සිළුමිණ

சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 91 වැනි කාණ්ඩය 40 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ කන්‍යා රවි 18 භාග අධි වප් අව දියවක ඉරිදා ■ වර්ෂ 2020ක් වූ ඔක්තෝබර් මස 04 වැනි ඉරිදා මිල රු 80.00

ගුරුවරු 25,000ක් මාරුවීම් පෝලිමේ

(සුභාෂිණී ජයරත්න)

ගුරුමාරුවීම් අපේක්ෂාවෙන් සිටින පාසල් ගුරුවරුන් 25,476කට ස්ථානමාරු ලබා ගැනීමට නොහැකිවී ඇත. මොවුහු වාර්ෂිකව ගුරු ස්ථාන මාරු අපේක්ෂා කළ අය සහ එකම පාසලේ වසර 10 වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ අය වෙති. මේ වසරේ ඇති වූ කොරෝනා වසංගතය නිසා බොහෝ ගුරු මාරු තාවකාලිකව ඇණ හිටීම නිසා මෙම තත්ත්වය උද්ගතව තිබේ.

එමෙන්ම පළාත් පාසල් ගුරුවරුන්ට අමතරව ජාතික පාසල්වල සේවය කරන ගුරුවරුන් 2,476ක්ද මෙම පිරිසට අයත් වෙති. මේ වසරේදී පමණක් ජාතික පාසල්හි ගුරු මාරු ඉල්ලුම්පත්‍ර 5,500 කට ආසන්න ප්‍රමාණයක් ලැබී ඇති අතර පළාත් පාසල් ගුරුවරු 30,000කට වැඩි ප්‍රමාණයක් ඉකුත් 2019 වසරේදී මාරුවීම් ලබා ඇත.

ගුරුමාරුවීම් අත්හිටුවීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විමසූ විට එහි ප්‍රකාශකයෙක් පැවසුවේ ප්‍රාථමික ගුරු භවතුන්ට මාරුවීම් ලබා දුන් බවත් සෙසු ගුරු භවතුන්ට මාරුවීම් ලබා නොදුන්නේ කොරෝනා වසංගතය හේතුවෙන් මාස කිහිපයක් පාසල් වසා තැබීම නිසා සිසුන්ට ඇති වන අපහසුතාව වළක්වා ගැනීමට බවය. එම නිසා ලබන වසරේ මුල් භාගයේදී මේ මාරුවීම් ලබාදීමට ප්‍රමුඛතා අනුව කටයුතු කරන බවද ඔහු හෙළි කෙළේය.

උසස් පෙළට 362,824ක් ශිෂ්‍යත්වයට 331,694ක්

ඔක්තෝම්බර් 12 වැනි දින සිට නොවැම්බර් මස 6 වැනි දින දක්වා පැවැත්වෙන උසස් පෙළ විභාගය දිවයින පුරා විභාග මධ්‍යස්ථාන 2648 කදී පැවැත්වෙන අතර මෙවර පාසල් අයැදුම්කරුවන් 277,580 දෙනෙක්ද, පෞද්ගලික අයැදුම්කරුවන් 85,244 දෙනෙක්ද විභාගයට මුහුණ දෙන බව විභාග දෙපාර්තමේන්තුව පවසයි.

මේ අතර ඔක්තෝබර් 11 වැනිදා පැවැත්වෙන 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය විභාග මධ්‍යස්ථාන 2936 කදී පැවැත්වෙන අතර ඇයැදුම්කරුවන් 331,694 දෙනෙක් විභාගයට මුහුණ දෙති.

ඔක්තෝබර් මස 12 වන දින සිට ආරම්භ වන්නාවූ උසස් පෙළ විභාගයට හා 11 වැනි දින පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගය වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව විභාග කාල සීමාව තුළ පූර්ණ සෞඛ්‍යාරක්ෂිත වැඩ පිළිවෙළක් සකස් කර ඇති බව විභාග දෙපාර්තමේන්තුව පවසයි. 4 වැනි පිටුවට

වනයට හානි කළ 25ක් අධිකරණයට

(අමිල මලවිසූරිය)

වනාන්තර විනාශ කිරීම පිළිබඳව ජනමාධ්‍ය ඔස්සේ පුළුල් ප්‍රචාරයක් ලබාදීම නිසා ඒ පිළිබඳව ජනතාව අවදියෙන් සිට පොලිසියට ලබා දුන් ඔත්තු සේවා අනුව සැකකරුවන් 25 දෙනෙකු අත්අඩංගුවට ගෙන අධිකරණයට පැමිණවීමට හැකි වූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නීතිඥ ජාලිය සේනාරත්න මහතා පැවැසීය.

ඒ අනුව වනාන්තර ගිනි තැබීම්, ගස් කැපීම්, කඩොලාන රක්ෂිතයන්ට හානි පැමිණවීම, වැලි ගොඩ දැමීම් ඇතුළු වන පරිසර හානි පිළිබඳවත් මහනුවර හන්තාන, කල්පිටිය, වනාතවිල්ලුව එළුවන්කුලම, මාරවිල මූදුකටුව, හොරොව්පොතාන මොරවැව, ආනවිලුන්දාව, මංගලපුර, කාවන්තිස්සපුර, මින්නේරිය, නකල්ස්, පොලොන්නරුව වැලිකන්ද, අනුරාධපුර ඉහළ තලාව, මීගමුව,

4 වැනි පිටුවට

විද්‍යුත් අපද්‍රව්‍ය තැපෑලෙන් ගනී!

(තාරක වික්‍රමසේකර)

ජාතික විද්‍යුත් අපද්‍රව්‍ය කළමනාකරණ සතිය 5 වැනිදා සඳුදා ආරම්භ වන බවත් එහිදී ජනතාවට විද්‍යුත් අප ද්‍රව්‍ය තැපැල් කාර්යාල හරහා ලබා දීමට පහසුකම් සලසා ඇතැයි මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරි අමරසිංහ සිළුමිණට කීය.

නිවස්වල ඇති විද්‍යුත් අපද්‍රව්‍ය 10 වැනිදා පස්වරු 4.00 දක්වා දිවයිනේ තැපැල් කාර්යාල වෙත ගෙනැවිත් භාරදීමට හැකියාව ඇති බවද සභාපතිවරයා කීය.

විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ආරක්ෂිත ලෙස කොටස්වලට වෙන්කර ශ්‍රී ලංකාව තුළ ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි ප්ලාස්ටික්, යකඩ වැනි කොටස් 4 වැනි පිටුවට

කොළඹ ගස් සුරැකීමට අලුත් සැලසුමක්

(නිහාල් පී. අබේසිංහ)

කොළඹ නගරයේ මාර්ග දෙපස ඇති ගස් සුරැකීමට හා එම ගස් කඩා වැටීමෙන් මහජනතාවගේ දේපොළ විනාශ වීම වැළැක්වීමට ජනාධිපති කාර්යාලයේ පරිසර ඒකකයේ මෙහෙයවීමෙන් නව වැඩපිළිවෙළක් සකස් කර ඇත.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රොෂාන් රාජපක්ෂ ජනාධිපති කාර්යාලයීය විශේෂ පැවරුම් හා පරිසර අධ්‍යක්ෂ ධුරයට පත්වීමෙන් අනතුරුව මේ වැඩසටහන ආරම්භ කර ඇත. 4 වැනි පිටුවට

ඩොනල්ඩ් ට්‍රම්ප්ටත් කොරෝනා

ඇමරිකා ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තමන්ට සහ තම බිරිය මෙලනියාට කොවිඩ් වයිරසය ආසාදනය වී ඇති බව පසුගියදා ට්විටර් පණිවිඩයක් මගින් දැනුම් දී ඇත. තමන් සහ තම බිරිය ධවල මන්දිරය තුළ නිරෝධායනය වෙමින් සිටින බව ද එම පණිවිඩය මගින් දැනුම් දී තිබුණද ඔවුන්ගේ සෞඛ්‍යය තත්ත්වය ගැන වැඩිදුර තොරතුරු එහි සඳහන්ව නැත.

ශ්‍රී ලංකාවේ විශාලතම ඖෂධ නිෂ්පාදන කම්හල විවෘත කෙරේ

නවීන තාක්ෂණයෙන් අනූන ඖෂධ නිෂ්පාදන සහ පර්යේෂණ මධ්‍යස්ථානයක් හෝමාගම පිටිපන දී අගමැති මහින්ද රාජපක්ෂයන් අතින් ඔක්තෝබර් 2 වැනිදා විවෘත කරන ලදී, මෙම ඖෂධ නිෂ්පාදන කම්හල සඳහා වැය කළ මුදල ඇමරිකන් ඩොලර් දස ලක්ෂ 14කට ආසන්නය. මෙරට විශාලතම ඝන ඖෂධ නිෂ්පාදකයා වන හේමාස් සමාගමට අනුබද්ධිත මොරිසන්ස් සමාගමට අයත් මෙම කම්හල ඉදිරියේදී දේශීය ඖෂධ අවශ්‍යතාවයෙන් කොටසක් සපුරාලීමට අපේක්ෂිතය. ශ්‍රී ලංකාවට වාරෂිකව ඖෂධ පෙති බිලියන 1.8ක් ආනයනය කරනු ලබයි. 'සෞභාග්‍ය යේ දැක්ම ' ප්‍රතිපත්ති ප්‍රකාශනයට සමගාමීව දේශීය ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීමේ හා දිරි ගැන්වීමේ අරමුණින් ආරම්භ කළ මෙම මධ්‍යස්ථානය තුළින් ඉදිරියේදී විදේශීය ඇණවුම් සඳහා ඖෂධ නිෂ්පාදනද සිදු කරනු ඇත. අපනයන සිදු කරනුයේ යුරෝපා සංගමයේ යහපත් නිෂ්පාදන ක්‍රමවේදවලට අනුකූලවය. මෙම අවස්ථාවට ඇමතිවරුන් වන ආචාර්ය බන්දුල ගුණවර්ධන, නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි, විමල් වීරවංශ, රාජ්‍ය අමාත්‍යවරුන් වන මහාචාර්ය චන්න ජයසුමන, විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොළ, හේමාස් සමූහ ව්‍යාපාරයේ සභාපති හුසේන් අලි, මොරිසන් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ මුරතාසා යුසුක් ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ. මෙරට ඖෂධ කර්මාන්තය පිළිබඳ ලිපියක් 10 පිටුවේ පළවේ.

ඩෙංගු රෝගීන් 27,733ක්

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

ජනවාරි මාසයේ සිට මේ දක්වා මෙරටින් ඩෙංගු රෝගීන් 27,733ක් වාර්තා වී ඇති අතර එම කාලය තුළදී පුද්ගලයන් 30 දෙනකු මියගොස් ඇති බව ජාතික ඩෙංගු පාලන ඒකකයේ අධ්‍යක්ෂ අනුර ජයසේකර මහතා පවසයි.

පවතින වැසි සහිත කාලගුණ තත්වය හමුවේ ඩෙංගු යළි හිස එසවීමෙ අවදානමක් මතුව ඇති බවත් මේ පිළිබඳව ජනතාවට අවදානයෙන් සිටින ලෙසත් ජයසේකර මහතා සඳහන් කරයි. 4 වැනි පිටුවට



ජාත්‍යන්තර ගුරු දිනය ඔක්තෝබර් 5වන සඳුදාට යෙදී ඇත. ශ්‍රී ලංකාවේ පාසල් 10,175කට අයත් 247,334ක් ගුරුවරු කුමන සේවා දුෂ්කරතා තිබුණද විශිෂ්ට සේවයක නිරතව සිටින බව අවිවාදිතය. සිසුන් 42,14,772ගේ නැණස පාදන එම ලාංකීය ගුරු පරපුර දකුණු ආසියාවේ අඩුම වැටුප් ලබන ගුරුවරු ලෙසද පිළිගැනේ. මෙම දසුන සිළුමිණ ඡායාරූප ශිල්පී නිශංක සිල්වාගේ කැමරා ඇසට ලක්වූයේ ඉකුත් සිකුරාදා මරදාන ශ්‍රී සංඝමිත්තා බාලිකා විද්‍යාලයේදීය. එහි විදුහල්පතිනි තුෂාරිද සිල්වා 5 ශිෂ්‍යත්ව දරුවන්ට විභාගය පිළිබඳ උපදෙස් ලබා දෙන අයුරුයි මේ. ගුරු දිනය පිළිබඳ විශේෂ ලිපියක් 5 පිටුවේ පළවේ.

සමඟි ජන බලවේගය කළු කොඩි ඔසවයි

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

20වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නයි ආණ්ඩුවට බල කරමින් හෙට (05) රට පුරා කළු කොඩි ඔසවා විරෝධතාව පළකිරීමට සමගි ජන බලවේගය තීරණය කර තිබේ. එමෙන්ම 08 වැනිදා කොළඹ හයිටි පිටියේදී පස්වරු 2.30ට මහජන රැලියක් පැවැත්වීමට ද සමගි ජන බලවේගය කටයුතු කර ඇතැයි එම පක්ෂයේ මහලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුම බණ්ඩාර 'සිළුමිණ' ට කීය.

විපක්ෂයේ සියලු දේශපාලන පක්ෂ මෙන්ම බහු ජන සංවිධාන ඇතුළු සමාජ ක්‍රියාකාරීන් රැසක් මේ සඳහා එක්කර ගැනීමට එම පක්ෂය පියවර ගෙන තිබේ. මීට අමතරව 20 වැනි සංශෝධනයට එරෙහිව තවත් විරෝධතා රැසක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව පක්ෂයේ මහලේකම්වරයා සඳහන් කළේය.

හීය

● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

හොස්ස බිම උලා ගැනීම

මෙරට රාජ්‍ය සේවයට ඉතාමත් කීර්තිමත් ඉතිහාසයක් තිබුණේය. එහෙත් ඒ කීර්තිමත් බව රැඳී තිබුණේ අතීතයේ පමණි. වර්තමාන රාජ්‍ය සේවය තුළ එවැනි කීර්තිමත් බවක් ගෑවිලාවත් ඇති බවක් නොපෙනේ. ඒ තරමටම වත්මන් රාජ්‍ය සේවය අකාර්යක්ෂම වී ඇත.

කලකට ඉහත රටේ ඇත කෙළවරක පිහිටි හද්ද පිටිසර ගම්මානයක වෙසෙන ගැමියකු යම් අවශ්‍යතාවක් ඉටුකර ගැනීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවකට ලිපියක් යවනු ලැබුවහොත් සතියක් ඇතුළත ඊට පිළිතුරක් ලැබුණේය. අදාළ ආයතනයේ ප්‍රධානියාගේ හෝ ඔහුගේ බලලත් නිලධාරියෙකු ගේ අත්සනින් යුතුව ලැබුණු එම පිළිතුරු ලිපිය අවසන් කර තිබුණේ " මේ වගට - ඔබේ යටහත් සේවක" යනුවෙනි. බොහෝ විට එම ඉල්ලීම ද ඉෂ්ට කෙරුණේය. ඒ එදා රාජ්‍ය සේවයේ හැටිය. එහෙත් අද එය අතීතයට ගිය සිදුවීමකි. මෙකල පවතින රාජ්‍ය ආයතනයකට එවැනි එක ලිපියක් නොව ලිපි සීයක් යැවුවද ඊට කිසිදු පිළිතුරක් නොලැබේ. එසේම අද රාජ්‍ය ආයතනයකින් යම් මහජන අවශ්‍යතාවක් ඉටු කර ගැනීම ගලකින් පට්ටයක් ගන්නවාටත් වඩා අසීරු කර්තව්‍යයකි.

අපට පෙනෙන අන්දමට නම් මේ සියල්ලටම හේතුවක් වී ඇත්තේ වත්මන් රාජ්‍ය සේවය බරපතළ ලෙස දේශපාලණීකරණය වීමය. කලකට ඉහත රාජ්‍ය සේවයේ නියැළී ලොකු කුඩා හැම දෙනෙකුටම දේශපාලන කටයුතු වල යෙදීම තහනම් විය. අද එම නීතිය බලපාන්නේ උසස් නිලධාරීන්ට පමණි. එම නීතිය සොක්කන්ට අදාළ නොවේ.

එහෙත් අද වැඩිපුරම දේශපාලන කටයුතු වල නිරතවන්නේ රාජ්‍ය සේවයේ නිරත පොඩ්ඩන් නොව ලොක්කන් බව ප්‍රසිද්ධ කරුණකි. ඔවුන් එසේ කරන්නේ තම දේශපාලන හාම්පුතුන් පිනවා උසස් තනතුරකට පැන ගැනීමේ අදහසිනි. ලොක්කන් එසේ කරන විට ඔවුන් යටතේ සිටින පොඩ්ඩන් ද තම ප්‍රධානින් අනුගමනය කරන්නේ දෙවරක් නොසිතමිනි. රජයේ කාර්යාල වල මෙවැනි අභාග්‍යවත් තත්ත්වයක් ඇතිවීමට මුල්වූයේ අපේ ඇතැම් දේශපාලනඥයන්ම බව කනගාටුවෙන් වුවද කිව යුතුය.

එක්තරා රාජ්‍ය ආයතනයක සේවක මහතකුගේ විවාහ මංගල්‍යයකට සහභාගි වීම සඳහා එම කාර්යාලයේ එක් සේවකයෙකු පමණක් සිටිය දී එහි ලොක්කන් සහ සොක්කන් ඇතුළු දෙපිරිසම රාජකාරි වේලාව තුළ ගොස් ඇතැයි කියන ප්‍රවතක් ඉකුත් දා විදුත් සහ මුද්‍රිත මාධ්‍ය ඔස්සේ අනාවරණය විය. රාජ්‍ය සේවා චක්‍රලේඛ සහ අනපනත් අනුව නම් එය බරපතළ විෂමාචාරයකි. ඇතැම් විට රජයේ නීති රෙගුලාසි ගැන පවා තැකීමක් නොකර එම පිරිස තම සගයාගේ මඟුල් ගෙදර ගොස් තිබුණේ අදාළ පුද්ගලයාගේ දේශපාලන බල පුළුවන්කාරකම නිසා විය හැකිය. දේශපාලන හෙන්චයියන්ගේ මූණ හොඳ කිරීමට අපේ ඇතැමුන් දරන උනන්දුව එමගින් සිතාගත හැකිය.

අද රජයේ කාර්යාල බොහොමයකම සේවා කටයුතු වල බරපතළ ප්‍රමාදයක් පවතින බව ප්‍රසිද්ධ කරුණකි. බොහෝ විට ඒවා සිදුවන්නේ අදාළ සේවක මහතුන්ගේ සහ උසස් නිලධාරීන්ගේ නොසැලකිල්ල නිසාය. තවත් සමහර ආයතනවල සේවක පිරිස් මහජන අවශ්‍යතා ඉටු කිරීම ප්‍රමාද කරන්නේ හිතාමතාය. ඒ අතයට ගනුදෙනුවක් බලාපොරොත්තුවෙනි. විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවලින් නිවාස සැලසුම් අනුමත කිරීමේ දී එම තත්ත්වය බහුල වශයෙන් දකින්නට ලැබේ.

ඉහළ යමින් පවතින බඩු මිල හමුවේ අද ජීවත්වීම දුෂ්කර කාර්යයක් වී ඇති බව සැබෑය. එහෙත් සියලුම රාජ්‍ය ආයතනවල සේවක මහත්ම මහත්මින්ට තමන් විසින් කරනු ලබන රාජකාරිය සඳහා නිශ්චිත වැටුපක් ලැබේ. එසේ තිබිය දී තමන් විසින් ඉටු කළ යුතු රාජකාරිය සඳහා යම් සේවකයෙකු අල්ලසක් බලාපොරොත්තු වීම සහගහන අපරාධයකි. අධික ජීවන වියදම ඒ සඳහා හේතුවක් ලෙස දැක්විය නොහැක. සමහර ලොක්කන් ද මෙවැනි අතයට ගනුදෙනුවල යෙදෙන්නේ රුපියල් කෝටි ගණනිනි. එහෙත් හැම දෙනෙක්ම එසේ නොවෙති.

ඇතැම් ලොක්කන් තමන් යටතේ සිටින සොක්කන්ගේ මෙවැනි පහත් ක්‍රියාවන් සඳහා අනුබල දෙන බවක් අසන්නට ලැබේ. වැරැද්ද දැක දැකත් නිහඬව සිටීම ද විෂමාචාරයකි. ඇතැම් විට එම ලොක්කන් ද තමන් යටතේ සිටින සොක්කන්ගේ එවැනි නොමනා ක්‍රියා දැක නොදුටුවාක් මෙන් සිටින්නේ අදාළ පුද්ගලයන් සතු දේශපාලන බලපුළුවන්කාරකම් නිසා විය හැකිය. තමන් සතු දේශපාලන බලය මුල්කරගෙන ආයතන ප්‍රධානින් අල්ලේ නටවන සොක්කෝ ද අද ඕනෑ තරම් අප අතර සිටිති.

එවැන්නන් වැඩිපුරම සිටින්නේ වෘත්තිය සමිතිකාරයන් අතරය. ඉකුත් ජේ.ආර්.ජයවර්ධන පාලන සමයේ මෙවැනි ජුන්ටා කාරයෝ කොතරම් බලවත්ව සිටියාදැයි කිවහොත් තමන්ට අවනත නොවන ආයතන ප්‍රධානීන් සැතපුම් සිය ගණනක් ඈතට මාරු කරවීමට පවා සමත්වූහ. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදී පාලන තන්ත්‍රයක් යටතේ එවැනි දෑ කිසිසේත්ම සිදු නොවිය යුතුය. එවැනිදෑට ඉඩ නොතැබීම රජයේ බලධාරීන්ගේ ද වගකීමකි.

අනෙක් අතට තම දේශපාලන හාම්පුතුන් පිනවීම සඳහා ඔවුන්ගේ රූකඩ ලෙස කටයුතු කළ ඇතැම් උසස් නිලධාරීන්ට අවසානයේ දී මුහුණ පෑමට සිදුවන ඉරණම අතිශයින් කනගාටුදායකය. මේ දිනවල එක් එක් කොමිෂන් සභා මගින් සිදුකර ගෙන යන සාක්ෂි විමසීම්වලින් එවැනි තොරතුරු බොහොමයක්ම හෙළිවෙමින් පවතී. අන්තිමේ දී එවැනි උසස් නිලධාරීන්ට සිදුවී ඇත්තේ තමන්ගේ වැරදි එකිනෙකා පිට පටවමින් බෝල පාස්කර ගැනීමටය. තවත් පිරිසක් රටින් පැන ගොස් සිටිති.

එහෙත් ඔවුන් ඒ තත්ත්වයට පත් කරමින් ඒ සඳහා ආධාර සහ අනුබල දුන් දේශපාලන හාම්පුතුන් තවමත් නිදැල්ලේ පසුවන්නේ සුදනන් ලෙසිනි. ඉදිරියේ දී හෝ යම් ප්‍රශ්නයක් මතු වුවද දංගෙඩියට යා යුතුව ඇත්තේ ඉහත සඳහන් රාජ්‍ය සේවා නිලධාරීන්ට මිස ඔවුන්ගේ දේශපාලන හාම්පුතුන්ට නොවේ. එය ද එක්තරා අන්දමක දෛවයේ සරදමකි.

මේ වනාහී කැත, නරුම සහ අශික්ෂිත දේශපාලනයේ ස්වභාවයයි. වර්තමානයේ රාජ්‍ය සේවයේ නියැළී ලොක්කන්ට මෙන්ම සොක්කන්ට ද මෙවැනි සිදුවීම් කදිම පාඩම්ය. එහෙයින් රාජ්‍ය සේවකයා තමන්ගේ රාජකාරිය හිතට එකඟව සහ අනලස්ව ඉටු කළ යුතුය. ඔවුන් රාජකාරිය පසෙකට දමා දේශපාලනය කරට ගැනීම කිසිසේත්ම නොකළ යුතු දෙයකි. එසේ නොකර තම දේශපාලන හාම්පුතුන් පිනවීම සඳහා තමන්ගේ රාජකාරිය යොදා ගන්නා කවර තරාතිරමකට අයත් රාජ්‍ය සේවකයකුට වුවද අන්තිමට සිදුවන්නේ තමන්ගේ හොස්ස බිම උලා ගැනීමටය. එම දිනය වැඩි ඈතක නොවන බව ද අවධාරණයෙන් ම සඳහන් කළ යුතුය.

BOVANS
ලොව ප්‍රකට ලේයර්ස්
ශ්‍රී ලංකාවේ සරු ඵල නෙලා ගත් කිකිළි පැටවුන්
* වැඩි බිත්තර නිෂ්පාදනයක්
* ඉතාම ශක්තිමත් බිත්තර කටුවක්
* වැඩි ජීවන ශක්තියක්
දික්කන්ද ෆාම්ස්
යක්කල පාර, වතුරුගම, බ: ප:
ටෙලි: 033 5626501 ෆැක්ස්: 033 2279674

සුනාමි ව්‍යසනය සිදුවූ 2004 දෙසැම්බර් 26 පැරැලියේදී සුනාමියට බිලි වී සුනුවිසුනු වූ දුම්රිය මෙහි දැක්වේ. මෙහි ගමන් කළ මගීන් දහසකට අධික පිරිසක් මරුමුවට පත්විය

රිස්වාන් වසර 16කට පසු හමු වූ මව යැයි කියන කාන්තාව සමඟ

2004 දෙසැම්බර් 26 වැනිදා රටම හැඬවූ සුනාමි ව්‍යසනයෙන් ජීවිතක්ෂයට පත්වූ සංඛ්‍යාව 31,289කි. අතුරුදන් වූ සංඛ්‍යාව 4,100කි. පුද්ගලයන් 5,16,150ක් අවතැන් වූ අතර ඒ අතර සුනාමියෙන් මව, පියා යන දෙදෙනාම අහිමි වූ දරුවන් සංඛ්‍යාව 1,071කි. එමෙන්ම දරුවන් 3,739කට මව හෝ පියා අහිමි විය

අම්පාරේ රඟ දැක්වෙන 'හුණුවටයේ කතාවේ' අලුත්ම ජවනිකාව

● සුරේකා නිල්මිණී ඉලංගකෝන්

හෙන්රි ජයසේනයන් ගේ 'හුණුවටයේ කතාව' වේදිකා නාට්‍යයෙන් කියවෙන්නේ දරුවකුගේ සැබෑ අයිතිය විනිශ්චය කිරීමේ අපූරු නඩු තීන්දුවකි. 'මයිකල්' නම් ළදරු කුමරකුගේ අයිතිය පතා ඔහු වැදූ මව සහ හදාවඩාගත් ගෘෂා නම් තරුණ මෙහෙකාරිය අධිකරණය හමුවට එන අතර දරුවාගේ සැබෑ අයිතිය තීරණය කිරීමට 'අඩසක්' නම් විනිසුරු යොදා ගන්නේ අමුතු ක්‍රමයකි. හුනුවලින් සලකුණු කරන ලද වෘත්තයක් තුළ දරුවා තබා දෙපසට අදින ලෙස ඔහු මවුවරු දෙදෙනාට අණ කරයි. එහිදී දරුවාට සැබවින් ම ආදරය කරන ගෘෂා දරුවා වේදනා විඳිනු දකිනු නොහැකිව සටන අතහරිද්දී දරුවා සැබවින්ම අයිති විය යුත්තේ ගෘෂාට බව විනිසුරු තීරණය කරයි.

හුණුවටයේ කතාවේ එන ඒ සංවේදී කතා පුවත යළි සිහි ගන්වමින් දරුවකුගේ සැබෑ මව කවුදැයි සොයන ආන්දෝලනාත්මක කතාවක් මේ වන විට කරළියට පැමිණ ඇත. මේ පුවත වාර්තා වන්නේ අම්පාර සමන්තුරෙයි ප්‍රදේශයෙනි.

ඒ, සුනාමි ව්‍යසනයේදී අතුරුදන් වූ එවකට පස් වසරක් වයසැති පිරිමි දරුවකු වසර 16කට පසු එම දරුවාගේ මව යැයි කියන කාන්තාවක විසින් සොයා ගැනීමේ පුවතක් මාධ්‍ය හමුවේ අනාවරණය වීමත් සමඟ ය. මේ වන විට එම සිදුවීම වඩාත් උණුසුම් වී ඇත්තේ එදා පස් වියැති මේ වන විට 21 වැනි වියේ පසුවන එම තරුණයාගේ සැබෑ මව ඇයම දැයි යන්න සැකයට තුඩු දෙන කරුණක් බවට පත්ව තිබෙන නිසාය. ඒ, මෙතෙක් එම තරුණයා හදාවඩා ගත් බව කියන අම්පාර හොල්මන්ගල ප්‍රදේශයේ පදිංචි මොහොමඩ් ජුනයිඩ් නූර් ඉන්ෂාන් (42) නමැති කාන්තාවක විසින් සමන්තුරේ පොලිසියට කරන ලද ප්‍රකාශයක් හේතුවෙනි.

අම්පාර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජයන්ත රත්නායකගේ උපදෙස් මත සමන්තුරෙයි පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කුරුවිට ජයලත් විසින් පොලිසියට කැඳවූ අවස්ථාවේදී ඇය හැඬූ කඳුළින් සිය අවනඩුව ඉදිරිපත් කළාය.

දරුවා සිංහල ගෙදරක හැදී වැඩුණා යැයි කී කතාව බොරුවක්ද?

මෙම සිදුවීමේ කථානායකයා බවට පත්වී සිටින මොහොමඩ් රියාස් නමැති 21 හැවිරිදි තරුණයා තමන්ගේම කුසින් උපන් දරුවා බවත් දරුවාගේ පියා තමා සහ දරුවා අත්හැර යෑමත් සමඟ තමන් කුලී වැඩ කරමින්, ගෘහ සේවයේ යෙදෙමින් දහසක් දුෂ්කරතා මැද දරුවා ඇතිදැඩි කළ බවත් ඇය එහිදී විස්තර සහිතව අනාවරණය කළාය. ඇයගේ දුක්ගැනවිල්ලට සාවධානව සවන් දුන් පොලිස් ස්ථානාධිපතිවරයා මේ පිළිබඳ පුළුල් විමර්ශනයක් කිරීමට තම නිලධාරීන්ට උපදෙස් දෙනු ලැබුවේ එම කාන්තාව සහ මොහොමඩ් ශියාන් නමැති තරුණයාගේ සැබෑ මව තමා යැයි කියමින් මාධ්‍ය ඉදිරියේ පෙනී සිටි කාන්තාව ප්‍රකාශ කළ කරුණු අතර දැඩි පරස්පර බවක් දක්නට ලැබීම හේතුවෙනි.

ඒ සම්බන්ධයෙන් මෙතෙක් පැවැත්වූ මූලික විමර්ශනවලින් අනතුරුව තරුණයාගේ සැබෑ මව කවුද යන්න විද්‍යානුකූලව අනාවරණය කර ගැනීම සඳහා ඩී.එන්.ඒ. පරීක්ෂණයක් පැවැත් වීමට පොලිසිය විසින් තීරණය කර තිබේ. ඒ අනුව තරුණයාගේ මවුවරු යැයි කියන කාන්තාවන් දෙදෙනාගේම එකඟත්වය මත ලබන සඳුදා (5දා) ඔවුන් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත ය. සුනාමි දරුවාගේ කතාව 'හුණුවටයේ කතාවේ' අලුත්ම ජවනිකාව බවට පත්ව ඇත්තේ ඒ අයුරිනි.

වසර 16කට පෙර නැතිවූ බව කියන දරුවාගේ සැබෑ මව තමා යැයි කියමින් අම්පාර කරෙයිතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි සිත්ති හමාලියා නම් කාන්තාව පසුගිය 28 වැනිදා මාධ්‍ය හමුවේ පැවසුවේ තම දරුවා මෙතෙක් හදා වඩාගෙන ඇත්තේ සිංහල මවක විසින් බව ය. එහෙත් සමන්තුරේ පොලිසිය හමුවේ දරුවාගේ සැබෑ මව තමා බව පවසමින් ප්‍රකාශයක් කළේ මුස්ලිම් කාන්තාවකි. තම දරුවාගේ නම නසීන් මුහමලේ අස්කර් රිස්කාන් බව සිත්ති හමාලියා පැවසුවද දැන් හමුවී සිටින තරුණයාගේ නම මොහොමඩ් රිස්වාන් ය.

සිත්ති හමාලියා පවසන පරිදි මේ කතාව වසර 16ක අතීතයකට දිවෙන්නෙකි. 2004 දෙසැම්බර් 26 වැනිදා රට ම හැඬවූ දවසක් වූයේ නොසිතූ ලෙස පැමිණි සුනාමිය නිසා ය. රුදුරු සුනාමි ව්‍යසනය නිසා සිය ජීවිතයට අත්වූ ඉරණම අබුසාලි සිත්ති හමාලියා පසුගියදා මාධ්‍ය හමුවේ අනාවරණය කළේ මෙලෙසිනි.

"ඒ කාලේ මම අම්පාර අශ්රෆ් අනුස්මරණ රෝහලේ සුළු සේවිකාවක් ලෙස සේවය කරමින් සිටියේ. සුනාමිය පැමිණි දවසෙත් මම රාජකාරියට වාර්තා කළා. ඒ වනවිට මට අවුරුදු 5ක පුතෙක් හිටියා. සුනාමිය එද්දි පුතා හිටියෙ සමන්තුරෙයි ගෙදර. සුනාමිය නිසා අවතැන් කඳවුරුවල කොටු වුණ මට දරුවා ළඟට යන්න විදිහක් තිබුණේ නැහැ. දවස් තුනකින් මම ගෙදර යද්දි පවුලේ කවුරුත් හිටියෙ නැහැ. මගේ සොයුරියගේ සැමියාට (විශ්‍රාමලත් ප්‍රාදේශීය ලේකම්) පුද්ගලයකු පැමිණ කියා තිබුණා මගෙ පුතා රෝහල් හිටියා කියලා. අපි රෝහලට ගිහින් බලද්දි රෝහලේ රෝගීන් ඇතුළත් කරන පොතේ පුතාගේ නම තිබුණා. නමුත් ඒ වෙද්දිත් දරුවගේ මවුපියන් යැයි කියමින් පුතාව කවුරු හරි අරගෙන ගිහින්.

එදා ඉඳලා මම හම්බවෙන හැම කෙනාගෙන් ම පුතාගේ ඡායාරූපය පෙන්නලා විස්තර අහනවා. පිස්සියක් වගේ දරුවා සොයමින් හැමතැනම ඇවිද්දා. මගේ පුතා කොහේ හරි ඉන්නවා කියලා තොරතුරක් ලැබුණු ගමන් මම ඒ හැම තැනනටම ගිහින් හොයන එක පුරුද්දක් වුණා. මගේ පුතා සොයන්න මගෙ ඥාතීන් ඇතුළු බොහෝ පිරිස් විවිධ උදවු උපකාර කළා. මම මානව හිමිකම් කාර්යාලයටත් ගියා. ඒත් ඔවුන් මට කිසිම උපකාරයක් කළේ නැහැ. පොලීසියත් මට ගැඹුරු හඬින් තර්ජනය කළා. උසස් නිලධාරියකු මාව හිරේ දමන බවටත් තර්ජනය කළා. මා ඔහුට මගේ වේදනාව කීවා. කොළඹ මානව හිමිකම් කාර්යාලයට පැමිණිලි කළත් ප්‍රතිඵලයක් ලැබුණේ නැහැ. මම බොහෝ ජනමාධ්‍යවලටත් කතා කළා"

එසේ පුතු සොයමින් රට පුරා ගිය ඇයට 2016 වසරේදී සිය පුතු සිංහල පවුලකට සම්බන්ධ වී සිංහල පාසලක ඉගෙනුම ලබන බව දැනගන්නට ලැබෙන්නේ මිතුරියක ගේ මාර්ගයෙනි.

"මම ඇයගේ උපකාරයෙන් පාසලට ගොස් පුතා දැකීමට උත්සාහ කළත් විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩලය මට දරුවා බැලීමට අවසර ලබා දීම ප්‍රතික්ෂේප කළා. මම රැකියාවත් අතහැරලා සිංහල කාන්තාවක් වගේ ඇඳුම් ඇඳගෙන දරුවා දැකගැනීමේ ආශාවෙන් බොහෝ කාලයක් පාරක් පාරක් ගාණේ ඇවිද්දා. අලෙවි නියෝජිතයකු ලෙසත් රැකියා ප්‍රවර්ධන නිලධාරිනියක ලෙසත් හිඟන්නියක ලෙසත් වෙස්වලාගෙන ඇවිදිමින් පුතා සෙව්වා. මට විශ්වාසයක් තිබුණා දවසක මාගේ පුතා මා ළඟට එයි කියලා. ඒ වෙනුවෙන් මම බොහෝ අවමාන, කරදරවලට මුහුණ දුන්නා. මේ අතර මගේ සැමියා වෙනත් විවාහයක් කර ගත්තා. නමුත් මම තනියම මගේ දරුවා සොයන කටයුත්ත දිගටම කළා. ජනාධිපතිතුමා දක්වා කියන්න පුළුවන් හැම ආයතනයකටම, නිලධාරියකුටම කිව්වා. කිසි කෙනෙක් ඇහුම්කන් දුන්නෙ නෑ. එක් ආයතනයක් මගින් මම මගේ දරුවා පදිංචි ස්ථානය දැනගත්තා. රැකියා ලබා දෙන අයකු විදිහට මම පුතාගේ තොරතුරු ලබා ගත්තා."

ඉන් නොනැවතුණු හමාලියා සිය පුතු යැයි විශ්වාස කළ දරුවා බලන්නට ඔහු ඇතිදැඩි වෙමින් සිටි අම්පාර හොල්මන්ගල ප්‍රදේශයේ නිවෙසටද ගියාය. සිංහල පවුලක් සමඟ හැදී වැඩෙමින් සිටි තම පුතුට දෙමළ භාෂාව කතා කිරීමට හැකියාවක් නොතිබුණු බවත් තමාට ද සිංහල භාෂාව නොතේරීම හේතුවෙන් පුතු සමඟ අදහස් හුවමාරු කර ගැනීමට නොහැකි වූ බවත් ඇය මාධ්‍ය හමුවේ පැවසුවාය.

පසුව නැවත සිය නිවෙසට ගිය ඇය, තම පුතු යැයි සිතාගෙන සිටින 21වැනි වියේ පසුවන රිස්වාන් ට දුරකථනයෙන් කතා කර තිබේ. එහිදී ඇය තම පුතුගේ සිරුරේ ඇති "උපන් ලප සහ සලකුණු" ගැනද විමසා තිබේ.

සැබෑ මව හඳුනා ගැනීමට ඩී.එන්.ඒ. පරීක්ෂණයක් සඳහා මවුවරු දෙදෙනා ලබන සඳුදා අධිකරණය හමුවට

"ඊට පස්සේ පුතා දැනගත්තා එයාගේ අම්මා මම තමයි කියලා. ඉන් දින කිහිපයකට පස්සේ මගේ පුතා කොළඹ රැකියාවට යන බව ගෙදරට පවසා මාව සොයාගෙන සමන්තුරේ ට ආවා" හමාලියා මාධ්‍ය හමුවේ තුටු කඳුළු සලමින් එසේද කීවාය. රිස්වාන් තමා බිහි කළ මව යැයි පවසන සිත්ති හමාලියා බලන්නට ඇගේ නිවෙසට ගොස් තිබුණේ පසුගිය 28 වැනිදා ය. එහිදී පුතු සමඟ මාධ්‍යයට පෙනී සිටි හමාලියා සිය සතුට ප්‍රකාශ කරමින් මෙසේද කීවාය.

"අවුරුදු 16කට පස්සේ මගේ පුතා මගෙ ළඟට ආව එක ගැන මට ගොඩක් සතුටුයි. සමහරු කිව්වා මගේ පුතා ජීවතුක් අතර කියලා. සමහරු කිව්වා පුතා ජීවතුන් අතර නැහැ කියලා. නමුත් අවුරුදු 16ක් තිස්සේ මම මගේ පුතා හොයන උත්සාහය අත හැරියේ නැහැ. අවුරුදු 5දී නැතිවුණ මගෙ පුතා දැන් හින්දි නළුවෙක් වගේ. මගේ පුතා නැවත හොයාගන්න දෙවියන් මට පිහිට වුණා. පුතා සොයා දෙන ලෙස ඉල්ලමින් මම මක්කමට බාර වුණා. දැන් පුතා ලැබිලා තියෙන නිසා පුතා එක්ක මක්කමට ගිහින් ඉස්ලාමීය චාරිත්‍ර අනුව ඒ බාරය ඔප්පු කරන්නයි මම හිතාගෙන ඉන්නෙ. ඒ වගේම මේ දක්වා පුතාව බලාගත්ත ඒ සහෝදරියටත් හැකි පමණින් උදව් කරන්නත් මම බලාපොරොත්තු වෙනවා. පුතාට දෙමළ කතා කිරීමට නොහැකියි. ඒත් සිංහල භාෂාවන් මා කියූ දේවල් විශ්වාස කර මා ළඟට පැමිණීම ගැන සතුටු වනවා."

සිත්ති හමාලියා විසින් මාධ්‍ය මගින් කළ එම ප්‍රකාශ පිළිබඳ පොලිස් විශේෂ කාර්යාංශයේත් බුද්ධි අංශවලත් සහායෙන් පැය 24ක් ගතවන්නට පෙර සියලු තොරතුරු එක්රැස් කරගන්නට සමන්තුරෙයි පොලිසිය සමත් විය. දරුවාගේ සැබෑ මව කවුරුන්ද යන පටලැවිල්ල ලෙහා ගැනීම සඳහා දරුවාට හිමිකම් කියන මවුවරු දෙදෙනා දරුවාද සමඟ පසුගිය 1වැනිදා සමන්තුරෙයි පොලිසියට කැඳවා තිබුණේ ඒ අනුව ය. එහිදී දරුවා මේ දක්වා හදාවඩාගත් හොල්මන්ගල පදිංචි මුහමඩ් ජුනයිද් නූර් ඉන්ෂාන් විසින් දරුවාගේ උප්පැන්න සහතිකය, බර කිරුම් සහතික, පාසල් සහතික ආදී ලේඛන කිහිපයක් ම පොලිසිය වෙත ඉදිරිපත් කළාය.

දරුවා සම්බන්ධ ලේඛන මවුවරු දෙදෙනා ළඟම...

සුනාමියෙන් අතුරුදන් වූ තම දරුවා රිස්වාන් යැයි සිතන සිත්ති හමාලියා නමැති කාන්තාවද දරුවා සම්බන්ධ ලේඛන කිහිපයක් පොලිසියට ඉදිරිපත් කර තිබුණි. දරුවා සොයමින් වසර ගණනාවක් රට වටා ගොස් ඇති ඇති සිත්ති හමාලියා 2016 වසරේදී මෙම දරුවා පිළිබඳ තොරතුරු ලැබී ඔහු සොයා ගිය බවද පොලිසිය හමුවේ ප්‍රකාශ කොට තිබුණාය.

මෙතෙක් කරන ලද විමර්ශන අනුව පොලිසිය පවසන්නේ සමන්තුරෙයි පදිංචි සිත්ති හමාලියා තම දරුවා සොයා වසර ගණනාවක් දරන ලද උත්සායක ප්‍රතිඵලයක් ලෙස සොයාගත් දරුවා ඇයගේ දැයි නිශ්චිත ව කිව නොහැකි නමුත් ඇය ඒ තමන්ගේම දරුවා යැයි සිතමින් ඔහුට සමීප වී ඇති බව අනාවරණය වී ඇති බවයි. සිත්ති හමාලියා ට පළමු වරට දරුවා මුණ ගැසෙන විට ඔහු පාසල් අධ්‍යාපනය නිම කර සිට ඇති අතර රැකියාවක් සොයාදෙන ලෙස සිත්ති හමාලියාගෙන් ඉල්ලා සිට ඇති බවත් ඒ අනුව ඔහු සමන්තුරෙයි ප්‍රදේශයට පැමිණ ඇති බවත් පොලිසිය වැඩිදුරටත් අනාවරණය කරගෙන තිබේ. ඇය දරුවා හදාවඩා ගත්තේ සිංහල මවක් විසින් යැයි අසත්‍යයක් ප්‍රකාශ කළේ ඇයිද යන්න පිළිබඳවද පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වමින් සිටී. කෙසේ වෙතත් අවසානයේදී පොලිසිය මවුවරු දෙදෙනා ඩී.එන්.ඒ පරීක්ෂණයට යොමු කිරීමට තීරණය කරනු ලැබුවේ මෙය විද්‍යානුකූලව සනාථ කරගත යුතු කරුණක් බවට පත්ව ඇති නිසා ය.

ඒ අනුව එම පරීක්ෂණයෙන් පසු සමන්තුරෙයි රඟ දැක්වෙන හුණුවටයේ කතාවේ අලුත්ම ජවනිකාව තුළ සැඟවී ඇති ප්‍රෝඩාව සහ සැබෑව හෙළි වනු ඇත.

විනාඩි 20ක කාලයක් තුළ ජීවිත 32,000ක් බිලි ගනිමින් බිලියන ගණන් දේපළ විනාශ කළ සුනාමිය මෑත ඉතිහාසය තුළ ශ්‍රී ලංකාව මුහුණ පෑ දරුණුතම බේදවාදකයයි. 2004 දෙසැම්බර් 26 වැනිදා රට ම හැඬවූ එම ව්‍යසනයෙන් ජීවිතක්ෂයට පත්වූ සංඛ්‍යාව 31,289කි. අතුරුදන් වූ සංඛ්‍යාව 4,100කි. පුද්ගලයන් 5,16,150ක් අවතැන් වූ අතර ඒ අතර සුනාමියෙන් මව, පියා යන දෙදෙනාම අහිමි වූ දරුවන් සංඛ්‍යාව 1,071කි. එවැනි බේදනීය සිදුවීමක් තුළ රිස්වාන් වැනි දරුවන් ගැන අනුවේදනීය කතා තවදුරටත් අසන්නට ලැබීමද අරුමයක් නොවේ.

සමන්තුරෙයි පොලිසියේදී තම මවුවරු යැයි කියන සිත්ති හමාලියා සහ නූර් ඉන්ෂාන් අතරට මැදිවූ රිස්වාන්

බාහිර උපාධිධාරීන් 30,000ක් කබලෙන් ළිපට වැටෙයිද?

වසර ගණනාවකින් සිසුන් ලියාපදිංචි කර නැහැ

- බාහිර ශිෂ්‍ය සංගම්වලින් චෝදනා

● සුභාෂිණී ජයරත්න

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග

රුහුණු විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන

කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිනි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා

බාහිර උපාධි සුරැකීමේ සංවිධානයේ කැඳවුම්කරු මහේෂ් අඹේපිටිය

බාහිර උපාධි ආචාර්ය සංසදයේ කැඳවුම්කරු මනෝජ් සංජීව

පාසල් අධ්‍යාපනය නිමා කිරීමෙන් අනතුරුව බොහෝ දෙනෙක් අපේක්ෂාවෙන් පසුවන්නේ සරසවි වරම් ලබා ගැනීමටය. එහෙත් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් වීමට නොහැකිව අපේක්ෂා භංගත්වයෙන් පසු වූ බොහෝ දෙනෙක් ඉන් අනතුරුව පිවිසෙන්නේ බාහිර උපාධි ලබා ගැනීමේ අපේක්ෂාවෙනි. රජයේ පිළිගත් ඉහළ වැටුප් තලයක උසස් රැකියාවකට යාමට මේ බාහිර උපාධියෙන් විශාල පිටිවහලක් ලැබෙන්නේය. කෙසේ වෙතත් මෙම බාහිර උපාධිධාරීන්ගේ අපේක්ෂා යම් පමණකට භංග වෙමින් බාහිර උපාධියේ තත්ත්වය මේ වන විට විවිධ ගැටලු සහගත තත්ත්වයන් මතු කරමින් සිටියි. බාහිර උපාධිධාරීන් මේ වන විටත් චෝදනා කරන්නේ තමන්ට නිදහස් අධ්‍යාපනයෙන් උරුම වූ උපාධිය විවිධ කප්පාදු කිරීම් වලට ලක්ව ඇති බවකි. මේ පිරිස චෝදනා කරන්නේ බාහිර උපාධි ලියාපදිංචියේ සිට විභාග ප්‍රතිඵල පැමිණීම දක්වාම මේ කප්පාදු කිරීම් වලින් දැඩි ලෙස බාහිර උපාධිධාරීන් පීඩා විඳින බවකි.

මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් කලා උපාධිධාරීන්ගේ ලියාපදිංචිය තාවකාලිකව අත්හිටුවා විශ්වවිද්‍යාල ප්‍රතිපත්තිමය තීන්දුවකට පිවිස ඇත්තේ එක් වසරකට අභ්‍යන්තර පාඨමාලා හදාරා උපාධිධාරීන් බවට පත් වන සංඛ්‍යාවට සමාන බාහිර උපාධිධාරීන් සංඛ්‍යාවක් බාහිර උපාධිධාරීන් ලෙස බඳවා ගැනීමය. තවත් පැත්තකින් බාහිර උපාධියේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් විෂයමාලා සංශෝධනයක් කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත් නිදහස් අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කරමින් බාහිර උපාධිධාරීන් මෙන්ම අපේක්ෂකයෝ මේ වන විට මුහුණ පා ඇති ගැටලු විවිධ පැතිකඩ හරහා සිළුමිණ විශේෂ සටහනක් කරන්නේ මේ ප්‍රශ්නය හැකි ඉක්මනින් නිරාකරණය කිරීමට අවධානය යොමු කිරීමටය.

"බාහිර උපාධිය ආරම්භ කළේ තරුණ පිරිස අධ්‍යාපනගත කරන්නයි. ඒත් මේ වන විට මේ බාහිර උපාධියට විවිධ ප්‍රශ්න මතුවෙලා. සමහර විශ්වවිද්‍යාලවලට වසර ගණනාවකින් බාහිර සිසුන් බඳවා ගෙන නැහැ. කැලණිය විශ්වවිද්‍යාලය තමයි බාහිර උපාධියට වැඩි සිසුන් පිරිසක් බඳවා ගන්නේ. ඒත් වසර ගණනාවකින් එහි ලියාපදිංචියක් සිදු වී නැහැ. රුහුණු විශ්වවිද්‍යාලයත් එහෙමයි. ඊට හේතුව තමයි සෑම රජයක්ම බාහිර උපාධිය වදයක් කොට සැලකීම. මේ වන විට බාහිර උපාධිය සම්බන්ධයෙන් විශාල ප්‍රශ්න ගණනාවක් මතු වෙලා. සාමාන්‍යයෙන් බාහිර උපාධි පළමු වසරේ හොඳම ප්‍රතිඵල ගන්නා සිසුන් කිහිප දෙනෙක් අභ්‍යන්තර උපාධි පාඨමාලාවේ දෙවැනි වසර ශිෂ්‍යයකු ලෙස බඳවා ගන්නවා. නමුත් වසර 10-15 ක සිට මේ අයිතිය නොකියාම අත්හිටුවා තියෙනවා. ඒ වගේම විශ්වවිද්‍යාල බාහිර උපාධි උගන්වන අයට ඒ පිළිබඳ ඇත්තේ අඩු අවබෝධයක්. මේ නිසා අපේ සිසුන් විවිධ අවස්ථාවල අපහසුතාවලට පත් වෙනවා. ඒ වගේම 2006/13 නමින් චක්‍රලේඛයක් ගෙනාවා. එයින් සඳහන් වුණේ, අභ්‍යන්තර සිසුන්ට සමාන ප්‍රමාණයක් බාහිර සිසුන් බඳවා ගත යුතු බවයි. නමුත් එසේ සමාන කිරීම වැරදියි. සෑම විශ්වවිද්‍යාලයකින්ම බාහිර උපාධි හදාරන්න බැහැ. ඒ වගේම සෑම වසරකම බාහිර උපාධි ලියාපදිංචිය කරන්නෙත් නැහැ. ජ'පුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ විෂය හැරුණු කොට 2016 වසරේ සිට මේ දක්වා කිසිම විශ්වවිද්‍යාලයකට මේ බාහිර උපාධි සඳහා බඳවා ගැනීම් කර නැහැ. .....මේ නිසා බාහිර උපාධි කප්පාදුවක් තමයි මේ සිදුවෙලා තියෙන්නේ "බාහිර උපාධි සුරැකීමේ සංවිධානයේ කැඳවුම්කරු මහේෂ් අඹේපිටිය පවසයි.

මේ වන විට මෙම ප්‍රශ්නය වැඩිවශයෙන් මතුවී ඇත්තේ කැලණිය , ජයවර්ධනපුර මෙන්ම රුහුණු, පේරාදෙණි විශ්වවිද්‍යාල සඳහාය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම පවසන්නේ ලියාපදිංචිය තාවකාලිකව අත් හිටුවා ඇත්තේ කලා සිසුන්ගේ පමණක් බවය. ඒ එහි විෂය මාලා රැකියා වෙළෙඳ පොළට සිරිලන පරිදි සංශෝධනය කරන්නට ගත් තීරණය නිසාය.

"විෂය මාලා වෙනස් කිරීම අපි කිසිසේත් එපා කියන්නේ නැහැ. එය අනිවාර්යයෙන්ම සිදුවිය යුත්තක්. නමුත් අපි කියන්නේ මෙය බාහිර අභ්‍යන්තර උපාධි දෙකටම සිදුවිය යුතුයි කියා. මොකද මේ විෂය මාලා දෙකම සමානයි. වෙනස් විය යුතුනම් ඒ දෙකේම වෙනස්කම් සංශෝධන සිදුවිය යුතුයි. ඒත් මේ ප්‍රතිසංස්කරණ හරහා අධ්‍යාපනය ලැබීමට තියෙන අවස්ථා අහිමි නොකළ යුතුයි. 1996 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ උසස් පෙළ විෂය 4 විෂයයන් තුනකට අඩු කළා. මේ නිසා දරුවන්ට උසස් අධ්‍යාපනයට පිවිසීමට තිබූ ඉඩ ප්‍රස්ථා අහිමි වුණා. අද රටේ විවිධ පුද්ගලික උසස් අධ්‍යාපන ආයතන බිහි වෙලා. එසේ නම් හතු පිපෙන්නාක් මෙන් බිහිවෙන ආයතනත් නියාමනය හා නවීකරණය විය යුතුයි".

කැලණිය විශ්වවිද්‍යාලයේ 2016 වසරේ සිට මේ දක්වා බාහිර උපාධි ලියාපදිංචිය කර නැහැ. රුහුණ විශ්වවිද්‍යාලයේ කොටසකගෙන් ලියාපදිංචියට මුදල් ගත්තා. ඒත් අද මේ සියල්ල නතර වෙලා. ඒ වගේම මෙහි ඇති ලොකුම ගැටලුව තමයි එසේ බඳවා ගත් අයටත් වසර දෙකකින් විභාග පවත්වා නැහැ. මේ නිසා කැලණිය විශ්වවිද්‍යාලයෙන් බාහිර උපාධි ලබා ගෙන පිටවීමට වසර 7-8 ක් පමණ යනවා. "ඒ බාහිර උපාධි ආචාර්ය සංසදයේ කැඳවුම්කරු මනෝජ් සංජීවය.

ඔවුන්ගේ චෝදනාවක් වන්නේ මෙම බාහිර උපාධි සඳහා අය කර ගන්නා මුදල් සම්බන්ධයෙනි. පසුගිය පාලන සමයේ රුපියල් 15,000 කින් පමණ ආරම්භ වූ මේ උපාධි මුදල නොදැනුවත්වම රුපියල් 65,000 දක්වා ඉහළ දමා ඇති බවකි. මේ වන විට එය රුපියල් 80,000 ක් දක්වා ඉහළ දමා ඇති බවත් එයින් බාහිර උපාධි ලබා ගැනීමට පැමිණෙන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට විශාල අගතියක් වන බවත් ඔවුන්ගේ චෝදනාවකි. බාහිර උපාධි ලියාපදිංචිය අපේක්ෂාවෙන් වසරකට 50,000- 60,000 ක් අතර සිසුන් පිරිසක් සිටින බවත් ඔවුන්ගේ අපේක්ෂා සියල්ල මේ වන විට නැතිවී ඇති බවත් ඔවුහු චෝදනා කරති. කෙසේ වෙතත් පසුගියදා උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදි මේ බාහිර උපාධිධාරීන්ට විශේෂ සැලකිල්ලක් ලබා දී ඇති බවත් එය මේ සටනේ එක් ජයග්‍රහණයක් වූ බවත් ඔවුහු පැවසූහ.

බාහිර උපාධි ලියාපදිංචිය සම්බන්ධයෙන් පනවා ඇති මේ බාධක පිළිබඳ විශ්වවිද්‍යාල උපකුලපතිවරු දැක්වූයේ මෙවන් අදහසකි. "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් අපට ලිඛිතව දැන්වූ පසුවයි, බාහිර උපාධි ලියාපදිංචිය තාවකාලිකව නැවැත්වූයේ. පසුගියදා උපාධිධාරීන් 50,000 කට රැකියා ලබා දීමේදී ඉන් විශාල ප්‍රමාණයක් ලැබුණේ බාහිර උපාධිධාරීන්ට. නමුත් ඔවුන්ට රැකියා ලබා දිමේදි නිපුණතා පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණා. මේ නිසා කලා බාහිර උපාධිධාරීන්ගේ උපාධියේ ගුණාත්මක බව ඇති කිරීමටත් ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ දැනුම ලබා දීමේ අරමුණින් ඒ විෂය මාලා සංශෝධනය කිරීමේ අරමුණ ඇතිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මේ තීරණයට පිවිසියේ. ඒ වගේම අපේ විශ්වවිද්‍යාලයටත් තවත් ගැටලුවක් තියෙනවා. අපි වසර 3 කින් බාහිර උපාධි ලියාපදිංචි කර නැහැ. මේ වසරේ ඒ ප්‍රශ්නය විසඳමින් සිටියේ. ඒත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ නියෝගය පරිදි මේ කටයුතු තාවකාලිකව නවත්වා තියෙනවා. බාහිර උපාධිධාරීන්ගේ ගැටලුවේදී රජය මතුකරන තර්කය ඉතා සාධාරණයි. "රුහුණු විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මෙසේ සඳහන් කරයි.

මේ වන විට බාහිර උපාධි බොහෝමයක් පිරිනමන කැළණිය විශ්වවිද්‍යාලයේද මතුව ඇති මේ ප්‍රශ්නයට හැකි ඉක්මනින් විසඳුම් දීමට එම පාලනාධිකාරිය කටයුතු සකස් කරමින් සිටියි.

"පසුගිය කාලයේ බාහිර උපාධි සඳහා සිසුන් විශාල පිරිසක් බඳවා ගත්තා. මෙයින් එක් අතකට විශාල ගැටලු රාශියක් මතු වුණා. ප්‍රශ්න පත්‍ර පරීක්ෂා කිරීම් මෙන්ම ප්‍රතිපල දීම පවා ප්‍රමාද වුණා. මේ නිසා අවස්ථා කිහිපයකදීම ලියාපදිංචි ප්‍රමාණය අඩු කරන්න උත්සහ ගත්තත් විවිධ බලවේග නිසා එය කළ නොහැකි වුණා. මේ අතර කැලණිය විශ්වවිද්‍යාලය තීරණය කළා, මේ පාඨමාලා සඳහා ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ විෂයන් අනිවාර්යය කරන්න. පසුගිය මාසවල අපි විභාග ප්‍රතිඵල කිහිපයක් නිකුත් කළා. ඒ අනුව සිසුන් 25,000 ක් පමණ පෙනී සිටි විභාගවලින් සමත් වී සිටියේ සියයට 10 යි. මේ නිසා සිසුන් විශාල පිරිසක් බඳවා ගැනීමේදි ප්‍රමිතිය අත්‍යවශ්‍යයි. දැන් අපේ විශ්වවිද්‍යාලයේ වසරකට මානව හා ශාස්ත්‍ර පීඨයට සිසුන් බඳවා ගන්නේ අභ්‍යන්තර සිසුන් මෙන් දෙගුණයක්. ඒ 2600 කට ආසන්න පිරිසක්. අඩු පිරිසක් බඳවා ගැනීමෙන් උපාධියේ ගුණාත්මක බව වැඩි කරන්න පුළුවන්. කෙසේ වෙතත් කැලණි විශ්වවිද්‍යාලයේ මතුව ඇති ප්‍රශ්න වහා විසඳන්නට මේ වන විට කටයුතු යොදා තියෙනවා..." ඒ කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිනි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා ගේ අදහසයි. කෙසේ වෙතත් බාහිර උපාධිධාරීන්ගේ ගැටලු පිළිබඳ මතු කරන තර්කයන්ට සාධාරණ මග පෙන්වීමක් ලබා දිමට මේ වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව කටයුතු යොදමින් පවතියි.

"අපි කිසිම විටක බාහිර උපාධි ලියාපදිංචිය නවත්වලා නැහැ. දැනට සියලුම කලමනාකරණ, තොරතුරු තාක්ෂණ මෙන්ම ශාස්ත්‍ර පීඨ සියලුම බාහිර උපාධි ක්‍රියාත්මකයි. තාවකාලිකව නවත්වා ඇත්තේ කලා බාහිර උපාධි පමණයි. අද රැකියා විරහිත උපාධිධාරීන්ගේන් තුනෙන් දෙකක් පමණ ශාස්ත්‍ර පීඨයේ උපාධිධාරීන්. මේ අයගෙනුත් බහුතරයක් බාහිර උපාධිධාරීන්. මේ අය අමාරුවෙන් උපාධි ලබා ගත්තත් රැකියාවක් නැතිනම් වැඩක් නැහැ.

ඒ නිසා මෙතැන යම් ප්‍රශ්නයක් තියෙනවා. මේ නිසා අපි නැවතත් ලංකාවේ සියලුම ශාස්ත්‍ර පීඨ උපාධිධාරීන් පිළිබඳ සලකා බැලීමක් කරනවා. ඒ වගේම කැළණිය විශ්වවිද්‍යාලයේත් යම් ප්‍රශ්නයක් තියෙනවා. මෙහි එක වසරකට 20000 කට අධික ප්‍රමාණයක් ලියාපදිංචි වෙලා තියෙනවා. නමුත් අපි රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියටම එදා වසරකට බඳවා ගත්තේ සිසුන් 25000 ක්. වැඩිපුර බඳවා ගැනීමෙන් ආචාර්යවරුන්ගේ ගැටලු මතු වෙනවා.

ප්‍රශ්න පත්‍ර පරීක්ෂා කිරීමේ ගැටලු මතු වෙනවා. මේ නිසා අපි බාහිර උපාධි ලියාපදිංචි වීම් ප්‍රමාණය අඩු කළා. කෙසේ වෙතත් තාවකාලිකව ලියාපදිංචිය අත්හිටුවා ඇති කලා උපාධිධාරීන් ලියාපදිංචි කිරීම් කටයුතු නැවතත් හැකි ඉක්මනින් ආරම්භ කෙරෙනවා." ඒ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංගය. කෙසේ වෙතත් බාහිර උපාධිධාරීන් වෙනුවෙන් කතා කරන සංවිධාන වල ඉල්ලීම් වන්නේ බාහිර උපාධි අපේක්ෂකයන්ට හැකි ඉක්මනින් සාධාරණයක් ඉටු කරන ලෙසයි.

අඩු මිලට බෙඩ් ෂීට් ලස්සන ඩිසයින් වලින් ඩබල් බෙඩ් ෂීට් අපේ මිල
රු.290/-යි වෙළඳපළේ මිල රු.600/-යි, ඩබල් බෙඩ් ෂීට් කොට්ට උර දෙක සමඟ අපේ මිල රු.390/-යි වෙළඳපළේ මිල රු.800/-යි, ට්‍රිපල් බෙඩ් ෂීට් කොට්ට උර දෙක සමඟ අපේ මිල රු.490/-යි වෙළඳපළ මිල රු.950/-යි, තවත් බෙඩ් ෂීට් වර්ග 70ක්, තුවා, ලේන්සු, සරොන්, නයිට්ඩ්‍රස්, පාසල් ළමුන්ගේ මේස් රු.40/-, Cotton මේස් රු.90/-, සර්වියට් රු.30/- සිට, කොට්ට රු.350/- සිට, මෙට්ට කවර 3x6- රු.490/-, 4x6-රු.590/-, 5x6-රු.690/-, 6x6-රු.790/-, තොග මිලට ලබා ගත හැක
සැමිර්විටා ක්ලෝතින් අවුට්ලට් ගුරුගේ නේවර් පාර්ක් අසල, ජා-ඇල.
0771 964 341 / 0117 902 278

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

අර්ධකාලීන සන්ධ්‍යා සහ සති අන්ත පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

- කර්මාන්තශාලා පුහුණුව (WP1)
- මෝටර් කාර්මික ශිල්පීය (M1,M2,M3,M10)
- වාහන විදුලි ශිල්පීය (E3,EA)
- බල විදුලි ශිල්පීය (E5,EM,EM2)
- යාන්ත්‍රණ ශිල්පීය (T1,T2,T3)
- සැලැසුම් ශිල්පීය ගෘහ/යාන්ත්‍රික (CD1-3,MD1-3)
- AutoCAD 2D/3D
- පෑස්සුම් ශිල්පීය (W1,W2,W3)
- ඉන්ධන පොම්ප ශිල්පීය (M4,M5)
- ද්‍රව හා වායු පීඩන ශිල්පීය හයිඩ්‍රොලික් සහ නියුමැටික් (HP1,HP2)
- Automobile Colour Technician (ACT1)
- යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව (MF)
- ත්‍රීරෝද රථ අලුත්වැඩියාව (M6)
- ඉලෙක්ට්‍රොනික ශිල්පීය (E2)
- මයික්‍රෝ කොන්ට්‍රෝලර් (MCR1)
- කර්මාන්තශාලා ස්වයංක්‍රීයකරණය (PLC1, PLC2)
- ශීතකරණ හා වායු සමීකරණ ශිල්පීය (RAC1, RAC2, RAC3)
- වාහන බොඩි අලුත්වැඩියාව හා පින්තාරු ශිල්පීය (AP1, AT1)
- CNC තාක්ෂණය - T4, T5,CNC/M/01,CNC /M/02,CNC/T/01
- වාහන හිමියන් සඳහා මෝටර් කාර්මික ශිල්පය (M7)
- හයිබ්‍රිඩ් තාක්ෂණය... ආදී පාඨමාලා රැසක්

සන්ධ්‍යා පාඨමාලා ප.ව. 3.30 - ප.ව. 6.00
සති අන්ත පාඨමාලා පෙ.ව. 8.00 - ප.ව. 4.30

අයදුම්පත් 2020 ඔක්තෝබර් මස 15 දිනට පෙර පහත ලිපිනයට යොමු කළ යුතු වේ
අයදුම්පත් ආයතනයට පැමිණ හෝ වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය

වැඩි විස්තර
www.cgtti.lk
0112623490 / 0112605625 / 0112605535

පාඨමාලා ආරම්භය නොවැම්බර් අගදී...

ලේඛකාධිකාරී,
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,
582, ගාලුපාර, ගල්කිස්ස, (අඟුලාන හන්දිය අසල)

தினக்குரல் தினகரன் வலம்புரி தமிழ் Mirror



ඉකුත් සතියේ දෙමළ මාධ්‍ය කී දේ...

● ටී චන්ද්‍රසේකර ගෙන්

නව ව්‍යවස්ථාවෙන් දෙමළ ගැටලු විසඳෙයි

යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් දෙමළ ජනතාවගේ ගැටලුවලට විසඳුම් ලැබෙන අතර කාලීන අවශ්‍යතාව වී ඇත්තේ 19 වැනි සංශෝධනය මුළුමනින්ම අහෝසි කොට 20 වන සංශෝධනය ගෙන ඒම බව යාපනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී අංගජන් රාමනාදන් යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවසීය. - *උදයන්*

යාපනයේ වෙළෙඳසැල් රාත්‍රී 10 තෙක් විවෘත කරන්න ජනපතිගෙන් උපදෙස්

යාපනය නගරයේ පිහිටි සියලු වෙළෙඳ සැල්, ඖෂධ හල්, ආපනශාලා සියල්ල රාත්‍රී 10 වනතුරු විවෘත කිරීමට උපදෙස් දී ඇති අතර එතුළින් ජනතාවට විශාල සහනයක් ලැබෙනු ඇත. - *උදයන්*

පළාත් සභා හි කිසිදු වෙනසක් නෑ: ඉන්දීය සබඳතාවට කිසිදු හානියක් වන්නේ නෑ.
වවුනියාවේදී විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන කියයි

20 වන සංශෝධනයේ පළාත් සභා පිළිබඳ කිසිවක් සඳහන්ව නොමැති බවත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේද පළාත් සභා පිළිබඳ කිසිඳු සංශෝධනයක් ගෙන නොඑන නිසා ඉන්දියාව සමග පවතින සබඳතාවයට එයින් කිසිදු හානියක් ඇති නොවන බවත් විදේශ කටයුතු ඇමති දිනේෂ් ගුණවර්ධන පැවසීය. - *වලම්පුරි*

යාපනය නගරයේ මහ දවාලේ කඩු කල්ලියක් වැඩ පෙන්වයි

යාපනය නගරයේ ඊයේ මහ දවල් කඩු කල්ලියක ප්‍රහාරයකින් තරුණයකු බරපතළ තුවාල ලැබීය. එසේ තුවාල ලබා ඇත්තේ තවත් කලහකාරී කල්ලියක සාමාජිකයකු බව පැවසේ. -*තිනක්කුරල්*

20 න් සියලු ප්‍රශ්න විසඳෙන්නේ නෑ. ඇමති ජී.ඇල්.පීරිස්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනයෙන් සියලු ප්‍රශ්නවලට විසඳුම් ගෙන එන්නට නොහැකි අතර 20 තාවකාලික ක්‍රියාදාමයක් වන බව අධ්‍යාපන ඇමති මහචාර්ය ජී. ඇල්.පීරිස් පවසයි. - *තිනක්කුරල්*

20 ගැන අපේ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණ අර්ථ නිරූපනයෙන් පසුව- කඳුරට ජනතා පෙරමුණ නායක රාධාක්‍රිෂ්ණන්

"20 වන සංශෝධනයේ අඩුපාඩු රැසක් තිබෙනවා. එය අභියෝගයට ලක්කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් ඉදිරිපත් වී තිබෙනවා. එනිසා 20 ගැන ශ්‍රේෂ්ඨාධිකරණ අර්ථ නිරූපනයෙන් පසු අපේ තීරණය ප්‍රකාශයට පත් කරනවා." යැයි කඳුරට ජනතා පෙරමුණ නායක රාධාක්‍රිෂ්ණන් නුවරඑළියේ පැවැති මාධ්‍ය හමුවක දී පැවසීය. - *තිනක්කුරල්*

13 මුළුමනින් ම ක්‍රියාත්මක කරන්නැයි අගමැති මෝදි බල කළා ව්‍යවස්ථාවට ඇතුළත් කරුණක් නිසා අවුලක් නෑ
- ඇමති ඩග්ලස් දේවානන්දා

ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි පළාත් සභා ක්‍රමය මුළුමනින් ම ක්‍රියාත්මක කරන්නැයි බල කළා. එහෙත් එය කල්තියාම ව්‍යවස්ථාවට ඇතුළත් වූ දෙයක් නිසා එය ක්‍රියාත්මක කිරීමට රජයට කිසිදු ප්‍රශ්නයක් නොමැති බව ධීවර ඇමති ඩග්ලස් දේවානන්ද මහතා පැවසීය.

වීරකේසරි -

සජිත් පොරොන්දු කඩකළා අසාද් සාලි සජිත් ගෙන් නිදහසට කරුණු විමසයි පිළිතුරු නොදුන්නහොත් නඩු මඟට

පොරොන්දු කඩකිරීම පිළිබඳව නිදහසට කරුණු විමසා විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසට එරෙහිව එන්තරවාසියක් යැවීමට ජාතික එක්සත් පෙරමුණ තීරණය කර ඇත.

ඉකුත් මහ මැතිවරණයේදී ජාතික එක්සත් පෙරමුණ දිස්ත්‍රික්ක 4 කට තනිවම තරඟ කිරීමට නාමයෝජනා සකස්කර තිබියදී අවසන් මොහොතේ සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාසගේ ඉල්ලීමට හා ජාතික ලැයිස්තුවෙන් තමන්ට ඉඩක් දෙන බවට දුන් පොරොන්දුවට අනුව සජිත් පිළේ තරග කිරීමට තීරණය කළ බවත් මැතිවරණයෙන් පසු ඔහු ඒ පොරොන්දු කඩකිරීම නිසා වන්දි ඉල්ලා නඩු පැවරීමට එන්තරවාසියක් යැවීමට තම පක්ෂය තීන්දු කළ බවත් අසිද් සාලි සඳහන් කළේය. - *වීරකේසරි*

විපක්ෂ නායකගේ රැළියට ගල්මුල් ප්‍රහාරයක් සැකපිට 3ක් අත් අඩංගුවට

සමගි ජනබලවේගයේ නායක හා විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස පෙරේදා ගල්කිස්ස බංගලාව වීදියේ නිවාස සංකීර්ණයේ පැවැති රැළියකට සහභාගිවෙමින් සිටිය දී ගල්මුල් ප්‍රහාරයක් එල්ල විය. මෙම සිදුවීම සම්බන්ධයෙන් ගල්කිස්ස රස්ඩම්වත්ත ප්‍රෙදශයේදී පුද්ගලයන් තිදෙනකු පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන ඇත. - *තමිල් මිරර්*

21/4 ප්‍රහාරය උණුසුම් වෙයි මෛත්‍රීට එරෙහිව අලුත් චෝදනා

පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනට එරෙහිව කතෝලික සංවිධානයේ නායක ශිරන්ත අමරසිංහ විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අලුතින් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබේ.

පසුගිය රජය ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් දැක්වූ නොසැලකිලිමත්කම නිසාම එම අපරාධය සිදු වූ බවත් එහි සඳහන් වේ.

තමිල් මිරර්

සිසුන්ගේ හඬට කන් දී තීරණ ගත්තාදැතුරු නැඟෙනහිර සංවර්ධන සැලසුම් රැසක් ආරම්භ කළා අගමැති කියයි

කොරෝනා සමයේ පාසල් වසා දැමුවත් අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපන කටයුතු සිදුකළත් දරුවන්ගේ ඉල්ලීමට කන්දෙමින් පාසල් යළි ආරම්භ කළ බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා කොළඹ හින්දු විදුහලේ දී පැවසීය. - *තමිල් මිරර්*

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ගැටලුවක එ.ජා මහ ලේකම් ගෙන් නිවේදනයක්

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ගැටලුකාරී තත්ත්වයක පවතින බව පවසන එ.ජා.මහ ලේකම් ඇන්ටෝනියෝ ගුඩ්ඩේරස් ඒ පිළිබඳ කනගාටුව පළකර තිබේ. - *තමිල් මිරර්*

සිංහල දේශයට 20 අනතුරුදායකයි ! ශ්‍රී ලංකාව දේශයන් කිහිපයකින් සමන්විත දූපතක්

"ශ්‍රී ලංකාව බහුතර සිංහල ජාතියට පමණක් අයිති රටක් නොවෙයි. දේශයන් රැසකින් සමන්විත රටක් බව සිංහල ජනතාව පිළිගත යුතුයි" යැයි දෙමළ ජාතික ජනතා පෙරමුණේ නායක ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් පැවසීය.

කොළඹ ජාතකි හෝටලයේ පැවැති මාධ්‍ය හමුවක දී හෙතමෙ ඒ බව පැවසීය. - *තිනක්කුරල්*

දෙමළ සන්ධානය සමඟ ඉන්දියාව කතා නොකළ යුතුයි 13 වන සංශෝධනය ගැන වෙනත් රටවල් තීරණ නොගත යුතුයි. - රාජ්‍ය ඇමති සරත් වීරසේකර

ඉන්දීය අගමැතිවරයා ඝාතනය කළ කොටින්ගේ අතකොලුවක් වූ දෙමළ ජාතික සන්ධානය සමඟ ඉන්දියාව සාකච්ඡා නොකළ යුතුයි. එයද ඉක්මවා සාකච්ඡා කළහොත් එය තමන්ගේ අගමැතිවරයා පාවාදීමක් වනු ඇතැයි පළාත් සභා පළාත් පාලන රාජ්‍ය ඇමති සරත් වීරසේකර පැවසීය. - *තිනක්කුරල්*

20 ට අධිකරණයෙන් විසඳුම් සෙවීම සුදුසුයි - කතානායක කියයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනයට එරෙහිව 39 දෙනෙකු අධිකරණය හමුවට ගොස් තිබේ. එබැවින් මෙවැන්නක් අධිකරණය තුළින් විසඳා ගැනීම සුදුසු බව කතානායක මහින්ද යාපා අබේවර්ධන පැවසීය. - *වීරකේසරි*

උඩු යටිකුරු වූ මංගලගේ කුරුඳු පොලු ප්‍රහාරය

● සටහන හා ඡායාරූප
ජයසිරි පේදුරුආරච්චි

ශ්‍රී ලංකාව ගැන මුළු ලෝකයේම අවධානයට ලක්වූ දින අතර 2013 ඔක්තෝබර් 05 දිනය ද විශේෂිතම දිනයකි. ඒ මෙරට දේශපාලනයේ නිරතුරු කතාබහට ලක්වන මංගල සමරවීර මහතාගේ කුරුඳු පොලු ප්‍රහාරයේ කතාවත් සමඟය.

එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහගේ නායකත්වයට අභියෝග කරමින් දෙවිනුවර නගරයෙන් ඇරඹි විරෝධතා පාගමන අතර ඇති වූ ගැටුම් සහගත තත්ත්වය මුළු ලෝකයේම අවධානය දිනාගත් සිදුවීමක් බවට පත්විය. මේ සම්බන්ධයෙන් වූ නඩුව වසර හතක් පුරා ක්‍රියාත්මක වූ අතර නඩු දෙකකට අදාළ තීන්දුව සැප්තැම්බර් 30 දින ප්‍රකාශයට පත්වූයේ දෙපාර්ශ්වය අතර සමථයකට පත්වෙමිනි. ඒ මංගල සමරවීර ඇතුළු විත්තියේ පාර්ශ්වය මෛත්‍රී ගුණරත්නගේ පැමිණිලි පාර්ශ්වයෙන් කරන ලද ඉල්ලීම මතය. ඒ අනුව මංගල සමරවීර ඇතුළු සැකකරුවන් හැට දෙදෙනෙකුට චෝදනා වලින් නිදහස්වීමේ අවස්ථාව ලැබුණු අතර; සිදුවීමට අදාළව ක්‍රියාත්මක වන පහරදී ශබ්දවාහිනී යන්ත්‍රයක් පැහැරගැනීමට අදාළ නඩුව මෙම මස 26 වැනි දින යළි කැඳවීමට නියමිතය.

විසිහතර වතාවක් තම පක්ෂය පැරදවූ බවට තම නායකයාට චෝදනා කළ එවක දකුණු පළාත් සභාවේ හා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන් ලෙස සිටි මෛත්‍රී ගුණරත්න සහ ශිරාල් ලක්තිලක යන අයගේ නායකත්වයෙන් "පැරදුණා ඇති - රනිල් යන්න" යන තේමාව යටතේ විරෝධතා පාගමන සංවිධානය කොට තිබුණ අතර රනිල් වික්‍රමසිංහගේ සහායට මංගල සමරවීර, දකුණු පළාත් සභා මන්ත්‍රී ගයාන් සංජීව, මාතර නගර සභා විපක්ෂ නායක උපුල් නිශාන්ත, මාතර ප්‍රාදේශීය සභා විපක්ෂ නායක ලයනල් කොඩිකාර යන අය හා කොළඹ ඇතුළු ප්‍රදේශ කීපයකින් පැමිණි රනිල් හිතවාදී කණ්ඩායමක් ද විය.

මෛත්‍රී ගුණරත්න හා ශිරාල් ලක්තිලක කොළඹට යෑමට සූදානම්ව තිබූ "රනිල් යන්න" යන පාගමන මාතරින් එහාට යෑමට නොදීමට මාතර එක්සත් ජාතික පක්ෂ ප්‍රබලයාට අවශ්‍යව තිබිණි. ඒ නායකත්වයේ ද උපදෙසින් විය හැකිය. 2005 ජනාධිපති මැතිවරණයේ දී "රනිල්ට බෑ" කියා රනිල් ගෙදර යෑවීමට සියලු තුරුම්පු ගැසූ මංගල සමරවීර මහතා රනිල් විරෝධි පා ගමන මාතරදී නතර කිරීමට ඉදිරිපත් වීම දෛවයේ සරදමක්ව තිබුණේය.

ඔක්තෝබර් 5 වැනිදා උදෑසන දෙවිනුවරින් ඇරඹි පාගමන මීටර් කීපයක් ඉදිරියට ගමන් කිරීමේදී දෙවිනුවර නුගේ ලඟදී මාතර දෙසින් පැමිණි මංගලගේ කණ්ඩායම හා පළමු ගැටුම ඇතිවුණේය. ඉන් මෛත්‍රී ගුණරත්න මහතාගේ පුතා තුවාල ලබූ අතර මෛත්‍රී ගුණරත්න කණ්ඩායමේ ප්‍රහාරයෙන් පසුබසින්නට මංගල කණ්ඩායම සිදුවූයේ පැමිණි බස් රථ වලට ද අලාභහානි සිදු කර ගනිමිනි.

හිටපු ඇමැති
මංගල සමරවීර

වෙඩි ප්‍රහාරයට ලක්වූ
ක්‍රිෂාන්ත පුෂ්පකුමාර

බී. ජී. ප්‍රියන්ත
(පොඩි කඩේ ප්‍රියන්ත)

මෛත්‍රීලා මාතර දෙසට ගමන්කරද්දී මංගලගේ ගෝලබාලයන් යළි රහුණ විශ්වවිද්‍යාලය අසලදී ද ප්‍රහාරයකට ලක්වූයේ බස් රථ වලින් යළි මාතර බල පසුබස්සද්දී ය. එහෙත් විරෝධතා පාගමන නැවැත්වීමේ පළමු උත්සාහය අසාර්ථක වුව ද මංගල සමරවීර ඇතුළු කණ්ඩායම සැලසුම් සහගත ලෙස යළි සූදානම්වූයේ කොළඹ බලා යන විරෝධතා පාගමන කෙලෙස හෝ නැවැත්වීමේ අටියෙනි. කණ්ඩායම සූදානම්ව ස්ථානගතවී සිටියේ මාතර දොඩම්පල අසලය. ඒ ගැන විරෝධතා පාගමනනේ යෙදෙන අයට කල්තියා වාර්තා වූයෙන් ඒ දෙසට කලින්ටත් වඩා වැඩි ජවයකින් ගමන්කරනු දක්නට විය. ගතවූයේ නිමේෂයකි. මාතර මහ නගරසභාව අසල පුංචි යුද්ධයක සිරි ගත්තේය.

වසර 7 කට පෙර මාතරදී සිදුවූ කුරුඳු පොලු ගැටුම දෙපාර්ශවයේම එකඟත්වයෙන් සමථයට

මාතර බෝධිය අසලට රැස්වූ පාගමනට එරෙහි වන්නන් රනිල් විරෝධී පෙළපාලිය එනතුරු විනාඩි 45 ක් පමණ එතැන රැඳී සිට තිබේ. ඒ කාලය ඇතුළත ඔවුන්ව දෙවරක්ම පොලිසිය විසින් විසිරුවා හැර තිබුණත් කලහකාරීන් ඒ ප්‍රදේශයේ ගැවසෙන සෙනඟ අතර දිගටම රැඳී සිට ඇත. එමෙන්ම කුරුඳු පොලු, අසල කාණුවල හා පලතුරු කඩවල තට්ටු යට සඟවා තිබී ඇත. කුරුඳු පොලු එළියට ආවේ රනිල් විරෝධී පෙළපාලිය පෙනෙන තෙක් මානයට පැමිණි පසුවය. දෙපිරිස අතර ප්‍රහාරයේදී පොලු, මුගුරු, ගල්මුල්, බෝතල් ද පහරදීම සඳහා යොදාගෙන තිබූ අතර වෙඩිතැබීමක් ද සිදුව තිබුණි. ඉන් තුවාල ලැබූ පිරිස පහළොවකි.

සිදුවූ සියල්ලේම වගකීම මංගල සමරවීර පිටින් යන තත්ත්වයක් නිර්මාණය වී තිබුණේය. ඒ නීත්‍යානුකූල පොලිස් අවසර මත ගමන්ගත් පොළපාලියට නීත්‍යානුකූල නොවන අයුරින් රැස්වී බාධා කිරීම නිසාය. ගැටුම්කාරී තත්වයෙන් පසු පොලිසිය විසින් අදාළ සිදුවීම්වල වීඩියෝ පට නැරඹීමෙන් පසු සිද්ධියට අදාළ පිරිස් අත්අඩංගුවට ගැනීමට කටයුතු කළේය. මහෙස්ත්‍රාත්වරයාගේ නියෝගය පරිදි ඔවුන් මංගල සමරවීර ද උසාවියට ඉදිරිපත් කළ අතර ඔහුට ඇප ලැබුණේ පොලීසිය ඊට විරුද්ධ නොවීම නිසාය. එහෙත් පහරදීමට සම්බන්ධවූ ඔහුගේ ගෝල බාලයින්ට බන්ධනාගාර ගතවන්නට සිදුවූහ.

මංගල සමරවීර පොලිසියට බාරවීම සඳහා පැමිණි අයුරු කාටත් විශේෂත්වයක් විය. ඒ ඔහු පැමිණෙන විට රිමාන්ඩ් භාරයට යෑමට සූදානම්ව "සිලි සිලි" මල්ලක සරමක්, තුවායක්, සබන්, දත් බෙහෙත්, දත් බුරුසු, ඖෂධ ආදිය ද රැගෙන පැමිණි නිසාය. ඔහු පොලිසියට බාර වන බවට කල් තියා දැනුම් දී තිබුණු නිසා එදින විශාල සෙනගක් පොලිසිය වට කරනු ඇති බවට බලාපොරොත්තුවක් විය. මංගල විසින් මාතර දිස්ත්‍රික්කයේ රැකියා දුන් අයගෙන් සුළු ප්‍රතිශතයක් හෝ පැමිණියේ නම් එය මහා සෙනගක් වනු ඇත. නමුත් මංගල පැමිණියේ ඔහුගේ සොහොයුරියත්, නීතිඥ නිස්සංක නානායක්කාරත්, තව කිහිප දෙනෙකුත් සමඟය.

එදින පස්වරුවේ ඔහුට ඇප දුන් අවස්ථාවේදී උසාවියෙන් පිටත ඔහුව පිළිගැනීමට කිසිවෙක් නොසිටීම ද විශේෂත්වයක් විය. එයට ඔහු වෙනුවෙන් මෙවැනි දේ සංවිධානය කිරීමට සිටි අය සියලු දෙනාම ඒ වන විට රිමාන්ඩ් භාරයේ සිටීම හේතුවන්නට ඇත. ඒ වන විටත් දිස්ත්‍රික්කයේ සියලුම එක්සත් ජාතික පක්ෂ ප්‍රබලයින් මංගලව මගහැර සිටීම තවත් හේතුවක් විය. ඒ වන විට රනිල් වික්‍රමසිංහගේ කිට්ටුවන්තයකු වන සාගල රත්නායක සිදුවීමේ නොසිටීම විශේෂ අවස්ථාවක් විය. ඒ වන විට බුද්ධික පතිරණ සිදුවූ කිසිදු අවස්ථාවකට ප්‍රසිද්ධ සම්බන්ධයක් නොපෙන්වූයේ ඔහු ඒ වන විට සජිත් ප්‍රේමදාසගේ කණ්ඩායම සමග සිටි නිසාය. නමුත් මංගලට රනිල් වෙනුවෙන් බෙල්ල දීමට සිදුව තිබුණේය.

මංගල සමරවීරට අමතරව අග්‍රාමාත්‍ය හිටපු පෞද්ගලික ලේකම් සුගත් චන්ද්‍රසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ව සිටි සන්දිත් සමරසිංහ, ලක්ෂ්මන් විජේමාන්න, එක්සත් ජාතික පක්ෂ කළුතර දිස්ත්‍රික් කළමණාකාරු ප්‍රසාද් හෙට්ටිආරච්චි, මංගල සමරවීරගේ මහජන සම්බන්ධතා නිලධාරී සමීර මනහර, දකුණු පළාත් සභා මන්ත්‍රීවරුන්ව සිටි බී. ජී. චන්දන ප්‍රියන්ත, ගයාන් සංජීව, ක්‍රිෂාන්ත පුෂ්ප කුමාර, හබරාදූව හිටපු සංවිධායක ලයනල් ඉපිලවත්ත, මාතර මහ නගර සභාවේ විපක්ෂ නායක උපුල් නිශාන්ත, මාතර හිටපු නාගරික මන්ත්‍රීවරුන් වන නුෂ්කි ඉක්බාල්, නලීන් අබේගුණවර්ධන, ජගත් නල්ලපෙරුම, එක්සත් ජාතික පක්ෂයේ බලපිටිය හිටපු සංවිධායක නීතිඥ කමල් ද සොයිසා, හිටපු නාගරික මන්ත්‍රී නීතිඥ නදිල මාලගොඩ, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එච්. ආර්. විමලසිරි, මාතර ප්‍රාදේශීය සභාවේ හිටපු විපක්ෂ නායක ලයනල් කොඩිකාර, දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති හේමසිරි කොඩිතුවක්කු, එක්සත් ජාතික පක්ෂයේ මාතර දිස්ත්‍රික් මාධ්‍ය ලේකම් උදයංග සඳරුවන්, අමාත්‍ය සාගල රත්නායක මහතාගේ කාර්යමන්ඩල නිලධාරී ලහිරු ජයසිංහ ගැරට්, අගලවත්ත සංවිධායක ගාමිණී නල්ලපෙරුම යන පිරිස මෙම නඩුවේ සැකකරුවෝ වූහ.

මෙම සිදුවීමට අදාළව වසර හතක් පුරා මාතර මහෙස්ත්‍රාත් අධිකරණයේදී නඩු තුනක් විභාගවෙමින් තිබූ අතර එම කාලය තුළ සිද්ධියට සම්බන්ධ වූවන් රැසක් විවිධ දේශපාලන ක්‍රියාකාරකම් රැසකට එක්ව සිටියහ. ඒ අතර පිල් මාරුකිරීම විශේෂය. එදා සජිත්ට එරෙහිව රනිල් රැකි මංගල සමරවීර, රනිල් වික්‍රමසිංහගේ නායකත්වය අමතක කර සජිත් ප්‍රේමදාස සමග එක්ව සිටියේය. පසුව ඉන් ද ඉවත්ව ගියේ කතා රැසකට මග පාදමිනි.

මෛත්‍රී ගුණරත්න මහතා හා ශිරාල් ලක්තිලක, හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන හා එක්වෙමින් තනතුරු ලබාගත් අතර පසුව සජිත් ප්‍රේමදාසගේ සමගි ජන බල වේගය සමග එක්ව මහ මැතිවරණයට ද තරග කළේය. දකුණු පළාත් සභා මන්ත්‍රීවරයකුව සිටි හා පසුගිය මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මාතරට තරග කළ බී. ජී. ප්‍රියන්ත (පොඩි කඩේ ප්‍රියන්ත) ද මහ මැතිවරණය අතර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමග එක්වූයේ ලක්ෂ්මන් යාපා අබේවර්ධනට සහාය දක්වමිනි.

'විජය ගුරු උපහාර උලෙළ' 5දා මාතලේදී

මාතලේ විජය ජාතික පාසලේ ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධාන කරන 'විජය ගුරු උපහාර උලෙළ' මේ මස 5දා පස්වරු 5.30ට මාතලේ ගාන්ධි උත්සව ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධාන කර ඇත.

විජය ජාතික පාසලේ සේවය කොට විශ්‍රාම ගොස් සිටින ගුරුවරුන් වෙත උපහාර පිදීම මෙහි අරමුණ වී තිබෙන අතර උපහාර උලෙළ මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. ඒ අනුව මෙහිදී විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන් ඇතුළු ගුරුවරුන් 40 දෙනෙකු වෙත උපහාර පිරිනැමීමට නියමිතව තිබෙන අතර එළඹෙන 5දාට යෙදෙන ලෝක ගුරු දිනය නිමිත්තෙන් විජය විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසින් මෙය සංවිධාන කරයි. ශ්‍රී ලංකාවේ ජනප්‍රිය කලාකරුවෝද මේ අවස්ථාවට සහභාගි වෙති.විජය ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මේ අවස්ථාවට සහභාගි වන ලෙස ද ඉල්ලීමක් කරයි.

ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය මගින් සංවිධානය කළ මධ්‍යම පළාත් ගුරු පුහුණු වැඩමුළුව පසුගියදා මහනුවරදී පැවැත්විණි. කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ අංශාධිපති, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අරුණ ලොකුලියන හා කැලණිය විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝජ් පුෂ්පකුමාර ජිනදාස මහතා විසින් දේශන පවත්වන ලදි. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ සභාපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහින්ද පතිරණ මහතා, මධ්‍යම පළාත් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක කේ.පී. හේරත් බණ්ඩා මහතා, පුවත්පත් කොමසාරිස් නිරෝෂණ තඹවිට මහතා, සහකාර කොමසාරිස් අයේශ් විජයසිංහ මහතා, ගණකාධිකාරී කුෂාන් දේවප්‍රිය මහතා ද මෙම වැඩමුළුවට සහභාගි වූහ. ප්‍රධාන මේසයේ ආරාධිතයන් අසුන්ගෙන සිටි අයුරුයි මේ.

1 වැනි පිටුවෙන්

කොළඹ ගස්...

කොළඹ නගරයේ විටින් විට විශේෂයෙන් වැසි සමයේ දී සිදුවන ගස් කඩා වැටීමට හේතු සොයා පිළියම් හඳුනා ගැනීමේ අධ්‍යයන සමීක්ෂණයක් ජනාධිපති කාර්යාල පරිසර ඒකකයේ මෙහෙයවීමෙන් පසුගියදා සිදු කෙරිණි.

පේරාදෙණිය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය අචලා අත්තනායක, වනෝද්‍යාන අංශ භාර නිලධාරී සුනිල් ගමගේ, වනෝද්‍යාන අංශ භාර කොළඹ මහ නගර සභාවේ සහකාර නිලධාරී පසන් තරිඳු වික්‍රමසිංහ සහ නගර අලංකරණ නියෝජ්‍ය අධ්‍යක්ෂ තරංගා මුණිවීර යන මහත්ම මහත්මීහු අධ්‍යයන සමීක්ෂණයට සහභාගී වූහ. ජනාධිපති කාර්යාලයීය විශේෂ පැවරුම් හා පරිසර ඒකක නිලධාරීන්ගේ සහය ඔවුනට ලැබිණ.

ඩෙංගු රෝගීන්...

මේ නිසා සියලු දෙනාම තමන්ගේ නිවස අවට පාසල සහ ඒ අවට මෙන්ම ඩෙංගු මදුරුවන් බෝනොවන ආකාරයෙන් පවත්වාගෙන යා යුතු බව ජනතාවට අවධාරණය කර සිටින බවත් අධ්‍යක්ෂවරයා සඳහන් කරයි.

වනයට හානි කළ...

කැකිරාව, මලව්වැව, සෝමාවතිය, කිරිඳිඔය, කන්තලේ, ගලෙන්බිඳුණුවැව වැනි ප්‍රදේශවලින් එකී පැමිණිලි අදාළ පොලිස් ස්ථාන වෙත ලැබී ඇති බවද ඔහු පෙන්වා දුන්නේය. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව වැනි ආයතනවලද සහාය ලබා පැමිණිලි සියල්ලම කඩිනමින් විමර්ශන සිදු කර සැකකරුවන් අත්අඩංගුවට ගත් බවද ඔහු පෙන්වා දුන්නේය.

විද්‍යුත් අප ද්‍රව්‍ය...

මෙරට දී ප්‍රතිචක්‍රීකරණයට යොමු කරනු ලබන බවත් ඉතිරි කොටස් අදාළ ප්‍රතිචක්‍රීකරණ හා නිෂ්කර්ෂණ පහසුකම් සහිත රටවලට අපනයනය කරනු ලබන බවද ඔහු කීය.

සියලුම ඉලෙක්ට්‍රොනික උපාංගවල රසදිය, ඊයම්, කැඩ්මියම් ඇන්ටිමනි, බෙරලියම්, ආසනික් වැනි විවිධ විෂ රසායනික අඩංගුවන බැවින් එම අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීමෙන් සෞඛ්‍ය ගැටලු මෙන්ම පාරිසරික හානිද සිදු වන බව අමරසිංහ මහතා කීය.

වාර්ෂික දේවපූජෝත්සවය දඹහේන දේවාලයේ දී

මහරගම දඹහේන දේවාලයේ වාර්ෂික දේව පූජෝත්සවය දඹහේන දේවාලයේදී ඔක්තෝබර් මස 8 හා 9 දිනවලදී පැවැත්වේ. ඒ අනුව 8 වැනි දින අලුයම කිරි අම්මාවරුන්ගේ දානය හා 9 වැනිදා ශ්‍රී විෂ්ණු දේවාලය විවෘත කිරීම සිදුකෙරේ. 10 වැනි දින උදේ දේව දානය සහ ගරායක් නැටුම් පවත්වන අතර 11 වැනිදා සවස කාවඩි නැටුම් පවත්වනු ලැබේ.

උසස් පෙළට...

මේ වසරේ අගොස්තු මස පැවැත්වීමට නියමිතව තිබූ උසස් පෙළ විභාගය හා ශිෂ්‍යත්ව විභාගය කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් විභාගය පැවැත්වීම මාස දෙකකට කල් ගිය අතර කොවිඩ් වසංගත තත්ත්වය ලංකාවේ යම් පමණකට පාලනය කිරීමෙන් අනතුරුව ප්‍රසිද්ධ පාසල් විභාගයක් පැවැත්වෙන්නේ මෙවරය. ඒ අනුව දිවයිනේ උද්ගතව ඇති කොවිඩ් වසංගත ව්‍යාප්ත තත්ත්වය හේතුවෙන් විභාගය පැවැත්වෙන කාල සීමාව තුළ උද්ගත වන ඕනෑම හදිසි තත්ත්වයක් වෙනුවෙන් සූදානම් වීමට මේ වන විටත් විභාග දොපර්තමේන්තුව හා සෞඛ්‍ය අමාත්‍යාංශය අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතියි. උද්ගත වන හදිසි තත්ත්වයකදි අදාළ ප්‍රදේශවල රෝහල් සමග සම්බන්ධීකරණය වෙමින් ප්‍රතිකාර ලබා දීම සඳහා ගිලන් රථ හා අවශ්‍ය කාර්ය මණ්ඩල මෙන්ම රෝහල් වාට්ටු පහසුකම් සූදානම් කර තැබීමද මේ යටතේ බලාපොරොත්තු වෙයි. මේ කටයුතු සම්බන්ධීකරණය කිරීම පළාත් හා කළාප අධ්‍යක්ෂකවරු හරහා සිදුවෙයි.

දහසින් බැඳි පියලි නැති ගුරු දිනයක් සමරමු!

ජගත් ගුරු දිනය ඔක්තෝම්බර් 5දා

දකුණු ආසියාවේ අඩුම වැටුප් ලබන ගුරුවරු සිටින්නේ ලංකාවේ

මුදල් වවුචරපත් තැගි විලාසිතා එපා

අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ගුරුවරයා ප්‍රධාන කොටස්කරුවෙකු විය යුතුයි

වර්තමානයේ ගුරු සේවය කොළ පිරවීමකට සීමා වෙලා

● **සුභාෂිණී ජයරත්න**

ලොව වෙනස් කිරීම උදෙසා මානව සංවර්ධනයේ අති දැවැන්ත කාර්ය භාරයක් උසුලන්නේ ගුරුවරුය. මේ කර්තව්‍යයේදී ඇවැසි අධ්‍යාපනය සමාජගත කිරීමේ මහා යුග මෙහෙවර ගුරුවරු අතින් සිදුවන අතර එහි පෙර ගමන් කරුවෝ වන්නේද ගුරුවරුය.

මේ නිසාවෙන් එදත් අදත් ගුරුවරු සලකන්නේ ගුරු දෙවිවරු වශයෙනි. ගුරු භූමිකාවේ යම් යම් වෙනස්කම් කාලයත් සමඟ සිදු වුවද ගුරුවරු ජීවිත කාලය පුරාවටම සිය සිසු දරුවන්ගෙන් සැලකුම් ලබන්නට පිං කර ඇත. ගුරු පිදුම එක් දිනයකට පමණක් සීමා නොවූවද වසරක් පාසා ගුරු දිනයද අප රටේ සමරන්නේ ලංකාවේ 246,000 ක් වන ගුරුවරුන්ගේ විශිෂ්ඨ සේවය අගයනු වස්ය.

හෙට තවත් ලෝක ගුරු දිනයක් සමරන්නේය. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා හා සංස්කෘතික සංවිධානය විසින් ලෝක ගුරු දිනය ලෙස ප්‍රථම වරට සැමරූයේ 1994 වසරේ ඔක්තෝබර් මස 05 වන දින දීය. ඒ 1966 ඔක්තෝබර් මස 05 වන දින ප්‍රංශයේ පැරිස් නුවර පිහිටි යුනෙස්කෝ ප්‍රධාන මධ්‍යස්ථානයේ දී එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල නියෝජිතයින් එක්ව පවත්වන ලද මහා සමුළුවේදී ගුරු භූමිකාව, එහි අගය, ගුරුවරයාගේ සමාජයීය හා ගෝලීය මෙහෙවර, මෙන් ම ගුරු සේවයේ අභිවෘද්ධිය උදෙසා ඉතා වැදගත් සුවිශේෂ තීරණ තීන්දු රැසක් ගත් දිනය එදින වන නිසාය.

2016 ඔක්තෝබර් 05 වන දින ලෝක ගුරු දිනය ලොව බොහෝ රටවල උත්කර්ෂවත්ව සැමරූ අතර ලංකාවේ ගුරු ඇගැයීම සිදු වන්නේ ඔත්තෝම්බර් මස 6 වැනිදාය. පසුගිය කාලය පුරාවටම ගුරු දිනය සැමරූයේ සියල්ල දහසින් බැඳි පියලි මත තීරණය කරමිනි. මිල අධික භාණ්ඩ ලබා දීමෙන් එසේත් නැතිනම් මුදල් වවුචර් පත් ලබා දීමෙන් ගුරුවරුන් පිනවීම හා ගුරු පඩුරු පිරිනැමීම පසුගිය කාලයක් පුරාවටම දැකිය හැකි වූ අතර මේ සියල්ල ඉතා තරඟකාරී මට්ටමින් සිදුවීමද තවත් කනගාටුදායක සිදුවීමකි. මුදලේ ප්‍රමාණය තීරණය කරමින් මිල අධික වටිනාකමින් වැඩි තෑගි ලබා දීමෙන් ගුරුවරු පිනවන විට මුදල් නොමැති දෙමවුපියන්ට සිදුවූයේ බුලත් අතක් හෝ නිවසේ පිපුණු මලක් වැනි දෙයක් ලබා දි ගුරුවරු දෙපා නම දින්නටය. විලාසිතාවක් වූ මේ ගුරු දිනයේ තෑගි ලබා දීමෙන් ඇතිවන ඇති- නැති භේදය දරුවන් අතර පමණක් නොව ජනප්‍රිය නාගරික පාසල් අතරද පැහැදිලි බෙදුමක් නිර්මාණය විය.

ගුරුවරු වනාහි සිය මව පියා හා සමාන ගරුත්වයකින් සැලකිය යුතු පිරිසකි. එහෙත් මේ විලාසිතාව නිසා ගුරුවරුන්ගේ භූමිකාව හා ගරුත්වය කෙලෙසුනු අවස්ථාද ගුරු දිනයේ ඔනෑ තරම් දැකිය හැකි විය. ගුරු දිනය වෙනුවෙන් යැයි සඳහන් කරමින් දෙමවුපියන් අධික ලෙස පීඩාවට පත් කරමින් මුදල් ලබා ගැනීම් පසුගිය කාලයේ මහත් පීඩාවක් බවට පත් වූ කරුණකි. අධ්‍යාපන අමාත්‍යාංශ පසුගිය කාලයේ චක්‍රලේඛ නිකුත් කරමින් දැඩිව සඳහන් කළේ අනුමැතියකින් තොරව දෙමවුපියන්ගෙන් කිසිදු මුදලක් අය කර ගැනිම සම්පූර්ණයෙන්ම තහනම් වූ කටයුත්තක් බවයි. එහෙත් මේ පිළිබඳ සමාජගත වූ යම් යම් දෙමවුපිය පිරිස් ගුරු දිනය වෙනුවෙන් ගුරුවරුන් පිනවීමට මුදල් ලබා ගැනීම නිසා බොහෝ නැති බැරි දෙමවුපියන්ට සිදුවූයේ ණය වී හෝ තම දරුවාගේ නම්බුව ආරක්ෂා කිරීමටය.

මේ හේතුවෙන් 2016 වසරේ අධ්‍යාපන අමාත්‍යාංශයට සිදුවූයේ ගුරු දිනය සැමරීම වෙනුවෙන්ම නීති ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කරන්නටය. 33/2016 දරන චක්‍රලේඛය එවකට අධ්‍යාපන ලේකම්ව සිටි සුනිල් හෙට්ටිආරච්චි විසින් නිකුත් කළේ ගුරු දිනය වෙනුවෙන් ත්‍යාග ප්‍රදානය කිරීමේ දැඩි සීමා තහංචි පනවමිනි. මේ ආකාරයෙන් මුදල් එකතු කරමින් විවිධ තෑගි හෝ පිරිනැමීම ආර්ථික අපහසුතාවලින් පෙළෙන දෙමවුපියන්ට විශාල ප්‍රශ්නයක් මතුව ඇති බවත්, දරුවන්ට පාසල් තුළදි ඇතිවන එම මානසික පීඩනයක් ඇතිව ඇති බවත් මෙහිදි දැඩිව අවධාරණය විය. මේ නිසා මේ චක්‍රලේඛය හරහා එවැනි තෑගි එකතු කිරීම, මුදල් එක්රැස් කිරිම හෝ එවැනි ත්‍යාගයක් ලබා ගැනීම දැඩි ලෙස විනයානුකූල වරදක් බවත් සඳහන් කර ඇති අතර සෘජුව හෝ වක්‍රව එවැනි කටයුත්තක් සිදු කිරීම ආයතන සංග්‍රහ පනත අනුව හා අල්ලස් හෝ දූෂණ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් කොට තිබේ. මෙම චක්‍රලේඛයෙන් අනතුරුව පසුගිය වසර තුනක කාලයේදි සැරසිලි ලත් එවැනි ගුරු දින දක්නට නොමැති වීම එක් අතකට අධ්‍යාපන පද්ධතියේ සැනසුම් සුසුමක් විය.

වර්තමානයේ ගුරු වෘත්තිය සම්බන්ධයෙන් විවිධ ගැටලු මතුවීම නිතර අසන්නට ලැබෙන පුවතකි. ගුරු දිනයේ තුටු පඩුරින් ගුරුවරුන් පිනවීමට වඩා ඔවුන්ගේ ගැටලු වලට මුල් තැන ලැබීම අනිවාර්යයෙන් සිදුවිය යුත්තකි. ගුරු සේවයේ තෘප්තිමත් බව පිළිබඳව යම් යම් ගුරු සංගම් කතා කරන නිසාවෙන් ඵලදායි ගුරු සේවයක් ලබන්නට නම් ගුරු වෘත්තිය සඳහා සතුටුදායි පරිසරයක් නිර්මාණය විය යුතුය. ගුරුවරුන්ගේ දැනුම ප්‍රතිපෝෂණය වන ක්‍රියාමාර්ග ඇති කළ යුතු අතර ගුරුවරුන්ට තෘප්තිමත් වැටුපකට උරුම කම් කියන්නට සැලැස්විය යුතුයි.

ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝෂප් ස්ටාලින් මහතා පෙන්වා දෙන පරිදි දකුණු ආසියාවේ අඩුම වැටුප් ලබන ගුරුවරු ඇත්තේ ලංකාවේ බවය. හිටපු අධ්‍යාපන ඇමැතිවරයෙකුද වරෙක පවසා සිටියේ කොත්තු බාස්ටත් වඩා අඩු වැටුපත් රජයේ ගුරුවරු ලබන බවකි. ඔවුන්ට 2019 /2020 වැටුප් අරගල කරන්නටද සිදුවූයේ මේ හෙයිනි. ගුරු සංගම් විසින් කරන තවත් චෝදනාවක් වන්නේ වර්තමානයේ ගුරු භූමිකාව කොළ පිරවීමකට සීමා වී ඇති බවකි. පදනම් විරහිතව සිදුවන එම කොළ පිරවීම් නිසා ගුරුවරයාට සිය අපේක්ෂිත ඉගැන්වීමේ කාර්යය සිදු කරන්නට අද නොහැකි වී ඇත. ගුරුවරයාට තෘප්තිමත් ගුරු සේවයක් ලැබුණේ 1994 වසරේදීය. ඒ ශ්‍රී ලංකා ගුරු සේවය ඇති වීමෙනි. නමුත් බී.සි පෙරේරා වැටුප් කොමිසම හේතුවන් යළිත් ප්‍රශ්න මතුවූ අතර මේ වන තෙක් ඒ සම්බන්ධව වරින් වර මතුකළ යෝජනා ක්‍රියාත්මක නොකළ බව ගුරු සංගම් චෝදනා කරති. මේ පිළිබඳ අදහස් මතුකරන ගුරු සංගම් නිරන්තරයෙන් ඉල්ලීම් කරන්නේ ගුරු සේවය සඳහා වෘත්තික සභාවක් ඇති කරන ලෙසය.

ගුරුවරුන්ගේ යහපත සඳහා රජය පුළුල් ක්‍රියාමාර්ග රාශියක් ගත්තද ගුරු සංවර්ධනයේ මෙන්ම ගුරු ප්‍රතිපෝෂණ වැඩ පිළිවෙල ක්‍රියාත්මක වීම තවමත් ඇත්තේ පහළ තලයකය. ඒ සඳහා කරන්නාවූ ආයෝජනයේ ඵල දැයේ දරුවන්ටය. අද ගුරුවරුයාට පශ්චාත් අධ්‍යන හෝ කළමනාකරණ පුහුණු සඳහා ඇත්තේ ඉතා අඩු අවස්ථා වන අතර මේ සඳහා අය කරන මුදලද ගුරුවරුන්ට දැරිය නොහැකිය. මේ නිසා රජයේ වගකිම වන්නේ ඒ සඳහා අවස්ථාව සැපයීමය. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාතමක කරන්නා ගුරුවරයා හා විදුහල්පතිවරයාය. නමුත් වර්තමානයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හමුවේ ගුරුවරයාගේ හෝ විදුහල්පතිවරයාගේ ඇත්තේ අඩු නියෝජනයකි. වර්තමානයේ මේ කර්තව්‍යයේදි ඔහුගේ භූමිකාව වී ඇත්තේ ප්‍රේක්ෂකයකු පමණක් වීමය. මේ තත්ත්වය වෙනස් විය යුතුය. ගුරුවරයා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විෂයයේ ප්‍රධාන කොටස්කරු විය යුතුය.

ලොව අනිකුත් රටවල් හා සන්සන්දනයේදි හොඳම ගුරු සිසු අනුපාතයක් ඇති රටක් වන්නේ ලංකාවයි. ඒ සිසු ගුරු අනුපාතය 20 : 1 කි. නමුත් මේ ගුරු සිසු අනුපාතය නිවැරදිව තුලනය නොවීම තවත් ගැටලුවකි. වර්තමානයේ 20,000 ක ගුරු ඌණතාවයක් තිබුණද, දුෂ්කර ගුරුවරු සිය දුෂ්කර සේවය නිමකර නගරයේ පාසලකට යාමට නොහැකි වී ඇත්තේ නිසි ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම නිසාය. ගුරු තුලනයක් ඇති කරන්නට නම් නිසි බඳවා ගැනීම් හා ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය යුතුය. වර්තමානයේ කලාප අධ්‍යාපන කාර්යාල 98 ක් තිබුණද මේවායේ සේවය ලබා ගැනිමට යාමේදි බොහෝ ගුරුවරු අපහසුතාවයට පත්වන වාර අනන්තය. අද විශ්‍රාම යන ගුරුවරුයාට සිය විශ්‍රාම වැටුප ලබා ගැනීමට වසරක කාලයක් ගෙවන්නට සිදුවෙයි. ඊට හේතුව මේ කලාප කාර්යාල සමහරක්ගේ ඇති අකාර්යක්ෂම තාවයයි. ගුරු ගැටලු පිළිබඳ සාකච්ඡාවේදි ඔවුන් කරන එක් ඉල්ලීමක් වන්නේ ගුරු විදුහල්පති සේවය සංවෘත සේවාවක් බවට පත් කිරීමටය. කෙසේ වෙතත් ගුරු දිනය අර්තවත්ව සැමරීමේදි ගුරුවරුන්ගේ මේ ගැටලු කෙරෙහිද අවධානය යොමු කිරිම රජයේ එක් වගකිමක් වන්නේය.

අද අප සිටින්නේ වියපත් වියෝය. අපට සිප්කිරි පෙවූ ඔවුහුද අද වියපත්ව ජීවිතයේ සැදැ සමයේ ගෙවන්නෝ වෙති. සමහර විට ඔවුන් තමන් අකුරු කළ සිසු දරුවන්ගේ හපන්කම් දකිමින් මේ මගේ ගෝලයෙක් යැයි උදම් අනමින් සතුටු කඳුළු වගුරනාවා විය හැක. ඒ ගුරුවරුද අපේ දෙවිවරුය. අද අප යම් තැනක සමාජයේ දිවි ගෙවන්නේ නම් එහි වැඩි ගරුත්වයක් හිමිවිය යුත්තේ ඔවුන්ටය.

අපට පාර කියාදුන් ඒ ගුරුවරු සාදා අගයන්නට අපට හැකිනම් එය මිනිසත්කමේ උතුම්ම වටිනාකමකි. හෙට ඇරඹෙන ලෝක ගුරු දිනයදා දහසින් බැඳි පියලි නැති වුවද ලිපියකින්, දුරකතන ඇමතුමකින් ,කෙටි පණිවිඩයකින් හෝ වැඩිහිටි ඔවුන් අමතන්නට අපට හැකිනම්, බුලත් හුරුල්ලක් දි , මලක් දී තම දරුවාගේ ගුරුවරුන්ගේ දෙපා නමැද වන්නට ඔබගේ දරුවා හුරු කරන්නට ඔබට හැකිනම් සැබෑ ගුරු දිනයක් ඔබටත් අපටත් සමරන්නට හැකිවේවි!

විදේශ සේවා කාර්යාංශයේ සුපිරි ගැහිලි

● **තාරක වික්‍රමසේකර**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යනු 'එතෙර වෙළඳපොළ සඳහා නිපුණතාවයෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම' යන දැක්මෙන් යුතුව කටයුතු කරන සේවා ආයතනයකි. එහි මෙහෙවර ප්‍රකාශය වන්නේ 'දේශීය ආර්ථිකයට දායක වෙමින් හා සියලුම පාර්ශ්වකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවයන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරිම' යන්නයි.

විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍ය පියංකර ජයරත්නට කමිටුවේ වාර්තාව ලබා දුන් අවස්ථාව.

කෝටි 2කට අධික මිලකට හිටපු සභාපතිවරයා විසින් මිලදී ගත් සුපිරි ජගුවර් මෝටර්රථය

එවන් පරමාර්ථයන්ගෙන් යුතුව විදේශ විනිමය මෙරටට ගෙන ඒම පිණිස ස්ථාපිත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පසුගිය 'යහපාලන' සමයේ කෙරුවාවල් දෙස බැලූ විට සිහිවන්නේ අපේ පැරැන්නන් කියනා 'වැටත් නියරත් ගොයම් කා නම් කාට කියන්නද ඒ අමාරුව' යන වදන් පෙළයි. 2015 වසරේ සිට වසර 4ක් පුරා සිදු කරන ලද මහා පරිමාණ දූෂණ රැසක් හෙළිව තිබේ. මේ කරුණු හෙළි වූයේ දිනේෂ් ගුණවර්ධන කාර්යාංශය බාර ඇමැතිවරයාව සිටි කෙටි කාලයේදීය.

විදේශ විනිමය ගෙනවිත් මෙරට ආර්ථික අතින් ශක්තිමත් කරන්නට ස්ථාපිත වූ කාර්යාංශයේ නිලධාරීන් හා ආයතනය හරහා දේශපාලන අධිකාරිය විසින් මෙරට ආර්ථිකයට කරන ලද හානිය සුළු පටු නොවේ. කාර්යාංශයේ සිදු කර ඇති මේ අතිවිශාල දූෂණය සම්බන්ධව විමර්ශනය කිරීම සඳහා දූෂ්මන්ත තොටවත්ත (වරලත් ගණකාධිකාරී), රබිත අබේගුණවර්ධන (ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ) ටී.එස්. සූරියආරච්චි (ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ) යන කණ්ඩායම පත් කරන ලදී.

එම කමිටුව විසින් කරන ලද විමර්ශනයේදී කාර්යාංශයේ සිදු කරන ලද බරපතළ වංචා හා දූෂණ අටක් හෙළිව ඇත.

ඒ දූෂණ හා වංචා අතර,

1. රන් පියාපත් නමින් ක්‍රියාත්මක කළ මාධ්‍ය වැඩසටහන (රු.මිලියන 85)
2. සම්මත ක්‍රියාවලියෙන් ඔබ්බට ගොස් කැබ් රථ 05 මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මිලට ගැනීම - (රු.මිලියන 21.780)
3. කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට මැස්ඩා මෝටර් 15ක් මිලට ගැනීම- (රු.මිලියන 140.250)
4. කැබ් රථ 09ක් මිලදී ගැනීම - (රු.මිලියන 85.500)
5. ටෙන්ඩර් පටිපාටියෙන් බාහිරව ජගුවර් වර්ගයේ කාර් රථයක් මිලදී ගැනීම- (රු.මිලියන 21.9)
6. නිලඇඳුම් ටෙන්ඩරයේ අක්‍රමිකතා - (රු.මිලියන 29.252)
7. දේශපාලන කටයුතු සඳහා කාර්යාංශයේ නිලධාරීන් 05 දෙනකු යොදවා ගැනීම හා ස්ථාන මාරු කිරීම.
8. හිටපු අධීක්ෂණ මන්ත්‍රීවරයා විසින් කාර්යාංශයේ ගාල්ල ශාඛාව දේශපාලන කාර්යාලයක් ලෙස පවත්වාගෙන යාම. යන කරුණු අඩංගු වේ.

මේ බරපතළ වංචා හා දූෂණ නිසා කාර්යාංශයට සිදුව ඇති පාඩුව මිලියන 138ක් බව මේ වන විට කරන ලද විමර්ශනයන්ගෙන් හෙළිව ඇත. එහිදී කාර්යාංශයේ සභාපතිවරයාගේ පෞද්ගලික පරිහරණය පිණිස රුපියල් කෝටි දෙකකට අධික වටිනාකමක් ඇති (රු.21,900,000/-) අතිසුඛෝපභෝගී ජගුවර් මෝටර්රථයක් මිලට ගෙන ඇත්තේ නිසි ටෙන්ඩර් පටිපාටියෙන් තොරවය. ටෙන්ඩර් අංක - PR/02/14-3(III) යටතේ එස්.එම්.එල්. ෆ්‍රොන්ටෙයර් ඔටෝමොටිව් පුද්ගලික සමාගමෙන් අදාළ මෝටර් රථය මිලට ගෙන ඇත.

ප්‍රසම්පාදන කමිටුව සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එයින් එක් සාමාජිකයෙකු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හෝ සමාන නිලධාරියෙකු විය යුතුය. එහෙත් කමිටුව සමන්විතව ඇත්තේ කාර්යාංශයේ සභාපති, සාමාන්‍යාධිකාරි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි හා අමාත්‍යාංශ නියෝජිතවරයෙකුගෙනි. ඒ අනුව ප්‍රසම්පාදන උපදෙස් උල්ලංඝනය වී ඇත.

Bidding Data Sheet (BDS) යටතේ සුදුසුකම්ලත් ලංසුකරුවෙකු වීමට බලයලත් නියෝජිත (Authorized Agent) විය යුතුය. නමුත් SML Frontier Automotive (pvt)Ltd ආයතනයේ ලිපිගොනුව අනුව බලයලත් නියෝජිත තහවුරු කිරීමට සහතිකයක් නොමැති අතර Land Rower සිංගප්පූරු ආයතනය සමඟ මිලදීගැනීම් ගිවිසුමක් ඇතිබව හැඟවෙන ලිපියක් 2017.04.04 දින ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම ආයතනය ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම්ලත් ආයතනයක් නොවේ.

'රන් පියාපත්' නමින් දීප ව්‍යාප්ත මාධ්‍ය ආවරණ වැඩසටහනක් පවත්වා ඇති අතර එහි වටිනාකම මිලියන 58කි.

2018.08.03 දිනැති කළමනාකරු(ප්‍රචාරණ) විසින් මාධ්‍ය වැඩසටහනක් මගින් ජනතාව දැනුවත් කිරීමට යෝජනා කර සභාපතිවරයාට ඉදිරිපත් කර ඇත. ඊට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලැබී ඇත.

අදාළ කාර්යය වෙනුවෙන් Media Mind (pvt)Ltd ආයතනය ලංසුපත් ඉදිරිපත් කර නොමැති අතර ඒ සඳහා එම ආයතනය පෙන්වා ඇත්තේ Air Supply Production (Pvt)Ltd ආයතනයේ සම්පත් සහ අනෙකුත් පහසුකම්ය. තවද, Air Supply Production (Pvt)Ltd ආයතනය Media Mind ආයතනයේ මව් සමාගම බවට සඳහන් කර ඇතත් එයද සාවද්‍ය බව ලේඛන අනුව පැහැදිලිවී තිබේ. එසේ වුවත්, Air Supply Production (Pvt)Ltd සහ Media Mind (pvt)Ltd ආයතන වෙනම ආයතන 2ක් වන අතර Media Mind ආයතනයට ලංසුපත් ඉදිරිපත් කිරීමේදී වෙනත් සමාගමක තොරතුරු ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැත.

මෙම ලිපි ඉදිරිපත්කර ඇත්තේ ලංසු විවෘත කළ දිනට පසුදින වීම තවත් ගැටලු මතු කරවන්නකි. ලංසුකරුවකු ලංසු ඇගයීම සඳහා සුදුසුකම් ලැබීමට ටෙන්ඩර්කරුවන්ගේ උපදෙස් අංක 2.1 යටතේ කරුණු7ක් සපුරාලිය යුතු වුවත් එහි සඳහන් 2,3,6 සහ 7 Media Mind (Pvt)Ltd ආයතනය විසින් සපුරා නොමැත. එහෙත් එම ආයතනයට මෙම ටෙන්ඩරය ලබා දීම විශාල දූෂණයකි.

2020 වසර සඳහා රුපියල් මිලියන 29.25ක වටිනාකමින් යුත් නිල ඇඳුම් කොන්ත්‍රාත්තුවද නිසි ලෙසින් ක්‍රියාත්මක කර නොමැත. 2019.02.08 දින නිල ඇඳුම් මිලදී ගැනීම සඳහා 6 දෙනකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර ඇත.

නිල ඇඳුම් මිලදී ගැනීමට ප්‍රථම ඒ සඳහා වැයවන මුදල ඇස්තමේන්තු කළ යුතු වුවත් එවැන්නක් සිදුකර නොමැත. මේ හේතුව නිසා අදාළ ටෙන්ඩර් මිලගණන් තීරණය කිරීමටත්, අයවැය ප්‍රතිපාදනවල ප්‍රමාණවත්බව පිළිබඳව සෑහීමකට පත්වීමටත් හැකියාව ලැබී නොමැත.

2020 වසර සඳහා කාර්යාංශ නිලධාරීන්ට ලබාදෙනු ලබන නිලඇඳුම් වලට අමතරව ටීෂර්ට් 02ක් ලබාදීමට තීරණය කර ඇති බව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන හා මානව සම්පත්) 2019.02.26 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුහුණු) වෙත දන්වා ඇත.

අදාළ මිලගණන් අනුව ඉහළම මිලගණන් ඉදිරිපත් කර ඇති S.L.R.Holdings ආයතනයට සෑම වර්ගයකම සාම්පල් 1 වර්ගයේ සාරියක් රු.5425/- බැගින් රු.18,88,150/-ක වටිනාකමකට කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. නමුත් මෙම මිලගණන් කාර්යාංශය ඉදිරිපත් කළ මිලගණන්වලට වඩා අධික වන අතර සෙසු ආයතන ලංසු ලේඛන වල සඳහන් පිරිවිතර වලට එකඟ නොවන බව පවසා ඉවත්කර ඇත.

එම ආයතන ඉදිරිපත් කර ඇති මිලගණන් වනුයේ සාරියක් රු.4000/- ක් ලෙසිනි. ඒ අනුව කාර්යාංශයට රු.4,956,150/- ක මූල්‍යමය පාඩුවක් සිදුකොට ඇත.

ගාල්ල ශාඛා කාර්යාලය දේශපාලන කාර්යාලයක් බවට පත් කරගෙන එහි දේශපාලන කටයුතු සිදු කර ඇති අතර එම කාර්යාලයට අදාළ ගෙවීම් සිදු කළ ආකාරයද ඉතා අපැහැදිලිය. එමෙන්ම නීති විරෝධීය.

2016.01.01 දින සිට 2016.08.01 දින දක්වා බදුකරු සමඟ එකඟ වී ඇති බදු ගිවිසුමක් ගැන ලිපිගොනුවේ සඳහන් නොවේ.

නමුත් ගෙවීම් සිදු කර ඇත. 2016 වසරේ මසකට ලක්ෂ 4ක් හා 2017 ලක්ෂ 5ක් 2018 ලක්ෂ 6ක් 2019 ලක්ෂ 7ක් (පසුව ගෙවීම නවතා ඇත)

සම්මත ක්‍රියාවලියෙන් ඔබ්බට ගොස් ලබාගෙන ඇති කැබ්රථ 5ක් සඳහා ගිවිසුම්ගත වීමද තවත් වංචාවකි.

අමාත්‍යාංශය විසින් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ Pasan rent a car & tours ආයතනයෙන් කැබ්රථ 5ක් 2017.02.13 දින සිට මාස 60 කට ලබාගෙන ඇත.

මේ සඳහා අමාත්‍යාංශය සහ එම ආයතනය අතර ගිවිසුමක් අත්සන් කර ඇත. ඒ අනුව WPPH 5766, WPPH 6144 , SPPH 7225, SPPH 8040, හා WPPI 6006 යන Toyota Hilux වර්ගයේ කැබ් රථ ලබා ගෙන ඇත.

ගිවිසුම අනුව මාසිකව රු.825,000 ක මුදලක් සියලුම වාහන සඳහා ධාවනය කරන කි.මි. 3000 සීමාව තුළ මාසිකව ගෙවීමටත් කි.මි. 3000 ඉක්මවන වාහනයක් සඳහා අතිරේක කි.මි. 1ක් සඳහා රු.55.00 බැගින් වැට් රහිත මිලක් ගෙවීමටත් එකඟ වී ඇත.

රුපියල් මිලියන 85.5ක් වටිනා ඩබල් කැබ් රථ 09ක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මිලදී ගැනීම හා මිලියන 140.25 මැස්ඩා මෝටර් රථ 15ක් මූල්‍ය කල්බදු ක්‍රමයට මිලට ගැනීම නිසි ලෙසින් සිදුව නොමැති නිසාද කාර්යාංශයට විශාල පාඩුවක් සිදුව ඇත.

මෝටර් රථ මිලදී ගැනීමේදීද ආයතන 6ක් ලංසු ඉදිරිපත් කර ඇතත් එයින් 4ක් ප්‍රතික්ෂේප කර ඇත්තේ පිරිවිතරවල අඩුපාඩු පෙන්වමිනි.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් Colonial Motors Cey Ltd ආයතනය මෝටර් රථ මිලට ගැනීම සඳහා තෝරාගෙන ඇති අතර ඒ සඳහා මැස්ඩා වර්ගයේ මෝටර්රථයක් රු.9,350,000/- ක මුදලකට මිලට ගෙන ඇත.

එමෙන්ම ප්‍රචාරණ හා මහජන සම්බන්ධතා අංශයේ සිදුකරන ලද ස්ථාන මාරුවීම් හුදෙක් දේශපාලන හා පළිගැනීම් උදෙසා කරන ලද මාරුකිරීම් බවද මේ වන විට අනාවරණය වී තිබේ. මෙම ස්ථාන මාරුවීම් සිදුකර ඇත්තේ මැතිවරණ කාලසීමාවකය.

මේ සියලු වංචා මෙන්ම තවත් වංචා රැසක් ඇතුළත් වාර්තාව පසුගිය සැප්තැම්බර් 23 දින විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍ය පියංකර ජයරත්න මහතා වෙත එම අමාත්‍යාංශයේදී භාර දෙන ලදී.

මේ පිළිබඳව සිළුමිණ කළ විමසීමකදී අමාත්‍යවරයා පැවසුවේ කරුණු විමර්ශනය කෙරෙන බවත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අධීක්ෂණය කිරීමෙන් පසුව අදාළ වාර්තාව ඉදිරි කටයුතු සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරන බවයි.

මහජන මුදල් විනාශ කරන්නට දේශපාලකයන්ට හෝ නිලධාරීන්ට බලය ලබා දී නොමැති බවත් එවැනි කටයුතු කරන්නන්ට උපරිම දඬුවම් ලබා දීමට කටයුතු කරන බවත් ඔහු කීවේය.

දියෙස්පෝරාව
DIASPORA

නීතිවේදී හසක රත්නමලල

කැනඩාවේ සිට ලියයි

‘සන් ඇන්ඩ් සී’ මිනිස් ජාවාරමට කැනේඩියානු විරෝධය

ශ්‍රී ලංකාවේ ඊලාම් යුද්ධය අවසන්වී වසරක් ගෙවීමෙන් පසු 2010 වසරේ අගෝස්තු මාසයේ 12 වන දින කැනඩාවේ බටහිර වෙරළ තීරයේ පිහිටි වැන්කුවර් නගරය අසල වරායකට “සන් ඇන්ඩ් සී” නමින් වූ නෞකාවක් සේන්දු විය. ඒ නෞකාවේ ශ්‍රී ලංකා ද්‍රවිඩ ජාතිකයන් 492 දෙනෙකු විය. ඔවුන් අතර පිරිමින් 380 ක්ද, කාන්තාවන් 63 ක්ද, ළමුන් 49 ද දෙනෙකු විය. නැව පදවාගෙන ආ නැවියන් ඇතුළු පැමිණි සියලුදෙනාම කැනේඩියානු රජයෙන් සරණාගත භාවය අයද සිටියේය. වෙනදා මහත් හරසරින් සරණාගතයින් පිළිගන්නා කැනේඩියානු නිලධාරින් මෙවර වඩා වෙනස් ආකාරයකින් මේ පිරිසට සලකනු ලැබ ඇති බව බලු බැල්මට පෙනන්නට තිබුණි.

කැනේඩියානු නිලධාරින් විසින් කිහිප දෙනෙකු හැර නැවේ සිටි සියලු දෙනාම අත් අඩංගුවට ගනු ලැබූ අතර ඔවුනට අඩුම වශයෙන් මාස තුනක කාලයක් වත් කැනේඩියානු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ අත්අඩංගුවේ පසුවන්නට සිදුවිය. සමහරුන්ට මාස අටක් දහයක් සිරගතවී සිටින්නට සිදුවී තිබුණි. කිහිප දෙනෙකුට පමණක් කැනේඩියානු සරණාගත භාවය ප්‍රධානය කර ඇති වුවද, කැනඩාවට සේන්දු වී දස වසරක් පසු වී ඇති වුවද ඉන් බහුතරයකට තවමත් “ස්ථිර පදිංචිය” (permanent residency) ලැබී නැත. “ස්ථිර පදිංචිය” යනු කැනේඩියානු පුරවැසිභාවයට අඩිතාලමයි.

කැනඩාව එක්සත් ජාතීන්ගේ සරණාගත සංවිධානයේ සරණාගතයින් ලබාගැනීමට කැමති රටක් ලෙස අත්සන් තබා ඇති බැවින් කැනඩාවට පැමිණෙන සියලු සරණාගතයින් බාර ගැනීමට කැනඩාව බැඳී සිටී. මේ අනුව ජාතිය, ආගම, ජාතිකත්වය, විශේෂිත සමාජ කණ්ඩායමක සාමාජිකත්වය හෝ දේශපාලන මතය හේතුවෙන් ජීවිතය හෝ නිදහස අනතුරට පත්විය හැකි රටකට පිටුවහල් කිරීමට හෝ ආපසු යැවීමට කැනඩාවට නොහැකිය. වීසා බලපත්‍රයක් හෝ ප්‍රවේශ බලපත්‍රයක් නොමැතිව රට තුළට ඇතුළු වුවද, සරණාගත අයදුම්පත සලකා බලන තුරු පිටුවහල් කළ නොහැක. එහෙත් මෙවර මේ ආකාරයෙන් කැනේඩියානු සංක්‍රමණ දොරටු වෙනදා මෙන් ඉතා පහසුවෙන් විවුර්ත නොවීමෙන් පෙනීයන්නේ කැනඩාව මිනිස් ජාවාරම් කරුවනට තව දුරටත් සංවේදී නොවන බව පෙන්වීම විය යුතුය.

මෙම තත්වයට තවත් හේතුවක් වූයේ කැනේඩියානු ජනතාවද මෙම නෞකාවේ පැමිණි සරණාගතයින් බාරගැනීමට එතරම් කැමැත්තක් නොදැක්වීමය. ඒ දිනවල සුප්‍රසිද්ධ සංගණන ආයතනයක් මගින් පැවැත්වූ සමීක්ෂනයකට අනුව කනේඩියානුවන් සියයට 48 මෙම සරණාගතයින් පිරිස කැනඩාවට බාර ගැනීම පිළිබඳව විරුද්ධව සිය මතය ප්‍රකාශ කර තිබුණි.

මෙවැනි හේතුන් නිසා කැනේඩියානු නිලධාරීන් ඉතා දැඩි ලෙස කටයුතු කල අතර මේ නෞකාව පිළිබඳ දීර්ග වශයෙන් තොරතරු සෙවූ කැනේඩියානු බලධාරීන් තායිලන්තයේ ලියාපදිංචි සන් ඇන්ඩ් සී නෞකාවේ අයිතිකරුවන් වූයේ තායිලන්තයේම ලියාපදිංචි සමාගමක් වන Sun and Rshiya Company Ltd. නමැති සමාගම බවත්, එහි විධායක අධ්‍යක්ෂකවරයා වන්නේ මෙම නැවේම සරණාගතයකු ලෙස පෙනීසිටි කුනරොබින්සන් ක්‍රිස්තුරාජා බව සොයා ගනු ලැබීය. ඒ අනුව ඔහුට එරෙහිව ආගමන හා සරණාගතයන් ආරක්ෂා කිරීමේ පනතේ 117 වගන්තිය යටතේ මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධයෙන් නඩු පවරනු ලැබිය. (R. v. Christhurajah 2019 BCCA 210).

මීට අමතරව ලෙස්ලි ජනා එමානුවෙල්, තම්පීර්නායගම් රාජරත්නම්, සහ නඩරාජා මහේන්ද්‍රන් නමැති පුද්ගලයිට එරෙහිවද මිනිස් ජාවාරම් කරුවන් ලෙස සලකා නඩු පවරනු ලැබීය (R. v. Rajaratnam,2019 BCCA 209). තවද මෙහිදී ලෙස්ලි ජනා එමානුවෙල් නැමැත්තා සන් ඇන්ඩ් සී නෞකාවේ කපිතාන් වරයා ලෙස කටයුතු කල බවද කැනේඩියානු බලධාරීන් විසින් සොයා ගනු ලැබීය. මීට අමතරව සත්‍යපවන් අසීර්තම්ට නමත්තෙකුටද චෝදනා එල්ල වූ නමුත් නඩු විභාගයට පෙර ඔහු මිය ගිය අතර ඒ හෙයින් චෝදනා ඉවත් කරගනු ලැබීය.

නැවේ පැමිණි සෑම කෙනෙකුම මුදලින් ඩොලර් දස දහසක් ගෙවා හෝ කැනඩාවේ වෙසෙන ඥාතියෙකුගේ මාර්ගයෙන් නැවේ අයිතිකරුවන්ට මුදල් ගෙවීමට එකඟ වී තිබුණු බව කැනේඩියානු නිලධාරීන් විසින් හෙළි කරගෙන තිබුණි.

මෙම සරණාගත ජාවාරමට කැනේඩියානු බලධාරීන් කෙතරම් විරුද්ධත්වයක් දක්වුවේද යන්න මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර ක්ෂමා ආයතනය 2011 පෙබරවාරි 11 වන දින නිකුත් කළ නිවේදනයක පැහැදිලිව පෙනෙන්නට තිබුණි. “සන් ඇන්ඩ් සී සරණාගත ඉල්ලුම්කරුවන් රඳවාතබා ගැනීමට එරෙහිව පෙනී සිටින්නෙමු” යනුවෙන් වූ ඒ නිවේදනයේ මෙලෙස කියා තිබුණි. "බොහෝ සරණාගත ඉල්ලුම්කරුවන් කැනඩාවට පැමිණි පසු රඳවා තබා නොගන්නා අතර රඳවා සිටින අය සාමාන්‍යයෙන් දින හෝ සති කිහිපයක් ඇතුළත නිදහස් කරනු ලැබේ. කෙසේ වෙතත්, එම්වී සන් සී මගීන් සම්බන්ධයෙන් ගත් කල, රජය වෙනදාට වඩා අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉල්ලා සිටින අතර, මගීන් පිළිබඳ අහිතකර තොරතුරු සෙවීම සඳහා සැලකිය යුතු ශක්තියක් හා සම්පත් ආයෝජනය කරමින්, නොගැළපෙන බවට දුර්වල තර්ක ඉදිරිපත් කරමින් එල්ටීටීඊ [දෙමළ ඊලාම් විමුක්ති කොටි] සම්බන්ධතාවය පිළිබඳව ප්‍රකාශ කරමින් , ආගමන හා සරණාගත මණ්ඩලය විසින් නිදහස් කිරීමට දැඩි ලෙස විරුද්ධ වීම සහ ළමයින් සම්බන්ධ නඩු වලදී පවා ෆෙඩරල් අධිකරණයේ නිදහස් කිරීමේ නියෝගවලට එරෙහිව අභියාචනා කිරීම.” යන කාරණා අනුව සන් ඇන්ඩ් සී සම්බන්ධයෙන් වන කැනේඩියානු විරෝධය පිළිබිඹු වෙයි.

මේ අතර, සන් ඇන්ඩ් සී නෞකාව කැනඩාවට සෙන්දුවී අවුරුදු දහයක් ගෙවුණු මේ වසරේ කැනේඩියානු පාර්ලිමේන්තුව තුළ ශ්‍රී ලංකාවට එරෙහිව දිගින් දිගට ම කටයුතු කරන ශ්‍රී ලංකික ද්‍රවිඩ සම්භවයක් සහිත ගැරී ආනන්ද සංගරී මන්ත්‍රීවරයා මෙසේ කියා තිබුණි.

"කැනඩාවේ අප, බොහෝ අවස්ථාවන්හි දී සරණාගතයන් සාදරයෙන් පිළිගන්නෙමු, ඒ අතර අප එලෙස නොකළ අවස්ථාද තිබේ, මෙය එවැනි එක් අවස්ථාවකි".

ඔබේ අදහස් ලියා එවන්න:
sldiasporatalks@gmail.com

සෞම්‍යගේ ගැටලුව කියන තරම් සෞම්‍ය ද?

● රසික කොටුදුරගේ

සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ සේවය කළ ප්‍රවීණ රංගධරයකු වන සෞම්‍ය ලියනගේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පාලනාධිකාරිය විසින් ගණු ලැබූ තීරණය පිළිබඳව නොයෙක් පාර්ශ්ව විසින් මේ වන විට විවිධ මත පළ කරමින් තිබේ. මෙම ලිපියෙහි අරමුණ වන්නේ එකී ප්‍රශ්නය පිළිබඳව තුළනාත්මකව විමසා බැලීමය.

සෞන්දර්ය විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ආයතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ජී. එස්. පී. නානායක්කාර විසින් ලිඛිතව දක්වා ඇති පරිදි සිද්ධිය සංක්ෂිප්ත වශයෙන් මෙසේය.

“සෞම්‍ය ලියනගේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය සහිතව ආධුනික කථිකාචාර්යවරයකු ලෙස තනතුරට පත් වන්නේ වර්ෂ 2007 02.02 දිනය. ඔහුට ඒ වනවිට තිබුණේ 1998.09.01 දින සිට වලංගු වන කැලණි සරසවියේ සාමාන්‍ය සාමාර්ථයක් සහිතව ලබා ගන්නා ශාස්ත්‍රවේදී උපාධිය සහ ඕස්ට්‍රේලියාවේ ෆිලින්ඩර් සරසවියෙන් ලබා ගත් ශාස්ත්‍රපති උපාධියත්ය. මෙරට රජයේ විශ්ව විද්‍යාලයයක ආධුනික කථිකාචාර්යවරයකු වීමට අවශ්‍ය මූලික සුදුසුකමක් වන්නේ මූලික උපාධිය සඳහා ලබන පන්ති සාමාර්ථයකි. එහෙත් සෞම්‍ය ට ප්‍රථම උපාධිය සඳහා සම්මාන සාමාර්ථයක් නැති බැවින් ඕස්ට්‍රෙලියාවේ ෆිලින්ඩර් සරසවියෙන් වර්ෂ 2003.06.10 දින ලබා ගත් ශාස්ත්‍රපති උපාධි සලකා බලා ආධුනික කථිකාචාර්ය තනතුර සඳහා බඳවාගෙන තිබේ. ඒ තනතුර ස්ථිර කිරීමට පශ්චාත් උපාධියක් සම්පූර්ණ කිරීමේ පරිවාස කාලයකට යටත්වය. ආධුනික කථිකාචාර්යවරයකු ලෙස බඳවා ගත් සෞම්‍ය ලියනගේ එම තනතුරෙහි ස්ථිර කිරීමට තවත් පශ්චාත් උපාධියක් හැදෑරිය යුතුව තිබිණි. එකී අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ඕස්ට්‍රෙලියාවේ La Trobe සරසවියේ ආචාර්ය උපාධියක් හැදෑරීමට වර්ෂ 2010.06.01 දින සිට 2013.08.31 දක්වා වැටුප් සහිත වසර තුනක අධ්‍යයන නිවාඩුවකුත්, වර්ෂ 2013.09.01 දින සිට වර්ෂ 2014.08.24 තෙක් වැටුප් රහිත අධ්‍යයන නිවාඩුවකුත් ලෙස වසර හතරක් නිවාඩුවක් ඔහුට සෞන්දර්ය විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇත. එහෙත් ඉහත කාලය තුළ ඔහු එම ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නොමැති බව සෞන්දර්ය විශ්වවිද්‍යාලයයේ නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයා සඳහන් කරයි.

සෞම්‍ය ලියනගේ සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කර පශ්චාත් උපාධි සුදුසුකම තහවුරු කරනු ලබන්නේ වර්ෂ 2015.08.12 වැනි දිනය. ඔහු විසින් ඉදිරිපත් කර ඇති උපාධි සහතිකය සත්‍යාපනය කිරීමෙන් පසු වර්ෂ 2015.10.01 සේවය ස්ථිර කිරීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ ය. එකී පරීක්ෂණ මණ්ඩලයේ තීරණය පහත පරිදිය.

“ සෞම්‍ය ලියනගේ විසින් වර්ෂ 2015.02.02 දිනට ආධුනික කථිකාචාර්ය ධුරයේ වසර 08ක පරිවාස කාලයක් සම්පූර්ණ කර ඇත. නමුත් ඒ දින වනවිට ඔහු ආධුනික කථිකාචාර්ය ධුරයේ තහවුරු කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නැත. එබැවින් එදින සිට තාවකාලික කථිකාචාර්ය ධුරයට පත් කර ඇත. ආධුනික කථිකාචාර්ය ධුරයේ ස්ථිර කිරීමට ඔහු සුදුසුකම සපුරා ඇත්තේ එම තනතුරේ වසර 08කුත් සම්පූර්ණ කර තවත් තවත් මාස 6 කුත් දින 10කට පසුය. එනම් 2015.08.12 දිනය. එහෙත් ඔහුට ආචාර්ය උපාධිය ලබා ගැනීම වෙනුවෙන් සරසවිය විසින් ලබාදුන් වැටුප් සහිත තෙවසර ඇතුළු නිවාඩු සිව් වසරත්, ශාස්ත්‍රපති උපාධියක් වෙනුවට දර්ශන ශූරී උපාධියක් ලබා ගැනීමත්, සුදුසුකම් හා දක්ෂතාත් සැලකිල්ලට ගෙන ඔහු නර්තන හා නාට්‍ය කලා පීඨයේ නාට්‍ය, මුද්‍රානාට්‍ය, නූතන නර්තන අධ්‍යයන අංශයේ ආධුනික කථිකාචාර්ය තනතුරේ ස්ථිර කිරීමට නිර්දේශ කළේය. ඒ අනුව ඔහු මේ තනතුරේ ස්ථිර කෙරෙන්නේ 2015 සිට නොව 2007 වසරේ සිට ක්‍රියාත්මක වන ආකාරයෙනි. තවද ඔහු විසින් පශ්චාත් උපාධි සුදුසුකම සම්පූර්ණ කරන ලද දිනය වන වර්ෂ 2015.08.12 දින සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II) තනතුරට උසස් කිරීමටද නිර්දේශ විය. ඉහත නිර්දේශ සහිතව සෞම්‍ය ලියනගේ නැවත සේවය පිහිටුවීම පිළිබඳව සිහි කැඳවීමේ පත්‍රිකාවක් වර්ෂ 2015.12.14 දින පැවති 127 වැනි පාලක සභාවේ අනුමැතියට දැමිණි. ඔවුන්ගේ තීරණය වූයේ නියමිත වසර 08ක කාලය තුළ පශ්චාත් උපාධි සුදුසුකම සපුරා නැති බැවින් ඔහුව නිර්දේශ කළ දින සිට එනම් 2007.02 02 දින සිට තාවකාලික කථිකාචාර්ය ධුරයේ ස්ථිර කළ නොහැකි බවය. එසේ වුවද ඔහු පශ්චාත් උපාධිය සම්පූර්ණ කළේ වසර අටක පරිවාස කාලයක් ගතවී මාස 6යි දින 10ක් ගතවීමෙන් බැවින් ඒ කාලය මාස 07ක් සේ සලකා මුල් පත්වීම් කාලයෙන් එම මාස 07 අඩු කර 2007.09.02 දින සිට සේවයේ ස්ථිර කර ඔහු තනතුරට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කළ වර්ෂ 2015. 08. 12 දින සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (11 ශ්‍රේණිය) ට උසස් කරන ලෙසය. ඒ අනුව සිදුව ඇත්තේ තාවකාලික කථිකාචාර්ය මට්ටමට ඇද දැමූ සෞම්‍ය ලියනගේ ආධුනික කථිකාචාර්ය තනතුරේ පිහිටුවන්නේ නැතිව සේවයේ ස්ථිර කිරීම හා වර්ෂ 2015.12.18 සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (11 ශ්‍රේණිය) ට උසස් කිරීමය. එසේ වුවත් ඉහත පාලක සභා තීරණය අනුව ආධුනික කථිකාචාර්ය ධුරයට පත් වූ දිනය සංශෝධනය කර නැවත පත්වීමේ ලිපියක් නිකුත් වී නොතිබුනි.

මෙම පත්වීම සම්බන්ධව වර්ෂ 2015 සිට වර්ෂ 2019 දක්වා අභ්‍යන්තර හා රජයේ විගණන අංශ විමසුම් කර තිබිණි. වර්ෂ 2019 දී රජයේ විගණන අංශ විසින් කර තිබූ විමසීම 169 වැනි පාලක සභාවටත් යොමු කර තිබිණි. මෙම කාරණාව වර්ෂ 2018.03.22 දින පැවති කෝප් කමිටු සභාවාරය වෙතත් යොමු විය.

මේ අතර මේ කරුණ ගැන වර්ෂ 2019.09.09 දින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ද UGC/HR/4/15/19/2 දරන ලිපියෙන් විශ්වවිද්‍යාල පාලක සභාව විමසුවේය.

වර්ෂ 2019.12.06 දින 169 වැනි පාලක සභාව රැස් විණි. එම පාලක සභා වාර්තාව සෞම්‍ය ලියනගේ ගේ පත්වීම සම්බන්ධ කළ විගණන විමසුමේ සඳහන් කරුණු ගැන සෞන්දර්ය විශ්ව විද්‍යාලයීය අධ්‍යයන ආයතන අංශයෙන් වාර්තාවක් කැඳවූයේය. එම වාර්තාව වර්ෂ 2020.02.20 දින පැවති 170 වැනි පාලක සභාව වෙත ඉදිරිපත් විය. 170 වැනි පාලක සභාවාරයට වර්ෂ 2020.02.13 දින පැවැත්වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ 1026වන කොමිෂන් සභා වාරයේ ගත් තීන්දුවක් දන්වා තිබිණි. එහි පැහැදිලිව දක්වා තිබුණේ සෞම්‍ය ලියනගේ ආධුනික කථිකාචාර්යවරයෙක් ලෙස සේවය ස්ථිර කිරීම සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයේ කාචාර්ය ධුරයකට පත් කිරීම. ඉන්පසු උපාධිය ලැබුණු පසු නිබන්ධය බාර දුන් දින සිට බලපාන පරිදි උසස් කිරීම හා බඳවා ගත් දිනයේ සිට සේවය ස්ථිර කිරීම. එසේ කරන්නේ නිබන්ධනය බාර දුන් පසු පරීක්ෂකවරුන් පත් කිරීම, පරීක්ෂණය පැවැත්වීම වාර්තාව සැපයීම වැරදි ඇත්නම් නිවැරදි කිරීම නැවත නිබන්ධන බාර දීම විශ්වවිද්‍යාලය එය අනුමත කිරීම ආදියට කල් ගත වෙන නිසා. ඒ සියල්ල අවුරුදු අටක් ඇතුළත සිදුවෙනවා නම් ප්‍රශ්නයක් නැහැ. කල් ගියොත් එයට වරද කරුවා පරිපාලනය පරීක්ෂකවරුන් මිස උපාධි අපේක්ෂකයා නොවන බැවින් ඔහුට අවැඩක් සිදු නොවන අයුරින් ක්‍රමයක් සකසා තිබිය යුතුයි. අවුරුදු අටෙන් පසු ඔහුට පරිවාස කථිකාචාර්යවරයකු ලෙස සේවය කරන්න බැරි නමුත් විශ්වවිද්‍යාලයට ඔහු අස් නොකර විශ්වවිද්‍යාල සේවයේ බවය. සෞම්‍ය ලියනගේ සම්බන්ධව මෙම තීන්දුව ගත්තේ එවැනි වටපිටාවක් තුළ බව සෞන්දර්ය විශ්වවිද්‍යාලය යේ නිසි බලධාරියා ලෙස කටයුතු කරන සම්මානිත මහාචාර්ය අබේරත්න බණ්ඩාර පැවසීය.

“සෞම්‍ය ලියනගේ, තමන්ට වූ අගතිය සම්බන්ධයෙන් පෙනී සිටින ලෙස අප වෘත්තීය සංගමයෙන් ඉල්ලීමක් කර කර තිබුණි. ඒ අනුව අප ආචාර්යවරුන්ගේ විධායක සංගමය රැස්වී මෙම කාරණය සම්බන්ධයෙන් මූලික අධ්‍යනයක් කළ යුතු බවට තීරණය කළේය. සෞම්‍ය ලියනගේ මහතා ඔහුට සිදු වී තිබෙන අගතිය සම්බන්ධයෙන් අපට ලිඛිතව දන්වා ඇති මුත් මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට එය පමණක් සලකා බැලීම ප්‍රමාණවත් නොවේ. ඒ අනුව අප ආචාර්ය සංගමය ලිඛිතව ලිපියක් ඉදිරිපත් කරමින්, එතුමා සම්බන්ධයෙන් ලබා දී ඇති කෝප් කමිටු වාර්තාව,විගණන වාර්තාව, පත්වීම් ලිපිය, උපාධි සහතිකය ඇතුළු මේ සඳහා පදනම් වූ සියලු ලේඛනවල පිටපත් විශ්වවිද්‍යාල පරිපාලනයෙන් ඉල්ලා තිබේ. අදාල ලේඛන ලබාගත් පසු ආචාර්ය සංගමයේ විධායක සභාව සහ මහ සභාව රැස්වී එම ලේඛන අධ්‍යයනය කර මේ ක්‍රියාමාර්ගය නිවැරදි ද නැති ද යන්න ෆුටා එකට ලිඛිතව ඉදිරිපත් කිරීමට සැළසුම් කර තිබෙන බව” මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සෞදර්ය විශ්වවිද්‍යාලයේ නර්ථන හා නාට්‍ය කලා පීඨ ආචාර්යවරුන්ගේ සංගමයේ ලේකම් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජනක කොට්ටේගොඩ කියා සිටියේය.

“මෙය සමාජය තුළ කතිකාවට බඳුන් වී ඇති බව අප දැන සිටියත්, මේ සම්බන්ධයෙන් සෞදර්ය විශ්වවිද්‍යාලයේ ආචාර්ය සංගමය නිලවශයෙන් ඊට මැදිහත් වන ලෙස ෆුටා එකට දැනුම් දී නැහැ. ආසන්න වශයෙන් මෙකී සිදු වීම සිදු වුවද මෙවැනි අවස්ථා නෛතික වශයෙන් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිදු වේ. එනිසා ෆුටා හී සභාපතිවරයා වශයෙන් නිල ප්‍රකාශයක් කිරීමට හැකියාවක් නැති බව” මේ සම්බන්ධයෙන් අප කළ විමසීමකදී මහාචාර්ය ශ්‍යාම් බන්නැහක කියා සිටියේය.

මියන්මාරයේ ශ්‍රී ලංකා තානාපති ලෙස කටයුතු කරන මහාචාර්ය නලින්ද සිල්වා මෙසේ පැවසීය. “සෞම්‍යගේ පරීක්ෂකයන් තීරණයක් දීමට කල් අරගෙන. සුළු නිවැරදි කිරීම් කරන්නත් කියල. ඔහු ඒ සියල්ල කර උපාධිය ලබාගෙන තියෙන්නෙ 2015 අගෝස්තු 12 වැනි දා. එවිට අවුරුදු අට පැනලා. මෙවැනි අවස්ථාවල් ඇති වෙනවා. විශ්වවිද්‍යාලය එවිට කරන්නෙ අවුරුදු අට සම්පූර්ණ වූ දිනයේ සිට තාවකාලික කථිකතබාගන්න පුළුවන්. මෙහි ඊනියා සඵල දින (effective date) කතාවක් නැහැ.

විශ්වවිද්‍යාලය ඒ අනුව ක්‍රියා කරමින් පරිවාස කාලයට අවුරුදු අට පිරුණු 2015 පෙබරවාරි 02 සිට බලපාන පරිදි සෞම්‍ය තාවකාලික කථිකාචාර්යවරයකු ලෙස පත් කරලා. එය නිවැරදියි. එහෙත් ඉන් පසු 2015 දෙසැම්බර් 14 වැනි දින පැවති පාලක සභා රැස්වීමක දී සෞම්‍ය අවුරුදු අටට වඩා මාස 6 දින 10ක් වැඩි පුර අරගෙන ඇති බව නිරීක්ෂණය කර එය මාස 7ක් ලෙස සලකමින් සෞම්‍යගේ ස්ථිර කිරීම ඔහු පත් වූ 2007 පෙබරවාරි 02 සිට නොව 2007 සැප්තැම්බර් 02 දින සිට කෙරෙන බවටත් උසස්වීම 2005 අගෝස්තු 12 සිට කෙරෙන බටත් තීරණය කරල. මෙය වැරදි තීරණයක්. මාස 6 දින 10 මාස 7 ලෙස සැලකුවේ කෙසේ ද යන්න පැහැදිලි නැහැ. සෞම්‍ය ස්ථිර කිරීමට තිබුණේ 2007 පෙබරවාරි 02 සිට. එය කෙසේවත් 2007 සැප්තැම්බර් 02 වෙන්න බැහැ. අනෙක් අතට විශ්වවිද්‍යාල පරිපාලනයේ පරීක්ෂකවරුන්ගේ පමාවීම්වලට අපේක්ෂකයාට වන්දි ගෙවන්න කියන්නෙ නැහැ. සෞම්‍ය උසස් කළ යුතු ව තිබුණේ ඔහු නිබන්ධය භාර දුන් 2014 සැප්තැම්බර් 30 සිට. මේ තීරණ ගෙන ඇත්තේ යහපාලන ආණ්ඩු කාලයේ පැවති පාලක සභා රැස්වීමක (2015 දෙසැම්බර් 14). මට ප්‍රශ්නය සෞම්‍ය ඒ දිනවලම එයට විරුද්ධත්වය ප්‍රකාශ නොකළේ ඇයි ද යන්නයි. එදාම විරුද්ධ වුණා නම් අද කරන්න දෙයක් නැති වන බව (මෙය මහාචාර්ය නලීන්ගේ බ්ලොග් අඩවියේ සටහනකින් උපුටා ගනු ලැබූවකි). මෙවැනි කාරණයක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විශ්වවිද්‍යාල වැනි ආයතන මීට වඩා නම්‍යශීලී විය යුතුය. වසර අටකට ප්‍රථම පශ්චාත් උපාධිය සම්පූර්ණ කළ යුතු බවට දක්වා තිබුණ ද එය නම්‍යශීලී නෛතික රාමුවකි. සෞම්‍ය සිය උපාධි නිබන්ධනය අදාළ කාලයට ප්‍රථම නිමකර දී තිබුණද උපාධිය හිමිවන්නේ ඉන් වසරකට පමණ පසුවය. ඒය සාමාන්‍ය තත්ත්වයකි. සාමාන්‍යයෙන් උපාධිය සමත් වුවද උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වා උපාධිය ලබා දෙන විට කාලයක් ගතවේ. සෞම්‍යට සිදුව ඇත්තේද එවැනි දෙයකි. නියමිත කාලසීමාව තුළ දී එය ලබාදිය ගත හැකි වූවා නම් මෙවැනි තත්ත්වයක් ඇති නොවේ හොඳය. නමුත් එසේ නොවූවා කියා ආචාර්යවරයකුට මේ ආකාරයට සැලකීම සුදුසු නැත. මින් පෙරත් මෙවැනි අවස්ථා ඕනෑතරම් සිදුව තිබෙන අතර, මෙහි තිබෙන ගැටලුව වන්නේ පත් වීම් ලැබූ දිනය ඉදිරියට ගැනීමට එවක සෞදර්ය විශ්වවිද්‍යාල පාලනාධිකාරිය කටයුතු කිරීමය. ඔවුන් එය සිදු කර ඇත්තේ මේ තාක්ෂණික කාරණාව පිළිබඳ බැරෑරුම්ව ගෙන නොවන බව පැහැදිලිය. සමහරුන් මෙය ලබැඳියන් කෙරෙහි විශේෂත්වය දැක්වීමක් ලෙස පෙන්වීමට උත්සාහ ගෙන තිබේ. මාස හෝ දින කිහිපයක ගැටලුවක් ඉස්මත්තට ගෙන සුදුසුකම් පිරූ ආචාර්යවරයකුට මේ ආකාරයෙන් සැලකීම ආයතනිකව හෝ ශිෂ්ටසම්පන්න ජනසමාජයක් ලෙස ගෙන බැලුව ද කෙතරම් යුක්ති සහගතද යන්න නැවත සිතාබැලිය යුතු බව කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි අප සමඟ කියා සිටියේය.

ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ අශෝක හඳගම කියා සිටින්නේ, “මහාචාර්ය සෞම්‍ය ලියනගේ කොළඹ සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ ඔහු දැරූ පීඨාධිපති, මහාචාර්ය ආදී තනතුරු වලින් ඉවත් කර තිබෙයි. එයට හේතුව ලෙස විශ්ව විද්‍යාල පාලක සභාව ගෙනහැර දක්වන්නේ, කථිකාචාර්ය වරයෙකු ලෙස තම පරිවාස කාලය නිමවන්නට පෙර සපුරාලිය යුතු පශ්චාත් (ආචාර්ය?) උපාධි සුදුසුකම ඔහු සපුරා නොමැති බවයි. විශ්ව විද්‍යාල පාලක සභාව ට මෙය සොයා ගැනීමට වසර හයක් ගත වී ඇත. ඒ කාලය තුළ ඔහු පීඨාධිපති සහ මහාචාර්ය තනතුරුවලට උසස් කර ඇත. සෞම්‍ය තමාගේ ආචාර්ය උපාධිය නිසි පරිදි නියමිත කාලයට සපුරා ඇත්ද නැද්ද යන්න සොයා බලා සුදුසු පරිදි කටයුතු කිරීම පාලක සභාව සතු වගකීමකි. එම කටයුත්ත නිසි ක්‍රමවේදයකට අනුව සිදු කිරීමද ඔවුන් සතු වගකීමකි. එසේ වී ද නැද්ද යනු අප දන්නේ නැත. අප දන්නා පරිදි සෞම්‍ය සිය ආචාර්ය උපාධි සුදුසු කම සපුරා ඇත්තෙකි. ඔහු ක්‍රියාකාරී අචාර්යවරයෙකි. සරත්චන්ද්‍ර යුගයෙන් පසු සරසවිය තුළ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීමට තරම් ශක්‍යතාවක් ඇති අයෙකි. විදේශීය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ බුද්ධිමය ගනු දෙනු කිරීමට සම්බන්ධතා ගොඩනගා ගත්තෙකි. සෞන්දර්ය විශ්වවිද්‍යාලය මෙතෙක් පැවති කලායතන මට්ටමින් ඉහළට ඔසවා තැබීමට තරම් විභවයක් ඇත්තෙකි. ලංකාවේ විශ්වවිද්‍යාල තුළින් මෙවැනි ආචාර්ය වරුන් හමු වන්නේ කලාතුරකිනි. එවැනි උගත් ක්‍රියාකාරී බුද්ධිමත් ආචාර්ය වරුන් විශ්ව විද්‍යාල තුළ රඳවා ගන්නට කටයුතු කිරීම වගකිව යුත්තන් ගේ වගකීමකි. සෞම්‍ය විශ්විද්‍යාලයට සම්පතකි. එවන් අයෙකු විශ්ව විද්‍යාලයෙන් නෙරපීමට තාක්ෂණික කරුණු සෙවීමට සමත් විශ්වවිද්‍යාල පාලක සභාව කළ යුත්තේ සැබෑ පර්යේෂණ මහාචාර්ය වරයෙකු සේවයේ තබාගෙන ඔහුගෙන් වැඩක් ගැනීමට කටයුතු කිරීමය.”

ප්‍රවීණ රංගධර සෞම්‍ය ලියනගේගෙන් මේ සම්බන්ධයෙන් විමසීමක් කළ අතර, ඔහු කියා සිටියේ “මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුවන බැවින් අදහස් දැක්වීමෙන් වැළකෙන බවය“.

ආන්දෝලනයට ලක්වූ සෞම්‍ය ලියනගේ

මහාචාර්ය
නලීන් ද සිල්වා

මහාචාර්ය
අබේරත්න බණ්ඩාර

මහාචාර්ය නිර්මාල්
රංජිත් දේවසිරි

ආචාර්ය බී. එම්. එච්.
එස්. කේ. බන්නැහැක

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජනක කොට්ටේගොඩ

ප්‍රවීණ සිනමාවේදී
අශෝක හඳගම

අවශ්‍ය දේ 20 නෙමෙයි ජීවන වියදම අඩු කිරීමයි

සමගි ජන බලවේගයේ ජාතික සංවිධායක හා පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක

● භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

● 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එපා කියන්නේ ඇයි?

ඇත්තට ම හේතු ගණනාවක් තිබෙනවා. මේ මොහොතේ රටේ ජාතික අවශ්‍යතාව ආණ්ඩුක්‍රම සංශෝධනය නොවෙයි.

මේ රජයට මීට බොහෝ දේවල් කළ යුතුව තිබෙනවා. රටේ ජනතාවට ගැටලු ගණනාවක් ඇති වෙලා තිබෙනවා. රට ආර්ථිකව අස්ථාවරයි. අද මිනිස්සුන්ට රැකියා අවස්ථා අහිමි වෙලා තිබෙනවා. ජීවන වියදම අධික ලෙස වැඩි වෙනවා. අපි මේ මුහුණ දෙන අර්බුදය තේරුම් අරගෙන මේවා ගොඩ නගන්න අවශ්‍ය පියවර ගැනීම වහාම කළ යුතුව තිබෙනවා. මේ සඳහා ව්‍යවස්ථාවෙන් කිසිදු බාධාවක් නැහැ.

ඒ විතරක් නොවෙයි ආණ්ඩුවත් ජනාධිපතිවරයාත් අද එකම පැත්තේ අය. එකම පක්ෂයේ අය. ඊට අමතරව ශක්තිමත් දේශපාලන බලයක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ බහුතරයත් තිබෙනවා. තවත් මොකටද 20 වැනි සංශෝධනය ගැන දුක් වෙන්නේ. මේ නිසා රටේ මූලික අවශ්‍යතාවය තේරුම් නොගැනීම තමයි ආණ්ඩුවට වැරදිලා තිබෙන තැන. මෙන්න මේ කරුණු නිසා 20 වැනි සංශෝධනයත් මේ මොහොතේ අවශ්‍ය නොවන බව අපි ආණ්ඩුවට අවධාරණය කරන්නේ.

ඒ වගේම ආණ්ඩුව කියන හැටියට අලුත් ව්‍යවස්ථාවක් ගෙන ඒමට කරුණු සම්පාදනය කරනවා. එහෙම වෙන්න ඕන නැහැ. මේ කරුණු ඔය කියන ව්‍යවස්ථාවේදීම ගෙන එන්න පුළුවන්.

උදාහරණයක් ගෙන එන්න නම් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා කරුණු විමසලා කාලයක් අරගෙන සිදු කළ යුතුයි. ඇයි මේ කඩිමුඩියේ ව්‍යවස්ථාවක් ගෙන එන්නේ. එවිට එම ව්‍යවස්ථාව සාර්ථක එකක් වෙන්නේ නැහැ. මෙන්න මේ කරුණ නිසාත් අප 20 ප්‍රතික්ෂේප කරනවා.

● ව්‍යවස්ථා අර්බුදය නිසා යහපාලන කාලයේ ජනාධිපති අගමැති අතර ගැටුම් ඇති වීම නිසා රට අරාජික වූ බව වර්තමාන රජය ප්‍රකාශ කරනවා. එහෙම වුණාද?

ඒක එහෙම වෙන්න බැහැ. ඔවුන් එහෙම කියනවා නම් මේ මොහොතේ වර්තමාන රජයට එහෙම කිසිදු ගැටලුවක් නැහැනේ. පසුගිය ඉතිහාසයේ යහපාලන ආණ්ඩුව කාලේ එවැනි තත්වයක් නිර්මාණය වී තිබුණත් අද වෙනකොට ආණ්ඩුවට එවැනි තත්වයක් නැහැ. ආණ්ඩුව සහ ජනාධිපතිවරයා දෙදෙනාම එක පැත්තක ඉන්නේ.

මොවුන් මේ ගොඩනගන තර්කය හරහා කියන්නේ ආණ්ඩුව සහ ජනාධිපතිවරයා අතර යම් මතවාදයක් තිබෙනවා කියන එක නේද? එහෙම වෙන්න බැහැ. මොකද මේ පාර්ශ්වයන් දෙකම සිදු කළ යුත්තේ ජනතාව ලබා දුන් ජනවරමට අනුව ක්‍රියා කරමින් රටට සේවය කිරීමයි..

ආණ්ඩුවටත් ජනවරමක් තිබෙනවා. නමුත් රටේ අලුතෙන් නීති සම්පාදනය කරන්න ජනතාව ජනවරමක් දීලා නැහැ.

මොකක්ද මේ 20 වැනි සංශෝධනයේ මූලික අරමුණ. පැහැදිලිව පෙනෙන කරුණ තමයි ජනතාව ප්‍රතික්ෂේප කරන කාරණා. සෘජුවම ජනතාවට දරා ගත නොහැකි කාරණා.

විශේෂයෙන් කිවහොත් ඇමති මණ්ඩලයේ ප්‍රමාණය වැඩි කිරීම. පාර්ලිමේන්තුව විසිරුවා හැරීමේ බලය ලබා ගැනීම. ද්විත්ව පුරවැසියන්ට යළි වතාවක් මැතිවරණයට ඉදිරිපත් වීමේ හැකියාව වැනි කරුණු කාරණා රටේ ඉදිරි ගමනට හෝ ප්‍රගමනයට අදාළ වෙන්නේ නැහැ. මේ කරන්නේ තනිකරම බලය තහවුරු කරගෙන ජනාධිපතිවරයා යම් ආකාරයක එක පැත්තකට ගොස් ඒකාධිපති පාලනයකට ගෙන යන නීති සම්පාදනය කිරීමක් හැටියට පෙන්වා දිය හැකියි.

● 19 වැනි සංශෝධනය තුළින් මේ රටට කිසිම වැඩක් සිදු නොවූ බවයි වර්තමාන රජය නිරන්තරයෙන් ප්‍රකාශ කරන්නේ. ඔබ ප්‍රකාශ කරන්නේ 19යෙන් රටට වැඩක් වුණා කියලද?

රටට වැඩක් වෙන්න නම් 19 ද 20 ද කියන එක අදාළ නැහැ. 19 වැනි සංශෝධනය ගෙන ආවේ එක පැත්තකින් රටේ දේශපාලනය වී තිබූ රාජ්‍ය ආයතන ඉන් මුදා ගන්නයි. ඒ වගේම රාජ්‍ය සේවය තුළ ස්වාධීනත්වය ඇති කරන්න. ඒ වගේම රටට සමබර පරිපාලනයක් ඇති කිරීමට.

ආණ්ඩු වෙනස් වුණත් ක්‍රියාත්මක වන වැඩ කටයුතු දිගමට ක්‍රියාත්මක කරන්න.

19 යට එල්ල කරන මූලිකම කරුණු අපි බලමු. ස්වාධීන කොමිසන් ගැන කියනවා. එහි තිබෙන්නේ තාක්ෂණික දුර්වලකමක් විතරයි.

මැතිවරණ කොමිසන් සභාව බලන්න. පුද්ගලයන්ගේ ප්‍රශ්න තිබෙන්නට පුළුවන්. ඒත් ඉකුත් මැතිවරණ දිහා බැලුවාම කිසිදු ජීවිතයක් බිලි නොගෙන ඒවා පවත්වන්ට හැකි වුණා. ඉකුත් ජනාධිපතිවරණය මහ මැතිවරණය මොනතරම් ස්වාධීනව පැවැත්වුණාද මොනතරම් සාධාරණ මැතිවරණයක් ද කියලා අපි රජයෙන් අහන්න කැමතියි. මැතිවරණ කොමිසන් සභාව නිසා සාධාරණ නිදහස් මැතිවරණයක් පැවැත්වුණා කියන එක අප සියලු දෙනා පිළිගත යුතු කාරණාවක් බව මා මතක් කර සිටිනවා. කොමිසමට පෙර මැතිවරණවලදී කොයිතරම් මිනිස් ජීවිත අහිමි වුණාද.

● ආණ්ඩුව ජනතාවගෙන් තුනෙන් දෙක ඉල්ලුවේ මේ ව්‍යවස්ථා සංශෝධනයට. පාර්ලිමේන්තුවේදි එය ජයග්‍රහණය කිරීමට රජයට හැකිවේද?

ඒක සම්පූර්ණයෙන්ම වැරදි මතයක්. ජනතාවට කිව්වද ජනාධිපතිවරයාගේ දුර කාලය දික් කරනවා කියලා. නෑ. ජනතාවට කිව්වද ඇමති මණ්ඩලය වැඩි කරන්න අපි බලය ඉල්ලනවා කියලා. නෑ. ජනතාවට කිව්වද ද්විත්ව පුරවැසි භාවය යළි පණගන්වනවා කියලා. නෑ. මේ දේවල් කියලා නොවෙයි බලය ඉල්ලුවේ. ව්‍යවස්ථා සංශෝධනය කියන වචනය විතරයි ජනතාවට කිව්වේ. මෙය ජනතාවට කරපු අසාධාරණයක් හැටියටයි අපි දකින්නේ.

තුනෙන් දෙකක බලයත් පෙන්වීමට ආණ්ඩුවට හැකියාවක් නැහැ කියන කාරණය පැහැදිලිය. ආණ්ඩු පක්ෂයේම මැති ඇමතිවරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සැලකිය යුතු පිරිසක් මේ සඳහා සිය විරෝධය දක්වා තිබෙනවා.

● ඔබ එසේ කීවත් ආණ්ඩුවේ ඇමතිවරු ප්‍රකාශ කරනවා විපක්ෂයේ මන්ත්‍රීවරු තිස්දෙනකු ආණ්ඩුවට සහය දක්වන බව. එය එසේ සිදු වේවිද?

සමගි ජන බලවේගයේ නම් එහෙම කණ්ඩායමක් ඉන්නවා කියන එක මම කිසිසේත්ම පිළිගන්නේ නැහැ. සමගි ජන බලවේගය එකට එකතුවෙලා වැඩකටයුතු කරන්නේ සාමූහික හැඟීමෙන් යුතුවයි.

ඔය කියන කතාව විවිධ පුද්ගලයන්ට විවිධ පක්ෂවලට එල්ල කරන්න පුළුවන්. තාම එහෙම දෙයක් වෙලා නැහැනේ. අපි දැඩිව විශ්වාස කරනවා 20 වැනි සංශෝධනය කියන්නේ ජනතා විරෝධී පනතක්. එය පරාජය කිරීම සඳහා සියලු දෙනා එකට එකතුවෙලා වැඩකටයුතු කළ යුතුයි කියලා. මේ සඳහා පාර්ලිමේන්තුවේ බහුතරයක් අප සමඟ එක්වෙනු ඇතැයි අප අපේක්ෂා කරනවා.

තවත් පැත්තකින් ආණ්ඩුව තනතුරු වරප්‍රසාද, මුදල් ලබාදීලා මන්ත්‍රීවරු ඒ පැත්තට ගන්න උත්සහ කරනවා නම් ඒකත් මේ රටේ සාදාචාර සම්පන්න දේශපාලන නායකයන් විසින් නොකළ යුතු කාරණයක්. මේ රටේ ජනතාව වර්තමාන සහ අනාගත දේශපාලන ක්‍රියාවලියේදි එවැනි ක්‍රියා දැඩිව ප්‍රතික්ෂේප කරනවා.

● මහ මැතිවරණ වේදිකාවේදී වර්තමාන රජය විසින් දිගින් දිගටම ප්‍රකාශ කළා බැදුම්කර හොරුන් ඇතුළු වංචනිකයන් අත්අඩංගුවට ගන්නා බව. දේශපාලන වේදිකාවල ඒ සම්බන්ධව රජය පියවර නොගන්නා බවට ප්‍රකාශ වෙනවා. මේ පිළිබඳව ඔබගේ අදහස?

යහපාලන ආණ්ඩුවටත් මේ චෝදනාවම එල්ල වුණා. හොරු අල්ලන්න ආපු ආණ්ඩුව හොරු විසින් අල්ල ගත්තා කියන චෝදනාව යහපාලන රජයට දිගින් දිගටම එල්ල වුණා.

අද ඒ කතාවම මේ ආණ්ඩුවටත් සිදුවෙලා තිබෙනවා. මහ බැංකුවේ බැදුම්කර වංචාව, තවත් වංචා දූෂණ රැසක් පිළිබඳව ප්‍රසිද්ධියේ කතා වුණා. හැබැයි මේ කිසිවක් ගැන වර්තමාන රජය ක්‍රියාත්මක වන ආකාරයක් අපිට පෙනෙන්නට නැහැ. එයින් පෙනී යන්නේ යහපාලනයෙන් සිදු කරා කියන කාරණයම මේ ආණ්ඩුවෙනුත් සිදු කරනවා කියන එකයි. හොරු වංචාකාරයන් දූෂිතයන් ආරක්ෂා කිරීමට මේ ආණ්ඩුවත් ක්‍රියා කරන බව පෙනී යනවා.

● පාස්කු ප්‍රහාරයට අදාළව ජනාධිපති කොමිසමක් මෙන්ම පොලිසිය විසින් පරීක්ෂණ සිදු කරගෙන යනවා. විපක්ෂය ඒ පිළිබඳව සෑහීමකට පත්වෙනවාද?

පාස්කු ප්‍රහාරයේ පරීක්ෂණ පිළිබඳව දැනට මේ ක්‍රියාත්මක වන පරීක්ෂණ ඉතා හොඳයි. මෙහිදී අපිට පෙනෙන කරුණක් තමයි බොහෝ දෙනකු වගකීම් පැහැරහැර තිබෙනවා. අනික අවධානය යොමු නොකළා කියන කාරණය. සමාජයේ බොහෝ දෙනෙකු මේ පිළිබඳව සැකයක් සංකාවක් ඇති කරගෙන තිබෙනවා.

මේ කාරණය නිසා මෙහි පරීක්ෂණවලින් පසුව මෙහි වගකීම භාර ගත යුතු අයටත් මේ පිළිබඳව නොසැලකිලිමත්ව ක්‍රියා කරපු අයටත් අනිවාර්යෙන්ම දඬුවම් ලබා දිය යුතුයි. අපි ඒ පිළිබඳව දැඩි අවධානයකින් සිටින බව රජයට අවධාරණය කරන්නට කැමතියි. කවුරු වරදක් කර ඇතත් නීතිය ක්‍රියාත්මක කරන්න කියලා අපි රජයෙන් ඉල්ලීමක් ද කරනවා.

● සමගි ජන බලවේගයේ සහෝදර පක්ෂ දැන් විරසක වෙලා ඇති බව ජන මාධ්‍යයෙන් කියවෙනවා. එය සත්‍යයක්ද?

එහෙම කිසිම අර්බුදයක් නෑ. අපගේ සමගිය, එකමුතුකම විඳ දරාගන්න බැරි අය තමයි එවැනි කතා නිර්මාණය කරන්නේ. එය දේශපාලනයේදී සාමාන්‍ය තත්වයක්. එවැනි කරුණු ගැන අපි සැලකිලිමත් වන්නේ නැහැ.

අපි සමගි ජන බලවේගය පක්ෂයක් හැටියට ක්‍රියාත්මක වන අතරම සමගි ජන සන්ධානයක් හැටියටත් ක්‍රියා කරන්නට ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

● සමගි ජන බලවේගය පක්ෂයක් හැටියට ඉදිරි ගමනට සූදානම් වන්නේ කොහොමද?

ඉකුත් මහ මැතිවරණයට අප මුහුණ දුන්නේ බිම් මට්ටමේ කිසිදු ක්‍රියාකාරකමක් නොමැතිවයි. සමගි ජන බලවේගය කියලා නාමිකව ඇති කරගත් පක්ෂයක්. ඒ වගේම බිම් මට්ටම් සංවිධාන ජාලයක් නොමැතිව අපිට පුළුවන්කම ලැබුණා ප්‍රථම ජයග්‍රහණය ලබා ගන්න. ඒ අනුව අපි පාර්ලිමේන්තුව තුළ ආසන පනස් හතරක් ලබා ගත්තා. ඒත් එක්කම මෙය ඉතිහාසගත වන වාර්තාවක්. මොකද හේතුව මාස දෙකක් දෙක හමාරක කාලය තුළදී තමයි සමගි ජන බලවේගය මෙම ජයග්‍රහණය ලබා ගත්තේ.

අපි මේ වන විට අපගේ බිම් මට්ටමේ ජාලය හදන ව්‍යාපාරය ආරම්භ කරලා ඉවරයි. අපි ඉකුත් සති අන්ත දෙකම දිස්ත්‍රික්ක හතරක ඡන්ද පොළ මට්ටමේ ක්‍රියාකාරී සංවිධාන ගොඩ නගන්නට මෙය ප්‍රාදේශීය මට්ටමින්, දිස්ත්‍රික්ක පළාත් සහ ජාතික මට්ටමින් ක්‍රියාවට නංවනවා.

ඕනෑම මැතිවරණයකට මුහුණ දීමට අපි දැනටමත් ලෑස්තියි

ඔක්. 09 වැනි දිනට යෙදෙන ලෝක තැපැල් දිනය නිමිත්තෙනි

හැට පැන්නත් බිම නොයන තැපැල් සේවය

● රසික කොටුදුරගේ

ලොව පුරා රටවල් 193ක් නියෝජනය කරන විශ්ව තැපැල් සංගමය තැපැල් කටයුතු පිළිබඳ විශ්ව මෙහෙයුම් මධ්‍යස්ථානය වශයෙන් සැලකේ. ලිපි තැපැල් කිරීමෙන් ආරම්භ වූ තැපැල් සේවය ක්‍රමයෙන් භාණ්ඩ හා විවිධාංගීකරණයට ලක් වූ වෙනත් වාණිජ සේවා සපයමින් ලෝක වාසීන්ට මහඟු මෙහෙවරක් ඉටු කරයි. ජාත්‍යන්තර තැපැල් කටයුතු ව්‍යාප්ත වීමත් සමඟ පොදුවේ පිළිගනු ලබන එකඟතාවන් හා නීතිරීතිවල ගැටලු මතු වූයෙන් ජාත්‍යන්තරව පිළිගත හැකි සම්මුතින්වලට එළඹීමේ අවශ්‍යතාව මතු විය.

මේ ආකාරයේ එකමුතුවක් පිළිබඳ ප්‍රථම වරට අදහස් ඉදිරිපත් කරන ලද්දේ ඇමරිකා එක්සත් ජනපදයේ පෝස්ට් මාස්ටර් ජනරාල් ධූරය හෙබ වූ තොන්ටිගෝමරි බ්ලෙයාර් ය. වසර 1863 මැයි 11 වැනිදා ඇමරිකාව සහ යුරෝපය රටවල් 15 ක නියෝජිතයන් ප්‍රංශයේ පැරිස් නුවරට රැස් වී ජාත්‍යන්තර තැපැල් කටයුතු පිළිබඳ පාර්ශ්වීය එකඟතාවන් සඳහා පොදු නීති මාලාවක් සකස් කළේය.

මේ අතර තුර උතුරු ජර්මානු තැපැල් සේවයේ නිලධාරියකුව සිටි හෙන්රිච් වොන් ස්ටීවන් විසින් වඩාත් ප්‍රායෝගිකව සහ පුළුල්ව තැපැල් කටයුතු ජාත්‍යන්තරකරණය සඳහා වන අදහසක් ඉදිරිපත් කළේය. ස්විස්ටර්ලන්තයේ බර්න් නගරයේ දී රටවල් 22ක නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් 1874 සැප්තැම්බර් 15 වැනිදා ඇරඹී මෙම සමුළුවේ දී ගනු ලබන තීරණයකට අනුව ඔක්තෝබර් 09 වැනිදා ඓතිහාසික බර්න් ගිවිසුම අත්සන් කරමින් ජෙනරල් පෝස්ටල් යූනියන් (General Postal Union) නමින් නව සංවිධානයක් ආරම්භ කළේය. පසුව වර්ෂ 1878 දී සංවිධානයේ නාමය විශ්ව තැපැල් සංගමය (Universal Postal Union -UPU) බවට නාමකරණය විය. ලෝක සමුළුවක් වශයෙන් 1874 දී තැපැල් සංගමය නිර්මාණය වීමත් සමඟ මෙම සංවිධානයේ සැසිවාර කිහිපයක්ම පවත්වන ලද අතර පැවැත්වෙන ස්ථානය වසරින් වසර රටින් රටට මාරුවෙමින් පැවතුණි. මේ අයුරින් තැපැල් සමුළු සාමාජික රටවල පැවැත්වීමේ දී සංගමයක් වශයෙන් මුදුන් පමුණුවා ගත් ගෞරව සහ ජයග්‍රහණ සැමරීමට ඊටම ආවේණික වූ දිනයක් නොමැති අඩුපාඩුව කැපී පෙනෙන්නට විය. වසර 1969 දී ටෝකියෝ නගරයේ පැවැති ලෝක සමුළුවේ දි බර්න් ගිවිසුම අත්සන් කළ ඔක්තෝබර් 09 වැනිදා විශ්ව තැපැල් දිනය වශයෙන් ප්‍රකාශයට පත් කෙරිණි. පසුව වසර 1984 දී හැම්බර්ග් සමුළුව විශ්ව තැපැල් දිනය (World Post Day) වශයෙන් නම් කරන ලදී. මෙවර එය පවත්වන්නේ 146 වැනි වතාවටය.

ලන්දේසීන් විසින් මෙරට පාලනය කළ සමයේ එනම්, වර්ෂ 1798 දී ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් ලංකාවේ තැපැල් සේවය ආරම්භ කෙරිණි. ඒ අනුව කොළඹ, ගාල්ල, මන්නාරම, යාපනය හා ත්‍රිකුණාමලය යන මුහුදුබඩ පළාත්වල මුල්ම තැපැල් කාර්යාල පහ පිහිටු විය. වර්ෂ 1799 දී තැපැල් රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම සහ තැපැල් ගාස්තු නියම කිරීමත් සමඟ මෙහි කටයුතු ආරම්භ විය. ශ්‍රී ලංකා තැපෑලට අවුරුදු 221 ක තරම් වූ දීර්ඝ ඉතිහාසයක් ඇත. ලන්දේසීන් විසින් පිහිටවූ "ඊස්ට් – ඉන්දියා කොම්පැණි" නමැති ආයතනය එවකට තැපෑල සේවාව මෙහෙය වූ අතර, එවක සාමාන්‍ය ජනතාවට එහි සේවය නොලැබුණි. එකල මෙම සේවය රාජකාරී කටයුතුවලට පමණක් සීමා විය. යාපනය දිස්ත්‍රික්කයට අයත් ඩෙල්ෆ් දූපතේ ඇති පරෙවි තැපෑල පිළිබඳ නටබුන් හැරුණු කොට 1798 සිට 1815 දක්වා වූ ඉතිහාසය පිළිබඳ සඳහන් කිරීමට තරම් වූ ලිඛිත සාක්ෂි එතරම් හමු නොවේ.

තැපැල්පති
රංජිත් ආරියරත්න

වෘත්තීය සමිති
කැඳවුම්කරු ජයන්ත

ලංකාවේ එකම තැපැල්
බෙදන්නිය කළුතර චන්ද්‍රාවතී

1815 දී උඩරට ගිවිසුම නම් කුට ලේඛනය මඟින් මෙරට පාලන බලය බ්‍රිතාන්‍යයන් අතට පත් වීමත් සමඟ ඔවුන් තැපැල් සේවාව ප්‍රතිසංවිධානය කරන ලදී. 1857 අප්‍රේල් පළමු වැනිදා වික්ටෝරියා රැජිනගේ රූපය සහිත ශ්‍රී ලංකාවේ පළමු මුද්දරය නිකුත් කෙරිණි. 1882 දී ස්ථිර තැපැල් කාර්යාලයක් කොළඹ පිහිටුවන ලද අතර, එවකට ලංකාවේ ප්‍රථම තැපැල්පතිවරයා වූයේ ගුවන් හමුදා නිලධාරියෙක් වූ ඒ. කෙනඩිය. කෙසේ වෙතත් 1815 තරම් වූ ඈත යුගයේ දී තැපැල්පතිවරුන් ගණනාවක් සිටිය අතර ඊ. බ්ලැටර්මන් මුළු දිවයිනටම තැපැල්පතිවරයා විය. ඉන් අනතුරුව ඊ. බ්ලැටර්මන්ගේ ඇවෑමෙන් 1817 දෙවන තැපැල්පතිවරයා ලෙස පත්වූයේ ලුවිස් සන්සෝනිය. තෙවන තැපැල්පතිවරයා වශයෙන් පත්වූ මේජර් ජී. ස්ටුවට්, ඒ මහතාගේ පාලන කාලය තුළදී දිවයිනේ ප්‍රධාන නගරවලට තැපැල් සේවාව ව්‍යාප්ත කිරීමට ඔහු සමත් විය. තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව වශයෙන් හැඳින්වූ එවක තැපැල් සේවාව අභිමානනීය සේවයක් ඉටු කළේය. විශ්ව තැපැල් සංගමය තුළ දෙවරක් සාමාජිකත්වය ලබා ගත් රටක් වශයෙන් ශ්‍රී ලංකාව සැලකේ. වර්ෂ 1877 අප්‍රේල් 01 වැනිදා බ්‍රිතාන්‍ය යටත්විජිතයක් වශයෙන් තිබියදී ශ්‍රී ලංකාව (සිලෝන්) එහි සාමාජිකත්වය හිමි කර ගත් අතර, වර්ෂ 1949 ජූලි 13 වැනිදා නිදහස් රාජ්‍යයක් වශයෙන් නැවත වතාවත් සාමාජිකත්වය හිමි කර ගත්තේය. ශ්‍රී ලංකා තැපෑල අවුරුදු 221 ක කාලයක් තිස්සේ ක්‍රියාකාරීව පවතින අතර, මෙය ශ්‍රී ලංකාවේ ඇති පැරණිම දෙපාර්තමේන්තුවලින් එකකි.

ශ්‍රී ලංකා තැපෑල ආසියාවේ මුල්ම තැපැල් රථය හඳුන්වාදීමේ ගෞරවය හිමි කරගෙන සිටින අතර 1832 දී කොළඹ- මහනුවර අතර අශ්ව රථ මඟින් තැපැල් හුවමාරුව සිදු කර ඇත. ඉන් අනතුරුව 1838 දී තවත් තැපැල් රථයක් කොළඹ සහ ගාල්ල අතර ආරම්භ කරන ලදී. වර්ෂ 1892 දී ප්‍රථම "ජංගම තැපැල් කාර්යාලය" සිය මුල්ම ගමනාරම්භය සනිටුහන් කළ අතර එය කොළඹ සහ මහනුවර තදාසන්න ප්‍රදේශයක් වන පේරාදෙණිය දක්වා ධාවනය විය. එතැන් සිට ගතවූ වසර ගණනාවක් තිස්සේ තැපැල් ප්‍රවාහනය සඳහා සහ බෙදීම සඳහා විවිධ ප්‍රවාහන මාධ්‍යයන් යොදා ගැනිණ.

මේ වනවිට දිවයින පුරා තැපැල් කාර්යාල 653 ඇති අතර, උප තැපැල් කාර්යාල සංඛ්‍යාව 3410කි. සමස්ත ස්ථිර කාර්ය මණ්ඩලය 22800ක් වන අතර, ඉන් 8000ක පමණ පිරිස කනිෂ්ඨ තැපැල් සේවකයින් (ලියුම් බෙදන්නන්) ය. ආදේශකයන් 4500න් පමණ පිරිසකගේ අවශ්‍යතාව පවතින අතර දැනට ඇත්තේ 2000ක පමණ පිරිසකි. තැපැල් සේවා නිලධාරීන් 5500 පමණ සේවා අවශ්‍යතාවයක් පවතින අතර දැනට සිටින්නේ 4400 පමණ පිරිසකි. 1100ක පමණ පුරප්පාඩුවක් පවති. දැනට සේවා නියුක්තව සිටින සියල්ලන් සඳහාම වසරකට රුපියල් මිලියන 14,000ක් පමණ වැයවන අතර, ඉන් 91% ම වැය වන්නේ වැටුප් සහ අනෙකුත් දීමනා සඳහාය. නමුත් තැපැල් සේවා දෙපාර්තමේන්තුව වසරකට උපයන ආදායම රුපියල් මිලියන 8396 (2019 වසර)කි. රුපියල් මිලියන 6000ක පමණ මුදලක් රජයට දැරීමට සිදු වේ. මීට පිළියමක් ලෙස තාක්ෂණික ක්ෂේත්‍රය දියුණු කිරීමට අවශ්‍ය වන අතර, ඊට වසර පහක සැලැස්මක් යෝජනා කර ඇත. ඒ සඳහා විශාල ආයෝජනයක් කළ යුතුය. 2021 අයවැයෙන් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන බව ජනාධිපතිවරයා සමඟ කළ සාකච්ඡාවේදී ප්‍රකාශ කළ බව තැපැල්පති රංජිත් ආරියරත්න අප සමඟ පැවසීය.

ශ්‍රී ලංකා පොදුජන තැපැල් වෘත්තිය සමිති සන්ධානයේ කැඳවුම්කරු ජයන්ත විජේසිංහ සඳහන් කර සිටියේ වර්තමානය වන විට කනිෂ්ඨ සේවකයන් ඉතාම දුෂ්කර අඩියකට වැටී ඇති බවයි. එසේ වුවත් සිය කාර්ය නොපිරිහෙළා ඉටු කරන බවයි. වර්ෂා දිනවල ලියුම් බෙදීම සඳහා යන විට පැලඳීමට වැසි කබායක් හෝ හිස්වැස්මක් මොවුන්ට නැත. ඔවුන් ගමන් ගන්නේ යතුරුපැදි සහ පා පැදි වලිනි. කඳුකර ප්‍රදේශවල සේවයේ නියුතු කනිෂ්ඨ සේවකයෝ (ලියුම් බෙදන්නන්) කඳු නගිමින් පල්ලම් බසිමින් සිය කාර්යය ඉටු කරති. ඔවුන් පැය අටකට වඩා වැඩි කාලයක් තම ලොට් එක තුළ කටයුතු කළද ඒ සඳහා ගෙවීමක් සිදු නොවේ. කිසියම් හේතුවක් නිසා වෙනත් ලොට් එකක අතිරේකව සේවය කළද හිමිවන්නේ අතිකාල පැය හතරක් පමණි. බොහෝ විට මේ සඳහා යොදවන්නේ ආදේශකයකි. එනිසා එම අවස්ථාවද ඔවුන්ට අහිමිය.

ග්‍රාමීය නාගරික භේදයකින් තොරව මෙකී තත්ත්වය කනිෂ්ඨ සේවකයන් සැමට එක සමානය. මොවුන්ගේ මූලික වැටුප රුපියල් 15,000 පමණ වේ. අනෙකුත් දීමනා සමඟ රුපියල් 25,000කට ආසන්න වේතනයක් ලබා ගත්තද සමිති මඟින් ලබා ගන්නා ණය හා වෙනත් ණය තුරුස් ගෙවූ විට ඉතිරි වන්නේ රුපියල් 10,000ක පමණ සොච්චම් වැටුපකි. මීට කදිම උදාහරණය වන්නේ තැපෑල වෙනුවෙන් මහත් කැපවීමක් කළ කනිෂ්ඨ සේවිකාවක් වූ පයාගල ප්‍රදේශයේ කටයුතු කරන චන්ද්‍රවතී කඳුරුවලය. වසර 15ක් පුරා මේ රැකියාවේ නිරතවන ඇය සතියකට වැඩ කරන කාලය දින හයකි. චන්ද්‍රාවතී දෛනිකව මේ තැපැල් මලු එකතු කිරීම සඳහා කිලෝමීටර් 15ක් පමණ පාපැදියෙන් ගමන් කරන අතර මසකට දින 25ක් සේවය කරයි. ඇයගේ මාසික වේතනය රුපියල් 4000ක් වුවත් ඇ කිසිදා ඒ වෙනුවෙන් මැසිවිලි නැඟුවේ නැත. පසුගිය ලෝක තැපැල් දිනය වෙනුවෙන් ඇය ඇගයීමට ලක් කෙරුණු අතර වසර 15ක් දෛනිකව පා පැදියෙන් ගිය ඇයට එදින හිමි වූයේ ද පාපැදියක් පමණි. කනිෂ්ඨ සේවකයාගේ තත්ත්වය මෙයවන විට ඉහළ නිලධාරීහු වැඩි වෙහෙසක් නොගෙන සුර සැප විඳිති.

පාඩු පිට පවත්වාගෙන යන මෙවැනි ආයතන ලාබ ලබන ආයතන බවට පත් නොකර මෙකී කනිෂ්ඨ සේවක ගැටලු විසඳීමට නොහැකිය. එනිසා පෞද්ගලික අංශය හා තරගකාරී තත්ත්වයට මෙය පරිවර්තනය කිරීමෙන් මෙම ඉලක්ක සපුරාගත හැකිය. සෞභාග්‍යයේ දැක්ම අනුව යමින් මෙවැනි පාඩු ලබන ආයතන වඩා ඵලදායී කාර්යක්ෂම සේවා සපයන ආයතන බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ වෙමින් පවතී. ලබන වසරේ අයවැය මඟින් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට ජනාධිපතිවරයා උපදෙස් ලබාදී ඇත.

දිවමිණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2020ක් වූ ඔක්තෝබර් මස 04 වැනිදා ඉරිදා

නව ආර්ථිකයක්! පියවර දසදහසක්!!

ගෝලීය ආර්ථිකය 1930 දශකයේ ඇතිවූ ලෝක ආර්ථික අවපාතයෙන් පසු දරුණුතම පසුබෑමට මුහුණ දෙමින් සිටියි. සියවසක මහා භීතිය ඇති කළ කොවිඩ් 19 ඉගැන්වූ පාඩම් අතර ආර්ථික පාඩම තරම් බලවත් පාඩමක් නැත. ඒ පාඩම අතර තිබෙන ප්‍රධානම අනතුරු ඇඟවීම ගෝලීයකරණයේ වන අන්ත්‍රාවයි. ලෝකය එකම යායක් යැයි කියූ බොහෝ දෙනෙක් දැන් එවැනි කතා කියන්නේ නැත.

එනිසාම අන් කවරදාටත් වඩා අද වන විට ගෝලීයකරණය කෙරෙහි බොහෝ පර්ශ්ව විවේචනාත්මකව කතා කරති. රාජ්‍ය නොවන සංවිධානය පෙන්වා දෙන්නේ ගෝලීයකරණයේ අනුහස නිසා ලෝකයේ ධනවත් ම පුද්ගලයන් 8 දෙනාගේ වත්කම ගෝලීය දුගී ජනගහණයෙන් 1/2 කොටසක් වන බිලියන 3.6 ක ජනයාගේ වත්කමට සමාන වන බව ය. ගෝලීයකරණ ක්‍රියාවලිය වේගවත් කිරීමට උර දුන් ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු බටහිර යුරෝපියානු රටවල්, වාර්තමානය වන විට ඒ ක්‍රමවේද හා ප්‍රතිපත්ති කෙරෙහි සැකසංකා මතුකරමින් සිටී. ගෝලීයකරණ විරෝධී කණ්ඩායම් බටහිර රටවල බිහිව ඇත්තේ මේ අනර්ථ සඳහා වූ විරෝධය මතු කිරීමට ය.

ශ්‍රී ලංකාව වෙත ගෝලීයකරණයෙහි අභියෝගවලට මුහුණ දීමට සිදුවී තිබෙන්නේ රාජ්‍ය අවපාලනයක අම්හිරි ප්‍රතිඵල සමඟ ය. ක්‍රමානුකූල ව සිදු නොවූ ආර්ථික ලිහිල්කරණය හා ආනයන ප්‍රතිපත්ති නිසා දේශීය නිෂ්පාදකයා තිරයෙන් ඉවත් වී තිබේ. කුඩා ආර්ථිකයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවට ගෝලීය වෙළෙඳාමේ සාධාරණ කොටසක් හිමිකර ගැනීමට තවමත් නොහැකි ව ඇත. අප අන්තර්ජාතික වෙළෙඳාම සඳහා වන බාධක ලිහිල් කිරීමෙන් චීනය, ඉන්දියාව වැනි ඉහළ නිෂ්පාදන පරිමානුකූල පිරිමැසුමක් සහිත රටවල් වෙතින් කෙරෙන ආනයන හමු වේ. දේශීය නිෂ්පාදන මරණ මංචකය වෙත ගෙන යන ලදී. ඒ රටවල් සමඟ කරනු ලබන වෙළෙඳාමේදී අපගේ අපනයන ආදායමට වඩා හතර පස් ගුණයකින් වැඩි ආනයන වියදමක් දැරීම, වර්තමානයේදී ශ්‍රී ලාංකේය ආර්ථිකය වෙත ඉතා අහිතකර තත්ත්වයක් ගෙන දී ඇත. අනෙක් අතට අප රටෙහි පර්යේෂණ හා සංවර්ධන කටයුතු කෙරෙහි වූ ආයෝජනයන්හි තිබෙන දැඩි පසුබැසීම් හේතුවෙන් අන්තර්ජාතික වෙළඳාමේ දී ඉහළ ලාබදායි අංශ වෙත ළඟා වීමට නොහැකි ව ඇත. සීමිත සම්පත් සහිත රටවල් වන ජපානය, තායිවානය හා සිංගප්පුරුව වැනි රටවල් පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලින් අධි තාක්ෂණික උපාංග නිෂ්පාදනය වෙත පිවිස තම ආර්ථිකය ඉහළ වර්ධනයක් දෙසට ගෙන යන ලදී.

සරල තැනකින් පටන් ගන්න යැයි ජනාධිපතිවරයා රාජ්‍ය අමාත්‍යවරුන්ට දුන් උපදෙස වටින්නේ මේ කරුණු පසුබිමේ ලා සලකද්දී ය. සරල හා පුංචි තැන්වලින් පටන් ගැනීම ආර්ථික න්‍යායෙකි. ශ්‍රී ලංකාව වැනි දේශීය පරිභෝජනයක් ඇති රටවලට ඒ න්‍යාය ඉතා හොඳින් ගළපා ගත හැකිය. ඉන්දියාවේ ප්‍රකට ආර්ථික විශේෂඥයන් කිහිප දෙනකුම මෙහි ප්‍රායෝගික වැදගත්කම පෙන්වා දී ඇත. බංග්ලාදේශයේ ග්‍රාමීන් බැංකු ව්‍යාපාරයෙහි පදනම සරල හා පුංචි තැනින් පටන් ගැනීම ය. එහි නිර්මාතෘ මහාචාර්ය මොහොමඩ් යුනුස් නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විශේෂඥයෙකි. නොබෙල් ත්‍යාගලාභී තවත් ආර්ථික විශේෂඥයකු වන ආචාර්ය ඊ.එෆ්. ෂූමාකර් 'පුංචි දේ ලස්සනයි' නමින් පොතක් ද ලියා ඇත. ජනාධිපතිවරයා කියන්නේ ලෝක පූජිත මේ සත්‍ය ගැන ය.

ලොව විද්‍යාවන් අතර වඩාත් පෙරමුණ ගන්නේ ආර්ථික විද්‍යාව ය. එය නූතන ලෝකයේ වැදගත් ම විද්‍යාවයි. රටක ඉදිරි ගමන තීන්දු කරන ප්‍රධාන සාධකය එරට ආර්ථික ප්‍රතිපත්තියයි. රාජ්‍ය නායකයකුගේ සාර්ථකත්වය තීන්දු කරන ප්‍රධාන සාධකය වන්නේ ද ඔහුගේ ආර්ථික ප්‍රතිපත්තිය හා දැක්මයි. ජනාධිපතිවරයාගේ ආර්ථික දැක්ම හා වැඩපිළිවෙළ ඉතා පැහැදිලි ය; ඒ දිගු ගමනක මූලාරම්භය ය. එය මිනිසුන් වැදගත්කොට සලකන හා දේශීය සම්පත් කෙරෙහි වැඩි විශ්වාසය තබන ප්‍රායෝගික ආර්ථික දර්ශනයකි.

සාමාන්‍ය ජනතාව ඉලක්ක කරගත් ආර්ථිකයක් යනු පොළොවේ දර්ශනයයි. එනිසාම එය මේ භූමියේ නිරායාසයෙන් පැළ කළ හැකි ආර්ථික දර්ශනයකි. මහ පැරකුම්බා රජ සමය මෙන් හාල් පිටරට යවන්නට තවමත් බැරි බව සත්‍යයකි. හාල් බලේ පෙන්නන්නට මැතිනියගේ සමයේ මෙන් හර්තාල් කරන්නට කාටවත් සිදු වී නැත. ඒත් හාලේ බලේ ලොවට ම පෙන්වන්නට අපට කැපෙන පාරේ සුඛෝපභෝගීව නැතත්, දුක් ගැහැටක් නැතිව යන්නට ලැබෙන බව නම් ස්ථිර ය. එනිසා පාර කාපට් කර ගැනීමේ අවශ්‍යතාව අප ඉදිරියේ ඇත; එනම් සාමාන්‍ය ජනයා වන අපට මේ ක්‍රමය පැළ කරගන්නට අවැසි පොහොර රජයට සැපයීමේ වගකීමක් ඇත.

භෞතික සම්පත් ලෝකය පුරා එක සමාන ලෙස ව්‍යාප්ත වී නැත. බොරතෙල් ඇත්තේ එක තැනක ය; තිරිඟු ඇත්තේ තව තැනක ය; දියමන්ති ඇත්තේ තවත් තැනක ය; ඇතැම් ප්‍රදේශ කාන්තාර ය; තව ප්‍රදේශ වැසි වනාන්තර ය; තවත් ප්‍රදේශ මුඩු බිම් ය; තිබෙන සම්පත් ප්‍රමාණවත් තරමින් පරිභෝජනයට ගත යුතුය. උවමනාකම් සිහි බුද්ධියෙන් යුක්තව සපුරා ගත යුතුය. ප්‍රාදේශීය සම්පත්වලින් ප්‍රාදේශීය වුවමනාකම් සපුරා ගැනීම බුද්ධිමය ජීවන ක්‍රමයක් බව නූතන ආර්ථික විද්‍යාව සඳහන් කරයි. ආනයන සිදු විය යුත්තේ අත්‍යවශ්‍ය කටයුතු සඳහා පමණි. අපේ සම්පත්, අපේ උවමනාකම් සඳහා හොඳටම ප්‍රමාණවත්ය. අවශ්‍ය වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය සංවිධානගත කිරීමය.

ශ්‍රී ලංකාවේ පිහිටීම, භූ - විෂමතාව, දේශගුණික රටාව හා පස අගනා ස්වභාවික සම්පත් ලෙස හඳුන්වනු ලැබේ. පිහිටීමට අනුව විශේෂ සාගර කලාපයක් අපට අයත් ය. දකුණු ආසියාවේ කේන්ද්‍රීය ස්ථානයක රට පිහිටා ඇත. එහෙත් පිහිටීමෙන් නිසි ප්‍රතිලාභ ලබන්නට තව ම අපි සමත් වී නැත. රට වටා මුහුදක් පැවැතිය ද පරිභෝජනයට අවශ්‍ය මාළු ටික හෝ සපයා ගන්නට අපි තවමත් අසමත් ය. අපි මෙතෙක් අනුගමනය කර ඇති ආර්ථික උපාය මාර්ග හා ආර්ථික ප්‍රතිපත්ති වැරදි බව පෙනී යයි. රටට ගැළපෙන හා ජනතාවට ඔරොත්තු දෙන වැඩසටහන් අපට අවශ්‍ය වේ. ඒවා මහවැලි ව්‍යාපාරය මෙන් විශාල ව්‍යාපෘති නොවූවාට කමක් නැත. ජනාධිපතිවරයා සරල තැනින් පටන් ගන්න යැයි කියන්නේ ඒ නිසා ය.

කිතුල් ගහට, ගම්මිරිස්වලට, අලි වැටට වග කියන රාජ්‍ය අමාත්‍යවරුන් පත් කිරීම අලුත් අත්දැකීමකි. එහි ඇත්තේ යථාර්ථවාදී තෝරා ගැනීමකි. අපේ විභව සම්පත් ආවරණය වන අයුරින් රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක විය යුතු අතර, සෑම ක්ෂේත්‍රයක් සඳහා ම වගකීම් දරන්නකු හා වගකීම් දරන ආයතනයක් පැවැතීම ඉතා වටී. නිදි වර්ජිතව වැඩකරන පුංචි මිනිසුන්ගෙන් ලෝකය වෙනස් කළ හැකිය. එහෙත් ඔවුන් විධිමත් කළමනාකරණ ක්‍රියාවලියකට හසු කර ගත යුතුය. ඒ වෙනුවෙන් වගකීම් හා යුතුකම් ඉටු කරන නායකයකු සිටීම ඉතා වැදගත් ය. ජනාධිපතිවරයා මේ තත්ත්වය හොඳින් වටහාගෙන ක්‍රියාත්මක වීම වටින්නේ ඒ නිසා ය.

'විධායක බලය ජනතා සුබසෙතටයි'

ජනාධිපති නීතිඥ යූ. ආර්. ද සිල්වා

● **සුභද්‍රා දේශප්‍රිය**

මේ වනවිට රටේ ප්‍රධාන සමාජ කතිකාව බවට පත්ව ඇත්තේ විසිවැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවයි. විසිවන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පසුගිය දිනක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කැබිනට් අනුමැතිය හිමි විය. 2015 වසරේ බලයට පත් ආණ්ඩුව මඟින් 19 වැනි සංශෝධනය හඳුන්වා දුන් අතර, එය සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහය ලබා ගැනිණි. එහිදී 20 වැනි සංශෝධනය ඉතා කඩිනමින් ගෙන ඒමට පොරොන්දු විය. ඉන් අනතුරුව මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීමේ සංකල්පය පෙරදැරි කොටගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහය ලබා ගැනීම සිදුකරන ලදී.

නමුත් ඒ ආණ්ඩුව එම කර්තව්‍ය ඉටු කළේ නැත. මැතිවරණ ක්‍රමය රටේ ආණ්ඩු ක්‍රමය සඳහා ඉතා වැදගත් වෙයි. විශේෂයෙන් ජනාධිපති බලතල වැඩියෙන් පවතින අවස්ථාවල වඩා යෝග්‍ය වන්නේ සමානුපාතික ඡන්ද ක්‍රමයයි. නමුත් යම් කිසි ආකාරයකට ජනාධිපතිවරයාගේ බලතල අඩුවන්නේ නම්, එහිදී අනිවාර්යයෙන් සමානුපාතික ඡන්ද ක්‍රමයෙන් වෙනත් සුවිශේෂී ඡන්ද ක්‍රමයකට යා යුතුය. එයට හේතුව සමානුපාතික ඡන්ද ක්‍රමයට අනුව බොහෝ අවස්ථාවලදී ලැබෙනුයේ ස්ථාවර ආණ්ඩු නොවීමයි. බොහෝ විට සරල බහුතරය ලබා ගත් ආණ්ඩු මේ රටේ බිහි වීම සුවිශේෂී කාරණාවකි. නමුත් ඒ ක්‍රමවේදයේ වෙනසක් 2010 සහ 2020 මැතිවරණයේදි දැක්කත් නැවත අපිට මෙවැනි සුවිශේෂ අවස්ථා උදා වෙතැයි විස්වාස කිරිමට අපහසුය. මේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව සහ සහය දුන් පිරිස් පිළිබඳව විශාල අර්බුදයක් නිර්මාණය වී තිබිණි. කෙසේ වෙතත් ව්‍යවස්ථා සංශෝධනයේ ඇති දුර්වලම සංශෝධනය 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය බව මගේ අදහසයි. මේ සංශෝධනය කළ පිරිස එම සංශෝධනය කරනු ලැබුයේ රටේ අවශ්‍යතාවට වඩා ඔවුන් තුළ තිබූ ද්වේෂයකින් සහ පෞද්ගලික කාරණා මත බව ඉතා පැහැදිලිය. එහි ඇතැම් සංශෝධනවල හොඳ ලක්ෂණ නැතුවාම නොවේ. සාමාන්‍යයෙන් දේශපාලනික තත්ත්ව යටතේ දී ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට මේ සංශෝධනය කර ඇති අතර, එය ජනතාව වෙනුවෙන් ගනු ලැබූ තීන්දුවක් නොවෙයි. මේ නිසා මේ සශෝධනය ඇතැම් තැනක අසාර්ථක සංශෝධනයන් වෙයි.

2020 මැතිවරණ ව්‍යාපාරයේ දී වත්මන් ජනාධිපතිවරයා මෙන්ම පොදු ජන එක්සත් පෙරමුණෙ පිරිස විසින් මතු කළ සුවිශේෂී කාරණාවක් වූයේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කළ යුතු බවයි. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කළ යුතු බවට ජනතාව ද එහිදී කැමැත්ත ලබා දුන් බව පෙනෙයි. ඒ අනුව මේ 20වැනි සංශෝධනය සම්බන්ධයෙන් පසුගිය දිනක කැබිනට්ටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගනු ලැබීය. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ ඇතැම් ලක්ෂණ ගත් විට ජනාධිපතිවරයාගේ ධූරකාල වසර පහක් වීම සහ දෙවතාවක් පමණක් ඡන්දයට ඉදිරිපත් වීමට හැකි වීම වැනි කාරණා සම්බන්ධයෙන් කතා කිරිමේදී, සාපේක්ෂ වශයෙන් හොඳ ලක්ෂණ ලෙස දැකිය හැකියි. විශේෂයෙන් ම දෙවතාවකට වඩා ජනාධිපතිවරයෙක් පත්වීම සුබදායි වන්නක් නොවේ. ජනාධිපතිවරයා වෙනස් වන විට ආණ්ඩු ක්‍රමය ද යම් තරමකට වෙනස් වෙයි. ඉතිහාසයේ අපි එවැනි අත්දැකිම් විඳ තිබේ. ඒ නිසා දෙවතාවකට සීමා කිරීම වැදගත් යැයි මගේ විශ්වාසයයි. නමුත් ධූරකාලය වසර පහද හයද කියන කාරණාව තවදුරටත් සාකච්ඡාවට ලක්කළ යුතුයි. සමහර විට ලංකාව වැනි රටකට වසර පහක් හෝ හයක් වැදගත් කියලා විශ්වාසයක් ඇත. නමුත් තොරතුරු දැන ගැනීමේ පනත අහෝසි නොකළ යුතුයි කියන කාරණාව ඇතැමුන්ගේ මතයයි. නමුත් මේ තොරතුරු දැනගැනීමේ පනත යටතේ සෑම තොරතුරක්ම ලබාගැනීමට ඉල්ලුම් කිරීමට ජනතාව පෙලඹී ඇත. අතිශයින්ම පුද්ගලික සහ රහස්‍ය තොරතුරු ලබාදීම සදාචාර විරෝධි කාර්යයකි. එම නිසා එය කිරීම අපහසුය. ඒවා ලබා දීම එතරම් යෝග්‍ය නොවෙයි. තොරතුරු දැන ගැනීමේ පනත වැදගත් නමුත් යම්තාක් දුරට විවිධ අවස්ථා යම් ආවරණයකට යටත්ව කළ යුතුයි යන ස්ථාවරත්ව තිබිය යුතුයි.



> ජනාධිපති මුක්තිය තිබිය යුතුයි...

ඒ නිසා පවතින රජයේ ස්ථාවරත්වය අනුව මේ යෝජිත 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට තුනෙන් දෙකේ බලයක් ලබා ගැනීම අපහසු කරුණක් නොවෙයි. 20 වැනි ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතේද නිවැරදි ආකාරයට සංශෝධනයන් දෙස නොබැලුව හොත් සිවිල් ක්‍රියාකාරීන්ගේ අනවශ්‍ය පිබිදීමක් ඇතිවිය හැකියි. ඒ නිසා රටට හිතකර ව්‍යවස්ථා සංශෝධනයක් වෙතැයි අපේ විශ්වාසයයි.

එසේම මේ වන විට නව ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් ජනාධිපති නීතිඥ රොමේෂ් සිල්වාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පිහිටුවා ඇත. මෙරටට නව ව්‍යවස්ථාවක් අවශ්‍ය නම් මේ සියලු ජනතාගේ අවශ්‍යතාවන් පිළිබඳව සිතා බැලිය යුතුය. ඒ අනුව නව ව්‍යවස්ථාව එකවර පරිපූර්ණ ලෙස සකස් කළ යුතුය. ඒ පිළිබඳව සමාජ කථිකාවක් ගොඩනැගිය යුතුය. මේ සම්බන්ධයෙන් බලධාරීන් නැවත කියවා බැලිය යුතුයි. කෙසේ වෙතත් ඒ අලුත් ව්‍යවස්ථාව ගෙන එන තෙක් 19 වැනි ව්‍යවස්ථාවේ ඇති අඩුපාඩු 20 වැනි සංශෝධනය හරහා වෙනස් කිරීම සිදු කිරීම අත්‍යවශ්‍ය කරුණකි.

එසේ නොවන්නට 2/3 බලයක් ඇති වැඩි ඡන්දයෙන් පත් වූ ආණ්ඩුවෙන් 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය නිසා පත් වූ නව ජනාධිපතිවරයාට; රටට වඩා හිතකර ආකාරයට පාලනයක් ගෙන යාමට නොහැකියාවක් මතුවී තිබිණි. මේ තත්ත්වය වෙනස් කිරීම උදෙසා මේ 20 වැනි සංශෝධනය ගෙන එන ලදී. ඒ නිසා අනිවාර්යෙන්ම 19 වැනි ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුයි. විශේෂයෙන් ඇමැති මණ්ඩලය පත් කිරීමේ බලතල සම්බන්ධයෙන් අගමැතිවරයාගේ උපදෙස් විමසිය යුතු නැති අතර; අවශ්‍ය අවස්ථාවලදී පමණක් අදහස් විමසීම සම්බන්ධයෙන් සිදු කර ඇති සංශෝධනයේ සඳහන් කරුණු පිළිබඳව සාකච්ජා කිරීමේදි 1978

> ව්‍යවස්ථා සංශෝධනයේ ඇති දුර්වලම සංශෝධනය 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයයි...

> දෙවතාවකට වඩා ජනාධිපතිවරයෙක් පත්වීම සුබදායි නොවේ...

ව්‍යවස්ථාවේ අඩංගු කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුයි. ඒ අනුව සලකා බැලීමේදි රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ යහපාලන රජය යටතේ ඇති කළ සංශෝධන අනුව ජනාධිපතිවරයාගේ වැඩි බලතල ප්‍රමාණයක් පාර්ලිමේන්තුවට පවරා ගැනීම සිදුවිය. 19 වැනි සංශෝධනය ඉදිරිපත් කළ අවස්ථාවේ ඇතැම් කොටස් ජනමත විචාරණයකින් තොරව වෙනස් කළ නොහැකි කරුණු පමණක් වෙනස් නොවිණි. රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ බටහිර ගැති පිරිසට එකතුවී කළ සංශෝධනයේදී ඒ පිරිසට ඔවුන් අපේක්ෂා කළ දේ සිදු කිරීමට නොහැකි විය. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව අනුව ඇතැම් ජනාධිපති බලතල කප්පාදු කිරීමේ අවකාශය නොලැබුණි. එම බලතල ඉවත් කිරීමට නම් ජනමත විමසුමකට යායුතු ව ඇති නිසා ජනාධිපතිවරයාගේ බලතල කප්පාදුවට මේ රටේ ජනතා ප්‍රසාදය හිමි නොවන බව දන්නා නිසා එසේ කිරිමට නොපෙලඹුණි. මේ 19 වැනි ව්‍යවස්ථා විකෘති ව්‍යවස්ථාවක් බවට පත්වීම එයින් සිදුවිය.

ජනාධිපතිවරයා නිකම්ම නිකන් ජනාධිපතිවරයෙක් බවට පත්කොට සමස්ත බලය පාර්ලිමේන්තුවට කේන්ද්‍රකර ගැනීමේ උපක්‍රමය ඉටු කරගැනීමට ඔවුන්ට නොහැකි විය. ජනාධිපතිවරයාට සේනාධිනායකයන් පත් කිරීමේ බලතල තිබුණද ජනාධිපතිවරයා අබිබවමින් එවකට අගමැතිවරයා ඇතුළු පිරිස ඒ සියලු බලතල අතට ගෙන කටයුතු කරන ආකාරය අපි දුටුවෙමු. ඒනිසා විකෘති ව්‍යස්තාවක් බවට 19 ව්‍යවස්ථාව පත් විය. ඒ අනුව 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයක අවශ්‍යතාව මතු වන්නේ ජනාධිපතිවරයාට එතුමාගේ බලතල නැවත ලබා දීමටයි. 1978 ජනරජ ව්‍යවස්ථාවෙන් අනතුරුව රටට අවශ්‍ය වන පූර්ණ ව්‍යවස්ථාවක් සැකසිය යුතුයි. ඒ අනුව තව දුරටත් ව්‍යවස්ථා සංශෝධන නොව නව ව්‍යවස්ථාවක් ලෙස ජනතාවගේ පරමාධිපත්‍යයට ගැළපෙන ආකාරයට පාර්ලිමේන්තුවේ 2/3 සහ ජනතාවගේ ජනමත විචාරණයේ සැකසෙන ව්‍යවස්ථාවක් අවශ්‍යතාවය පැන නැඟී ඇති බව අපි කවුරුත් දන්නා කරුණකි. පසුගිය සංශෝධනයන් අනුව අගමැතිවරයා විසින් පාර්ලිමේන්තු සංයුතිය තුළ නිසියාකාරව කටයුතු නොකරන තාක්කල් ජනාධිපතිවරයාට තනි මතයෙන් රට පාලනය කිරිමට බලතල නැත. එසේ නැවත ජනාධිපතිවරයාගේ බලතල ලබා දුන් පසුව ජනාධිපතිවරයා එතැනදී ඒකාධිපතිවරයෙක් වනවාද නැද්ද කියන කාරණා මතු වෙයි. එයට ව්‍යවස්ථාවෙන්ම ප්‍රතිපාදන ඇත. එනම් ජනාධිපතිවරයා අනිවාර්යෙන්ම පාර්ලිමේන්තුවට වගකිව යුතුයි. ව්‍යවස්ථාවේ 42 ව්‍යවස්ථාවේ ඒ සඳහා ප්‍රතිපාදන පවතී. එහි පැහැදිලිව සඳහන් කර ඇති කරුණක් ලෙස ජනාධිපකිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු අතර එවැනි අවස්ථාවක පාර්ලිමේන්තුවට වග නොකියන්නේ නම් ඒ පුද්ගලයා පාර්ලිමේන්තුවේ නිසියාකාර ක්‍රියා නොකරන්නේ නම් ජනාධිපතිවරයාට දෝශාභියෝගයක් ගෙන එමින් ජනාධිපතිවරයා ඉවත් කිරිමට 38 වැනි ව්‍යවස්ථව අනුව පාර්ලිමේන්තුවට හැකියාව ඇත. එසේ නම් මෙය තනි මතයට ගොඩනැගි ව්‍යවස්ථාවක් නොවන අතර ඒ බලතල ඒ ආකාරයෙන්ම පවතින බව පෙනෙයි. ජනාධිපතිවරයකුට මුක්තිය තිබිය යුතුයි යන කාරණාවද මෙහිදි මතුවෙයි. එයින් අදහස් කරන්නේ ජනාධිපතිවරයෙක් අත්තනෝමතිකව වැඩ කළ යුතුයි කියන කාරණාව නොවෙයි. ජනාධිපතිවරයා අධිකරණය ඉදිරියේදි ඔහුත් සාමාන්‍ය පුද්ගලයෙක් වෙයි. රාජකාරිය මත සලකා බලා 19 වැනි ව්‍යවස්ථාවේදි ජනාධිපතිවරයාට 'මුක්තිය' ලබා දීම 19 වැනි ව්‍යවස්ථාවේ ලබාදී ඇත.

එය 20වැනි ව්‍යවස්ථාවට හඳුන්වා දිමේදි අඩුපාඩු දක්නට ලැබෙයි. ජනතාවට ජනාධිපතිවරයාගේ යම් ක්‍රියාවකදි ජනතාවට මූලික අයිතිවාසිකම් කඩ වීමේදි ශ්‍රේෂ්ඨාධිකරණයට යෑමට ඇති ඉඩකඩ සම්බන්ධයෙන් එක් අතුරු වගන්තියක් ඉවත් කිරිම නිසා ජනතාවට යම් කුකුසක් ඇතිවීමට ඉඩ ඇත. ජනතාවගේ මූලික අයිතිවාසිකමක් කඩ වීමේදි මූලික අයිතින් වෙනුවෙන් කටයුතු කිරිමට එහිදි හාධා පැමිණෙතැයි යන මතයක් ඇති වෙයි. 20 වැනි ව්‍යස්ථාවේ ඒ සම්බන්ධයෙන් යම් කිසි කොටසක් තිබුණද එය එතරම් පැහැදිලි කර ඇතිබවක් දක්නට නැත. එය වඩා පැහැදිලි කර ඇතිනම් ඉතා හොඳයි .

යම් කිසි පනතක් සම්බන්ධයෙන් සති දෙකක කාලයක් ලබා දී තියෙන අතර පුරවැසියාට අධිකරණයට යෑමට කටයුතු කිරිමට එය සතියක කාලයක් කිරිම සම්බන්ධයෙන් ගැටලු මතුවී ඇත. එය නැවත ඇති වුවහොත් වැදගත් වෙයි. ජනතාවට වඩා පාරදෘශ්‍ය භාවයකින් යුතුව එය කළ යුතුයි. එමෙන්ම ජනාධිපතිවරයාට දිව්රුම් දීම සම්බන්ධ වගන්තිය සහ විගණකාධිපති බලතල සම්බන්ධයෙන් අගමැති සහ ජනාධිපති ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් විගණනය කිරිම විගනකාධිපතිවරයාගේ යටතට පත්කිරිමෙන් වඩා පාරදෘශ්‍ය භාවයක් දක්නට ලැබෙයි. මේ ව්‍යවස්ථාවේ මුදල් කටයුතු යන බලතල සම්බන්ධයෙන් 148 වැනි වගන්තියේ පාර්ලිමේන්තුවට මුදල් කටයුතු සම්බන්ධයෙන් වගකිම සහ පාලන කටයුතු බලතල හිමිකරදී ඇත. පාර්ලිමේන්තුවට එම බලතල හිමිවී ඇති බව ඒ අනුව පෙනෙයි. විගනකාධිපතිවරයාගේ බලතල ඉවත් කිරීම සම්බන්ධයෙන් ජනතාවගේ කුකුසක්ද ඇතිවී ඇත. එය කමිටු අවස්ථාවේදි ඉවත් කර නැවත විගනකාධිපතිවරයාට එම බලතල හිමිවෙතැයි අපි සිතමු. ද්විත්ව පුරවැසි භාවය සම්බන්ධයෙන් අපි කතා කළ යුතුයි? ඇයි මේ වැනි දෙයක් අපේ රටට අවශ්‍ය වන්නේ ද? එසේම ද්විත්ව පුරවැසි භාවය හිමි අයට ජනාධිපතිවරණය දක්වා යන්නට බලතල ලැබෙනවාද කියන කාරණාව සම්බන්ධව අපි සාකච්ජා කළ යුතුයි. එවැනි ද්විත්ව පුරවැසිභාවය හිමි අයකුට ප්‍රශ්න සහගත තත්ත්වයක් ඇති වූ විට ශ්‍රී ලංකා ජනරජය යටතේ එයට පෙනී සිටීමේදී සීමා ඇති ද ඒවාට බාධා ඇති ද කියන කාරණාව සම්බන්ධයෙන් කතිකාවක් ඇතිවිය යුතුයි.

ජනතා ප්‍රසාදය හිමි ශක්තිමත් ජනාධිපතිවරයෙක්ට වැඩ කිරීමට ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන තිබිය යුතුය. ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව එකම දේශපාලනික මතවාද මත පිහිටා පත් වූ රජයන් යටතේ ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ සහය අනිවාර්යෙන් හිමි වෙයි. මේ රට ගොඩනගන්නට අසීමිත ජනවරමක් යටතේ පත්කළ ආණ්ඩුව ඉදිරියට යෑමට නම් අත්තනෝමතිකව වෙනස් කරන ලද 19 වැනි ව්‍යවස්ථාව සංශෝධන කළයුතු සේම දීර්ඝකාලක් පුරා රටේ අවශ්‍යතාව බවට පත්වී තිබූ නව ව්‍යවස්ථාවක් ඇති කිරිමෙන් මෙරටට යහපත් හෙටක් උදා කර ගත හැකි බවට කිසිදු සැකයක් නැත.



“19 න් රටට කිසිම වැඩක් වුණේ නැහැ”

● අධිකරණ අමාත්‍ය, ජනාධිපති නීතිඥ අලි සබ්රි

ජනපති මාස 10 ක් තිස්සේ ප්‍රජාතන්ත්‍රවාදීව රට පාලනය කරනවා

19 ගෙනාපු අය විතරයි ඒක ආරක්ෂා කරන්න හදන්නේ

රට ඉදිරියට ගෙනයන්න 20 නැතුව බැහැ

ආර්ථිකය ශක්තිමත් කිරීම තමයි රටේ දියුණුවීමට එකම විසඳුම

අර්ජුන් මහේන්ද්‍රන් නැති නිසා මහ බැංකු නඩුව අවුල් වෙලා

● භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්

▶ දේශපාලන පක්ෂ, විපක්ෂය මෙන් ම බහුජන සංවිධාන රැසක්ම විසිවෙනි සංශෝධනය එපා කියනවා. ඇයි ඒ?

විපක්ෂය කියන්නේ හැමදේටම විරුද්ධ වන කණ්ඩායමක්. ඒ නිසා ඔවුන් සුපුරුදු පරිදි විස්ස ගෙන එනවාට විරුද්ධයි.

ඔවුන්ගේ දේශපාලන අධිකාරිය පෙන්වීමේ උත්සාහයක් හැටියටත් ඔවුන් මෙයට විරුද්ධව සිටින බව අපට පැහැදිලිව පෙනී යනවා.

19 ය ගෙන ආවේ අපි නොවෙයි නේ. 19 ය ගෙන ආවේ ඔවුන්මයි. මේ නිසාත් එය ආරක්ෂා කරන්නට ඔවුන් කටයුතු කරනවා. මෙය පුදුම විය යුතු කරුණක් නොවෙයි.

▶ ඔබ නියෝජනය කරන ආණ්ඩුවේ ඇතැම් පිරිස් එදා 19 යට මනාප වුණා. මොකද ඒ ගැන කියන්නේ?

මේ පිළිබඳව විශේෂයෙන් කියන්න දෙයක් නැහැ.

මේක ගෙනාපු අයවත් දන්නේ නැහැ මෙහි මොනවාද තියෙන්නේ කියලා. ඒක තමයි ඇත්ත තත්ත්වය. මේක ගෙන එන්නට කටයුතු කරපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇමැතිවරුන් පමණක් නොවෙයි. එවකට ජනාධිපතිව සිටි මෛත්‍රීපාල සිරිසේන මහතා පවා ප්‍රකාශ කර තිබුණා 19 ය නරකයි උචිත නැහැ කියලා. මේ නිසා වෙන මොන කතාද කියලා ජනතාවට මේ මගින් ම වැටහෙනවා ඇති.

බොහෝ දෙනා මේ සම්බන්ධව දැන් කියන්නේ රියදුරන් දෙදෙනකු එකට වාහනය පදවනවා කියායි. දහනවය ගෙන එන්න ගොඩක් මහන්සි වූ සුමන්තිරන් මහත්මයා ප්‍රකාශ කරනවා දහනවය තාවකාලිකයි මෙය දීර්ඝ කාලීනව උචිත නැතැයි කියලා. මේ ප්‍රකාශවලින් තේරෙනවා 19 වැනි සංශෝධන මොනතරම් අවුලක් ද කියන එක.

▶ ඉකුත් මහ මැතිවරණයේදී ඔබලා පැහැදිලිවම ප්‍රකාශ කරා 19 වැනි ව්‍යවස්ථාව අහෝසි කරනවා කියන කාරණය ඇයි ඒ?

පැහැදිලිවම එම මැතිවරණයේදී අපගේ ප්‍රධානතම කරුණක් වශයෙන් අපි ජනතාවට අවධාරණය කළා මේ සංශෝධනය සිදු කළ යුතු බව. ජනතාවගෙන් ඒ සඳහා අපි තුනෙන් දෙකක බලයක් ඉල්ලා සිටියා. 19 ඉවත් කරන්නම් අපිට පාර්ලිමේන්තුව තුළ ඒ බලය අවශ්‍යයි. ජනතාව පැහැදිලිවම එය තේරුම් ගත් බව මැතිවරණ ප්‍රතිඵලයකින් පැහැදිලියි. ජනතාව අපිට තුනෙන් දෙකක බලයක් ලබාදී තිබෙනවා. මේ ප්‍රතිඵලය සහ අපගේ මූලිකවම බලාපොරොත්තුවූ කරුණක් අද අපිට ඉෂ්ඨ කරගන්න පුළුවන් වෙලා තිබෙනවා.

19 වැනි ව්‍යවස්ථා සංශෝධනය තුළ රටට අත්වූ ඉරණම මේ රටේ ජනතාව පැහැදිලිව දැක්කා. ඔවුන් ඒ තුළ තිබූ ගැටලු නිසාම ජනතාවට නොයෙක් කරදර, පීඩාවන්ට මුහුණ දෙන්නට සිදු වුණා.

රටේ පාර්ශ්වයන් දෙකක් රට පාලනය කරන ආකාරයක් තමයි මෙහිදී සිදු වුණේ. ආයතන පද්ධති කඩා වැටෙමින් නොයෙක් නොයෙක් අවුල් සහගත තත්ත්වයන් ඇති වුණේ මෙන්න මේ ප්‍රධාන කාරණාව නිසයි.

▶ මේ ආණ්ඩුවට 19 යෙන් ඉදිරියට යන්න බැරිද? 20 අවශ්‍යමද?

ඇත්තටම බෑ. 20 අවශ්‍යමයි. මෙහි ඇති ගැටලු කිහිපයක් මට පෙන්වා දෙන්න පුළුවන්. උදාහරණයක් ලෙස ජනාධිපතිවරයාට කිසිදු අමාත්‍යාංශයක් දැරීමට නොහැකි බව එක් තැනක සඳහන් වෙනවා. නමුත් තව තැනකදී කියවෙනවා ජනාධිපතිවරයා සතුව ආරක්ෂාව තිබිය යුතුයි කියලා.

▶ 20 වැනි සංශෝධනය මගින් ශක්තිමත් බල සම්පන්න විධායක ජනාධිපතිවරයෙක් බිහිවන බවත් පාර්ලිමේන්තුව නමට පමණක් බව සමහර දේශපාලන පක්ෂවල මතය බවට පත් වෙලා තිබෙනවා.මේ පිළිබඳව ඔබගේ අදහස?

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට පත්වෙලා දැන් මාස දහයකට වැඩියි. ඔහු ඉතා ප්‍රජාතන්ත්‍රවාදීව මෙරට පාලනය කරනවා. සියලු ක්‍රියාමාර්ග ව්‍යවස්ථානුකූලව ප්‍රජාතන්ත්‍රවාදීව තමයි සිදු කළේ. ජනතාව පිළිබඳව රට පිළිබඳව තීන්දු තීරණ ගැනීමේදී ප්‍රායෝගික විය යුතුයි. පොත පතට සීමාවෙලා එහෙම තීරණ ගන්න බැහැ. මේ රටේ ගැටලු විසඳා ගනිමින් මේ රට සංවර්ධනය කරා ගෙන යමින් යහපත් රටක් බවට පත් කිරීමට ජනාධිපතිවරයා ප්‍රමුඛ මේ රජයට හැකියාව තිබෙනවා. මේ කාරණා නිසා අද ජනතාව අපිට තුනෙන් දෙකක බලය ලබා දී තිබෙනවා. ඔවුන් අප පිළිබඳව තබා ඇති විශ්වාසය අප රැක ගනිමින් ජනතා හිතැති නායකයන් වශයෙන් ක්‍රියා කිරීමට අප සියලු දෙනා බැඳී සිටිනවා.

▶ 19 ඉවත් කිරීම සම්බන්ධව ජනතාව දැනුම්වත් කරන්නේ කෙසේද?

19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කිරීමත් තමයි අපි ප්‍රථමයෙන් සිදු කරන්නේ. ඒ මගින් මුලින් ම සිදු වෙන්නේ 19 ඉවත් වීම්ට පෙර තිබූ තත්ත්වයට යන එකයි. අපි 18 ට ගියත් එයින් ප්‍රායෝගිකව සිදු කළ නොහැකි ගැටලු කිහිපයක්ම තිබෙනවා. අපි එය වෙනස් කරනවා මිසක් 19 යෙන් ගෙන ආපු වැඩි ප්‍රමාණයක් ඉවත් කිරීමට මෙහිදී කටයුතු කරනවා.

▶ ජනමාධ්‍ය මගින් පැවසෙනවා ආණ්ඩුව තුළ සිටින පිරිසක්ම මේ සඳහා සහයෝගය ලබා නොදෙන බවත් පාර්ලිමේන්තුවේදී තුනෙන් දෙකක බලය පෙන්වීමට නොහැකි බවත් මෙය සත්‍යයක්ද?

ඇත්තටම මට ඒ සම්බන්ධව තොරතුරක් නැහැ. නමුත් රජයට සම්බන්ධ සියලු දෙනා මේ සඳහා එක්ව සිටින බව පැහැදිලියි. ජනාධිපතිතුමන්, අගමැතිතුමන් මේ පිළිබඳව දැඩි විශ්වාසයකින් යුතුව සිටිනවා. ඒ අවශ්‍ය තුනෙන් දෙකක බලය පෙන්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනවා.

▶ යහපාලන රජය ගෙන ආ 19 වැනි සංශෝධනයෙන් රටට කිසිම සේවාවක් වුණේ නැහැ කියලද ඔබ කියන්නේ?

ඔව්. කිසිදු සේවයක් වුණේ නැහැ. රටේ ආරක්ෂාවට මොකද වුණේ. රටේ සංවර්ධනයට කිසිම දෙයක් සිදු වුණේ නැහැ. රටේ ආර්ථිකය එන්න එන්නම කඩා වැටුණා. වසර පහකට ආසන්න කාලයක් මේ රටට කිසිදු වැදගත් දෙයක් සිදු කරන්නට යහපාලන රජයට නොහැකි වුණා. මේ වගේ කරුණු රාශියක් පෙන්වා දිය හැකියි. අන්න ඒ නිසා අපි පැහැදිලිවම 19 ය ඉවත් කළ යුතුයි.

▶ මේ වනවිට 20 වැනි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරමින් පෙත්සම් 39 ක් ගොනු කර තිබෙනවා. වැඩි ප්‍රමාණයක් විපක්ෂය නියෝජනය කරන දේශපාලන පක්ෂ සහ පුද්ගලයන්. මේ පිළිබඳව ඔබගේ අදහස?

විපක්ෂය නියෝජනය කරන අයගේ දේශපාලන මතවාද එළියට දාන්න තමයි අධිකරණයට ගොස් තිබෙන්නේ. රජයට විරුද්ධ වීම සඳහා යම් පසුබිමක් සකස් කරවා ගැනීමට තමයි ඔවුන් මේ මගින් උත්සාහ කරන්නේ. 19 ගෙනාවේ ඒ අය නිසා ඔවුන් එය ආරක්ෂා කරන්න කටයුතු කරනවා.

▶ 20 වැනි සංශෝධනයේ වෙනස්කම් කිහිපයක්ම සිදු කිරීමට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා කමිටුවක් පත් කර තිබෙනවා. මේ මගින් වෙනසක් සිදු වෙනවාද?

මේ පිළිබඳව සාකච්ඡා කළ අවස්ථා ගණනාවකින් පසුව මෙහි යම් යම් වෙනස්කම් කිරීමට අප තීරණය කර තිබෙනවා. ඒ සම්බන්ධව අපි අධිකරණයට කරුණු ඉදිරිපත් කරනවා. නීතිපතිවරයා මාර්ගයෙන්.

▶ පාස්කු ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයන් තවමත් නිදැල්ලේ සිටින බවට ජනතාව අතරින් කියවෙනවා. අධිකරණ ඇමැතිවරයා හැටියට ඔබ මේ සඳහා ලබාදෙන පිළිතුර?

ඇත්තටම අධිකරණ ඇමැතිවරයා හැටියට පාස්කු ප්‍රහාරය සම්බන්ධව ක්‍රියාත්මක වන පරීක්ෂණ වලට මම සම්බන්ධ නැහැ. මෙහි විමර්ශන සියල්ල සිදු වන්නේ ආරක්ෂක අමාත්‍යාංශය සහ පොලිස් දෙපාර්තමේන්තු මගින් මේ පරීක්ෂණ ඉතා කාර්යක්ෂම සහ විනිවිද භාවයකින් කෙරීගෙන යනවා.

මීට අමතරව මේ ගැන සොයා බැලීම සඳහා ජනාධිපති විමර්ශන කොමිසම ක්‍රියාත්මකයි. එම කොමිසමේ කටයුතු ඉතා හොඳ මට්ටමින් සිදු කරගෙන යනවා. මේ දෙකෙන් ම කරුණු හෙළි කර ගත යුතුයි. පොදුවේ ගතහොත් මේ වනවිට හුගක් වැදගත් දේවල් හෙළිවෙමින් පවතිනවා. අපි බලාගෙන ඉන්නවා මේ විමර්ශන වලට මොකද වෙන්නේ කියලා. මේ තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශයෙන් මෙන් ම ජනාධිපති කොමිසමෙන් රජයට ලබාදීමෙන් පසු අපි නීතිමය පියවර ගැනීමට කටයුතු කරනවා.

▶ වර්තමාන රජය මහ බැංකු කොල්ලයට අදාළව සැකකරුවන්ට දඬුවම් කරන්නේ නැති බවට සමාජ මාධ්‍ය තුළ නොයෙක් ප්‍රචාරයන් සිදු කෙරෙනවා. ඇත්තට මෙම මූල්‍ය වංචාවේ සැකකරුවන්ට දඬුවම් දෙන්නේ නැද්ද?

මෙය අසත්‍ය ප්‍රචාරයක්. අදාළ පුද්ගලයන් පොලිසිය විසින් අත්අඩංගුවට අරන් අධිකරණයට ඉදිරිපත් කර තිබෙනවා. නඩු පනවා තිබෙනවා. මේ සම්බන්ධව විශේෂ මහ අධිකරණයේ නඩු දාලා තිබෙනවා. එම නඩුව කරගෙන යන්න බැරි වෙලා තිබෙන්නේ මෙහි එක් වූදිතයෙකු වන අර්ජුන් මහේන්ද්‍රන් මහතා ලංකාවේ නොමැති වීමයි. අපි ඒ සම්බන්ධව නිසි ක්‍රමවේදයකින් ක්‍රියාත්මක වෙනවා. මොකද අපිට ඒ රටට ගිහිල්ලා ඔහුව බලහත්කාරයෙන් ගෙන එන්න බැහැ.

අපි අදාළ නීතිමය කටයුතු සිදුකරලා සිංගප්පූරු රජයට දන්වලා තිබෙනවා මෙම සැකකරු මෙරටට ලබාදෙන්න කියලා. මේ කාරණය නිසා මෙහි ප්‍රමාදයක් තිබෙනවා.

▶ වර්තමාන රජයට සහ ජනාධිපතිවරයාට ජනතාව අතර ප්‍රසාදයකට ලක්වීමට හැකි වී තිබෙනවා පාතාල ක්‍රියාකාරකම් නතර කිරීම සහ මත්ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධව ඉදිරියේදී මේ සම්බන්ධව නව නීති ගෙන එනවාද?

පොදුවේ ගත් කළ මේ ක්‍රියාදාමය සම්බන්ධව අපි සාකච්ඡා කරමින් සිටිනවා. ඉදිරියේදී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඒ වගේම විවිධ පැතිවලදී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. ආරක්ෂක අමාත්‍යාංශයෙන් බොහෝ දේවල් ක්‍රියාත්මක කරනවා. ඉතාම සැලසුම් සහගතව මෙය ක්‍රියාත්මක වන්නේ. අපේ පැත්තෙන් නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධව අපි සොයා බලමින් අදාළ නීති සම්පාදනය පිළිබඳව සාකච්ඡා පවත්වමින් සිටින්නේ.

බන්ධනාගාරවල රැඳවියන් සම්බන්ධව නොයෙක් නොයෙක් ගැටලු ඇති වෙලා තිබෙනවා. අපි මේ සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව තීන්දු තීරණ ගනිමින් සිටිනවා.

▶ ඔබලා කුමන පරිශ්‍රමයක් දැරුවත් දිනපතාම බන්ධනාගාරවල ජංගම දුරකතන, හෙරොයින් ඇතුළු මත්ද්‍රව්‍ය සොයා ගනු ලබනවා. ඇයි මේවා බන්ධනාගාර ඇතුළතට යාම වළක්වාලන්නට බැරි?

ඇත්තටම අපි අපට පුළුවන් උපරිම විදියට ක්‍රියාත්මක වෙනවා. මේ සඳහා ආරක්ෂක අමාත්‍යාංශය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව මෙන්ම අධිකරණ අමාත්‍යාංශය එක්ව තමයි මේ කටයුතු සිදු කරන්නේ. විවිධ වූ ක්‍රියාපාටීන් මේ වෙනුවෙන් ක්‍රියාත්මකයි. බන්ධනාගාර ඇතුළත මාෆියාවක් ක්‍රියාත්මක නිසා මෙම වැරදි ක්‍රියා දවසකින් දෙකකින් ඉවර කරන්න බැහැ. මේ සඳහා ටික කාලයක් යාවි. නමුත් අපි අපට පුළුවන් උපරිම ලෙස කටයුතු කරමින් මෙම නීති විරෝධී ක්‍රියා මාර්ග සම්පූර්ණයෙන් භාර කිරීමට පියවර ගන්නවා.

ආරක්ෂක අමාත්‍යාංශය ක්‍රියාත්මක වීම නිසා මෙම සැකකරුවන් ගේ මත්ද්‍රව්‍ය, අවි ආයුධ ජාලය දැන් කඩා බිඳ දමා තිබෙනවා. සියයට අසූවකින් අසූ පහකින් විතර දැන් අවසන් වෙලා තිබෙනවා.

මෙය සම්පූර්ණයෙන් නතර කිරීම සඳහා අපට අවශ්‍යතාව තිබෙනවා. ඒ සඳහා උනන්දුව තිබෙනවා. දේශපාලන නායකත්වය ලබා දීලා තිබෙනවා.

ජනාධිපතිතුමන් අගමැතිතුමන්, ආරක්ෂක ලේකම්තුමන් මෙන් ම ත්‍රිවිධ හමුදාව පොලිසිය මේ සඳහා එක්ව කටයුතු කරනවා. අදාළ අමාත්‍යාංශ මෙන් ම බන්ධනාගාර දෙපාර්තමේන්තුව මෙන් ම අපගේ අමාත්‍යාංශයත් මේ වෙනුවෙන් කළ හැකි උපරිම දේ සිදු කරනවා.

▶ ජනාධිපතිවරණයට, මහ මැතිවරණයට ඉදිරිපත් වූ අවස්ථාවේ ඔබගේ කඳවුර දිගින් දිගටම ප්‍රකාශ කළා. බඩු මිල අඩු කරලා ජනතාවට සහන සලස්වන බව. එහෙත් අද බඩු මිල සම්බන්ධව ජනතාව රජයට චෝදනා කරනවා නේද?

රජයක් වශයෙන් අපි කළ හැකි සියල්ල සිදු කරනවා. රජය අපි භාර ගන්න කොට මේ රට ආපස්සට ගියපු රටක්. ආර්ථික, සමාජීය, සංස්කෘතික මේ සෑම අංශයක් ම ඉකුත් කාලයේදී කඩා වැටිලා තමයි තිබුණේ. නමුත් අපි බලයට පත්වූ විගස මේ තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා හැකි සෑම ක්‍රියාදාමයක් සිදු කරනවා.

ජනතාවට ඉදිරි කාලයේදී එහි ප්‍රතිඵල දැකගත හැකියි.

අපි බලයට පැමිණෙන විට මේ රට කොවිඩ් 19 වසංගතයට මුහුණ දී තිබුණේ. අපි එයට සාර්ථකව මුහුණදීලා මේ රට ඉන් ගොඩ ගැනීමට කටයුතු කළා.

අද මුළු ලෝකයම ආර්ථික වශයෙන් කඩා වැටිලා සමාජීය වශයෙන් කඩා වැටිලා. රටක් හැටියට අපි අද ලෝකයේ ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ශ්‍රී ලාංකිකයන් හැටියට අපට මේ සඳහා සතුටු විය හැකියි. මුළු ලෝකයේම සංචාරක ව්‍යාපාරය කඩා වැටිලා. ශ්‍රී ලංකාවෙත් සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන් ම කඩා වැටිලා. මේ සියල්ලත් එක්ක අභියෝගාත්මක කාලයක් තමයි අපි ගත කරන්නේ.

මේ සියල්ල මැද කොවිඩ් අවධානමත් තිබුණා. රට ඉන් මුදාගන්න අද බොහෝ ව්‍යාපාරික ක්‍රියාදාමයන් බිඳ වැටිලා මෙන්න මේ වගේ කාලයක තමයි අප ජීවත් වෙන්නේ.

කොවිඩ් අවදානමක් නැතිව ජීවත්වීමට හැකිවීම අපි සියලු දෙනා ලබාගත් ජයග්‍රහණයක් හැටියට තමයි මා දකින්නේ. මේ නිසා මා හිතනවා රජය මේ වනවිට දැඩි කැපවීමකින් සහ ජනතා හිතවාදීව ක්‍රියා කර තිබෙනවා කියලා.

▶ රටක් වශයෙන් දැඩි ණය අර්බුදයක සිටින රටක්. කොහොමද ඉන් මිදෙන්නේ?

අපි දේශීය ආර්ථිකය ගොඩගැනිය යුතුයි. ඒ මත පදනම් විය යුතුයි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් මේ වන විට ඒ වෙනුවෙන් ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නංවා තිබෙනවා. අපි අපනයනය වැඩි කළ යුතුයි. නාස්තිය කළමනාකරණය කළ යුතුයි. විවිධ අංශවල ආර්ථික පුනර්ජනනයක් සිදුකළ යුතුයි. අපි රජයක් හැටියට ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි මේවා ක්‍රියාත්මක කරමින් සිටිනවා.

මෙවැනි ක්‍රියාදාමයන් මගින් ආර්ථිකය ශක්තිමත් කිරීම තමයි මේ සඳහා තිබෙන එකම විසඳුම.

▶ මෙවර පත් කළ කැබිනට් අමාත්‍යධුර සහ ඔවුන්ගේ විෂයන් පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?

මෑත ඉතිහාසය තුළ කැබිනට් මණ්ඩලයක් ඉතා හොඳ මට්ටමින් පත් කළ අවස්ථාවක් හැටියට පෙන්වා දිය හැකියි. ඉතාම හොඳ සංයුතියක් මෙන් ම විෂයයන් බෙදීම ඉතා හොඳින් සිදුකර තිබෙනවා.

කැබිනට් ඇමැතිවරු යටතේ රාජ්‍ය ඇමැතිවරු පත් කිරීමේදී වෙනම ක්‍රියාදාමයක් හැටියට සිදුකර තිබෙනවා.

විශේෂයෙන් ම වෙනදා මෙන් නොවෙයි රාජ්‍ය ඇමැතිවරුන්ට බලතල පවරා තිබෙනවා. ඔවුන් නාමිකව පත් කිරීමක් තමයි මින් පෙර සිදු වුණේ.

“පාස්කු ප්‍රහාරය ගැන තොරතුරු ජනාධිපති කොමිසමෙන් රජයට ලබාදුන් පසු නීතිමය පියවර ගන්නවා”

“නීති විරෝධී ක්‍රියා නවත්වන්න හැකි සියලු දේ අප අමාත්‍යාංශයෙන් කරනවා”

පවුල් ලක්ෂ 24ක මල්ල කරේ

ජාතික ගෙවතු වගා වැඩසටහන ඔක්තෝබර් 17 දින ඇරැඹේ

● **නිහාල් පී. අබේසිංහ**

මගේ සිත 2011 වසර දක්වා දිව යයි. 2011 වසරේ අපේ ආහාර නිෂ්පාදන ක්ෂේත්‍රයේ පෙරළියක් ඇති විය. මෙරට මුඩුබිම්, වැලිබිම්, මඩබිම් සියල්ල මහ ගොවි බිම්වලට පත්විය. කොළඹ නගරයේ වටරවුම්වලද එළවළු වගා පුරවා තිබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2011 මාස 5 - 6 කදී මෙරට එළවළු මිල සියයට 60 - 80 දක්වා අඩු විය. 2011 පෙබරවාර මාසයේ රුපියල් 320 - 350 වූ අමුමිරිස් කිලෝව 2011 අගෝස්තු මාසය වන විට රුපියල් 85 - 90 දක්වා පහළ වැටිණි. 2011 පෙබරවාරිවල රුපියල් 120 - 130 ක් වූ කරවිල කිලෝව 2011 අගෝස්තු සැප්තැම්බර් වන විට රුපියල් 45 - 60 දක්වා අඩු විය. මේ අනුව මාස 6ක් ඇතුළත 2011 දී මෙසේ එළවළු මිල සියයට 60 - 75කින් පමණ අඩු විය.

2011දී මේ සියලු දේවල් සිදුවූයේ අන් කිසිවක් නිසා නොව එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වූ බැසිල් රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් මෙහෙයවනු ලැබූ 'දිවිනැඟුම' ජාතික ව්‍යාපාරය නිසාය.

2011 මාර්තු 12 වැනිදා රට පුරා ආරම්භ කළ ඒ ජාතික ව්‍යාපාරය මඟින් 'ඉසුරුමත් නිවහනක් - අසිරිමත් මවුබිමක්' යන තේමාව මුල් කරගෙන රටපුරා පුද්ගලයන් කෝටියක පමණ ගෘහ ආර්ථිකය ඉහළ නැංවීමට කටයුතු කළේය. පවුල් ලක්ෂ 21කට බීජ ඇට පැළ පොහොර කුකුළු පැටවුන් ආදිය නොමිලේ ලබාදෙනු ලැබීය. එය මෙරට ක්‍රියාත්මක ඓතිහාසික ගෘහ ආර්ථික සංවර්ධන වැඩසටහනක් විය.

2011දී මෙරට කෘෂි ක්ෂේත්‍රයේ ගෘහ ආර්ථිකයේ මහා පෙරළියක් ඇති කළ ඒ දිවි නැඟුමට වඩා රටේ ආර්ථික ප්‍රවර්ධනයට රජය තවත් සුවිශේෂ යමක් කිරීමේ අරමුණින් එදා 'දිවි නැඟුම' ඉදිරියට ගෙන ආ, අද ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වූ ජනාධිපතිකාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා දැන් මෙරට පවුල් ලක්ෂ 24ක ගෙවතු ලක්ෂ 24ක් තිරසර ලෙස අස්වැද්දීමට කටයුතු යොදා ඇත.

සෑම ගමකම පවුල් 210කට පැළ බීජ පොහොර කෘෂි උපදෙස් නොමිලේ

බැසිල් රාජපක්ෂ මහතා පවසන්නේ "ඵලදායි පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්" යන සංකල්පය යථාර්ථයක් කර ගැනීමයි මේ දීපව්‍යාප්ත වැඩපිළිවෙළක් රටපුරා ක්‍රියාත්මක වන බවයි.

"මේ වැඩපිළිවෙළින් ආර්ථිකය සවිමත් කිරීම සඳහා ගෘහ ආර්ථිකයට ප්‍රමුඛතාව දෙමින් කටයුතු කරනවා. ඒ අනුව දේශීය කෘෂි හා පශු සම්පත් නිෂ්පාදන මට්ටම් දියුණු කර දිරිමත් කිරීමේ ජාතික ගෙවතු වගා වැඩසටහන මෙවර මහ කන්නය ආරම්භයත් සමඟ ඔක්තෝබර් මස මැද පමණ ආරම්භ කිරීමට කටයුතු යොදනවා." බැසිල් රාජපක්ෂ මහතා පවසයි.

ගෘහ ආර්ථිකය හා පෝෂණය වැඩි දියුණු කර පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික ගෙවතු වගා වැඩසටහන 2020 - 21 ලෙස නම් කර ඇති මේ වැඩසටහන රටපුරාම මෙවර මහ කන්නය ආරම්භ කිරීමත් සමඟ ඇරැඹීමට කටයුතු යොදා ඇත.

මෙහි සියලු කටයුතු ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකායේ මෙහෙයවීමෙන් සිදුවේ. එහි සභාපති බැසිල් රාජපක්ෂ සියලු වැඩකටයුතු අධීක්ෂණය කරනු ලැබේ.

මේ යටතේ එක ගමකින් අඩු ආදායම් ලාභී පවුල් 210ක් තෝරාගෙන ඒ අයට එළවළු පැළ, පලතුරු පැළ, කැඳ වර්ග සකසන බෝග, ඔසු පැළ, දැවමය ශාක හා කුළුබඩු ශාක පැළද පලා වර්ගද ලබාදීම සිදුකෙරේ. ඊට අමතරව එම පවුල් සඳහා අවශ්‍යතාව පරිදි තවත් පැළ හා බීජ වර්ග හා කෘෂි උපදෙස් ලබාදෙයි. ඊට අමතරව අක්කර 1/4, 1 1/2 අතර බිම් ඇති අයට විශේෂ පහසුකම් යටතේ පැළ බීජ පොහොර හා කෘෂි උපදෙස් ලබාදීමට ද පියවර ගෙන ඇත.

කෙසේ වුවත් මෙහිදී ඒ ඒ ප්‍රදේශවලට ඉතා උචිත වැඩි ඵලදායක සහිත ශාක වර්ගවලට ප්‍රමුඛතාව ලබාදෙයි. ඊට අමතරව පශු සම්පත් පාලනයට මේ පවුල් යොමු කරන බවත් ඒ අනුව කුකුළු පාලනය, ගව පාලනය, එළවළු වගාව, මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සඳහා ද මෙම පවුල් යොමු කරන බවත් බැසිල් රෝහණ රාජපක්ෂයන් පවසයි.

මෙම වැඩපිළිවෙළ යටතේ සෑම අවස්ථාවකදීම පරිසරය රැක ගැනීමට ප්‍රමුඛතාව දිය යුතු බවද රජය අවධාරණය කරයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ හා අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් හා මෙහෙයවීම මත ක්‍රියාත්මක මේ වැඩපිළිවෙළ යටතේ ගෙවතු ලක්ෂ 24ක් අස්වද්දන අතරම ඒ අනුව ගෙවත්තෙන්ම පරිසරය සුරැකීම ද අරඹනු ලැබේ.

මෙම සෑම අවස්ථාවකදීම පරිසරයට හිතකර ලෙස පස් සංරක්ෂණය කරන ශාක වර්ගවලට ප්‍රමුඛතාව ලබාදෙනු ලැබේ. ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීමට ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට ඩෙංගුවලින් වැළකී සිටීමට පරිසරයේ පිරිසුදුකම් පිළිබඳවත් මෙහිදී අවධානය යොමු කෙරේ. මේ සඳහා පරිසරය පිළිබඳව කටයුතු කරන මධ්‍යම පරිසර අධිකාරිය, පරිසර අමාත්‍යාංශය ආදියෙන්ද උදවු අවශ්‍ය කෙරේ.

ඒ සමඟම මේ සමස්ත වැඩසටහන ඉදිරියට ගෙන යාම සඳහා කෘෂිකර්ම, පළාත් පාලන වාරිමාර්ග, ඉඩම් යන අමාත්‍යාංශ සහ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා සියලුම ප්‍රාදේශීය ලෙකම් කාර්යාලවල පූර්ණ සහාය ලබා ගැනේ. මේ පිළිබඳව අපට කරුණු දැක්වූ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් බන්දුල තිලකසිරි මහතා පවසන්නේ මේ වැඩපිළිවෙළට ගමේ සිටින සියලුම රාජ්‍ය නිලධාරීන් එක්වෙන බවයි. ඒ අනුව ග්‍රාම නිලධාරිවරයා, සමෘද්ධි නිලධාරි, කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි යන ග්‍රාමීය නිලධාරීන් එක්වී මෙම ගෙවතු අස්වැද්දීමේ කටයුතු අධීක්ෂණය කරන බව බන්දුල තිලකසිරි මහතා පවසයි.

ප්‍රධාන අරමුණ ගෘහ ආර්ථිකය නැංවීම හා ජීවනෝපාය සංවර්ධනයයි

"මේ වැඩපිළිවෙළ යටතේ සෑම ග්‍රාම නිලධාරි වසමකම පවුල් 210කට සෙත සැලසෙනවා. ඒ අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පවුල් 50ක්, ග්‍රාම නිලධාරි යටතේ පවුල් 50කට, කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන සහකාර නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි යන අය පවුල් 50 බැගින් මෙම වැඩපිළිවෙළට සම්බන්ධ කර එම පවුල් අධීක්ෂණය කරනවා."

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ බන්දුල තිලකසිරි

සමෘද්ධි දෙපාර්තමේන්තුවේ ජීවනෝපාය සංවර්ධන ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේනක ද සොයිසා

"මේ මඟින් ගමේ සමෘද්ධි සහනාධාර ලබන පවුල්වලට ප්‍රමුඛත්වය ලැබෙනවා. ඒ අයට ගෘහ ආර්ථිකය සවිමත් කරගෙන ආර්ථික ලෙස නැගී සිටින්න අතහිත දෙනවා. මේ වැඩසටහන යටතේ අපි පැළ බීජ හා කෘෂි උපදෙස් ලබාදෙනවා. ඊට අමතරව ග්‍රාම නිලධාරි යටතේ සම්බන්ධ වන පවුල්වලටත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව උදවු කරනවා. මේ යටතේ එළවළු, පලතුරු, කුළුබඩු ශාකද පැළ වර්ග ආදිය හා සත්ව පාලන කටයුතු පිළිබඳව ඒවාට අදාළ දෙපාර්තමේන්තුවල සම්බන්ධීකරණය ඇතිව සිදුකරනවා යැයිද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් බන්දුල තිලකසිරි මහතා පවසයි.

පවුලේ දියුණුවට ගෙවතු ලක්ෂ 24ක් වවන වැඩ පිළිවෙලක්

ඒ සමඟම මෙරටට පැමිණ සිටින මැදපෙරදිග සඳහා ගිය කාන්තාවන්ගේ පවුලේ ආර්ථිකය ඉහළ නැංවීමට අතහිත දීමත් මෙම වැඩපිළිවෙළේ තවත් පරමාර්ථයක්.

මැදපෙරදිග රැකියා සඳහා කාන්තාවන් යොමුවීම වැළැක්වීමත් පවුලේ ආර්ථිකයට කාන්තාවන්ට දායකත්වය සැපයීම හැකි ආකාරයේ ආර්ථික තත්ත්වයක් ගොඩ නැංවීම මඟින් සමාජයීය ප්‍රශ්න සඳහා විසඳුම් ලබාගත හැකි ආකාරයට කාන්තාව සවිබල ගැන්වීමට මෙම වැඩසටහන මඟින් අපේක්ෂා කරයි.

මේ පිළිබඳව අපට කරුණු දැක්වූ මේ වැඩපිළිවෙළ මෙහෙයවන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජීවනෝපාය සංවර්ධන අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේනක ද සොයිසා මහතා පැවසුවේ මේ ගෙවතු ලක්ෂ 24 අස්වැද්දීමේ වැඩසටහන වර්තමානයේ පවතින ජීවන වියදම අවම කිරීමට ගෘහ ආර්ථිකය ඉහළ නැංවීමට හේතුවන බවයි. ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකාය මේ වැඩසටහනට නායකත්වය ලබාදෙයි.

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂයන් බෝග වගාවක් නිරීක්ෂණය කරමින්

අපේ රටේ ජනතාවට නැවුම් එළවළු ලබාදීම ජාතික ආහාර නිෂ්පාදනය වැඩි කිරීම හා අපේ රටේ විස නැති එළවළු පලතුරු වවාගෙන අපේ ජනතාව නිරෝගී පරපුරක් බවට පත්කිරීම මෙම වැඩපිළිවෙළේ අරමුණු අතර වන බව සේනක ද සොයිසා මහතා පවසයි.

මේ දිනවල පවතින වැස්ස බෝග වගාවට ඉතා හොඳයි. මේ දිනවල පවතින කාලගුණය පිළිබඳව අදහස් දක්වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කෘෂි කාලගුණ විද්‍යාඥ ආචාර්ය බී.වී.ආර්. පුණ්‍යවර්ධන මහතා පවසා ඇත්තේ අද හෙටම ලැබෙන වර්ෂාවත් සමඟ බිම් සැකසීම සකස් කරන ලෙසයි. ඒ අනුව අපි මේ ගෙවතු වගා වැඩසටහන ඔක්තෝබර් 17 වැනිදා සුබ මොහොතින් ආරම්භ කරනවා. 17 වැනිදාට යෙදෙන දිළිඳුකම පිටුදැකීමේ දිනය වෙනුවෙන් තමයි අපි මේ වැඩසටහන ආරම්භ කරන්නේ. ඒ අනුව මේ ගෘහ ආර්ථික සංවර්ධන වැඩසටහන ඔක්තෝබර් 23 දක්වා පුරා සතියක් තුළ රටපුරා පවත්වනවා.

අපි මේ වැඩපිළිවෙළට අවශ්‍ය පැළ සකස් කිරීමට යාම ග්‍රාම නිලධාරි වසමකම එක් තවාන්කරුවෙක් බැගින් තෝරා ගත්තා. පසුගිය බදාදා ඒ සියලු තවාන්කරුවන්ට අපි තවාන් පිළිබඳ උපදෙස් දුන්නා. ඒ අනුව රටපුරා මේ සඳහා තවාන් 14012 ක් දැන් සකස් කරගෙන යනවා.

සැමගේ සහාය ඇතිව සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහගේත් උපදෙස් ඇතිව මේ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. එහි ප්‍රධානතම මෙහෙයුම් ආයතනය වනුයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව බව සේනක මහතා පවසයි. එහි සියලු සම්බන්ධීකරණ කටයුතු කරන සේනක ද සොයිසා මහතා පවසන පරිදි මේ යටතේ සෑම ග්‍රාම නිලධාරි වසමකටම පවුල් 100කට එළවළු පැළ ලබාදීම සිදු කරනවා. ඒ අනුව බටු, මිරිස්, තක්කාලි, මාළුමිරිස් පැළ ගොවී ජනතාවට ලබා දෙනවා. ඒවා එක් වර්ගයක පැළ 6 බැගින් පැළ 24ක අසුරනයක් එක් පවුලකට ලබා දෙන්නයි සැලසුම් කර තිබෙන්නේ.

මෙහි මුල් පවුල් 100ට පැළ ලබාදීම හා සම්බන්ධීකරණ කටයුතු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ග්‍රාම නිලධාරි මඟින් සිදුකෙරේ. අනෙක් පවුල් 100ට පැළ ලබාදීම පවුල් සවිබල ගැන්වීමට කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන සහකාර හා ආර්ථික සංවර්ධන නිලධාරි මඟින් සිදුවේ.

දිළිඳුකම පිටු දැකීමේ සතිය ලෙස නම් කර ඇති ඔක්තෝබර් 17 - 23 කාලය තුළ දිළිඳුකම් පිටු දැකීමේ ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව පවුල් ලක්ෂ 12 කට බීජ ලබාදීම ද සිදු කෙරේ.

ඒ බීජ පැකට්වල මෑ, වම්බටු, බෝංචි, කරවිල, බණ්ඩක්කා, වට්ටක්කා, යෝධ නිවිති ආදිය අන්තර්ගතය. ඒ අනුව රටේ කෘෂි දේශගුණික කලාවලට ගැළපෙන බීජ වර්ග පැළ වර්ග ගොවි ජනතාවට ලබාදීම සිදු කෙරෙන බවද සේනක ද සොයිසා මහතා පවසයි.

මෙහිදී ගොවි ජනතාවට ලබා දෙන්නේ විවිධ ආහාර වර්ගවල බීජයි. ඒ බීජ මිශ්‍ර කරමින් විවිධ ප්‍රදේශවලට ලබාදීම සිදුකෙරෙන අතර ඊට අමතරව කුකුළු පාලනය, එළු පාලනය, මිරිදිය මත්ස්‍ය වගාව හා ගව පාලනයට පහසුකම් ලබාදීම මෙහිදී සිදු කෙරේ.

රට පුරා අලුතින් එළවළු පැළ තවාන් 14,012 ක් සකස් කරයි

ගෙවත්තේ මඩ පොකුණුවල මත්ස්‍ය වගාවට පහසුකම් සැලසීම ගෘහස්ත කිරි කර්මාන්තය දියුණු කිරීම කෙරෙහිද මෙහිදී අවධානය යොමු කර ඇත. එමඟින් ගෘහ ආර්ථිකයේ විශාල දියුණුවක් ඇති වනු ඇත.

මේ වැඩපිළිවෙළ ඉදිරියට යාමේදී ගෘහ පරිභෝජනයෙන් පසුව අතිරික්තය ග්‍රාමීය වෙළෙඳ පොළට යොමු කර ගෘහ ඒකකවල ආර්ථික ප්‍රවර්ධනයක් ඇති කිරීමට හැකියාව තිබේ. තම ගෙවත්තේ වැවෙන වැඩිපුර එළවළු පලතුරු බිත්තර කිරි ගමේ වෙළෙඳ පොළට යොමුවන විට ගමේ වෙළෙඳ පොළේ ආහාර ද්‍රව්‍යවල මිල අඩුවේ. ඊට අමතරව අතරමැදියන් නැතිව ගමේ එළවළු ගමේම විකිණීම නිසා ගමේ ආර්ථිකය දියුණු වීම ස්ථිරයි. තවත් වැඩි ප්‍රමාණයක් ඇත්නම් ඒ ප්‍රමාණය නගරයට යැවීමට ඉඩ ඇත.

මෙරට ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය ඉහළ නැංවීමටත් ගමේ හා නගරයේ එළවළු මිල අවම කිරීමටත් බිත්තර මිල, කිරි මිල අවම කිරීමටද මෙම වැඩසටහන ඉවහල් වන බව මෙරට කෘෂි හා ආර්ථික විද්‍යාඥයන්ගේ අදහසයි.

දිවි නැඟුමෙන් ලැබූ පන්නරය මඟින් මෙරට ගෙවතු ලක්ෂ 24ක් අස්වද්දා සත්ව පාලන කටයුතුවලට උදව් දී රටම ගොවිපළක් කරන්නට උත්සාහ දරන මේ අලුත් ජාතික ගෙවතු වගා වැඩපිළිවෙළට රටේ සියලු නිලධාරීන්ගේ ද බලධාරීන්ගේ මෙන්ම පොදු ජනතාවගේ ද සහාය ලැබිය යුතුව තිබේ.

අපේ බෙත් අපිම හදන 'සාස්තරේ'

● **චන්දිමා එදිරිමාන්න**

රටේ ජනතාවට අත්‍යවශ්‍ය සියලුම ඖෂධ මෙරටදීම නිෂ්පාදනය කළ යුතු බවට රජය තීරණය කර තිබේ. ඒ අනුව ඉදිරි වසර 05 ක කාලය ඇතුළත මෙම ඉලක්කය ජයගැනීම සෞඛ්‍ය බලධාරීන්ගේ අරමුණයි. ඖෂධ නිෂ්පාදන හා සැපයුම් සහ නියාමන රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන මහතා ප්‍රකාශ කරන අන්දමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළට අනුව මෙලෙස මෙම ඖෂධ මෙරට තුළදීම නිපදවීම සිදුවනු ඇත. එහි ඇති විශේෂත්වය වන්නේ පිළිකා වැනි රෝග සඳහා අවශ්‍ය ඖෂධ වර්ග මෙරට තුළදීම නිෂ්පාදනය කිරීමට කටයුතු යෙදී තිබීමයි.

පසුගිය කාලය පුරාම මෙරට ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නංවා ලීමට අවශ්‍යය කෙරුණු ඖෂධ වර්ග විදෙස් රටවල් රැසකින් ම මෙරටට ආනයනය කිරීම සිදු විය. ඒ සඳහා අතිවිශාල මුදලක් ද වැය කෙරුණු අතර පැහැදිලිවම රටේ ජාතික ධනය විදේශ රටවලට ගලා යන එක මාර්ගයක් බවට එලෙස ඖෂධ ආනයනය කිරීම පත් විය. ඇස්තමේන්තු කර ඇති අන්දමට එලෙස ඖෂධ ආනයනය කිරීමට වසරකට රුපියල් බිලියන 60 ක පමණ මුදලක් මෙරටට වැය වී තිබේ.

මෙරට ඖෂධ නිෂ්පාදනය ක්ෂේත්‍රය නව දිශානතියකට යොමු කිරීම සඳහා ජනාධිපතිවරයා තුළ ඇති දැක්ම පැහැදිලිව පෙන්නුම් කළ මුල්ම සාක්ෂිය වූයේ ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ නව රාජ්‍ය අමාත්‍යාංශයක් ද බිහි කිරීමට කටයුතු කිරීමයි.

මෙලෙස මෙරට ඖෂධ නිෂ්පාදන කර්මාන්තය සවිබල ගැන්වීම උදෙසා තීරණාත්මක පියවරක් ලෙස ඖෂධ නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටුවීමට ගත් පියවර පිළිබඳව ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදකයන්ගේ සංගමය ද උද්දාමයට පත්ව සිටියි. අත්‍යවශ්‍ය ඖෂධ මෙරට ජනතාවට ලබාදීම සඳහා දේශීයව බටහිර ඖෂධ නිෂ්පාදනය කරන නිෂ්පාදකයින් දක්වන දායකත්වය පිළිබඳව සැලකීමේදී මෙවැනි අමාත්‍යාංශයක් පිහිටුවීම අතිශය වැදගත් පියවරක් බවත් එමගින් මෙරට අනාගතය සුබවාදී කිරීම සඳහා වත්මන් රජය කෙරෙහි සුබවාදී බලාපොරොත්තු තැබීමට හැකිවී ඇති බවත් එම සංගමය අවධාරණය කරන ලදී.

විදෙස් වෙළෙඳපොළ ද ඉලක්ක කරගනිමින් ඉදිරියේදී මෙම ඖෂධ නිෂ්පාදන කටයුතු පුළුල් කිරීමට ඖෂධ නිෂ්පාදනය හා සැපයීම නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය දැනටමත් තීරණය කර තිබේ. එයට අනුව විදෙස් වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් ඖෂධ නිෂ්පාදනය සඳහා හම්බන්තොට ප්‍රදේශයේ අක්කර 400 ක ආයෝජන කලාපයක් ඉදිකිරීමට තීරණය කර ඇති බව ද විෂය භාර අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන මහතා පසුගියදා අනාවරණය කළේ ය. මීට අමතරව දේශීය ඖෂධ නිෂ්පාදන ආයෝජකයන් සඳහා අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශයේ අක්කර 100 ක මධ්‍ය පරිමාණ ආයෝජන කලාපයක් ද පිහිටුවීමට තීරණය වී ඇත. ඉදිරි මාස දෙක තුන ඇතුළත මෙම ස්ථානවල ඖෂධ නිපැයුම් ආරම්භ කරනු ඇත.

රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන

වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ලේකම් සෙනාල් ප්‍රනාන්දු

ප්‍රජා වෛද්‍ය විශේෂඥ උත්පලා අමරසිංහ

ඖෂධ නිෂ්පාදක සංගමයේ සභාපති සංජය ජයරත්න

හැකි සෑම අවස්ථාවකම විදෙස් රටවලට ගලා යන මෙරට ජාතික ධනය රට තුළම ඉතිරි කිරීම, වත්මන් රජයේ අභිලාෂය බවත් ශ්‍රී ලංකාව තුළට මෙරටට අවශ්‍ය ඖෂධ නිෂ්පාදනය සඳහා ගනු ලැබූ තීරණයක් සමඟ එතෙර මෙතෙර ඖෂධ සමාගම් රැසක් මෙරට තුළදීම ඖෂධ නිෂ්පාදන කාර්යයන් සඳහා දැනටමත් ඉදිරිපත් වී ඇති බවත් අමාත්‍ය චන්න ජයසුමන මහතා ප්‍රකාශ කරයි. ඉදිරි මාස 06 ක කාලය තුළ සේලයින්, ප්‍රතිජීවක හා නිර්විත්දන ඖෂධ ශ්‍රී ලංකාවේ නිපදවීම සඳහා අවශ්‍ය සියලු විධිවිධාන මේ වනවිටත් යොදා ඇති බව ද අමාත්‍යවරයා අනාවරණය කළේ ය. මෙතෙක් විදේශ රටවලින් මෙරටට ආනයනය කරන ලද මිල අධික ඖෂධ වර්ග මෙරට තුළදීම වැඩපිළිවෙළ ගැන අදහස් දක්වන ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදකයන්ගේ සංගමයේ සභාපති සංජය ජයරත්න මහතා සඳහන් කළේ මෙය මීට පෙර ක්‍රියාත්මක කිරීමට තිබුණත් පමා වී හෝ ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම අගය කළ යුතු ක්‍රියාවක් බවයි.

මේ පිළිබඳව අදහස් දක්වන රජයේ වෛද්‍ය නිලධාරි සංගමයේ ප්‍රධාන ලේකම් වෛද්‍ය සෙනාල් ප්‍රනාන්දු මහතා සඳහන් කළේ ඖෂධ වර්ග මෙරට ආනයනය කිරීමේ ක්‍රියාවලිය තුළ දූෂිත හා අක්‍රමිකතා ද නිරන්තරයෙන් ම සිදුවූ බවයි.

පසුගිය කාලය පුරා එලෙස ගුණාත්මක ඖෂධ මෙරටට ගෙන්වීමක් සිදු නොවුණ බවත් ඊට එරෙහිව තම සංගමය සෑම අවස්ථාවකව හඬ නැඟූ බවත්, අරගල කළ බවත් සඳහන් කළ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ලේකම්වරයා දැනට රට තුළ ඇති ඖෂධ මාෆියාව විනාශ කර දැමීමට මේ නව වැඩපිළිවෙළ මගින් හැකිවන බවත් ප්‍රකාශ කළේ ය.

මේ පිළිබඳව ප්‍රජා වෛද්‍ය විශේෂඥ උත්පලා අමරසිංහගෙන් ද අප විමසූ අතර එහිදී ඇය ප්‍රකාශ කළේ මෙලෙස අත්‍යවශ්‍ය සියලු ඖෂධ නිෂ්පාදනය කිරීමට කටයුතු කිරීම තුළින් ඉදිරියේදී ඖෂධ මිල පාලනය වීම අනිවාර්යයෙන්ම සිදුවනු ඇති බවයි.

මහින්ද - තිස්ස - වජිර
කොළඹදී ලොකු කතාබහක

"තිලීපන් සැමරීමට ඉල්ලමින් උතුරේ හර්තාල් ක්‍රියාත්මක වෙනවා. ආණ්ඩුව මේ තත්ත්වයට මුහුණ දෙන්නේ කොහොමද? පසුගිය කාලයේ වගේ තත්ත්වයක් නැවත ඇති වෙයිද යැයි මාධ්‍යවේදියෙකු ඉකුත් අඟහරුවාදා (29) අරලියගහ මන්දිරයේදී අගමැති මහින්ද රාජපක්ෂ මහතාගෙන් විමසා සිටියේය.

"එහෙම එකක් නැවත වන්නේ නැහැ. රට ආරක්ෂිතයි. ආරක්ෂාව සම්බන්ධයෙන් අප බොහෝ අවධානය යොමු කර තිබෙනවා. නැවත උතුරේ එවැනි තත්ත්වයක් ඇති වෙනවා නම් පසුගිය කාලයේ දුන්නු උත්තරේම තමයි උත්තරේ."

අගමැතිවරයා මේ කරුණ එක හුස්මට කියාගෙන ගියේය. විදුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනවල ප්‍රධානීන් ඉකුත් 29 වැනිදා පෙරවරුවේ අග්‍රාමාත්‍යවරයාගේ ආරාධනයෙන් අරලියගහ මන්දිරයට කැඳවා තිබුණා.

අගමැතිට මාධ්‍යවේදීන් ගෙන් ප්‍රශ්න පත්තරයක්

20 වැනි ආණ්ඩුක්‍රම සංශෝධනය සහ තවත් කරුණු කිහිපයක් සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා කෙරිණි. මාධ්‍යවේදීන් කිහිපදෙනෙක් අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න රාශියක් අසනු ලැබූහ.

ඒවාට අගමැතිතුමා අවස්ථානුකූලව සුදුසු පිළිතුරු ලබා දුන්නේය.

අරලියගහ මන්දිරයේ පැවැති මෙම සාකච්ඡාව සඳහා රජයේ සම කැබිනට් ප්‍රකාශකවරුන් වන අමාත්‍ය උදය ගම්මන්පිල සහ අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල ද එක්වූහ. එහිදී මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට විටක මෙම ඇමැතිවරු දෙදෙනා ද පිළිතුරු ලබා දුන්හ.

පුරා පැය දෙකකට ආසන්න කාලයක් මෙම සාකච්ඡාව පැවැත්වුණි. ජනමාධ්‍යවේදීන් අතර ඉතාම ජනප්‍රිය චරිතයක් වන අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා මෙම සාකච්ඡාවෙන් පසු මාධ්‍යවේදීන් සමඟ සුහද කතා බහක ද නියැළුණේය. ඒ තේ පැන් සංග්‍රහයේදීය.

ඉකුත් සතිය පුරාවටම අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඉතාම කාර්ය බහුල විය. ඔහු අමාත්‍යාංශ නිලධාරීන් මෙන් ම සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්විය.

පාසල් දරුවෝ රත්නපුරේදී අගමැති වටකර ගනිති

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ ඉකුත් සඳුදා රත්නපුරය බලා පිටත්ව ගියේය. ඒ රත්නපුර ප්‍රදේශයේ උත්සවයකට සහභාගි වීමටය. අගමැතිවරයාගේ හෙලිකොප්ටරය ගොඩ බැස්ස වූයේ රත්නපුර මද්දුව ක්‍රීඩා පිටියටය.

පාසල් දරුවන් රැසක් ක්‍රීඩාංගණයට පැමිණ සිටියේ අගමැතිවරයා දැක ගැනීමේ ආසාවෙනි. මෙහිදී අගමැතිවරයා ඒ දරුවන් සමඟ සුහද කතාබහක නිරත විය.

අනතුරුව එම දරුවෝ තම පාසලේ තිබෙන අඩු පාඩු පිළිබඳව අගමැතිවරයාට පැවසූහ. එහි සිටි ඇමැති පවිත්‍රා වන්නිආරච්චි සහ ජනක වක්කුඹුර වෙත අගමැතිවරයා උපදෙස් ලබා දුන්නේ වහාම එම අඩු පාඩු සකස් කරන ලෙසයි.

මේ අතර බෙලිඅත්ත ප්‍රදේශයේ පාසල් දෙකක සිසුහු පිරිසක් ඉකුත් අඟහරුවාදා කොළඹට පැමිණියහ. ඒ අරලියගහ මන්දිරය නැරඹීම සඳහා ය. අග්‍රාමාත්‍යවරයා පෞද්ගලිකව එම දරුවන්ට අරලියගහ මන්දිරය සම්පූර්ණයෙන් ම දැක බලා ගැනීමට අවස්ථාව ලබා දුන්නේ ය. බෙලිඅත්ත ධම්මපාල බාලිකා විද්‍යාලයේ සිසු දැරියෝ මෙහිදී අගමැතිවරයා සමඟ කතා බහකද නියැළුණහ.

අග්‍රාමාත්‍යවරයා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති පොත් එළි දැක්වීමේ උත්සවයකට සහභාගි වූයේ ඉකුත් අඟහරුවාදා සවස 4.00 ට ය.

එලීනා ජයවර්ධන මහත්මිය පිළිබඳව සාගරිකා දිසානායක ලේඛිකාව විසින් ලියන ලද ග්‍රන්ථය සහ හිටපු ජනාධිපතිවරයෙකු වූ ජේ.ආර්. ජයවර්ධන මහතාගේ මුනුපුරෙකු වන ප්‍රදීප් ජයවර්ධන මහතා විසින් රචිත ජේ.ආර්. ජයවර්ධන නොකළ කතා එළිදැක්වීම ද මෙහිදී සිදුවිය.

මෙම අවස්ථාව සඳහා හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, හිටපු අමාත්‍ය වජිර අබේවර්ධන, පාර්ලිමේන්තු මන්ත්‍රී තිස්ස අත්තනායක, මහාචාර්ය චරිත හේරත් යන මහත්වරු ඇතුළු පිරිසක් ද ඊට එක්ව සිටියහ.

උත්සවය අවසානයේදී එම ස්ථානයෙන් පිටව යන අග්‍රාමාත්‍යවරයා "තිස්ස ඔයා වජිරත් එක්ක මොනවද ඔය හැටි කතා කරන්නේ" යැයි අගමැතිවරයා විමසා සිටියේය.

එවිට තිස්ස අත්තනායක මහතා එයට පිළිතුරු දෙමින් "නෑ මං මේ වජිරගෙන් දේශපාලන උපදේශයක් ගත්තා යැයි සිනාසෙමින් අග්‍රාමාත්‍යවරයාට පිළිතුරක් ලබාදුන්නේ ය.

"වජිරගෙන් උපදේශයක් ගත්තොත් වරදින්නේ නැතැයි අග්‍රාමාත්‍යවරයා ද සිනාසෙමින් කීවේය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සතිය ආරම්භ කරනු ලැබුවේ කොළඹින් පිටතට නිරීක්ෂණ චාරිකාවකට සම්බන්ධ වෙමිනි.

දංකොටුව ටෙක්ස්ටයිල් ඇතුළු ආයතන කිහිපයක් වෙත ගිය ජනාධිපතිවරයා දේශීය රෙදි නිෂ්පාදන වැඩි කිරීම පිළිබඳව රෙදි නිෂ්පාදකයන් සමඟ මෙහිදී සාකච්ඡා කළේ ය. අදාළ නිලධාරීන් සමඟ පැවැති මෙම සාකච්ඡාවලින් පසු දේශීය රෙදි නිෂ්පාදනය වැඩි කිරීම සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කළේය.

පාසල් දරුවන්ට අපේ රටේම රෙදි

ලබන වසරේ සිට පාසල් සහ ආරක්ෂක හමුදා නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි සැපයීම දේශීය නිෂ්පාදකයන්ට පැවරීම පිළිබඳව විමසීමට ලක් කෙරිණි. ජාතික කොඩි සහ බෞද්ධ කොඩි රට තුළ නිෂ්පාදනය කිරීම සඳහා එම කර්මාන්තකරුවන් දිරිමත් කිරීමට ජනපති කටයුතු කළේ ය.

එදින සවස ජනාධිපතිවරයා විශේෂ කරුණු කිහිපයක්ම පිළිබඳව අවධානය යොමු කළේ ය. පරිසර විනාශයක් පිළිබඳව කියවෙන අසත්‍ය පුවත් සමාජ මාධ්‍ය ඔස්සේ සහ ඇතැම් මුද්‍රිත මාධ්‍ය සහ රූපවාහිනී ගුවන් විදුලි මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරමින් පවතින තත්ත්වයක් උදාවී ඇත.

අසත්‍ය ප්‍රවෘත්ති මවන්නන් පිළිබඳව රජය දැඩි අවධානයෙන්

වනාන්තර ගිනි තබා විනාශ කරන බවට අසත්‍ය ප්‍රචාර සිදු කෙරෙන බවට හා ජනතාව නොමග යවන අසත්‍ය ප්‍රවෘත්ති නිර්මාණය වෙමින් පවතී. ඒ පුවත් සමාජගත කරන පිරිස් හඳුනාගෙන ඔවුනට එරෙහිව නීතිමය පියවර ගැනීමට රජය පියවර ගැනීමට තීරණය කර ඇත.

29 වැනි අඟහරුවාදා දහවල් වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් පිළිබඳව රාජ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් සමඟ අමාත්‍යාංශයේ ඉදිරි වැඩපිළිවෙළ සාකච්ඡා කළ ජනාධිපතිවරයා එදින සවස් භාගයේදී තැපැල් සහ ජනමාධ්‍යවේදී වෘත්තීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය.

ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය නිපුණතා වර්ධනයට අභ්‍යාස ආයතනයක් පිහිටුවීමට මෙහිදී සැලසුම් කර තිබේ.

මේ අතර පසුගියදා ජනාධිපති මන්දිරයේදී තානාපතිවරු සිවුදෙනෙක් ජනාධිපතිවරයා වෙත සිය අක්තපත්‍ර පිළිගැන්වූහ.

කොරියානු ජනරජය, ජර්මනිය, වතිකානය සහ ස්විස්ටර්ලන්තය යන රාජ්‍යයන්හි නව තානාපතිවරු මෙලෙස අක්තපත්‍ර පිළිගැන්වීම සිදුකළහ.

පැරණි බස් රථ නවීකරණය කර පුස්තකාල ලෙස සකස් කර දුෂ්කර පාසල්වලට ලබාදීමේ වැඩපිළිවෙළක් ද ජනාධිපතිවරයාගේ උපදෙස් මත ප්‍රවාහන අමාත්‍යාංශය මගින් සිදු කළේය. ඒවා දුෂ්කර ගම්මානවල පාසල්වලට බෙදා දීමට පියවර ගෙන ඇත. මේ ක්‍රියාවලියට පාසල් දරුවෝ සහ දෙමවුපියෝ මෙන්ම ගුරුවරු ද ජනාධිපතිවරයාට සිය කෘතඥතාව පුදකරනු ලැබූහ. ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා ද මෙම අවස්ථාවට එක්විය.

දුෂ්කර පාසල් 25ක් සඳහා මේවා ලබාදුන් අතර ලෝක ළමා දිනයට සමගාමීව ජනාධිපතිවරයා විසින් පාසල් දරුවන් කැඳවා මෙම වැඩසටහන ආරම්භ කර ඇත. මෙදින ජනාධිපතිතුමා මෙම අවස්ථාවට පැමිණි පාසල් සිසු සිසුවියන්ට ජනාධිපති ලේකම් කාර්යාලය නැරඹීමට ද අවස්ථාව ලබාදුන්නේය.

පුත්තලම, ලුණුවිල අනුරුද්ධ මධ්‍ය මහා විද්‍යාලය, ගම්පොළ දොළොස්භාගේ කනිෂ්ඨ විද්‍යාලය, ධර්මපුරම් රජයේ දෙමළ මිශ්‍ර පාසල, කුරුවිට විජය කුමාරතුංග විද්‍යාලය සහ ගාල්ල පිලාන විද්‍යාර්ථෝදය මහා විද්‍යාලය සඳහා සංකේතාත්මකව පුස්තකාල පරිත්‍යාග කෙරිණි.

ධාවනයෙන් ඉවත් කළ පැරණි බස් රථ අලුත්වැඩියා කර දරුවන්ගේ සිත් ගන්නා පරිදි පුස්තකාල සකස් කර තිබෙන අතර අංග සම්පූර්ණ එක් පුස්තකාලයක් සඳහා වැයකර ඇති මුදල රුපියල් මිලියනයකට ආසන්න වේ.

මොබිටෙල් ආයතනය ඊ - පුස්තකාල පහසුකම් සපයා තිබෙන අතර ඒ ඔස්සේ සිසුන්ට තොරතුරු අධ්‍යයනය කිරීමේ සහ ඊ-ග්‍රන්ථ පරිශීලනය කිරීමේ හැකියාව ලැබේ. ලංකා ගමනාගමන මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් හා මොබිටෙල්, මනුසත් දෙරණ සහ ජාතික පුස්තකාල ප්‍රලේඛන මණ්ඩලය පුස්තකාල ව්‍යාපෘතියට අනුග්‍රහකත්වය සපයයි.

ඇමති ප්‍රසන්න රණතුංග ඉකුත් සෙනසුරාදා පොළොන්නරුවේ ගියේය. ඒ රාජ්‍ය ඇමති රොෂාන් රණසිංහගේ පියාගේ දේහයට අවසන් ගෞරව දැක්වීම සඳහාය.

බන්දුල, ඉරාන තානාපති හමුවෙයි

දේහයට අවසන් ගෞරව දැක්වීමෙන් පසු ප්‍රසන්න අමුත්තන් වෙනුවෙන් වෙන්කර තිබූ කාමරය වෙත ගියේය. එම කාමරයට වී සිටි මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයා ප්‍රසන්න එහි පැමිණෙනවාත් සමඟ එම කාමරයෙන් පිටව ගියේ ප්‍රසන්න ඇමතිවරයා අසුන් ගන්නවාත් සමඟිනි.

ශ්‍රී ලංකාවේ හා ඉරානය අතර වෙළෙඳ කටයුතු සම්බන්ධව වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා සහ ඉරාන තානාපති අතර හමුවක් පසුගියදා වෙළෙඳ අමාත්‍යාංශයේදී පැවැත්විණි.

මෙම හමුවේදී ඉරානය තුළ ශ්‍රී ලංකා තේ සඳහා පවතින ඉල්ලුම සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර මුදල් භාවිතයකින් තොරව භාණ්ඩ හුවමාරු ක්‍රමය මගින් ශ්‍රී ලංකාවේ තේ සහ ඉරානයෙන් කෘෂිකර්මාන්තයට අත්‍යවශ්‍ය හා මෙරටදී නිෂ්පාදනය කළ නොහැකි මට්ටමේ උපකරණ හුවමාරු කරගැනීම සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

ඉරාන රජය මගින් මෙරට තුළ වෘත්තීය පුහුණු ආයතන ඇති කර එතුළින් අය කරනු ලබන මුදලින් කොටසක් මහපොළ ශිෂ්‍යත්ව භාරකාර අරමුදලට වෙන් කර ශ්‍රී ලංකාවේ සිසු දරුවන් වෙත තවත් ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයන් පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි.

මත්කුඩු ලෝලීහු සජිත්ට ගල් ගසති

විපක්ෂ නායක සහ සමගි ජන බලවේගයේ නායක සජිත් ප්‍රේමදාස මැතිවරණයෙන් පසුව පක්ෂය ගොඩ නැගීමේ කටයුතුවලට නායකත්වය දෙමින් සිටින අතරවාරයේදී කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයන් වෙනුවෙන් සංවිධානය කරන ස්තුති රැස්වීම්වලට සහභාගී වීමට වෙලාව වෙන් කර ගැනීමට අමතක කරන්නේ නැත. පසුගිය අඟහරුවාදා සවස කොළොන්නාවේ පැවති ස්තුති රැස්වීම් අවසන් කළ සජිත් මොරටුවේ රාවතාවත්තට පැමිණියේ හිරුණිකා ප්‍රේමචන්ද්‍ර විසින් සංවිධානය කර තිබූ ස්තුති රැස්වීමකට සහභාගීවීමටය.

සජිත් කතාව පටන්ගෙන විනාඩි කිහිපයක් යන විට කලබලකාරී තත්වයක් ඇතිවූයේ වේදිකාව දෙසට ගල් ප්‍රහාරයක් එල්ලවීම නිසාය. කිසියම් පිරිසක් විසින් එල්ල කළ ගල් ප්‍රහාරය වේදිකාවේ වහලය මතට වැටුණේය.

එක් ගලක් පතිත වූයේ හිරුණිකා අසලට. ඈ ගැබ්බරව සිටින්නියකි. ඒ සමගම ආරක්ෂක නිලධාරීහු පීඩිකාව වෙතට පැමිණියහ.

"මම ගැන නෙමෙයි මෙතැන ඉන්න මිනිස්සු ගැන බලන්න. මිනිස්සු ටික පරිස්සම් කරන්න. එයාලාට කිසිම දෙයක් වෙන්න අරින්න එපා" සජිත් ආරක්ෂක නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

වේදිකාවට ගල් ප්‍රහාරයක් එල්ල වුවත් සජිත් එයින් සැලුණේ නැත. ඔහු සිදුවන්නේ කුමක්දැයි හොඳින් බලාගෙන සිට නැවත රැස්වීමේ වැඩ ඉදිරියට රැගෙන ගියේය.

"ගල් ගැහුවට කමක් නෑ. ප්‍රශ්නයක් නෑ. මම බය වෙලා යන්නේ නෑ. කවුරුවත් බය වෙන්න එපා. මේ රත්මලානේ දේශපාලනය මෙහෙයවන්නේ කවුද කියලා අපි දන්නවා. මදාවියොන්ට බයේ මම යන්නේ නෑ. මම ඕනම අභියෝගයකට මුහුණ දෙන්න සූදානම්. මම මේ ගල් ප්‍රහාරවලට බය වෙන්නේ නෑ, මම ඕනම උණ්ඩයකට මුහුණ දෙන්න සූදානම්. මගේ කට කාටවත් වහන්න බෑ. අද මට ගහපු ගල් එකතු කරලා ප්‍රජා ශාලාවක් ඔබලාට හදලා දෙනවා" සජිත් සහතිකයක් දුන්නේය.

සජිත් තමන්ගේ කතාව අවසන් කර වේදිකාවට එල්ල කළ ගල් ටික එකතු කරගත්තේය.

"මගේ තාත්තා සුචරිතයේ වැඩ පටන් ගන්නකොට විරුද්ධවාදීන් මෙහෙම ගල් ගැහුවා. ඒ ගල් එකතු කරලා එතුමා සුචරිත මන්දිරය ගොඩ නැඟුවා." සජිත් කීවේ තමන්ට එල්ලවූ ගල්වලින් ප්‍රජා ශාලාව ගොඩ නගන හැටි ගැන කියමින්ය.

එතැන් සිට සජිත් ගියේ අභාවප්‍රාප්ත විකට නළු ටෙනිසන් කුරේගේ දේහයට අවසන් ගෞරව දැක්වීමටය.

සජිත් විපක්ෂ නායකත්වයට පත්වීමෙන් පසුව විපක්ෂ නායක කාර්යාලයේ සෑම පොහෝ දිනකම ධර්ම දේශනාවක් සංවිධානය කරන අතර මෙවර පස්වැනි වතාවට ධර්මදේශනාව සංවිධානය කර තිබුණි. පෝ දින ධර්මදේශනාව පැවැත්වූයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමාග්‍රී ධර්ම සංඝ සභාවේ අනුනායක හා ප්‍රධාන ලේඛකාධිකාරී, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ අංශාධිපති, අග්ගමහා පණ්ඩිත මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල නායක ස්වාමීන්වහන්සේ විසිනි.

"ඔබතුමාගේ පියාත් ආගම දහමට බොහෝ ලැදි අයෙක්. ඔබතුමත් ඒ මඟ යන එක ගැන අපිට සතුටක් තිබෙන්නේ. රටේ නායකයෙක් වෙන්න නම් රටේ තිබෙන සංස්කෘතිය හඳුනාගන්න ඕන. ඔබතුමන් මේ රටේ තිබෙන සංස්කෘතිය මොකක්ද කියලා තේරුම් ගත්ත නායකයෙක්. සමහර දේශපාලනඥයින්ට වැරදුනේ රටේ සංස්කෘතිය හැරිහැටි හඳුනාගත්තේ නැති නිසා" උන්වහන්සේ සඳහන් කළහ.

"හාමුදුරුවෝ කිව්වේ නායකතුමාගේ වැඩපිළිවෙළ ගැනම තමයි. රටේ තියෙන මහා සංස්කෘතිය හඳුනාගෙන ඒක ආරක්ෂා කරන අතරම අනෙක් ජාතීන්ට, අනෙක් සංස්කෘතීන්ට ඉඩ ලබාදෙනවා කියලා කියන්නේ ඔබතුමාගේ දැක්ම තමයි. ඒ වගේම සමගි ජන බලවේගයේ දැක්ම තමයි මේ" හර්ෂණ රාජකරුණා මන්ත්‍රීවරයා කීවේ ධර්මදේශනාව අවසන්වීමෙන් පසුව සජිත් ඇතුළු මන්ත්‍රීවරුන් සමඟ සුහද කතාබහක යෙදෙමින් සිටින අතරවාරයේදීය.

පසුගිය සති අන්තයේ සජිත් සිටියේ අනුරාධපුරයේ සහ පොළොන්නරුවේය. එම දිස්ත්‍රික්ක දෙකේ විහාරස්ථානවලට ගොස් නායක හිමිවරු හමුවී ආශීර්වාද ලබාගැනීමට සජිත් සති අන්තයම වෙන් කර තිබුණි.

"මහත්තයෝ, ඔබතුමා සංස්කෘතික කටයුතු ඇමැති වෙලා කටයුතු කරපු කාලේ මේ පළාතේ හැම පන්සලකටම වගේ උදවු කරලා තියෙනවා. ඔබතුමාගේ පියාත් ඒ වගේම තමයි. යන යන හැම තැනකටම මොනවා හරි කරලා තියෙනවා." නායක හිමිවරුන් කීවේ සජිත් විහාරස්ථාන වෙනුවෙන් කළ සේවය ගැනය.

මේ අතර සජිත් අටමස්ථානාධිපති උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන සංඝනායක ආචාර්ය පූජ්‍ය පල්ලේගම සිරිනිවාස නාහිමිපාණන්වහන්සේ බැහැදැක ආශීර්වාදය ලබා ගත්තේය. අනතුරුව පල්ලේගම හේමරතන නාහිමිපාණන්වහන්සේ ද බැහැදුටුවේය. ඉන්පසු සජිත් රුවන්වැලි මහා සෑරගුන්ට කප් රුක් පූජා කිරීමටද, ජයශ්‍රීමහා බෝධිරාජයාණන් වහන්සේ අබියස උතුම් පහන් පූජාවටද සහභාගී විය. සජිත් එයට සහභාගී වූයේ සමගි ජන බලවේගයේ අනෙකුත් මන්ත්‍රීවරුන්ද සම්බන්ධ ද කරගනිමින්ය.

සුරපුරයක් ගැන ආණ්ඩුවේ පොරොන්දු

සති අන්තයේ දින දෙකම සජිත් රජරට ගතකළේ විහාරස්ථාන ආශ්‍රිතවය.

'මොකක්ද මේ විස්ස?'

ස්වාමීන්වහන්සේ නමක් සජිත්ගෙන් විමසූහ.

"රටේ ජනතාව ගැන හිතලා, රටේ අනාගතය ගැන හිතලා, රටේත් ජනතාවගේත් අභිවෘද්ධිය තකා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය වෙනවා නම් එය සිදුවිය යුත්තේ. විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිර්මාණය කරලා තිබෙන්නේ පෞද්ගලිකත්වය මත. ඒක ඇත්තටම ආණ්ඩුව ඇතුළේ තිබෙන බල අරගලයක ප්‍රතිඵලයක් විදියටයි මම දකින්නේ." සජිත් කීවේය.

"සමහර මාධ්‍ය පෙන්නන්නෙ රට සුරපුරයක් කියලා. හැබැයි ඇත්ත දැනගන්න මේ ගම්වලට එන්න ඕන මහත්තයෝ"

අරලගංවිල විහාරවාසී හිමිනමක් කීහ. උන්වහන්සේ සජිත්ගේ කතාව අනුමත කළහ.

සජිත් අඟහරුවාදා සමගි ජන බලවේගය පක්ෂ කාර්යාලයට පැමිණියේ අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල දිනමු කමිටු පිහිටුවීමේ ප්‍රගතිය ගැන සාකච්ඡා කිරීමටය. හරින් ප්‍රනාන්දු ඇතුළු මන්ත්‍රීවරු පක්ෂ ප්‍රගතිය ගැන අවධානය යොමු කළේ මීළඟට පැවැත්වෙන කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල වැඩසටහන සාර්ථක කරගන්නා ආකාරය ගැනත් අවධානය යොමු කරමින්ය.

එ.ජා.ප. ය යළි ගොඩනැගීම සඳහා නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන ප්‍රමුඛ පිරිසකට අදාළ සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කොට වාර්තාවක් ලබාදීමේ වගකීම නායකයා පසුගිය දා පවරනු ලැබීය. රුවන් සමඟ අකිල, සාගල, කරුණාසේන කෙඩිතුවක්කු, ගමල් සෙනරත් වැනි අය ඊට ඇතුළත්ය. විශේෂයෙන් අර්ජුන, වජිර, නවීන්, සන්දීප් ඇතුළු කණ්ඩායම සමඟ අදහස් හුවමාරුවක් කරන ලෙසද නායකයා විසින් උපදෙස් ලබාදී තිබේ.

මේ කමිටුවේ සියලු දෙනා සාමූහිකවයි වගකීම ඉටුකළ යුත්තේ. සතියකින් වාර්තාව දෙන්න කියලා මම කිව්වා. ඒත් තාම නෑ. සාමූහිකත්වයෙන් මිසක් තනි තනිව කටයුතු කිරීම මෙතනට ගැළපෙන්නේ නැහැ. එ.ජා.ප නායකයා අදාළ කමිටු සාමාජිකයින්ට ලබාදුන් පණිවුඩය එයය.

රුවන් දකුණේ හරියට වැඩ

අපි හැකි ඉක්මණින් නිසි වාර්තාවක් හදලා බාර දෙන්නම්. උඩින් පල්ලෙන් මේක කරලත් බැහැ. ඒකයි ටිකක් කල් යන්නේ. කමිටු සාමාජිකයන්ගෙන් විමසූ විට නායකයාට ලැබුණේ එවැනි පිළිතුරකි. නියෝජ්‍ය නායක රුවන් පසුගිය සති අන්තයේ මාතරදී සිය පළමු ප්‍රාදේශීය මෙහෙයුම් කාර්යාලය විවෘත කළේ විශාල ජනතා ප්‍රතිචාර සමඟිනි. සාගල ඇතුළු දිස්ත්‍රික් එ.ජා.ප සංවිධායකයන් එම කටයුත්ත සංවිධානය කර තිබිණ.

කාර්යාලය විවෘත කිරීමෙන් පසුව දින දෙකක් මාතර දිස්ත්‍රික්කය පුරා සංචාරය කරමින් පාක්ෂිකයන් හමුවෙමින් වෙහෙරහේන, දෙවිනුවර විෂ්ණු දේවාලය හා සෙසු ආගමික ස්ථාන රැසක ප්‍රධාන පූජ්‍ය පක්ෂ හමුවී ආශීර්වාද ලබාගැනීම මෙන්ම එ.ජා.ප ය යළි ගොඩනැගීමේ වැඩසටහන ඔවුන් හමුවේ විස්තර කිරීමට ද නියෝජ්‍ය නායක රුවන් කටයුතු කළේය.



මාධ්‍ය ආයතන ප්‍රධානීන් හමුවේදී අගමැතිගෙන් ප්‍රශ්න රැසකට ක්ෂණික පිළිතුරු

ළමා දිනයේදී ජනපති ගෙන් දුෂ්කර පාසල් 25කට බස් රථවල හැඳූ ජංගම පුස්තකාල

ගල් ගහලා මගේ කට වහන්න බැහැ. මට ගහන ගල් එකතු කරලා ප්‍රජා ශාලාවක් හදනවා

රැවකිය හැල්ල
සාක්ෂි බෙන්නිස් කියයි... ejournalists@gmail.com

මුතුරාජවෙලටත් 'ගොල්ෆ්' එයිද ?

● **නිහාල් ජී. අබේසිංහ**

බස්නාහිර පළාතේ ඉහළම ජෛව විවිධත්වයකින් යුත් තෙත් බිම මෙන් ම අභය භූමිය ද වූ 'මුතුරාජවෙල' වනාහි 1802 ට පෙර මුළු බස්නාහිරටම අවශ්‍ය සහල් දුන් සරු වෙල්යායකි. පසු කාලයේදී මේ අභය භූමිය හරහා සකස් කළ හැමිල්ටන් ඇළ හා ඕලන්ද ඇළ නිසා මුතුරාජවෙලට කරදිය කාන්දුවී එහි කුඹුරු අස්වැද්දුම අසීරු වී ඇත. ඒ නිසා මේ ප්‍රදේශයේ කුඹුරු සියල්ලම වාගේ දැන් වල් බිහිවී ඇත. ඒ නිසාම දැන් මුතුරාජවෙල ඉහළ ජෛව විවිධත්වයක් පෙන්නුම් කරයි.

අක්කර 7580 ක විශාලත්වයකින් යුක්තව තිබූ මේ අභය භූමි විටින් විට අනවසර අල්ලාගැනීම් කුණු කසළ දැමීම් ආදිය නිසා දැන් පාරිසරික තර්ජනවලට ලක්වී ඇත. මේ නිසා මුතුරාජවෙල අභය භූමිය ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගැසට් කර ඇත්තේ අක්කර 2560 ක් පමණි.

මොන තර්ජන තිබුණත් තවමත් මෙහි ජෛව විවිධත්වය ඉහළම මට්ටමක පවතී. අපේ රටේ ඇති ප්‍රධාන තෙත් බිමක් මෙන් ම රම්සා සම්මුතියට අයත් තෙත් බිමක් වූ මුතුරාජවෙල වනාහි කොළඹට නුදුරුව ඇති පාරිසරික සෞන්දර්යයෙන් අනූන වූ පාරිසරික සංවේදී කලාපයකි. මුතු මෙන් වටින පාරිසරික කෘෂිකාර්මික හා ධීවර ක්ෂේත්‍රවලට ක්ෂේම භූමියක් වූ මුතුරාජවෙල සුරැකීම පරිසරයට ආදරේ කරන හැමගේ යුතුකමකි.

වනජීවී අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරිය බණ්ඩාර

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරි අමරසිංහ

පාරිසරික යුක්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ හේමන්ත විතානගේ

බටහිර වෙරළ තීරය දිගේ පැතිරුණු උතුරින් මීගමු කළපුවත්, දකුණින් කැලණි ගඟත්, බටහිරින් වෙරළ තීරයෙන් හා නැගෙනහිරින් කොළඹ - මීගමු ප්‍රධාන මාර්ගයෙන් ද සීමා මායිම්ව පිහිටා ඇති මුතුරාජවෙල ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය අතින් අනූන බිමකි. මීගමු කලපුවත් එක්ව ගත් කල මුතුරාජවෙල වගුරු බිම හෙක්ටයාර දස දහස් ගණනක් පුරා ව්‍යාප්තව පවතී.

කිසිම දේකට අවසර දීලා නැහැ

වනජීවී අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරිය බණ්ඩාර

මුතුරාජවෙල තෙත් බිම ඉතා ඉහළ ජෛව විවිධත්වයකින් යුක්ත පරිසර පද්ධතියකි. එබැවින් මෙහි වෙසෙන සියොතුන් අතර දේශීය මෙන් ම විදේශීය පක්ෂීන් ද වේ. මෙය කිවුල්දියට ම ආවේණික වූ කඩොලාන පරිසරයකින් ද, විවිධාකාර සියොතුන් හා උභය ජීවීන්ගෙන් ද, විවිධ කෘමි විශේෂ හා ජලජ පැළෑටිවලින් ද ස්වයංපෝෂිත වූ තෙත් බිමකි.

මෙම ප්‍රදේශය මත්ස්‍යයන් හා ඉස්සන්ගේ අභිජනන මධ්‍යස්ථානයක් වන අතර එළවළු, පලතුරු, ඖෂධ හා දැව සපයන ප්‍රභවයක් ද වේ. ඉතාම ජනාකීර්ණ ප්‍රදේශයක් වන මහ කොළඹ ප්‍රදේශයේ හරිත පෙනහළු ලෙස කටයුතු කරන මුතුරාජවෙල තෙත් බිම ස්වාභාවික ගං වතුර පාලනයට ද ඍජු දායකත්වයක් ලබාදෙයි.

පසුගිය දිනවල මුතුරාජවෙල ප්‍රදේශයේ මහ ගින්නක් ද ඇති විය. ඊට පසු මුතුරාජවෙල ඉඩම් විශාල ප්‍රමාණයක් ගොඩ කිරීම් ද සිදුවිය. දැන් ඒ මුතුරාජවෙල හරහා අධිවේගී මාර්ගය ඉදිවී ඇති නිසාත් ප්‍රදේශයේ ගුවන් තොටුපළ ආදිය සංවර්ධනය වෙමින් පවතින නිසාත් එහි ඉඩම් පර්චස් එක ලක්ෂ 10 - 20 අතරට අලෙවි වේ. තමන්ට අයිතිවී තිබූ වගුරු බිම් ලක්ෂ ගණන්වලට ගොඩකර ඒ වගුරු බිම් විකුණන අය ද බහුලව වෙති.

මේ මුතු මෙන් වටිනා මුතුරාජවෙල ට දැන් එල්ලවී ඇති අලුත්ම තර්ජනය ජාඇළ ප්‍රදේශයේ ඉඩම් සංවර්ධනය සඳහා යයි කියමින් මුතුරාජවෙල අභය භූමිය ඇතුළත අක්කර 600 ක ප්‍රදේශයක් ගොල්ෆ් පිටියකට හා සුපිරි හෝටල් සංකීර්ණයක් සඳහා සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට එක්තරා සමාගමක් කටයුතු කිරීම හා ඉල්ලුම් කිරීමයි.

මෙහිදී එම සමාගමේ හිමිකරු මුතුරාජවෙල පෞද්ගලික ඉඩම් බොහොමයක් තමන් සතු කර ගැනීමට කටයුතු කරමින් සිටියි. මුතුරාජවෙල ඇති වල් බිහිවූ අත හැර දැමූ පැරණි කුඹුරු යාඅවල් එහි අයිතිකරුවන්ගෙන් මිලදී ගෙන ඇති මේ ව්‍යාපාරික බලවතා එම ඉඩම්වල මේ හෝටල් ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට සූදානම් වන බව පරිසරවේදීහු පවසති.

මෙම ඉදිකිරීම් කිරීමට එම සමාගම දැනට මධ්‍යම පරිසර අධිකාරියෙන් හා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. ඒ පිළිබඳව මූලික නිරීක්ෂණ චාරිකාවක් එම ආයතනවල නිලධාරීහු මුතුරාජවෙලට ගියහ.

මේ ගමනේ සුවිශේෂී සිදුවීම වනුයේ මේ සඳහා ඉහත ආයතනවල 20 දෙනෙකු සහභාගි වීමත් ඒ සඳහා අදාළ ව්‍යාපෘතිය කරන සමාගම් විසින් නවීන මෝටර් රථ හා සියලු පහසුකම් ද සැලසීමයි. කෙසේ වුවත් මේ නිරීක්ෂණ වාර්තාවේදී ලබාගත් තොරතුරු අනුව මේ ව්‍යාපෘතිය සඳහා පාරිසරික ඇගැයීම් වාර්තාවක් සකස් කිරීමට සුදුසු දැයි සොයා බැලීම් ද සිදු කෙරෙමින් පවතී.

මේ පිළිබඳව අදහස් දක්වන වනජීවී අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරිය බණ්ඩාර මහතා පවසන්නේ මේ ව්‍යාපෘතිය සඳහා තම ආයතනය කිසිම අනුමැතියක් ලබාදී නැති බවයි. ඒ පිළිබඳව කිසිම වාර්තාවක් එකී දෙපාර්තමේන්තුව සකස් කර නොමැති බවත් පාරිසරික ඇගැයීමක් කිරීමට ද කිසිම සූදානමක් නැති බවත් ඔහු කීය.

මෙම ඉඩම් පෞද්ගලික වුවත් වන ජීවී කලාපයක් ඇතුළත අභය භූමියක් ඇතුළත කර ඇති සංවර්ධන කටයුතු සීමා ඇත. මුතුරාජවෙල අභය භූමිය මේ වනවිට අනවසර ඉදිකිරීම් හා පරිසර විනාශයන් රාශියකට මුහුණදී සිටී. මෙම භූමියේ මීගමුව කලපුවේ සිට මෝය කට දක්වා වූ ප්‍රදේශය මේ වනවිට ඒ හරහා වැටී ඇති මාර්ගයන් දිගේ සිදුවූ ඇති සංවර්ධනය සහ අධිවේගී මාර්ගය අවට ඇතිවන සංවර්ධනය නිසාද, කෙරවලපිටිය ආශ්‍රිතව ඇති කොළඹ මහ නගර සභාවේ කැළි කසළ එකතු කිරීමේ අංගණය සහ වෙනත් සංවර්ධන කටයුතු නිසා ද කැබලි රාශියකට වෙන්ව අතැයි පරිසර යුක්ති කේන්ද්‍රය පවසයි.

මෙහි නවතම සිද්ධිය වන්නේ ජා - ඇළ ප්‍රදේශයේ ඉඩම් සංවර්ධනය සඳහා මෙල්වත්ත ප්‍රොපටි ඩිවලොපර්ස් යනුවෙන් වූ සමාගමක් මුතුරාජවෙල වගුරු බිම තුළ අක්. 600 ක බිම්වල, ගොල්ෆ් පිටියක්, හෝටල් සංකීර්ණයක් සහ වෙනත් සංවර්ධන කටයුතු රාශියක් සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු අනෙකුත් ආයතනවල අවසරය ඉල්ලා සිටීමයි. මෙම පුද්ගලයා මුතුරාජවෙල වගුරු බිම තුළ තැනින් තැන ඇති පෞද්ගලික ඉඩම් තම සන්තකයට ලබාගෙන ඒවා ගොඩකර විවිධ ව්‍යාපෘති කිරීම පසුගිය රජය යටතේ මෙන් ම වර්තමානයේද සිදුකරමින් පවතින බව පරිසර යුක්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ හේමන්ත විතානගේ පවසයි.

කොළඹ මේ වනවිට ඉතිරිව ඇත්තේ හෙ. 2000 ටත් වඩා අඩු වූ තෙත් බිම් ප්‍රමාණයකි. ඉතිරිව ඇති මේ වගුරු බිම් ප්‍රමාණයත් මෙලෙස ගොඩකර විනාශ වීම නිසා අනාගතයේදී ගංවතුර පාලනය අතිශය අපහසු වන අතර එමගින් අවට ප්‍රදේශවලට විශාල හානියක් වනු ඇතැයි හේමන්ත විතානගේ මහතා පවසයි.

වන නිසා පරිසරය විනාශ කරන හිතු හිතු දේ මෙහි කිරීමට මේ ව්‍යාපාරිකයනට නොහැකි බවත් පාරිසරික ඇගැයීම් වාර්තාව සකස් නොකර කිසිවක් කිව නොහැකි බවත් වනජීවී මෙහෙයුම් අධ්‍යක්ෂ මංජුල අමරරත්න පවසයි.

ඒ සමඟම වනජීවී නිලධාරීන් පවසන්නේ මෙවැනි විශාල ව්‍යාපෘතියක් ඉදිකරන භූමිය නිරීක්ෂණය කිරීමට එහි යාමට වාහන ලබා දීම එවැනි ව්‍යාපෘතිවලින් ම කිරීම සාමාන්‍ය ක්‍රියාදාමයක් පමණක් බවයි.

මේ පිළිබඳව වනජීවී සංරක්ෂණ නිලධාරීන් කළ නිරීක්ෂණ චාරිකාව මගින් ලැබුණු තොරතුරු විද්වත් කමිටුවක් මගින් අධ්‍යයනය කර පසුව ව්‍යාපෘතියට පාරිසරික ඇගැයීමක් කිරීම කළ යුතු ද යන්න තීරණය කරන බව ද වනජීවී අධ්‍යක්ෂ ජනරාල් සූරිය බණ්ඩාර මහතා පවසයි.

මේ පිළිබඳව කරුණු දක්වන පරිසර යුක්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ හේමන්ත විතානගේ පවසන්නේ විවිධ බලපෑම් ඇති මුතුරාජවෙල අභය භූමියට ඇති අලුත්ම නවතම තර්ජනය හෙවත් ඉඩම් කොල්ලය වන්නේ ඒ ඇතුළත අක්කර 600 ක ගෝල්ෆ් පිටියක් තැනීම පිණිස උත්සාහ දැරීම බවයි.

මුතුරාජවෙල විනාශ වුණොත් බස්නාහිරටම ගැටලු රැසක්

පාරිසරික යුක්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ හේමන්ත විතානගේ

මේ මුතුරාජවෙල තෙත් බිමට විවිධ තර්ජන එල්ල වී එය විනාශ වුවහොත් ඉන් කොළඹ හා ගම්පහ ප්‍රධාන නගරවල ජනතාවට අහිතකර බලපෑම් රැසක් එල්ල විය හැකි බව ද හේමන්ත විතානගේ මහතා පවසයි.

මුතුරාජවෙල වගුරු බිම් ප්‍රමාණය හෙක්ටයාර 3,068 (අක්කර 7,580) ක් වන අතර එය රටේ විශාලතම තෙත් බිම් පද්ධතියයි. මෙම වගුරු බිම අද්විතීය හා බෙහෙවින් විවිධ වූ පරිසර පද්ධතිය නිසා කැපී පෙනෙන අතර එය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා තෙත් බිම් 12 න් එකක් ලෙස ලැයිස්තු ගත කර ඇත. මුතුරාජවෙල අභය භූමිය මේ වනවිට අනවසර ඉදිකිරීම් හා පරිසර විනාශයන් රාශියකට මුහුණදී සිටී. මෙම භූමියේ මීගමුව කලපුවේ සිට මෝය කට දක්වා වූ ප්‍රදේශය මේ වනවිට ඒ හරහා වැටී ඇති මාර්ගයන් දිගේ සිදුවූ ඇති සංවර්ධනය සහ අධිවේගී මාර්ගය අවට ඇතිවන සංවර්ධනය නිසාද, කෙරවලපිටිය ආශ්‍රිතව ඇති කොළඹ මහ නගර සභාවේ කැළි කසළ එකතු කිරීමේ අංගණය සහ වෙනත් සංවර්ධන කටයුතු නිසා ද කැබලි රාශියකට වෙන්ව අතැයි පරිසර යුක්ති කේන්ද්‍රය පවසයි.

මධ්‍යම පරිසර අධිකාරිය ඇතුළු බලධාරීන් මුතුරාජවෙල කලපුව පිළිබඳව දරන නිදාශීලී පිළිවෙත නිසා එය මෙසේ විනාශයට පත්ව ඇති බව ද හේමන්ත විතානගේ මහතා පවසයි.

අපෙනුත් අනුමැතියක් දීලා නැහැ

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරි අමරසිංහ

මේ පිළිබඳව කරුණු දක්වන මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරි අමරසිංහ මහතා පවසන්නේ මෙම ව්‍යාපෘතියට අදාළව පාරිසරික ඇගැයීම් වාර්තාවක් සිදු කිරීමට තවම නිසි ඉල්ලීමක් මෙතෙක් ඉදිරිපත්වී නොමැති බවයි. එමෙන් ම මේ මුතුරාජවෙල ප්‍රදේශයේ සංවේදී කලාප තිබෙන බැවින් මෙවැන්නකට අවසර දීම ඉතා අපහසු තත්ත්වයක් බව ද සභාපතිවරයා පැවසීය.

"මෙය වනජීවී දෙපාර්තමේන්තුවටත් අයිති ප්‍රදේශයක්. ඒ අනුව අපට පමණක් මේකට අවසර දෙන්න බැහැ. ආයතන සියල්ල එක්වී කටයුතු කළ යුතුයි.

පෞද්ගලික ඉඩම්වල තමයි මේ ගෝල්ෆ් පිටිය හදන්න හදන්නේ. ඒක පිළිබඳව හරියට අධ්‍යයනය කළ යුතුයි. පෞද්ගලික ඉඩම් වුණත් කරන්න බැරි ව්‍යාපෘති තිබෙනවා. තවම අපි මේ පිළිබඳව කිසිම අවසරයක් දීලා නැහැ යැයි සභාපතිවරයා පවසයි. එමෙන් ම අදාළ ව්‍යාපෘති ප්‍රදේශය නිරීක්ෂණයට එම සමාගමේ වාහනවල යාම රජයේ නිලධාරීන්ට උචිත නැති බව ද ඔහු කියයි.

මේ පිළිබඳව කරුණු දක්වන මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් හේමන්ත ජයසිංහ මහතා පවසන්නේ මෙම ගෝල්ෆ් ක්‍රීඩාංගණය හා හෝටල් සංකීර්ණ ඉදිකිරීමට ඉල්ලා ඇති ප්‍රදේශය වනජීවී කලාපයට හා ප්‍රේරණ කලාපයට අයත් වන නිසා එහි පාරිසරික ඇගැයීම් වාර්තාව ප්‍රධාන ලෙස සකස් කළ යුත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව බවයි.

කුරුණෑගල රෑමතියගේ ඝාතන අබිරහස

ඝාතනය වූ දීපිකා විජේකෝන්

දීපිකාගේ සිරුර පුළුස්සා තිබූ ස්ථානය

● **අමිල මලවිසූරිය**

පසුගියදා කුරුණෑගලින් අතුරුදන් වූ කාන්තාවකගේ ඉරණම් ගමනේ සුලමුලද දින 38කට පසු එනම් පසුගිය 26 වැනිදා අනාවරණය කරගැනීමට හැකි වූයේ කුරුණෑගල පොලිසියේ අපරාධ අංශයේ නිලධාරීන්ගේ සූක්ෂ්ම විමර්ශනයක ප්‍රතිඵලයක් ලෙසිනි.

එලෙස අතුරුදන්ව සිටි විජේකෝන් මුදියන්සේලාගේ දීපිකා විජේකෝන් නමැති කාන්තාව ඇගේ අනියම් සැමියා විසින් පොල්ගහවෙල, ගොඩවෙල සැකකරුගේ නිවෙසේදී ඝාතනය කොට තම පියාගේ අලව්වෙ නිවෙසේදී පුළුස්සා සිරුරු කොටස් යාබද මාඔයට දමා තිබියදී සොයා ගැනීමට පොලිසිය සමත් විණි. ඒ පසුගිය 26 වැනිදා සැකකරුවන් කළ පාපෝච්චාරණ අනුවයි. 48 හැවිරිදි දීපිකාට එවන් ඛේදවාචකයක් අත්වූ ශෝකාලාපය මෙලෙසිනි.

රුමත් කාන්තාවක් වන දීපිකා විජේකෝන් පළමු විවාහයෙන් වෙන්ව සිටි අතර ඇය කලක් විදේශ රැකියාවක නිරතවූ තැනැත්තියකි. ඝාතනය වන විට දීපිකා කුරුණෑගල මිලේනියම් සිටි හි අංක 73 දරන නිවෙසේ තනිව විසූ අතර එම නිවෙස විදේශගතව සිටින ඇයගේ වැඩිමහල් සොහොයුරියකට අයත් වූවකි. ඇය විදේශගතව සිටි හෙයින් මාස කීපයක සිට දීපිකා එම නිවෙසද බලා කියාගෙන එහි විසුවාය.

දීපිකාට සුනෙත් මුණ ගැසුණේ මීට වසර තුනකට පමණ පෙර දිනකදී කුරුණෑගල රෝහලට ගිය අවස්ථාවකදී ය. සුනෙත්ද වසර හයක පමණ කලක් කොරියාවේ රැකියාවක නිරතව පැමිණ පොල්ගහවෙල, ගොඩවෙල, ජයසුන්දර වත්තේ, අංක 63 දරන නිවෙසේ තනිව විසූ අයෙකි. 35 හැවිරිදි සුනෙත් එදින රෝහලට ගොස් තිබුණේ අසනීපව ප්‍රතිකාර ලැබූ ඔහුගේ පියාණන් බැලීමට ය. එදින අහඹු ලෙස හමුවූ දීපිකා හා සුනෙත් අතර වූ කතාබහ පසුව දෙදෙනාට ම නොදැනී පෙම් පලහිලව්වක් දක්වා දුරදිග ගියේ කාලයාගේ ඇවෑමෙනි. එලෙස කල් ගෙවද්දී දීපිකා සහ සුනෙත් කුරුණෑගල මිලේනියම් සිටි නිවෙසේ සහ පොල්ගහවෙල සුනෙත්ගේ නිවෙසේද විටෙන් විට විසූහ.

මිලේනියම් සිටි හි විසූ දීපිකාගේ දුක-සැප සොයා බැලුවේ ඉබ්බාගමුවේ, තල්ගොඩපිටියේ සිටි ඇයගේ බාල සහෝදරයා සහ ඔහුගේ බිරිය ඉනෝකා ය. දිනකට දෙකකට වරක් දුරකථන ඇමතුමක් ගෙන දීපිකාගේ සුවදුක් විමසීමට ඔවුහු වග බලා ගත්හ. පසුගිය අගෝස්තු මාසයේ 18 වැනිදා දීපිකාගේ සුවදුක් විමසීමට ඇගේ සහෝදරයා දුරකථන ඇමැතුමක් ගත්තද එයින් ඇසුණේ ප්‍රතිචාරයක් නොමැති බව පමණි. දින දෙක තුනක්ම ඔවුහු දීපිකා ගැන දන්නා කියන සෑම තැනකම සොයා බැලූහ. එහෙත් ඇය ගැන ලැබුණු එකම තොරතුර වූයේ මිලේනියම් සිටි නිවාස සංකීර්ණයේ ආරක්ෂක නිලධාරියකු පැවැසූ හෝඩුවාව පමණි. ඒ, 17 වැනිදා පස්වරුවේ මිලේනියම් සිටි හි නිවෙසේ සිට ඇය බැහැරට ගිය බව ය. දීපිකා සොයා වෙහෙස වූ ඇයගේ සහෝදරයා සහ නෑනා පසුගිය 22 වැනිදා දහවලේ කුරුණෑගල පොලිසියට ගිය අතර ඉනෝකා දීපිකාගේ අතුරුදන් වීම ගැන පැමිණිලි කළේ මෙලෙසිනි. "සර්... මගේ මහත්තයගේ අක්කා පසුගිය 18 වැනිදා ඉඳලා ආගිය අතක් නෑ. ෆෝන් නම්බර් එකට කෝල් ගත්තත් වැඩ නෑ... අක්කා හිටිය මිලේනියම් සිටි ආරක්ෂක නිලධාරියා නම් කියන්නෙ 17 වැනිදා සවස ගෙදරින් පිටවෙලා යනවා දැක්කා කියලයි... හැබැයි එයාට දන්න තරමට කිසිම තරහකාරයෙක් එහෙම හිටියෙත් නෑ..."

දීපිකාගේ අතුරුදන් වීම පිළිබඳව කුරුණෑගල පොලිසියේ විවිධ පැමිණිලි අංශ පොතෙහි සටහන් වීමත් සමඟ කුරුණෑගල මූලස්ථාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කපිල අධිකාරි මහතා විසින් ප්‍රදේශය බාර උසස් පොලිස් නිලධාරින්ද දැනුවත් කළේය. අනතුරුව උසස් පොලිස් නිලධාරීන්ගේද උපදෙස් මත පොලිස් ස්ථානාධිපතිවරයා විසින් දීපිකාගේ අතුරුදන් වීමේ 'පොටක්' පාදා ගැනීමේ විමර්ශන බාර කෙරුණේ කුරුණෑගල පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පුෂ්පලාල් මහතාට ය.

අපරාධ අංශ ස්ථානාධිපතිවරයා විසින් සියලු දේ අධ්‍යයනයෙන් පසු දීපිකාගේ දුරකථනය පිළිබඳව පුළුල්ව විමර්ශනය කෙරුණේ ඇගේ දුරකථනයට ලැබුණු දුරකථන අංක ගැනද පුළුල් විමර්ශනයකට මුල පුරමිනි. ඇගේ දුරකථනයට ලැබුණු අවසන් දුරකථන ඇමැතුම් කිහිපයය අතර වැඩි ම ඇමතුම් ගෙන තිබූ දුරකථන අංකයක් පිළිබඳ විමර්ශන නිලධාරීන් ගේ දැඩි අවධානයක් යොමු විය. ඒ අනුව එම දුරකථන අංකයේ හිමිකරු ගේ ලිපිනය ලෙස අනාවරණය වූයේ පොල්ගහවෙල, ගොඩවෙල, ජයසුන්දරවත්තෙ, 63 දරන අංකය යි. කුරුණෑගල පොලිස් නිලධාරීන් තම පොලිස් බලප්‍රදේශයෙන් පිටත පොල්ගහවෙල පොලිස් වසමේ පදිංචි ව සිටි සුනෙත් පිළිබඳව අවේක්ෂණ රාජකාරියේද නිරත වෙමින් පුළුල්ව සොයා බැලුවේ දුෂ්කරතා රැසක් මධ්‍යයේ ය. ඒ හරිහැටි එම ප්‍රදේශයට ගොස් විමර්ශන සිදු කිරීමට කුරුණෑගල පොලිසියේ අපරාධ අංශයට වාහනයක්ද නොමැති හෙයින් නිලධාරීන් පෞද්ගලික වාහනවලින් එම ප්‍රදේශයට ගොසිනි.

එහිදී අනාවරණය වූයේ සුනෙත් ඔහුගේ නිවෙසේ තනිවම වෙසෙන බවටයි.ඒ, කුඩා කාලයේදීම සුනෙත්ගේ මවුපියන් එකිනෙකාගෙන් වෙන්වී මේ වන විට වෙනත් විවාහ කරගෙන ජීවත් වන නිසා බවද සැල විණි. කොරියාවේ රැකියාවක නිරතව සිට පැමිණීමෙන් පසු මුදල් පොලියට දෙන 'ජොබ්' එක කරමින් ඔහු එම නිවෙසේ විසුවේ තනිවම ය. දින ගණනාවක් පුරා සුනෙත් පිළිබඳව සොයා බැලූ කුරුණෑගල පොලිස් නිලධාරීන්ට ඒත්තු ගියේ දීපිකාගේ අතුරුදන් වීමට සුනෙත්ගේ යම් සබඳතාවක් ඇතිය යන්නයි. ඒ අනුව පසුගිය 26 වැනිදා සුනෙත් විසූ පොල්ගහවෙල නිවෙසට කුරුණෑගල පොලිස් නිලධාරීන් ගියහ. නිවෙසේ විසූ සුනෙත් පොලිස් නිලධාරීන්ට කියන්නට වූයේ,

"සර්... මං එයා ගැන මුකුත් දන්නෙ නෑ... මට අන්තිමටම හම්බ වුණේ පසුගිය අගෝස්තු 18 වැනිදා... ඒ මගේ මේ ගෙදරදි... එදා රෑ මට යාළුවෙකුගේ ගෙදර යන්න තිබුණා. ඒ නිසා මං එදා රෑම දීපිකාට රුපියල් දාහක් දීලා කුරුණෑගල ගෙදර යන්න කීවා... එච්චරයි මං දන්නෙ..."

සුනෙත් කුරුණෑගල පොලිසිය රැගෙන ගොස් වැඩිදුර ප්‍රශ්න කෙරිණි. එහිදී සුනෙත්ගෙන් කරුණු එකින් එක හෙළි වීමට ගත වූයේ නිමේෂයකි. ඒ අනුව හෙළි වූයේ අමනුස්සයන් කීප දෙනෙකු විසින් දීපිකාගේ ජීවිතයේ අවසානය තීන්දු කළ ආකාරය පිළිබඳ හද කම්පා කරවන පාපෝච්චාරණයකි.

"සර්... මට එයාගෙන් හරිම කරදරයක් වෙලා තිබුණේ... පහුගිය 18 වැනිදා රෑ දීපිකා 10.30ට විතර ඇති... අපි දෙන්නා අතර රණ්ඩුවක් වුණා... ඒ වෙලාවේ මං දීපිකාට ගෙදර තිබුණ පොරවෙන් කෙටුවා..."

මාඔයේ තිබූ දීපිකාගේ පිළිස්සුණු සිරුරු කොටස් පොලිස් පරීක්ෂක වසන්ත බණ්ඩාර සොයාගත් මෙහොත

කුරුණෑගල අපරාධ අංශ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක M.H.N. පුෂ්පලාල්

නිවෙසේ ලේ විලක් මැද මැරී වැටී සිටි දීපිකා ගේ නිසල සිරුරට කුමක් කරන්නේද යන්න දසඅතේ කල්පනා කළ සුනෙත් ඒ බව දන්වා තිබුණේ අසල නිවෙසක සිටින ඔහුගේ ඥාති 'මාමා' කෙනෙකු වන 61 හැවිරිදි නිමල්ට ය. විවාහක පුද්ගලයකු වූ නිමල් පසුව ඒ බව දන්වා ඇත්තේ සුනෙත්ගේ පියා වන වෙනත් විවාහයක් කරගෙන අලව්වෙ, කපුවරල ප්‍රදේශයේ වෙසෙන 65 හැවිරිදි සේනාරත්නටයි.

"තාත්තා එදා රෑම කුලියට ගත් කාර් එකකින් මගේ ගෙදරට ආවා... පස්සෙ දීපිකාගේ සිරුර පෝර උරෙකින් ඔතලා කාර් එකේ දාගෙන තාත්තා අරන් ගියා.... අලව්වෙ ගෙදරට..."

අලව්වට රැගෙන ගිය දීපිකාගේ සිරුර සේනාරත්න විසින් සිය නිවෙසේ පිටුපසට රැගෙන ගොස් අසල කැළිකසළ ගොඩකට පැරණි ටයරයක්ද එක්කොට එදින රාත්‍රියේම පුළුස්සා තිබිණි. පසුව පිළිස්සුණු සිරුරේ කොටස් සේනාරත්න විසින් ම තැන තැන වළ දමා තවත් ප්‍රමාණයක් ඔහුගේ නිවෙසට යාබදව ගලා බසින මාඔයට විසිකර තිබුණේ පෝර උරයකට දමමිනි. ඒ අතරේ සුනෙත් සිය නිවෙසේ සියලු ලේ පැල්ලම්ද සෝදා පිරිසුදු-කොට දීපිකාගේ අත්බෑගය, දුරකථනය සහ කුඩයද එම වත්තේම පුළුස්සා තිබේ.

සුනෙත්ගේ පාපෝච්චාරණය අනුව ඔහුගේ පියා 65 හැවිරිදි සේනාරත්න සහ 61 නිමල් කුරුණෑගල පොලිසියේ අත්අඩංගුවට පත්වූ අතර දීපිකාගේ සිරුරේ කොටස් ස්ථාන කීපයකදී සොයා ගැනිණි. ඊට අමතරව මාඔයට විසිකර තිබූ සිරුරු කොටස්ද කුරුණෑගල කොට්ඨාස පොලිස් පිහිනුම් ඒකකයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක වසන්ත බණ්ඩාර විසින් මාඔයේ කිමිදී දැඩි පරිශ්‍රමයක් යොදා සොයා ගැනීමට සමත් විය.

කෙසේ හෝ මේ වන විට අනාවරණය වෙමින් තිබෙන්නේ දීපිකා ගේ ඝාතනය සුනෙත් විසින් ඉතා සැලැසුම් සහගතව සිදුකර ඇති බවකි. ඒ, සුනෙත් වෙනත් කාන්තාවක් හා ඇසුරක් පවත්වමින් ඇය විවාහ කරගැනීමට සූදානමින් සිටියද ඒ සඳහා දීපිකා ඔහුට මහත් බාධාවක් වී තිබේ. එම නිසා ඉතා සූක්ෂ්ම ලෙස දීපිකා තම නිවෙසට කැඳවා සුනෙත් මෙකී ඝාතනය සිදු කරන්නට ඇතැයි පොලිසියේද සැකය මේ වන විට යොමු වෙමින් තිබේ. ඝාතනය සඳහා සුනෙත් විසින් යොදාගත් අත්ග්ලවුස්ද පුළුස්සා තිබියදී ඒවායේ සුන්බුන්ද සොයා ගැනීමට පොලිසියට හැකි විය. අත්අඩංගුවට පත් සැකකරුවන් තිදෙනා කුරුණෑගල ප්‍රධාන මහේස්ත්‍රාත් සම්පත් හේවාවසම් මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ලබන 12 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කෙරිණි.

කුරුණෑගල දිසාව බාර නියෝජ්‍ය පොලිස්පති අනිල් ප්‍රියන්ත සහ කුරුණෑගල කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඒ.ජේ.වයි.බී. ක්‍රිෂාන්ත යන අයගේ උපදෙස් මත කුරුණෑගල මූලස්ථාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කපිල අධිකාරිගේ මෙහෙයවීමෙන් එහි අපරාධ අංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක **M.H.N.**පුෂ්පලාල් ඇතුළු පොලිස් පරීක්ෂක මාලිංග, පොලිස් සැරයන් වරුන් වන 5910 හේරත්, 15332 කාරියප්පෙරුම, 58064 බස්නායක සහ කොස්තාපල් 26938 අශෝක යන නිලධාරීහු විමර්ශනවලට එක් වූහ.

නෙත්සරගේ අවසන් කටයුතු

මියගිය අයෙක් වූ මාපලගම සිරිසුනන්ද විදිහලේ සිසු නෙත්සර

නෙත්සරගේ අක්කා වරුණි හඬා වැළපෙමින්

ගාල්ලට භීතියක් වූ ජලභීතිකාව

● **ලලිත් චාමින්ද** - ගාල්ල

නෙත්සර පුතු පස් දෙනෙකුගෙන් යුත් පවුලේ බඩපිස්සා ය. පවුලේ එකම පිරිමි දරුවා ය. මේ නිසා මවුපියන් මෙන්ම වැඩිමහල් සහෝදරියන් දෙදෙනාද නෙත්සරට පණමෙන් ආදරය කළහ. ගවේෂ් නෙත්සර අකුරු කරන්නට ගියේ මාපලගම සිරිසුනන්ද විද්‍යාලයේ 08 ශ්‍රේණියටය. මීට මාස එකහමාරකට පමණ ඉහතදී නෙත්සර පුතු උපකාරක පන්තියකට සහභාගි වීමට පාපැදියෙන් මාපලගම දෙසට යමින් සිටියේය. අයාලේ යමින් සිටි සුනඛයකු මාර්ගයේ ගමන් කරමින් සිටි ගැහැනු ළමයකුගේ ඇඟට පැන්නේය. ඒ සමඟ ඇය නෙත්සර පුතුගේ පාපැදියේ ගැටුණු අතර නෙත්සර පුතුද බිම ඇද වැටුණේය. අයාලේ යමින් සිටි සුනඛයා නෙත්සර පුතුගේ පාදයක් යාන්තමට සීරුවද එය එතරම් ගණන් නොගත් නෙත්සර උපකාරක පංතියට සහභාගි වීම සඳහා ගියේය.

"අක්කේ මාර වැඩක් නේ වුණේ. ගෑනු ළමයෙක් බල්ලෙක් හපන්න ඇවිත් මගේ සයිකලේ උඩට වැටුණා. බල්ලා මගේ දකුණු කකුල යාන්තමට සීරුවා. සීරුණු තැන මම සබන් ගාලා සේදුවා"

මෙම සිද්ධිය සිදු වී දින 04කට පසු නෙත්සර තම සහෝදරියට කීවේය. නෙත්සර ගේ සහෝදරිය වන වරුණි නිසංසලාද එය එතරම් ගණන් ගත්තේ නැත. "කෝ බලන්න හුරපු තැන" වරුණි නෙත්සර ගේ පාදය දෙස විපරම් කොට බැලුවේය. ඒ වනවිට පාදයේ සීරිම් තුවාලයක් පවා දක්නට නොවීය.ටික දිනක් යනවිට මේ සිද්ධිය නෙත්සර ට මෙන්ම පවුලේ අයටද අමතක වී ගියේය.

දිනය ඉකුත් 26 වැනිදාය.

"අක්කේ මගේ දකුණු කකුලට උඩින් තුනටිය පැත්ත රිදෙනවා. වේදනාව ඉවසන්න බැහැ" නෙත්සර සොහොයුරිය වරුණි නිසංසලාට කීවේය. ඒ අනුව උඩුගම රෝහලට ඇතුළත් කළ නෙත්සර ට මූලික ප්‍රතිකාර සිදුකෙරුණද ඔහුගේ කොන්දේ ඇති වී තිබූ වේදනාව එන්න එන්න ම වැඩි වන්නට විය. නෙත්සර පුතු කරාපිටිය ශික්ෂණ රෝහලට මාරු කළේ ඒ නිසාය. නෙත්සර ළඟ නතර වී ඔහුට සාත්තු සප්පායම් කළේ සහෝදරිය වන වරුණි නිසංසලා ය.

"අනේ අක්කේ මගේ ඇඟ හීතලයි. මට හුස්ම ගන්න බැහැ." දත් මදින්නට ගිය නෙත්සර තම සහෝදරියට කීවේය. පසුව නෙත්සර ඇඳට විත් හාන්සි වී සිටියේය.

"අනේ අක්කේ මට වතුර ටිකක් දෙන්න බොන්න". නිසංසලා වතුර කොප්පය නෙත්සර ට දෙන විට ඔහුගේ අත වෙවුලන්නට විය.

"අනේ අක්කේ මට හුස්ම ගන්න බැහැ" නෙත්සර යළිත් කීවේය. නිසංසලා ඒ ගැන වාට්ටුවේ සිටි හෙදියන්ට කීවාය.

"මෙයාට ඒතරම් අමාරුවක් නැහැ. හයවෙලාද කොහෙද" ඔවුහු නිසංසලාට කීහ.

ටික වේලාවකට පසු වාට්ටුව භාරව සිටි විශේෂඥ වෛද්‍යවරිය නෙත්සර පුතු අසල පැමිණියාය.

"පුතා බය වෙන්න එපා. ඔයාව යාන්තමට හෝ පුසෙක් හෝ බල්ලෙක් සීරුවාද?" වෛද්‍යවරිය නෙත්සර පුතුගෙන් ඇසුවේය. නෙත්සර පුතුට මීට මාස එකහමාරකට පමණ ඉහතදී වූ සිද්ධිය මතක් විය. හේ අකුරක් නෑර සිද්ධිය වෛද්‍යවරියට කීවේය. නෙත්සර පුතු එම වාට්ටුවේ කාමරයක් තුළ වෙන ම රඳවා තබන ලෙස වෛද්‍යවරිය උපදෙස් දුන්නාය. කෙමෙන් ඔහුගේ රෝගී තත්ත්වය දරුණු වන්නට වූ අතර ඔහුට හුස්ම ගැනීමට අපහසු විය. අතට හසුවන ඕනෑම දෙයක් පොළවේ ගසා කුඩු කරද්දී නිසංසලා ඒ ගැන වාට්ටුවේ සිටි හෙදියන්ට කීවාය. පසුව නෙත්සර පුතුට එන්නතක් විද ඔහුගේ අත් පා ගැට ගැසීමට කටයුතු කරනු ලැබීය. ඉන්පසු නෙත්සරපුතුට නින්ද ගියේය. ටික වෙලාවකට පසු ඔහු අවදි විය.

දැනටම ගාල්ලේ ජීවිත දෙකක් බිලි අරන්

"අක්කේ ඔයා අඬන්න එපා. මම මැරිලා ඉපදුණා. මම මැරෙනවා. ඔයා අඬන්න එපා. අනේ මගේ අත් දෙක ලිහන්න" නෙත්සර පුතු මරු විකාරයෙන් මෙන් කීවේය.

"මල්ලි මොනවාද ඔය කියන විකාර කතා. ඩොක්ටර්ස්ලා කියලා තියෙන්නේ ලිහන්න එපා කියලා."

නිසංසලා හඬමින් කීවාය. ඒ අතර දැඩි අසාධ්‍ය තත්ත්වයට පත්වූ නෙත්සර රෝහලේ දැඩි සත්කාර ඒකකයට මාරු කළේය. එහෙත් ඔහුගේ දිවි බේරා ගැනීමට හැකි වූයේ නැත.

මේ අයුරින් අවාසනාවන්ත ලෙස ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු වූයේ හොරගස්තුඩුව අලුත්පහල මාපලගම ප්‍රදේශයේ පදිංචිව සිටි කහවගුරුගේ ගවේෂ් නෙත්සර නැමති වයස අවුරුදු 12ක් හා මාය හයක් වියැති පාසල් සිසුවෙකි. නෙත්සර පුතුගේ මව වන හිරිමතුගොඩගේ චිත්‍රා නන්දනී (48) දරාගත නොහැකි සොවින් වැලපෙමින් මෙසේ කීවාය.

"අනේ මගේ එකම පුතා මට නැති වුණා. මීට මාස එකහමාරකට පෙර ගණිතය විෂය සඳහා උපකාරක පන්තියකට යන විට බල්ලෙක් පාපැදියට පැනලා කකුල සීරුවා කියලා අක්කලාට කියලා තියෙනවා. ඒ සඳහා බෙහෙත් කරන්න ගියේ නැහැ. මාස එකහමාරකට පමණ පසු පුතාගේ තුනටිය රිදෙන්න ගත්ත නිසා තමයි රෝහල් ගත කළේ."

නෙත්සර පුතු ජලභීතිකා රෝගය වැලඳීමෙන් මිය යන්නට දින තුනකට පෙර ඒ ආසන්නයේ ම පදිංචි අයකුද ජලභීතිකා රෝගය වැලඳීමෙන් මිය ගියේය. ඔහු නියාගම ලොකුගමගේ සරත් (54) නැමති ඉහල පිටිටනිය යටලමත්ත ප්‍රදේශයේ පදිංචි අවිවාහකයෙකි. ඉකුත් 25 වැනිදින මොහු මාර්ගයේ වැටී සිටියදී 1990 හදිසි ගිලන් රථ සේවාවට අයත් ගිලන් රථයකින් උඩුගම රෝහලට ඇතුළත් කර තිබූ අතර මොහු ඒ අවස්ථාවේ හැසිරී ඇත්තේ උන්මත්තකයකු ලෙසට ය. මීට සතියකට පමණ ඉහතදී සුනඛයකු විසින් ඔහු සපා කා තිබුණි.

නෙත්සර පුතු මෙන්ම සරත් නැමති පුද්ගලයාද නිසි අයුරින් වෛද්‍ය ප්‍රතිකාර නොගැනීම තම ජීවිතවලින් වන්දි ගෙවීමට සිදු විය. ගාල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කංචිත සමරරත්න ඒ පිළිබඳ මෙසේ කීවේය.

"සුනඛයන් හා පූසන් සපා කෑ අය සිටී නම් වහාම රෝහල් වෙත වාර්තා කර නිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වන ලෙස ඉල්ලා සිටිනවා. පසුගිය සතිය තුළ මාපලගම හා යටලමත්ත යන ප්‍රදේශවලින් ජලභීතිකා රෝගීන් දෙදෙනකු වාර්තා වෙලා තියනවා. එම රෝගීන් දෙදෙනා ම මියගොස් තිබෙන නිසා මේ තත්ත්වය සරලව ගන්න එපා. සුරතල් සතුන් සපා කා ඇත්නම් සුළුවෙන් තැකීමක් කරන්න එපා. එහිදී වෙන තුවාල ලොකු ද පොඩි ද කියලා බලන්නේ නැතිව වහා ම වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වන්න. පසුගිය සතිය තුළ මියගිය එක් සිසුවෙක් පුද්ගලික පන්තියකට ගොස් පැමිණෙමින් සිටියදී බල්ලෙකු සපා කා තියෙනවා. එය සුළු තුවාලයක් නිසා ගණන් නොගැනීම නිසා තමයි ප්‍රශ්නය ඇතිවෙලා තියෙන්නේ. එම නිසා සුරතල් සතුන් සපා කා ඇත්නම් වහාම ළඟම රෝහලට ගොස් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න.

නිසි පරිදි වෛද්‍ය ප්‍රතිකාර ගන්නේ නම් ජලභීතිකා රෝගය සියයට සියයක්ම වළක්වා ගන්න පුළුවන්

ඒ වගේම එසේම සුරතල් සතුන් ඇති කරන අය අදාළ එන්නත් කිරීම නිසි කාලයට සිදු කරන්න. විශේෂයෙන්ම පිස්සු බලු එන්නත වාර්ෂික ව ලබා දිය යුතු නිසා එක්වරක් ලබා දුන්නා කියා එය මඟ හරින්න එපා. සැක සහිත සතුන් සම්බන්ධයෙන් වඩාත් ප්‍රවේශමෙන් කටයුතු කළ යුතුයි. දැනට බලපෑමට ලක්ව ඇති උඩුගම ප්‍රදේශ ආශ්‍රිතව ඉදිරි දින කිහිපය තුළ එන්නත් කිරීම සිදු කරනවා. ඒවා සහභාගී වී එන්නත් කිරීම සිදුකර ගන්නා ලෙස ද ඉල්ලා සිටිනවා."

ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේ ජලභීතිකා ඒකකයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි වෛද්‍ය ගීංතාජලි ගුණරත්න ද ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වූවාය.

"වවුලා ඇතුළු ක්ෂීරාපායි සියලුම සතුන්ගෙන් ජලභීතිකාව බෝවෙන්න පුළුවන්. ඒ නිසා එම සතුන් සපාකැවොත්, සිරුවොත් ලෙව කෑවොත් රෝහලකට ඇතුළු වී වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතුයි. සියලුම සුරතල් සතුන් එන්නත් කරගත යුතුයි. ගවයාගෙන් ද ජලභීතිකාව වැලඳෙන්න පුළුවන්. ඇතැම් අය ගවයා ලෙව කෑවත් ගණන් ගන්නේ නැහැ.කරාපිටිය රෝහලේ පරීක්ෂණාගාරයක් තියෙනවා. පැය 24 පුරාම එය විවෘතයි. ක්ෂීරපායි සතකු මියගිය විට ඒ සතාගේ හිස අපිට ගෙනත් දෙන්න පුළුවන්. එයින් පරීක්ෂණවලදී අපිට තහවුරු කරගන්න පුළුවන් මේ සතාට ජලභීතිකාව වැලඳිලා නැද්ද කියලා. එන්නත් කිරීමේදී එය පහසුවක් වෙනවා"

වසරකට මෙරට ජලභීතිකා මානව මරණ 20-30 අතර ප්‍රමාණයක් සිදුවන බව ජලභීතිකා මර්දන ඒකකය පවසයි. ඉන් වැඩිපුර මරණ සංඛ්‍යාවක් සිදු වන්නේ සුනඛ සපාකෑම් හේතුවෙනි. ශ්‍රී ලංකාවේ ජලභීතිකා රෝගයට ප්‍රධාන හේතුව වන්නේ එම රෝගයට එරෙහිව සුනඛයන් එන්නත් සිදු නොකිරීම සහ රෝගීන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු නොකිරීම බවද ජලභීතිකා මර්දන ඒකකය පවසයි.

නිසි පරිදි වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්නේ නම් ජලභීතිකා රෝගය සියයට සියයක්ම වළක්වා ගත හැකි රෝගයකි. ජලභීතිකා රෝගය වැළැක්වීම සඳහා ප්‍රතිකාර රජයේ රෝහල් මඟින් නොමිලේ ලබා ගත හැකිය. ජලභීතිකා රෝගය මර්දනය සඳහා වාර්ෂිකව සුනඛයන් එන්නත් කිරීම ශ්‍රී ලංකාව තුළ නිර්දේශිත ය. 1975 වසරේ සිට ක්‍රියාත්මක කරනු ලැබූ ජලභීතිකා රෝග මර්දන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස මානව ජලභීතිකා රෝගය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත. වැඩි ම ජලභීතිකා මරණ සංඛ්‍යාවක් සිදුව ඇත්තේ 1973 වර්ෂයේදීය. ඒ සංඛ්‍යාව 377 කි. කෙසේවුවද 2019 වර්ෂය වන විට එම සංඛ්‍යාව 26 දක්වා අඩු වී ඇත.

තරුණ වරලත් ගණකාධිකාරීවරයෙකුට වකුගඩුවක් ඉතා ඉක්මණින් අවශ්‍යයි.

A, B, O, AB පොසිටිව් ඕනෑම රුධිර කාණ්ඩයක් ඇති අයෙකුට මේ සඳහා දායක විය හැක.

0783780035 - සුජීව

කොල්ලකරුවන් නිවෙසට පිවිසි ඉදිරිපස

නිවෙසේ මුරකරු සිද්ධිය පිළිබඳ පොලිසියට කරුණු කී ආකාරය

කොල්ලකෑ නිවෙස

කටානේ මංකොල්ලය ඇල්ලූ පොලිස් මෙහෙයුම මෙන්න

පැය හතළිස් අටක් යන්නටත් මත්තෙන් කොල්ලකරුවන් අත්අඩංගුවට

කෝටි තුනකට ආසන්න මුදල් සහ ස්වර්ණාභරණ කොල්ල කයි

සීඅයිඩී නිලධාරීන් සේ වෙස්ගෙන

● අමිල මලවිසූරිය

මිනීමරුවන්, කොල්ලකරුවන්, කප්පම්කරුවන්ට එරෙහි පොලිසිය කෙතරම් වැටකඩුලු තර කළද අපරාධකරුවන්ද රිසි සේ අපරාධ ක්‍රියාවන්ට පෙලඹෙන ආකාරයක් පෙනේ. එහෙත් ඒ සියලුම අපරාධකාරයන්ට පොලිසියෙන්නම් ගැලවීමක් නොමැත. ඒ අනුව මෑත කාලයේ සිදුවූ බොහෝ අපරාධ ක්‍රියාවන්හි සුලමුල දින කීපයක් තුළදීම විමර්ශන නිලධාරීන්ගේ උකුසු ඇස් මත හෙළි කරගැනීමට සමත් වූයේය.

පසුගිය 30 වැනිදා කටාන, අක්කර පනහ නිවෙසකට ඇතුළුව කෝටි දෙකකට ආසන්න මුදල් සහ කෝටියක පමණ ස්වර්ණාභරණ කොල්ලකා පලා ගිය වුන්ද පැය හතළිස්අටක් යන්නටත් මත්තෙන් නීතියේ රැහැනට කොටුකර ගැනීමට පොලිසිය සමත් වූයේ පොලිසියේ කාර්යභාරයද 'නිත'ටම පෙන්නුම් කරමිනි. පුවත්පත මුද්‍රණයට යන විට එම කොල්ලයට පැමිණි කොල්ලකරුවන් සිවුදෙනෙකු මුදලින් රුපියල් ලක්ෂ 72ක් සහ ස්වර්ණාභරණ ප්‍රමාණයක් සමඟ අත්අඩංගුවට ගැනීමට හැකි වූ බව විමර්ශන නිලධාරීන් කීවේය. සෙසු සැකකරුවන් සහ කොල්ලය පිටුපස සිටින අදිසි හස්තය ගැන හඳුනා ගැනීමට ද පොලිසිය දිගින් දිගටම විමර්ශන කණ්ඩායම් 4ක් ඔස්සේ මෙහෙයුම් සිදු කරමින් සිටී.

තිස් වැනිදා පෙරවරු 9.15ට පමණ කටාන පොලිස් වසමේ අක්කරපනහ, 307/එෆ් - 39 දරන කෝටිපති ව්‍යාපාරිකයාගේ නිවෙසට සයදෙනෙකුගෙන් සමන්විත කොල්ල කල්ලියක් නිල් පැහැති මෝටර් රථයකින් පැමිණ නිවෙසට ඇතුළු වන ආකාරය අසල සීසීටීවී කැමරාවක මනා ලෙස සටහන් වී තිබිණි.

එම නිවෙස කෝටිපති ව්‍යාපාරිකයකු වන ජෙරාඩ් ප්‍රනාන්දු නමැත්තාගේය. මෙරට ජනප්‍රිය බීඩි ව්‍යාපාරය ප්‍රධානකොට හෝටල් කීපයකද හිමිකරුවකු වන එම ව්‍යාපාරිකයා දේපොළ විකිණීම් ඇතුළු නිවෙසේම පවත්වාගෙන යන මහා පරිමාණ බේකරි නිෂ්පාදන ආයතනයකද හිමිකරුවෙකි. ව්‍යාපාරිකයා පසුගිය මාස කීපයක සිට අසනීප තත්ත්වයක් හේතුවෙන් නිවෙසටම වී සිටි අයෙකි. ඒ අතරේ ඔහුගේ සුවදුක් විමසීමට බොහෝ පිරිස්ද නිවෙසට පැමිණ තිබේ.

කටාන පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩිලාන් රාජපක්ෂ

පසුගිය බදාදාද පෙරවරු 9.15ට පමණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරි පිරිසක්යැයි පවසමින් ඔහුව මුණගැසීමට පැමිණි තිබුණේ සයදෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමකි. වයස අවුරුදු 25ත් 40ත් අතර වූ එකී පිරිස සුදු පැහැති කමිසයකින් සහ කළු පැහැති කලිසම්වලින් සැරැසි මුහුණු ආවරණද (මාස්ක්) පැලඳ නිවෙසේ ගේට්ටුව අසලට පැමිණ තිබිණි.

ඒ මොහොතේ නිවෙසේ ආරක්ෂාවට ගේට්ටුව අසල සිටි වැඩිහිටි පුද්ගලයාට අදාළ කාරණය පවසා එකී පිරිස නිවෙසට පැමිණෙන ආකාරය ව්‍යාපාරිකයාගේ නිවෙසෙහි ආරක්ෂිත සීසීටීවී කැමරා කාචයක මනා සේ සටහන් විණි.

නිවෙසේ ප්‍රධාන ගේට්ටුවේ සිට මඳ දුරකින් පිහිටි නිවෙසට පැමිණි අතර එකී කණ්ඩායම නිවෙස් මුරකරු සමඟ කිසියම් කලබලකාරි ආකාරයකින් යම් කතාබහක නිරත වන ආකාරයද සීසීටීවී කැමරාවලින් මනා සේ පෙන්නුම් කෙරිණි.

එකී කොල්ල කණ්ඩායමේ ග්‍රහණයට නතුව සිටි ව්‍යාපාරිකයාගේ නිවෙසේ වෙසෙන වැඩිහිටි පුද්ගලයා පසුව පොලිසිය සිදුකළ විමර්ශනවලදී කොල්ලකරුවන් විමසුවේ කුමක්ද යන්න පැවැසුවේ මෙලෙසිනි.

"මට ගිනිඅවියක් දික්කරලා... සේප්පුව පෙන්නන්න කීවා... මං කිව්වා සේප්පුවක් නෑ පෙන්නන්ඩ... ඒ කිව්වට ඇහුවේ නෑ... පස්සෙ මා ළඟ දෙන්නෙක් තියලා.... අනෙක් අය ගේ ඇතුළට ගිහින් කාමරවල සියලු දේ ඇදලා මුදලුයි රත්තරන් බඩුයි හොයලා..."

නිවෙස් හිමිකරු පොලිසියට සිද්ධිය පිළිබඳ කරුණු කියමින්...

කොල්ලකරුවන් විසින් නිවෙසේ මුරකරු ප්‍රාණ ඇපයට ගෙන නිවෙසට පැමිණෙන අයුරු

එලෙස ජෙරම්ගේ නිවෙසට කොල්ලකරුවන් ඇතුළුවීමෙන් පසු නිවෙසේ සිටි ව්‍යාපාරිකයා, බිරිය, පුත්‍රයා සහ දියණියද කොල්ලකරුවන්ගේ ග්‍රහණයට ගෙන තිබේ. එසේම ජෙරම්ගේ සුවිසල් නිවෙසට යාබද ඔහුගේ බේකරි නිෂ්පාදන ආයතනයේ පිරිසද කොල්ලකරුවන් විසින් ප්‍රාණ ඇපයට ගෙන තිබුණේය.

ව්‍යාපාරිකයා ඇතුළු පවුලේ සියලු දෙනාම නිවෙසේ සාලයට කැඳවා ගිනිඅවි පෙන්නා තර්ජනය කරමින් කොල්ලකරුවන් පවසා ඇත්තෙ, "උඹලා ළඟ කෝටි ගාණක සල්ලි තියෙනවානේ... අපට සල්ලි දියන්... නැත්නම් වෙඩි කන්න තමයි වෙන්නෙ..."

එකී තර්ජනයන්ට නිවෙස් හිමියන් ඇතුළු සේවක පිරිසද බියේ බිරාන්තව සිටිද්දී කොල්ලකරුවන් විසින් නිවෙසේ සියලුම අස්සක්මුල්ලක් නැරම පීරා ඒ වන විට නිවෙසේ තිබූ සියලුම මුදල් සහ ස්වර්ණාභරණ සොයාගෙන තිබේ. අනතුරුව කෝටි දෙකකට ආසන්න මුදල් කන්දරාවක් සහ ස්වර්ණාභරණ තොගයක් නිවෙසේ තිබී සොයා ගැනීමට කොල්ලකරුවන්ට හැකි වී ඇති බවකි.

නිවෙසේ විනාඩි 45කට අධික වේලාවක් ගතකළ කොල්ලකරුවන් විසින් සේවකයන් සහ ව්‍යාපාරිකයා ඇතුළු පවුලේ සැම නිවෙසේ ඉහළ මහලේ කාමරයකට ඇතුළුකොට දොර අගුළුලා පැනගොස් තිබුණේ ත්‍රාසජනක චිත්‍රපට දසුනක් පා මහ දහවලේ නිවෙසක් කොල්ල කමිනි.

එලෙස පැන යද්දී කොල්ලකරුවෝ නිවෙසේ සීසීටීවී කැමරා පද්ධතියේ දත්ත ගබඩාව වන ඩී.වී.ආර්. යන්ත්‍රයද ගලවාගෙන යාමට තරම් සූක්ෂ්ම වී තිබේ. එහෙත් කොල්ලකරුවන්ට නොපෙනුණු නිවෙසේ වූ තවත් එවැනිම ඩී. වී. ආර්. යන්ත්‍රයක සීසීටීවී කැමරා දසුන් ගබඩා වී තිබිණි.

කොල්ලකරුවන් ගිය සැණින් කටාන පොලිසිය ඇමැතු ව්‍යාපාරිකයා සිදුවූ අකරතැබ්බය ගැන පොලිසියට පැවැසූහ. ඊට ක්ෂණිකව ක්‍රියාත්මක වූ කටාන පොලිස් ස්ථානාධිපති ඩිලාන් රාජපක්ෂ මහතා නිලධාරි කණ්ඩායමක් නිවෙසට යවද්දී ප්‍රදේශය බාර උසස් පොලිස් නිලධාරින්ද දැනුම්වත් කිරීමට කටයුතු කෙරිණි.

ඒ අනුව බස්නාහිර පළාත බාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සෘජු උපදෙස් මත බස්නාහිර උතුර දිසා බාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ මහතාගේද උපදෙස් මත මීගමුව කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සමන් සිගේරා විසින් අක්කර පනහේ මහා පරිමාණ කොල්ලය පිළිබඳව අවට සියලු පොලිස් ස්ථානද දැනුවත් කෙරිණි. අනතුරුව සියලුම පොලිස් ස්ථාන සහ ඒකක එක්ව කොල්ලකරුවන් අත්අඩංගුවට ගැනීමට පුළුල් මෙහෙයුමක් දියත් කෙරිණි.

එහිදී අවට සීසීටීවී දසුන් මගින් පොලිසිය අනාවරණය කරගෙන තිබුණේ කොල්ලකරුවන් නිල් පැහැති ඇල්ටෝ වර්ගයේ මෝටර් රථයකින් සහ යතුරුපැදියකින් කොල්ලයට පැමිණ ඇති බවයි. වැඩිදුරටත් විමර්ශනයේදී හෙළි වී තිබුණේ රථය වත්තල ප්‍රදේශයේ කුලී රථ ආයතනයකින් කුලියට ගෙන ඇති බවයි.

රථය ඔස්සේ සිදු කළ විමර්ශනවලදී රථයේ හිමිකරු වන ගම්පහ පුද්ගලයෙක් සමඟ මාවතගම, එප්පාවල සහ නිකවැරටිය ප්‍රදේශවල වුන් සැකකරුවන් සිවුදෙනෙකු අත්අඩංගුවට ගැනිණි.

අත්අඩංගුවට ගෙන සිටින සැකකරුවන් ඔස්සෙ පොලිසිය පුළුල්ව විමර්ශනය සිදු කරන්නෙ මෙකී සැකකරුවන් සංවිධානාත්මක අපරාධකරුවන් හෙවත් පාතාලයට සම්බන්ධද යන්නයි. එසේම ව්‍යාපාරිකයාගේ නිවෙසෙහි ව්‍යාපාර කටයුතුවලින් එදිනෙදා එක්රැස් වන මුදල් විශාල ප්‍රමාණයක් තිබෙන බවට කිසියම් පුද්ගලයකු දැන සිට කොල්ලකරුවන්ට තොරතුරු ලබාදී ඇතිද යන්නත් විමර්ශනය කෙරේ.

2018 ජුනි 24 වැනි දින මාතර නිලේබා ස්වර්ණාභරණ ආයතනය කොල්ලකෑ ආකාරයටම මහ දවාලේ සිදු වූ මෙකී කොල්ලයේ සියලු තතු පැය හතළිස් අටක් තුළ හෙළි කරගත් පොලිසියට තුති පුද කළ යුතුය.

● ජාලිය වීරක්කොඩි

මීතොටමුල්ල කුණු කන්ද නාය ගියේ 2017 අප්‍රේල් 14 වැනිදා ය. කුණු කන්දට යට වී 26 දෙනෙක් මිය ගියහ. තවත් 11 දෙනෙක් සොයා ගත නොහැකි සේ ඒ කුණු කන්ද යට වැළලුනහ. අද මීතොටමුල්ල උද්‍යාන හැදෙන්නේත් ඒ වැළලුණු මිනිසුන්ගේ ඇටකටු මතය. ඒ පුපුරා ගිය බේදවාචකය මේ රටේ මිනිසුන්ගේ ආකල්ප දෙදරවා දැම්මේය. මිනිස්සු ටොපි කොළයක් බිම දාන්න බිය වූහ.

සුද්දාගේ කුණු සුද්දාටම යවයි

රටකට වද්දගත යුතු නොවන අතිශය බිහිසුණු රසායනික ද්‍රව්‍ය සහ මිනිස් ශරීර කොටස් සහිත, කුණු හා අබලි ද්‍රව්‍ය සහිත ටොන් ගණනක කසළ සමඟ කසළ බහාලුම් 263ක් ලංකාවේ ප්‍රකට සමාගම් තුනක් විසින් එංගලන්තයේ සිට ලංකාවට ගෙන්වනු ලබන්නේ මේ වකවානුවේය. රටම කසළ කළමනාකරණය ගැන මරණයෙන් පාඩම් ඉගෙන ගෙන සිටි වකවානුවක, වර්ෂ 2017 සැප්තැම්බර් සිට වර්ෂ 2018 මාර්තු දක්වා කාලය තුළ එංගලන්තයේ සිට මේ කසළ ගෙන්වා තිබුණේ ලෝකය පිළිගත් සදාචාර එකඟතා මතු නොව, බාසල් සම්මුතියෙන් ආවරණය කෙරෙන නෛතික රාමුව උල්ලංඝණය කරමිනි.

දැන් මේ කතාව යළි සංවාදයට එන්නේ සාධනීය මුහුණුවරක් සහිතවය. අන්තරායකර ද්‍රව්‍ය නැව්ගත කිරීම පාලනය කරන ජාත්‍යන්තර බාසල් සම්මුතිය උල්ලංඝණය කරමින් වර්ෂ 2017 සැප්තැම්බර් සිට 2018 මාර්තු දක්වා කාලය තුළ එංගලන්තයේ සිට මෙරටට රැගෙන විත් තිබුණු විෂ සහිත අපද්‍රව්‍ය සහිත බහාලුම් 263 න් බහාලුම් 21ක් පසුගිය සෙනසුරාදා (19) සවස 5.15ට පමණ කොළඹ වරායෙන් යළිත් එංගලන්තය වෙත හරවා යැවීමට රජය කටයුතු කළේය.

හරවා යැවූ කසළ බහාලුම් 21 හා දැනට ඉතිරිව ඇති බහාලුම් 242 සම්බන්ධයෙන් වෙනම විමර්ශනයක් රේගු දෙපාර්තමේන්තුව විසින් අරඹා තිබේ. ප්‍රති නැව්ගත කළ බහාලුම් සම්බන්ධව ලබන මස 15 දා අධිකරණයට කරුණු වාර්තා කිරීමට නියමිතය. තවද අදාළ විමර්ශන අවසන් වූ පසු නීති විරෝධීව සායනික අපද්‍රව්‍ය සහ කසළ බහාලුම් 263 මෙරටට යොමු කළ මව් සමාගමෙන් මෙන්ම ඒවා භාරගෙන මෙරටට ගෙන්වූ සමාගම් තුනෙන් වන්දි ලබා ගැනීමට රේගු දෙපාර්තමේන්තුව පියවර ගනිමින් සිටී. ඒ සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට දෙරටේම නිලධාරීන් දැනුවත් කරන බවත් රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශකවරයා මාධ්‍යයට කීවේය.

සිද්ධිය සම්බන්ධව ලෝකයේ ප්‍රමුඛ පෙළේ විදෙස් මාධ්‍ය ගණනාවක් වාර්තා කර තිබිණි. එංගලන්ත පරිසර ඒජන්සිය උපුටා දැක්වූ විදෙස් වාර්තාවක් සඳහන් කළේ අදාළ සිද්ධිය සම්බන්ධව ශ්‍රී ලංකා බලධාරීන් සමඟ සමීපව කටයුතු කරන බවය. විධිමත් පරීක්ෂණයක් සඳහා එංගලන්ත පරිසර ඒජන්සිය ශ්‍රී ලංකාවෙන් වැඩිදුර තොරතුරු ඉල්ලා ඇති බව එහි වාර්තා වූයේය.

මෙම කසළ බහාලුම් තොගය සම්බන්ධයෙන් එංගලන්තයේ පරිසර, ආහාර සහ ග්‍රාමීය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මීට වසරකට පෙර විමර්ශනයක් ආරම්භ කළ බව බ්‍රිතාන්‍යයේ ටෙලිග්‍රාෆ් පුවත්පත් කලෙකට පෙර වාර්තා කර තිබිණි. වර්ෂ 2019 ජූලි මස 23 දා මේ සිද්ධිය සම්බන්ධව දීර්ඝ ලෙස වාර්තා කළ ඩේලි ටෙලිග්‍රාෆ් පුවත්පත මේ කුණු යවා ඇත්තේ ලංකාවේ දී ප්‍රතිචක්‍රීකරණය සඳහා බව කීවේය. ඒ වනවිට ලංකාවේ මිනිස්සු කුණු කඳුවලට යටවී මිය යමින් සිටියහ.

වැදගත් වූයේ ලංකාවේ රේගු දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය විමසමින් ඔවුන් ඉතා පුළුල් ලෙස තත්වය ලෝකය අභිමුව තැබීමය. එම කන්ටේනර් තුළ මිනිස් ශරීර කොටස් හමු වූ බවට ඔවුන් වාර්තා කළේය. අතිශය භයානක විෂ සහිත සායනික අපද්‍රව්‍ය තිබුනු බව වාර්තා කළේය.

ඒ වනවිට මෙම කන්ටේනර් බ්‍රිතාන්‍යයට යළි එවීමට ලංකා රජය කටයුතු කරමින් සිටින බවත් සිද්ධිය සම්බන්ධව බ්‍රිතාන්‍ය රජයත් පරීක්ෂණයක් ආරම්භ කර ඇති බවත් ඉන් කියැවිණි.

වර්ෂ 2017 දී ගෙන්වන ලද කන්ටේනර් 111ක් කොළඹ වරායේ තැන්පත් කර තිබුණු බවත්, එම අංගණයෙන් අධික දුර්ගන්ධයක් වහනය වීම සම්බන්ධව තොරතුරු සොයා යෑමේ දී මේ සායනික අපද්‍රව්‍ය සම්බන්ධ පුවත අනාවරණය වූ බවත් ටෙලිග්‍රාෆ් පුවත්පත අනාවරණය කර තිබිණි. ද ටෙලිග්‍රාෆ් කීවේ බ්‍රිතාන්‍ය මිනිස් ශරීර කොටස් මේම කන්ටේනර් තුළ තිබුණා නම් මේ සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ අර්බුදකයට මුහුණ දී සිටින බ්‍රිතාන්‍යය NHS රෝහල්වල අපද්‍රව්‍ය බවට විශ්වාස කළ හැකි බවය.

උපද්‍රවකාරී අපද්‍රව්‍ය දේශ සීමා හරහා ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම පාලනය කිරීම පිළිබඳ බාසල් සම්මුතිය බලගැන්වෙන්නෙ වර්ෂ 1989 මාර්තු මස 22 දිනය. එක්සත් ජාතීනගේ පරිසර සංවිධානය අනුබද්ධ ලොව අපද්‍රව්‍ය බැහැර කිරීමේ සම්බන්ධයෙන් වන මෙම සම්මුතියට ස්විස්ටර්ලන්තයේ දී රටවල් ගණනාවක් අත්සන් තැබුවේය.

එහිදී බැර ලෝහ සහිත අපද්‍රව්‍ය ඇතුළු අනෙකුත් අපද්‍රව්‍ය රටවල් අතර හුවමාරුවේදී එකඟතාවකට එළඹුණේය. සම්මුතියෙන් පෙර කී අපද්‍රව්‍ය රටකින් රටකට ප්‍රවාහනය කිරීම මුළුමනින්ම අත්හිටුවූයේය. බාසල් සම්මුතිය සඳහා අප අත්සන් තැබුවේ වර්ෂ 1992 දීය. එංගලන්තය අත්සන් කළේ වර්ෂ 1994 දීය.

පසුගිය වසරේ ජූලි මාසයේ දී බාසල් සම්මුතිය උල්ලංඝණය කර එංගලන්තයෙන් ආ මිශ්‍ර අපද්‍රව්‍ය සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය ජිනීවා හි පිහිටි කාර්යාලය වෙත ලිඛිතව පැමිණිල්ලක් කළේය. මේ අතර බ්‍රිතාන්‍ය රජය මෙම කසළ නැවත සිය රටට ගෙන්වා ගැනීම සම්බන්ධව රාජ්‍ය තාන්ත්‍රික කතිකාවක නිරත විය.

දීර්ඝ ක්‍රියාවලියකින් අනතුරුව කසළ කන්ටේනර් 21ක් ලංකාවෙන් යළි එංගලන්තය වෙත පිටත් කර යැවීමට හැකි විය. ශ්‍රී ලංකා රේගුව ප්‍රකාශ කළේ, 2017 දෙසැම්බර් වනවිට එංගලන්තයෙන් නීති විරෝධි ලෙස ලංකාවට එවන ලද අපද්‍රව්‍ය කන්ටේනර් 263 ක් ලංකාව තුළ තිබූ බවයි.

කෙසේවෙතත් පසුගිය දිනවල මහත් ආන්දෝලනයට ලක් වූ කසළ කන්ටේනර් 242 ට මෙම කන්ටේනර් 21 අයත් නොවන බව ශ්‍රී ලංකා රේගුව පැවසුවේ ය

එවකට පැවති පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධව තියුණු කතිකාවක් ඇති විය. විපක්ෂය විසින් රජය තියුණු ප්‍රශ්න කිරීම්වලට ලක් කළේය. එවකට මුදල් ඇමතිවරයා මේ සිද්ධිය සම්බන්ධ ආයතනවල නම් ගම් සහිතව දීර්ඝ විස්තරයක් පාර්ලිමේන්තුවේ දී හෙළි කළේය. වර්ෂ 2017 සැප්තැම්බර් සිට වර්ෂ 2018 මාර්තු 02 දක්වා කාලය තුළ අපද්‍රව්‍ය අඩංගු බහාලුම් 242ක් ලංකාවට ගෙනවිත් තිබුණු ආකාරය, ඉන් බහාලුම් 111ක් කොළඹ වරායේ රඳවා ඇති අයුරු, එම කුණු ආනයනකරුවන් තිදෙනා, ඔවුන් ගෙනා කුණු ප්‍රමාණ ගැන ඔහු පාර්ලිමේන්තුවට කීවේය.

ඒ හෙළිදරව් කිරීමට අනුව ඉන් එක් ආනයනකරුවෙක් කුණු බහාලුම් 65ක් ද අනෙක් ආනයන කරුවා 64ක් ද මේ රටට ගෙන්වා තිබිණි. ඉතිරි බහාලුම් 130 වරායෙනුත් නිදහස් කරගෙන ගොස් තිබිණි. ඒවා කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ එක්තරා ස්ථානයක තැන්පත් කර ඇතැයි වාර්තා විය.

වර්ෂ 2019 ජූලි මාසය වන විට මධ්‍යම පරිසර අධිකාරිය කටුනායක නිදහස් වෙළෙඳ කලාපයේ ගොඩගසා තිබූ අපද්‍රව්‍ය තොගය සොයා ගත්තේය. මෙම කුණු බහාලුම් කටුනායක තැන්පත් කරගත් ආයතනය වර්ෂ 2014 සිට ඒකාබද්ධ බාහිර සේවා මධ්‍යස්ථානයක් ලෙස කටුනායක අපනයන සැකසුම් කලාපය තුළ අන්තර් වෙළෙඳ කටයුතුවල නිරත වන බව ආයෝජන මණ්ඩලය කියා සිටියේය.

එංගලන්තයේ රෝහල්වලින් බැහැර කළ මෙට්ට, කුෂන් කැබලි, පාපිසි, අතුළු මෙට්‍රික් ටොන් 27685ක අපද්‍රව්‍ය එම බහාලුම් තුළ තිබිණි. එම කන්ටේනර් 130 වර්ෂ 2017 ඔක්තොම්බර් සිට වර්ෂ 2018 ජනවාරි දක්වා කාලය තුළ අවස්ථා 12කදී එංගලන්තයේ වෙන්ගාර්ඩ් ලිමිටඩ් නැමැති ආයතනයකින් මෙරටට ගෙන්වූ බව මධ්‍යම පරිසර අධිකාරිය කීවේය.

මේ කසළ බහාලුම් 130න් 29ක් මේ සමාගම විසින් ප්‍රති අපනයනය කර තිබිණි. දැන් වෙළෙඳ කලාපය තුළ තවත් බහාලුම් 101ක් ඉතිරි වී තිබේ. මෙම බහාලුම් හැකි ඉක්මනින් ප්‍රති අපනයන කරන මෙන් එවකට ආයෝජන මණ්ඩලය මෙම සමාගමට දැඩි ලෙස අවවාද කළේය. එහෙත් විවිධ හේතු දක්වමින් ඒ ප්‍රති අපනයනය ප්‍රමාද කරන බව ආයෝජන මණ්ඩලය එදා මාධ්‍යයට කීවේය.

එවකට රේගු සේවා සංගමයේ ලේකම් ජේ.ඒ. ගුණතිලක මාධ්‍ය සාකච්ඡාවකට සහභාගී වෙමින් ජාවාරමේ අශිෂ්ඨකම ගැන කීවේය. ඔහු පෙන්වා දුන්නේ මෙම අපද්‍රව්‍ය ගෙන එන ලද පුද්ගලයාට හෝ ආයතනයට එක බහාලුමක් සඳහා පවුම් ලක්ෂ 3ක් පමණ ලැබී ඇති ආකාරය විමර්ශනවලින් හෙළි වූ බවයි. වර්ෂ 2013 සිට මෙලෙස අපද්‍රව්‍ය ආනයන කර ඇති බවට තොරතුරු තමන්ට ඇති බවත්, මීට පෙර මෙලෙස ගෙන්වූ කන්ටේනර් 122ක් වරායෙන් පිට කර ඇති බවටත් ඔහු මාධ්‍යයට හෙළි කළේය.

මධ්‍යම පරිසර අධිකාරියේ උපද්‍රවකාරී අපද්‍රව්‍ය හා රසායනික අපද්‍රව්‍ය කළමනාකාර ඒකකයේ එවකට අධ්‍යක්ෂක අජිත් වීරසුන්දර කීවේ එළඹි සිහියෙන් විමසිය යුතු කතාවකි. ලෝක සම්මුතීන් හා සදාචාරයන් බිඳ දමා රටේ නීතියට එරෙහිව ගෙන්වන ලද මෙම කුණු තමන්ගේ ආයතනයෙන් ඉවත දමන කසළ සමඟ එක් කර කොළඹ ඇතුළු නගර සහා කසළ ඒකකයට එක් සමාගමක් විසින් භාර දී ඇති බව ඔහු කීවේය. මේ ගෙන්වා තිබූ ද්‍රව්‍ය අතර විකිරණශීලී හෝ අධි විෂ රසායන තිබුණා නම් මේ වනවිටත් රටට දෙවියන්ගේ පිහිටය.

ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති හේතුවෙන් මෙලෙස අවසරයකින් තොරව කසළ කන්ටේනර් වැනි දේ ගෙන්වා ගැනීමට අදාළ සමාගම්වලට හැකියාව ලැබී තිබුණු බව අනාවරණය විය.

රටක සාධනීය තත්වයන් වැඩි දියුණු කිරීම සඳහා පනවන නීති රෙගුලාසි අවභාවිත කිරීම නෛතික ආරවුලකට වඩා පුද්ගලයන්ගේ ආකල්ප හා චර්යා පිළිබඳ ප්‍රශ්නයකි. මේ අර්ධ මනුෂ්‍යයන් උක්ත ජාවාරම කර තිබුණේ 2013-07-30 දිනැති අංක 1818-30 දරන ගැසට් පත්‍රය තුළ මුවා වෙමිනි.

වර්ෂ 2013-07-11 දින නිකුත් කරන ලද අංක 1818-30 දරන ගැසට් නිවේදනය මගින් රේගු ආඥා පනත, විනිමය පාලන පනත, ආනයන අපනයන පාලන පනත ආදියෙහි පාලනයෙන් තොරව භාණ්ඩ ආනයන හා අපනයන කිරීමට අවශ්‍ය නීතිමය පසුබිම ආයෝජකයන්ට ලැබිණි. මෙය නීත්‍යානුකූල වෙළෙඳාමට ලබා දිය හැකි ප්‍රායෝගික ප්‍රතිපාදනයකි. ඉන් කටුනායක නිදහස් වෙළඳ කලාපය, හම්බන්තොට වරාය හා ගුවන්තොටුපළ පිහටුවන "Hub" තුළට නිදහසේ භාණ්ඩ අපනයනය කිරීමට මේමගින් ඉඩකඩ විවර වූයේය.

එහෙත් රටට මහත් ව්‍යසනයක් වූ අපද්‍රව්‍ය අඩංගු බහාලූම් මෙරටට ගෙන්වා තිබුණේ මෙම ගැසට් නිවේදනයේ ප්‍රතිපාදන යොදාගනිමිනි. බහාලූම් 130ක් වරායෙන් මුදවාගෙන කටුනායක තැන්පත් කර තිබුණේ එවැනි "Hub" එකක් තුළය.

මෙම අප ද්‍රව්‍ය අඩංගු බහාලූම්වලට අමතරව මීට ඉහත දී වියට්නාමයෙන් ගම්මිරිස් ගෙන්වා ඒවා ලංකාවේ ගම්මිරිස් ලෙස ප්‍රති අපනයනය කළ ජාවාරම්කරුවන් රටේ ගම්මිරිස් වෙළඳපළ විනාශකරන ලද්දේත් මෙම ගැසට් පත්‍රයේ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් බව රේගු දෙපාර්තමේන්තුව එදා කීවේය.

කෙසේ වෙතත් අප තේරුම් ගත යුතු යථාර්ථයක් තිබේ. ලෝක සම්මුතීන් වලංගු වන්නේ සදාචාර සම්පන්න මිනිස්සුන්ටය. එංගලන්තයටත් ලංකාවටත් ඒ සත්‍යය වලංගුය. අශිෂ්ට මිනිස්සුන්ගේ අශික්ෂිත ව්‍යාපාර අවසානයේ විනාශ කරන්නේ ලෝකයේ පැවැත්මය.

ළමා දිනයේ රශ්මියෙන් වැසී

වැඩිහිටි ලෝකය අහිමි නොවන්නට නම්....

● හර්ෂා සුගතදාස

රාගල ඩෙල්මාර් වතුයායේ පදිංචි වී සිටි වෙල්ලයන් කරුපයියාගේ නිවසේ ඉදිරිපස දොරටුව විවෘත වී තිබීම සාමාන්‍ය දසුනක් වුව ද පසුගිය 22 වැනිදා එය විවෘත වූයේ ම නැත. 70 හැවිරිදි කරුපයියාත් තම බිරිය වන 65 හැවිරිදි සීතා ලෙච්චමිත් පමණක් මේ නිවසේ වාසය කරන බැවින් වයස්ගත ඔවුන් දෙදෙනා ගැන විමසිලිමත් වීම ඔවුන්ගේ අසල්වාසීන්ගේ සිරිතකි. නිවසේ දොර ජනෙල් විවෘත නොවීම ගැන සැක සිතූ ඔවුන් රාගල පොලිසියට එය දැනුම් දුන්නේ වෙන කළ යුතු කිසිවක් නැති බැවිනි. රාගල පොලිසිය පැමිණ නිවසේ දොර කඩා විවෘත කළ විට දක්නට ලැබුණේ මිය ගොස් සිටි කරුපයියා සහ ලෙච්චමි යුවළය. සීතා ලෙච්චමි දීර්ඝ කාලයක් රෝගාතුර වී සිටි අතර ඇයට ඇප උපස්ථාන කරමින් ඇයව රැක බලාගෙන ඇත්තේ කරුපයියා ය. ගිලන් වී සිටි ඈ මිය ගිය විට කරුපයියා වස බී සිය දිවි හානි කරගෙන තිබෙන්නේ පාළුව, තනිකම ඉවසා ගත නොහැකි නිසා විය යුතුය. ඔවුන්ගේ එකම පුතා විදෙස් රටක සේවය කරයි. දරුවන් විදෙස්ගත වන විට වියපත් මවුපියන් නිවෙස් තුළ හුදකලා වීමෙන් සිදුවන අනුවේදනීය කතාවක් ලෙස මෙය ගෙනහැර දැක්විය හැකි ය.

වත්මන් සමාජයේ නිවෙස් තුළ තනිවී සිටින වැඩිහිටි පිරිස බොහෝ වෙති. බොහෝ දෙනකු තම මවුපියන් උපරිම අන්දමින් රැකබලා ගත්ත ද මවුපියන්ව වැඩිහිටි නිවාසවල තබන දරුවෝ ද සිටිති. තවත් සමහරු මවුපියන් මහමඟ දමා යති. අද වනවිට රැකියා නොකරන වැඩිහිටි දරුවන් දක්නට නැති තරම් ය. ඔවුන්ට රැකියාවෙන් ඉවත් වී මවුපියන් රැක බලාගත නොහැකි ය. තත්ත්වය දරුණු වන්නේ දරුවන් විදෙස්ගත වූ විට ය. අවසානයේ සිදුවන්නේ වැඩිහිටියන් අසරණවීමය. ඔවුන් හුදකලා වීමය. වර්තමානයේ බොහෝ දරුවන්ට සිය මවුපියන්ව රැකබලා ගැනීමට අවශ්‍ය වුවත් එය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබෙන්නේ පවතින තරගකාරී ජීවන රටාව හේතුවෙනි. වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා සේවක සේවිකාවන් තබා ගැනීමට ද ප්‍රමාණවත් ආදායමක් නොමැති වීම නිසා වැඩිහිටි දරුවෝ අසරණ වෙති. ඇතැම්විට සේවක සේවිකාවන් සොයා ගැනීමත් උග්‍ර ප්‍රශ්නයකි. කුඩා දරුවන් රැකබලා ගැනීම සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන තිබුණද වැඩිහිටියන් උදෙසා එවැනි නිවහන් ප්‍රචලිත වී නොතිබීම හේතුවෙන් අද වැඩිහිටියන් නිවෙස් තුළ කාලය ගත කරන්නේ හුදකලාවමය. ඒ නිසාම වර්තමාන සමාජයේ වැඩිහිටි පිරිස ගැටලු රැසකට මුහුණදී සිටිති.

කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජා විද්‍යා දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී ආචාර්ය මනෝරි වීරතුංග

අපේ රටේ වැඩිහිටියන් මුහුණදී සිටින ගැටලු පිළිබඳව සාකච්ඡා කිරීමට තීරණය කළේ ඔක්තෝබර් 01 වැනි දිනට යෙදී තිබුණු ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිති කරගනිමිනි.

"අද ලෝකයේම වැඩිහිටි ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වී තිබෙනවා. ඒකට හේතු වෙලා තිබෙන්නේ සෞඛ්‍ය අංශය වැඩිදියුණු වීමෙන් ආයු අපේක්ෂණය ඉහළ යෑම. වැඩිහිටියන් වෘද්ධභාවයට පත්වීමත් සමඟ සෞඛ්‍යමය, ආර්ථිකමය සහ සමාජමය ගැටලු රාශියක් මතු වෙනවා. ලෝකයේ වැඩිහිටි ජනගහනයේ ගැටලු ගැන කතා කිරීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ සංවිධානය 1990 වර්ෂයේදී වැඩිහිටියන් වෙනුවෙන් ඔක්තෝබර් 01 වැනිදා වෙන් කර තිබෙනවා" යනුවෙන් සඳහන් කළේ කොළඹ විශ්ව විද්‍යාලයේ ප්‍රජා විද්‍යා දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී ආචාර්ය මනෝරි වීරතුංගය.

සංවර්ධිත රටවල්වල වැඩිහිටියන් ලෙස සලකනු ලබන්නේ වයස අවුරුදු 65 ට වැඩි පිරිසය. එහෙත් සංවර්ධනය වෙමින් පවතින රටවල්වල වැඩිහිටි අය ලෙස සැලකෙන්නේ වයස අවු. 60 ට වැඩි පිරිසය. 2012 වර්ෂයේ මෙරට සිදු කළ ජන හා නිවාස සංගණන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය නියෝජනය කරන්නේ මුළු ජනගහනයෙන් 1/8 කි. එය 12.4% කි. වර්ෂ 2050 වනවිට ශ්‍රී ලංකාවේ වයස අවු. 60 ට වැඩි පුද්ගලයින් මුළු ජනගහනයෙන් 30% කට ආසන්න වනු ඇතැයි තක්සේරු කර ඇත. ඒ අනුව 5 දෙනෙකුගෙන් 1 ක් අයෙක් වැඩිහිටියෙකි.

රටේ ජනගහනය වයස් මට්ටම් අනුව කාණ්ඩ 3 කට බෙදා දැක්විය හැකි ය. ඒ 0 - අවු. 14, අවු. 15 - අවු. 59 සහ අවු. 60 ට වැඩි යනුවෙනි. එයින් මුල් කාණ්ඩය ළමා යනුවෙන් ද දෙවැනි කාණ්ඩය ශ්‍රම බළකාය යනුවෙන් ද තෙවැනි කාණ්ඩය වියපත් යනුවෙන් ද හැඳින්වේ. වියපත් කාණ්ඩය ද නැවතත් කොටස් 3 කට බෙදාවෙන් කර තිබේ. එය මතු දැක්වේ.

සැඳෑ සමය ගත කරන්න තරුණ වියේ සිට සූදානම් විය යුතුයි

I. වයස අවු. 60 - අවු. 70 (තරුණ වැඩිහිටි කණ්ඩායම)

II. වයස අවු. 70 - අවු. 80 (වැඩිහිටි වැඩිහිටි කණ්ඩායම)

III. වයස අවු. 80 ට වැඩි (වයෝවෘද්ධ වැඩිහිටි කණ්ඩායම)

ලංකාවේ වැඩිහිටියන්ගෙන් 60% අයත් වන්නේ වයස අවු. 60 - අවු. 70 කාණ්ඩයටය. සැබැවින් ම ඔවුන් විශ්‍රාම ගැන්වූවද වැඩ කළ හැකි පිරිසකි. ඔවුන්ව රටේ ආර්ථිකයට ඵලදායි ආකාරයට යොදා ගත හැකි ය. රටේ ශ්‍රම බළකායට ඇතුළත් කළ හැකි ය. ඔවුන්ව 'රිදී ආර්ථිකය' ලෙස නම් කර තිබෙන්නේ එබැවිනි.

"වයස අවු. 60 වුණ විට ඔවුන්ව විශ්‍රාම යැවීමේ ඒ අය ගෙවල්වල අලස සුවයෙන් ඉන්නවා. හැබැයි ඒ අයට වැඩ කරන්න පුළුවන්. ගෙදර නිදාගෙන රූපවාහිනිය බල බලා සිටින විට ඔවුන් රෝගීන් වෙන්න පුළුවන්.

ඔවුන්ගේ ශරීර ක්‍රියාකාරිත්වය අඩු වෙනවා. අන් අය සමඟ සන්නිවේදනය අඩු වෙනවා. ආර්ථික ගැටලු ඇති වෙනවා. ඇතැම් විට මානසික ගැටලු ඇති වෙනවා. ඒ නිසා හැම කෙනෙකුගේම පූර්ව සූදානමක් තිබෙන්න ඕනෑ. විශ්‍රාම ගිය විට ඊට පසු කාලය ගත කිරීම සම්බන්ධයෙන් වෙනත් රැකියාවක යෙදෙනවාද ව්‍යාපාරයක, ස්වයංරැකියාවක නිරත වෙනවාද කියලා ඒ අය සැලසුම් කිරීම ඉතාමත් වැදගත්. අද හුඟාක් දෙමවුපියන් ප්‍රධාන තැන දෙන්නේ දරුවන්ගේ අධ්‍යාපනයට. තමුන් හම්බ කරන මුළු සේසතම සමහර වෙලාවට අර්ථසාධක මුදල් පවා දරුවන්ගේ උසස් අධ්‍යාපනයට යොදවනවා. අවසානයේදී මවුපියන් වියපත් වනවිට කායික හා මානසික වශයෙන් විතරක් නෙමෙයි. ඔවුන් ආර්ථික වශයෙනුත් දුර්වල වෙලා. මේ අසරණවීම වළක්වා ගැනීමට නම් ආර්ථික වශයෙන් ශක්තිමත් විය යුතුයි. ඒ වගේ ම ව්‍යායාම කිරීම, ගෙදර දොර වැඩකටයුතුවල යෙදීම, අධ්‍යාත්මික කටයුතුවල යෙදීම සිදු කළ යුතුයි. අපි කාටවත් වයසට යෑම වළක්වා ගන්න බැහැ. ඒත් විශ්‍රාම දිවියට පූර්ව සූදානමකින් සැලසුම් කිරීමෙන් ආර්ථික, කායික හා මානසික වශයෙන් ශක්තිමත් වෙන්න පුළුවන්" යනුවෙන් තරුණ, වැඩිහිටි හා ආබාධ ඒකකයේ ප්‍රජා වෛද්‍ය විශේෂඥ ශිරෝමී මාදුවගේ විස්තර කළාය.

වර්තමානයේ බොහෝ වැඩිහිටියන් විශ්‍රාම ගිය මොහොතේ සිට නියැළෙන ප්‍රධාන රාජකාරිය වී තිබෙන්නේ දරුවන්ගේ දරුවන් හදා වඩා ගැනීමය. අද වියපත් වැඩිහිටියෝ මුනුපුරු මිනිපිරියන් සමඟ පෙර පාසල් යති. ටියුෂන් පන්ති යති. නැතහොත් පිහිනුම් පන්ති හෝ නර්තන පන්ති යති. මෙම වැඩිහිටියන්ට බණක් භාවනාවක් කිරීම තබා සායනයකට යෑමට, යහළුවන් ඇසුරු කිරීමට කාලයක් නැත. සමහර විට සැරයටියෙන් යනෙන තුරු සංසාරේ එක්ව වාසය කරන්නට ප්‍රාර්ථනා පොදි බැඳගෙන ආ මව සහ පියා දරුවන් දෙදෙනකුගේ නිවෙස්වල මුනුපුරු මිනිපිරියන් රැක බලා ගනිමින් සැඳෑ සමය දෙපසට වී ගත කරන අවස්ථා ද ඇත. මව කොළඹ නිවසකය. පියා මහනුවර නිවසකය. වියපත් මවුපියන් දෙපසට වීමෙන් ඔවුන්ගේ මානසික තෘප්තිය, බෙදා හදා ගැනීම අහිමි විය හැකි ය.

ජීවිතයට අවශ්‍ය වන්නේ ආහාර පාන, ඖෂධ සහ ඇඳුම් පැලඳුම් පමණක් නොවන බව දරුවන් ද අවබෝධ කර ගත යුතු ය.

"අපේ රටේ ඉස්සර තමයි විස්තෘත පවුල් තිබුණේ. අනික ඉස්සර ගෙදර පවුල් කීපයක් ජීවත්වන විට ගෙදර දොර බලාගෙන කවුරු හරි හිටියා. දැන් විස්තෘත පවුල් වෙනුවට න්‍යෂ්ටික පවුල් ජීවත්වන නිසා මවුපියන් වියපත් වුණාම ඔවුන් රැක බලාගන්න කෙනෙකු ගෙදර නැහැ. සමහර වෙලාවට අද කාලයේත් මව සහ පියා, දරුවන්, දරුවන්ගේ දරුවන් ආදී වශයෙන් ජීවත් වන විස්තෘත පවුල් දකින්න ලැබෙනවා. හැබැයි එතන තියෙන්නේ විස්තෘත පවුලක් නෙමෙයි. න්‍යෂ්ටික පවුල් දෙකක්. අම්මා තාත්තා තනිවෙලා. වැඩිහිටි දරුවන් ඔවුන්ගේ දරුවන් එක්ක වෙනම පවුලක් වෙලා. මේ තත්ත්වය නැති විය යුතුයි. සතුටු

අවු: 60 - 70 අතර පිරිස රිදී ආර්ථිකය ලෙස ශ්‍රම බළකායට ඇතුළත් විය යුතුයි.

පවුලක් කියන්නේ මවුපියන් සහ දරුවන් විතරක් සිටින පවුලට නොවෙයි. ඒ පවුලට ආච්චි සහ සීයා එකතු වෙන්න ඕනෑ. වැඩිහිටි දරුවෝ මේ ගැන මීට වඩා බුද්ධිමත්ව හිතන්න ඕනෑ. හැබැයි අපේ වියපත් වැඩිහිටියොත් මීට වඩා නම්‍යශීලී වීම නුගක් වටිනවා. මොකද ඒ අය හිතනවා එයාලා වැඩිහිටියන් නිසා එයාලාගේ අණට අනිත් අය යටත් විය යුතුයි කියලා. කාලයෙන් කාලයට සිද්ධවෙන වෙනස ඒ අය තේරුම් ගන්නේ නැතිව මුනුපුරු මිනිපිරියන් එක්ක ගැටුම් ඇති කර ගන්නවා. ජීවිතයේ අවධි ගොඩාක් තියෙනවා. වැඩිහිටියන් අත්හැරීම් අවධියට ඇවිත් තිබෙන බව අවබෝධ කර ගැනීම ඉතාමත් වැදගත්. ඒ අය අවබෝධයෙන් බුද්ධිමත්ව නම්‍යශීලීව කටයුතු කරනවා නම් දරු මුනුපුරන් එක්ක සතුටින් ජීවත් වෙන්න පුළුවනි. හැම වයස් කාණ්ඩයකම ආකල්පමය වෙනසක් සිදු විය යුතුයි" යනුවෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජා විද්‍යා දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී ආචාර්ය මනෝරි වීරතුංග පැවසුවේ පරම්පරා ගැටුම් සමථයකට පත්කර ගත යුතු ආකාරය පැහැදිලි කරමිනි.

ඇ පවසන ආකාරයට රටේ වැඩිහිටි ජනගහනය ශීඝ්‍රයෙන් ඉහළ යෑම රටකට හිතකර නැත. මෙහි ගැටලුව ඇතිවන්නේ වැඩිහිටියන්ගේ ආයු අපේක්ෂණය ඉහළ යෑම නිසා නොවේ. රටේ උපත් සංඛ්‍යාව අඩු වූ නිසා ය. මේ වනවිට බොහෝ පවුල්වල දරුවන් සිටින්නේ එක් අයකු හෝ දෙදෙනකු පමණි. ඊට හේතු වී තිබෙන්නේ වත්මන් වැඩිහිටි පරම්පරාව ගුණාත්මක දරුවකු බිහි කිරීමට උත්සුක වීමය. ඒ සඳහා ඔවුහු දරුවන්ට ඉහළම අධ්‍යාපනයක් ලබාදීමට උනන්දු වෙති. අද අපේ රටේ අධ්‍යාපනය සහ සෞඛ්‍ය යන අංශ ද්විත්වය ඉතා හොඳින් වර්ධනය වී තිබුණ ද ඊට සාපේක්ෂව ආර්ථික අංශයෙන් වර්ධනය නොවීම හේතුවෙන් බොහෝ දෙනකු දරු උපත් අඩු කරන බව ආචාර්ය මනෝරි වීරතුංග සඳහන් කළේ ජනගහනය සම්බන්ධයෙන් ඈ සිදු කළ විද්‍යාත්මක විශ්ලේෂණවල තොරතුරු මූලාශ්‍ර ඇසුරෙනි. ළමා ජනගහනය අඩු වීමත් වැඩිහිටි ජනගහනය වැඩි වීමත් ඈ හඳුන්වන්නේ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය යනුවෙනි. වැඩිහිටියන්ගේ සංඛ්‍යාව ඉහළ යන විට රටක යැපුම් අනුපාතය ඉහළ යනු ඇත. රාජ්‍ය වියදම් ඉහළ යනු ඇත. ළමා හා තරුණ ජනගහනය අඩුවීමත්

සමඟ රටේ ශ්‍රම වෙළෙඳපොළ පහත වැටෙන අතර රටේ බදු ආදායම ද පහත වැටෙනු ඇත. මේ අනුව වැඩිහිටි ජනගහනය රටකට බරක් නොවී රැක බලා ගැනීමේ ජාතික අවශ්‍යතාව මතු වී තිබේ.

වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් උදෙසා කටයුතු කිරීමේ අරමුණින් වැඩිහිටි මහ ලේකම් කාර්යාලයක් ස්ථාපිත කර සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම නිලධාරීන් පත්කර සිටින්නේ දිවයින පුරා විසිරී සිටින වැඩිහිටියන් ගැන සොයා බැලීමටය. වැඩිහිටි සමිති පිහිටුවා ඔවුන් ඒකරාශී කිරීම, ඔවුන්ට දීමනාවක් ලබාදීම, වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කර ඊට වරප්‍රසාද ලබාදීමට කටයුතු කිරීම, අසරණ වැඩිහිටියන් වෙනුවෙන් පවත්වාගෙන යන වැඩිහිටි නිවාස අධීක්ෂණය කිරීම, වැඩිහිටි දිවා මධ්‍යස්ථාන ඇති කිරීම වැනි කාර්යයන් රැසක් ඉටු කරන්නේ වැඩිහිටි මහලේකම් කාර්යාලයෙනි.

තරුණ, වැඩිහිටි හා ආබාධ ඒකකයේ ප්‍රජා විශේෂඥ වෛද්‍ය ශිරෝමී මාදුවගේ

ජාත්‍යන්තර වැඩිහිටි දිනය නිමිත්තෙන් උත්සව සංවිධානය කර ඔවුන්ට උපහාර පිදීමත් වැඩිහිටියන්ගේ ගායන, නර්තන වැනි හැකියාවන් ඔප නැංවීමට අවස්ථා ලබාදීමත් අගය කළ යුතුය. එහෙත් වැඩිහිටි ජනගහනය ගැන ඉන් ඔබ්බට සිතා ජාතික ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීම අද රටේ කාලීන අවශ්‍යතාවක් වී තිබේ.

අතටම හසු කරගත් කෝටි හයේ වාලම්පුරි ජාවාරම

● ට්‍රයිටෙන් වර්ගයේ වාලම්පුරි 02ක් ඇති බවට පොලිසියට ඔත්තුවක්

● ලලිත් චාමින්ද - ගාල්ල

වාලම්පුරි ගැන අපි අසා ඇත්තෙමු. වාලම්පුරියක් නිවසේ හෝ ව්‍යාපාරික ස්ථානයේ තැබීමෙන් එම ස්ථානයට යස ඉසුරු හා වාසනාව කැන්දාගෙන එන බව අපේ ඇත්තන් අතර මතයක් පවතී. ඒ විතරක් නොව ඇතමුන් විශ්වාස කරන්නේ වාලම්පුරියක් තිබීමෙන් යස ඉසුරු පමණක් නොව තමන්ට සිතූ සිතූ සැපසම්පත් ලැබෙන බවය. හක්බෙල්ලන් විශේෂයන් වන වාලම්පුරි වර්ග රැසකින් සමන්විත වේ. කොටින්ම කිවහොත් මහ මුහුදේ රජ්ජුරුවෝ වන්නේ වාලම්පුරියයි.

වාලම්පුරි කෝටිපති ව්‍යාපාරිකයන් අතර ඉතා ජනප්‍රියත්වයට පත්ව තිබේ. වාලම්පුරි ජාවාරමක්ද ක්‍රියාත්මක වන අතර එම ජාවාරම ක්‍රියාත්මක වන්නේ ඉතා සුක්ෂම අයුරිනි. මෙය ක්‍රියාත්මක වන්නේ ජාලයක් ලෙසිනි. වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥාපනතේ 31 වගන්තියට අනුව වාලම්පුරි වර්ග 30ක් ඒවායේ සජීවී හෝ අජීවී කොටස් කිසිවක් ඇල්ලීම, එක්රැස් කිරීම, ළඟ තබා ගැනීම, ප්‍රවාහනය මෙන්ම අලෙවියද සපුරා තහනම් වේ. අපි මේ කියන්නට යන්නේ කෝටි 06කට අලෙවි කිරීමට සූදානම් වූ ට්‍රයිටෙන් වර්ගයේ වාලම්පුරි 02ක තොරතුරු අනාවරණය කරගත් ජාවාරම ගැනය.

වාලම්පුරි 02ක් විකිණීමට තැත් කළ සැකකරුවන් සිව් දෙනෙකු කළුතර විශේෂ කාර්ය බළකා කඳවුරේ නිලධාරීන් විසින් ඉමඳුව කෝදාගොඩ ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගනු ලැබීය.

ජාවාරම්කරුවන් කොටුකරගැනීමේ මෙහෙයුම දියත්වන්නේ පොලීසියේ අනුදැනුමෙනි. මෙකී මෙහෙයුමේ මහ මොළකරු නොඑසේ නම් උපාය දූතයාගේ චරිතයට රඟපෑවේ පොලිස් පරීක්ෂක අංජනය. වාලම්පුරි ජාවාරම් ගැන පොලිස් පරීක්ෂක අංජන නිරතුරුව සෝදිසියෙන් සිටියේය. ඔහුට සිය පුද්ගලික ඔත්තුකරුවන් මගින් මේ ගැන තොරතුරු රැසක් ලැබී තිබුණි. වාලම්පුරි අලෙවි කිරීමේ ඇත්තේ එක්තරා ජාලයකි. මේ අතරතුර එම ජාලයේ අයකු දැනහැඳින ගැනීමට පොලිස් පරීක්ෂක අංජනට හැකි විය. පොලිස් පරීක්ෂක අංජනට වාලම්පුරි 02ක ඡායාරූප දෙකක් සිය ජංගම දුරකතනයට ඔහුගෙන් ලැබී තිබුණි. ඔහු හැටන් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. අංජන උපාය දූතයකු ලෙස ඔහුත් සමඟ ගනුදෙනු කළේය. මෙකී පුද්ගලයා බණදහම් දන්නා ආගමට ළැදි අයෙකි. හේ මෙකී ජාවාරම කරගෙන ගියේ ධර්මයෙනි. කොටින්ම කිවහොත් ආගමට මුවාවීගෙනය.

ජාවාරම පිටුපස වැඩ තහනමකට ලක්වූ පාසල් ගුරුවරයෙක් හා ගුවන් හමුදාව හැරගොස් සිටින සෙබළෙක්

"මහත්තයා වමට කැරකුණු වාලම්පුරියක් තියෙනවා රුපියල් කෝටි හතර හමාරක් වෙනවා. අනිත් වාලම්පුරිය කෝටි එකහමාරකට දෙන්න පුළුවන්" ජාවාම්කරු කීවේය. "නැහැ මට අවශ්‍ය කෝටි පහමාරක පමණ වටිනා වාලම්පුරියක් උපාය දූතයාගේ චරිතයට පණ දෙන පොලිස් පරීක්ෂක අංජන කිවේය. ඔහු එසේ කියමින් මෙකී ජාවාරම්කරු සමඟ විශ්වාසය ගොඩනගා ගත්තේය..

පොලිස් පරීක්ෂක අංජන විසින් සැලසුම් කළ මෙහෙයුම ටක්කයට ක්‍රියාත්මක වී තිබුණි. පොලිස් විශේෂ කාර්ය බළකායේ නිලධාරීන් පැමිණ ප්‍රධාන ජාවාරම්කරු හා අනික් සැකකරුවන් අත්අඩංගුවට ගන්නා විට තමන් උගුලකට හසුවී ඇති බව වාලම්පුරි ජාවාරමේ මහ මොළකරුට අවබෝධ වන්නට වැඩිවෙලාවක් ගත නොවීය. තමන් සමග දින ගණනාවක් තිස්සේ මෙම වාලම්පුරි විකිණීමේ ගනුදෙනුව ගැන කතා කොට ඇත්තේ පොලිස් විශේෂ කාර්ය බලකායේ පොලිස් පරීක්ෂකයකු බවට දැන ගත්තේ ඔවුන් පොලිස් අත්අඩංගුවට පත්වීමත් සමඟය. අත්අඩංගුවට ගත් සැකකරුවන් අතර වැඩතහනමකට ලක්වූ පාසල් ගුරුවරයකු, ගුවන් හමුදාව හැරගොස් සිටින සෙබළකු ද සිටින බව පොලිසිය පවසයි.

විශේෂ කාර්ය බළකයේ අණ දෙන නිලධාරි නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දරගේ උපදෙස් මත කළුතර පොලිස් විශේෂ කාර්ය බළකා කඳවුරේ ප්‍රධාන පොලිස් පරීක්ෂක දයාරත්න, ඉමඳුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක උපුල්කුමාර, පො. පො. අංජන, පොලිස් කොස්තාපල්වරුන් වන 85517 දිසානායක. 86975 අත්තානයක 81379 සම්පත් හා 35615 ජයරත්න යන නිලධාරීන් විසින් වැටලීම කරනු ලැබීය.

පෞරාණික වටිනාකමින් යුතු වාලම්පුරි 02ක් ළඟ තබාගෙන විකිණීමට තැත් කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ සැකකරුවන් සිව් දෙනා ගාල්ල වැඩ බලන මහෙස්ත්‍රාත් සෝමසිරි උඩුවැල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඔක්තෝබර් 06 වැනි දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස වැඩබලන මහේස්ත්‍රාත්වරයා නියෝග කළේය.

බතික් වලින් රට හැඩ කරන දිරිය මිනිසුන්

● **නිශානී හේරත් බන්නැහැක**

තම ආදරය දිනූ තැනැත්තාට ආදරයේ සංකේතයක් ලෙස මුලින්ම තෑගි කිරීම සඳහා නිමැවුණු බතික් සළු පිළි චීන ළඳුන්ගේ සුවිශේෂ නිර්මාණයකි. ගිනිකොන චීනයේ වුහාන් ප්‍රාන්තයේ ජීවත්වන සුදු ජාතික කතුන් බතික් කලාවේ නිපුණයෝය. වයස අවු: 7 - 8 තරම් කුඩා වියේ සිට ඔවුන් තම මවගෙන් හෝ මිත්තණියගෙන් බතික් කලාව උගනී. මියාඕ හා ෂුයිවල කාන්තාවෝ රවුම් හැඩයේ සියුම් බතික් මෝස්තරයකින් ඇඳුම්වල කොලරය හැඩ කරති. ඒ පසුපස රසවත් කතාවකි.

තරුණ මියාඕ ළඳක් රෝගාතුර වූවාය. ඇය සුවකරගත නොහැකි බව කියැවිණි. එහෙත් ඇයගේ මව ඉතා සියුම් පාසි වර්ගයක් මඟින් ඇව සුවපත් කළ අතර ඒ රෝගය සුව කළ පැළෑටි වර්ගය කෙරේ දැක්වූ භක්තියෙන් ඇය පැළෑටි මෝස්තරය තම ඇඳුමේ පින්තාරු කරගත් බවත් ඉන්පසු එය එම ප්‍රදේශයට උරුම වූ බතික් මෝස්තරයක් වූ බවත් ජනප්‍රවාදයේ එයි.

මීට වසර 400 පෙර ශ්‍රී වික්‍රම රාජසිංහ, රාජාධිරාජසිංහ යන රජවරු තම රජ ඇඳුම් සඳහා මෙම බතික් කලාව මුලින්ම යොදා ගත් බවට හෙළ වංශ කතාවේ සඳහන්ය. ලොවට බතික් හඳුන්වා දුන්නේ ඉන්දුනීසියානුවන් විසිනි. එවකට ප්‍රාථමික මට්ටමේ කලාවක් වූ නිසා වර්ණ සාදා ගත්තේ ගස්වැල්වල පොතු හා සාරය යොදා ගනිමිනි.

පසුගිය සියවසෙහි ඉන්දුනීසියානුවන් මඟින් බතික් ලෝකයට හඳුන්වා දුණි. ලංකාවට බතික් කලාව හඳුන්වා දුන්නේ ප්‍රේමකුමාර එපිටවෙලයන්ගේ බිරිය සෝමා උඩබාගේ විසිනි. ඒ වයිති නමින් රෙදි ඉන්දියාවෙන් ගෙන්වමින් තම සැමියාගේ මුද්‍රා නාටකයක් සඳහා ඇඳුම් නිර්මාණය කරමිනි.

ඉන්දුනීසියාව, ඉන්දියාව, චීනය, මැලේසියාව වැනි රටවල බතික් සායම් කිරීමේ කලාව අතීතයේ සිට පැවති බව සද්ධර්මාලංකාරයේ පවා සඳහන්ය. බතික් නිර්මාණ ශිල්පී හා චිත්‍රපට නිෂ්පාදක බුද්ධි කීර්තිසේන ලංකාවේ බතික් ප්‍රචලිත කිරීමට 1969 ඉවහල් වූ අතර 1973 දී දේශීයව බතික් ව්‍යාප්තව පැවතුණි. දේශීය බතික් කලාවට කලාත්මක වූත් නිර්මාණාත්මක වූත්, සෞන්දර්යාත්මක වූත් රිද්මයක් ගෙන දුන් කලාකරුවෙක් ලෙස නැසීගිය විපුල ධර්මවර්ධනයන් හැඳින්විය හැකිය. සෝමබන්දුලයන් ද එසේය.

කිතු චරිතය බතික් ප්‍රදර්ශනයක් ලංකාවේ පළමුවරට ඉදිරිපත් කළේ රත්මලානේ දේවනාත් පීරිස්ය. ඒ 1998 දීය. සුමිත්ත කුලරත්නයන් විසින්. 1980 විදේශීය බතික් ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

බතික් කම්හලක් ගිනිගෙන එහි හිමිකරු චිත්‍රපට නිෂ්පාදක හෙන්රිකස් පීරිස් ඇතුළු සිවුදෙනෙක් පිළිස්සී මියගියේ 1982 දීය. කපු රෙදි වර්ණ ගැන්වීම සඳහා ත්‍රිකුණාමලයේ බතික් නිමැවුම්කරුවන් පෙර කල අර්තාපල්, රාජාල, නිවිති, වට්ටක්කා, කැරට් යනාදී අලවර්ග හා එළවළුවලින් පාට සාදා ගත්හ.

බතික් කියන්නෙ කලාවක්. දැනටමත් හොඳම බතික් අලෙවිය වැඩිවෙලා

අසූව දශකයේ අගභාගයේදී රාජ්‍ය අනුග්‍රහය නොමැතිකමින් බතික් කර්මාන්තය ඇද වැටුණි. එකල ධනවත් කීපදෙනෙක් අතට සීමාවූ බතික් අද සාමාන්‍ය ජනතාව අතරට යමින් ගෘහ කර්මාන්තයක් බවට පත්ව ඇත.

ලෝකයේ ඉහළම පෙළේ නිර්මාණ කිරීමට සමත් නිර්මාණකරුවන් මෙරට සිටියත් ඔවුනට අත දෙන්නට මෙතෙක් කලක් රජයන් මැදිහත් නොවීම නිසාම තවම අපට ග්‍රාමීය වශයෙන් කර්මාන්ත දියුණු තත්වයකට ගෙන ඒමට නොහැකිවී තිබේ. බතික් කර්මාන්තය දේශීයව නැංවීමට නව රජය ගෙන ඇති වැඩපිළිවෙළ හා බතික් ඇඳුම්වලින් සැරසීමට දයාසිරි ජයසේකර ඇමතිවරයා යෝජනා කිරීම නිසා බතික් නිපැයුම් ක්ෂේත්‍රයේ නව ප්‍රබෝධයක් ඇතිවී ඇත.

එදා විජය රජු ලංකාවට පැමිණෙන විට කුවේණිය නූල් කටිමින් සිටි කතාව අප අසා ඇත. රෙදිපිළි නිර්මාණ කලාව ලාංකිකයන්ට එය සහජ හැකියාවක් සේ පිහිටා ඇත.

මෑත කාලීනව බතික් කලාව දේශීය කර්මාන්තයක් වශයෙන් ප්‍රචලිත කිරීමට පුරෝගාමී වූයේ පිටකොටුව ජන ශ්‍රී සහ ජනශ්‍රී මිල්ස් ආයතනයේ අධිපති එස්. සොක්කලිංගම්ය. ඔහු මීට වසරකට පෙර මෙළොව හැර ගියේය. දැන් එහි අධිපතිත්වය දරන්නේ ඔහුගේ පුත් ප්‍රදීප් සොක්කලිංගම්ය. එංගලන්තයේ උසස් අධ්‍යාපනය හැදෑරීමෙන් පසු කාර්මික තාක්ෂණ ආයතනයේ (TTI) පර්යේෂණ ඉංජිනේරුවකු ලෙස සේවය කළ ඔහු පියාගේ ව්‍යාපාරය බාර ගෙන හොඳින් පවත්වාගෙන යන අතර රත්මලානේ කර්මාන්තශාලාවක් හා පිටකොටුවේ කඩසාප්පු කිහිපයක් පවත්වාගෙන යයි. ප්‍රදීප්ගේ ප්‍රධාන ආයතනික ශාඛාව පිහිටි කොළඹ 13 මහා විද්‍යාල මාවතේ අංක 65 ස්ථානයට අප ගියේ ඔවුන්ගේ බතික් පුරාවෘතය දැන ගැනීමටය. ඔහු සිළුමිණට පැවසුවේ මෙවැන්නකි.

"මගේ පියා සෙල්ලම්පිල්ලේ සොක්කලිංගම් තමයි මේ ව්‍යාපාරය ගොඩනැගුවෙ. මීට අවු: 40 - 50 කලින් එයා හුගාක් දුක් විඳලා තමයි රෙදි ව්‍යාපාරයෙන් මුදල් උපයලා තියෙන්නේ. අපේ පවුලේ හිටියේ දැන් ඕස්ට්‍රේලියාවෙ ඉන්න අක්කයි, නුවර ඉන්න නංගියි, අම්මයි. අපි ජීවත්වුණේ කොළඹ. තාත්තා නාවලපිටියේ. තාත්තාගේ තාත්තා, මිය යනවිට තාත්තට අවුරුදු 14යි. අම්මත් අවුරුදු 28න් මිය ගිහින්. සීයා පිටකොටුවට ඇවිත් බස් එකේ තමයි ඒ කාලේ රෙදි ගෙනිහින් තියෙන්නේ."

ඔහු තම පියාව හඳුන්වන්නේ ලොකු සර් නමින්. ඒ අනිත් අයත් සොක්කලිංගම් හඳුන්වන්නේ ඒ නමින් නිසයි. ප්‍රදීප් භාෂා තුනම හොඳින් හසුරුවන්නෙකි.

"අපි දැන් සැප විඳින්නේ ලොකු සර් පුදුම විදිහට දුක් විඳලා උපයපු මුදල්වලින් තමයි. 1974 දි ලොකු සර් රෙදි ව්‍යාපාරේ සුළුවට පටන් ගත්තේ. 1988 ජනශ්‍රී නමින් අපේ කඩය පිටකොටුවේ පටන්ගත්තා. පසුව එරික් සූරියගේ බතික් සමඟ සම්බන්ධ වුණා. ඒ කාලේ පූගොඩ වේයන්ගොඩ, රෙදි මෝල් තිබුණා. අද අපි මේ ක්ෂේත්‍රයේ රැඳී ඉන්නේ ඒ මෝල් නිසයි. ඊට ගරුකිරීමක් ලෙසයි අපේ පිටකොටුවේ ෂොප් එකේ පූගොඩ, වේයන්ගොඩ නම් ගහලා තියෙන්නේ. ඒවා 1944 වැහුවා. චීනරෙදි ආවා. අපි ඉන්දියාවෙන් බතික් වලට අමුරෙදි බැක්ෂන් (බක්ෂානි) කියලා 1968 සිට ගේන්න පටන් ගත්තා. අමුරෙදි සුදු කිරීමට. එම කර්මාන්තශාලාත් 2010 දී වැහුවා. අපේ රටට පිටරටින් ඒවා ගෙන්වපු නිසා.

ඒ කාලෙ වෙද්දි මහා විද්‍යාල මාවතේ පිහිටි මේ ආයතනය විකුණන්න දාලා තිබුණේ. භගවන් බක්ෂානි මේ ආයතනයේ හිමිකරුට වුවමනා වුණේ ආයතනය දිගටම කරගෙන යන කෙනකුට දෙන්නයි. එතකොටයි මමත් සම්බන්ධ වුණේ. එහි කලින් ආයතනයේ සිටි සේවකයනුත් හිටියා. අමු රෙදි මිලට ගෙන එය නැවත සැකසීමක් තමයි සිදු කෙරෙන්නේ. පටන්ගන්න කාලේ මාසයකට රෙදි මීටර් ලක්ෂයයි තිබුණේ. මම ලොකු සර්ට කීවා රෙදි එවන්න කියලා. ඒ ෆැක්ට්‍රිය අපි ජනශ්‍රී මිල්ස් ප්‍රයිවට් ලිමිටඩ් ලෙස වෙනස් කරමින් චීනයෙන් ගෙන්වන ලද රෙදිවලට වඩා තත්ත්වයෙන් උසස් රෙදි නිපදවූවා.

අමුරෙදි ඉන්දියාවෙන් තමයි ගෙන්න ගන්නෙ. ඉස්සර. ෂර්ට් රෙදි, ලුංගි, ලේඩ් බතික්, ෂර්ට්, කැන්ඩියන් මේකප් සාරි, ස්කර්ට් ආදී වර්ග 5, 6 වගේ තිබුණේ. දැන් බතික් නිමැවුම් වර්ග 100 පමණ තියනවා. අපිට අයිති රෙදි මෝලක්ද ඉන්දියාවේ පිහිටා තියන අතර, එහි සුදු බතික් සඳහා වෙනත් පැහැයන් වලින් යුත් රෙදි නිපදවනවා. සිවුරු රෙදිත් ඊට අයත්. හොඳ දීප්තියෙන් යුත් නිමාවක් ලබාගැනීම සඳහා ප්‍රමිතියෙන් උසස් ඩයි වර්ග අපි භාවිත කරනවා. පිටකොටුවෙ දේවි ඩයිකොම් බතික් ඩයි අපි ගන්නේ. ඊට අමතරව රියැන්ටික් ඩයිත් පාවිච්චි කරනවා. මේ දිනවල ඩයි මිලත් ඉහළයි. ජනශ්‍රී අවු 32 වැඩි කාලයක් ඉන්දියාවෙන් කපු රෙදි ගෙනත් සුදු කළා. දැන් දැන් ඩයි කරනවා. ඒ කාලේ නොකළත්.

අපිට තියන ලොකුම ගැටලුව අමුරෙදිවලටත් ගෙන්වන විට ටැක්ස් අයකරගැනීම. බතික් කර්මාන්තය ආශ්‍රිතව ලංකාව පුරා ජනශ්‍රී කපු රෙදිවලින් බතික් නිර්මාණ කරන 10,000 වැඩි පිරිසක් ජීවත් වෙනවා. අපි දන්න විදිහට බතික් කර්මාන්තය පටන් අරගත්තට පස්සේ නවත්තපු කෙනෙක් නැහැ. වෙන රැකියා අතහැර බතික් වලට ආවා මිසක්. ඒ ඒ පිරිස්ම බතික් වෙළෙඳපළ හදාගත්තා. ලක්සල, සළුසල ලංකාව පුරාම තියන අලෙවිහල්වලට විතරක් නෙමෙයි, පිටරටින් එන සංචාරකයන්ටත් බතික් ඇඳුම් අලෙවි කරලා බතික් ඇඳුම් නිමැවුම්කරුවන් ආදායම් ලැබුවා.

ඒත් කොරෝනා සමයෙන් පස්සේ බතික් නිර්මාණ අලෙවියේ පහළ බැසීමක් සිදු වුණා. මැෂින් කට් නිර්මාණ වලට වඩා අතින් කරන සියුම් නිර්මාණ (free hand) වල මිල අධිකයි. විසිතුරු බතික් නිර්මාණ සඳහා කැලෑ මල්, පැළවර්ග, මාළු, වනසතුන්, සමනලයන්, මොනරු, අලි ඇතුන්, වඳුරන්, පැරණි පිඟන් ගඩොල්, තඹ භාණ්ඩ ආදියේ ඇති කැටයම් ද යොදා ගැනෙනවා. නව අත්හදා බැලීම් සිදු කරමින් බතික් කර්මාන්තය දියුණු කිරීම තමයි මගේ අරමුණ. මගේ බිරිය දිව්‍යා ප්‍රදීප්, ශ්‍රීනිතී, තනුෂ් දරුවන් ප්‍රමුඛ පවුලට තමයි මම මුල්තැන දෙන්නෙ ව්‍යාපාරයට වගේම."

ප්‍රදීප්ගේ පියා වන එස්. සොක්කලිංගම් හින්දු පූජාස්ථාන මෙන්ම බෞද්ධ සිද්ධස්ථාන ඉදිකරමින් විශාල සමාජ මෙහෙවරක නිරත වූ සමාජ සේවකයෙකි. හොඳ හදවතක් ඇත්තෙකි.

බතික් කලාව දේශීය කර්මාන්තයක් වශයෙන් ප්‍රචලිත කිරීමට පුරෝගාමී වූ එස්. සොක්කලිංගම්

සොක්කලිංගම් ගේ බිරිය, පුත් ප්‍රදීප් සොක්කලිංගම්, ලේලිය දිව්‍යා ප්‍රදීප්, මිනිපිරි ශ්‍රීනිතී හා මුනුපුරු තනුෂ්

ජනශ්‍රී ආයතනයේ බතික් රෙදි කර්මාන්ත ශාලාව පිහිටා තියෙන්නේ, රත්මලාන මාලිගාව පාරේ අංක 11, පළමු පටුමගේය. අක්කර 3ක් පුරා කර්මාන්ත ශාලාව විහිදී ඇත.

ජනශ්‍රී ආයතනයේ කළමනාකරු සුමිත් වික්‍රමසිංහ හා නිෂ්පාදන කළමනාකරු ලාල් පීරිස් එම කර්මාන්ත ශාලාවේ බතික් රෙදි පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය අපට පැහැදිලි කර දුන්නේ එකී සියලු අංශ පෙන්වමිනි.

"අපි ඉන්දියාවෙන් තමයි අමු රෙදි ගෙන්වන්නේ. සුදු කිරීමෙන් හෝ වර්ණ කිරීමෙන් පසුව දේශීය බතික් කර්මාන්තයට නිකුත් කිරීම සිදු කෙරෙනවා. බතික් ඇඳුම් නිපදවන අය අපෙන් තමයි රෙදි ගන්නේ. සුදු හෝ ඩයි කරපු රෙදි අමුරෙදි නූල්වලින් වියා කැඳ දමා කපු රෙදි නිෂ්පාදන ක්‍රියාවලිය කෙරෙන්නේ ඉන්දියාවෙ. අපෙත් කර්මාන්ත ශාලාවක් එහි තියනවා. කපුරෙදි රෝල්වල තියන රෙදිවලින් අපි මීටර් 2500, මීටර් 5000 ප්‍රමාණයට මැෂින්වලට දමන්න කපා ගන්නවා. අපි යටතේ සේවකයෝ 40 පමණ වැඩ කරනවා. අවට හා දුර පළාත්වල අය. එයාලට නවාතැන් ආහාරපානත් ලැබෙනවා."

ඔහු අපිට එම කහ පැහැ ගැන්වුණු අමු රෙදි පිරිසිදු කරගෙන වෙළෙඳපොළට යවන සුදු හා වර්ණ බතික් රෙදි නිෂ්පාදන ක්‍රියාවලියේ අවසානය දක්වා ම පියවරෙන් පියවර විස්තර කරනු ලැබීය.

"මුලින්ම අමුරෙදි රෝල කෝස්ටික් සෝඩා වතුරේ දමන්නේ කැඳ ඉවත් කර ගන්නයි. ඉන්පසු වොෂින් මැෂින් එකෙන් කැඳ ගතියත්, කෝස්ටික් සමඟින් ඉවත් කරනවා. කෝස්ටික් රිකවරි ප්ලාන්ට් එකෙන් ජලය පිරිසිදු කර නැවත පරිසරයට හානි නොවන පරිදි කෝස්ටික්වල පිටි කැඳ ගතිය ඉවත් කර වෙනම ප්ලාන්ට් එකකට එකතු කරනවා. අති විශාල ප්‍රමාණයේ උණුවතුර බොයිලර් දෙකරත් කරන්නෙ දරවලින්.

ඉන්පසු මීටර් 2500 ප්‍රමාණයේ පිරිසිදු කරගත් රෙදි රෝල්, බතික් ඕඩර් අනුව සුදු, නිල්, රතු, කහ, තැඹිලි, කොළ, දම්, ඉන්ඩිගෝ, මැජෙන්ටා ආදී විවිධ වර්ණවලින් වර්ණ ගන්වා රෝල් ලෙස තැන්පත් කරනවා. බතික් කිරීමට වොයිල් රෙදිත් ගන්න නිසා හොඳ ඉල්ලුමක් තියෙනවා. වැඩිපුරම යන්නේ තද නිල්, රතු හා මැජෙන්ටා කලර් එක."

ලංකාවට චීනෙන් තමයි හුගාක් පාට කරපු බතික් කපු රෙදි එන්නේ. අඟල් 36 පළල. ඒත් හේදුවාම පාට යනවා. රෙද්දත් ඇකිළෙනවා.

අපේ කර්මාන්තශාලාවේ රෙදි පිරිපහදු කිරීමේ ක්‍රියාවලියේදී භාවිතයට ගැනෙන ජලය පිරිසිදු කර නැවත භාවිත කෙරෙනවා. කර්මාන්තශාලාව නිරීක්ෂණයට ජල සාම්පල් පරීක්ෂණයට නිතරම පරිසර අධිකාරිය, පරිසර සෞඛ්‍ය පරීක්ෂක පැමිණෙනවා."

ජනශ්‍රී අධිපති ප්‍රදීප් සොක්කලිංගම් තම කර්මාන්ත ශාලාව පිළිබඳ මෙසේ කීහ.

"බතික් කියන්නෙ කලාවක්. දැනටමත් හොඳම බතික් අලෙවිය වැඩිවෙලා. අපි ආනයනය කරන්නේ මෙහෙට හොඳම කපු රෙදි. ඒ නිසා ප්‍රමිතිය ඉහළයි. අපේ බතික් රෙදි සිවුරු වලට, පොල්ගහවෙල අසපුව, බලන්ගොඩ අසපුවෙන් ගන්නවා. කැනඩාව, ඕස්ට්‍රේලියාව, එංගලන්තය, ඉන්දියාව, කොරියාව වගේ රටවලට යවනවා. විදේශිකයෝ ලංකාවෙ බතික් මෝස්තරවලට ආසයි. එහි එම්බ්‍රොයිඩර්, හයිබ්‍රිඩ් දැකුම්කළුයි. සුවපහසුයි. කල්පවතිනවා. හොඳ බතික් සාරි රු. 2500 සිට ලක්ෂ 2 දක්වා. සරම් නම් එතරම් මිල නැහැ."

ජනශ්‍රී බතික් රෙදි භාවිතා කරමින් විවිධ මෝස්තරයේ ඇඟළුම් නිෂ්පාදනය කරන මාතර ප්‍රදේශයේ ද අප සංචාරයක යෙදුණෙමු.

වැලිහිඳ, දෙනිපිටිය ලේඛා බතික් ආයතනයේ හිමිකාරිනිය අමරා හෙට්ටිආරච්චි 79 වියේ පසුවන අතර වසර 42ක් ඇඟළුම් ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබමින් සම්මාන රැසකින් පිදුම් ලබා ඇත. මේ ඇගේ හඬ.

"මුල් යුගයේ සිටම ජනශ්‍රී මුදලාලි තමයි අපිට රෙදි ණයට දෙමින් පවා අතහිත දුන්නේ. ජනශ්‍රී එකෙන් ගන්න බතික් රෙදිවලින් අපි සරම්, ගවුම්, නයිටි, හවුස්කෝට්, බෙඩ්ශීට්ස්, විස්කෝස් බ්ලවුස්, ගවුම්, සාරි ඔසරි සියල්ල නිපදවනවා. මට අවුරුදු 30දි මහත්තයා නැතිවුණා. චිත්‍ර අඳින්න හා මහන්න මට පුළුවන්. පාළුව මකාගන්න තමයි මා බතික් නිර්මාණකරණයට යොමුවුණේ. මහින්ද යාපා අබේවර්ධන මහතා මගේ අක්කගේ පුතා. ඒ කාලේ මට කොළඹ කඩ කීපයක් අල්ලලා දුන්නා. ඇඳුම් මහලා දාන්න. දෙවෙනි වරටත් මා විවාහ වුණා. මා යටතේ 20 පමණ සේවය කරනවා. මගෙන් ඉගෙනගෙන වෙනම බතික් නිපදවන අයත් ඉන්නවා. අපේ ඇඳුම් කොළඹ, මහරගම, කළුතර, බෙලිඅත්ත, කතරගම, හම්බන්තොට, ත්‍රිකුණාමලය, හිඟුරක්ගොඩ ආදී දිවයින පුරාම අය පැමිණ ගෙනියනවා.

පිටරට සංචාරකයන් පවා මෙහේ එනවා. බතික් මිලට ගන්න බතික් කරන හැටි බලන්න. දැන් මගේ දියණිය තමයි මේ ආයතනය පාලනය කරන්නේ.

අපිට තියෙන ලොකුම ගැටලුව අමුරෙදිවලටත් ගෙන්වන විට ටැක්ස් අයකර ගැනීම

ඊළඟට අප ගමන්කළේ තෙලිජ්ජවිල, උඩුකාව, බෙත්මි බතික් නිර්මාණය කරන දහම් සමරජීවගේ (43) නිවසටය. මෙහි බතික් ව්‍යාපාරය අරඹා ඇත්තේ දහම්ගේ පියා එච්.ජී. සෝමසිරි (70) විසින් වන අතර ඒ 1974 දීය. දහම් තම බිරිඳ නිල්මිණි (42) සමඟින් තම නිවසේ බතික් ඇඳුම් නිර්මාණය කරයි.

දහම්ගේ පියා බතික් ඇඳුම් නිර්මාණයෙහි තම මුල් යුගය සිහිපත් කළේ මෙසේය.

"මම 1974 තමයි වේයන්ගොඩින් රෙදි ගෙනත් මේ බිස්නස් එක පටන්ගත්තේ. ඒක වැහුවාම ජනශ්‍රී එකෙන් තමයි රෙදි ගත්තේ. එහේ අධිපති සොක්කලිංගම් මහත්තයා අපට උදව් කළා. මගේ දරුවෝ 5 දෙනාගෙන් 4 දෙනෙක්ම බතික් කර්මාන්තෙ ඉගෙනගත්තා."

ඔහුගේ බාල පුත් තිසර සමරජීව (33) තම නිවසේ සිට මෙම කර්මාන්තය පවත්වාගෙන යයි. අපි ඔහුටත් ඇහුම්කන් දෙමු.

"අමුද්‍රව්‍යවල මිල ඉහළයි. බතික් රෙදි ගන්නේ ජයශ්‍රී එකෙන්. අපි නම් සුළුවෙන් තමයි ගෙදර කර්මාන්ත ශාලාව පවත්වගෙන යන්නේ. නිෂ්පාදනයෙන් පසු ඉවත්වන ඉතිරි කොටස පොල්ගස්වලට පෝර වෙන්න දානවා. එම තීන්ත, ඉටි තලප ඉන්ටර්ලොක්ගල් වර්ණ ගැන්වීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඒ දවස්වල කෙනෙක් සොයා බැලුවා. නමුත් ඔහු මියගියා."

ආසියාවටම බතික් සපයන මූන් ලයිට් ආයතනය ආසියාවේ විශාලතම බතික් කර්මාන්තය ලෙස හැඳින්වූවාට වරදක් නැත. උඩුකාව ප්‍රදේශයේ අක්කර 5ක භූමිභාගය සිසාරා පැතිර පවතී. එහි අධිපති එච්.ඩී. චන්ද්‍රසේන සිළුමිණ හා සුහද පිළිසඳරක යෙදුණේ මෙහෙමයි.

"මීට අවුරුදු 45ට කලින් කොළඹින් රෙදි ගෙනත් පොඩියට පටන්ගත්තේ. මුලින් සළුසළින් පසුව ඉන්පසු වේයන්ගොඩින් හා පූගොඩින්. ඉන්පස්සේ පිටකොටුවෙන් චීන පොප්ලීන් ගත්තා. මුලින් කළේ සරම් ෂර්ට්. එම වර්ගයේ ගවුම් නයිටි, හවුස්කෝට්, බිත්ති සැරසිලි නිර්මාණ ආදී සියල්ලක්ම අපි නිෂ්පාදනය කළා.

ලංකාවේ දේශගුණයට ඔරොත්තු දෙන්නේ කපු රෙදිද. අනික කාලයෙන් කාලයට, කාලයේ තාලයට මෝස්තර අලුත් කරන්න ඕනෑ. අපි එක දිගටම එකම මෝස්තර පාවිච්චි කරන්නෙ නෑ. නිතරම අලුත් මෝස්තරවල ඇඳුම් නිෂ්පාදනය කරනවා.

ඉස්සර ලංකාවෙ තිබුණේ විදේශීය බතික් පමණයි. පිජාමා සරම් තමයි වැඩිපුර තිබුණේ. අපි බතික් ඇඳුම් නිපදවා දේශීය වෙළෙඳපොළට දැම්මෙ සාමාන්‍ය ජනතාවට ගන්න පුළුවන් මිලකටයි. අපිට අවම ලාභයක් තියාගෙන. ඒ වගේම විදේශිකයන්ට, සංචාරකයන්ට, හොටෙල් වලට අලෙවි කරනවා. බතික් නිමි ඇඳුම් නිර්මාණකරණයේ මූලිකම සිද්ධාන්තය වන්නේ හොඳ රෙද්දක්, හොඳ ඩයි වර්ගයක් තෝරා ගැනීමයි. ඩයි පිළියෙල කිරීමේ ක්‍රම කීපයක් තියනවා. ක්‍රමයට අනුවම කළ යුතුයි. ඉස්සර බතික් වලට ඉල්ලුමක් තිබුණේ අවුරුදු කාලෙට පමණයි. දැන් වසර පුරාම අඳින්න පුළුවන්.

සරම්, ලුංගි, ගවුම්, කෆ්ටාන්, විස්කෝස් ගවුම්, බීච්රස්, සාරි, කැන්ඩියන් ඔසරි, හවුස්කෝට්, පිනපෝ, මැක්සි, ඒලයින් ගවුම්, ළමා ඇඳුම් සියලුම වර්ගයේ පොඩි සරම් ෂර්ට්, සියලුම වර්ගයේ බතික් ඇඳුම් වර්ග, කොට්ට උර, බෙඩ්ෂීට්, බැනියම්, ටී ෂර්ට්, එම්බ්‍රොයිඩර් ගවුම් ආදී සියල්ලම අපි නිපදවනවා.

සම්මාන රැසකින් පිදුම් ලබා ඇති මූන් ලයිට් බතික් නිෂ්පාදනාගාරයේ ගොඩනැගිලි රැසක නිෂ්පාදන ක්‍රියාවලිය සිදු කෙරෙන ආකාරයද අපට දැකබලා ගන්නට හැකි විය.

දේශීය ස්වයං රැකියාවක් ලෙස බතික් කලාව නැංවීමට රජය ගෙන ඇති පියවර කොතරම් දූරදර්ශී ආයෝජනයක්දැයි අපට පසක් වේ.

ලේඛා බතික් අධිපතිනි අමරා හෙට්ටිආරච්චි

බෙත්මි බතික් අධිපති එච්.ජී. සෝමසිරි

දහම් සමරජීව බෙත්මි බතික්

තිසර සමරජීව බෙත්මි බතික්

මූන්ලයිට් අධිපති එච්.ඩී. චන්ද්‍රසේන

සේයාරූ - සරත් පීරිස් කැළුම් ලියනගේ

ගව ඝාතන තහනම ගැන මත විමසුමක්

20 පිටුව

මැති සබය රත් කළ පොත් 4 ක්

21 පිටුව

හදපු සුද්දා ළඟවත් නැති අපේ කාර්

29 පිටුව

රජු සුතිජා බිසව විවාහ කර ගත් අවස්ථාව

වඩාත් පුවත් මැවීමට සමත්ව තිබෙන්නේ තායි රජුගේ විවාහ ජීවිතයයි. වජිරලොන්කොන් කුමරු ප්‍රථම වරට විවාහ වූයේ 1977 වසරේ ඔහුට වයස විසිපහක්ව තිබියදීය. ඔහුගේ ප්‍රථම විවාහය සිදුවූයේ ඔහුගේ මව් පාර්ශ්වයේ ඥාති සහෝදරියක් සමඟිනි. එහෙත් එම කුමරිය පසුව දික්කසාද කර දැමූ ඔහු ඒ අතර තායිලන්තයේ ඉතා සුරූපි නිළියක සමඟ පෙමින් වෙළුණේය. කතාව එතැනින් නිම නැත...

ඔටුනු පැලඳ සිටින තායි රජු

තායි රජුගේ ඉළඇදෙන වැඩ

රජු සහ සිනීනත්

සිනීනත් ගුවන් යානා පුහුණුවකදී

රජුට ආචාර කරන රජයේ නිලධාරීන්

තායිලන්තය යන නම කියූ සැණින් සිහියට නැගෙන්නේ සංචාරක පුරවරයකි. බුදු දහම මෙන්ම තාවකාලික පැවිද්ද යන සංකීර්ණ මනෝ විද්‍යාත්මක ක්‍රියාවලියට ඉඩ පහසුකම් සහිත එමෙන්න අනික් අතින් ජනතාවට විශාල ලිංගික නිදහස සහිත, ගණිකා වෘත්තිය නීතිගත කර ඇති තායිලන්තය සැබවින්ම ආසියාතික බටහිර සංස්කෘතික සම්මිශ්‍රණයක් ලෙස දැකිය හැකිය. මේ සංකීර්ණ සංස්කෘතික ලක්ෂණ සහිත තායිලන්තයේ තායිලන්තයේ පවතින දේශපාලන ක්‍රමවේදයද තරමක් සංකීර්ණය. රටේ පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ජනතාව විසින් තෝරා පත් කර ගන්නා අතර නාමික විධායකය ලෙස රජතුමා සැමටම ඉහළින් සිටින්නේය.

බ්‍රිතාන්‍යයේ මෙන්ම තායිලන්තයේද රජකම ලේ උරුමයෙන් පැවත එන්නේය. මේ වන විට තායිලන්තයේ රජකම හොබවන්නේ 2016 ඔක්තෝබර් මාසයේදී මියගිය භූමිබෝල් අදුල්යාදෙජ් රජුගේ පුතණුවන් වන මහා වජිරලොන්කොන්ය. මේ විස්තර ලියන්නට යන අපූරු පුද්ගලයාද ඔහුය. තායි රජ පවුල

චක්වළගල

● විරෝනි වෑවලගේ

ගැන වෙනම කතා කළ යුතු බොහෝ දේ තිබේ. ඒ අතරින් ප්‍රථමයෙන්ම කිව යුත්තේ තායි රජ පවුල මේ වන විට රටට, ජනතාවට බරක් වී ඇති බවය. ඔවුන් රටේ පාලනයට කිසිසේත් මැදිහත් නොවන අතර ඒ වෙනුවට ඉතා විශාල අධිකාරී බලයක් සමඟ මහජනතාවගේ මුදල් විශාල ලෙස කාබාසිනියා කරමින් අති සුඛෝපභෝගී ජීවිත ගත කරමින් සිටිති.

වර්තමාන රජු වජිරලොන්ග්කොන් කෙසේ වුවද ඔහුගේ පියා වන හිටපු රජු භූමිභෝල් නම් ජනතාවගෙන් එතරම් චෝදනා ලැබූවකු නොවේ. ඔහු ජනතාවගේ සිත්වල ගෞරවය ලැබීමට සමත් වූයේය. 2016දී භූමිභෝල් රජු මියගිය අතර ඔහුගේ සහ සිරිකිත් බිසවගේ එකම පුතු වන මහා වජිරලොන්ග්කෝන් රජු ලෙස අභිෂේක ලැබීය. තායි රජු 'රාමා' යනුවෙන්ද හඳුන්වන අතර භූමිභෝල රජු නව වැනි රාමා වූ අතර වජිරලොන්ග්කොන් රජු දස වැනි රාමා යනුවෙන් නම් ලබා තිබේ.

විශේෂිතම කරුණ වන්නේ තායිලන්ත වැසියන්ට එරට රජු විවේචනය කිරීම නීතියෙන් තහනම් කර තිබීමයි.

එමෙන්ම මේ වන විට තායි රජු ඩොලර් බිලියන 30ක වත්කම්වලට උරුමකම් කියන අතර ඔහු මේ වන විට ලෝකයේ ජීවත් වන ධනවත්ම 'රජු' වශයෙන්ද තහවුරු වී තිබේ. වජිරලොන්කොන් රජුට ඉතා දීර්ඝ නමක් හිමි අතර එම නම වචන 23කින්ද අකුරු 182කින්ද සමන්විතය.

1952 වර්ෂයේ උපත ලැබූ වජිරලොන්කොන් රජු රජකමට පත්වූයේ වයස අවුරුදු 64දීය. ඒ අනුව ඔහු තායිලන්තයේ වඩාත් වැඩිම වයසකදී රජකමට පත්වූ රජු ලෙසින් ද ප්‍රකාශිතය. ලන්ඩනයේදී අධ්‍යාපනයත්, යුද පුහුණුවත් ලැබූ වර්තමාන තායි රජතුමා ගුවන් යානා පැදවීමේ හැකියාවද සහිත බව කියවේ.

පියාගේ අභාවයෙන් පසු රජකටම පත්වූ වජිරලොන්කොන් රජු දින තුනක් පුරා තම රාජාභිෂේක උත්සවය පැවැත්වූයේය. එම උත්සවයේදී ආරාධිතයන් එක් ලක්ෂ පනස් දහසකට පමණ සංග්‍රහ කළ බවද කියැවේ.

කෙසේ වුවද තායිලන්තයේ රජ පවුල සම්බන්ධව ක්‍රියාත්මක වන නීතිය ලෝකයේ එවැනි එකම නීතිය යනුවෙන්ද සැලකිය හැකි ඉතා වෙනස්කම් සහිත නීතියකි. ඒ නීතියට අනුව තායි රජු හෝ රජ පවුලේ සාමාජිකයන් තබා රජ පවුලේ සුරතල් සතුන් පවා විවේචනය කිරීමේ හැකියාව එරට ජනතාවට හිමි නොවේ. මේ නීතිය කඩ කළ පුද්ගලයන් වසර 35ක් දක්වා හිරගෙට නියම කළ උදාහරණද තායිලන්තය සතුය.

මේ හේතුවෙන්ම රජු සතුව අසීමිත නිදහසක් පවතින අතර වර්තමාන තායි රජු එම නිදහස උපරිමයෙන් භුක්ති විඳින බවද පෙනේ. එහෙත් පෙර විසූ රජවරු මෙන් නොව වජිරලොන්කොන් රජුගේ පෞද්ගලික ජීවිතය පුදුම උපදවන සුලු බැවින් තායි ජනතාව මේ වන විට සිර ගත වීමේ බිය පසෙක දමා රජු විවේචනය කිරීමට පෙලඹෙනුද දැක ගත හැකිය. මේ විවේචන අතරට රජුගෙ පෞද්ගලික ජීවිතය පමණක් නොව රජුගෙ ව්‍යාපාර කටයුතුද ඇතුළත්ය. හිටපු තායි අගමැතිවරයකු වන තක්ෂින් ශිනවත්‍රා සමඟ වජිලොන්කොන් ඔටුන්න හිමි කුමරු ලෙස සිටි අවධියේ සිදුකළ ව්‍යාපාර ගනුදෙනු තැන වාර්තා කළ 'ෆා ඊස්ටන් ඉකනොමික් රිවීව්' සඟරාව වාරණය කිරීමටද එරට රජය කටයුතු කළ අන්දම රජුගේ බලය සම්බන්ධව හොඳ උදාහරණයක් ලෙස දැක්විය හැකිය. එහෙත් මේ වන විට තායි ජනතාව ප්‍රසිද්ධ විරෝධතා ව්‍යාපාරවල යෙදෙමින් රජු විවේචනය කිරීමේ යම් යම් ප්‍රවණතාද තායිලන්තයෙන් දැක ගත හැකිය.

මේ සියල්ලට අමතරව වඩාත් පුවත් මැවීමට සමත්ව තිබෙන්නේ තායි රජුගේ විවාහ ජීවිතයයි. වජිරලොන්කොන් කුමරු ප්‍රථම වරට විවාහ වූයේ 1977 වසරේ ඔහුට වයස විසිපහක්ව තිබියදීය. ඔහුගේ ප්‍රථම විවාහය සිදුවූයේ ඔහුගේ මව් පාර්ශ්වයේ ඥාති සහෝදරියක් සමඟිනි. එහෙත් එම කුමරිය පසුව දික්කසාද කර දැමූ ඔහු ඒ අතර තායිලන්තයේ ඉතා සුරූපි නිළියක සමඟ පෙමින් වෙළුණේය.

එම නිළිය ඔහුගේ ප්‍රථම පුත් රුවන ඔහුට තිළිණ කළ අතර 1994 වසරේදී ඔවුන් විවාහ වන විට ඔවුන් දරුවන් තිදෙනෙකුගේ දෙමවුපියෝ වූහ. විවාහය එතෙක් පමා කිරීමට හේතුව වූයේ රැජිනගෙ ආශිර්වාදය කුමරුගේ සිත් ගත් නළඟනට නොලැබීමය. විවාහයෙන් පසු මේ නිළියටද තායි යුද හමුදාවේ මේජර් නිලයක් හිමි විය.

මෙසේ බොහෝ දුක් ගැහැට මැද ප්‍රේමය ජය ගත්තද වජිරලොන්කොන් කුමරු මේ විවාහයේද දිගුකල් රැඳී සිටීමට කැමැත්තක් දැක්වූයේ නැත. විවාහයෙන් වසර දෙකකට පසු ඔහුගේ බිරිය රටින් පිටව ගියේ තම දරුවන්ද රැගෙනය. වජිරලොන්කොන් කුමරු තම බිරිය සහ තායි ගුවන් හමුදාවේ එයාර් මාෂල්වරයකු අතර සම්බන්ධයක් පවතින බව රටපුරා ප්‍රචාරය කර හැරියේය.

2001 වසරේදී වජිරලොන්කොන් කුමරු යළිත් වරක් විවාපත් වූ නමුදු එය ජනතාව අතර ප්‍රසිද්ධියට පත් කරණු ලැබුවේ 2005 වසරේදී ඔවුන් දෙමාපියන් වූ අවස්ථාවේදීය.

මෙවර කුමරුගේ සහකාරිය තායිලන්තයේ තරමක් නූතන ගතිපැවතුම් සහිත පවුලක සාමාජිකාවක වූවාය. එහෙත් වසර 13ක පවුල් ජීවිතය අවසාන කරමින් ඇයගෙන්ද දික්කසාද වූ වජිරලොන්කොන් කුමරු දික්කසාදය වෙනුවෙන් ඇයට තායිලන්ත 'බාත්' මිලියන 200ක් ලබා දුන්නේය.

මේ වන විට කුමරුගේ බිරිය සහ තායිලන්ත රැජිනද වන සුතිජා තිජායි රැජින සමඟ කුමරු විවාහ වූයේ 2019 මැයි මාසයේ ඔහුගේ අභිෂේක මංගල්‍යයට පෙර දිනයේදීය.

විවාහයට පෙර තායි ගුවන් සේවයේ ගුවන් සේවිකාවක වූ සුතිජා කුමරුගේ සිත් ගැනීමට සමත්ව සිටියාය. එහෙත් ඇයට ප්‍රබල තරගයක් දීමට තවත් කාන්තාවක් ඉදිරිපත් සිටි අතර ඇය සිනීනත් නම් වූ හෙදියකි. හෙදියක වශයෙන් තම ජීවිතය ආරම්භ කළද ඇය ඉක්මනින්ම තායි ගුවන් හමුදාවේ ගුවන් නියමුවරියක් ලෙස තම කාර්ය භාරය විතැන් කර ගත්තාය.

පසුව ඇය වජිරලොන්කොන් රජුගේ සිත් ගැනීමටද සමත් වූයෙන් ඇයව තායි යුද හමුදාවේ මේජර් ජනරාල් නිලයකට උසස් කරණු ලැබීය. පසුව ඇය තායි රජුගේ පෞද්ගලික ශරීර ආරක්ෂක වශයෙන් පත් කර ගනු ලැබූ අතර අවසානයේ 2019 ජූලි 28වැනිදා ඇයව නිත්‍යානුකූල ලෙස විවාහ කර ගැනීමටද රජු කටයුතු කළේය. එහෙත් ඇයගේ මේ ශීඝ්‍ර නැගීම පැවතුනේ මාස තුනක් වැනි කෙටි කාලයක් පමණි. රජුගේ නියමය මත සිනීනත් සියලුම රාජකීය නිලවලින් පහ කරණු ලැබූ අතර එයට හේතුව ඇය 'සුතිජා රැජිනට අවනත නොවීම' බව ප්‍රකාශ විය. එහෙත් මේ සිදුවීමෙන් වසරකට පසු එනම් පසුගිය සැප්තැම්බර් 2වැනිදා යළිත් සිනීනත් හා විවාහය යළි පවත්වා ගැනීමටත්, ඇයට පෙර ලබාදුන් රාජකීය තනතුරුවල ඇය යළිත් පිහිටුවීමටත් රජු අණ දුන්නේය.

මේ පෙනෙන අන්දමට නම් තායි රජු වජිරලොන්කොන්ට රාජ්‍ය පාලනයේ වඩා වැඩි වැඩකොටසක් පැවරී නොතිබීම තායි ජනතාවගේ සැනසිල්ලට කරුණක් වනු ඇත.

ඒ රජුට අන් සියල්ලට වඩා තමන්ගේ සිත්ගත් කාන්තාවන් පාලනය කර ගැනීමට කාලය යෙදවීමට සිදුවී ඇති බැවිනි. එහෙත් මේ සියල්ල වසර ගණනාවක් පුරා ඉවසාගෙන සිටි තායි ජනතාව මේ වන විට රටේ නීතිය උල්ලංඝනය කරමින් රජුට විරුද්ධව උද්ඝෝෂණ සංවිධානය කරමින් සිටින නිසා තායි රජුට දෙකෙන් එකක් තෝරා බේරා ගැනීමට සිදුවන දිනය වැඩි ඇතක නොවනු ඇත.

රජු විදේශයකදී නිදහස් සුවය විඳිමින්

ට්‍රම්ප්, බයිඩන් සජීවීව පැටලෙති

ඇමරිකා ජනාධිපතිවරණයේ තවත් ආකර්ෂණීය අංගයක් වන ප්‍රධාන අපේක්ෂකයන්ගේ සජීවී සංවාද පසුගිය බදාදා ආරම්භ විය. මෙවර ජනාධිපතිවරණයේ ප්‍රථම සජීවී විවාදය එසේ පැවැත්වුණු අතර එය අමෙරිකා පුරවැසියන්ගේ පමණක් නොව මුළු ලෝකයේම අවධානයට යොමු විය.

පාලකයන් තෝරා ගැනීමේදී ඉතා විනිවිද භාවයෙන් යුතු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම අනුගමනය කරන ඇමරිකාවේ ජනාධිපති අපේක්ෂකයන් මුහුණ දෙන ප්‍රබල කඩඉමක් ලෙස මේ සජීවී සංවාද දැක්විය හැකිය.

ජනමාධ්‍ය සිව්වැනි ආණ්ඩුව බවට රූපාන්තරණය වීමත් සමඟ අමෙරිකා දේශපාලනයේ වැඩි වැඩකොටසක් එරට ජනමාධ්‍යවලටද පැවරුණු අතර තමන් තෝරා ගන්නා නායකයාගේ බුද්ධිමත්බව, ඔහු සමාජ ප්‍රශ්නවලදී දක්වන විචක්ෂණ භාවය ඇතුළු තවත් බොහෝ දේ සම්බන්ධව ජනතාවට අවබෝධයක් ලබා ගැනීමට මේ සජීවී සංවාද ඉවහල් විය.

මෙවරද ස්වකීය දෙවැනි ධූරකාලය සඳහා තරගවදින ජනාධිපති ට්‍රම්ප් රිපබ්ලිකන් අපේක්ෂකයා ලෙසත්, ජෝ බයිඩන් ඩිමොක්‍රටික් පක්ෂයේ අපේක්ෂකයා ලෙසත් මේ සජීවී සංවාදයට එක්වූහ. ක්ලේව්ලන්ඩ්හි කාස්ට් වෙස්ටන් රිසර්ව් විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී මේ විවාදය පැවති අතර විවාදය මෙහෙයවීම ෆොක්ස් ප්‍රවෘත්ති ඒජන්සියේ ප්‍රවීණ මාධ්‍යවේදී ක්‍රිස් වැලස් විසින් සිදුකරන ලදී. අන්තර්ජාල මාධ්‍ය රැසක් සමඟ, ඇසෝසියේටඩ් ප්‍රෙස්, එන්බීසී ප්‍රවෘත්ති ඇතුළු පුවත් සේවා රැසක් මේ විවාදය සජීවීව ලොව පුරා විකාශය කිරීමට එක්විය.

මෙහිදී අපේක්ෂකයන් දෙදෙනාම එකසේ තියුණු ප්‍රශ්න කිරීම්වලට ලක්වුණු අතර දෙදෙනාම එකසේ ඒවාට ප්‍රතිඋත්තර ලබාදීමට කටයුතු කළහ. එක් අවස්ථාවකදී ඩොනල්ඩ් ට්‍රම්ප් ජෝ බයිඩන්ගේ පුත්‍රයාගේ මත්ද්‍රව්‍ය ඇබ්බැහි වීම හාස්‍යයට ලක් කළ අතර, ජෝ බයිඩන් එයට ඉතා දක්ෂ ලෙස පිළිතුරු දෙමින් 'මගේ පුත්‍රයා සෙසු බොහෝ දෙනෙක් වගේම මත්ද්‍රව්‍ය පාවිච්චි කරනවා. ඔව්. මඳක් වැඩිපුර පාවිච්චි කරනවා. නමුත් ඔහු එය සමනය කර ගැනීමට කටයුතු කරමින් සිටිනවා. මම ඔහු ගැන ආඩම්බර වෙනවා' යැයි පැවසීය.

මේ අතර විවාදය සරුව ඇවිළෙමින් පැවතියදී වැඩසටහන මෙහෙයවූ ක්‍රිස් වැලස්ට ජෝ බයිඩන්ට අදහස් දැක්වීමේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ජනාධිපතිවරයාට 'නිහාඬවන' ලෙස පැවසීමටද සිදුවිය.

ට්‍රම්ප් ජනාධිපතිවරයා සෑම විටම මුව ආවරණ පැලඳ සිටීම සම්බන්ධව ජෝ බයිඩන් හාස්‍යයට ලක් කළ අතර, මොස්කව් නගරාධිපතිගේ බිරිය බයිඩන්ගේ මැතිවරණ වියදම් වෙනුවෙන් ඩොලර් මිලියන 3.5ක් ලබා දී ඇති බවද පවසා සිටියේය. බයිඩන් ජනාධිපති වුවහොත් ඔහු පොලිස් නිලධාරීන්ට ලබාදී ඇති පහසුකම් අවම කරනු ඇති බවටද ට්‍රම්ප් චෝදනා කළ අතර මේවාට පිළිතුරු ලෙස බයිඩන් ට්‍රම්ප්ගේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය දැඩිසේ විවේචනය කළේය.

ආයෝජකයන්ට පාවාඩ අතුරන කොවිඩ් පැරදවූ රටවල චීන ලැයිස්තුව

කොවිඩ්වලින් පසු ආර්ථිකය යළි පණගැන්වීමට සමත් වූ දෙවැනි රට ශ්‍රී ලංකාවයි

චීනයේ Y i C a i ආයතනය සම්බන්ධව මේ වන විට ලෝකයේම අවධානය යොමු වෙමින් තිබේ. ඒ මේ වන විටත් මුළු ලෝකයටම පහර දෙමින් තිබෙන කොවිඩ් වසංගතය සාර්ථකව පාලනය කළ රටවල් සම්බන්ධව එම ආයතනය නිකුත් කළ වාර්තාවත් සමඟිනි. එම වාර්තාවට අනුව ලෝකයේ රටවල් 108ක් අතරින් කොවිඩ් මැනවින් පාලනය කර, ආර්ථිකය යළි පණගැන්වීමට සමත් වූ දෙවැනි රට බවට ශ්‍රී ලංකාව පත්ව තිබේ. මෙය ශ්‍රී ලාංකික අපට ඉතා සතුටුදායක කරුණක් වන අතර එය ජාතියක් ලෙස අප කළ කැපකිරීම් සහ දැක්වූ එකමුතුකම, මෙන්ම විනයද ඇගයීමට ලක් වූ අවස්ථාවක් ලෙසින්ද සැලකිය හැකිය. එමෙන්ම අප රටට මේ සමඟ ලැබෙන අන්තර්ජාතික අවධානයද සුළු කොට තැකිය නොහැකිය. ඒ මුළු ලෝකයම දණ ගැස්වූ අභියෝගයක් හමුවේ අප රට දැක්වූ සමර්ථකම Y i C a i ආයතනය මනාව සංක්ෂිප්ත කොට දක්වා ඇති හෙයිනි.

Y i C a i ආයතනය පසුගියදා නිකුත් කළ වාර්තාවට අනුව කොවිඩ් වසංගතය හමුවේ රටවල් 108ක ක්‍රියාකාරීත්වය ඔවුන් විසින් සැලකිල්ලට ලක් කර තිබේ. දැනට එම වාර්තාවේ සාරාංශයක් පමණක් ඉදිරිපත් කර ඇති අතර ඔක්තෝබර් මාසය තුළ සම්පූර්ණ වාර්තාව ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කරන බවද Y i C a i ආයතනය පවසා තිබේ.

දැනට ඉදිරිපත් කර ඇති සංක්ෂිප්ත වාර්තාවට අනුව කොවිඩ් වංසගතය ඉතා විධිමත් ලෙස පාලනය කරමින් ආර්ථිකයද යළි ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට සමත් වූ ප්‍රථම රටවල් දහයෙන් නවයක්ම ආසියා පැසිෆික් කලාපයේ පිහිටා ඇත.

එම රටවල් නවය අනුපිළිවෙළින් චීනය, ශ්‍රී ලංකාව, දකුණු කොරියාව, මියන්මාරය, ඔස්ට්‍රේලියාව, තායිලන්තය, නවසීලන්තය, වියට්නාමය සහ කාම්බෝජය වන අතර අප්‍රිකා මහාද්වීපයේ ඝානාව තුන්වන ස්ථානය හිමිකරගෙන තිබේ.

කොවිඩ් වසංගතයෙන් දරුණු ලෙසම බැට කෑ මහාද්වීපය වන්නේ යුරෝපා මහාද්වීපයයි. එහෙත් ස්කැන්ඩිනේවියානු රටවල් සහ ජර්මනිය වසංගතයට කිසියම් ශක්තිමත්, සංවිධානාත්මක අන්දමකින් මුහුණ දුන් බව පැහැදිලිය.

තවමත් බොහෝ රටවල ආර්ථිකයන් උපරිම තත්ත්වයෙන් ක්‍රියාත්මක නොකරන අතර විරුකියාව දරුණු සමාජ ප්‍රශ්නයක් බවටද පත්වෙමින් තිබේ. යුරෝපය, අමෙරිකාව මෙන්ම මැද පෙරදිග කලාපයද මේ වාතාවරණයට එකසේ මුහුණ දෙමින් සිටිති. කඩා වැටී ඇති ව්‍යාපාර සංඛ්‍යාව අති විශාලය.

මේ සියල්ල දත්ත වශයෙන් සලකා බලමින් Y i C a i ආයතනය තම වාර්තාවේ 21 සහ 23 වන ස්ථාන පිළිවෙළින් ඩෙන්මාර්කයට සහ ජර්මනියට හිමිවන බව දන්වා තිබේ.

තවමත් දෛනිකව වයිරස ආසාදිතයන් විශාල වශයෙන් වාර්තා වන අමෙරිකාව සහ බ්‍රසීලයට Y i C a i වාර්තාවේ හිමි වී තිබෙන්නේ බොහෝ ඇත ස්ථානයන්ය. අමෙරිකාව ලෝකයට ඉදිරිපත් කෙරෙන බොහෝ වාර්තාවල අංක එකට නිතැතින්ම පත් වුවද මෙවර කොවිඩ් පාලනය කිරීම සම්බන්ධව අමෙරිකාවට හිමිවී ඇත්තේ රටවල් 108ක් අතරින් 98වන ස්ථානයයි. බ්‍රසීලයද මේ වන විටත් කොවිඩ් වයිරසයෙන් දරුණු ලෙස බැටකමින් සිටින අතර Y i C a i ආයතනය තම ලැයිස්තුවේ 89වන ස්ථානය බ්‍රසීලය වෙනුවෙන් වෙන් කරමින් ලොවට දැනුම් දෙන්නේ රටක් වශයෙන් සංවිධානාත්මකව ගැටලුවකට, හදිසි අවස්ථාවකට මුහුණ දීමේදී මේ රටවල් කෙතරම් අසමත්ද යන්නයි.

ස්කැන්ඩිනේවියානු රටක් වුවද ස්වීඩනයට වයිරස ව්‍යාප්තිය පාලනය කර ගැනීමට නොහැකි වූ අතර Y i C a i වාර්තාවේ 90වැනි ස්ථානය ස්වීඩනයට හිමිවී තිබේ.

ලොව පුරා වැඩි ප්‍රසිද්ධියක් හිමිවී නොමැති වුවද Y i C a i යනු 2016 වසරේ අගෝස්තු මාසයේදී ස්ථාපිත කරන ලද, ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත් කෙරෙන අන්තර්ජාලය පදනම් කර ගත් ප්‍රවෘත්ති ඒජන්සියකි. එය හැඳින්වෙන්නේ Y i C a i Global යනුවෙනි. Y i C a i මාධ්‍ය ජාලය යනුවෙන් ද එය ප්‍රසිද්ධියක් උසුලයි.

චීනයේ ඉතා විශාල, එමෙන්ම ප්‍රබල මාධ්‍ය ජාලයක් වන ශැංහයි මාධ්‍ය ජාලයේ ආර්ථික තොරතුරු ඒකකය ලෙස Y i C a i මාධ්‍ය ඒකකය ස්ථාපිත කර තිබේ. මේ ආයතනයේ කොටස්වලින් සියයට 30ක් චීනයේ ලෝක ප්‍රකට බිලියනපතියකු වන ජැක් මා ට හිමිය. Y i C a i මාධ්‍ය ආයතනය පවත්වාගෙන යෑමේ ප්‍රධාන අරමුණ ලෙස ඔවුන් දක්වන්නේ ලොව පුරා ආර්ථිකමය තොරතුරු වාර්තාකරණය, විශ්ලේෂණය මෙන්ම බෙදාහැරීමයි. අනාගත ලෝකයේ මූල්‍ය තොරතුරු වාර්තාකරණයේ ප්‍රමුඛයා බවට පත්වීම මේ ආයතනයේ ප්‍රධාන අරමුණ බව පැහැදිලිය.

චීනය මෑතකාලීනව බොහෝ බටහිර සමාගම් සමඟ ගිවිසුම් ගත වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර ඒ අනුව Y i C a i සමාගමද ට්වීටර්, බ්ලූම්බර්ග් යනාදී සමාගම් සමග එක්ව කටයුතු කරමින් සිටී.

කොවිඩ් වසංගතය පැතිර යෑමෙන් මේ වන විට ලොවපුරා මිනිසුන් මිලියනයක් මියගොස් ඇතද වඩාත්ම හානි සිදුවී ඇත්තේ සමස්ත ලෝක ආර්ථිකයට බව පැවසිය හැකිය.

තවමත් බොහෝ රටවල ආර්ථිකයන් උපරිම තත්ත්වයෙන් ක්‍රියාත්මක නොකරන අතර විරුකියාව දරුණු සමාජ ප්‍රශ්නයක් බවටද පත්වෙමින් තිබේ. යුරෝපය, අමෙරිකාව මෙන්ම මැද පෙරදිග කලාපයද මේ වාතාවරණයට එකසේ මුහුණ දෙමින් සිටිති. කඩා වැටී ඇති ව්‍යාපාර සංඛ්‍යාව අති විශාලය.

මේ තත්ත්වය යටතේ වසංගතයට ලොව පුරා රටවල් මුහුණ දුන් අන්දම විද්‍යාත්මක පදනමක් මත සලකා බලමින් ඉහත කී වාර්තාව ඉදිරිපත් කිරීමට Y i C a i සමාගම කටයුතු කර තිබේ. මෙවැනි වාර්තාවක් ලෝකයට ඉදිරිපත් කිරීමේදී ආර්ථිකයම වශයෙන් ඉතා විශාල අවධානයක්, ඉතා පහසුවෙන් එම වාර්තාවන්ට යොමුවීම වැළැක්විය නොහැකිය. මෙවැනි වාර්තාවක් මගින් වසංගතයට ස්ථාවරව මුහුණ දුන් රටක් ලෙස තහවුරු වීම යනු ඉදිරියේදී බොහෝ ආයෝජකයන් තම ආයෝජන මේ රටවල් කරා යොමු කිරීමය. ඒ අනුව Y i C a i ආයතනයේ වාර්තාවේ ඉදිරියෙන්ම සිටින ශ්‍රී ලංකාවට වසංගතය ජයගත් රටක් ලෙස විරුදාවලි හිමිවීම පැහැදිලිවම දීප්තිමත් අනාගතයක පෙරමග සලකුණු බව කිව හැකිය.

චක්වළගල

● ටිරෝනි වෑවලගේ

බාබඩෝස් පාලකයෝ මහරැජන ධූරයෙන් නෙරපති

බටහිර කොදෙව් දූපත් හි තවත් එක් රාජ්‍යයක් වන බාබඩෝස් පසුගිය දිනයක ලෝකයේම අවදානය දිනා ගන්නා වෙනස්කම් තම පාලන තන්ත්‍රයට අදාළව සිදු කළේය. ඒ මෙතෙක් කලක් තම රාජ්‍යයේ ප්‍රධානියා ලෙස සැලකුණු බ්‍රිතාන්‍ය මහ රැජින තවදුරටත් තම රාජ්‍යයේ ප්‍රධානියා ලෙස නොසලකන බවත් එම තීරණය ලබන වසරේ සිට ක්‍රියාත්මක බවත් ප්‍රකාශ කිරීමය. බාබඩෝස් ස්වාධීන රාජ්‍යයක් වුවද එහි නාමික රාජ්‍ය නායකයා ලෙස මේ දක්වා බ්‍රිතාන්‍ය මහරැජින සලකණු ලැබීය.

යටත් විජිත යුගයේ සිට පැවති මේ ධූරය හදිසියේම වෙනස් කරමින් මහරැජින තවදුරටත් තම රාජ්‍ය නායකයා නොවන බව ප්‍රකාශයට පත් කිරීම පිටුපස චීනය සිටින බවට ප්‍රකාශයක් මහා බ්‍රිතාන්‍ය පසුගියදා සිදු කර තිබිණි.

ඒ යටතේ බ්‍රිතාන්‍ය චෝදනා කර සිටියේ චීනය කැරිබියානු කලාපයේ බලය ඉතා සූක්ෂ්මව අත්පත් කර ගනිමින් සිටින බවයි. එමෙන්ම 'චීන ආයෝජන යනු සියල්ල නොවන බවද' වටහා ගන්නා ලෙස මහා බ්‍රිතාන්‍ය බාබඩෝස් පාලකයන්ට පවසා ඇතැයි වාර්තා වේ.

පසුගිය වසර කිහිපයේදී බාබඩෝස් සහ චීනය අතර ද්විපාර්ශ්වික සබඳතා ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය විය. මේ යටතේ චීන ආයෝජන මේ වන විට බාබඩොස් දේශය පුරා දක්නට ලැබෙන අතර දීනමා සහ ප්‍රධාන ලෙස තාක්ෂණික උපකරණ සහ පාසල් සිසුන්ට ලැප්ටොප් පරිගණක සහ ටැබ් යනාදිය ලබා දී ඇතැයි වාර්තා වේ. චීනය ලොව පුරා ව්‍යප්ත කර ඇති 'මාවතක් සහ තීරයක්' ව්‍යාපෘතියට 2019 වසරේදී බාබඩෝස් සම්බන්ධ කර ගැනීමට චීනය කටයුතු යෙදීය. ඇතැම් රටවල් චීනයේ මේ 'මාවතක් සහ තීරයක්' යන ව්‍යාපෘතිය නව යටත්විජිතවාදයක් ලෙසින්ද සලකමින් චෝදනා කරනු දක්නට ලැබේ.

බටහිර රටවල චෝදනාව වන්නේ චීනය ණය සහ ප්‍රධාන ලබා දෙමින් දුගී රටවල් තම දේශපාලන ව්‍යාපෘතියට ඇඳා ගනිමින් සිටින බවයි.

එහෙත් මේ චෝදනාවලට ප්‍රතිචාර ලෙස බාබඩෝස් පාලකයන් පවසා ඇත්තේ තවදුරටත් බ්‍රිතාන්‍ය ජාතිකයකු තම රාජ්‍ය නායකයා ලෙස පවත්වා ගැනීමට තමන්ට අවශ්‍ය නොවන බවත්, ඒ වෙනුවට බාබඩෝස් ජාතිකයකු තම රටේ රාජ්‍ය නායකයා ලෙස තෝරා පත් කර ගැනීමට තමන්ට අවශ්‍ය බවත්ය.

මේ තීරණය ගනිමින් දෙවැනි එළිසබෙත් රැජින ධූරයෙන් ඉවත් කිරීමට තමන් තීරණය කර සිටියේ ඒ අනුව මිස කිසියම් චීන වැඩපිළිවෙළක් හේතුවෙන් නොවන බවද බාබඩෝස් පාලකයන් ප්‍රකාශයට පත් කර තිබේ.

බ්‍රිතාන්‍ය පොලිස් නිලධාරියා මරා දැමූ ශ්‍රී ලාංකිකයා අත්අඩංගුවට

පසුගියදා ලන්ඩන් නගරයේ කොයිඩොන් ප්‍රදේශයේ සිදුවූ වෙඩි තැබීමකින් පොලිස් නිලධාරියකු මරණයට පත්ව තිබේ. මෙහි අසතුටුදායක සිදුවීම වී ඇත්තේ එම වෙඩි තැබීමේ සිදුවීමේ සැකකරු ලෙස ශ්‍රී ලාංකිකයකු අත්අඩංගුවට පත්ව තිබීමය.

මියගොස් ඇති පොලිස් නිලධාරියා මාටියු රටන නම් වූ නවසීලන්ත ජාතිකයෙකි. වයස අවුරුදු විස්සේදී පමණ ලන්ඩනයට සංක්‍රමණය වී ඇති ඔහු කාගේත් සිත් දිනා ගනිමින් ජීවත් වූ පුද්ගලයකු ලෙස ප්‍රසිද්ධියක් උසුලා තිබේ. මියයන විට වයස අවුරුදු 54ක් වූ මේ පුද්ගලයා පොලිස් සේවයට අමතරව ක්‍රීඩා සමාජ පාපන්දු පුහුණුකරුවකු ලෙසින්ද කටයුතු කර තිබේ. කොයිඩොන් ප්‍රදේශවාසීන් දැඩි සේ කනගාටුවට පත්ව ඇත්තේ මෙවැනි පුද්ගලයකු මෙලෙස මරා දැමීම සම්බන්ධයෙනි.

මේ පොලිස් නිලධාරියා මරා දැමීම සම්බන්ධව චෝදනා ලබා ඇත්තේ ලුයිස් ද සොයිසා නම් වන 23 හැවිරිදි ශ්‍රී ලාංකික තරුණයෙකි. ඔහු ශ්‍රී ලංකාවේ සිට ලන්ඩනයට සංක්‍රමණය වූ පවුලක සාමාජිකයකු ලෙස හඳුනාගෙන තිබේ. මේ මරණය සම්බන්ධව දකුණු ලන්ඩනයේ ජනතාව දැඩි අප්‍රසාදය පළ කරන බැවින් මේ වන විට ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් දෝශදර්ශනයට ලක්වෙමින් පවතින බවද වාර්තා වේ.

මේ සිදුවීම සිදුවී ඇත්තේ පසුගිය සිකුරාදා එරට වේලාවෙන් රාත්‍රී 2.50ට පමණය. ලුයිස් ද සිල්වා නම් වූ මේ ශ්‍රී ලාංකික තරුණයා සහ කණ්ඩායම පිස්තෝලයක් ද සොරාගෙන යමින් සිටින බව කොයිඩොන් පොලීසියට දැනගන්නට ලැබී තිබේ. එහිදී මේ තරුණයා සහ ඔහු සමග සිටි සෙසු කණ්ඩායම ලුහු බැඳ ගිය පොලීසිය මේ තරුණයා අල්ලාගෙන ඔහුට මාංචු යොදා තිබේ. මේ 23 හැවිරිදි තරුණයා තම දෑත්වල මාංචු යොදා තිබියදීම අතේ වූ පිස්තෝලයෙන් උණ්ඩ පහක් සෘජුවම පොලිස් නිලධාරී මාටියුගේ හරීරයට එල්ල කර තිබේ. එහිදී ලුයිස් ද සිල්වා තරුණයාටද තුවාල සිදුවී ඇති අතර ඔහු ද මේ වන විට රෝහල් ගතව ප්‍රතිකාර ලබමින් සිටින බව වාර්තා වේ.

කෙසේ වුවද හෘදය ආසන්නයේ ඇතිවූ තුවාල හේතුවෙන් පොලිස් නිලධාරියා මරණයට පත්වූ අතර මේ වන විට ලුයිස් ද සොයිසා මිනිමරුම් චෝදනා ලබා සිටී.

ලුයිස් ද සොයිසා නම් වන මේ තරුණයා ලන්ඩන් නරගයේ පාසලකින් අධ්‍යාපනය ලබා ඇති අතර එහිදී ඔහු ඉගෙනීමෙහි ඉතා විශිෂ්ට දක්ෂතා දක්වා ඇති බව වාර්තා වේ. ඔහු කුඩා කාලයේදී ගණිතයට සහ විද්‍යාවට විශිෂ්ට දස්කම් පෙන්වා ඇති බවත්, යම් දිනක ඔහු ඔක්ස්ෆර්ඩ් සරසවියේ අධ්‍යාපනය ලැබීමට වරම් ලබා ගනු ඇති බවත් ඔහුගේ පාසල් මිතුරන් සඳහන් කර තිබේ. එහෙත් ඔහු ඒ වෙනුවට මත්ද්‍රව්‍ය සහ කල්ලි, කණ්ඩායම් ඇසුරට පෙලඹී තිබේ.

ඔහුගේ මව එලිසබත් නම් කාන්තාවක් වන අතර, පියා 'චන්න' නම් වන ශ්‍රී ලාංකිකයෙකි. ඔහු යෝග අභ්‍යාස ගුරුවරයකු ලෙස කටයුතු කළ බව වාර්තා වී තිබේ. කෙසේ වුවද පොලිස් නිලධාරියකු මරා දැමීම සම්බන්ධව සෘජුව චෝදනා එල්ල වන බැවින් ඔහුගේ අනාගතය ඉතාම අවිනිශ්චිත වනු ඇති බව අමුතුවෙන් කිව යුතු නොවේ. බීබීසී මාධ්‍ය මේ සාතනයට අදාළ පුවත වාර්තා කරමින් දක්වා තිබුණේ මෙලෙස මිය ගියේ පසුගිය මාස දොළහක කාලයේදී මෙවැනි සිදුවීම්වලින් මියගිය සය වැනි පොලිස් නිලධාරියා බවයි. කල්ලි, කණ්ඩායම් සහ මත්ද්‍රව්‍ය හේතුවෙන් බොහෝ පොලිස් නිලධාරීන් තම ජීවිත අනතුරේ හෙළන බවත්, ඔවුන් සේවය වෙනුවෙන් කැපවන බවත් දකුණු ලන්ඩනයේ මෙට්රෝ පොලිස් නිලධාරීන් මේ සිදුවීම හුවා දක්වමින් පෙන්වා දී තිබේ.

23 හැවිරිදි ලුයිස් ද සිල්වා තරුණයා තම දෑත්වල මාංචු යොදා තිබියදීම අතේ වූ පිස්තෝලයෙන් උණ්ඩ පහක් සෘජුවම පොලිස් නිලධාරී මාටියුගේ ශරීරයට එල්ල කර තිබේ.

මේ සිදුවීමට අදාළ සාක්ෂි සොයමින් පොලිස් කණ්ඩායම් මේ වන විටත් අදාළ ප්‍රදේශයේ සෝදිසි මෙහෙයුම් ක්‍රියාත්මක කරමින් සිටිති. එමෙන්ම ලුයිස් සමග සිටි බවට සැකපිට තවත් සිව් දෙනෙකුද අත්අඩංගුවට ගෙන තිබේ.

මියගිය මාටියු රටන පොලිස් නිලධාරියා වෙනුවෙන් බොහෝ පිරිසක් ශෝක වූ අතර ඔහුගෙන් පුහුණුව ලැබූ ක්‍රීඩා කණ්ඩායම්ද විශේෂ ශෝක කාලයක් ප්‍රකාශයට පත් කර තිබේ.

තලෛයිමන්නාරම් ජැටිය

මන්නාරම් පුරාවිදු උරුම මැකී යන ලකුණු

● රුක්ෂිලා වෙත්තමුණි

ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ වයඹ දිගින් පිහිටි මන්නාරම වර්ග කිලෝමීටර් 1996 කින් යුක්ත වූ අතර උතුරින් කිලිනොච්චි දිස්ත්‍රික්කයටත් නැගෙනහිරින් මුලතිව් හා වව්නියා දිස්ත්‍රික්කවලටත් දකුණින් අනුරාධපුර හා පුත්තලම දිස්ත්‍රික්ක වලටත් බටහිරින් මහා සමුද්‍රයටත් සීමා මායිම්ව පිහිටා ඇත. මඩු, මන්නාරම, මාන්තායි බටහිර, මුසලි හා නානාට්ටාන් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස යටතේ ග්‍රාම නිලධාරි වසම් 153 කට බෙදා මන්නාරම් දිස්ත්‍රික්කයේ සිවිල් පරිපාලන කටයුතු සිදු කෙරේ.

මන්නාරම් දිස්ත්‍රික්කයේ පිහිටි උරුමයන් අතර මාතොට පැරණි වරාය හා දිය අගල සුවිශේෂත්වයක් උසුලයි. මන්නාරම - යාපනය මාර්ගයේ කිලෝමීටර් 6 ක් පමණ ගමන් කර මාන්තෙයි හන්දියෙන් තිරුකේෂ්වරම් කෝවිල වටා පිහිටි දිය අගලට පිවිසිය හැකිය. මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිරුකේතිෂ්වරම් ග්‍රාම නිලධාරී වසමට අයත් තිරුකේතිෂ්වරම් ග්‍රාමයෙහි මාතොට පැරණි වරාය සහ දිය අගල පිහිටා ඇත.

ශිලා ලේඛන හා සාහිත්‍ය ග්‍රන්ථවල දැක්වෙන පරිදි මාතොට විවිධ නම්වලින් ව්‍යවහාර කර ඇත. එනම්, මහතොට, මහවොටි, මහතිත්ත, මහපුටු, මහවුටු, මවතුතොට, මහපටන හා මොඩුතොට යනාදි වශයෙනි. මාන්තොට්ටම් ලෙස දෙමළ භාෂාවෙන් හඳුන්වනු ලබයි.

ආචාර්ය ශිරාන් දැරණියගල ඇතුළු විද්වතුන්ගේ මතය වූයේ විවිධ ජන කණ්ඩායම් මෙරටට සංක්‍රමණය වීමට මූලික හේතුවක් ලෙස වරාය ආශ්‍රිතව ගොඩනැගුණු වෙළඳ නගර බිහිවීමය. ඔවුන් තම ආර්ථික, දේශපාලන හා සමාජීය අවශ්‍යතා මූලික කොටගෙන එම නගර ආශ්‍රිතව ජීවත් විය.

ක්‍රි.ව. දෙවන සියවසේ දී ටොලමි විසින් මදෙට්ටු (Madouttu) ලෙස මෙම ස්ථානය හඳුන්වා ඇත. පුරාවිද්‍යාඥයින්ගේ අදහස වනුයේ ලංකාවේ පැරණිම වරාය මාතොට හෙවත් මහාතිත්ථ යන්නය. ක්‍රි. පූ. 2 වන සියවසේ සිට ක්‍රි.ව. 13 වන සියවස දක්වාම සක්‍රියව පැවති යැයි අනුමාන කරන මෙම වරාය අනුරාධපුර රාජධානියට ආසන්නව පැවතිණි. එමෙන්ම මාතොට වරාය එකල ප්‍රධානතම වරාය වූ බව ද සඳහන්ය.

මාතොට පැරණි වරාය හා දිය අගල

1887 දී මාතොට වරාය ආශ්‍රිතව පුරාවිද්‍යා කැණීම් කටයුතු ආරම්භ කර ඇති අතර 1907, 1926-1928, 1950-1951, 1970 හා 1980-1984 යන වර්ෂ වලදී විටින් විට කැණීම් සිදුකොට තිබේ. එම කැණීම් වලින් ලැබූ සාධක අනුව චීනය, අරාබිය, ග්‍රීක, ජපන්, අරාබි හා රෝමය ආදි රටවල් සමඟ වෙළඳ සබඳතා පැවති බවට අනාවරණය වේ.

එමෙන්ම මාතොට ප්‍රදේශයේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස පිළිබඳ සාධක ද මෙහිදී සිදුකළ කැණීම් මගින් සොයා ගැනීමට ආචාර්ය ශිරාන් දැරණියගල සමත් වී ඇත. මෙහිදී අනාවරණය කර ගත් සාධක අනුව මාතොට ක්‍රි.පූ. 1800 වන විට මධ්‍ය ශිලා යුගයට අයත් මානව ජනාවාසයකි. මුහුදු සත්ත්ව අවශේෂ මෙම කැණීම් තුළින් හමු වූ අතර ජ්‍යාමිතික හැඩැති ශිලා මෙවලම් රැසක් ද සොයා ගැනීමට හැකි වී ඇත. මහාචාර්ය චන්දන රෝහණ විතානච්චි මෙම ස්ථානයෙන් හමු වූ සාධක අනුව සඳහන් කරන්නේ ක්‍රි. පූ. 02 වන සියවසේ දී මූල ඓතිහාසික යුගයට අයත් ජනාවාසයක් මෙහි තිබූ බවය. එසේම මෙම කාලවකවානුවට අයත් කාලරක්ත වර්ණ මැටි බඳුන් හා රූලේටඩ් වර්ගයේ මැටි බඳුන් ද සොයාගෙන ඇත.

මෙහි ප්‍රාකාර දෙකක් හා දිය අගල් දෙකකින් වට වූ බළකොටුවක් තිබෙන්නට ඇතැයි යන්න සඳහන්ය. මාතොට වරාය ස්වභාවික වරායක් වූ අතර ඊට නුදුරු මුහුදේ නැංගුරම් ලා එහි සිට කුඩා යාත්‍රා ඔස්සේ විදේශිකයන් තම ගනු දෙනු සඳහා ගොඩබිමට පැමිණෙන්නට මෙහි ඇති දිය අගල් උපයෝගී කරගන්නට ඇතැයි යන්න ද මෙම භූමිය මාතොට ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කරන්නට ඇති බව ද විද්වතුන්ගේ මතයයි.

Ancient Ceylon (Vol 5) හි දක්වා තිබෙන්නේ දිය අගල් දෙකකින් යුතු මෙම වෙළඳ නගරයේ බිම් ප්‍රදේශය අශ්ව ලාඩමක හැඩය ගත් බවය. වර්තමානයේ දී පසින් යට වූ නගරයක් ලෙස මෙම වරායට අයත් භූමිය දැක්විය හැකිය යන්න පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදුකළ ගවේෂණය සම්බන්ධයෙන් ලියවුණු මන්නාරම දිස්ත්‍රික්කය (M.V.G කල්ප අසංග, I.P.S. නිශාන්ත) ග්‍රන්ථයේ වැඩිදුරටත් විස්තර කොට ඇත.

එමෙන්ම තිරුකේතීෂ්වරම් කෝවිල හා ඒ වටා වූ පැරණි ජනාවාස සාධක සහිත දිය අගල් ද්විත්තයෙන් වට වූ භූමිය මාතොට පැරණි වෙළඳ නගරයට අයත් වේ යැයි සඳහන්ය. මෙම ප්‍රදේශයේ බහුල ලෙස චීන මැටි බඳුන් කැබලි, වෙනත් විදේශීය මැටි බඳුන් කැබලි, පබළු හා වළං කැබලි හමු වී ඇත. එමෙන් ම මෙහෙ දී වීදුරු නිෂ්පාදන උඳුනකට අයත් බිත්ති කොටස් සහ උණු වූ අපද්‍රව්‍ය සමඟ බැඳුණු කොටස් හමුවීම සුවිශේෂීය.

අරිප්පු බළකොටුව

අරිප්පු කොටුව මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අරිප්පු බටහිර ග්‍රාම නිලධාරී වසමේ මුක්තරිපුත්තුරය ග්‍රාමයේ පිහිටා ඇත. මැදවච්චිය - මන්නාරම මාර්ගයේ මුරුක්කන් හන්දියට පැමිණ සිලාවතුර අරිප්පු මාර්ගයේ කිලෝ මීටර් 4 ක් ගමන් කිරීමෙන් මෙම ස්ථානයට පිවිසිය හැකිය.

කුඩා ප්‍රමාණයේ බළකොටුවක් වූ මෙය පෘතුග්‍රීසීන් විසින් පළමුව ඉදිකර ඇත. පසුව ලන්දේසීන් විසින් මෙම බළකොටුව අත්පත් කරගත් අතර එහි නවීකරණ කටයුතු සිදුකරනු ලැබීය. දැනට දක්නට ඇති ඉතාම කුඩා බළකොටුව ලෙස මෙය සැලකේ. කාලතුවක්කු බැස්ටියන් (Gun Bastion) දෙකකින් යුක්තය. මුතු කැඩීම ආශ්‍රිත කටයුතු සඳහා මෙම බළකොටුව උපයෝගී කරගත් බවත් එසේ කඩන ලද මුතු එකතු කිරීමට යොදාගත් එකම බළකොටුව ලෙසත් අරිප්පු හැඳින්වේ. සෑම

ඩොරික් ඇතුළත බිත්ති

ඩොරික් මන්දිරය

මුහුදු බාදනයට ලක් වූ ඩොරික් මන්දිරය

වසරකම මාර්තු- අප්‍රේල් මාසවල මුතු බෙලි කර්මාන්තය සිදු කරනු ලබයි. එසේ මුතු බෙල්ලන් එකතු කොට ගබඩා කිරීමෙන් පසුව මුතුවල වර්ණය, ප්‍රමාණය හා ඔපය අනුව කොටස් වලට බෙදා වෙළඳ පොළට නිකුත් කළ බව සඳහන්ය.

කොරල් ගල්, නුණු ගල් හා පිළිස්සූ ගඩොල් භාවිතා කර අරිප්පු කොටුවේ ශේෂව ඇති පල්ලිය ඉදිකොට ඇති බව දැක්වේ. එසේම කොටුව වටා ඇති තාප්පය ද විනාශ වී ගොස් ඇති අතර තැනින් තැන ඇතැම් කොටස් දක්නට ලැබේ. 1878 අප්‍රේල් 14 වැනිදා ලෙසින් සටහන් කරන ලද සොහොන් කොතක් මෙහි දක්නට ලැබේ. එය චාර්ලිස් ලෙයස් නම් ඉංග්‍රීසි ජාතික බැංකු නිලධාරියෙකුගේය. එසේම පැරණි ළිඳක් ද කොටුවට ආසන්නව පිහිටා ඇත.

ඩොරික් මන්දිරය

මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අරිප්පු නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ මුහුදු වෙරළට මායිම්ව ඩොරික් කුලුනු භාවිතාකොට ඉදිකිරීම හේතුවෙන් ඩොරික් ලෙස මෙම මන්දිරය හඳුන්වා ඇත. ක්‍රි.ව. 1798-1805 අතර කාලවකවානුවේ දී මෙරට ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළ ෆ්‍රෙඩ්රික් නෝර්ත් මන්නාරම පෙදෙසේ මුතු කැඩීමේ කටයුතු අධීක්ෂණය කිරීමට පැමිණි අවස්ථාවේ නවාතැන් ගැනීම සඳහා මෙම ගොඩනැගිල්ල ප්‍රාදේශීය ඉංජිනේරු නාජල් විසින් ක්‍රි.ව. 1802 දී ඉදිකර ඇත. එසේම 1820 දි සර් එඩ්වඩ් බාර්න්ස් විසින් පැරණි පෘතුග්‍රීසි පල්ලිවල අමුද්‍රව්‍ය භාවිතා කරමින් මන්නාරමේ රජයේ ගොඩනැගිලි හා ඩොරික් ගොඩනැගිල්ල අලුත් වැඩියා කළ යුතුය යන්න අණ කර ඇතැයි යන්න සඳහන්ය.

මහල් දෙකකින් යුත් මෙම මන්දිරයේ පහත මාලයේ කුඩා කාමර හතරක් පිහිටා තිබී ඇති අතර වර්තමානයේ දී කාමර දෙකක් පමණක් හඳුනාගත හැකිය. වාස්තු විද්‍යාත්මක ලක්ෂණ අනුව ඉතා අලංකාර ගොඩනැගිල්ලක් ලෙස මෙය වාර්තා වේ. ගොඩනැගිල්ල මධ්‍යයෙහි ඉහළ මාලයට නැගීමට පියගැට පෙළක් දක්නට ඇත. මුහුදු බාදනය හේතුවෙන් මෙහි පසුපස කොටස සම්පූර්ණ වශයෙන් මුහුද දෙසට කඩා වැටී තිබේ. ගඩොලින් නිමවා හුණු බදාමයෙන් කපරාරු කර ඇති ගොඩනැගිල්ලෙහි සියලුම දොර ජනෙල් ආරක්කුව සහිතව ඉදිකර ඇත. ආණ්ඩුකාරයාගේ නිදන කුටියත්, භෝජන ශාලාවත්, බටහිර හා නැගෙනහිර දිසාවනට සඳළුතල දෙකකුත් ඉහළ මාලයේ තිබුණු බවට සඳහන් වේ.

ඩොරික් මන්දිරයේ සිට එකල මන්නාරමේ ඉහළ ආදායමක් ලැබූ කොන්ඩච්චි පෙදෙසේ මුතු කැඩීම පිළිබඳව ආණ්ඩුකාර විසින් අධීක්ෂණ කටයුතුවල නිරතව සිට ඇත. එසේම එමගින් ලබාගත් මුතු විවිධ රටවලට අලෙවි කිරීම සිදු වූ බව ද වාර්තා වේ.

ජැටිය හා දුම්රිය ස්ථානය

මන්නාරම - තලෛයිමන්නාරම මාර්ගයේ කිලෝමීටර් 28 ක් පමණ ගමන් කිරීමෙන් පසු දුම්රිය ස්ථාන හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 1.5 ක් පමණ වෙරළට පැමිණ මීටර් 600 ක් පමණ වෙරළ තීරය ඔස්සේ ගමන් කළ විට මන්නාරම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඕල්ඩ්පියර් ග්‍රාමයේ තලෛයිමන්නාරම් ජැටිය පිහිටි ස්ථානයට පිවිසිය හැකිය.

තලෛයිමන්නාරමේ පිහිටි පැරණිම ජැටිය ලෙස සැලකෙන මෙය වසර 100 කට වඩා පැරණිය. මුහුදු ජලය හා මුහුදු සුළං හේතුවෙන් බොහෝ කොටස් විනාශ වී ඇති මෙම ජැටියේ යකඩ කණු වර්තමානයේදී ද දැකගත හැකිය. මෙහි කණු දෙකක් අතර පරතරය මීටර් 5.8 කි. ජැටියේ පළල මීටර් 7.8 ක් වන අයුරින් සමාන්තරව කණු දෙකක් බැගින් සිටින සේ සිටුවා ඒ මත ජැටිය ගොඩනගා ඇත. මීටර් 1.5 ක ප්‍රමාණයකින් කණුවක වට ප්‍රමාණය ද මීටර් 2.2 කින් එහි උස ද සටහන්ව ඇත.

ශ්‍රී ලංකාවේ තලෛයිමන්නාරම් ජැටිය සහ ඉන්දියාවේ ධනුෂ්කොඩි අතර ඒකාබද්ධ මෙම ප්‍රවාහන සේවය ආරම්භ කර ඇත්තේ 1914 වසරේදීය. නොගැඹුරු පෝක් සමුද්‍ර සන්ධිය හරහා ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාව වෙත පාරු සේවයක් ක්‍රියාත්මකව තිබී ඇති අතර එහිදී එක් නැවතුම්පළක් ලෙස තලෛයිමන්නාරම භාවිතා කොට ඇත. 1964 වසරේ දෙසැම්බර් මසදී දරුණු සුළි කුණාටුවකින් මෙම ජැටිය දැඩි ලෙස හානියට පත්විය. අතිවිශාල ජීවිත සහ දේපොළ හානි සිදුකරමින් ධනුෂ්කොඩි වෙත බලපෑ සුළි කුණාටුව ජීවිත හානි 1,800කට වැඩි ප්‍රමාණයක් බිලිගනිමින් හමාගිය අතර ඒ සුළි සුළඟ හේතුවෙන් ජැටිය පමණක් නොව ධනුෂ්කොඩි දුම්රිය ස්ථානය ඇතුළු සියල්ල විනාශවී ගොස් ඇත. මෙම පාරු සේවය ඉන්දු - ලංකා දුම්රිය සේවයේ කොටසක් ලෙස ක්‍රියාත්මකව පැවැති අතර, පාරුව ඔස්සේ මගීන් තලෛයිමන්නාරම සිට ඉන්දියාවේ රාමේෂ්වරම් දූපතේ ධනුෂ්කොඩි දක්වා රැගෙන යන ලදී. එමෙන්ම ගොඩබිම සිට පැමිණෙන දුම්රියෙන් භාණ්ඩ සහ මගී ජනතාව ෆෙරි යාත්‍රාව වෙත හුවමාරු කරගැනීම පහසු කිරීම වෙනුවෙන් මුහුද මැදට දිවයන විශේෂ ජැටි තලෛයිමන්නාරමේ සහ ධනුෂ්කොඩිහි ඉදිකර ඇත.ශ්‍රී ලංකා රජයේ දුම්රිය සේවයට අයත් දුම්රිය ස්ථානය මගින් ජැටියෙහි මෙහෙයවීම් සිදු කරන ලදී.

මේ අනුව මන්නාරම දිස්ත්‍රික්කය තුළ සැලකිය යුතු පුරාවිද්‍යා වටිනාකමින් යුතු උරුමයන් රැසක් විසිර පවතී. එම උරුමයන් මනාලෙස නඩත්තු කළහොත් අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කරගත හැකිය.

2020 - 10 - 10 දක්වා

මේෂ - නිර්මාණශීලී බව මතු කෙරේ

මේෂ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 01 - 02 - 03 යන ස්ථානවල ගමන් කරමින් යහපත් මානසික සුවයකට කරුණු සලසයි. නිර්මාණශීලී බව හා සිතේ සතුට රජයන සතියකි. ධන සම්පත් හිමි වන ඒ තුළින් ඉඩමක් නිවසක් මිලදී ගැනීම යන ලැබීම් ඇති කෙරේ. කිසියම් අසනීප තත්ත්වයක් පෙන්වන අතර උරහිස දණහිස ආශ්‍රිත උවදුරු එළඹෙන බව පෙනෙන්නට ඇති නිසා කල්පනාකාරී වන්න. තමාට හිමි වෙන්නට තිබී අන්සතුවූ දේපළක් නැවත ඔබට හිමි වන ලකුණු පෙනේ.

වෘෂභ - රැවටිලිවලට හසු වේ

වෘෂභ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා 12 - 01 - 02 යන ස්ථානවල ගමන් කරමින් ඔබට සතිය ආරම්භයේ කිසියම් ධන හානියකට හේතු ඇති කළත් සතිය මැද භාගයේ සිට එම ආපදාව මග හැරෙනු ඇත. බොහෝ දුර සිට පැමිණි හිතවතකු නිසා කිසියම් රැවටීමකට හසුවිය හැකි අතර කල්පනාකාරීව කටයුතු කළහොත් එය මඟහරවා ගැනීමට ඔබට හැකි වෙයි. පාදයේ වළලුකර ආශ්‍රිත අගුණ මතු කෙරේ. ඇස් රෝග මතු කෙරෙන සතියකි.

මිථුන - වාසනාවන්ත දරු සම්පත්

මිථුන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 11 - 12 - 01 යන ස්ථාන පසු කරමින් ඔබට යහපත් ආර්ථික වාසියක් ද හිමි කර දෙමින් සිතේ සතුට ලැබදීමට සමත් වෙයි. එහෙත් තුනටියේ ආපදාවක් නිසා හදිසි මුදල් වැය කිරීමකටද හේතුවෙයි. දරු සම්පත් බලාපොරොත්තු වන මවුවරුන්ට පියවරුන්ට වාසනාවන්ත දියණිවරු ලැබෙන සතියක්ද වෙයි.

කටක - රැකියා ප්‍රතිලාභ

කටක ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතිය ඉතා වාසනාවන්ත සතියක් වන අතර රැකියා බලාපොරොත්තුවූ අයට රැකියා ඵලද උසස් වීම් හා වේතනයේ ඉහළ යාමක්ද පෙන්වයි. පපුවේ සෙම, හතිය වඩන තත්ත්වයක් පවතින නිසා ඇල් වතුර භාවිතය, රාත්‍රි කාලයේ ස්නානය සුදුසු නැත. කෙසේ නමුත් තමාගේ කියා වාහනයක් නිවසක් හෝ එබඳු භෞතික සම්පත් හිමි වීමක්ද පෙනෙන්නට තිබේ.

සිංහ - මවු පාර්ශ්වයේ උරුමයක්

සිංහ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 09 - 10 - 11 යන ස්ථානවල ගමන් කරමින් පෙර පිං මතු කරන සතියක් උදාවෙයි. විශේෂයෙන් මවු පාර්ශ්වයේ උරුමයක් හිමි වන බව පෙනේ. යටි බඩ, මුත්‍රගත රෝග මතු කෙරේ. කෙසේ නමුදු ඒ වෙනුවෙන් මුදල් වැය කිරීමක්ද සිදු වේ. සකසුරුවම අවශ්‍ය සතියකි.

කන්‍යා - හිතවතුන්ගේ අකල් මරණයක්

කන්‍යා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 08 - 09 - 10 යන ස්ථානවල ගමන් කිරීම නිසා සතිය ආරම්භය තම හිතවතුන්ගේ අකල් මරණයක් නිසා සිත් තැවුලකට හේතු වන අතර ඒ වෙනුවෙන් දැඩි වෙහෙස මහන්සියක් දැරීමට සිදුවේ. උගුරේ ආසාදිත බවක් මතු කෙරේ. තවද කාන්තාවකගේ රැවටිලි බස් නිසා කිසියම් නින්දා සහගත තත්ත්වයකට ඔබ පත්වන ලකුණු පෙනේ.

තුලා - යහපත් මංගල යෝජනා

තුලා ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 07 - 08 - 09 යන ස්ථානවල ගමන් කිරීම නිසා සතිය ආරම්භයේ මංගල යෝජනා පැමිණේ. විවාහක අයකු නම් විවාහ ජීවිතයේ තිබූ ගැටලු කිපයක් නිරාකරණය වන ලකුණු පෙනේ. කෙසේ වුවද සිතේ සතුට පැමිණේ. ඉගෙනුම ලබන අයකු නම් තම ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට ශක්තිමත් අඩිතාලමක් වැටෙන සතියකි.

වෘශ්චික - සිත් කලකිරීම්

වෘශ්චික ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මෙම සතියේ චන්ද්‍රයා 06 - 07 - 08 යන ස්ථානවල ගමන් කිරීම නිසා කිසියම් අයුරක සිත් කලකිරීමකට හේතුවේ. තමාගේ ක්‍රියා කලාපයක් අන් අයගේ දෝෂ දර්ශනයට ලක්වන ලකුණු පෙනේ. යටි බඩේ රෝග හා කෑම අජීර්ණයක් නිසා ඇතිවන රෝගී තත්ත්වයකින් පීඩා විඳීමට සිදුවේ. ඔබ කෙනෙකුගේ ණය මුදලකට ඇප කරුවකු ලෙස අත්සන් තැබීමෙන් ගැටලු රාශියකට මුහුණ දෙන සතියකි.

ධනු - ශෛල්‍යකර්මයකට හේතු වේ

ධනු ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව මේ සතියේ චන්ද්‍රයා 05 - 06 - 07 යන ස්ථානවල ගමන් කරමින් යහපත් දරුඵලයකට හිමිකම් කියන සතියකි. ශෛල්‍යකර්මයක් හෝ හදිසි වැටීමක් නිසා ඇති විය හැකි ආපදා තත්ත්වයක්ද පෙන්වන නිසා ප්‍රවේශම් වන්න. තමාට හිමි වන්නට තිබී කිසියම් අයුරකින් යටපත්ව තිබූ ධනයක් හිමි වන සතියකි. තම අභිලාෂ ඉටුකර ගැනීමට මහත් අධිෂ්ඨානයෙන් කටයුතු කරන සතියකි.

මකර - සෙම් අධික කෙරේ

මකර ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා 04 - 05 - 06 යන ස්ථානවල ගමන් කරමින් පපුවේ හිසේ සෙම ගතියක් නිසා පීඩා විඳීමට සිදුවන නමුදු ආර්ථික අතින් නම් සුබ වෙයි. රැකියා ලාභ හා නිවසක් ඉදිකිරීමට සුදුසු වාතාවරණය සැලසේ. විවාහක අයගේ යුග දිවියට විවිධ තර්ජන එල්ල විය හැකි නිසා කල්පනාකාරී විය යුතුය. ඉවසීමෙන් හා බුද්ධි ගෝචරව කටයුතු කිරීමෙන් කල් ගෙවන්න.

කුම්භ - දේපළ හිමිකමක්

කුම්භ ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මෙම සතියේ 03 - 04 - 05 යන ස්ථානවල ගමන් කරමින් දේපළ හිමි කමකට හේතු මතු කෙරේ. තමාට කලක් තිස්ස පැවතුණු නඩු තීන්දුවක් තමාට වාසි සහගත ලෙස විසඳෙනු ඇත. උරහිස ආශ්‍රිත උවදුරක් පිළිබඳ පෙර ලකුණු පළ කරන නිසා ප්‍රවේශම් වන්න. ජලාශ ආශ්‍රිත වැව්, අමුණු ආශ්‍රිත කටයුතු කෙරෙන් ප්‍රවේශම් වන්න. කෙසේ නමුදු ආර්ථික අතින් ලැබීම් ඇති වනු ඇත.

මීන - හදිසි ධන ලාභ

මීන ලග්නය හිමි ඔබගේ කේන්ද්‍රයට අනුව චන්ද්‍රයා මේ සතියේ 02 - 03 - 04 යන ස්ථානවල ගමන් කරමින් හදිසි ධන ලාභයකට හේතු මතු කෙරේ. දරු සම්පත් අපේක්ෂා කරන්නන්ට දරු සම්පත් උදාවේ. නිකරුණේ සිදු වන ධන හානිද ඇති වේ. උගුරේ නිතර නිතර ආසාදිත ලකුණු පළ කෙරේ. සෙම වඩන ආහාර පානාදියෙන් වැළකී සිටීම එම අපහසුතා මඟ හරවා ගැනීමට ඇති මාර්ගයයි. රාත්‍රි කාලයේ ගමන් බිමන් වලින් ප්‍රවේශම් වන්න.

බෞද්ධ මතයට අපි එකඟයි. ඒත්...

මුස්ලිම් කවුන්සලයේ සභාපති.
එන්. එම්. අමීන්

ශ්‍රී ලංකාව කියන්නේ බෞද්ධ ජනතාව බහුතරයක් ජීවත් වෙන රටක්. ගව ඝාතනය නැවැත්වීම බහුතර ජනතාවගේ අභිලාෂයක් නම් රජය එය කිරීමට කටයුතු කරනවා නම් එය කළ යුතුයි.

මුස්ලිම් ජනතාව ගව මස් ආහාරයට ගන්නවා මස් වෙළඳාම කරනවා කියලා සමාජයේ මතයක් තියනවා. ඒ නිසා මුස්ලිම්වරුන්ට මෙයින් ගැටලුවක් ඇති වෙයිද කියලා කියනවා. අපේ ආගමේ හරක් මස් කන්න කියලා නැහැ. ඇතැම් පිරිස් මස් වෙළඳාමේ නියුතු වූ නිසා යම් බලපෑමක් ඇති වෙයි කියලා සමහරු කියනවා. මේ පසුබිම තුළ අපිට එළුමස් කන්න පුළුවන්, මාළු කන්න පුළුවන්, සමහර විට මුස්ලිම් ජනතාවට එකම සාධකයක් වන්නේ හජ් වන්දනා කාලයේ අපි මේ ගවයන් බිලි පූජා දෙන්න තියනවා, ඒත් එය අනිවාර්යය නැහැ. ඇත්තටම අපි එහිදී කරන්නේ බිලි දීමෙන් අනතුරුව ගවයන් දුප්පත් මිනිසුන්ට බෙදා දෙනවා. එයට කියන්නේ 'කුරුබාන්' කියලා. නබිතුමාටත් පෙර කාලයේ ඓතිහාසික සිදුවීමක් නිසා ලෝකය පුරා මුස්ලිම් ප්‍රජාව මෙය කරනවා. ඒත් හැම පවුලකටම එක්කෙනෙක් කළා නම් හොඳයි. ඒ සඳහා එළුවා, ඔටුවා වැනි සතුන් යොදා ගන්නත් පුළුවන්. මේ අවස්ථාවේදී එළුවන් මිල වැඩියි. කල් යාමේදි එය සකස් වෙයි. රටේ ගොවියන්ට මෙයින් විශාල බලපෑමක් එල්ල වෙන්න පුළුවන්.

ගොවියෝ තමයි අපේ මිනිස්සුන්ට මේවා විකුණන්නේ. ගොවියන්ට සෑහෙන ප්‍රශ්නයක් වෙයි. මුස්ලිම් අයට මෙයට ලොකු දෙයක් වෙන එකක් නැහැ. ගොවියන්ට මෙය කෙසේද බලපාන්නේ කියන කාරණාවයි අපි බලන්න ඕන. ගොඩක් අය හිතන්නේ මුස්ලිම් අයට මෙයින් ලොකු බාධාවක් වෙයි කියලා. නමුත් එහෙම විශේෂයක් නැහැ. එක්තරා ආගමක බලපෑමක් තිබෙනවා නම් අපි එයට ගරු කළ යුතුයි.

පිටරටින් ගෙන්වා විකුණුවත් සාමාන්‍ය මිලට ලබා දිය නොහැකි සේම සෑහෙන මිල ඉහළ යාමක් සිදුවෙන්න පුළුවන්. එයට සාපේක්ෂව අනෙක් මස් මාළු වර්ගවලත් මිල ඉහළ යයි. ඒ ගැනත් සැලසුම් තිබිය යුතුයි

සියලු ලාංකිකයන්ට යහපත් තීරණයක්

ගවඝාතන විරෝධී ජාතික සංවිධාන එකමුතුවේ සභාපති
ශ්‍රීලංකා රාමඤ්ඤ මහා නිකායේ දක්ෂිණ ලංකාවේ ප්‍රධාන සංඝ නායක
ඕමල්පේ සෝභිත නා හිමි

අගමැති මහින්ද රාජපක්ෂයන් විසින් ගව ඝාතනය නතර කිරීමට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම් රැස්වීමකදී යෝජනාව කර තිබුණා. අගමැතිවරයා ඉදිරිපත් කළ එම යෝජනාව පිළිගෙන ගව ඝාතනය නතර කළ යුතු බවට එම මන්ත්‍රීන් කණ්ඩායම පිළිගෙන තිබුණා. මෙය අත්‍යවශ්‍ය කාරණාවක් ලෙස කිසිදු ජාති භේදයකින් තොරව මන්ත්‍රී කණ්ඩායමම තීරණය කිරීම ගැන කෘතවේදී විය යුතුයි.

ඒ මන්ත්‍රී කණ්ඩායමේ විවිධ මත තියෙන අය හිටියත් මේ අවස්ථාවේදී සදාචාර සම්පන්නව මෙවැනි තීන්දු තීරණ ගැනීම සම්බන්ධයෙන් මම පෞද්ගලිකව ස්තුතිය පළ කරනවා. මෙය සෑම පුද්ගලයෙක්ම සංවිධානයක්ම ගරු කරන තීරණයක්. ඒ තීරණය ඒ ආකාරයෙන් ම ක්‍රියාත්මක වෙයි කියලා. මේ රටේ සදාචාරය ගරුකරන ජනතාව බලාපොරොත්තු වෙනවා. ගව ඝාතනය නතර කරන ලෙස දශක ගණනාවක් පුරා මඩිහේ පඤ්ඤාසීහ වැනි මහ නා හිමිවරුන්, අනගාරික ධර්මපාල තුමා වැනි දේශමාමකයින් ජාතික නායකයන් විසින් කරන ලද මහ අරගලයක් තිබුණා. හරක් මස් කෑමට විරුද්ධව එදා ගිහි පැවිදි නායක හිමිවරුන් පවා හඬ නැගුවා. ඒ බලාපොරොත්තුව හැමදාම ජනතාව තුළ තිබුණා. ඒ බලාපොරොත්තුව මෙවර ඉටු වේවි යන කාරණාව පිළිබඳවත් බලාපොරොත්තුවක් අපිට තියෙනවා .

මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම ගැන අගමැතිතුමාට පින් දෙනවා. ඒ වගේම ආණ්ඩු පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට ප්‍රශංසාව පුද කරනු ලබනවා. ගවඝාතනයට විරුද්ධව අවිහිංසාවාදී සංවිධාන, රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය වැනි සංවිධාන එකතු වුණා. ඒවගේම සර්වෝදය වැනි සංවිධානත් එකතු වුණා. ඒ පිරිස මේ සම්බන්ධයෙන් හඬක් නැගුවා. මෙවන් පරිසරයක් යටතේ අපි බලාපොරොත්තු වෙනවා රජය ගත්ත මේ පියවරට මහජනතාව සහාය ලබා දෙයි කියලා. රජය ජනමතයට අනුව ක්‍රියාකළ යුතුයි. ඒ අනුව අපි මේ සම්බන්ධයෙන් ජනතාව අතරට ගිහින් ජනමතය හදන්න උත්සාහ කළා. ඒ සමගම කැබිනට් මණ්ඩල අනුමැතිය මෙයට හිමි වීම සම්බන්ධයෙන් අපි බෙහෙවින් සතුටට පත්වෙනවා.

සදාචාරය ගරු කරන ගිහිපැවිදි සියලු දෙනා සතුටට පත් වෙනවා මේ තීරණය ගැන. ඇමැති මණ්ඩලය මේ කාරණාව ඒකමතිකව අනුමත කිරීමත් අගය කළ යුතුමයි. ඉතා ඉක්මනින් ඒ නීතිය ක්‍රියාත්මක කරන්නේ නම් එය විශාල භාග්‍යයක්.

මෙය හුදු ආගමික ප්‍රශ්නයක් නොවෙයි, වෙනත් ආගමිකයන්ට වුවමනා නැති හුදු බෞද්ධයන්ට පමණක් වුවමනා දෙයක් නොවෙයි. ගව ඝාතනයට විරුද්ධ බලවේග සම්බන්ධයෙන් ආගමක් ගාවා ගන්නම එපා කියලයි මම ඉල්ලන්නේ. මෙතැන සෞඛ්‍යමය ප්‍රශ්නයක් තියෙන්නේ.

වෛද්‍යවරුන් පවා ජනතාව දැනුවත් කරනවා ගව මස් ආහාරයට ගැනීමේ විපාකයන් ගැන. පොදුවේ සියලු ආගමිකයන්ට, ජාතීන්ට බලපාන කරුණක් ලෙස මෙය සඳහන් කරන්න පුළුවන්.

ආගමික භේදයකින් තොරව ගන්නා ලද මේ තීරණය අගය කළ යුතුයි. මේ තීරණය සියලුම ශ්‍රී ලංකීය ජාතියේම යහපත පිණිසයි කියලයි අපි කියන්නේ.

ජීවිකාවන් රැසක් අහිමි වෙන වැඩක්

සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී
මුජබර් රහුමාන්

ගව ඝාතනය තහනම් කරන්න මේ ආණ්ඩුව තීන්දුවක් ගත්තේ ඇයි කියන හේතුව අපි තාම දන්නේ නැහැ.

ඒ පිළිබඳව තවමත් මේ අය කියන්නේ නැහැ. ඒ සඳහා වන හේතුව පැහැදිලි කළ යුතුයි. මුස්ලිම් ජනතාව පමණක් නොවෙයි මේ රටේ සිංහල ක්‍රිස්තියානි ජනතාව, ආරක්ෂක අංශවල අයට ගව මාංශ ඕන වෙනවා. එමෙන්ම විශාල පිරිසක් ගව මාංශ ආශ්‍රිතව දිවි ගෙවනවා. දැන් ඒ අය ජීවත් වෙන්නේ කොහොමද?

ගවමස් විතරක් නොවෙයි ඒ හම් වලින් නොයෙක් භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තත් තියෙනවා. ඍජුව හා වක්‍රාකාරව ජීවත් වූ බොහෝ පිරිසක් මේ නිසා අතරමං වෙනවා. එවන් තත්ත්වයක් උඩ මේ තහනම ඇත්තෙන්ම අපට නම් ප්‍රශ්නයක්.

මේ නිසා රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකට රැකියා අහිමි වෙනවා. එය බලවත් ලෙසින් ජනතාවගේ ආර්ථිකයට බලපානවා. කොරෝනා වලින් ආර්ථිකයට දරුණු ප්‍රහාරයක් එල්ල වෙලා තියෙන වෙලාවට රටේ ආර්ථිකය තවත් විනාශකාරී තත්ත්වයට පත් වෙනවා නියතයි.

මේ අය කියන්නේ නැහැ මීට හේතු වන කාරණාව කුමක්ද කියා. අපි හිතන්නේ පිටරටින් ගවමස් ගෙනල්ලා ඇසුරුම් කරලා සුපර් මාර්කට්වල විකුණයි. මෙහි කවුරු හරි ලොකු ව්‍යාපාරකයෙකුට හම්බ කරගන්න දෙන වැඩපිළිවෙළක් තියෙන හැඩයි.

දේශීය කර්මාන්ත නගා සිටුවන්න කතා කරන මේ ආණ්ඩුව ගව මස් තහනමෙන් දේශීය ව්‍යාපාරයක් නේද මේ නැති කරන්න හදන්නේ. මේ වගේ තීන්දු නිසා ආර්ථිකයට තවත් පහර වදිනවා. විනාශකාරී තත්ත්වයට පත් වෙනවා. පිටරටින් ආනයනය කිරීම තුළින් අධි ශීතකරණවල බහා මාස ගණන් පරණ කරලා මස් සුපිරිවෙළඳ සැල්වල විකුණා තැබීම සිදු වන්නේ. එහෙම වුණාම ජනතාව රෝගී වෙන්නේ නැද්ද කියලා අපි අහන්න කැමැතියි.

ලෝක සෞඛ්‍ය සංවිධානය ගව මාංශ අනුමත කර නැහැ

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ සභාපති, ළමා ස්නායු රෝග විශේෂඥ වෛද්‍ය
අනුරුද්ධ පාදෙණිය

රතු මස් පරිභෝජනය එපා කියලා කියන්නේ විද්‍යාත්මක පදනමක් මතයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ පිළිකා පිළිබඳව ඇමරිකානු සහ ඔස්ට්‍රේලියානු මෙන්ම අනෙකුත් බටහිර රටවල් පිළිකා පිළිබඳව විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගම්වල මතය වන්නේ එයයි.

මේ මස්වර්ග වැඩි දියුණු කිරීමට යොදා ගන්නා රස කාරකයන් නිසා පිළිකා කාරක ගුණය ඉතා ඉහළ ගොස් තිබෙනවා. එම නිසා මේ රතු මස් පළමු පෙළේ පිළිකා කාරකයක් ලෙස හැඳින්විය හැකියි. ඒ වගේම මේ රතු මස් අනුභවයෙන් ලෝකයේ පිළිකා මරණ තිස්හතර දාහක් වාර්ෂිකව සිදු වෙනවා.

ආහාර මාර්ගයේ පිළිකා බඩවැල් ආශ්‍රිත පිළිකාද බොහෝ විට මේ මගින් ඇතිවෙනවා. පුරස්ථි ග්‍රන්ථියේ පිළිකා වැලඳීමටත් මේ අනුව වැඩි සම්භාවිතාවක් තියෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය සඳහන් කරන ආකාරයට රතු මස් අනුභවය අනුමත කරන්න බැහැ. ඔස්ට්‍රේලියාවේ පිළිකා පිළිබඳ පිහිටුවා ඇති කවුන්සිලයේ මේ අදහස් තහවුරු කර තියෙන බව පේනවා.

ලංකාවේ පිළිකා රෝගය ඉතාමත් ශීඝ්‍රයෙන් පැතිරී යනවා. දිනකට පිළිකා රෝහලට රෝගීන් හැත්තෑඅටක් පමණ ලියාපදිංචි වෙනවා. ගවයා මිය යන අවස්ථාවේදී ඇති වන හෝමෝන් ක්‍රියාකාරීත්වයේදී වැඩි වන හෝමෝන නිසා ඒ මස් අසමතුලිත වූ මස් බවට පත් වනවා. අපි ආහාරයට ගන්නේ හෝමෝන නිසා අසමතුලිත වූ එම මස් බව සිහි තබා ගත යුතුයි.

එය අපේ හෝමොන් පද්ධතියට දැඩි ලෙසින් බලපානු ලබනවා. ඒ අනුව සිරුරේ සමතුලිතභාවය සහ සිරුරේ රසායනිකයන් විශාල වශයෙන් වෙනස් වීමට මේ රතු මාංශ බලපානවා.

ගව ඝාතන තහනම ක්‍රියාත්මක කළ යුතුද?

සුභද්‍රා දේශප්‍රිය

මෙරට ගවඝාතනය නතර කිරීම සම්බන්ධයෙන් අගමැතිවරයා විසින් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමට ඉදිරිපත් කරන ලද යෝජනාවට ආණ්ඩු පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ගේ අනුමැතිය හිමි විය. ගව ඝාතනය වැළැක්වීම සම්බන්ධයෙන් කැබිනට් අනුමැතිය හිමිවීමෙන් අනතුරුව එය බොහෝ සත්ත්ව අවිහිංසා සමාජ කණ්ඩායම් විසින්ද අනුමත කරන ලදී. ගව මාංශ යනු පොදුවේ රතු මස් වර්ගයන්ට අයත් වන්නකි. ඒ අනුව විද්‍යාත්මක පදනමක් මත පිහිටා මේ රතු මස් පරිභෝජනය සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහ පිළිකා පිළිබඳව ඇමරිකානු සහ ඔස්ට්‍රේලියාව ඇතුළු රටවල පිළිකා පිළිබඳව විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගම් මිනිසුන්ගේ ශරීරයට ගව මස් අහිතකර බව පවසයි. රතු මස් පිළිබඳව ඇති විද්‍යාත්මක මතය වන්නේ එම මාංශ වෙනත් විවිධ ක්‍රම අනුව වැඩිදියුණු කිරීමට යොදා ගන්නා රස කාරකයන් නිසා පිළිකා කාරක ගුණය ඉතා ඉහළ යන බවයි. මේ මස් වර්ග ප්‍රධානම පෙළේ පිළිකා කාරකයක් ලෙස හැඳින්විය බව එම රටවල සෞඛ්‍ය සංවිධාන විසින් පෙන්වා දෙයි. රතු මස් අනුභවය නිසා ලෝකයේ වාර්ෂිකව පිළිකා මරණ තිස් හතර දාහක් වාර්තා වෙයි. ආහාර මාර්ගයේ පිළිකා, බඩවැල් ආශ්‍රිත පිළිකා බොහෝ විට හටගන්නේද මේ මාංශ අනුභවය නිසාය..

හාවඩ් විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය සඳහන් කරන ආකාරයට රතු මස් හෘද රෝග, අංශ භාග, දියවැඩියා රෝග කාරකයකි. ගව මස් යනු පිළිකා රෝගයට අතවනන ප්‍රධාන සාධකයක් බවටද පත් වී ඇත. සමාජය වසා පැතිර ඇති රෝග කිහිපයකට මූල බීජය වන මේ ගව මස් පරිභෝජනයෙන් වැළකීම නීරෝගීමත් සමාජයක් උදෙසා ඉතා වැදගත් බව බොහෝ දෙනාගේ අදහසයි. සදාචාරමය, ආර්ථික සහ සමාජයමය අහිතකර කරුණු රැසක්ම ගව මස් පරිභෝජනයෙන් මතු වී ඇත.

ගවමස් පරිභෝජනයට අපිත් විරුද්ධයි

සමස්ත ලංකා බෞද්ධ මහ සම්මේලනයේ හිටපු සභාපති
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යලයේ මහාචාර්ය
ප්‍රණීත් අබේසුන්දර

මිනිසාගේ ජීවිතයට කිට්ටුම සතා තමයි ගවයා. ඒ වගේම කෘෂිකර්ම ඉතිහාසය පුරාම ගවයාට ඉහළින් සලකා තියෙනවා. ගවයා ඉතිහාසයේ ලොකුම ධනය ලෙස සැලකුවා.

පසුගිය ශත වර්ෂයේත් ඉහත ශත වර්ෂවලත් ගවමස් ආහාරයට ගැනීම නතර කිරීමට උත්සාහයන් දරා තියනවා.

අඩු වැඩි වශයෙන් ඒවා යෝජනා ලෙස මතු වුණා. යළිත් යට ගියා. නමුත් රජයක් ලෙස මෙවැනි තීරණයකට පැමිණීම ගැන ප්‍රසාදය ගෞරවය හිමි වෙනවා. ගව ඝාතනයට අපි විරුද්ධයි.

පරිභෝජනය කිරීමටත් අපි විරුද්ධයි. පිරිමි සතුන් බෝවීම සම්බන්ධයෙන් මේ වන විට සත්ත්ව වෛද්‍ය විද්‍යාව දියුණු නිසා විකල්ප යොදා ගන්න පුළුවන්.

ඒ සඳහා වෛද්‍යවරුන් ඉන්නවා. මේ සම්බන්ධයෙන් විද්‍යාඥයන් ඉන්නවා. පොදු මහජනතාව ලෙසින් අප ගව ඝාතනයට විරුද්ධයි.

රතු මස් අනුභවයෙන් පිළිකා වැලඳීමේ වැඩි ප්‍රවණතාවක්

වයඹ විශ්වවිද්‍යාලයේ මානව පෝෂණවේදය පිළිබඳ මහාචාර්ය
රේණුක සිල්වා

ගවමස් අනෙක් මස් වගේම ප්‍රෝටීන් බහුල ආහාරයක්. නමුත් මස් අතුරින් රතු මස් සහ සුදු මස් සම්බන්ධයෙන් කතා කිරීමේ දී රතු මස් බොහෝ සෙයින් පරිභෝජනය කරන රටවල ජනතාවගේ ආහාර මාර්ගයේ පිළිකා සෑදීමේ ප්‍රවණතාව වැඩියි. ශරීරයේ කොලෙස්ටරෝල් ප්‍රතිශතය වැඩිවීමට හේතු සාධක වෙනවා. පරිභෝජනය සඳහාම ගවයන් ඇති කරන රටවල් තිබෙනවා. එය එම රටේ ජනතාවගේ ප්‍රධාන ජීවිකාවක් ද වෙනවා.

බොහෝ ජනතාව මේ වන විට සුදු පැහැති මස් පිළිබඳව අවධානය යොමු කර තියෙනවා. හරක් මස්වල යකඩ බහුලව තියෙනවා. මස් වර්ගවල ඛනිජ ලවන සහ විටමින් වර්ග රැසක් අඩංගු වෙනවා. පෝෂ්‍යදායි ආහාරයක්. නමුත් අපි නිර්දේශ කරන්නේ හරක් මස් නොවෙයි කුකුළු මස් ආහාරයට ගන්න කියලා. කුකුළුමස්වලින් වන අයහපත අඩුයි.

හරක්මස් ප්‍රධාන වශයෙන් යුරෝපීයන් පරිභෝජනය කරන නිසා ඔවුන් රෝගබාධාවලට පත් වනවා. කුකුළුමස් පරිභෝජනය ලංකාවේ ප්‍රචලිතයි. නමුත් ගව මස් විවිධ හේතූන් නිසා ශ්‍රී ලාංකිකයන් ආහාරයට ගැනීම අඩුයි.

ඒ අතුරින් හින්දු ජනතාව මෙන්ම සිංහල ජනතාව මුල් තැනක ඉන්නවා. කුකුළන් ඝාතනය තහනම් කළොත් එය රටේ මාංශ ආහාර අතින් ලොකු ප්‍රශ්නයක් වුණාට ගව ඝාතනය තහනම් කිරීම එතරම් ගැටලු මතු කරන්නක් නෙමෙයි. පෝෂණය සම්බන්ධයෙන් වුවත් එහිදී ප්‍රශ්නයක් මතුවෙන්නේ නැහැ. මස් පිණිස පමණක්ම මෙරට කිසිදු ස්ථානයක ගවයන් ඇති කරන්නේ නැහැ. එම නිසා ගවයන් ඇති කරන පශු කර්මාන්තයේ යෙදෙන්නන්ට එයින් හානියක් වන්නේ නැහැ. ජීවිකාවට තර්ජනයක් වෙන්නේ නැහැ. නමුත් හරක් මස් පරිභෝජනයට කැමැති අය ඉන්නවා. ඒ අයට විදෙස් රටවලින් ගව මස් ආනයනය කරන්න පුළුවන්. එය ලොකු ගැටලුවක් නොවෙයි. පෝෂණය සම්බන්ධයෙන් ගත්විට ගව මස් නැති වුණා කියලා පෝෂණය පැත්තෙන් තර්ජනයක් වෙන්නේ නැහැ.

ආහාරවලට ගැටලුවක් නැහැ

වන හා පාරිසරික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය 'දිවිසරණ' සත්ත්ව සුඛසාධන සංගමයේ නිර්මාතෘ
හේමන්ති රණසිංහ

මේ ඝාතනය නතර කිරීම සම්බන්ධයෙන් අපි ඇත්තටම සතුටු වෙනවා. ශ්‍රී ලංකාව බෞද්ධාගමික රටක්. අවිහිංසාව පිළිබඳව අපිට ආගමින්ම හික්මීමක් තියෙනවා. තමන්ගේ පෝෂණය වෙනුවෙන් අවිහිංසාව අමතක නොකළ යුතුයි කියන තැනයි මම ඉන්නේ.

ගව ඝාතනය කරන්නේ මස් කන නිසානේ. මම කියන්නේ සියලු සතුන් ඝාතනය නොකළ යුතු යි කියලා. සත්ත්ව මස් නොකෑවා කියලා කිසිම පෝෂණ අඩුවක් වෙන්නේ නැහැ. ඕනෑතරම් ආදේශක දේවල් තියනවා. අපිට පෝෂ්‍යදායි ආහාර වේලක් සකස් කරන්න මාංශ අවශ්‍යම නැහැ. මාංශ අනුභවයෙන් තමයි ලෙඩ රෝග වැලඳෙන්නෙ.

අපේ ආහාරයක් වෙනුවෙන් තවත් කෙනෙකුගේ ජීවිතයක් පූජා කරන්න අවශ්‍ය නැහැ. ඊට වඩා ක්‍රමවේද තියෙනවා. මේ වගේ දෙයක් නතර කිරීමට පළමුවැනි පියවර ගෙන තියෙනවා. එය ඉතාම අගය කරනවා. එය ක්‍රියාත්මක නොවන නීතියක් වුණොත් වැඩක් නැහැ නීතිය පනවා විතරක් මදි. එය ක්‍රියාත්මක වෙනවා ද කියා පසු විපරමක් කළ යුතුමයි. කෙටුම්පත ආ දවසේ සිට අපි සතුටු වුණා. කැබිනට් අනුමැතිය ගැන ඉතාමත් සතුටු වෙනවා. රටේ ජනතාව මේ සඳහා සහාය දිය යුතුයි.

කිරි ගොවියා සුරැකීමට ක්‍රමවේදයක් අවශ්‍යයි

මිල්කෝ සමාගමේ සභාපති
ලසන්ත වික්‍රමසිංහ

සමස්තයක් ලෙස ගත්විට මේ කර්මාන්තය සම්බන්ධයෙන්ම බොහෝ වාද විවාද තියෙනවා. එක් පැත්තක් පමණක් බලා මේ සම්බන්ධයෙන් තීරණ ගන්න බැහැ. අදහස් කියන්නත් බැහැ. කිරි ගොවියා පැත්තෙන් බලන්න ඕන පිරිමි සතුන්ට මොනවාද කළ යුතු වන්නේ කියන කරුණ සම්බන්ධව.

මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් තිබිය යුතුයි. එයට රජය මැදිහත්ව ගවයන්ට සහ වියපත් එළදෙනුන් සම්බන්ධයෙන් යම් පියවරක් ගත යුතුයි. දුප්පත් ගොවියාට එය තනිවම කරන්න පුළුවන් දෙයක් නොවෙයි.

ගවයෙක් නඩත්තු කරන්න යන පිරිවැය දරන්න අපහසුයි. ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීන්දු අරගන්න ඕන මේ කාරණා සම්බන්ධයෙන්.

ගොවීන් හුදකලාව ගත යුතු තීරණයක් නොවිය යුතුයි. මේ සමස්ත වැඩපිළිවෙළටම විකල්ප යෙදිය යුතුයි. ඒ සම්බන්ධයෙන් රජය යම් පියවරක් ගතයුතුයි කියලා මා හිතන්නේ. සතුන්ගේ සමස්ත බර ගොවියාට දරන්න නොදිය යුතුයි. මෙය තහනම් කරනවා කියලා 'තහනම ' පමණක් ක්‍රියාත්මක කර හරියන්නේ නැහැ. විසඳුමක් රජය දිය යුතුයි. කොහොම වුණත් බෞද්ධ රටක් ලෙස මේ තීරණය නරකයි කියා මම කියන්නේ නැහැ.

මැති සබය රත් කළ පොත් හතරක්



හෙවනැල්ල

යළි උපන්නෙමි

අබිනික්මන

මස් ලේ නැති ඇට

● ඒ.ඩී. රන්ජිත් කුමාර

1960 වසරේ ප්‍රකාශයටපත් ගුණදාස අමරසේකරයන්ගේ ආන්දෝලනාත්මක නවකතා වූ 'යළි උපන්නෙමි" (පොත් කවරයේ ඇත්තේ 'යලි උපන්නෙමි' යන්නයි) තරම් මීට වසර 60කට ඉහත එවකට නියෝජිත මන්ත්‍රී මණ්ඩල (අද පාර්ලිමේන්තුව) රත් කළ නවකතාවක් ගැන වාර්තා නොවේ. ඒ අතරම හෙවණැල්ල, අබිනික්මන කෘතිද විවාදයට ලක්වී තිබුණි.

ඒ බව 1963 සැප්තැම්බර් 13 වෙනිදා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නිල වාර්තාවේ (හැන්සාඩ්) අශෝධිත පිටපතේ (53 වන කාණ්ඩය / 14 වන කලාපයේ) සඳහන්ව ඇත.

මොකක්ද? මේ "යලි උපන්නෙමි" නවකතාව?

මීට වසර 60 කට එපිට 1960 වසරේ නිකුත් වූ මේ නවකතාව ගැන පණ්ඩිත, පූජ්‍ය හේන්පිටගෙදර ඤාණසීහ නාහිමියන් විසින් ලියූ "සාහිත්‍යය" කෘතියේ (1961) හඳුන්වා ඇත්තේ අශ්ලීල ප්‍රබන්ධයක් ලෙස ය.

ගුණදාස අමරසේකරගේ "යලි උපන්නෙමි" පොත

"යලි උපන්නෙමි" බඳු පොත පත පුස්තකාලයක තැන්පත් කිරීම ගංජා හෝ අබිං පාවිච්චිය සඳහා එහි තැන්පත් කිරීමත් එක හා සමානය"

(17 වන පිටුව)

ඤාණසීහ නාහිමියන් වැඩිදුරටත් කියා තිබුණේ මෙවැනි නවකතා ලියන ලේඛකයන් සිර අඩස්සියේ තබා ඔවුන් ලියූ ඒ අසභාය පොත පත පුළුස්සා දමතොත් එය වරදකැයි ජාතිය ගැන හිත ඇති කිසිවෙකුට කිය නොහැකි බවය.

(14 වන පිටුව)

"යලි උපන්නෙමි" නවකතාවේ ඌද්ධෘත පාඨ ද පාර්ලිමේන්තු හැන්සාඩ් හි අශෝධිතව පළව තිබුණේය. වැලිමඩ පාර්ලිමේන්තු මන්ත්‍රී කේ.එම්.පී. රාජරත්න මහතා 1963 සැප්තැම්බර් 13 වෙනිදා පාර්ලිමේන්තුවේ දීර්ඝ කතාවක් ආරම්භ කරමින් මෙසේ කීය.

නියෝජ්‍ය සභාපතිතුමනි,

"මා කියා සිටින්නේ මේ රටේ බාල පරම්පරාව විනාශ මුඛයට හරවන කුණුහරුප පොත් පත්, අසභ්‍යවාදයේ අන්තිම කෙළවරට ගොස් තිබෙන පොත් පත්, නියෝජ්‍ය සභාපතිතුමනි, සාහිත්‍යයේ නාමයෙන් අද බිහි කර තිබෙන බවයි. මේවා බිහි කරන්නේ සාමාන්‍ය පුද්ගලයන් නොවෙයි; සුළු පුද්ගලයන් නොවෙයි. මේ රටේ හැම තැන්ම උදන් අනන උසස් විද්‍යා පීඨයන්ගෙන් උසස් ම විද්‍යා පීඨය හැටියට පෙන්නුම් කරන්ට හදන පේරාදෙනියේ විශ්වවිද්‍යාලයේ සිංහල අංශය මගිනුයි මේ කාර්යය කරගෙන යන්නේ. ඒ අංශයේ මහාචාර්යවරයෙක් ඉන්නවා එදිරිවීර සරච්චන්ද්‍ර කියා. ඒ මහත්මයාගේ ප්‍රධානත්වයෙන් සිරිගුනසිංහ, ගුණදාස අමරසේකර යනාදි වශයෙන් සිටින ඒ මහත්මයාගේ ගෝල පිරිසයි ඕක කරන්නේ.

සිරි ගුනසිහගේ අබිනික්මන

සිරි ගුනසිංහගේ "අබිනික්මන" කවි පොතත්. එය ලියා ඇති සම්ප්‍රදාය ගැන මම යමක් කීමට අදහස් කරන්නේ නැහැ. මෙහි තිබෙන කවි දෙකක් මම කියවන්නම්. මේව කුණු හරුප. නමුත් පාසල්වල උගන්වන නිසා, විභාග ප්‍රශ්න පත්‍රවල එන නිසා, හැංගි හොරා කෙරෙන දෙයක් නොවන නිසා මම කියවන්නම්. මේ කව් තියෙන්නේ "අබිනික්මන" කෘතියේ.

"පාළු ළිඳේ දිය සෙවල ගොඩයි
ජීවිතයේ එය එකම සැපයි
බිහිවුණු හැටි ඔබ මේ කළු ලෝකෙට
යටි බඩ සුද මිරික මිරිකා"
තවත් එකක් මෙන්න.
"වදෙන් පොරෙන් ඔබ ඇයි ද
බිහි වුණේ
පාළු ළිඳේ පල් වතුර ගොඩේ
දුගඳ හමන මේ ජීවිතයේ
ඔබ ඇයි ද බිහි උනේ"
තවත් එකක් මේ පොතේම
"හිත පිරිසිදු පිරිමියෙක් මි
පෙම්කළ මුත් අන් බිරියට"

මෙන්න තවත් එකක්. ඒක ගුණදාස අමරසේකර මහත්මයාගෙ "යලි උපන්නෙමි" කියන පොතේ තියෙන්නෙ.

"එදින බුදුගෙය තුළ වූයේ අම්මාත් මාත් පමණකි. වටේ ම වූ පිළිම වලට වඳිමින් පැමිණි අම්මා සැතපෙන පිළිමය අසලට පැමිණ මුහුණ දෙපතුල් මත ඔබා වැන්දාය. ඉක්බිති ඇ දෙ අත් දඬු දෙ පතුල් වටා යවා මුහුණ ඒ මත තබාගෙන බලා උන්නාය. ඇ එසේ උන්නේ මා ඒ අවට නොසිටියාක් වැනි හැඟීමකිනි."

"එවේලෙහි මා තුළ වූයේ එක්තරා ලැජ්ජාවක් හා කෝපයකි. එදින දහවල් කාමයර තුළ නිඳා උන් අම්මාගේ මුහුණ තාත්තා සිඹිනු මා දැක තිබේ. ඒ වෙලෙහි මා තුළ ඇති වූ කැලඹීම හා ලැජ්ජාව වැනි හැඟුමකි, මා තුළ මේවෙලෙහි ද ඇති වූයේ.

අම්මා මා ගැන නොතකා මෙන් අතැනම රැඳි වූ මුහුණින් යුතුව උන්නාය. මා තුළ වූ කෝපය කොතරම් ද අසල වූ හිස් බෝතලය ගෙන බුදු රුවෙහි දෙ පතුල කුඩු වන සේ ගැසීමට මට සිතිණ. අම්මා එතැනින් නැගිටිටෙ කඳුළින් තෙත් වූ ඇසින් යුතුව ය."

රාජරත්න මහතා කතාකළ පසු ගලිගමුව පාර්ලිමේන්තු මන්ත්‍රී පී.බී. බාලසූරිය මහතා පැවසුවේ

"එතැන තාත්වික කමක් එතැන නැහැ."

"මෙතැන තාත්විකත්ත්වයක් නැහැ. මෙය මනඃකල්පිතයක්" රාජරත්න මහතා කියා ඇත.

ගරු බාලසූරිය මන්ත්‍රී තුමා

"කුපාඩ් තත්ත්වයක්."

ගරු රාජරත්න මන්ත්‍රී තුමා

සිරි ගුනසිංහගේ 'හෙවනැල්ල'

සිරි ගුනසිංහ මහත්මයගේ "හෙවනැල්ල" නවකතාවේ කොටසක් මේ. ආගමට පහර ගසන කොටස් ඔය පොත්වල කොටසක් මම දැන් කියවන්න කැමතියි.

"මේ වෙලාවට හාමුදුරුවො ඉන්නේ මොකට ද? තවම දනය වුණෙත් නැහැ. අම්මගෙ වැඩක්. මේ හදන්නේ තවත් බණ ටිකක් කියවන්න. මං අහල තියෙන බණ ඇති. බණේ තමයි මට ගහල තියෙන හෙනේ. හාමුදුරුවන්ට නිදා ගන්නෙයි කියනවා. බණ, බණ, යේසුස් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ. බුදුහාමුදුරුවොයි අපොයි. නිර්වානේ. දෙවියන් වහන්සේ. ඔළු ගෙඩිය. ලෝකෙ කරන්නේ උඹලා තමයි. ගෙවල් දොරවල් හදනව වගේ අපායවල් හදල මිනිස්සු ඒවට අරින්නේ උඹල තමයි. මේක අම්මගෙ වැඩක්. අනු වුණොත් විනාසයි. ළංවන්න ළංවන්න ලොකු වෙන කහ පාට ජිනදාසට පෙනුනේ දහ අට සන්නිවලින් එකක් මෙනි. කිසිම හැඩරුවක් නැති කහපාට පව් කන්දක්. ඒ එන්නේ දඬුවමක් ද?"

(122 - පිටුව)

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් වැදගත් කාරණයක් තමුන්නාන්සේට මතක් කර දෙන්නම්. දැනට අවුරුද්දකට පමණ උඩ දී පැවැත්වුණු ආණ්ඩු පක්ෂයේ එක්තරා රැස්වීමකදී කැස්බෑවේ මන්ත්‍රීවරයා (සෝමවීර චන්ද්‍රසිරි මහතා) "යලි උපන්නෙමි" කියන පොතෙන් උපුටා ගත් කොටසක් කියවා තිබෙනවා. අවස්ථාවේදි මුලසුන ගෙන හිටියෙ ගරු අගමැතිනිය (සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය) යයි මම හිතනව. මට ආරංචියි මේ පොතෙන් උපුටා ගත් කොටස් කියවන විට අගමැතිනිය කන් වසා ගත් බව. ගරු අගමැතිනිය, අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට නියෝග කර තියෙනවා, මේ පොත තහනම් කරන්නට, නමුත් මේ වන තෙක් තහනම් කර නැහැ.

මේ අවස්ථාවේ කොට්ටාවේ මන්ත්‍රී රොබට් ගුණවර්ධන මහතා නැගිට ඇත.

"මේ තැන්වල කථා කරල ඔය අයට පිළිතුරු දෙන්න බැහැ. ගම්වලට ගෙනැවිත් තළවන්න ඕනෑ."

ගරු රාජරත්න මහතා

දැන් පටන් අන් තියෙනවා මේ අයගෙ පොත් පුච්චන්න. ඇත්ත වශයෙන් ම මමත් ගෙනාව පොත් දෙකක් පුච්චල දමන්න. ඔබතුමාගෙ අවසරය තියෙනව නම් මේ පොත මම පුච්චන්න කැමතියි.

ගරු මන්ත්‍රීවරයෙක්

පුච්චන්න, පුච්චන්න

ගරු රාජරත්නමහතා

මම පුච්චන්න ද? පුච්චන්න ද?

ගාල්ලේ මන්ත්‍රී ගරු ඩබ්ලිව්. දහනායක මහතා

"පුච්චන්න පුච්චන්න."

ගරු රාජරත්න මහතා

"ඒක ඒ හැටි දෙයක් නෙවෙයි, මේ පොතටත් ගිනිකූරක් ගහන්න ඕනෑ. මේ රටට තේරුම් යන්න. මේ පොත "මස් ලේ නැති ඇට."

ගුණදාස අමරසේකරගේ අදහස්

"යලි උපන්නෙමි" නවකතාවට එල්ල වූ පහරදීම් වලට කතුවර ගුණදාස අමරසේකර මහතා මීට වසර 60කට පෙර මෙසේ අදහස් දක්වා තිබුණි.

"අසභ්‍යතාවය නමැති චෝදනාව ඕනෑම සාහිත්‍යයක් අරභයා එක්තරා අවස්ථාවකදී ඉදිරිපත් කරන්නක්. ඉංග්‍රීසි සාහිත්‍යය අරභයා මේ චෝදනාව ඉදිරිපත් කරන ලද්දේ දැනට අර්ධ ශත වර්ෂයකට (1960 වසරට) පමණ පෙර සිට යි. ප්‍රංශ සාහිත්‍යය අරභයා එම චෝදනාව ඉදිරිපත් කරන ලද්දේ ශත වර්ෂයකට (1960 වසරට) පමණ පෙර ගුස්ටාව් ෆ්ලෝබෙයාර් වැනි නවකතාකරුවන් ජීවත්ව සිටින සමයේදී ය. එබැවින් කිසියම් වකවානුවක දී සිංහල සාහිත්‍යය අරභයාත් මේ චෝදනාව මතු කිරීම යුක්ති යුක්තයි. මේ මතය ගරුකරන්නෝ සාහිත්‍ය පිළිබඳ අල්පදැනුම ඇති මුග්ධයෝය. ඔවුන් සිතන අයුරු සාහිත්‍යයට ඇතුළු විය යුත්තේ සමාජ සම්මත දේ පමණි."

1961 වසරේ පැවති සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ රජයේ සැනෙට් මණ්ඩලයේ සිටි ශ්‍රී.ල.නි. පක්ෂයේ මන්ත්‍රී ගුරු නායකයකු වූද ඒ.ඩී. ජයසේකර මහතා 'දිනමිණ' පුවත්පතට ලියා තිබුණේ "යලි උපන්නෙමි" පාසල් විය ඉක්ම වූ කාටවුවද කියවා රස විඳිය හැකි අගනා සාහිත්‍ය කෘතියක් බවය. "ඩේලි නිව්ස්" පුවත්පතට මහාචාර්ය සරච්චන්ද්‍රයන් "යළිඋපන්නෙමි" ගැන සඳහන් කර තිබුණේ This is not only a work of permanent value in our literature but one which will rank among any sush works in any language"

සිරිමාවෝ බණ්ඩාරනායක

සති ගණනක් ගත වී ගිය නමුත් යලි පන්නෙමි පොතට නඩු දමා නොතිබුණි. දිනක් රහස් පොලිස් පරීක්ෂක අම්බලවානර් අලුත් කඩේ උසාවියේ දී යළිත් වරක් තෝල්ක මුදලි වීරසිංහ මහතා මුණ ගැසී රහසක් හෙළි කළේය.

රොබට් ගුණවර්ධන

එහෙත් ගුණදාස අමරසේකර මහතා දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ශිෂ්‍යත්වය ලබා එංගලන්තයේ ගත කොට ලංකාවට පැමිණි පසු "සවස" පත්‍රයේ ඩී.බී. වර්ණසිරි සමඟ කළ සංවාදයේ (1969 අප්‍රේල් 15 - සවස) මෙසේ කියා තිබුණි.

"මගේ මුල් නවකතා අසභ්‍ය කෘතීන් කියල මම කියන්නේ නෑ. ඉංග්‍රීසියෙන් obscene කියන වචනය අසභ්‍ය යන්න පමණක් නොවෙයි ඊට වෙනස් අදහසක් දෙන්නක්. මම කියන්නේ මගේ "යලි උපන්නෙමි" වගේ නවකථා "අසභ්‍ය නවකථා" කියලා නෙවෙයි. ඒවා "අධම නවකථා" කියලා කිව්වොත් වඩා උචිතයි. ඒ කියන්නෙ ලංකාව වගේ සංස්කෘතික රටාවකට අනුව "යලි උපන්නෙමි" වගේ කෘතීන් අපේ සමාජයට යෝග්‍ය නෑ. එයින් ඉතා පහත් නීච පුද්ගල දර්ශනයක් පිළිබිඹු වන බව මම පිළිගන්නවා. ස්වයං පුද්ගල දර්ශනයක් පිළිබිඹු වන බව මම පිළිගන්නවා. ස්වයං විමුක්තිය සොයා ගිය චරිතයක් තමයි රණතුංග. මේ වගෙ ලිංගික පැනයකට මැදි වූ මිනිසුන් ලංකාවේ නැත්තේ නෑ. එසේ හිටියට එම අධමයින් වීරයන් කරන දර්ශනය මතු කර පොත් නොලිය යුතු යයි මම හිතනවා."

සුනන්ද මහේන්ද්‍රගෙන් ඇගැයුමක්

2006 වසරේ පැවැත්වුණ පොත් දොරට වැඩීමේ උලෙළකදී මහචාර්ය සුනන්ද මහේන්ද්‍ර "යලි උපන්නෙමි" නවකතාව ගැන මෙසේ සඳහන් කළේය.

"ගුණදාස අමරසේකර ගේ හොඳම නවකතාව "යලි උපන්නෙමි" යි. එය ඔහුගේ "කරුමක්කාරයෝ" ටත් වඩා හොඳ නවකතාවක්. එහෙත් අමරසේකර මෑතදී ලියූ පොත්වල, තමා මීට පෙර ලියූ පොත් නාමාවලියෙන් "යලි උපන්නෙමි" ඉවත් කරලා තියෙනවා."

ගුණදාස ලියනගේ විසින් ලියූ "අසභ්‍ය සාහිත්‍ය සහ සංස්කෘතික පොලීසිය" නම් කෘතියේ සඳහන් වන පරිදි "යලි උපන්නෙමි" තහනම් කරන බවටත්, අමරසේකරටත් විරුද්ධව නඩු පවරන බවත් මහත් ආන්දෝලනයක් සාහිත්‍ය ලෝකයේ පැතිර ගිය නමුත් එවැනි කිසි දෙයක් සිදුව නැත. මේ ඒ පිළිබඳව ගුණදාස ලියනගේ විසින්.

"නැඹුල් සුදිය" පොත

"යලි උපන්නෙමි" පළ වූ 1960 දෙසැම්බර් මාසයේදී පමණ රහස් පොලීසියේ පරීක්ෂකවරයකු වූ අම්බලවානර් මහතා එම පොතෙන් පිටපතක් ගෙන කොළඹ අලුත් කඩේ දිස්ත්‍රික් උසාවියේ තෝල්ක මුදලි කෙනෙකු වූ ඉන්දුපාල වීරසිංහ මහතා වෙත ගියේය. වීරසිංහ තෝල්ක මුදලි තැන ඊට කලින් "නැඹුල් සුදිය" වැනි පොත සම්බන්ධයෙන් වූ නඩුවලදී පවා පරිවර්තන හා සාක්කි ඉදිරිපත් කර මෙබඳු කටයුතු ගැන අත්දැකීම් ඇතිව සිටි පුද්ගලයෙකි. රහස් පොලීසියේ පරීක්ෂක අම්බලවානර් මහතා සිංහල භාෂාව ගැන එතරම් අවබෝධයක් ඇති අයෙකු නොවූ නිසා ඔහු වීරසිංහ මහතාට පොත දෙමින් මෙසේ කීය.

"මුඩ්ලියර් මෙන්න මේ පොතේ හරියට අසභ්‍ය දේවල් තියෙන බවට අපට වාර්තා ලැබිලා තියෙනවා. දැන් අපි මේකට විරුද්ධව නඩු දාන්න සේරම ලෑස්ති කරලයි තියෙන්නේ. කරුණාකරල මේ පොත කියවල අසභ්‍ය තැන් හොයලා ඒවායේ පරිවර්තන මට දෙන්න." යි පොලිස් පරීක්ෂකවරයා කීය.

වීරසිංහ මහතා පොතේ 'අසභ්‍ය' යැයි සැලකිය හැකි තැන් පරිවර්තනය කර දින ගණනකින් රහස් පොලිසියේ නිලධාරියාට දුන් අතර පරිවර්තන ගාස්තුව ද වීරසිංහ මහතාට ගෙවන ලදි. සති ගණනක් ගත වී ගිය නමුත් යලි පන්නෙමි පොතට නඩුදමා නොතිබුණි. දිනක් රහස් පොලිස් පරීක්ෂක අම්බලවානර් මහතා අලුත් කඩේ උසාවියේ දී යළිත් වරක් තෝල්ක මුදලි වීරසිංහ මහතා මුණ ගැසී රහසක් හෙළි කළේය.

"අපේ උත්සාහය ඔක්කොම වතුරෙ ගියා. 'යලි උපන්නෙමි' පොතට නඩු දාන්න එපායි කියල ලොකු බලකිරීමක් ද කියලා මමවත් දන්නේ නෑ." යි පොලිස් පරීක්ෂකවරයා කීය.

යලි උපන්නෙමි උසාවි යාමේ කතාව එතැනින් කෙළවර විය. එය නිරුපද්‍රිතව දිගමට වැජඹුණේය.

(අසභ්‍ය සාහිත්‍ය සහ සංස්කෘතික

පොලිසිය - (පිටු - 24, 25)

කෙසේ වුවද මේ සාහිත්‍ය මාසයේ සිංහල සාහිත්‍යයේ සැඟ වී ඇති තැන් යළි මතු කර දැක් වූයේ කිසිඳු ලේඛකයකුට අපහාස, උපහාස කිරීමට නොව සභ්‍ය අසභ්‍ය වාදය ගැන බුද්ධිමත් සංවාදයකට හොඳ තේමාවක් වන අවංක හැඟීමෙනි.

ඡායාරූප පිටපත් කිරීම - ලාල් සෙනරත්

තරංග

රන්සුනු

සුමුදු චතුරානී

ඉඩ දෙන්න, ඔබේ ආලෝකයේ කටු සටහනක් අඳින්න!

මහ වැස්සට සේදෙමින් ද; ගිනිගෙන දැවෙන හිරුගේ ප්‍රචණ්ඩ රශ්මියෙන් දැවෙමින් ද; කුරුලු වර්ගයාගේ අනේකවිධ ආදරය සහ අඩන්තේට්ටම් විඳිමින් ද අප නොදන්නාතරම් කාලයක් ජීවත් වූ මහා වෘක්ෂයක් අපේ ගමේ අපේ වත්තේ කෙළවර තිබේ. මම ගමේ යන සෑම වාරයකදී ම ජීවත් වීමෙන් ම ප්‍රතාපවත් වූ ඒ මහා වෘක්ෂයේ බඳා වටකරගත නොහැකි කඳ සියුම් ව අල්ලා බලන්නෙමි. ඇල්ලූ සැණින් කිසිවක් දැනෙන්නේ නැත. ලොකු කුඩා ගස් වලින් වටවූ ඒ පරිසරය හා එහි වෙසෙන්නෝ, මම ඔවුන්ගේ කොටසක් බවට පත් කරගන්නට ගත වන මිනිත්තු කිහිපය සොම්නස් සහගතව විඳ ගනිමින් මම සියුම් නිරීක්ෂණයෙන් යුතුව ගසේ කඳ අල්ලාගෙන සිටින්නෙමි. ටිකෙන් ටික මගේ අත්ලට ගසෙහි කඳෙහි වන සුමුදු වෙව්ලීමක් දැනෙන්නට වෙයි. එය ක්‍රමයෙන් වඩාත් සුමුදු ව කෙඳිරිල්ලක් ව අත්ලට දැනෙන්නට තවත් ටික වේලාවක් ගත වෙන්නේ ය. අනතුරුව ගසේ කඳෙන් නැගෙන සියුම් මුනුමුනුවක් කෙමෙන් කෙමෙන් සම්මත සන්නිවේදන භාෂා විධි ක්‍රමයෙන් බැහැරව දැනෙන්නට පටන් ගනී. ඒ දැනීම සම්පූර්ණ වෙන්නේ ගසටත් නොදැනෙන පරිද්දෙන් මා සෙමෙන් ගසේ කඳට කන තබා ඒ මුනුමුනුවට සවන් දෙද්දී ය. අප සැමට ම මෙන් ම ගහ කොළට ද, මහ පොළොවට ද, සුළඟට ද එයට ම ආවේණික වූ ශබ්දයක් තිබේ. අපට ඒ සියුම් සොබාදම් කෙඳිරිය ඇතුළු බොහෝ දේ ඇසෙන්නේ නැත. ඒ නොඇසීම නිසා ම අප බොහෝ දේ අහිමි කරගෙන ඇත්තෙමු.

මම පාවුලෝ කොයියෝ ගේ "The Alchemist" නම් ලෝක පූජිත කෘතිය අතට ගත්තෙමි. මෙය චූලානන්ද සමරනායක "සන්තියාගෝ නම් සැරිසරන්නා" නමින් සිංහලට නගා තිබේ. අපේ ජීවිතයේ මග හැරෙන දේ නිසා අපට කොතරම් දේ අහිමි වෙනවාද යන්න ගැන ලියවුණු මේ සටහන නිසා ය මට අර පැරණි මහා වෘක්ෂය සිහිපත් වූයේ.

"සන්තෘෂ්ටියට පැමිණ සිටින්නා වූ සෑම මිනිසකු තුළ ම දෙවියන් වහන්සේ වැඩ සිටින බව හදවත කොලුවාට තේරුම් කර දුණි. එසේ ම ඒ සන්තෘෂ්ටිය රස විද්‍යාඥයා පැවැසූ පරිද්දෙන් ම කාන්තාරයේ වැලි අංශුවක් තුළින් වුවත් මතු කර ගැනීමට පිළිවන. එසේ වන්නේ ඉතා කුඩා වැලි අංශුවක් පවා මැවීම එක්තරා මොහොතක් නිරූපණය කරන අතර විශ්වය ඒ නිර්මාණය කිරීම උදෙසා වසර මිලියන ගණනක් වැය කර ඇති හෙයිනි.

මිහිපිට ඉන්නා සෑම කෙනකුට ම තමන්ට ම උරුම වූ නිධානයක් ඇතැයි ඔහුගේ හදවත පැවසීය. 'මිනිසුන්ගේ හදවත් වන අප ඉඳහිට පමණක්, මේ නිධාන ගැන බොහෝ විස්තර මිනිසුන්ට කියන්නේ තව දුරටත් මිනිසුන්ට ඒවා සොයා ගෙන යන්නට වුවමනාවක් නැති නිසයි. අපි ඒවා ගැන කියන්නේ ළමුන්ට විතරයි." අන්තිමේදී අපි මේ ජීවිතේට තමුන්ගේ ම පාරේ ඉරණම වෙත යන්න ඉඩ දෙනවා. අවාසනාවකට වගේ තමුන්ගෙ යහපතට, තම ඉරණම කරා ඒ වගේ ම තමන්ගෙ චිත්ත සංතුෂ්ටිය කරා පාර පාදා ගත්තෙ ඉතා සුළු පිරිසක් විතරයි. හුගක් මිනිස්සු ලෝකෙ දකින්නේ බියකරු තැනක් විදියට. ඉතින් එහෙම මිනිස්සු කල්පනා කරන්න ගත්තහම ලෝකෙ ඇත්තට ම බියකරු තැනක් බවට පෙරළෙනවා.

පාවුලෝ කොයියෝ කියන්නේ සියලු නිධාන පවතින්නේ අප හදවත් ඇතුළත බව ය. ඒ නිධාන මතු කර ගැන්මට තරම් සියුම් බවක්, අවදි බවක් අප තුළ නැති බව ය. පාවුලෝ කොයියෝ අපූරු තාලේ ලේඛකයෙකි. මේ ලතින් ඇමරිකානු ලේඛකයා දිගින් දිගට ම සිය කෘති මගින් සියුම් ව ස්පර්ශ කරන්නේ මානව ජීවිතයෙහි වන දැක නොදැක යන සියුම් චින්තා ය.

"ඔයා ගාව තියෙනවා ආලෝකයක්. මට ඉඩදෙන්න අඩු ගානෙ කටු සටහනක්වත් ගහන්න."

රැල්ෆ් මේ චිත්‍ර ශිල්පියාට, මරියා නම් ගණිකාවගේ වතෙන් ආලෝකයක් පෙනෙයි. තමාටවත් නොපෙනෙන තමාගේ ආලෝකය රැල්ෆ් දුටුවේ කෙසේ දැයි මරියා කල්පනා කරයි.

පාවුලෝ කොයියෝ ගේ "මිනිත්තු එකොළහ" ඇතැති ව මම ද ඔබගේ, මගේ සහ අප සැමදෙනාගේ ම ස්වභාවයෙන් ම පවත්නා ආලෝකය ගැන කල්පනා කරන්නෙමි. ඒ ආලෝකයට ජාති, ආගම්, කුලමල පන්ති භේද බලපාන්නේ නැත. එහෙත් අප සැම සතු ඒ ආලෝකය පෙනෙන්නට නම් අපට අනෙකා දෙස අවබෝධයෙන් බැලිය හැකි විය යුතුය. එවිට මේ ලොව නරක මිනිසුන් ඔබට හමු නොවනු ඇත. හේතුව ඒ සෑම නරකක් පිටුපස ම කතන්දරයක් ඇති බැවිනි.

පාවුලෝ කොයියෝ සමඟ කළ සාකච්ඡා මාලාවක් 'ජීවිත වන්දනාවක සටහන්' නමින් සුමිත්‍රා රාහුබද්ධ ප්‍රවීණ ලේඛිකාව සිංහලට පරිවර්තනය කළාය. ඒ සාකච්ඡා මාලාවේ එක් තැනක මෙසේ සටහන් වෙයි.

"මගේ සුවිශේෂී සොයා යෑම වුණේ ආධ්‍යාත්මික සොයා යෑමකි. මේ ප්‍රශ්නය සෑම විට ම මගේ පොත්වල ඇතුළත් වන්නේ එබැවිනි. මගෙන් අසන හැම ප්‍රශ්නයකට ම පිළිතුරු දිය හැකි යැයි සිතූ කාලයක් තිබිණි. එය කළ නොහැකි යැයි මම අද අවබෝධ කරගෙන සිටින්නෙමි. හැම දෙයකට ම පැහැදිලි කිරීම් තිබෙන්නට පුළුවන. ඒවා ගුරුන්ගෙන් ලබාගත් පැහැදිලි කිරීම් විය හැකිය. නමුත් ඒවා මගේ නොවේ. සැබෑව නම් අපගේ නොදන්නාකම දිගට ම තිබෙන බව ය."

ඔබ ජීවිතයේ සියුම් දේ මග නොහරින්නේ නම් ඔබට ජීවිතය මුළුමනින් ම හසුවේ යැයි මට කිව නොහැකි ය. එහෙත් ලේඛනයේ රන්සුනු හමු වෙන බව නම් ස්ථිර ය.

sumudu.chathurani@lakehouse.lk

සැමරුම් කිත් රැස

මහාචාර්ය **ජයන්ත අමරසිංහ**

පහතරට දැල්වුණු ශාස්ත්‍රාලෝකයේ පහන් සිළුව

කෝට්ටේ රාජධානි සමයේ පුරුතුගීසීන්ගේ ආක්‍රමණ සිදුවන තෙක් දකුණුලක පිහිට සුප්‍රසිද්ධ දෙවිනුවර ගලතුරුමුල, තිලක පිරිවෙන, තොටගමු විජයබා ආදි පිරිවෙන් ආශ්‍රයෙන් කාව්‍ය ශාස්ත්‍රය, වෛද්‍ය ශාස්ත්‍රය, භාෂා ශාස්ත්‍ර මෙන්ම ධර්ම ශාස්ත්‍ර ප්‍රගුණ කළ ප්‍රසිද්ධ පඬි පරපුරක් මෙරට ශාස්ත්‍රාලෝකය ව්‍යාප්ත කළහ. පුරුතුගීසින් වෙරළබඩ ප්‍රදේශවල විහාරාරාම හා පිරිවෙන් පොත්ගුල් සියල්ල වනසා දැමූවද පහතරටින් ශාස්ත්‍රාලෝකය සපුරාම තුරන් නොවීය. මෙකී පිරිවෙන් ආශ්‍රයෙන් ශාස්ත්‍ර ශික්ෂණය ලද ගිහි පැවිදි වියත්නු වැලිවිට සරණංකර හිමියන්ගේ ධර්මශාස්ත්‍ර පුනරුත්ථාන පරිශ්‍රමය ආරම්භ වන්නට පූර්ව අවධියෙහි පහතරට විවිධ ප්‍රදේශවල වෙසෙමින් සාහිත්‍යකරණයෙහි නිමග්නව සිටියහ. දික්වැල්ල ආසන්නයේ පිහිටි ඌරුගමුව නම් ප්‍රදේශයේ විසූ රාජගුරු නමැති පඬිවරයකු ගැන කුලසේකර අප්පුහාමි ලියූ මණිචෝර ජාතක කාව්‍යයෙහි සඳහන් වෙයි. බෙලිඅත්තට නුදුරු ගලගම ග්‍රාමයේ විසූ දික්වැල්ලේ කඳවුරු කුලයට අයත් යතිවරයකු විසින් කහකුරුළු සන්දේශය ලියන ලද්දේ මෙකී කාල වකවානුවෙහිය. වැලිවිට සරණංකර හිමියන් විසින් ඉමහත් දුෂ්කරතා මධ්‍යයේ ධර්ම ශාස්ත්‍ර පුනරුත්ථාන ව්‍යාපාරය අරඹන විට පහතරටද එබඳුම පරිශ්‍රමයක නිමග්න වූ සරණංකර හිමියන්ට වැමහලු යතිවරයෙකි සිටිනාමළුවේ ධම්මජෝති හිමිපාණෝ. පසු කලෙක මහනුවරදී ඔවුනොවුන් සම්මුඛ වූ දෙදෙනා වහන්සේ තමතමන් දත් ධර්මශාස්ත්‍ර ඥානය ඔවුනොවුන් අතරේ හුවමාරු කරගත් අතර නොදත් කරුණු ශාස්ත්‍ර ඥානය ශේෂ වී පැවති පිරිස කරා එළඹ උගත්හ. ධර්ම ශාස්ත්‍ර ඥානය නිසි පරිදි උද්ග්‍රහණය කළ පසු ලංකාවේ විවිධ ප්‍රදේශවලින් මේ වියත් සාමණේරවරුන් කරා ගිහි පැවිදි ශිෂ්‍ය පිරිස් එලඹ ශාස්ත්‍ර හදාළ බව පැවසේ. උඩරටින් ඇරඹුණු ධර්ම ශාස්ත්‍ර පුනරුත්ථානය දකුණු ලකට ව්‍යාප්ත කොට නව ප්‍රඥාලෝකයක් දැල්වීමට පුරෝගාමී වූවෝ සිටිනාමළුවේ ධම්මජෝති හිමිපාණෝය. එහෙත් ධර්ම ශාස්ත්‍ර පුනරුත්ථාන පරිශ්‍රමය ගැන රචනා වූ සංඝරාජ සාධුචරියාව, සඟරජවත වැනි කෘතිවල සහ මහවාසලට සම්බන්ධ නිලධරයන් විසින් නිකුත් කරන්නට යෙදුණු ලේඛනවල පවතින පක්ෂග්‍රාහී භාවය නිසා ඇතැම් චරිතවලට හිමි විය යුතු ගෞරවය ගිලිහී ගොස් ඇති බව පෙනේ. මෙහිදී උඩරට විසූ ලේඛකයන්ගේ කෘතිවලින් පහතරට භික්ෂූන්වහන්සේගේ දායකත්වය අවප්‍රමාණ වූ සැටි කිරිඇල්ලේ ඤාණවිමල හිමිපාණෝ සකාරණව පෙන්වා දෙති.

ලාංකේය නූතන ශාස්ත්‍ර සම්ප්‍රදායේ ඉතිහාසය පිරික්සූ පඬිවරුන් අතුරින් ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන පඬිතුමා සිටිනාමළුවේ හිමියන්ගේ ශාස්ත්‍ර පර්යටනයට නිසි ගෞරවය හිමිකර දී තිබේ. 'පාතරට මාතර දිශාවෙහි වේහැල්ල නම් ග්‍රාමයේ පිහිටි ආරාමයෙහි නිවැසි වූ සිටිනාමළුවේ ධම්මජෝති නම් සාමණේර නමක් පාත රට අල්පාල්ප මාත්‍රයෙන් තිබූ ස්වභාෂා මාගධී සම්බන්ධ වූ යම් විද්‍යාවක් ඇත් ද ඒ සියල්ල තමන් වහන්සේ කෙරෙහි ඒකරාශි කරගෙන පාතරට විද්‍යා ප්‍රදීපය දල්වමින් සිටියේය. සරණංකර සාමණේරයන් වහන්සේ මෙකලට දැනගෙන සිටියේ බාලාවතාරයේ එක් කොටසකි. ධම්මජෝති සාමණේරයන් වහන්සේ දැනගෙන සිටියේත් එක් කොටසකි. දෙදෙනා දත් දෙකොටසින් පොත සම්පූර්ණ විය යුතු බව මොවුන් හට දැන ගන්නට ලැබී අන්‍යෝන්‍යයා සම්මුඛ වීමට මොවුන් දෙදෙන තුළෙහි මහත් අභිලාෂ ඇති විය. සරණංකර සාමණේරයන්ගේ කර්තව්‍යයන් දැක සුප්‍රසන්න වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජ තෙමේ උන්වහන්සේගේ ආරාධනයෙන් දූතයන් යවා සිටිනාමළුවේ සාමණේරයන් ද මහනුවරට කැඳවා දෙදෙනාගේම ශාස්ත්‍ර ඥානය දෙදෙනා හටම සාධාරණ කර ගැනීමට මාර්ග සලස්වා දුන්නේය.' ධම්මජෝති හිමියන් ජන්ම ලාභය ලද්දේ සිටිනාමළුව ග්‍රාමයෙහිය. ඒ ග්‍රාමයෙහි හේවා කොඩිතුවක්කු ආරච්චි රාලහාමිට දාව ක්‍රි. ව. 1672 දී උපන් මද්දුම අප්පුහාමි නමැති කුලපුත්‍රයා තිස්සමහාරාමයේ වැඩ විසූ කදුරුපොකුණේ බුද්ධරක්ඛිත නවරත්න ස්ථවිරයන් වහන්සේ වෙතින් ප්‍රව්‍රජ්‍යාව ලද්දේය. කදුරුපොකුණේ බුද්ධරක්ඛිත නවරත්න ස්ථවිරයෝ වනාහි එවක ලංකාවේ විසූ එකම උපසපන් භික්ෂූන් වහන්සේ වූහ. කදුරුපොකුණ සිටිනාමළුවට යාබදව පිහිටි ගමකි. සිටිනාමළුව පිහිටියේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිඅත්ත තංගල්ල නගරද්වය මධ්‍යයෙහිය. එවක කන්ද උඩරට සිංහල නරපතියන්ගේ පාලනයට නතුව පැවතුණු අතර පහතරට පැවතුණේ ලන්දේසි පාලනයට නතුවය. ලන්දේසින් ගිරුවා පත්තුවේ පවත්වාගෙ ආ ආහාර ගබඩා දෙකෙන් එක් ගබඩාවක් පැවතියේද සිටිනාමළුවෙහිය. මෙවක ඇතැම් ස්වදේශිකයන් ලන්දේසි පාලනයට අවනතව ජීවත් වූ අතර තවත් පිරිසක් ස්වදේශාභිමානී හැඟීම් පෙරටු කොට ගෙන බෞද්ධාගම සහ සිංහල ඇතුළු පාලි සංස්කෘත භාෂා පුනරුත්ථානය කිරීමට කටයුතු කළහ. ලන්දේසින්ගෙන් මුදලි මුහන්දිරම් තනතුරු ලබා ගත් ස්වදේශික ප්‍රභුවරුද පහත රට ධර්ම ශාස්ත්‍ර පුනරුත්ථාන කටයුතුවල නිමග්නව සිටි ගිහි පැවිදි උභය පාර්ශ්වයටම උදව් උපකාර කළහ. කන්ද උඩරට වෙසෙමින් සරණංකර හිමියන් සමග ගිහි පැවිදි බොහෝ ශිෂ්‍ය පිරිසකට ශාස්ත්‍ර ඥානය ලබා දෙමින් සිටි ධම්මජෝති හිමියන් නැවත පහතරටට වැඩම කළ විට උන්වහන්සේට වාසය පිණිස විහාරස්ථානයක් තනවා දී තිබෙන්නේ ගිරිවා පත්තුවේ මුදලි තනතුර දැරූ කහඳාවේ දොන් සිමන් සෙනරත් මුදලිතුමාය. ඩබ්ලිව්. එෆ්. ගුණවර්ධන මුදලිතුමා ගුත්තිල කාව්‍ය වර්ණනාව කෘතියෙහි ප්‍රස්තාවනාවෙහි සඳහන් කර ඇති එක් කරුණක් වන සිටිනාමළුවේ ධම්මජෝති හිමි වේහැල්ල විහාරස්ථානයේ වැඩවාසය කළ බව පැවසෙන සඳහන දෝෂ සහගතය. කදුරුපොකුණේ බුද්ධරක්ඛිත නවරත්න හිමිපාණන් වෙත පැවිදි වූ වේහැල්ලේ ධම්මදින්න හිමියන් වැඩ වාසය කළ විහාරස්ථානය වූයේ වේළුවනාරාමයයි.

මහනුවර වෙසෙමින් ගිහි පැවිදි විශාල ශිෂ්‍ය පිරිසකට ශාස්ත්‍ර දානය ලබා දෙමින් ධර්මශාස්ත්‍ර පුනරුත්ථාන කටයුතුවල නිමග්නව සිටි සිටිනාමළුවේ හිමියන් 1753 වර්ෂයේ උපසම්පදාව ලබන විට උන්වහන්සේ අසූ එක් හැවිරිදි වියේ පසුවූහ. වයෝවෘද්ධ හිමිපාණන් පහතරට බලා වැඩම කොට කහඳාවේ විහාරස්ථානයේ වැඩවාසය කරමින් සිටින කාලයේ ත්‍රිපිටකයට අයත් ග්‍රන්ථ සඳහා අටුවා සම්පාදනයෙහි ව්‍යාවෘත වූ බව පැවසේ. බාලවතාර සංග්‍රහය ද මේ හිමියන්ගේ කෘතියකි. සිටිනාමළුවේ හිමිපාණන්ගේ පැවිදි සිසුන් ලෙස සංඝරාජ සාධුචරියාවෙහි දැක්වෙන්නේ වේහැල්ලේ ධම්මදින්න, කදුරුපොකණේ සුවන්නජෝති සහ දික්වැල්ලේ බුද්ධරක්ඛිත යන භික්ෂූන් වහන්සේ තෙනම පමණි. සිටිනාමළුවේ හිමියන් කන්ද උඩරට බලා වැඩමකරන අවස්ථාවේ උන්වහන්සේගේ අතවැසි ලෙස උපස්ථාන කටයුතු කර තිබෙන්නේ බරණගණිත නම් අසල්වැසියෙකි. නක්ෂත්‍ර ඥානය පරම්පරාගත උරුමයක් කර ගත් පෙළපතකින් ඇවත ආ බරණගණිත සිටිනාමළුවේ හිමියන් වෙතින් භාෂා ශාස්ත්‍ර ඥානය වර්ධනය කර ගෙන දකුණු ලක කවි පරපුරෙහි ප්‍රමුඛ කවියකු බවට පත් විය. ලන්දේසින් විසින් සිටිනාමළුවේ සහ වීරකැටියේ පවත්වාගෙන යන් ලැබූ ධාන්‍ය ගබඩාවල හෙවත් පත්තායම්වල ලේකම් ලෙස සේවය කළ විර්තාමුල්ල ගමගේ දොන් ජාඤ්චි ද සිල්වා අභයගුණවර්ධන සමරජීව කවියාද සිටිනාමළුව ධම්මජෝති හිමියන්ගේ ගිහි ශිෂ්‍යයකු ලෙස පිළිගැනේ. පසු කලෙක මේ හිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව පහතරට ප්‍රදේශයේ ඉමහත් පරිශ්‍රමයෙන් ව්‍යාප්ත කළ ශාස්ත්‍ර ඥානය පසු ගිය සියවසේ මෙරට සිදු වූ ශාස්ත්‍ර ප්‍රබෝධයට පදනම සැකසීය.

බණ්ඩාරනායක ඝාතනය - 2 කොටස

අගමැති ඝාතනයට සම්බන්ධ තිදෙනාටම මරණ දඬුවම

● **ස්ටැන්ලි සමරසිංහ**

රාජ නීතිඥ ජෝජ් චිට්ටි පැමිණිල්ල ආරම්භ කරමින් පැවසුවේ කහ සිවුර නොසලකා මෙම අපරාධය කිරීමට හේතුව කුමක්දැයි අධිකරණය හමුවේ සාක්ෂි මඟින් පහදා දීම තමාගේ අරමුණ බවයි.

එමෙන්ම අපරාධය කිරීමට හේතුව දැන ගැනීමට නම් එවකට රටේ පැවති දේශපාලනය පිළිබඳව දැනුම්වත් වීම අවශ්‍ය බවද සඳහන් කළේය. අපරාධය කිරීමට කුමන්ත්‍රණය ඇරඹූ තැන සිට සාක්ෂි ඉදිරිපත් කළ යුතු හෙයින් ඒ පිළිබඳ දන්නා අයෙකුගේ සාක්ෂියෙන් එය අරඹන බව සඳහන් කළ චිට්ටි නීතිඥවරයා කරෝලිස් අමරසිංහගේ සාක්ෂියෙන් එය ඇරඹීය.

ජෝජ් චිට්ටි පළමුවෙන්ම සාක්ෂියට කැඳවූ අමරසිංගේ සාක්ෂියෙන් පැවසුනේ විත්තිකරුවන් කුමන්ත්‍රණය ආරම්භ කළ අන්දමය. ඝාතන සිද්ධියට මාසයකට හෝ එකහමාරකට පෙර බුද්ධරක්ඛිත එච්.පී. ජයවර්ධන සෝමාරාම පොලිස් පරීක්ෂක නිව්ටන් පෙරේරා කරෝලිස් අමරසිංහගේ නිවසට පැමිණියහ.

බුද්ධරක්ඛිත හිමි අමරසිංහ සහ පවුලේ තොරතුරු විමසීමෙන් පසු අමරසිංහගේ මෝටර් රිය ටිකකට නිව්ටන්ට ඉල්ලා දුන්නා.

අමරසිංහ එම ඉල්ලීම ඉටු කළා. ඔහුගේ මෝටර් රිය ඔපල් කපිතාන් වර්ගයේ එකකි. නිව්ටන් ඊට ගොඩ වී ධාවනය කරන්න සූදානම් වෙද්දි බුද්ධරක්ඛිත ඔහුට මුදල් දී පතුරම් ගෙනෙන්න කීවා.

ඊට දින දෙකකට පසුත් බුද්ධරක්ඛිත සහ ජයවර්ධන අමරසිංහගේ නිවසට පැමිණියා. ඊට විනාඩි 15කට පසු සෝමාරාමත් පැමිණියා. ඒ සමගම නිව්ටන් පොලිස් වාහනයකින් පැමිණියේ පොලිස් නිල ඇඳුමෙනි. ඔහු පැවසුවේ උසාවියේ සිට පැමිණෙන බවය.

එදිනත් බුද්ධ රක්ඛිත අමරසිංහගේ මෝටර් රිය ඉල්ලා සිටියා. බුද්ධ රක්ඛිත අමනාප කර ගැනීමට අකමැතිවූ අමරසිංහ එදිනත් ඔහුගේ මෝටර් රිය නිව්ටන්ට දුන්න.

ඔවුන්ගේ හැසිරීම වෙනස්වීමත් පතුරම් මිලට ගැනීමත් ගැන සැක පහළ කළ අමරසිංහ ඒ ගැන බුද්ධරක්ඛිතගෙන් විමසුවා. ඔවුන් පැවසුවේ වෙඩි තියන්න පුහුණුවීමට මුතුරාජවෙලට යන බවයි. අමරසිංහටත් ඔවුන් සමග එන්න යැයි බුද්ධරක්ඛිත කීවාට ඇස් රෝගීන් එන නිසා අමරසිංහ ඔවුන් සමග යෑම ප්‍රතික්ෂේප කළා.

ඊට දින දෙකකට පසු සෝමාරාම අමරසිංහගේ නිවසට පැමිණි අවස්ථාවේ වෙඩි තියන්න පුහුණුවීමේ හේතුව ගැන අමරසිංහ විමසූවිට සෝමාරාම ඊට පිළිතුරු දෙමින් පැවසුවේ මහා එකාට වෙඩි තැබීමට බවයි. මහා ඒකා කවුදැයි අමරසිංහ යළිත් සෝමාරාමගෙන් ප්‍රශ්න කළ විට කීවේ මහා එකා අගමැතිතුමා බවය.

එවැනි කුමන්ත්‍රණයක් සඳහා ඔබලා සූදානම් වන්නේ නම් දෙවියන්ගේ නාමෙට මෙහෙ නම් එන්න එපා කියා අමරසිංහ කීවා. සෝමාරාම එලෙස කියා ටික වේලාවකදි බුද්ධරක්ඛිත සහ ජයවර්ධන අමරසිංහගේ නිවසට පැමිණ ඉක්මණින්ම සෝමාරාම එක්කරගෙන යන්න ගිය ඔවුන් දෙදෙනා සෝමාරාමව එලෙස එක් කරගෙන යද්දි සෝමාරාම, අමරසිංහට කී දේ සත්‍යයක් නොවන බවත් ඔවුන්ට එවැනි අදහසක් නොමැති බවත් අමරසිංහගේ කණට කොඳුරමින් බුද්ධරක්ඛිත සහ ජයවර්ධන පැවසුවා.

ඔවුන්ගේ හැසිරීම සහ කියපු දේ සම්බන්ධයෙන් අමරසිංහට කිසිත් හිතාගන්න පුළුවන්කමක් තිබුණේ නෑ. සැප්තැම්බර් 25 වැනි දින අමරසිංහ උදේ 10.15ට පමණ කොළොන්නාව නගරසභා කාර්යාලයේ සිටියදී අමරසිංහට කවුදෝ ඇවිත් අගමැති බණ්ඩාරනායකට වෙඩි තබා ඇති බව කියා ගිය බව අමරසිංහ සිය සාක්ෂියේ පැවසීය.

ඒ අවස්ථාවේ සිට අමරසිංහ කිසිවෙක් සමග කතා කළේ නෑ. දවල් කෑමට ගෙදර ගිය ඔහුට දුරකථනය නාද විය. එය බුද්ධරක්ඛිතගේ කට හඬ බව ඔහුට දැනුණි.

"කිසිවකට බයවෙන්න එපා. නිහඬව ඉන්න. ඒ ගැන කිසිවක් කියන්න එපා." කියා බුද්ධරක්ඛිත පැවසීය. ඉන්පසු ජයවර්ධන, අමරසිංහගේ නිවසට ඇවිත් ණයට රුපියල් 100ක් අමරසිංහගෙන් ඉල්ලා ගත්තේය. අමරසිංහ එම මුදල ඔහුට දුන්නේය.

සැප්තැම්බර් 17 වැනි දින බුද්ධරක්ඛිත හිමි අමරසිංහගේ නිවසට පැමිණ කිසිදෙයකට බියවන්න එපා. මා දැන් එන්නේ ගුවන් විදුලිය මඟින් මෙම සිද්ධිය හෙළා දැක ජාතිය අස්වසාලීමේ ප්‍රකාශයක් කිරීමෙන් පසුව බව බුද්ධරක්ඛිත හිමි පැවසූහ. අමරසිංහ ඒ ගැන පැවසුවේ මම ඔවුන් ගැන පොලිසියට කියනු ඇතැයි ඔවුන්ට තිබූ බිය නිසයි.

මේ සම්බන්ධයෙන් කළ යුතු හැමදෙයක්ම කළ බවත් බුද්ධ රක්ඛිත හිමි පැවසූහ. අවශ්‍ය වුවහොත් අපි රාජාධිකරණයටත් යන්න ලෑස්තියි කියා බුද්ධරක්ඛිත පැවසූහ.

අගමැති බණ්ඩාරනායක අවමඟුල දා....

1959 සැප්තැම්බර් 25 වැනි දින කොළඹ රොස්මීඩ් පෙදෙසේ අංක 65 දරන අගමැති නිවසේ පුරවැසියන් 40ක් පමණ අගමැතිවරයා හමුවීමට පැමිණියේ අගමැති ලවා ඔවුන්ට අවශ්‍ය කටයුතු කර ගැනීමටයි.

මෙය සිරිත් පරිදි සෑම දිනකම සිදුවේ. ඒ අවදියේ අගමැති හමුවීම කිසිඳු අවහිරයක් තිබුණේ නැත. අගමැතිවරයා එනතුරු මෙම පුරවැසියන් අගමැති නිවසේ ආලින්දයේ කොනක තබා ඇති පුටුවල වාඩිවී සිටියහ.

මෙදින උදේ ඇමරිකානු තානාපති සහ ප්‍රකට නීතිවේදියෙකු වූ එන්.ඊ. වීරසූරිය මහතා අගමැති හමුවීමට පැමිණියහ. ඔවුන් පිටවී ගිය පසු අගමැතිවරයා ඔහු හමුවීමට පැමිණි පිරිස අතර සිටි සෝමාරාම සහ ආනන්ද හිමිවරු වෙත ගියේය. ඒ වන විට එහි වැඩ සිටි සංඝයා වහන්සේ දෙනම කතා බහ කරමින් සිටියහ. මීට පෙර මෙම සංඝයා වහන්සේ දැන හැඳිනගෙන සිටි බව දෙදෙනාගේ කතාබහෙන් එහි සිටි පිරිසට අවබෝධ විය. මින් එක් හිමිනමක් සෝමාරාමය. අනෙක් හිමිනම ආනන්දය. මීට පෙර එක උරයක් පමණක් සිවුරෙන් වසා සිටි සෝමාරාම එදින උරදෙකම වසා සිවුර ඇඳීමට හේතුව කුමක්දැයි ආනන්ද හිමි විමසුවේය.

ඊට පිළිතුරු දුන් සෝමාරාම පැවසුවේ ඉතා වැදගත් පුද්ගලයන් හමුවීමට යන විට සිවුරෙන් උරදෙක වැසෙන සේ සිවුර ඇඳීම තමාගේ පුරුද්ද බවය.

වන විට බණ්ඩාරනායක මහතා සෝමාරාම වෙතට පැමිණ දෙඅත් එක්කර පහත් වී වඳින ගමන් ඔබ වහන්සේට අවශ්‍ය කුමක්දැයි විමසද්දි සිවුර අස්සෙන් රිවෝල්වරය ගෙන දැතින්ම අල්ලාගෙන සෝමාරාම හිමි බණ්ඩාරනායක මහතාට වෙඩි තැබීය. එතුමාට එම වෙඩි පහරවල් වැදීමෙන් පසු පපුව අල්ලාගෙන නිවස ඇතුළට යද්දි සෝමාරාම ඒ පිටුපස ගියහ. ඔහු මා වෙතත් රිවෝල්වරය එල්ල කළේය. මා මල් පෝච්චියක් උඩින් පැන ගේට්ටුව වෙත ගියා. එහි සිටි ආරක්ෂකයාට නිවස ඇතුළේ සිදුවන සිද්ධීන් ගැන දැනුම් දුන්නේය.

අපේ අගමැතිවරයාට ඇතුළේ වෙඩි තබද්දි ඔබ මෙතැනට වී තුවක්කුවක් අරගෙන සිටගෙන ඉන්නවා කියා මා ඔහුට කීවා.

අගමැතිට වෙඩි තියන්නේ කවුදැයි අසමින් තුවක්කුවත් අරගෙන නිවස ඇතුළට ඔහු ගිය විට තව වෙඩි හඬ කීපයක් මට ඇසුණා.

මේ අතර වෙඩි වැදී වැටී සිටි අගමැති වටකරගෙන කවුරුත් හඬා වැලපුණහ. බණ්ඩාරනායක මැතිනියත් එහි සිටියා.

මේ අවස්ථාවේ කීපදෙනෙක් එක් වී අගමැතිවරයා ඉක්මනින් රෝහලට ඇතුළත් කළා. ඊට ටික වේලාවකට පසු වෙඩි වැදීමෙන් තුවාල ලත් එදින අගමැති හමුවීමට පැමිණි ගුණරත්න නමැති කෙනෙකුවත් රෝහලට ඇතුළත් කළා.

අගමැතිවරයාට මෙම අපරාධය කළ සෝමාරාම වට කරගෙන පිරිසක් ඔහුට හොඳට පහර දුන්නා. එහි සිටි පිරිස උත්සාහගත්තේ සෝමාරාමව මරා දමන්නයි. ආනන්ද හිමි ඊට ඉඩ දුන්නේ නෑ. ඔහු වතුර ටිකක් ඉල්ලා සිටි විට වතුර දෙන්න කවුරුත් ඉඩදුන්නේ නෑ. එහෙත් ආනන්ද හිමි මැදිහත්වී වතුර ලබා දුන් බව අධිකරණයට සිය සාක්ෂියෙන් විස්තර කළේය.

එදින ආනන්ද හිමි සමග අගමැති නිවසේ සිටි වෙදගේ පියදාස ඇතුළු කීපදෙනෙක් වෙඩි තැබීමේ සිද්ධිය දුටු බවද ඔවුන් ඒ සිද්ධියට අදාළව සාක්ෂි දුන්න. ඔවුන්ගේ සාක්ෂි ආනන්ද හිමිගේ සාක්ෂිය හා සමානය.

ඊට පසු සාක්ෂි දීම සඳහා කැඳෙව්වේ සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ සොහොයුරු බාන්ස් රත්වත්තේ මහතාය. විනිශ්චයවරයෙකු වන රත්වත්තේ මහතා පැවසුවේ එදින ඔහු රොස්මීඩ් නිවසේ සිටියදී බණ්ඩාරනායක මහතා ඔහු හමුවීමට පැමිණි අය සමග කතා කරමින් සිටියා. නිවසට පිටතින් සිරිමා බණ්ඩාරනායක මැතිනිය තවත් දෙදෙනෙක් සමග කතා කරමින් සිටියා.

මේ අවස්ථාවේ රතිඤ්ඤා පත්තු වෙන හඬ කීපයක් ඇසුණා. ඒ දෙසට මා ගියා. ඒ අවස්ථාවේ සිරිමා මැතිනිය වත්තේ සිට නිවස තුළට දුවගෙන ආවා. ඒ පසුපස හේමා දාබරෙ මහතාත් පැමිණියා. කිසියම් අනතුරක් වන බව සිතූ බාන්ස් මහතා බණ්ඩාරනායක මහතා සිටි පැත්තට යද්දි ඔහු කොරිඩෝ පැත්තට ගියා. බණ්ඩාරනායක මහතා පිටුපස භික්ෂුවක් රිවෝල්වරයක් එල්ලකරගෙන සිටියා.

පතුරම් ඇතුළු වීමේදී සිරුරේ හමේ පිළිස්සුණු හෝ හිරවූ ලකුණු දක්නට නැත. පතුරම සිරුරට ඇතුළු වෙද්දි කඩතොලු සිදුවීමක් දක්නට නැත.

වැඩියෙන් තුවාල සිදු වූයේ අක්මාව, බඩ සහ ඇලදිව යන ඉන්ද්‍රියන්ටය. අඩියක පමණ දුර සිට වෙඩි තබා තිබෙන බව වෛද්‍ය ප්‍රනාන්දුගේ අදහසය. බාහිර තුවාලවලට කෙළින්ම අභ්‍යන්තර තුවාල සම්බන්ධයි.

අගමැතිවරයාට සිදුවූ තුවාල අනුව එතුමා ජීවත් කළ නොහැක. තුවාල සිදුවීමෙන් ලේ ගැලීම නතර කළද අගමැතිවරයාගේ ජීවිතය බේරා ගැනීමට අසමත්වූ බව වෛද්‍ය ඇන්තනිස්ට පැහැදිලි විය. අගමැතිවරයාට වෙඩි තැබූ සෝමාරාම භික්ෂුවට ද රෝහලේදි සැත්කමක් කෙරුණි. ඔහුට තුවාල තුනක් සිදුවී තිබිණි. දකුණු කලව උඩ කොටස සිරීම් තුවාලයක් සහ හිසේ වම් පැත්තේ තුවාලයක් විය. සෝමාරාමට මෙම තුවාල සිදුවූයේ කෙසේදැයි සැත්කම සඳහා පැමිණි විට ඔහුගෙන් කිසිවෙක් විමසා නැත.

අගමැති බණ්ඩාරනායකට වෙඩි තැබීම සඳහා පස්වැනි විත්තිකාර නිව්ටන් පෙරේරා තමාගෙන් රිවෝල්වරයක් ඉල්ලා තම නිවසට පැමිණි බව පැමිණිල්ලෙන් සාක්ෂි පිහිටුවා බුරුමයේ සිට ලංකාවට සහල් ප්‍රවාහනය කිරීමට, සීනි නිපදවීමේ කර්මාන්තශාලාවක් පිහිටුවීම, කැලණිය රජමහා විහාරය ඉදිරිපිට ඉන්ධන අලෙවි ස්ථානයක් පිහිටුවීම බුද්ධරක්ඛිත හිමි සිතාගෙන සිටියා. රජයේ ආයතනවල කොන්ත්‍රාත් ලබාගැනීම සඳහා බුද්ධරක්ඛිත උත්සහ ගනිද්දි අගමැතිවරයා ඊට විරුද්ධ විය. අගමැතිවරයා එය නතර කිරීමට මැදිහත් විය. බුද්ධරක්ඛිතට අවශ්‍ය දේ කර ගැනීමට නොහැකි වූ විට ඔහු දිනක් පී.බී.ජී. කළුගල්ල මහාතට දුරකථනයෙන් කතා කොට කැලණිය පන්සලට එන්න පැවසීය.

ඒ අනුව ගිය විට බුද්ධරක්ඛිත කළුගල්ල මහතාට මෙලෙස පැවසීය. මේ ආණ්ඩුව බොහොම ඉක්මනට වැටෙනවා. ඔබට පුළුවන් ආණ්ඩුවෙන් ඉවත්වී රජයක් පිහිටුවන්න. එහෙම කළොත් අපේ මිනිස්ටරත් (විමලා විජේවර්ධන) ඔබට එක් වෙනවා. බුද්ධරක්ඛිත හිමි කැලණිය රජමහා විහාරයේ විහාරාධිපති තනතුරට පත්වූයේ තරගකාර ලෙස ක්‍රියා කිරීමෙන් බවද, ඔහු සංඝයා වහන්සේ නමක් වශයෙන් බොදු පිළිවෙත් අනුගමනය නොකළ බවද වැඩිපුර සිටියේ විමලා විජේවර්ධන මහත්මියගේ නිවසේ බවත් එහිදී ගිහියෙකු ලෙස ආහාරගත් බවද සාක්ෂිවලින් අනාවරණය විය. මුදල් සොයා ගැනීමේ අරමුණ අනුව ක්‍රියා කළ බුද්ධරක්ඛිත හිමිට අගමැති බණ්ඩාරනායක මහතා විරුද්ධ විය.

රජයේ විවිධ උසස් තනතුරු වලට පත් නොකිරීම, රාජ්‍යය යන්ත්‍රයේ ක්‍රියාදාමයේ කොටස්කරුවෙකු නොකිරීම සම්බන්ධයෙන්ද අගමැති බණ්ඩාරනායක සමග අමනාපයෙන් පසුවූ බවද සාක්ෂිවලින් අනාවරණය විය.

ශ්‍රී ලංකාවේ දීර්ඝතම අපරාධ නඩුව දින 55ක් විභාග විය. නඩු විභාගයේ වාර්තාව පිටු 3536 කින් යුක්තය. නඩු විභාගයට පසු තීන්දුව දැන ගැනීමට අධිකරණ පරිශ්‍රයට වැඩිම ජනතාවක් පැමිණි බව සඳහන්වේ. මෙම නඩු විභාගයේදි සාක්ෂිකරුවන් 97ක් දෙනෙක් සාක්ෂි දී ඇත. නඩු විභාගය ආරම්භ වූයේ 1961 පෙබරවාරි 22 දිනය. තීන්දුව ප්‍රකාශයට පත් කළේ 1961 මැයි 10 වැනි දිනය. දඬුවම් නියම කිරීමට පෙර වරදකරුවන්ගේ ප්‍රකාශ සඳහා දින දෙකක් ගත විය.

1961 මැයි 10 වැනි දින නඩුවේ තීන්දු ප්‍රකාශයට පත් කෙරුණි. එදින අධිකරණ පරිශ්‍රයේ අතුරුසිදුරු නැතිව මහජනයාගෙන් පිරී ඉතිරී ගියේය. එදින දහවල් 12.10ට ජූරි සභාව නික්ම ගියේ තීන්දු රැගෙන එන්නටය. තීන්දුව රැගෙන ජූරි සභාව අධිකරණ ශාලාවට ඇවිත් අසුන් ගැනීමෙන් පසු අධිකරණයේ නිලධාරියා ජූරි සභාවේ නායකයාගෙන් විමසුවේ ඒකමතික තීරණයකට එළඹුනාද යන්නය.

ජූරි සභාවේ නායකයා ඊට මෙලස පිළිතුරු දුන්නේය.

පළමු විත්තිකරු බුද්ධරක්ඛිත, දෙවන විත්තිකරු එච්.පී. ජයවර්ධන, හතරවෙනි විත්තිකරු සෝමාරාම වෙනුවෙන් ජූරියේ තීන්දුව ඒකමතික බවයි. ඔවුන් තිදෙනා බණ්ඩාරනායක මහතාගේ මරණය සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීමේ චෝදනාවට වරදකරුවන් වූ බව ජූරියේ ඒකමතික තීරණය බව කීය.

4 වැනි විත්තිකරු කුමන්ත්‍රණයට අමතරව මිනිමැරීමේ චෝදනාවට වරදකරුවී ඇති බවද ජූරියේ තීරණය බවද පැවසීය.

අනුර, සහ නිව්ටන් යන විත්තිකරුවන් කිසිම චෝදනාවකට වරදකරුවන් නොවන බව ජූරියේ පස්දෙනෙකුගේ තීන්දුව බවද සඳහන් කළේය. මේ අවස්ථාවේ නඩුව විභාග කළ විනිසුරුවරයා ඉතාමත් හැඟීම්බරව පැවසුවේ බෞද්ධයෙකු වශයෙන් තමා බෞද්ධ භික්ෂූන් දෙදෙනෙකුට මරණීය දඬුවම නියම කරන්න සිදුවන බව නොසිතුවේ යැයි කීය.

තුන්වැනි විත්තිකාර අනුර සහ පස්වැනි විත්තිකාර නිව්ටන් කිසිම චෝදනාවකට වරදකරුවන් නොවන බව ජූරි සභිකයන් පස්දෙනෙක් තීන්දු කළ හෙයින් ඔවුන් නිදහස් කළේය. බුද්ධ රක්ඛිත, එච්.ජී. ජයවර්ධන සහ සෝමාරාම යන තිදෙනාට දීර්ඝ ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව දීමෙන් පසු ඔවුන් තිදෙනාටම මරණීය දඬුවම් නියම කෙරුණි.

සමාප්තයි

දින 55 තිස්සේ විභාග වූ ලංකාවේ දීර්ඝතම නඩු විභාගය

මගේ සොහොයුරිය වැලපෙමින් බණ්ඩාරනායක මහතා අල්ලා ගත්තා. එක අතකින් තම සැමියා අල්ලාගෙන අනිත් අතින් භික්ෂුවගේ සිවුරෙන් අල්ලාගෙන ඔහුගෙන් තම සැමියා මුදවා ගැනීමට ඇය උත්සාහ ගත්තා. එතැනට තවත් කීපදෙනෙක් ළඟාවී භික්ෂුව වට කරගෙන ඔහුට පහර දෙන්න පටන් ගත්තා. එතැනට රැස්වන පිරිස එන්න එන්න වැඩි වුණා. ඔහු අත තිබූ රිවෝල්වරය වැටුනහම ඔහු එය ගන්න උත්සහ ගත්තත් රැස්වූ සෙනඟ ඔහුව මෙල්ල කරගත් පසු තවත් පිරිසක් බණ්ඩාරනායක මහතාව රෝහලට ගෙන ගියා.

රෝහලේදි බණ්ඩාරනායක ම

වසර එකසිය දහ හතරකට පෙර
ප්‍රභූ පවුල් දෙකක් ගැටීමෙන්
සිදු වූ ආටිගල ඝාතනය

‘කට වරද්දාගෙන’ මරු කටට මඟ කපාගනී

● ජානක පෙරේරා

දිනය වසර 1906 දෙසැම්බර් පස්වැනි දාය. ලංකාවේ මිනිරන් රජු ලෙස හැඳින්වුණු කහටගහ මිනිරන් පතල හිමි ධනවත් දොන් චාල්ස් ගිමෝරිස් ආටිගල මුදලිතුමාගේ එකම පුත් ෆ්‍රැන්සිස් ඩික්සන් ආටිගල එදින නැවතී සිටියේ තමා ඉගෙනුම ලැබූ කොළඹ වෙස්ලි විදුහලේ ප්‍රධාන ගුරුවරයා (Head Master) වූ සී. පී. ඩයස් මහතාගේ පිටකොටුව නිවසේය. ඩයස් මහතා කොළඹ නගර සභාවේ සභිකයෙකුද වූ අතර බෙහෝ දෙනෙකු ගරු කළ පුද්ගලයෙකු විය (පිටකොටුවේ ඩයස් පෙදෙස නම් කර ඇත්තේ ඔහුගේ නමින්ය).

කොලමුනේ ආටිගල වලව්වේ පැරණි සේයාරුවක්

තරුණ ඩික්සන් සල්පිටි කෝරලයේ සිය නිවස වූ කොලමුනේ වලව්වේ සිට කොළඹ ආ හැමවිටකම ඩයස් මහතාගේ නිවසේ නැවතී සිටීම පුරුද්දක් විය. දෙසැම්බර් පස්වන දා රාත්‍රී දහයට යම් අයෙක් මිදුලේ සිට “ෆ්‍රැන්සිස්, ෆ්‍රැන්සිස්” යනුවෙන් ඩික්සන්ට කතා කෙළ්ය. ආලින්දයේ සිටි ඔහු තමාට කතා කරන්නේ කවුදැයි බැලීමට මිදුලට ආවා පමණි. ඔහුගේ උදරය පාසා කරගෙන වෙඩි උණ්ඩයක් වැදින. බරපතළ ලෙස තුවාල ලත් ඩික්සන් වහාම රෝහල් ගතකරන ලදී. සිද්ධිය පොලිසියට දැනුම් දෙන ලදින් එවකට කොළඹ යුරෝපීය පොලිස් අධිකාරීව සිටි හර්බට් ඩව්බිගින් පිටකොටුව පොලිසියට ගොස් එතැනින් සිද්ධිය වූ ස්ථානයට ගියේය. මූලික පරීක්ෂණ වලින් හෙළි වූයේ වෙඩිල්ල තබා ඇත්තේ මිදුලේ පඳුරකට මුවා වී බවය.

ඉන් පසු සිය කැමැත්තෙන් පොලිසියට බාර වූ පිලෝරිස් නම් අයෙක් කළ පාපොච්චාරණයක් නිසා හිටපු පොලිස් කොස්තාපල් වරයෙකු වූ සිංඝෝනි පෙරේරා සහ ඔහුගේ ඥාති සොහොයුරු බාරොන් පෙරේරා වෙඩි තැබීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනුනි. සිද්ධියට සිංඝෝනි පෙරේරා ගේ සම්බන්ධයක් ඇති බවට කරුණු හෙළිවූයෙන් කලක් දක්ෂ පොලිස් නිලධාරියෙකුව සිට පසුව දේපළ හිමි ධනවත් ව්‍යාපාරිකයකු වූ ජ්‍යෙෂ්ඨ ජෝන් කොතලාවලද මේ ගැන සැකයට පාත්‍ර විය. (ඔහු මෙරට පසු කලෙක අගමැති වූ සර් ජෝන් කොතලාවලගේ පියාය). ඒ දිනවල කොතලාවල සිටියේ පිටරටය.

එවකට පොලිස් පරීක්ෂක වරුන් වැඩි දෙනෙක් සුද්දන් වූ නමුත් සිය දස්කම් නිසා සාමාන්‍ය කොස්තාපල් වරයකු ලෙස පොලිසියට බැඳුනු ජෝන් කොතලාවලට පොලිස් පරීක්ෂක නිලය දක්වා උසස් වීමට හැකි විය. ඔහු ප්‍රසිද්ධියට පත්වූයේ සූදු පොළවල් වැටලීම් සම්බන්ධයෙනි. ඉන් වඩාත්ම කැපී පෙනුනේ නෙයිනා නම් මැරයෙකුගේ සූදු පළ වැටලීමය. කොතලාවල ඉතා ශක්තිමත් හැඩිදැඩි පුද්ගලයකු විය. ඔහු වසර 1895 කොල්ලුපිටිය පොලිසියේ පරීක්ෂකවරයෙකු ලෙස සේවය කළ කාලයේ ඔහු යටතේ සේවය කළ අයෙකි සිංඝෝනි පෙරේරා.

ජෝන් කොතලාවල කොළඹ කරත්ත කරුවන්ගේ සංගමයේ සභාපතිවරයාද විය. ඒ කාලයේ යාන්ත්‍රික ප්‍රවාහන ක්‍රමයකට තිබුණේ දුම්රිය සහ කොළඹ නගරයට සීමා වූ ට්‍රෑම් රිය පමණි. ගොඩබිම බොහෝ ගමන් බිමන් කෙරුනේ ගොන් කරත්ත, රික්ෂෝ සහ අශ්ව කරත්ත මගින්ය.

මේ මිනිමැරුමට පසුබිම් වූයේ වූයේ කොතලාවල සහ ආටිගල පවුල් අතර නෑ සම්බන්ධයයි. පවුල් දෙකම විසුවේ පිළියන්දල මඩපාත ගමේය. බණ්ඩාරගම පළාතේ නොතාරිස් ඊ. ඒ.කොතලාවලගේ පුතුන් සය දෙනාගෙන් කෙනෙක් වූ ජෝන් කොතලාවල (ජ්‍යෙෂ්ඨ) විවාහ වූයේ ආටිගල මුදලිතුමාගේ වැඩිමහල් දියණිය වූ ඇලිස් සමඟය. ඇයට ලීනා සහ ඇලන් යනුවෙන් සොහොයුරියන් දෙදෙනෙක් වූ අතර සොහොයුරා වූයේ පවුලේ බාලම දරුවා ෆ්‍රැන්සිස් ඩික්සන්ය. ආටිගල මුදලි ජෝන්ගේ සහ ඇලිස් ගේ සම්බන්ධයට මුලදී විරුද්ධව සිටියේ යයි කතාවක් ඇත. කෙසේ වෙතත් අවසානයේදී ඔහු ඊට කැමැත්ත දුන් පසු විවාහය ජයටම සිදු වූ අතර මනාලයාට විශාල දැවැද්දක් ද ලැබිණ. මේ විවාහය සිදුවී වැඩිකලක් යන්නට පෙර ආටිගල මුදලිතුමා මියගියේ ඔහුගේ වැන්දඹුව, අවිවාහක දියණියන් දෙදෙනෙක් සහ පාසැල් යන වියේ සිටි පුතාද තනිකරමිනි.

ජෝන් කොතලාවල ඇලිස් සමඟ විවාහ වීමෙන් පසු ඔවුන් දෙදෙනාට දරුවන් තිදෙනෙකු ලැබිණ. ඒ කනිෂ්ඨ ජෝන් කොතලාවල (පසුව සර් ජෝන්) සහ ජස්ටින් යන පුතුන් දෙදෙනා සහ ෆ්‍රිඩා දියණියයි. මේ විවාහය ජ්‍යෙෂ්ඨ ජෝන් කොතලාවලට ධන උල්පතක් පැදුනාක් මෙන් විය. ඔහුගේ මස්සිනා ඩික්සන් බාලවයස් කරුවෙකු වූ බැවින් ඔහු සිංඝෝනි පෙරේරා සමඟ පොලිස් සේවයෙන් ඉවත්ව ආටිගල පවුලට අයත් විශාල පොල්වතු සහ මිනිරන් වතුවල පාලනය තමන් වෙත පවරා ගත්තේය. එහෙත් ජෝන් ඒවායින් ලැබුණු ආදායමින් තමන්ට හිමිවිය යුතු කොටස ඉක්මවා ලාභ ලබාගත් නිසා ඔහුගේ නැන්දම්මාට (ආටිගල මැතිනියට) ඔහු එම දේපළ පාලනයෙන් ඉවත් කිරීමට කුරුණෑගල දිස්ත්‍රික් උසාවියේ නඩු කිහිපයක් පැවරීමටද සිදුවිය. මේ හේතුවෙන් ඩික්සන් දහසය වැනි වියේදී පාසල් අධ්‍යාපනය නවතා දැමුවද ඔහුට ජෝන්ට මුහුණදීමට ශක්තියක් නොවීය. කෙසේ වෙතත් මේ තත්වය නිසා ආටිගල මැතිනිය (ඩික්සන්ගේ මව) එවකට මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාගේ මාර්ගයෙන් බාල වයසේ සිටි සිය පුතාට ආටිගල පවුලේ දේපළ පාලනය කිරීමට ‘වියා අයිටාටිස්’ ආඥාවක් (Letters of Venia Aetatis) මගින් නීතිමය බලය ලබාගත්තාය.

පොලිසියෙන් අස්වීමෙන් පසු සිංඝෝනි පෙරේරා කොතලාවලට අයත් නිවසක ජීවත් වූ අතර ඔහුට අයත් අනෙක් නිවෙස් වල නිවැසියන්ගෙන් කුලී අයකරගැනීමට කොතලාවලට සහය විය.

ෆ්‍රැන්සිස් ඩික්සන් ගේ දෙවන සොහොයුරිය ලීනා ආටිගල වසර 1905 දී විවාපත්වන විට ජෝන්ගේ සහ ඇලිස්ගේ දරුවන් සිටියේ කුඩා අවධියේය. ලීනා විවාහ වූයේ ලංකා පාබල හමුදාවේ ලුතිනන් (පසුව කර්නල්) වරයෙකු වූ ටී. ජී. ජයවර්ධන සමඟය. පසුකලෙක එම හමුදාවේ පළමු ලාංකික අණදෙන නිලධාරියා වූ ඔහු හිටපු ජනපති ජේ. ආර්. ජයවර්ධන ගේ පියාගේ වැඩිමහල් සොහොයුරාය.

ජයවර්ධන සහ ආටිගල පවුල් සම්බන්ධ වීම ආටිගල පවුලේ දේපළ වලින් තමන් එතෙක් අයුතු ලෙස ලැබූ ලාභ අහිමිවීමක් බව ජෝන් කොතලාවලට අවබෝධ විය. ඉන් කුපිත වූ ඔහු එම විවාහ උත්සව දිනයේදී ජයවර්ධන පරම්පරාවට "තොපි තම්බියෝ" යනුවෙන් අපහාස කෙළ්ය. උත්සවයට පැමිණි අමුත්තන් ඉදිරියේ තම අනාගත මස්සිනා ජයවර්ධන ගේ නැයින් ලජ්ජාවට පත්කිරීම ගැන කෝප වූ ඩික්සන් අත දිගහැර ජෝන් ගේ කම්මුලට පහරක් ගැසීය. ඉන් මාරාවේශ වූ ජෝන් ඔහුට මරණීය තර්ජනයක් කෙළේය.

"උඹ දැනගනින් යකඩ හබලපෙති කෑවයි කියල. උඹ පොඩි වැඩියි එත් උඹේ අවසානය තීන්දුයි"

මේ සිද්ධියෙන් පසු ජෝන් කොතලාවල 'ලංකා-ජපන් වෙළෙඳ සමාගම' (Ceylon-Japan Trading Company) නමින් සමාගමක් පටන් ගෙන එහි කටයුතු සඳහා යයි කියමින් ජපානය බලා පිටත් විය. මෙහි යටි අරමුණ හෙළි වූයේ පසුවයි.

ජෝන් කොතලාවල (ජ්‍යෙෂ්ඨ)

තුවාල වලින් මියගිය ෆ්‍රැන්සිස් ඩික්සන් ඊට පළමුව තමා සතු දේපළ සියල්ලම තම අක්කලා දෙදෙනාට - ටී. ජී. ජයවර්ධන සමඟ විවාපත් ලීනා සහ ඇගේ බාල සොහොයුරිය වූ ඇලන්ට - අන්තිම කැමති පත්‍රයකින් පැවරීය. තමාගේ ඉරණමට ජෝන් වගකිව යුතු බව ඩික්සන්ට අවබෝධ වූ නමුත් ලීනා වැන්දඹු තත්වයකට පත්කිරීමට අකමැති වූ නිසා ඔහු මස්සිනාට චෝදනා කෙළ් නැත. ඇලන් විවාහ වූයේ එෆ්. ආර්. සේනානායක සමඟය.

ඩික්සන් ගේ අවමඟුලෙන් පසු ඇලිස් ඒ බව දන්වා ජපානයේ සිට සිය සැමියා ජෝන්ට කොතලාවලට කේබල් පණිවුඩයක් යැවීය. 'කට වරද්දාගත්' ජෝන් ඊට ප්‍රතිචාර දැක්වූයේ "කවුද එයාට වෙඩි තිබ්බේ?" යයි අසමින් ඇයට පණිවුඩයක් එවමිනි. ඔහුගේ ඒ කේබල් පණිවුඩය පොලිසියට ප්‍රහේලිකාවක් විය. ඩික්සන් වෙඩි වැදීමෙන් ලත් තුවාල වලින් මියගිය බව සැතපුම් දහස් ගණනක් ඈත එපිට ජපානයේ සිටි ජෝන් කොතලාවල දැනගත්තේ කෙසේද? එවැන්නක් එතෙර දී දැනගැනීමට ඒ කාලයේ දුරකථන, ගුවන්විදුලි රූපවාහිනී හෝ අන්තර්ජාල සේවා හෝ නොතිබිණ.

මේ අතර සිංඝෝනි පෙරේරා විසින් ජපානයට යවන ලද කබල් පණිවුඩයක්ද පොලිසිය අතට පත් විය. “එළදෙනට පැටියා ලැබුණා” යනුවෙන් එහි සඳහන් වීම පොලිසියේ කුතුහලය තවත් වැඩි කෙළ්ය. එය යම් කිසි සංඥාවක් බව ඔවුන්ට අවබෝධ වූයෙන් ජෝන් කොතලාවල නැවත ලංකාවට එනතුරු ඔවුහු ඉවසිල්ලෙන් බලා සිටියහ. වසර 1907 ජනවාරි 24 වැනිදා ඔහු ‘හිටචි මාරු’ නම් ජපන් නැවෙන් කොළඹ වරායට සම්ප්‍රාප්ත වූ වහාම සහකාර පොලිස් අධිකාරි ජේ. එච්. ඩනියෙල් විසින් මගී ජැටියේදී ඔහු අත්අඩංගුවට ගන්න ලදුව කොටුව පොලිසියට ගෙනයනු ලැබීය. එතැනින් ඔහු ගෙනයන ලද්දේ නාගරික මහේස්ත්‍රාත් ජේ.එෆ් ආර් පෙරෙයිරාගේ බංගලාවටය. කොතලාවල වෙනුවෙන් පෙනී සිටි අද්වකාත් වරුන් වූ ජී. එස්. ස්නයිඩ සහ ඩොනල්ඩ් ඔබේසේකර ඔහු වෙනුවෙන් ඇප අයැදුම් කළ නමුත් එය ප්‍රතික්ෂේප කරන ලදින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගතකෙරිණ.

ජනප්‍රිය පුද්ගලයෙකු වූ කොතලාවල පොලිස් අත්අඩංගුවට ගැනීම කොළඹ මහත් ආන්දෝලනයක් ඇතිකෙළ්ය. එනිසා මහේස්ත්‍රාත් කීත් මැක්ලියොඩ් සෙනග සීමා කිරීම සඳහාත් ආරක්ෂාව පිණිසත් මූලික සාක්ෂි විභාගය පැවැත්වූයේ වැලිකඩ බන්ධනාගාරයේය. එම විභාගය අවසන් වූ පසු නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කරන ලදුව කොතලාවල ඉංග්‍රීසි කතාකරන ජූරියක් ඉල්ලාසිටියේය. විනිසුරු ඇලෙක්සැන්ඩ වුඩ් රෙන්ටන් ගේ ප්‍රධානත්වයෙන් නඩු විභාගය අලුත්කඩේ උසාවියේදී 1907 අප්‍රේල් 15 දා ඇරඹිණි. එදින විශාල පිරිසක් කොතලාවලට ඔල්වරසන් දෙමින් අලුත්කඩේ උසාවි බිමට එක්රොක් වූහ. බී.ඩබ්ලිව්. බාවා, එච්. ජේ. පෙරෙයිරා සහ ආර්. එච්. මෝගන් යන නීතිඥවරුන්ගේ සහායෙන් රාජ නීතිඥ (Crown Counsel) සී. එම්. ප්‍රනාන්දු පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටියේය. චූදිතයන් වෙනුවෙන් ටී. තෝන්හිල්. එෆ්. ඩබ්ලිව්. විලියම්ස්, පී. ජී. කුක්, හේලි, ස්නයිඩ් සහ ඩොනල්ඩ් ඔබේසේකර යන නීතිඥවරුන්ගේ සහායෙන් ඉන්දියාවේ කල්කටා සිට පැමිණි නීතිඥ අර්ඩ්ලි නෝටන් විත්තිය වෙනුවෙන් පෙනී සිටියේය. පැමිණිල්ල මෙහෙය වූයේ එවකට වැඩබලන නීතිපති, පසුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවකු වූ, වොල්ට පෙරෙයිරාය.

එකල මෙරට උසාවි ඇතුළු සියලු රාජ්‍ය ආයතන වල වැඩකටයුතු කෙරුණේ ඉංග්‍රීසියෙනි.

පැමිණිල්ල ඉදිරිපත් කරමින් රාජ නීතිඥ ප්‍රනාන්දු කියා සිටියේ මේ මිනිමැරුම ඉතා සුක්ෂම ලෙස සැලසුම් කරන ලද්දක් බවයි. මේ බව ඔප්පු කළ වැදගත්ම සාක්ෂිය වූයේ පිලෝරිස් හෙවත් පිලා නම් පුද්ගලයා අප්‍රේල් 20දා හෙළි කළ කරුණුය.

වාද්දුවේ උපන් පිලා කලක් බ්‍රිතාන්‍ය යුද හමුදාවේ සේවය කරමින් දකුණු අප්‍රිකාවේ දෙවෙනි බෝය යුද්ධයේදී (Second Boer War 1899-1902) සටන් අත්දැකීම් ලැබූ සෙබළකි. ඉලක්කයට වෙඩි තැබීම ඔහුට හොඳින් නුරුය. සිංඝෝනි පෙරේරා තම ඥාති සොහොයුරා වූ බාරොන් පෙරේරා සමඟ පිලා හමුවී ඩික්සන් මැරීමේ කටයුත්තට ඔහුව එකඟ කරගත්හ. ඒ සඳහා කොළඹ චෝක සමාගමෙන් තුවක්කුවක් මිලට ගත් ඔව්හු ටික දිනක් පිලාව පිටකොටුවේ කාමරයක රැඳවූහ. එහෙත් ඔව්හු තමන් සැබවින්ම කවුරුද යනවග පිලාට නොදැන්වීමට වග බලාගත්හ. එපමණක් නොව තමා මරා දැමිය යුතු පුද්ගලයාගේ නම ගම ගැනවත් පිලා දැන සිටියේ නැත. ඝාතනයට කලින් ඒ සඳහා පිලාට අත්තිකාරම් මුදලක් ලැබුණු අතර ඉතිරිය ඝාතනයෙන් පසු දෙන බවට සිංඝෝනි සහ බාරොන් ඔහුට පොරොන්දු වූහ.

ඝාතනය සිදු කිරීමට නියමිත දින රාත්‍රියේ සිංඝෝනි සහ බාරොන් පිලා සමඟ ඩයස් නිවසේ වැට අයිනට පැමිණියහ. විදුලි බලය නොතිබුණු ඒ වකවානුවේ ලාම්පු එළියෙන් මිදුලේ සිටි කිසිවෙකුත් පැහැදිලිව නොපෙනුනි. “ෆ්‍රැන්සිස්” “ෆ්‍රැන්සිස්” යනුවෙන් ඩික්සන්ට ඇමතුවේ සිංඝෝනි පෙරේරාය. ඩික්සන් මිදුලට ආ විගසම පිලා ඔහුට වෙඩි තැබිය. ඒ සමගම සිංඝෝනි සහ බාරොන් එතනින් පැන ගියේ වෙඩි තැබීමෙන් පසු පිලා ආපසු පලා යායුතු මඟ ගැන ඔහුට උපදෙස් දෙමින්ය. එහෙත් ඔවුන්ගේ යටි අරමුණ වූයේ ඩික්සන්ට වෙඩි තබා පිලා ආපසු එන අතරේ ඔහුද මරා දමා සියලු සාක්කි යටපත් කිරීමය. මේ බව ඉවෙන් මෙන් වටහාගත් පිලා තම ආරක්ෂාව පාතා වෙනත් මඟකින් ගොස් සිය කැමැත්තෙන් පොලිසියට බාර විය. තමා කිසිසේත් නොහඳුනන අයෙකුට වැඩි තැබූ බව ඔහු පොලිස් නිලධාරීන්ට පැවසීය.

පොලිසිය උනන්දු වූයේ පිලාට විරුද්ධව නඩු පැවරීමට වඩා මිනීමැරුම පිටුපසින් සිටි සැබෑ කුමන්ත්‍රණ කරුවන් අල්ලා ගැනීමටය. ඒ අනුව නීතිපතිවරයා පිලා රජයේ සාක්කිකරුවෙකු ලෙසත් ඔහු සියල්ල හෙළි කළේය.

ජෝන් කොතලාවල සිය මස්සිනාට වෙඩි තැබීමේ කටයුත්ත සිංඝෝනි පෙරේරාට පවරා ඊට කලින් 'ලංකා-ජපන් වෙළෙඳ සමාගමක්' පටන් ගෙන ජපානය බලා ගියේ ඒ සිද්ධියට තමාගේ කිසිම සම්බන්ධයක් නැතැයි රටට ඒත්තු ගැන්වීමට බව නඩුවේදී අනාවරණය විය. ඒ වන තෙක් ලංකාවේ කිසිම අපරාධ නඩුවකට මෙතරම් මහජන අවධානයක් යොමු නොවීය. ඊට ප්‍රධාන හේතුව වූයේ මෙරට දැවැන්ත ප්‍රභූ පවුල්වල සම්බන්ධයයි. කොතලාවලට විරුද්ධව මතු වූ සාක්කි ඉතා ප්‍රබල විය. බලවත් පුද්ගලයන් ඔහුව බේරා ගැනීමට තැත් කලත් සේනානායක සහ ජයවර්ධන පවුල් දෙකේ බලපෑම මත ඔහු හිර විය. දින ගණනාවක් පැවති නඩු විභාගය අවසානයේදී එහි තීන්දුව දීමට නියමිත දින වන විට චූදිතයන් තිදෙනාට මරණ දඬුවම හිමි වන බව ඉතා පැහැදිලි විය. නීතියෙන් මරණ දඬුවම හිමි වීමට වඩා සියතින් මියයාම හොඳයයි තීරණය කළ කොතලාවල රහසින්ම තමා සිටි සිර කූඩුවට සයනයිඩ් විස ගෙන්වාගෙන සිය දිවි නසා ගත්තේය. සිංඝෝනි සහ බාරොන් දෙදෙනාම පෝරකයට ගිය අතර පිලා නිදහස ලැබීය.

තම සංගමයේ සභාපති කොතලාවලට අත්වූ ඉරණම ගැන කුපිත වූ කරත්ත කරුවෝ පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් වූවන් ඔහු මරා දැමූ බවට අභූත චෝදනා නැගූහ. උසාවි නීතිය සහ එම නඩු විනිශ්චයේ සාධාරණත්වය ගැන කිසිදු අවබෝධයක් නැතිව කෝපයෙන් ඇවිස්සුනු සියයකට අධික කරත්ත කරුවන් පිරිසක් පැමිණිල්ල මෙහෙයවූ වැඩබලන නීතිපති වෝල්ට පෙරෙයිරා ගේ නිවස වටකොට ඔහුට සහ ඔහුගේ පවුලට පහර දෙන්නට තැත් කළහ.

ශක්තිමත් පුද්ගලයෙක් වූ පෙරෙයිරා එක් කරත්තකරුවෙක් නිවසේ ඉදිරිපස පඩිපෙළ නගිනු දැක ඔහු අල්ලා සෙනග දෙසට වීසි කෙළ්ය. ඉන්පසු පුදුමයකට මෙන් විසිරී ගිය සෙනග ඉන්පසු ඇවිද ගියේ නඩුව මෙහෙයවූ වෝල්ට පෙරෙයිරාට සහය දුන්, පැමිණිල්ල ඉදිරිපත් කළ රාජ නීතිඥ සී.එම්. ප්‍රනාන්දු ගේ නිවස පිහිටි බම්බලපිටිය ගාලුපාරේ අශෝක උද්‍යාන හන්දියටය. තමන්ට පහර දීමට එන කරත්ත කරුවන්ගේ හඬ ඇසුණු ප්‍රනාන්දු සිය පවුලත් සමඟ ඉක්මනින් ආරක්ෂිත ස්ථානයක සැඟවුනි. ඔහු නිවසේ නැතිබව දැනගත් සෙනග එම නිවස පොඩිපට්ටම් කළහ.

සිය සැමියාගේ නඩුවට විශාල වශයෙන් මුදල් වැය වීම නිසා ඇලිස් කොතලාවල සහ ඇගේ දරුවෝ ඉමහත් ආර්ථික අහේනියකට පත්වූහ. එහිදී ඔවුන් වෙනුවෙන් ඉදිරිපත් වූ සේනානායක පවුල කහටගහ මිනිරන් පතලෙන් සහ අනෙක් දේපළ වලින් ඔවුන්ට අයත් කොටස් සමහරක් ඇයට ලබා දුන් අතර කොතලාවල දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ වගකීමද බාරගත්හ.

සුව හමුව

සැකසුම: හර්ෂා සුගතදාස

පිළිතුරු සැපයීම - කායික රෝග විශේෂඥ වෛද්‍ය වරුණ ගුණතිලක

රුධිර පරීක්ෂාවට නිරාහාරව සිටියදී වතුර බීම සුදුසු ද?

ප්‍රශ්නය :- මම 62 හැවිරිදි පිරිමි අයෙක්මි. අධි රුධිර පීඩනය සහ කොලෙස්ටරෝල් ඇත. දිනපතා බෙහෙත් පෙති පාවිච්චි කරමි. මාස්පතා සායනයට යෑමට පෙර රුධිර පරීක්ෂාවක් සිදු කර ගනිමි. රුධිර පරීක්ෂණය සඳහා මම පැය 12ක් නිරාහාරව සිටින්නේ වතුර කෝප්පයක්වත් පානය නොකරය. මට උදෑසන බෙහෙත් පෙති කීපයක් ගැනීමට තිබේ. එහෙත් එය පවා මා ගන්නේ නැත. මගේ දරුවන් පවසන්නේ බෙහෙත් පෙති ගැනීම වරදක් නොවන බවයි. මට දැනගැනීමට අවශ්‍ය වන්නේ බෙහෙත් පෙති සහ වතුර පානය කිරීම වරදක්ද නැතිද යන්නය.

නාරම්මල - බන්දුල විජේතිලක

පිළිතුර :- ඔබ පැය 12ක් නිරාහාරව සිට රුධිර පරීක්ෂාවක් සිදුකර ගැනීම ඉතාමත් නිවැරදියි. එහෙත් රුධිර පරීක්ෂාව නිසා ඔබ දිනපතා ගත යුතු ඖෂධ ලබා නොගෙන සිටීම වරදකි. එම ඖෂධ නියමිත වේලාවට අනිවාර්යයෙන් ලබා ගත යුතුමය. වතුර ස්වල්පයක් සමඟ ඖෂධ පානය කිරීමෙන් රුධිර පරීක්ෂණයට කිසිදු අහිතකර බලපෑමක් සිදු නොවේ. ඔබ කොලෙස්ටරෝල් පරීක්ෂා කිරීම සඳහා රුධිර පරීක්ෂණයක් සිදු කරන බවට අනුමාන කරමි. Lipid profile පරීක්ෂණය සඳහා වතුර බීම වරදක් නොවුවත් වතුර නොබී සිටීමෙන් ඉතාමත් නිවැරදි ප්‍රතිඵල ලබා ගත හැකි බවද සඳහන් කිරීම වරදක් නැත.

රාත්‍රියේ කීප වරක් මුත්‍රා පහ කිරීමට අවශ්‍යයි

ප්‍රශ්නය :- මම 73 හැවිරිදි විවාහක පුරුෂයෙක්මි. මීට මාස කීපයකට පෙර සිට මගේ පුරස්ථි ග්‍රන්ථියක් ඉදිමී ඇත. පවුලේ වෛද්‍යවරයා විසින් දිනපතා උදේටත් රාත්‍රියටත් urimax පෙත්ත පාවිච්චි කිරීමට උපදෙස් දුන්නේය. රාත්‍රියේදී නින්දෙන් අවදි වී තුන් හතර වතාවක් මුත්‍රා පහ කිරීමට සිදුවේ. මම අධි රුධිර පීඩනයට Losartan 25 සහ ඇඳුම සඳහා seroflo ඖෂධ දිනපතාම ගනිමි. මට නිතර නිතර මුත්‍රා කිරීමට අවශ්‍ය වන්නේ රෝගයක් නිසාද? නැතිනම් ඖෂධ බලපෑමක් නිසාද?

හාල්දඬුවන - තිලකසිරි ප්‍රනාන්දු

පිළිතුර :- පුරස්ථි ග්‍රන්ථියේ ඉදිමීම හේතුවෙන් මුත්‍රාශයේ තැන්පත් වන මුත්‍රා සම්පූර්ණයෙන් බැහැර නොවී සුළු ප්‍රමාණයක් තැන්පත් වී තිබේ. මුත්‍රා පහ කිරීමේ අවශ්‍යතාව නිතර නිතර ඇති වන්නේ එබැවිනි. ඔබට urimax ඖෂධය නිර්දේශ කර තිබෙන්නේ එම ආබාධය නැති කිරීමටය. එම ඖෂධය පාවිච්චි කරන විටදීත් ඔබට නිතර නිතර මුත්‍රා පහ කිරීමට සිදුවේ නම් කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමු විය යුතුය. එහිදී ඔබේ මුත්‍රාශය, වකුගඩු යන ඉන්ද්‍රියයන් ස්කෑනින් පරීක්ෂණයකට ලක් කිරීමට සිදු විය හැකිය. ඇතැම්විට ශල්‍යකර්මයකට භාජනය කළ හැකිය. ඔබේ රෝගය නිශ්චය කර ගත හැක්කේ එවැනි පරීක්ෂණයක් මගිනි. එබැවින් නොපමාව වෛද්‍යවරයකු හමුවීම වැදගත් ය.

කොන්දෙ කැක්කුම නිසා දරුවකු ගැන බියෙන්

ප්‍රශ්නය :- මම සිසේරියන් සැත්කමකින් දරුවකු බිහි කළ 32 වැනි වියේ මවක් වෙමි. දැන් මගේ දරුවාට වයස අවු: 2 1/2ක් ගත වී ඇත. දරුවා බිහි වූ දින පටන් කොන්දෙ වේදනාව පවතී. මා වෛද්‍යවරයකු හමු වී කොන්දේ කැක්කුම ගැන පැවසූ විට ඔහු පැවසුවේ සිසේරියන් සැත්කමට හිරි වැටටවීම සඳහා කොන්ද ප්‍රදේශයට ලබා දුන් එන්නත නිසා මෙවැනි කැක්කුම් ඇති විය හැකි වුවත් කාලයක් යන විට එය මඟ හැරී යන බවය. එහෙත් තවමත් වේදනාව ඇත. තවත් දරු උපතක් අපේක්ෂා කළත් කොන්දේ වේදනාව නිසාම මම ඊට බියක් දක්වමි. ඔබතුමාගෙන් සහනයක් අපේක්ෂා කරමි.

කළුතර - වත්සලා රුවිනි කල්දේරා

පිළිතුර :- සිසේරියන් සැත්කම සඳහා හිරි වැටටවීමට ලබා දුන් එන්නත හේතුවෙන් ඇති වන කොන්දේ කැක්කුම දරුවාට වයස අවු: 2 1/2 වන තෙක් තිබිය නොහැකිය. බොහෝවිට දරු ප්‍රසූතියකදී ශරීරයේ හෝමෝන වෙනස් වීමත් සමඟ බන්ධනී ලිහිල් වේ. එහෙත් එය යළි යථා තත්ත්වයට පත්වෙයි. ඔබගේ රෝග ලක්ෂණ අනුව බන්ධනී යථා තත්ත්වයට පත් නොවී තිබීම නිසා කොන්දේ වේදනාවක් ඇතිවූවා විය හැකිය. එසේ නැත්නම් ශල්‍යකර්මයේ සිදු වූ සුළු සිදුවීමකින් යම් හානියක් ඇති වූවා විය හැකිය. ඔබව පරීක්ෂා නොකර රෝගය නිශ්චය කළ නොහැකිය. එබැවින් නොපමාව කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකු හමු වී ප්‍රතිකාර ලබා ගන්න.

පිළිකා වැලඳේ යැයි බියෙන්

ප්‍රශ්නය :- මගේ මව මීට වසර 8කට පෙර මිය ගියේ පියයුරු පිළිකාව හේතුවෙනි. දැන් මගේ පියා වසා ගැටිතිවල ඇති වූ පිළිකා තත්වයක් හේතුවෙන් මහරගම අපේක්ෂා රෝහලේ ප්‍රතිකාර ලබා ගනියි. පිළිකාව නිසාම මගේ පියා මරණයට පත් වන බව අපි හොඳාකාරවම දනිමු. මම 33 හැවිරිදි පිරිමියෙක්මි. මට 30 හැවිරිදි බාල සොහොයුරකු සහ 25 හැවිරිදි නැඟණියක් සිටියි. දැන් අප තිදෙනාම අප ද පිළිකාවට ගොදුරු වේ යැයි බියෙන් පසුවෙමු. පිළිකාව පරම්පරාවෙන් වැලඳෙන රෝගයක්ද? අප එය කල්තියා හඳුනා ගන්නේ කෙසේද?

කළුඅග්ගල - ජනිත් ප්‍රසන්න ජයසූරිය

පිළිතුර :- සමහර පිළිකා වර්ග ප්‍රවේණි සම්බන්ධතා මත ඇති විය හැකිය. එහෙත් සෑම පිළිකා වර්ගයක්ම ඒ ආකාරයට පරම්පරාවෙන් පරම්පරාවට උරුම වන්නේ නැත. ඔබේ මවට සහ පියාට වැලඳුණු පිළිකාවල සෛල විශේෂය කුමක්දැයි ඔබ සඳහන් කර නැත. එසේ වුවද අද තාක්ෂණයේ දියුණුව සමඟ පිළිකාවට ගොදුරුවීමේ අවදානම පරීක්ෂා කළ හැකි පරීක්ෂණ තිබේ. ඇතැම් පරීක්ෂණ රුධිර ආශ්‍රිතව කළ හැකි අතර ඇතැම් පරීක්ෂණ screen test වශයෙන් ඇත. එබැවින් ප්‍රථමයෙන්ම ඔබ තිදෙනා සිදු කළ යුත්තේ ඔබේ පියාට ප්‍රතිකාර කරන වෛද්‍යවරයා හමු වී ඔබේ ගැටලුව ඉදිරිපත් කිරීමය.

ඔබේ වෛද්‍ය ගැටලුව මේ ලිපිනයට යොමු කරන්න.
සුව හමුව, සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10.

සමානාත්මතාව අත්කර දුන් දකුණු අප්‍රිකාවේ වර්ණභේද විරෝධී ව්‍යාපාරය

● අනුර බී. සෙනෙවිරත්න

ලෝක ඉතිහාසයේ විසිවැනි සියවස හැඳින්විය හැක්කේ මිනිස් ඉතිහාසය තුළ කිසියම් මානව ප්‍රගතියක් අත්කර ගත් යුගයක් ලෙස ය. එම යුගය තුළ බිහි වී එම යුග පෙරළියට දායක වූ යුග පුරුෂයන් අතර ඉදිරියෙන් ම සිටින්නේ ෆැසිස්ට්වාදයට ජාතිවාදයට වර්ණභේදවාදයට හා ඒකාධිපතිත්වයට එරෙහිව සටන් වැදුණු දකුණු අප්‍රිකානු නායක නෙල්සන් මැන්ඩෙලා ය.

දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන දකුණු අප්‍රිකාවේ වර්ණභේද වාදය 1940 දශකය තරම් ඈතට දිවයයි 1948 මහ මැතිවරණ ජයග්‍රහණයත් සමඟ බලයට පත් අප්‍රිකානු ජාතික පක්ෂය' විසින් වර්ණභේද වාදය' දකුණු අප්‍රිකානු රජයේ ප්‍රතිපත්තියක් ලෙස සම්මත කරගන්නා ලදි. එය සුදු ජාතිකයන් නොවන අයට සුළු අවස්ථාවන් ලබා දුන් අතර ඔවුන්ගේ මූලික මානව අයිතිවාසිකම් වන අධ්‍යාපනය ගමන් කිරීමේ නිදහස සහ ස්වයං නිර්ණ අයිතිය උදුරා ගත් දැඩි මර්දනකාරී වැඩපිළිවෙළක් විය.

මෙම මර්දනකාරී පිළිවෙතට එරෙහි මූලික බලවේගය බවට පත් අප්‍රිකානු ජාතික කොන්ග්‍රසය' 1950 දශකයේ මුල් භාගයේ සිට ඊට එරෙහිව විරෝධතා ව්‍යාපාර ආරම්භ කළේ ය. එම වර්ණභේද විරෝධී උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් ලෙස 1952 දී පෝර්ට් එලිසබෙත් හි සහ නැගෙනහිර ලන්ඩනයේ දරුණු කැරලි කෝලාහල ඇති වූ අතර එහි දී ඔවුහු වඩාත් ප්‍රචණ්ඩ උපක්‍රම භාවිත කළ හ එහෙත් සංවිධානාත්මකව දේපළ විනාශ කිරීම 1959 පමණ වන තෙක් සිදු නොවී ය. වර්ණභේදවාදී රජය නෙල්සන් මැන්ඩෙලා සහ අනෙකුත් සිවිල් අයිතිවාසිකම් ක්‍රියාකාරීන් එවකට හැඳින්වූයේ ත්‍රස්තවාදීන් ලෙස ය

1949 දී අප්‍රිකානු ජාතික කොන්ග්‍රසයේ' යෞවන ලීගය විසින් එහි මධ්‍යස්ථ නායකත්වය අබිබවා යාමෙන් පසුව එය මෙහෙයවන ලද්දේ වෝල්ටර් සිසුලු නෙල්සන් මැන්ඩෙලා සහ ඔලිවර් ටැම්බෝ යන අය විසිනි. එම වසරේ අප්‍රිකානු ජාතික කොන්ග්‍රසයේ ජාතික විධායකයට තේරීපත් වූ ඔලිවර් ටැම්බෝල ඇන්ටන් ලෙම්බෙඩ්ගේ අප්‍රිකානු අදහස් මාක්ස්වාදයේ අදහස් සමඟ ඒකාබද්ධ කරන රැඩිකල් කළු ජාතිකවාදී වැඩපිළිවෙළක් වෙනුවෙන් පෙනී සිටියේ ය. සුදු අධිකාරිය පෙරළා දැමිය හැක්කේ මහජන උද්ඝෝෂණ තුළින් පමණක් ය යන මතය ඔවුහු ජනතාව අතරට ගෙන ආවෝ ය.

මෙහි ක්‍රියාකාරී වැඩසටහන 1952 ජුනි මාසයේ සිට ඩිෆියන්ස්. ව්‍යාපාරය සමඟ දියත් කරන ලද අතර නීති උල්ලංඝණය කිරීම නිසා රජය විසින් සිදුකරනු ලබන සමූහ අත්අඩංගුවට ගැනීම් ඔවුහු එමගින් අපේක්ෂා කළ හ. ඒ අනුවල රාත්‍රී 11 ට ඇඳිරි නීතිය පැනවීමෙන් පසු කළු ජාතිකයන්ට පිටතට පැමිණීම තහනම් කර තිබූ ජොහැන්නස්බර්ග්හි සුදු ජාතිකයන් වාසය කරන ප්‍රදේශයක වීදි බැස සිටි මිනිසුන් 50 දෙනෙකුගෙන් යුත් පිරිසක් මෙහෙයවන ලද්දේ නෙල්සන් මැන්ඩෙලා විසිනි.

නෙල්සන් මැන්ඩෙලා ඇතුළු එම කණ්ඩායම අත්අඩංගුවට පත් වුව ද රටේ සෙසු අය එම ආදර්ශය අනුගමනය කරමින් සුදු ජාතික පාලකයන් පැනවූ නීති උල්ලංඝනය කරන්නට වූහ. ඒ අනුව රට පුරා විසිරී සිටි කළු ජාතිකයෝ සුදු ජාතිකයන්ට පමණයි ' යනුවෙන් සඳහන් ස්ථානවලට පවා ඇතුළු වී පනවා තිබූ වාර්ගික නීති උල්ලංඝණය කළ හ.

1952 සැප්තැම්බරයේ දී විවිධ නීති 24 ක් උල්ලංඝනය කිරීම හේතුවෙන් එරට විවිධ නගර 24 කින් 2500 කට වැඩි පිරිසක් අත්අඩංගුවට ගෙන තිබේ. දිනෙන්-දින වැඩිවන කැරැල්ල වැඩ වර්ජන ආදියට සහභාගීවන්නන්ට එල්ල වූ දැඩි දඬුවම් හේතුවෙන් මාස පහකට පසු අප්‍රිකානු සහ ඉන්දියානු කොන්ග්‍රසයන් මෙම උද්ඝෝෂණ අත්හිටුවීමට තීරණය කළේ ය. මෙම උද්ඝෝෂණ අතරතුර කළු සහ ඉන්දියානු ජනයා 8000 කට ආසන්න ප්‍රමාණයක් රඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් ඒ අතර අප්‍රිකානු ජාතික කොන්ග්‍රසයේ' සාමාජිකත්වය 7000 සිට 100000 දක්වා වර්ධනය වූ අතර උද්ඝෝෂණ ආරම්භයේ දී 14 ක් වූ එහි උප කොට්ඨාස ගණන අවසානයේ 87 දක්වා ඉහළ ගියේ ය. නායකත්වයේ වෙනසක් ද සිදුකරමින් උද්ඝෝෂණ අවසන් වීමට ටික කලකට පෙර ඇල්බට් ලුතුලි අප්‍රිකානු ජාතික කොන්ග්‍රසයේ' නව සභාපතිවරයා ලෙස තේරී පත් විය.

ඇල්බට් ලුතුලි

ගෝවන් එම්බෙකි

වෝල්ටර් සිසුලු

ඇන්ටන් ලෙම්බෙඩ්

ඔලිවර් ටැම්බෝ

එම උද්ඝෝෂණ ව්‍යාපාරය වර්ණභේදවාදී නීති තාවකාලිකව ලිහිල් කිරීමට රජයට දැඩි බලපෑමක් එල්ල කළේ ය. එහෙත් තත්ත්වය සන්සුන් වූ පසු සුදු ජාතික රජය ඊට ප්‍රතිචාර දැක්වූවේ තවත් යකඩ හස්තයකිනි. අලුතින් ගෙනා එම දැඩි මර්දනකාරී ක්‍රියාමාර්ග අතර නීති විරෝධී සංවිධාන පනත කොමියුනිස්ට්වාදය මර්දනය කිරීමේ පනත මහජන ආරක්ෂාව පිළිබඳ පනත සහ අපරාධ නඩු විධාන පනත ඇතුළත් වී ය

අපරාධ නීති සංශෝධන පනතේ අංක 8 හි සඳහන් වූයේ .ඕනෑ ම පුද්ගලයෙකු වෙනත් ඕනෑ ම පුද්ගලයෙකුට යම් ආකාරයකින් උපදෙස් ධෛර්ය දීම් උසිගැන්වීම්ල විධාන දීම් ආධාර හෝ ප්‍රසම්පාදන සැපයීම් නීතියට විරෝධය දැක්වීම් සිදු කිරීම දඬුවම් ලැබිය හැකි වරදකට වැරදිකරු වනු ඇත. යනුවෙනි.

1952 දෙසැම්බරයේ දී නෙල්සන් මැන්ඩෙලා වෝල්ටර් සිසුලු සහ තවත් 18 දෙනෙකුට නඩු විභාගයට නායකත්වය දීම සම්බන්ධයෙන් කොමියුනිස්ට්වාදය මර්දනය කිරීමේ පනත යටතේ නඩු පවරනු ලැබී ය ඔවුන්ට එහි දී වසර දෙකකට අත්හිටුවන ලද මාස නවයක සිර දඬුවමක් නියම වී ය. මේ අතර අසාධාරණ යැයි සැලකෙන නීති සහ පාරිසරික රෙගුලාසිවලට කළු ජාතික ගොවීන් තුළ ඇති වූ කෝපය හේතුවෙන් පළමුව එරට උක් වගාව ඉලක්ක කරගත් සටන් මාලාවක් ඇති වී ය. ඒ අතර 1959 සිට 1960 දක්වා කාලය තුළ දකුණු අප්‍රිකානු කොමියුනිස්ට් පක්ෂය. සහ .පැන් අප්‍රිකානු කොන්ග්‍රසය. යන සංවිධාන දෙක වැඩවර්ජන හා ශිෂ්‍ය වැඩවර්ජන සංවිධානය කිරීමට දැඩි උනන්දුවකින් කටයුතු කළේ ය. වර්ණභේද විරෝධී ව්‍යාපාරයේ හැරවුම් ලක්ෂ්‍යය ලෙස හැඳින්වෙන 1960 මාර්තු 21 එල්ල වූ ෂාප්විල්' සංහාරයෙන් පසුව එම සංවිධාන දෙක ඇතුළු තවත් සමහර වර්ණභේද විරෝධී ව්‍යාපාර සාමකාමී සහයෝගීතාවේ සිට සන්නද්ධ ප්‍රහාර දක්වා වූ උපක්‍රමවලට මාරුවීමට පටන් ගත්තේ ය.

කළු ජාතිකයන් අතර විරැකියාව වර්ධනය වීමත් දකුණු අප්‍රිකානු දේශසීමා යුද්ධයේ අපකීර්තියත් නිසා දියත් වූ මහා වැඩවර්ජන සහ ශිෂ්‍ය උද්ඝෝෂණ 1970 දශකය දක්වා දිගට ම පැවතිණි. 1976 සිදු වූ සොවෙටෝ' නැගිටීම කුරිරු ලෙස මර්දනය කිරීමත් සමඟ තවත් රැඩිකල් පිරිස් එම සංවිධානයට බැඳීම නිසා එහි ගරිල්ලා බළකායේ ශක්තිය බෙහෙවින් ඉහළ ගියේ ය. 1976 සිට 1987 දක්වා කාලය තුළ එම බළකාය රාජ්‍ය ආයතන, ප්‍රවාහන මාර්ග, විදුලි බලාගාර සහ වෙනත් සිවිල් යටිතල පහසුකම් ඉලක්ක කරගනිමින් සාර්ථක බෝම්බ ප්‍රහාර මාලාවක් දියත් කළේ ය.

1983 පැවති ජනමත විචාරණයෙන් පසුව වර්ණභේදවාදී ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට අප්‍රිකානු ජාතික පක්ෂය' උත්සාහයන් කිහිපයක් ම ගන්නා බව පෙන්වී ය. ඒ අනුව ඔවුන් ත්‍රෛපාක්ෂික පාර්ලිමේන්තුවක් හඳුන්වාදෙමින් කොලරොඩ්ස් සහ ඉන්දියානුවන්ගේ පාර්ලිමේන්තු නියෝජනය සඳහා අවස්ථාව ලබා දුන්න ද කළු දකුණු අප්‍රිකානුවන්ට දේශපාලන අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීම දිගට ම කරගෙන ගියේය. 1986 දී හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමත් සහ සිය දේශපාලන විරුද්ධවාදීන් දහස් ගණනක් නඩු විභාගයකින් තොරව රඳවා ගැනීමට ද ජාතික පක්ෂ ආණ්ඩුව කටයුතු කළේ ය.

ඊට එරෙහි අරගලය ආරම්භ වූයේ දකුණු අප්‍රිකානු සමාජයේ ස්වාධීන අංශ කිහිපයකිනි.

එය සමාජ ව්‍යාපාරවල සිට ගරිල්ලා යුද්ධයක් දක්වා වූ ස්වරූපයන් ගත්තේ ය. වර්ණ භේද වාදය අවසන් කිරීම සඳහා එරට පළමු වරට රහසිගත ද්විපාර්ශ්වික සාකච්ඡා ආරම්භ වූයේ 1987 දී පමණ ය. ඒ ජාතික පක්ෂයට එල්ල වූ බාහිර බලපෑම් සහ දේශපාලන නොසන්සුන්තාවන් වැඩිවීමත් සමඟ ය.

එසේ වුව ද එරට වර්ණභේදවාදය 1990 දී බරපතළ ලෙස වර්ධනය වූ අතර 1994 දී පැවති පළමු බහු වාර්ගික මැතිවරණයෙන් පසු වර්ණ භේදවාදය අවසන් කිරීමේ සාකච්ඡා නැවත ඇරඹිණි. දකුණු අප්‍රිකාව ජාත්‍යන්තර වශයෙන් හුදකලා කිරීමත් විවිධ ආර්ථික සම්බාධක පැනවීමත් සමඟ පාලක ජාතික පක්ෂ රජයට එරෙහිව එල්ල වූ මහජන ක්‍රියාමාර්ග එම සාකච්ඡා ආරම්භ වීම සඳහා බෙහෙවින් ඉවහල් වීය.

අප්‍රිකානු ජාතික කොන්ග්‍රසයේ' ප්‍රමුඛ පෙළේ ක්‍රියාකාරීන් දෙදෙනෙකු වන ගෝවන් එම්බෙකි සහ වෝල්ටර් 1987 -1989 දක්වා කාලය තුළ සිරෙන් නිදහස් වූ ජනාධිපති එෆ්. ඩබ්ලිව් ඩී ක්ලාර්ක් විසින් අප්‍රිකානු ජාතික කොන්ග්‍රසය' සහිපෑන් අප්‍රිකානු කොන්ග්‍රසය තහනම් සංවිධාන ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කර නෙල්සන් මැන්ඩෙලා සිරෙන් නිදහස් කළේ ය. ඒ අනුව වර්ණභේද විරෝධීන් ද දකුණු අප්‍රිකානු ආරක්ෂක හමුදාව සමඟ විධිමත් සටන් විරාමයකට එළඹීයේ ය. වර්ණ භේදවාදී නීති 1991 ජුනි 17 වැනි දින අහෝසි කරන ලද අතර 1994 අප්‍රේල් මාසයේ පැවති පළමු බහු වාර්ගික මහ මැතිවරණය තෙක් බහුපාර්ශ්වික සාකච්ඡා දියත් වී ය.

දසක හයකට අධික කාලයක් පැවති මිලියන ගණනකගේ ජීවිත හා දේපළ බිලිගත් දකුණු අප්‍රිකානු වර්ණභේද වාදය අවසන් කර මේ වනවිට දසක 03ක් ගත වී තිබේ. ඒ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ .ජාතියේ පියා. ලෙස ගෞරවාදරයට පත් දකුණු අප්‍රිකාවේ හිටපු ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා විසින් කරන ලද කාර්ය භාරය සුළු පටු නොවේ.

වර්ණභේදවාදී රජය විසින් 1963 දී අත්අඩංගුවට ගන්නා ලද මැන්ඩෙලා වසර 27 ක් සිරගතව සිටි අතර ඔහු එම කාලය වැඩි වශයෙන් ගත කළේ රොබන් දූපතේ ය. මෙම කාලය තුළ ඔහු වර්ණභේද විරෝධී ව්‍යාපාරයේ ජාත්‍යන්තර සංකේතයක් බවට පත්ව සිටියේ ය. වර්ණභේදවාදී රජයට එරෙහිව ලොව පුරා විරෝධතා සහ සම්බාධක පැනවීම් නිසා මැන්ඩෙලාට සහ වර්ණභේද විරෝධී ව්‍යාපාරයට ජාත්‍යන්තර සහයෝගය නොඅඩුව ලබාගත හැකි වී ය.

වර්ණභේදවාදී රජයට එරෙහි අරගලය සාර්ථක වූයේ දේශීය හා විදේශීය බලපෑම් හේතුවෙන් පාලන තන්ත්‍රය අවසන් කිරීමට බල කෙරුණු බැවිනි. 1990 පෙබරවාරි 11 වැනි දින එවකට දකුණු අප්‍රිකාවේ ජනාධිපතිව සිටි.එෆ්. ඩබ්ලිව් ඩී ක්ලාර්ක් විසින් නෙල්සන් මැන්ඩෙලා සිරෙන් නිදහස් කරනු ලැබී ය. වර්ණභේදවාදී නීති අහෝසි කිරීම සිවිල් අයිතිවාසිකම් විරෝධතාකරුවන් නිදහස් කිරීම සහ දේශපාලන පක්ෂ තහනම් ඉවත් කිරීම මගින් වර්ණභේදවාදය අවසන් කිරීමට ඔවුහු එක්ව කටයුතු කළ හ.

1994 අප්‍රියෙල් 27 දකුණු අප්‍රිකාවේ පළමු ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණය පැවැත්වූ ඓතිහාසික දිනය යි. ඉතිහාසයේ ප්‍රථම වතාවට ජාතිය කුමක් වුවත් වර්ණය කුමක් වුවත් ඒ සෑම කෙනෙකුට ම එදින ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දෙන ලදි. අප්‍රිකානු ජාතික කොන්ග්‍රසය' මැතිවරණය ජයග්‍රහණය කළ අතර එහි නායකයා සහ ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ පළමු ජනාධිපතිවරයා වූයේ නෙල්සන් මැන්ඩෙලා ය.

දකුණු අප්‍රිකාව දැන් පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී රටකි. මැන්ඩෙලා සිවිල් යුද්ධයක් වැළැක්වීමට උදවු කළ අතර පුද්ගලයෙකුගේ සමේ පැහැය නිසා කිසිවෙකු වෙනස් කොට සැලකීමකට ලක් නොවන බවට ඔහු සහතික විය. එතැන් සිට අද දක්වා දකුණු අප්‍රිකාවේ සියලුම පුරවැසියන්ගේ අයිතිවාසිකම් සියල්ල මානව හිමිකම් මත පදනම් වූ නව දකුණු අප්‍රිකානු ව්‍යවස්ථාව මගින් ආරක්ෂා වේ.

එසේ වුව ද දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදය තවදුරටත් නොපවතින නමුත් විශේෂයෙන් අධ්‍යාපනය සහ ශ්‍රම ව්‍යාප්තිය වැනි ව්‍යුහාත්මක කාරණාවල දී වර්ණභේද වාදයේ සෙවණැලි අදටත් ඉඳහිට දැකිය හැකි ය

මිතුරු පවුර

● කමල් පෙරේරා

නුඹ අත අවියකි මා කුස ගින්නකි

ලතින් අමරිකානු කලාපය වූ කලී විප්ලවවාදී ලේඛකයන් රැසක් ලොවට දායාද කළ තිඹිරි ගෙයකි. පැබ්ලෝ නෙරුඩා, ජෝසෙ මාටි, ඉසබෙල් අයියන්ඩේ, වලෙජෝ හා අර්නස්ටෝ කාඩිනල් වැනි ලේඛක ලේඛිකාවන්ගේ දිග ලයිස්තුවක් අන්තර්ජාලයට පිවිසියහොත් ඔබට දැක බලාගත හැකිය. අද මිතුරු පවුරෙන් ඔබ හමුවට කැඳවන ඔටෝ රෙනේ කැස්ටිලෝ නම් කවියා සැලකෙනුයේද ලතින් අමරිකානු සාහිත්‍යය, ලොවට රැගෙන යාමට ඉමහත් දායකත්වයක් සැපයූ ලේඛකයන් අතර ප්‍රමුඛයකු වශයෙනි.

අමරිකාවේ නූතන කවියකු සේම ලොස් ඇන්ජලිස්හි කැලිෆෝනියා සරසවියේ දේශකයකුද වන සෙෂූ ෆොස්ට පවසන මේ වදන් පෙළින් ඔටෝ රෙනේ කැස්ටිලෝ යනු කෙබඳු චරිතයක්දැයි අපූරුවට තේරුම්ගත හැකිය. "කැස්ටිලෝගේ කවිය පූර්ණ අවධානය යොමු වී තිබෙනුයේ ස්වකීය මවුබිම වූ ගෝතමාලාවේ ඉතිහාසය වෙතය. එහි රළු බව සේම මුදු බවද ඔහුගේ කවිවල අපූරුවට කැටි වී තිබේ."

ගෝතමාලාවේ නිදහස්කාමී සමාජ ව්‍යාපාර හිස ඔසවමින් තිබූ 1936 වැනි සමයක කැස්ටිලෝ උපත ලබන්නේ යමක් කමක් ඇති පවුලක දරුවකු ලෙසිනි. කැස්ටිලෝ සමාජ සාධාරණය හා මානව අයිතීන් පිළිබඳව උනන්දුවක් දක්වන්නට පටන් ගන්නේ පාසල් වියේදිමය. ඔහු සටන්කාමී අදහස් වලින් සන්නද්ධ වෙමින් සිටි සමයේ ඇමරිකන් ගැති බුද්ධි අංශ විසින් 1954දී සිදු කරනු ලබන කුමන්ත්‍රණයකින් ජකෝබෝ ආබෙන්ස් ජනපතිවරයා බලයෙන් පහ කෙරෙයි. කැස්ටිලෝ ඇතුළු සටන්කාමීන් රැසක් එල්සැල්වදෝරයට පළා යන්නේ මේ පසුබිම මත තවදුරටත් මවුබිමේ විසීම අවදානම්සහගත වූ බැවිනි.

රොකී ඩාල්ටන් නම් සැල්වදෝර් කවියා සමඟ ඉක්මනටම මිතුදම් ගොඩනගා ගැනීමට කැස්ටිලෝ සමත් වේ. එම හමුවීමේ ප්‍රතිඵලය වන්නේ ප්‍රගතිශීලී ලේඛක එකමුතුවකට පදනම වැටීමයි. කැස්ටිලෝට නැගෙනහිර ජර්මනියට පැන ගැනීමට අවස්ථාවක් උදා වන්නේ මේ සමයේය. එහි ලෝප්සින් නම් සරසවියට ඇතුළු වී තරුණ ප්‍රජාව සමඟ විප්ලවවාදි සංවිධානවල වැඩ කරන ඔහු වසර කිහිපයක ඇවැමෙන් යළි සැල්වදෝරයට පැමිණ රොකී ඩාල්ටන් ඒ වන විට ශක්තිමත්ව ගොඩනගා තිබූ විප්ලවවාදි ව්‍යාපාරයේ වගකිවයුතු නායකයකු බවට පත්වෙයි.

පනහේ දශකයේ මවුබිම හැර ගිය ලේඛකයන් මැක්සිකෝ වලට එක්ව පිහිටුවන විප්ලවවාදි ලේඛක සංවිධානයක ප්‍රබලයකු බවට පත් වන කැස්ටිලෝ සිය මුල්ම කවි පොත් දෙක පළ කරන්නේද මෙකලය. 1966දී නැවත මවුබිම වන ගෝතමාලාවට සම්ප්‍රාප්ත වූ සැණින් ඔහු එහි සටන්කාමී සංවිධානයකට එක් වෙයි. එම සංවිධානයේ ප්‍රචාරක හා අධ්‍යාපන අංශවල ප්‍රධානියා බවට පත් වන්නට කැස්ටිලෝට වැඩි කාලයක් ගත වන්නේ නැත. මේ කාර්යයන් වලදී ඔහු සිය නිර්මාණ කුසලතාව තවත් මුවහත් කර ගනී. ඔහුගේ විප්ලවීය කවි ගෝතමාලා ජනතාවගේ හදවත් පත්ලටම කිඳා බැස ඔවුන්ගේ සටන්කාමීත්වය අවුලවයි.

ස්පාඤ්ඤ බසින් ලියූ කැස්ටිලෝගේ තෝරාගත කවි එකතුවක් ඉංග්‍රීසියට නැගී තිබේ. එසේම 1955දී ඔහු Premio centroamericano Poesia සම්මානයෙන්ද පිදුම් ලැබීය. කාල් හෙයිනිස්නම් සිනමාකරුවා කැස්ටිලෝ පිළිබඳව වාර්තා චිත්‍රපටයක්ද නිපදවා ඇත. තිදරු පියකු වන ඔහු විවාහ දිවියට පිවිසියේ ජර්මනියේදීය.

මේ සා පරිමාණ කීර්තියක් දිනා සිටියද ඇමරිකන් ගැති හමුදා ආණ්ඩුවට කැස්ටිලෝ හිසරදයක් විය. 1967දී ඔහුගේ සගයා වන නෝරා පායිස්ද සමඟ හමුදා භටයෝ ඔහු සස්කාපා බැරැක්කයට රැගෙන ගියහ. ටික දවසකට පසු සැල වූයේ දින 4ක් පුරා කුරිරු වද බන්ධනයට ලක් වූ කැස්ටිලෝ හා නෝරා පණ පිටින් පුළුස්සා දැමීමට තරම් හමුදා ආණ්ඩුව ම්ලේච්ඡ වූ බවය.

කැස්ටිලෝගේ ඉමහත් ජනප්‍රසාදයට පත් වූ කවියකි මේ.

නුඹ අත අවියකි
නුඹ අත අවියකි - මා කුස ගින්නකි
නුඹ අවියක් දරන්නේ - මා කුස ගින්නේ බැවිනි
මා කුස ගිනි දරන්නේ - නුඹ අවියක් දරන බැවිනි
අවියක් මතු නොව - සිය දහසක් පතුරම්ද
නුඹට හිමි කරගත හැකිය...
සයින් පෙළෙන මා මතට -ඒ පතුරන් විසුරවා
වරක් දෙවරක් නොව - දසදහස් වාරයක්
නුඹට මා මරන්නට හැකිය...
එසේ කළ හැකි වුව
නුඹ අතට අවියක් ද- මා කුසට ගිනි දැල්ද
හිමිව පවතියි නම් - දිගින් දිගටම
නුඹට වඩා හොඳින් සන්නද්ධ වෙමි මම....

සිළුමිණ වාණිජ මණ්ඩලී මෙම පිටු එකතුව ව්‍යාපාරික ඔබ වෙනුවෙන්ම සැකසෙන විශේෂ අතිරේකයකි. ඔබේ දේශීය-විදේශීය ව්‍යාපාර පුවත්, ප්‍රවෘත්ති නිවේදන, ජායාරූප සහ නවතම පුවත් අප වෙත යොමු කරන්න. සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යාපාරික තොරතුරු සමාජයට විවර කිරීමට ඔබ පවත්වන මාධ්‍ය සාකච්ඡා සහ ගවේෂණ චාරිකාද යොමු කරන්නේ නම් මැනවි. සියලු ලිපි පහත ලිපිනයට පමණක් එවිය යුතු වේ. සිළුමිණ වාණිජ මණ්ඩලී, ලේක්හවුස් - කොළඹ 10.

හෙට ලොවට මඟ කියන ව්‍යාපාරික අත්වැල

දුරකථන : කර්තෘ - 011 2429261
දැන්වීම් කළමණාකරු - 011 2429429 දිගුව 351
විද්‍යුත් ලිපිනය : edmediaunit@gmail.com

වාණිජ මණ්ඩලී

සෙලින්කෝ ලයිෆ්, නෙල්ලිඅඩි හරිත ශාඛාව විවෘත කරයි

යාපනයේ සෙලින්කෝ ලයිෆ් සමාගමට අයත් ඉඩමක ඉදිවුණු තට්ටු 05 කින් සමන්විත හරිත ගොඩනැගිල්ල සමාගමේ නෙල්ලිඅඩි ශාඛාව ලෙස පසුගියදා විවෘත කරන ලදී.

සමාගම විසින් මෙම ශාඛාව ස්වභාවික ආලෝකය උපරිම ලෙස ලැබෙන පරිදි සැලසුම් කර තිබෙන අතර එය සම්පූර්ණයෙන්ම සූර්යාලෝකය මගින් බලශක්තිය උත්පාදනය කරගනී. එසේම, මෙම ගොඩනැගිල්ලටම අයත් මල ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක්ද ස්ථාපිත කර ඇත. මීට අමතරව, මෙම ගොඩනැගිල්ලේ බලශක්ති කාර්යක්ෂමතාවෙන් යුතු නවතම විදුලි පහන් සහ වායු සමීකරණ පද්ධතියක් සවිකර තිබෙන අතර වැසි ජලය රැස්කර ගන්නා පහසුකම්ද ගොඩනඟා තිබේ. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුවද පැමිණි අභියෝගයට මුහුණ දෙමින් මෙම ගොඩනැගිල්ල සඳහා මුල්ගල තබා මාස 16 ක් ඇතුළත එය විවෘත කිරීමට හැකිවීම කැපී පෙනෙන කාරණයකි.

මෙම නව ගොඩනැගිල්ල විවෘත කිරීමේ අවස්ථාවට සෙලින්කෝ ලයිෆ් සභාපති, රාජ්කුමාර් රෙන්ගනාදන් මහතා සහ සමාගමේ අධ්‍යක්ෂවරුන් මෙන්ම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ නියෝජිතයන් පිරිසක් සහභාගී විය.

සෙලින්කෝ ලයිෆ් සක්‍රිය රක්ෂණ ඔප්පු මගින් ජීවිත ලක්ෂ 10 කට ආසන්න ගණනක් ආවරණය කර තිබේ. නවෝත්පාදනය, නිර්මාණශීලී සැලසුම් හඳුන්වා දීම සහ සංවර්ධනය,

පාරිභෝගික සේවා, වෘත්තීය සංවර්ධනය සහ ආයතනික සමාජ වගකීම යන අංශ සම්බන්ධයෙන් සෙලින්කෝ ලයිෆ් සමාගම දේශීය රක්ෂණ ක්ෂේත්‍රයේ මිනුම් ලකුණක් ලෙසට පිළිගැනීමට ලක්වේ.

සේයාරු සටහන -

සෙලින්කෝ ලයිෆ් සමාගමේ සභාපති, ආර්. රෙන්ගනාදන් සහ කළමනාකාර අධ්‍යක්ෂ, තුෂාර රණසිංහ (ඉහළ, දකුණේ සිට දෙවැන්නා සහ වමේ කෙළවරේම) නෙල්ලිඅඩි නව හරිත ශාඛාව විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වී සිටින අයුරු.

කොමර්ෂල් බැංකුවෙන් කාන්තා ව්‍යවසායකයන්ට webinar සම්මන්ත්‍රණයක්

කොමර්ෂල් බැංකුව විසින් පසුගියදා කාන්තා කර්මාන්ත සහ වාණිජ මණ්ඩලය (WCIC) සමග එක්ව webinar සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

ව්‍යවසායිකාවන් සවිබල ගැන්වීම සඳහා කොමර්ෂල් බැංකුව සිදුකරමින් තිබෙන වැඩසටහන්වල කොටසක් ලෙස බැංකුව විසින් මෙම webinar සම්මන්ත්‍රණය පැවැත්වූ අතර සමාජ දුරස්ථභාවය ආරක්ෂාකර ගත යුතු මේ කාල පරිච්ඡේදයේදී දැනුම සහ අධ්‍යාපනය ලබාදීම වෙනුවෙන් මෙම වැඩසටහන ගොඩනගා තිබේ.

මෙම webinar සම්මන්ත්‍රණය සඳහා සම්පත් දායකයින් ලෙස කළමනාකරණ උපදේශක අනෝජි ද සිල්වා, Women in Logistics & Transport (WiLAT) Sri Lanka හි, සමාරම්භක සභාපතිනිය සහ Chartered Institute of Logistics and Transport (CILT) හි, සභාපතිනිය ලෙස කටයුතු කළ ගයනි ද අල්විස් , ව්‍යාපාරික සහ අලෙවිකරණ උපදේශක තුසිතා කුමාරකුලසිංහම්, ජනප්‍රිය කේෂාලංකාර සහ රූපලාවණ්‍ය ශිල්පිනී සහ පුහුණුකරු, නයනා කරුණාරත්න, කොමර්ෂල් බැංකුවේ සංවර්ධන ණය දෙපාර්තමේන්තුවේ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය නිලධාරීවරයා විනෝද් පිල්ලෙයි සහභාගී විය. මෙම සම්මන්ත්‍රණය මෙහෙයවීම කොමර්ෂල් බැංකුවේ කාන්තා බැංකුකරණ අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනී, කමලිනී එල්ලාවල විසින් සිදු කළේය.

අරුණි ගුණතිලක සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට

වසර 25 කට අධික වෘත්තීය අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියන අරුණි ගුණතිලක බැංකුකරණ ක්ෂේත්‍රයේ දෙස්-විදෙස් සුවිශේෂ ආයතන රැසක සේවය කර ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරිනියක වන අරුණි ගුණතිලක හාවර්ඩ් නීති විද්‍යාලයෙන් නීතිය පිළිබඳ පශ්චාද් උපාධිය හිමිකර ගත්තාය. ශ්‍රී ලංකා බැංකුකරණ ක්ෂේත්‍ර අවදානම් වෘත්තිකයන්ගේ සංගමයේ ආරම්භක සාමාජිකාවක ද වන ඇය, කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ආරාධිත කථිකාචාර්යවරියක සහ Overseas School of Colombo හි භාරකාර මණ්ඩල සාමාජිකාවක ලෙස ද මෙරට තාරුණ්‍යය බලගැන්වීම සඳහා සිය දැනුම සහ අත්දැකීම් බෙදාහරියි.

ඒරන් රසල්-ඩේවිසන් (සභාපති), ප්‍රියන්ත විජේසේකර (ප්‍රධාන විධායක නිලධාරී), හරේෂ් කයිමාල්, මනිල්ක ප්‍රනාන්දු සහ දිනේෂ් රෙංගනාදන් සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් සමාගමේ සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ වෙති.

විශිෂ්ටතම ගෝලීය ව්‍යාපෘති සම්මානය කොළඹ වරාය නගර ව්‍යාපෘතියට

ජාත්‍යන්තර ඉංජිනේරු සහ ඉදිකිරීම් ප්‍රවෘත්ති සඟරාවක් වන Engineering News-Record (ENR) මගින් 8 වන වරටත් පවත්වනු ලැබූ වාර්ෂික ගෝලීය විශිෂ්ටතම ව්‍යාපෘති තරගයේදී කොළඹ වරාය නගර ව්‍යාපෘතිය ගෝලීය විශිෂ්ටතම ව්‍යාපෘතියට හිමි සම්මානය දිනාගැනීමට සමත් විය.

මෙහිදී ලෝකයේ මහාද්වීප 6 ක රටවල් 21 ක් නියෝජනය කරමින් ඉදිරිපත් කරනු ලැබූ සුවිශේෂී ව්‍යාපෘති 30 අබිබවමින් ප්‍රමුඛම ස්ථානය දිනාගැනීමට කොළඹ වරාය නගර ව්‍යාපෘතිය සමත් වීම කැපී පෙනෙයි. මෑතකාලීනව ඉංජිනේරු සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශ්‍රී ලාංකීය ව්‍යාපෘතියක් ලබාගත් ඉහළම ගෝලීය ඇගයීම මෙය වන අතර, පවත්නා තත්ත්වය හමුවේ මෙම වසරේ සම්මාන උළෙල අන්තර්ජාලය ඔස්සේ සැප්තැම්බර් මස 17 වන දින පැවැත්වීය. කොළඹ වරාය නගරයේ ඉදිකිරීම් ආරම්භ කොට වසර 6 ක් සම්පූර්ණවීමේ සංවත්සරය යෙදී තිබූ දිනයේදීම විශිෂ්ටතම ගෝලීය ව්‍යාපෘතිය ලෙස සම්මානයට පාත්‍රවීම සුවිශේෂී අවස්ථාවකි.

ලෝටස් ජයග්‍රාහකයන්ට තරු පන්තියේ නිවාඩුවක්

සැමසන් රබර් කර්මාන්ත ආයතනය විසින් සිය වටිනා වෙළෙඳසැල් හිමියන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අඟයමින් තරු පන්තියේ දේශීය සංචාරයක් පසුගියදා සංවිධානය කරන ලදී.

එහිදී ලෝටස් ටයර් වෙළෙඳසැල් හිමියන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරු පන්තියේ හෝටලයක් වන RIU - Ahungalle හෝටලයේ දෙදිනක් නිදහසේ සහ විනෝදයෙන් ගත කිරීමට අවස්ථාව ලැබුණි. පසුගිය වසරේදී වෙළෙඳ ඉලක්ක සම්පූර්ණ කළ වෙළෙඳසැල් හිමියන් වෙනුවෙන් සංවිධානය කළ වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහනේ වාසනාවන්ත ජයග්‍රාහකයන්ට මෙම අගනා අවස්ථාව හිමි විය. මෙම අවස්ථාවට සැම්සන් රබර් කර්මාන්ත ආයතනයේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලය මෙන්ම ලෝටස් ටයර් විකුණුම් සහ අලෙවිකරණ කණ්ඩායම සහභාගි වූහ.

"නියම මිලට... නියම දුරක්..." යන තේමාව ඔස්සේ දිවයින පුරා සිටින පාරිභෝගිකයන්ට සමීප වන ලෝටස් ටයර් දශක ගණනාවක සිට කතාබහට ලක්වූ ටයර් වෙළෙඳ නාමයක් වන අතර ගෙවන මුදලට උපරිම සාධාරණයක් ඉටු කරමින් පාරිභෝගිකයාගේ ආරක්ෂාව තහවුරු කරන ගුණාත්මකභාවයෙන් ඉහළ ලෝටස් ටයර් නිෂ්පාදන පෙළ බයිසිකල් ටයර් සහ ටියුබ්, මෝටර් සයිකල් ටයර් සහ ටියුබ්, ත්‍රී වීලර් ටයර් සහ ටියුබ් ආදී නිෂ්පාදන පෙළකින් සමන්විතය.

Microgrid ව්‍යාපෘතිය LECO, මොරටුව විශ්වවිද්‍යාලය, ඩීමෝ සහ DHYBRID සමඟ එක්වෙයි

ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO), මොරටුව විශ්ව විද්‍යාලය හා එක්ව, ශ්‍රී ලංකාවේ ප්‍රථම Microgrid නියමු ව්‍යාපෘතිය පසුගියදා දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව ඇමෙරිකානු ඩොලර් මිලියන 1.8 ක මූල්‍යාධාර ලබා දී ඇති අතර, මේ සඳහා ඩීමෝ සමාගම ජර්මානු බලශක්ති ප්‍රමුඛයකු වන DHYBRID හා එක්ව බලශක්ති උත්පාදනය හා ගබඩා කිරීම ඇතුළත් පුළුල් පුනර්ජනනීය Microgrid බලශක්ති විසඳුමක් ලබාදීමට නියමිතය.

Microigrid බලශක්ති ක්‍රමවේදය මේ වන විටත් රට පුරා පාරිභෝගිකයින් සඳහා අඛණ්ඩව විදුලි බෙදාහැරීම සඳහා යෝජිත ආකෘතියකි.

ශ්‍රී ලංකාවේ හරිත බල ශක්ති සංවර්ධනය වැඩි දියුණු කිරීමේ අරමුණින් විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශය ආසියානු සංවර්ධන බැංකුව හා එක්ව අඛණ්ඩව ක්‍රියාවට නංවන වැඩපිළිවෙළෙහි එක් පියවරක් වශයෙන් මෙම ව්‍යාපෘතිය සඳහන් කළ හැකිය. ලංකා විදුලි පුද්ගලික සමාගම මෙම සංකල්පය සාක්ෂාත් කර ගැනීම සඳහා තෝරා ගන්නා ලදී. එසේම නියමු ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති පරිශ්‍රය ලෙස මොරටුව විශ්වවිද්‍යාලය තෝරා ගැනිණි. මේ සඳහා LECO Smartgrid පර්යේෂණාගාරය පිහිටුවීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය හා LECO සමාගම අතර අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තැබිණි.

DSI ටයර්ස් වෙතින් දේශීය ආර්ථිකයට ඉහළ දායකත්වයක්

ජාතික ආර්ථිකය නඟා සිටුවීමේ රජයේ ප්‍රතිපත්තියට අනුව දේශීයත්වයට මුල් තැන දෙමින් වාර්ෂික නිෂ්පාදන ධාරිතාව 25%කින් වැඩි කරමින් DSI Tyres ක්‍රියාවට නඟා ඇති නව වැඩපිළිවෙල නිසා දේශීය රබර් ගොවියාගේ ආර්ථික වර්ධනයටද විශාල ශක්තියක් ලැබේ.

කැගල්ල, ඇහැලියගොඩ, බඩල්කුඹුර පිහිටි රබර් එකතු කිරීමේ මධ්‍යස්ථානවලින් නිෂ්පාදන මිල දී ගන්නා DSI ටයර්ස් මෙරට රබර් වගාවේ ප්‍රගමනයට දක්වන දායකත්වය සුවිශාලය. DSI ටයර්ස් කළමණාකාර අධ්‍යක්ෂ රණතුංග රාජපක්ෂ පවසන්නේ මෙරට මහ පොළොවෙන් උපන් සැම්සන් රබර් කර්මාන්ත ආයතනය අනාගතයේදීත් දේශීයත්වය පදනම් කර ගනිමින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට දැවැන්ත කාර්යභාරයක් ඉටු කරන බවයි. එසේම කොරෝනා වසංගතය නිසා ආර්ථික දුෂ්කරතාවලට පත් පාරිභෝගිකයන්ගේ පහසුව තකා මෙම වසරේදී DSI ටයර්ස් නිෂ්පාදනවල මිල ඉහළ නොදැමීමද සුවිශේෂත්වයකි.

100%ක්ම දේශීය සමාගමක් වන DSI ටයර්ස් මෙරට බයිසිකල්, මෝටර් බයිසිකල්, ත්‍රි රෝද රථ ටයර් හා ටියුබ් වෙළෙඳපොළේ ප්‍රමුඛයා වෙමින් ජාත්‍යන්තරයද අතික්‍රමණය කර

තිබෙන්නේ ජාතික ආර්ථිකයට විදේශ විනිමය එක් කිරීමේ පුරෝගාමියෙකු වෙමිනි. ජනාධිපති අපනයන සම්මානද ඇතුළුව ජාතික හා ජාත්‍යන්තර සම්මාන රැසක් දිනා ඇති DSI ටයර්ස් මෑතකදී ලැබූ අනගිභවනීයම ජයග්‍රහණය වන්නේ SLIM Turn Around Brand of the Year 2019 සම්මානයයි.

PATA රන් සම්මානය, ශ්‍රීලංකන් ගුවන් සේවයේ අලෙවිකරණ සන්නිවේදන අංශයට

ශ්‍රී ලංකාවේ ජාතික ගුවන් සේවය සහ වන්වර්ල්ඩ් සන්ධානයේ සාමාජිකයකු වන ශ්‍රීලංකන් ගුවන් සේවය සිය අලෙවිකරණ සන්නිවේදන ප්‍රයත්නයන්හි ගෝලීය ආකර්ෂණීය බව අඛණ්ඩව සනාථ කරමින් 2020 PATA සම්මාන උළෙලේ දී රන් සම්මානයෙන් පිදුම් ලැබීය.

ඒ අනුව, මෙවර PATA Travel Mart 2020 සම්මාන උළෙලේ දී ප්‍රකාශයට පත් කළ ජයග්‍රාහකයන් 20 දෙනා අතරට ජාතික ගුවන් සේවය ඇතුළත් විය.

මෙහිදී ශ්‍රීලංකන් ගුවන් සමාගමට පෑන් ඉන්දියා අලෙවිකරණ ව්‍යාපාරය යටතේ ඉදිරිපත් කළ Next Door Neighbor සහ Serendipity Next Door යන අලෙවිකරණ ව්‍යාපාරයට 'අලෙවිකරණ වාහකයා' ('Marketing Carrier') තේමාව යටතේ මෙම රන් සම්මානය හිමි විය.

මීට පෙර අවස්ථා දෙකකදී එනම් 2007 සහ 2019 වර්ෂ වල

දී රන් සම්මාන ලබා ගනිමින් ජාතික ගුවන් සේවය PATA හි සිය සලකුණ තැබූ අතර මෙය තුන්වන අවස්ථාව බවට පත්විය.

මෙවර PATA රන් සම්මාන 2020 සඳහා ලොව පුරා සංවිධාන 62 ක් සහ පුද්ගලයින් 62 දෙනෙකු ඇතුළත් විය. විවිධ ගමනාන්තවල පුද්ගලයන් 16 දෙනෙකුගෙන් යුත් ස්වාධීන විනිශ්චය කමිටුවක් විසින් ජයග්‍රාහකයන් තෝරා ගන්නා ලදී.

60 රස මිනිරුවන් Uswatte සිළුමිණ

උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි
සිළුමිණ මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස 74
සැප්තැම්බර් මස ජයග්‍රාහකයෝ



රුපියල් 2500 බැගින් ත්‍යාග ලැබූ ජයග්‍රාහකයෝ

1. ඩබ්ලිව්.ඒ.ජී. විමල් තෝරදෙනිය, වේරගම, මාතලේ.
2. ඩබ්.ජී. ගීතානි පතිරණ, නුංගමුව, පල්ලෙවෙල.
3. නිශාන්ත නාරංගොඩ, දංගොල්ලවත්ත, දොරටියාව.
4. කේ.එස්. ප්‍රදීප්, ලංගම ඩිපෝව, කතරගම.
5. කේ.වයි. සපුමලී ජයන්ති, කෝවිල වත්ත, අඟුළුගහ.
6. රොහාන් ඕවිටිගල, ගලවිලපුර, හෝමාගම.
7. බී.ඩී. සුනිල් රන්ජිත්, තානායම පිටුපස, අවිස්සාවේල්ල.
8. ඒ.පී.ඩබ්. ද සිල්වා, පිටියේගෙදර, බෙම්මුල්ල.
9. කේ.ජේ. රණසිංහ, නවලෝක උද්‍යානය, පෑලියගොඩ.

රුපියල් විසිපන්දහසක තෑගි

ජාතියේ ඉතිරි කිරීමේ බැංකුව

NSB National Savings Bank

● ඉනෝකා පෙරේරා බණ්ඩාර

ඔබේ මුදලටත් මුදලට උපයන පොලියටත් 100% ක රාජ්‍ය ආරක්ෂාව හිමි බැංකුවක්

මෙරට ජනතාවගේ මුදල් තැන්පතු වලට 100%ක් වගකියනු ලබන එකම රාජ්‍ය බැංකුව වන, ජාතික ඉතිරිකිරීමේ බැංකුව තවත් දෙවසරකින් සිය අභිමානවත් 50 වැනි වසර සමරයි.

අඩ සිය වසකට ආසන්න ඉතිහාසය තුළ මූල්‍ය ගනුදෙනුවලින් ඔබ්බට ගිය සමාජ වගකීමකින් බැඳී හිඳින ජාතික ඉතිරි කිරීමේ බැංකුව, පශ්චාත් කොවිඩ් සමයේ, නව සාමාන්‍ය (New Normal) තත්ත්වයට මුහුණ දෙන ආකාරයත්, සිය සමාජ වගකීම තව තවත් පුළුල් ව ක්‍රියාත්මක කරන ආකාරයත් පිළිබඳ, එහි සභාපතිනී කේෂලා ජයවර්ධන මෙසේ අදහස් දැක්වූවා ය.

" බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රය ගෙවුණු කාලය තුළ වඩාත් අවදානමකට ලක් වුණා. ජනතාවට දුන් ණය නැවත අය කර ගැනීම අපහසු වුණා. නමුත් ඒ නිසාම, එම ණය නැවත ගෙවීමට රජය විසින් නියම කළ සහන කාලයක් ක්‍රියාත්මක කරන්නත් සිද්ධ වුණා. අප දුටු වැදගත්ම දේ තමයි, සහන කාලයක් ක්‍රියාත්මක වන අතර ම නැවතත් ණය දීමේ ක්‍රියාවලියට යළි අතගැසීම.

NSB කියන්නේ, ගනුදෙනු කරුවන්ගේ තැන්පත් මුදල් සඳහා, සුරක්ෂිතතාව 100%ක් මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන බැංකුව. මොකද, අපේ තැන්පතු 60%ක් පමණ ඕනෑම වෙලාවක භාණ්ඩාගාර බිල් පත් ලෙස, මහා භාණ්ඩාගාරයේ තැන්පත්කොට තිබෙනවා.

1972 බැංකු පනතේ ම සඳහන්කොට තිබෙනවා,' ඔබේ මුදලටත් - මුදලට උපයන පොලියටත් 100% ක රාජ්‍ය ආරක්ෂාව හිමියි...' යනුවෙන්.

ඒ නිසා,ලෝකෙ කුමන ආර්ථික අභියෝග ඇතිවුවත් , මූල්‍ය සමාගම් වැහිලා ගියත් NSB බැංකුවේ දාන එක රුපියලක්වත් කිසිම දවසක ගනුදෙනුකරුවන්ට අහිමි වන්නේ නැහැ.පොලියත් එක්කම ආපසු ලැබෙනවා මිස.

ඒ වගේම, පුද්ගලික ණය සඳහා පොලී අනුපාතිකය, 14% සිට 9% දක්වා අපි අඩු කළා. ලක්ෂ 30 දක්වා උපරිමයකට යටත්ව, මේ පුද්ගලික ණය 9% පොලියට දැන් සුදුසුකම් සපිරූ ඕනෑම කෙනකුට ලබාගන්න පුළුවන්. 7% ක විශේෂ පොළී අනුපාතිකයක් යටතේ රුපියල් මිලියන 10 ක් දක්වා වසර 02ක කාලයකට ලබාදෙන NSB Wings පුද්ගලික ණය ක්‍රමවේදයත් මේ වන විට ඉතා ආකර්ෂණීය වී තිබෙනවා.

ඒ වගේමයි, නිවාස ණය අනුපාතිකයත් 8%ට අඩු කළා. පසු ගිය මාස දෙක තුන තුළ, ඔය විදියට රුපියල් බිලියනයක් ඉක්මවා ගිය ණය ප්‍රමාණයක් අපි ව්‍යවසායකයින්ට සහ ජනතාවට ලබා දුන්නා. එහෙම බලද්දී, කොරෝනා පීඩනය ආවත් ජාතික ඉතිරි කිරීමේ බැංකුව ප්‍රමුඛ කොට, ඊට අනුබද්ධව තිබෙන, ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (Sri Lanka Savings Bank) සහ Fund Management කියන මූල්‍ය ආයතනය ඒකාබද්ධව ජනතාවට දැවැන්ත ණය සහන ප්‍රමාණයක් පිරිනැමුවා.

නමුත් ගෙවී ගියේ බහුතර ජනතාවක් තුළ මූල්‍ය විනයක් නැති කාල පරිච්ඡේදයක්. නිවෙස් ළඟට පැමිණි ලොරිවලින් අවශ්‍ය අනවශ්‍ය සෑම දේම මිලදී ගන්නට ඔවුන් පෙළඹුණා විතරක් නෙවෙයි, සහනාධාර මානසිකත්වයටත් හුරු වුණා. මේ තත්ත්වය දකිනකොට බැංකුවක් විදියට අපි තවදුරටත් නිකන්ම සිටියේ නැහැ. ස්වයං රැකියා පුහුණු කරන්නට, කුඩා ව්‍යවසායකයන් බිහි කරන්නට අපි වෙනස් විදියක වැඩසටහනක් පටන් ගත්තා. ඒවා අදාළ වෙළෙඳපොළ හා බද්ධ කළා. RDB සභාපතිනියව සිටි කාලේ මං කාන්තාවන්ට ඉඟුරු වවන්න යොමු කළා. ඒවා බීම කොම්පැනිවලට සෘජුවම දෙන වැඩපිළිවෙළක් හැදුවා. බඩ ඉරිඟු වවා තායිලන්තයට ටොන් දහස් ගණනක් අපනයනය කළා. වියළි මිරිස් වවා දේශීය කුළුබඩු කර්මාන්ත ආයතනවලට සෘජුවම දුන්නා. ස්වයං රැකියා ලාභීන් සහ කුඩා පරිමාණ ව්‍යවසායකයින් වෙත අතරමැදියන් නැති වෙළෙඳපොළක් හදා දුන්නා. NSB හරහාත් මං ක්‍රියාත්මක කරමින් සිටින්නේ මෙන්න මේ සංකල්ප.

වාණිජ මණ්ඩලී

අපේ මිනිස්සු දහඩිය මහන්සියෙන් නැඟී සිටින්න ඕනෙ.ඒ මහන්සියේ ප්‍රතිඵල ගන්න, බැංකුවක් හැටියට අපි ඔවුන්ට උපරිම සහයෝගය දෙන්න ඕනේ.පහු ගිය මාස අට පුරා සහ දැනුත්, NSB ඉහළ කළමනාකාරිත්වය හා කාර්යය මණ්ඩලයේ සහයෝගයෙන් අපි ක්‍රියාත්මක කරමින් සිටින්නේ ඒ සමාජ වගකීමයි.

ඒ සඳහා NSB අපිට, විශාල ශක්තියක් තිබෙනවා. මාතර, මන්නාරම, අනුරාධපුර සහ බොරැල්ල ලෙස ශාඛා හතරක් ව ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව දැන් NSB සතු වත්කමක්. ඒ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව තමයි, NSB වෙත අනුබද්ධව, විශාල කාර්යයභාරයක් ඉටු කරන්නේ. දැන් අපට හැකියාව තිබෙනවා, බිංදුවේ සිට නැගිටින්නට වෙර දරන ගමේ - නගරයේ මිනිසුන්ට ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව හරහා විශාල ලෙස උදව් කරන්න.

ඒ අනුව, සමාජයේ අවදානමට ලක් වූ 70,000ක් තරම් වන පෙර පාසල් ගුරුවරු ඉලක්ක කොටගෙන අපි රුපියල් 40,000ක් බැගින් වූ සහන ණය ක්‍රමයක් ආරම්භ කළා. එතැනින් නතර නොවී, ගම්මානවල අසරණ වූ මිනිසුන් සොයා ගියා. ගම්පහ පළාතේ දුප්පත් ජනතාවට, ඔවුන්ගේ අක්කර කාලේ හෝ හෙට දවසේ හොඳම ඉල්ලුමක් ඇති, කහ වවන්න උදව් කළා.

තලාව සහ අනුරාධපුර ගම්මාන තුනක බඩ ඉරිඟු වවන්නත් ඒ 'බල්ක්' ණය ප්‍රදානය ම කළා. වවන බඩ ඉරිඟු අස්වනු, ත්‍රී පෝෂ සමාගමට අලෙවි කරන වැඩපිළිවෙළකුත් සකස් කළා.

ඊළඟට, මීගමුව සහ පුත්තලම ධීවර ගම්මානවලට ගියා. ඔවුන්ගේ ධීවර කටයුතු එක්ක ආපහු නැගිටින්න අවශ්‍ය සෑම දෙයක්ම ලබා දුන්නා. ඔවුන්ගේ කර්මාන්තයට, වගාවට තව තවත් ශක්තිය දී, අතරමැදියන් නැති වෙළෙඳපොළකුත් හදා දුන්නා.

වැදගත්ම දේ තමයි, මේ සෑම කෙනෙක් ම ඒ ණය ආපසු ගෙවනවා.ඒ වගේම, NSB ගිණුමක ඉතුරුත් කරනවා. මේ පොළඹවා ගැනීම අපගේ විශාල ජයග්‍රහණයක්. මොකද අපි ඉටු කළේ, සහනාධාර මානසිකත්වයෙන් මිනිසුන් මුදවන විශාල සමාජ වගකීමක් වන නිසා.."

මීට අමතරව,බොහෝ ගම්මානවල ක්‍රියාත්මක, ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය නම් උගුලේ හිර වූ කාන්තාවන් සොයා, ඇය විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරයි. එනම් වැඩපිළිවෙළට සෘජු ව ම සහභාගී වී එම කාන්තාවන් මුණගැසී ඔවුන් දැනුම්වත් කිරීමට ඇය විශාල වෙහෙසක් දරයි. ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව හරහා ක්‍රියාත්මක මේ වැඩසටහනට සමස්ත කාර්යය මණ්ඩලයේ ම සහයෝගය ලැබෙන බව ද ඇය සඳහන් කරයි.

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සභාපතිනී කේෂලා ජයවර්ධන

" ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ණය සමාගම් දෙසිය පනස් ගණනක් තිබෙනවා ඉන් එකසිය ගණනක් අපගේ ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ලියාපදිංචි වී සිටිනවා. ඔවුන්ට මිලියන ගණන් ණය දෙන්නේ අපගේ එම බැංකුවෙන් හැබැයි අපි දැන් එම ණය ලාභය පමණක් තකා ලබා දෙන්නේ නැහැ. මෙම මුදල් අරගෙන ඔවුන් කරන්නට යන ව්‍යාපෘති පිළිබඳ අපට වාර්තාවක් ලබා දිය යුතුයි.

මොකද, සමහර ආයතන වලින් සියයට 12 ට අරගෙන ඒ මුළු මිලියන ගණන ම විශාල බෝට්ටු මුදලාලිලාට ලොකු ගාණකට දෙනවා. කුඩා ධීවරයන්ට කියා, ගන්නා මේ ණය මුදල් ඒ මිනිස්සුන්ට සතයක් වත් ලැබෙන්නේ නැහැ.

ඒ නිසා, අපෙන් ගන්නා ඒ ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දෙන්නේ කුමන සමාජ මට්ටමකට ද? ඒ කුමක් සඳහාද... ඉන් ලැබෙන සමාජ ප්‍රයෝජනය කිමෙක් ද? යන සියලු කාරණා අප සොයා බලනවා.

ඒ වගේම, අපේ බැංකුවෙන් 12% පොලියට ණය අරගෙන ඔවුන්ට බැහැ, අර දුප්පත් ගම්වල මිනිස්සුන්ට සියයට විසි තිස් ගණන් ගණන්වල පොලියට ලබා දෙන්න. උපරිම ඔවුන්ට තබා ගත යුතු වන්නේ 2% ක ලාභයක් පමණයි. එවැනි නියාමනයන්ට යටත් ව පමණයි අප ඔවුන්ට ණය ලබා දෙන්නේ.

එම ණය පිරිනමන දවසට මමත් අපගේ ඉහළ කළමනාකාරිත්වය සමඟ ඒ තැන්වලට යනවා. එහිදී මම මේ කාන්තාවන්ට කතාවක් කරනවා. මේ ණය ඔවුන් ආයෝජනය කරන්නේ කුමක් සඳහාද? මූල්‍ය පරිහරණය සිදු කරන්නේ කෙසේද? ගිණුම් පවත්වාගෙන යන්නේ කෙසේද? ඉතිරි කරන්නේ කෙසේද? යන මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ ඔවුන් දැනුවත් කරනවා. ණය ලබා ගත්තාට,ඒ මූල්‍ය විනය මෙතෙක් ඔවුන්ට ලැබී නැහැ.

මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ කාන්තාව දැනුම්වත් කරනවා

ඒ වගේම, තමන්ගේ ව්‍යාපාරයට- කර්මාන්තයට අලෙවිය සහ ප්‍රචාරණය යොදා ගත යුතු ආකාරය පවා අප ඔවුන්ට කියා දෙනවා. මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා කාන්තාවන් දහස් ගණනකට අප මෙවැනි දේශන පවත්වා තිබෙනවා. දැනුවත් කිරීම්කොට තිබෙනවා. ජනතාව අතරට ගිහින්, ඒ ඒ සමාජය ස්ථර නගා සිටුවන අතර ම,ලංකාවේ විශාල ආයෝජන සඳහා, දැවැන්ත ව්‍යාපාරිකයන්ට corporate ණය හරහා, මහා මාර්ග ඉදි කරන්න, කර්මාන්ත ඇති කරන්න මිලියන ගණනින් ණය ලබා දෙනවා.

මේ වන විට, මහවැලි එල් කලාපයේ අක්කර තුන්සිය පනහක සීනි කර්මාන්ත ශාලාවක් සඳහා අපි රුපියල් බිලියන 5 ක ණය දෙන්නට කටයුතු කරගෙන යනවා.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව හරහා කුඩා උක් ගොවීන්ට ණය මුදල් ලබා දී ඔවුන් වවන උක්, එම සීනි කර්මාන්ත ශාලාවට ම ලබා දෙන වැඩපිළිවෙළකුත් ඒ අතර සකසමින් සිටිනවා. එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වූ විට, කුඩා උක් ගොවීන් වසරකට රුපියල් ලක්ෂ 10 ක 12 ක ආදායමක් ලබන පිරිසක් බවට පත් වනවා.

නැගිටින්නට වෙර දරන ගමේ නගරයේ මිනිසුන්ට ජාතික ඉතිරි කිරීමේ බැංකුව විශාල සවියක්

ඒ වගේම, කුරුඳු සහ කෙසෙල්වලටත් අප මේ ණය ක්‍රමය ඉදිරියේ දී ක්‍රියාත්මක කරනවා.

ඒ වගේම, වගා කරන්නට කැමැති ආයෝජකයන් වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අත්පත් වූ ඉඩම් ලබා දෙන වැඩපිළිවෙළකුත් ඉදිරියේදී අප ක්‍රියාත්මක කරනවා. හැබැයි, මේ ඉඩම් ලබා දෙන්නේ දේශපාලකයන්ට හෝ බලවත් උදවියට නෙවෙයි හරි විදිහට එන ආයෝජකයන්ට පමණයි"

මූල්‍ය ගනුදෙනු සහ ලාභයෙන් ඔබ්බට ගිය සමාජ ක්‍රියාකාරකම් රැසක නියැළෙන, සමාජ වගකීමක් ඇති බැංකුවක් ලෙස ක්‍රියාත්මක වන නිසාම, දෙස් විදෙස් සම්මාන රැසකට පාත්‍ර වන්නට හැකි වූ බව ද සභාපතිනිය පවසයි. බැංකු සහ මූල්‍ය අංශයටත් සමස්ත ක්‍රියාවලියටත් අදාළව පසු ගිය වසරේ දී රන් රිදී සම්මාන දිනා ගන්නට NSB වෙත හැකි වූයේ මේ නිසාය. එමෙන්ම ලබන වසර මැද භාගය වන විට, T-20 නම් නවීනතම මධ්‍යගත පරිගණක පද්ධතියක් හරහා, නවීනතම පරිගණක ක්‍රියාවලියකට යන්නට NSB සූදානම්ය.

එවිට, ලොව ඕනෑම රටක සිටින ඕනෑම කෙනකුට anywhere anytime banking... යන සංකල්පය ඔස්සේ NSB හා ඕනෑම වෙලාවක ගනුදෙනු කරන්නට අවස්ථාව සැලසේ.

මේ වන විට, EMV තාක්ෂණයෙන් යුතු චිප් එකක් සහිත මෙරට සුරක්ෂිතම ඩෙබිට් කාඩ් පත ඇත්තේ ද, NSB බැංකුව සතුවය. ලොව පිළිගත් PCIDSS (Payment Card Industry Data Security Standard)සහතිකය සහිත එකම ඩෙබිට් කාඩ්පත වන්නේද, මෙම අධි ආරක්ෂිත ඩෙබිට් කාඩ් පතයි.

" රට තුළ සිටින මෙම ආයෝජකයන් මෙන්ම, විදේශීය ශ්‍රමිකයන් වෙනුවෙන් ක්‍රියාත්මක,' එහෙන් සල්ලි මෙහෙන් තැගි ' වැඩසටහන ඔස්සේත්, මෙරට සිටින ඔවුන්ගේ ගිණුමේ ප්‍රතිලාභීන්ට ත්‍යාග පිරිනමන ජනප්‍රිය වැඩසටහනක් අප ක්‍රියාත්මක කරනවා. ඉතාලිය, කොරියාව සහ ජපානය වැනි රටවල් ගණනාවක සිටින NSB. නියෝජිතයන් මගින් එම රටවල්වල ශ්‍රමිකයන් මෙරට NSB. බැංකු හා බද්ධ වී සිටිනවා.

ඉදිරියේදී කැනඩාව, ඕස්ට්‍රේලියාව වැනි රටවලටත් අපගේ නියෝජිතයන් පත් කරන්නට ඉල්ලීම් කොට තිබෙනවා. මේ සියල්ල සඳහා අප ඇප කැප වී සිටින්නේ, ලාභයෙන් ඔබ්බට ගිය සමාජ වගකීමක් අප සතුව තිබෙන නිසා..."

සභාපතිවරිය පවසන්නේ, විවිධ අංශ කරා විසිරුණු පැතිරුණු සිය සමාජ වගකීම පිළිබඳ ව ය. ආචාර්ය එන්. ඇම්. පෙරේරා විසින් රට පුරා තැපැල් කාර්යාල අනුබද්ධ කොට, 1972 දී ආරම්භ කරන ලද NSB බැංකුවේ එම තැපැල් කාර්යාල ජාලය අද වන විට 4,000 දක්වා ව්‍යාප්ත වී තිබේ. ශාඛා 258 ක සේවය කරන සේවක සංඛ්‍යාව, 5000 කට ආසන්නය. NSB සතුව ඇති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ප්‍රමාණය 300 ඉක්මවා තිබේ.

එසේම, ගම් නියම්ගම් සිසාරා, සතෙන් සතේ රුපියලෙන් රුපියල ඉතිරි කිරීමේ පුරුද්ද කියා දී, දහස් සංඛ්‍යාත පාසල් දරුවන් වෙත ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කරමින්, වෙනදාටත් වඩා ඔවුන් හා සහසම්බන්ධ වී කටයුතු කරයි.

ඡායාරූප - තුෂාර ප්‍රනාන්දු

සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 116

රුපියල් පනස්දහසක තෑගි

කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 115 යනුවෙන් සඳහන් කර ඩේන්ටි මයිලේඩි ටොෆී දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට ඔක්තෝබර් 21 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය සහ දුරකතන අංකය ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ නම් සහ ප්‍රහේලිකාවේ නිවැරැදි විසඳුම ඔක්තෝබර් 25දා සිළුමිණ පත්‍රයේ පළ වේ. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත ත්‍යාග මුදල් පිරිනැමේ. ඔබේ ත්‍යාග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය - 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ටි ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.

උපකාරක පද

හරහට

1 ගිය වසරේ(2019) රාජ්‍ය සම්මාන දිනූ හොඳම නවකතාව
6 වනය/ වනයට අයත්
7 ශාලාව
8 සුමිත්‍රා පීරිස්ගේ සිනමා නිර්මාණයෙකි
9 වී ආදියෙහි සිහින් සුණු
10 කාන්තාව
12 නරක/පහත්/ අල්ප යන අරුතෙන් යෙදේ
13 වාපී ගුණැති ඔසු පානයෙකි
14 කඳදෙව්
15 මහවැලි ගඟබඩ පිහිටි සුන්දර සරසවිය
17 ශරීරය
18 මධ්‍යම පළාතේ තෙදිසාවෙන් එකකි

පහළට

1 මැටි භාජනය/පිඟාන
2 කාව්‍යකාර මණ්ඩප
3 මධ්‍යම ඉන්දියාවේ ප්‍රකට ගංගාවකි
4 චන්ද්‍ර මාස ක්‍රමයේ දහවැනි දිනය
5 දෙකන්නයෙන් එකකි
6 ආසව/ මත්පැන්
11 ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය පිහිටියේ මෙහිය
12 විශාල මදයක් සහිත රස පලතුරෙකි
13 නැබ / බුරිය
16 එකකට පසු සංඛ්‍යාව

■	1	2		3		4	5
6			■		■	7	
8							■
■	9		■		■	10	11
12		■	13			■	
	■	■	14				
15		16			■	■	
	■	17		■	18		

සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 115

නම: .....

ලිපිනය: .....

අත්සන: .....

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරූ මාධ්‍ය සේවා

ලෝක සංචාරක දින සැමරුම මහනුවර කැන්ඩි සිටි සෙන්ටර්හිදී

ලෝක සංචාරක දින සැමරුම් උත්සවයේ ජාතික සැමරුම මෙවර මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පසුගිය 25, 26 සහ 27 යන තෙදින පුරා පැවැත්විණි. මෙවර මෙම ජාතික සැමරුමේ තේමාව වූයේ සංචාරක හා ග්‍රාමීය සංවර්ධනය යන්නයි. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) විසින් ලෝක සංචාරක දිනය ලෙස සැප්තැම්බර් මස 27 නම් කර ඇත.

මෙම සැමරුම නිමිත්තෙන් පසුගිය 25, 26 සහ 27 යන තෙදින පුරා මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී පෙ.ව. 9 සිට රාත්‍රී 10 දක්වා ප්‍රදර්ශනයක් පැවති අතර ඒ සඳහා ප්‍රදර්ශන කුටි 80 ඉදිකර තිබිණි. මීට අමතරව සූප ශාස්ත්‍ර ප්‍රදර්ශන, සංස්කෘතික උත්සව, තේ කර්මාන්ත, සංස්කෘතික උරුමය සහ ප්‍රදර්ශනද පැවැත්විණි.

එමෙන්ම පාසල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන්ද පැවති අතර සංචාරක නායකයින්ගේ සමුළුවක්ද පැවැත්විණි.

මධ්‍යම පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දිරිගැන්වීමේ අරමුණින් පැවති INNEX 2020 ප්‍රදර්ශනයේ නව නිෂ්පාදන ඉදිරිපත් කළ මධ්‍යම පළාතේ සිසු දරුදැරියන් විශේෂ ඇගයීමකට ලක් විය. එමෙන්ම ජාත්‍යන්තර සංචාරක පර්යේෂණ සමුළුවද, අන්තර් පලාත් ජාල සැසිය හා පෝස්ටර්, වීඩියෝ තරගද ඇතුළත්ව පැවතිණි.

මෙදින (27) ලේක් හවුස් ප්‍රදර්ශන කුටිය ප්‍රදර්ශන කුටිය නැරඹීමටද සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව ඇතුළු පිරිසක් එක් විය.

මෙම අවස්ථාවට සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග, සබරගමු පළාත් ආණ්ඩුකාර ටිකිරි කොබ්බෑකඩුව, මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ ගමගේ, රාජ්‍ය අමාත්‍ය දිළුම් අමුණුගම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන නාලක කෝට්ටේගොඩ, උදේනි කිරිඳිගොඩ යන අය සහ එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ නියෝජිතයින් ඇතුළු පිරිසක් සහභාගී විය.

බිග් බෑඩ් වුල්ෆ් මෙවර ඔන්ලයින් ඔස්සේ

ඔක්. 1 දා සිට 4 වැනිදා දක්වා

බිග් බෑඩ් වුල්ෆ්, වෙනස්ම ආගමනයක් සටහන් කරමින් අඛණ්ඩ සිවුවැනි වරටත්, මෙවර ශ්‍රී ලංකාවට සපැමිණෙයි. මෙවර ඔන්ලයින් අවකාශය මගින් පැවැත්වෙන ප්‍රදර්ශනය **The Readers Portal** ඔස්සේ ඔක්තෝබර් මස, 1 වැනිදා සිට 4 වැනිදා දක්වා පැවැත්විණි.

එම අවස්ථාවට බිග් බෑඩ් වුල්ෆ් සම නිර්මාතෘවරුන් වන ඇන්ඩෘ යැප් හා ජැක්ලින් **Ng** මෙන්ම ප්‍රෝරීඩ් ලංකා පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ නිශාන් වාසලතන්ත්‍රි යන යන අය සහභාගී වූහ. බිග් බෑඩ් වුල්ෆ් පොත් ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා හවුල්කරු දීපක් මාධවන්ද මැලේසියාවේ සිට අන්තර්ජාලය ඔස්සේ සජීවී ව ඊට සම්බන්ධ විණි.

මෙවර ප්‍රදර්ශනය ඔන්ලයින් මගින් පැවැත්වීම හේතුවෙන් ශ්‍රී ලාංකීය පොත් ලෝලීන්ට පෙර පෙරට වඩා තුන් ගුණයකින් වැඩි පොත් ගොන්නක් වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව සැලසේ. ඒ අනුව දිවයින පුරා විසිරී සිටින බිග් බෑඩ් වුල්ෆ් රසිකයන්ට ඔන්ලයින් ප්‍රදර්ශනයට එක් කරන, මිලියන ගණනක් වන ඉංග්‍රීසි පොත් අතරින් තමන් ප්‍රිය කරන පොත් 50%- 90% දක්වා වට්ටම් සහිතව මිලදී ගැනීමේ අවස්ථාව මෙවරද උදා වෙයි. එමෙන්ම මෙවර බිග් බෑඩ් වුල්ෆ් ලොලීන්ට, මින් පෙර ප්‍රදර්ශනයක අත් නොවිඳි 70% ක තරම් ප්‍රතිශතයක නවතම තේමාවන්ගෙන් යුත් පොත්ද මිලදී ගැනීමටද අවස්ථාව සලසා තිබේ.

බිග් බෑඩ් වුල්ෆ්, **Online** පොත් ප්‍රදර්ශනයට එක් වන බිග් බෑඩ් වුල්ෆ් ලෝලීන්ට එහි වෙබ් අඩවියේ බැනරය මත කලික් කිරීමෙන් ඉන් පිරිනමන දීමනා දැන ගත හැකි වේ.

එමෙන්ම බිග් බෑඩ් වුල්ෆ්, පාසල් මාධ්‍ය පිටුව සමග සම්බන්ධවීමෙන් දීමනා පිළිබඳව හා තරග පිළිබඳ වැඩිදුර විස්තර දැන ගැනීමට හැකි බව සංවිධායක මණ්ඩලය දැනුම් දෙයි. ඔක්තෝබර් මස පළමුවෙනිදා සිට 4 වෙනිදා දක්වා **www.bigbadwolf books.lk** යන වෙබ් අඩවියෙන් 24 පැය පුරා ම පැවැත්වෙන ප්‍රදර්ශනය සඳහා එක් විය හැකියි. වැඩිදුර විස්තර සඳහා **www.facebook.com /bbwbookssrilanka** හා **www.instagram.com/bigbadwolfbooks_lk**වෙත පිවිසෙන්න.

නෙස්ලේ පොල් වගා සැලසුමට වසර 4 සපුරයි

නෙස්ලේ පොල් වගා සැලසුමට වසර හතරක් පිරීම නිමිත්තෙන් පසුගියදා සංවිධානය කළ විශේෂ උත්සවයකදී, එම සැලසුමේ පොල් ගොවීන් හා වගාකරුවන් 3,000කට පොල් වගා මණ්ඩලය හා නෙස්ලේ වෙතින් පොහොර කිලෝග්‍රෑම් 150,000ක් හා නවීන වගා ක්‍රමවේද හිමි වුණි.

පසුගිය වසර කිහිපය පුරා නියඟය සහ වගාවට වැළඳුණු රෝග හේතුවෙන් මෙරට පොල් සැපයුම විශාල පසුබෑමකට ලක්විය. එවන් පසුබිමක නෙස්ලේ පොල් වගා සැලසුම හරහා, රෝග ආසාදනවලට හොඳින් ඔරොත්තු දෙන පොල් වර්ග වගා කිරීමට අවශ්‍ය සහාය මෙන්ම, පොල් වගාව ආශ්‍රිත නව තාක්ෂණය, යහපත් ක්‍රමවේද, ගුණාත්මක වගා අමුද්‍රව්‍ය සහ වෘත්තිමය කෘෂි ආර්ථික සහාය ද පොල් වගාකරන්නන්ට හිමිවී ඇත.

2016 වසරේදී ආරම්භ වූ නෙස්ලේ පොල් වගා සැලසුම හරහා පොල් ගොවි පවුල් 3,000කට, අයහපත් කාලගුණික තත්ත්ව මෙන්ම වගාවට වැළඳෙන රෝග ආසාදනවලට ඔරොත්තු දෙන විශේෂ දෙමුහුන් පොල් පැළ 19,000ක් ලබා දී ඇත. එහි පළමු කාණ්ඩය 2021 වසරේදී පරිණත වීමට නියමිත ය. පොල් සැපයුම වර්ධනය කිරීමට මේ නෙස්ලේ පොල් සැලසුම හරහා පොල් වගා කරන්නන්ට තම ගෙවතුවල හා සාම්ප්‍රදායික පොල් ත්‍රිකෝණයෙන් පිටත ප්‍රදේශවල පොල් වගා කිරීමට ද දිරිය සැපයේ.

තව ද පොල් වගා සැලසුම හා එක්වන්නන් පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ අරමුණින් ආදර්ශ පොල් ගොවිපොළවල් හතරක් ද පවත්වාගෙන යනු ලබයි. පොල් වගාවන්ට ජල සම්පාදනය කිරීම බොහෝ පොල් වගාකරුවන් මුහුණ දෙන ගැටලුවකි. ඊට විසඳුමක් ලෙස නල ළිං සහ ක්ෂුද්‍ර වාරි පද්ධතියක් මගින් සාර්ථක ජල සම්පාදනයක් සිදු කරන අයුරු, ආදර්ශ ගොවිපොළවල් දෙකක් හරහා පෙන්නුම් කෙරේ. මීට අමතරව පොල් පැළ පරිණත වනතුරු අතිරේක ආදායමක් ලැබීම සඳහා කෙටි කාලීන එළවළු වැනි අතුරු බෝග වගාකිරීමට ද ගොවි මහතුන් දිරිමත් කෙරේ.

සෙලාන් බැංකුව මර්චන්ට් පෝටල් සේවා ආරම්භ කරයි

සෙලාන් බැංකුව, ඩිජිටල් ගනුදෙනු සිදුකිරීම සඳහා පවතින වඩාත් ආරක්ෂිතම සහ පහසුම පළමු පරිපූර්ණ බහුකාර්ය ඩිජිටල් ගෙවුම් පහසුකම වන සෙලාන් මර්චන්ට් පෝටල් සේවාව ඇමරිකානු අධ්‍යාපන කේන්ද්‍රයට (ANC) හඳුන්වා දී ඇත.

ANC ආයතනයේ එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියානු සාමාන්‍ය සහ පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා එම ආයතනයේ ප්‍රධාන පරිශ්‍රයට ද, අවසන් වසර සිසුන්ගේ SQA සහ UWL වැඩසටහන් සඳහා එම ආයතනයේ මහනුවර සහ මායා මාවතේ ශාඛාවලට ද සෙලාන් බැංකුව එම සේවාව පිරිනැමීමට කටයුතු යොදා ඇත. මුළුමනින් ම පාරිභෝගිකයාගේ අවශ්‍යතාව මත සකස් කෙරුණු ගෙවුම් විසඳුමක්වන සෙලාන් මර්චන්ට් පෝටල් සේවාව හරහා ANC වෙබ් අඩවියෙන් ඩිජිටල් මාධ්‍යය ඔස්සේ පහසුවෙන් ගෙවීම් සිදු කළ හැකිය. අලෙවිකරුවන් හට සිය ගෙවීම් පරික්ෂා කිරීමටත්, පාරිභෝගිකයන් හට තමන් සිදු කළ ගෙවීම් පරික්ෂාකර ගැනීමටත් මෙම සේවාව මගින් හැකි වීම නිසා පාරිභෝගිකයන් හට වඩාත් උසස් පාරිභෝගික අත්දැකීමක් හිමිකර දීමට අලෙවිකරුවන් හට හැකිවේ.

ගෙවීම් ආරම්භ කිරීම සහ සන්නිවේදනය ඩිජිටල්කරණය කර තිබීම ද මෙම පහසුකමේ තවත් සුවිශේෂී අංගයක්වන අතර පරිශීලකයාට භාවිතය පහසුවන ලෙස එය නිර්මාණය කර ඇති බැවින් විවිධ සන්නිවේදන ක්‍රම හරහා ගෙවුම් සබැඳි (Links) බෙදාහැරීමට සහ පාරිභෝගිකයන්ට සිහිකැඳවීම් සිදු කිරීමට ද හැකියාව ලැබී ඇත.

ප්ලාස්ටිසයිකල් LAUGFS සහ GLOMARK

සුපිරි වෙළඳසැල් ජාල දක්වා පුළුල් වෙයි

සුපිරි වෙළඳසැල්වලට බඳුන් සැපයීම මගින්, වගකිවයුතු පාරිභෝගිකයන්ට ඔවුන්ගේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීමට පහසු මාර්ගයක් ලබා දෙනු ඇතැයි යන විශ්වාසය ඇතිව, ප්ලාස්ටිසයිකල්, ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය සැලකිය යුතු ලෙස අඩු කිරීමේහි ලා ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරයි.

ප්ලාස්ටිසයිකල් විසින් මෙම වැඩසටහන සඳහා ලාෆ්ස් සහ සොෆ්ටලොජික් ග්ලෝමාර්ක් සුපිරි වෙළඳසැල් දාමයන් සමග හවුල්ව, තෝරාගත් අලෙවිසැල්වල මූලික ස්ථානගත කිරීම් ආරම්භ කර ඇත.

ප්ලාස්ටිසයිකල් යනු කොළඹ කොටස් වෙළඳ පොළේ විශාලතම ලැයිස්තුගත සමාගම වන ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී (JKH) හි සමාජ ව්‍යවසායකත්ව ව්‍යාපෘතිය වේ.

SAMSUNG GALAXY M01 CORE ඔබේ අතේ මුදලට

ගැළපෙන ස්මාර්ට්ම තේරීම

ශ්‍රී ලංකාවේ අංක එකේ ස්මාර්ට් ෆෝන් සන්නාමය Samsung තම Galaxy M දුරකථන පෙළේ නවතම සාමාජිකයා වන Galaxy M01 Core දුරකථනය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේය. ස්මාර්ට් ජංගම දුරකථනයක් ලබාගැනීමට අපේක්ෂා කරන සහ තමා පළමුවෙන්ම ගත් ස්මාර්ට් ජංගම දුරකථනයට වඩා විශේෂාංග සහිත දුරකථනයක් මිලදී ගැනීමට අපේක්ෂා කරන කණ්ඩායම්වල බලාපොරොත්තු ඉතාම හොඳින් අවබෝධ කරගනිමින් ඔවුන්ට සරිලන පරිදි Galaxy M01 Core නිර්මාණය කර ඇත.

ශ්‍රී ලංකාව තවදුරටත් ඩිජිටල්කරණය කිරීම අරමුණු කරගනිමින් Galaxy M01 Core දුරකථනය තුලින් පළමු වතාවට ස්මාර්ට් ජංගම දුරකථනයක් භාවිත කරන්නන්ට තාක්ෂණයේ සුවපහසුව ළඟා කර දෙයි. ශ්‍රී ලංකාවේ මෙතෙක් සිටින විශාලතම බෙදාහැරීම් ජාලය සමග එක්ව Samsung විසින් රටේ සෑම ප්‍රදේශයක් කරාම Galaxy M01 Core දුරකථනය සමීප කිරීමට කටයුතු කරයි.

රටපුරා විසිරී සිටින පාරිභෝගිකයන්ට සන්නිවේදන තාක්ෂණය පහසුවෙන් අතෙහි ඇති මුදලට සරිලන මිලකට ලබාගැනීමට Samsung සමාගම විසින් සිදු කරන කැපවීම මෙම Galaxy M01 Core දුරකථනය හඳුන්වා දීමෙන් මනාව පැහැදිලි වේ. Samsung සමාගම විසින් දුරකථනය නිර්මාණය කර තිබෙන්නේ මුදලේ ගාණට ඉහළ වටිනාකමක් සමග එම කාණ්ඩයේ ඉහළම ක්‍රියාකාරීත්වයක් ලබා දීමට සහ ඉහළ නිර්මාණාත්මක හැඩයකින් වන අතර තමන්ගේ අතේ ඇති මුදලට වඩාත් ඉහළ ක්‍රියාකාරීත්වයක් සහිත හැඩකාර දුරකථනයක් අපේක්ෂා කරන කණ්ඩායම ඉලක්ක කරමින්ය.

ෆොන්ටෙරා සමාගම කිරි ගොවීන්ට අත්වැලක් වෙයි

ෆොන්ටෙරා බ්‍රෑන්ඩ්ස් ලංකා සමාගම, තමන් සමග අත්වැල් බැඳගෙන සිටින කිරි ගොවීන් සමග එක්වී, කිරි වල තත්ත්වය හා ප්‍රමාණය වැඩි කිරීම සම්බන්ධයෙන් විසඳුම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ සාකච්ඡා මාලාවක් ආරම්භ කිරීමට පසුගියදා කටයුතු කළේ ය. මෙහිදී සත්ත්ව ආහාර සහ, කිරි ගොවිතැනට අවශ්‍ය උපකරණ බෙදා දීමක්ද සිදු විය. ශ්‍රී ලංකාවේ දේශීය කිරි කර්මාන්තයේ ජීවනාලිය වන්නේ සුළු පරිමාණ කිරි ගොවීන් ය. මෙරට කිරි සැපයුමෙන් 90% ක්ම ලැබෙනුයේ ඔවුන් වෙතිනි. ඔවුන්ට දැනුම හා පුහුණුව ලබාදීම, ප්‍රායෝගික ව්‍යාපාර ආකෘතියක් හඳුන්වා දීම සහ කිරි කර්මාන්තයට සම්බන්ධ විශේෂඥ දැනුම ඔස්සේ ඔවුන්ට පැහැදිලි මගපෙන්වීමක් ලබාදීම වැනි ක්‍රියාමාර්ග ඔස්සේ ඔවුන්ගේ කුසලතා වැඩිදියුණු කරමින්, ඔවුන්ගේ ජීවනෝපාය මාර්ගයන්හි ක්‍රියාකාරීත්වය සහ එමගින් ඔවුන්ට ලැබෙන ආදායම ඉහළ නැංවිය හැකි වේ.

සදාහරිත වැවිලි සමාගමෙන් විශේෂ ප්‍රවර්ධන වැඩසටහනක්

දශක දෙකකට අධික කාලයක් පුරා මෙරට වාණිජ වන වගාවේ ප්‍රමුඛයා වන සදාහරිත වැවිලි සමාගම, තම ළබැඳි පාරිභෝගිකයන් සඳහා පිරිනමන නවතම හා අසමසම ප්‍රවර්ධන වැඩසටහන පසුගියදා උත්කර්ෂවත් අයුරින් එළිදැක්විණි.

ඒ අනුව තම පාරිභෝගිකයන්ට ලකුණු පිරිනමන සාම්ප්‍රදායික පාරිභෝගික වැඩසටහනකට එහා ගොස්, ඔවුන්ට විවිධ වට්ටම් හා විශේෂ ප්‍රතිලාභ හිමිකර දෙන ආකාරයේ 'සදාහරිත ප්‍රිවිලේජ්' කාඩ්පතක් නිකුත් කිරීමට සමාගම පියවර ගෙන තිබේ.

සදාහරිත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ නිලධාරීන් රැසක් මෙන්ම වාණිජ වන වගා ක්ෂේත්‍රයේ දැවැන්තයන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ තවත් සම්භාවනීය ආරාධිතයන් රැසක් නව වැඩසටහන එළිදැක්වීමේ අවස්ථාවට එක්ව සිටියහ.

මෙම වැඩසටහන හරහා 30,000කට වැඩි පාරිභෝගිකයන් හා සදාහරිත වැවිලි සමාගම අතර සබඳතාව ශක්තිමත් වන අතර ම පාරිභෝගිකයන්ට සුවිශේෂී ප්‍රතිලාභ හා අත්දැකීම් රැසක් හිමි වේ.

මෙම වැඩසටහනට එක්වීමට කිසිදු වාර්ෂික ගාස්තුවක් අය නොකෙරේ. සැඟවුණු ගාස්තු ද නැත. එක්වරක් පමණක් අය කරගන්නා පරිපාලන ගාස්තුවක් පමණක් ඊට අයත් ය. පාරිභෝගික භවතුන්ගේ ජීවිත කරා වැඩි ගුණාත්මක බවක් හා සතුටක් එක්කරමින් වට්ටම් හා සුපිරි ගනුදෙනු රැසක් ඔවුන්ට පිරිනැමීමට සදාහරිත සමාගම සැදීපැහැදී සිටී.

VIVO වෙතින් නවෝත්පාදන

ස්මාර්ට් ජංගම දුරකථන ක්ෂේත්‍රයට ප්‍රථම වරට vivo විසින් AI-powered Quad cameras, In-Screen Fingerprint Scanners, HD Displays, Pop-Up camera, Special gaming සහ turbo modes, Flash charging ඇතුළු නවතම විශේෂාංග හඳුන්වා දුන්නේය. youth-centric සන්නාමයක් ලෙස, vivo මෙම ඩිජිටල් පරිවර්තන රැල්ලට සමග ගමන් කරමින් පරිශීලකයන්ගේ සියලු ඩිජිටල් අවශ්‍යතා සපුරාලන ස්මාර්ට් ජංගම දුරකථන නිෂ්පාදනය කරයි. එසේම 5G තාක්ෂණය හඳුන්වා දෙමින් මෙරට පාරිභෝගිකයන්ට පෙරළිකාර ඇත්දැකීම් ලබා දීමටද පර්යේෂණ සිදු කරමින් සිටී. තාක්ෂණය සඳහා වූ වැඩි නැඹුරුව මගින් ස්මාර්ට්ෆෝන් නිෂ්පාදකයින්ට පරිශීලකයන්ගේ පුද්ගලික ආශාවන් මුදුන්පමුනුවාලීම සඳහා අවශ්‍ය විප්ලවීය අත්දැකීමක් ලබා දෙන gadgets නව්‍යකරණය කිරීමට මග සලසා ඇත. ඒ අනුව ස්මාර්ට්ෆෝන් කර්මාන්තය අනාගතයේදී 'පාරිභෝගික කේන්ද්‍රීය' නවෝත්පාදන අංශයෙන් දියුණුවක් දකිනු ඇති බවට අපේක්ෂා කෙරේ.

ක්‍රීඩා

බන්දුල ජයමාන්න
kreeda@lakehouse.lk

'යුටියුබ්' ගුරුවරයා කරගත් ජාතික සර්ෆින් ශූරයා ලක්ෂිත මධුෂාන්

● ගීෂා මුණසිංහ

ලාකේයන්ට ආවේණික නොවුවත් මෙරට ඉතාමත් සාර්ථකව කළ හැකි ක්‍රීඩාවක් ලෙස රළ මත ලිස්සා යෑමේ (සර්ෆින්) ක්‍රීඩාව හැඳින්විය හැකිය. ආකර්ෂණීය වෙරළ තීරයක් හිමි ලොව ඇති රටවල් අතරින් සංචාරක ආකර්ෂණය ඉතාමත් ඉහළින් දිනා ඇති ශ්‍රී ලංකාව රළ මත ලිස්සා යෑමේ (සර්ෆින්) ක්‍රීඩාවෙන් විදේශීය සංචාරක ආකර්ෂණයද ඉතාමත් ඉහළින්ම දිනා ගැනීමට සමත්ව ඇත.

වාර්ෂිකව මෙරටට පුහුණුවීම් උදෙසා පැමිණෙන සංචාරක රළ මත ලිස්සා යෑමේ (සර්ෆින්) ක්‍රීඩක ක්‍රීඩිකාවන් හට ආරුගම්බේ, හික්කඩුව හා මාතර මඩිහේ වෙරළ තීර විශේෂ වෙයි. එහි දී යටිතල පහසුකම් ලබා දෙමින් සිටින ලාංකේය නව යොවුන් තරුණයන් මේ ක්‍රීඩාවට නිතැතින් යොමුවෙමින් සිටියි. එසේම මේ ක්‍රීඩාව සඳහා අවැසි කරන තාක්ෂණය, ක්‍රීඩා උපකරණ හා දක්ෂතාවය ප්‍රගුණ කිරීමට නොමඳ උත්සහයක නිරත වෙමින් සිටියි. කෙසේ වෙතත් කෙමෙන් කෙමෙන් මෙම ක්‍රීඩාව තමන් සතුකරගත් ලාංකේය ක්‍රීඩකයන් ලොව නන් දෙසින් මෙරටට පැමිණෙන ක්‍රීඩකයන්ගෙන් රළ මත ලිස්සා යෑමේ (සර්ෆින්) ක්‍රීඩාව ප්‍රගුණ කරමින් අධුනිකයන් හට ක්‍රීඩාව උගන්නමින් තම දක්ෂතාවය වර්ධන කරගැනීමේ අරගලයක නිරතව සිටියි.

එසේම මෙරටට ආවේණික නොවුවත් ඉතාමත් ආකර්ෂණීය රළ බිඳීමක නිරන්තරව මුසු වන ශ්‍රී ලංකා වෙරළ තීරයේදි අපේ ක්‍රීඩකයන් ජාත්‍යන්තර ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමඟ උරෙන් උර ගැටී තරග කරන්නේ කිසිඳු ජාත්‍යන්තර පුහුණුකරුවෙකුගේ හෝ උපදේශකයෙකුගේ මඟ පෙන්වීම මත නොවෙයි. ඒ කෙසේ වෙතත් අපේ ක්‍රීඩකයන් විදේශීය තරගකරුවන් පරාජය කරමින් ජයගත් අවස්ථාද නැතුවා නොවෙයි.

වෙරළ ක්‍රීඩා සමාජ හරහා ජාතික තරගාවලියක් කරා රැගෙන එන රළ මත ලිස්සා යෑමේ (සර්ෆින්) ක්‍රීඩාව 2018 වසරේදී ක්‍රීඩා අමාත්‍යාංශයේ සර්ෆින් ක්‍රීඩා සම්මේලනය ලෙස ලියා පදිංචි ජාතික තරගාවලියකින් සමන්විත ක්‍රීඩාවක් ලෙස සාධනීය ලක්ෂණ සමඟ වර්ධනය විය. මෙලෙස ආරම්භ වූ රළ මත ලිස්සා යෑමේ (සර්ෆින්) ක්‍රීඩාවේ වත්මන් ජාතික ශූරයා ලෙස අභිසෙස් ලබන්නේ වැලිගම සර්ෆර්ස් ක්‍රීඩා සමාජය නියෝජනය කරමින් තරග කළ වැලිගම පැලැනේ ලක්ෂිත මධුෂාන්ය. විවෘත අංශයේන් අසංක සංජීව ශූරතාව දිනා ගත් අතර කාන්තා අංශයේ ශූරතාව දිනාගැනීමට දකුණු අප්‍රිකානු ක්‍රීඩිකා නිකිතා රොබ් සමත් වුවාය.

අදියර තුනකින් සමන්විත වූ 2020 ජාතික සර්ෆින් තරගාවලියේ සමස්ත ප්‍රසාද ලකුණු 3000ක් ලබාගනිමින් ජාතික ශූරතා රළ මත ලිස්සා යෑමේ (සර්ෆින්) තරගාවලියේ අදියර තුනම ජයගනිමින් සමස්ත තරගාවලියේ ශූරතාව දිනා ගැනීමට ඔහු සමත් විය.

වැලිගම පැලැනේ සිද්ධාර්ථ විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරන ලක්ෂිත මධුෂාන් වෘත්තියෙන් ධීවර කර්මාන්තයේ යෙදෙන පවුලක සහෝදර සහෝදරියන් සිවුදෙනෙකුගෙන් යුත් පවුලේ තුන්වන පිරිමි දරුවා ලෙස මෙලොව එළිය දුටුවේ 1999 වසරේ මාර්තු 11 වැනිදාය.

ධීවර කර්මාන්තයේ නියැළෙන තිලක් ශාන්ත තම පියාගේ නොමඳ උත්සහය නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් ගෘහණියක් ලෙස තම දූ දරුවන් සිවු දෙනා උස්මහත් කරන ලක්ෂිතගේ මව ටී.වී.කේ. නිලන්ති නිතරම අවවාද දෙමින් උසස් අධ්‍යාපනයේ ඇති වැදගත්කම තම පුතුන්ට පහදාදෙයි. නමුත් වැලිගම වෙරළ තීරය සංචාරක පාරාදිසයක් ලෙස ආකර්ෂණීය වන පසුබිමක ඔවුන් නිතරම මුසුවන්නේ වෙරළ සමඟින්ය.

වැඩිමහල් බාප්පා උපුල් ශාන්ත වන අතර මද්දුම බප්පා අජිත් ශාන්ත වෙයි. ලොකු බාප්පා සමඟ හාදවන සංචාරක එංගලන්ත පෙම්වතිය. බාප්පාට සර්ෆින් ක්‍රීඩාවේ මිල අධික ක්‍රීඩා භාණ්ඩ ලබාදෙමින් රළ මත ලිස්සා යෑමේ ක්‍රීඩාවට සහයෝගය දෙයි. ඒ වගේම බාප්පාගෙන්ද සහයෝගය ලබාගනිමින් ඇයද පුරුදු පුහුණු වෙයි. මද්දුම බාප්පා අපට ගුරුහරුකම් ලබාදෙමින් සර්ෆින් ක්‍රීඩාවේ අවධානම මෙන්ම ක්‍රීඩා කළයුතු රටාව පහදා දෙමින් උද්‍යෝගිමත් කරදිදී එම අවස්ථාවට මුහුණ දෙමින් පසකට වී නිසි ඵල ලබන ලක්ෂිත හා වැඩිමල් සහෝදරයා වන බුද්ධික මධුෂාන් රළ මත ලිස්සා යාමේ ක්‍රීඩාව ප්‍රගුණ කරති. නමුත් සුනාමී බෙදවාචකය මතකයේ රැදී දෙමාපියන් තම දරුවන්ට මුහුදු සමඟ කරන ක්‍රීඩාවට වැටකඩුලු බඳියි. නමුත් බාප්පාගේ අඩි පාරේ යන දරුවන් නතර කර ගැනීමට ඔවුන්ට නොහැකි වෙයි.

බාප්පාලා දෙදෙනාගෙන් ලබන දැනුම වැඩි දියුණු කරන ලක්ෂිත හා බුද්ධික වැඩිමල් සොහොයුරා වැලිගම වෙරළ තීරයට සර්ෆින් ක්‍රීඩාව පුහුණු වීම් සඳහා එන සංචාරකයන් පුහුණු කිරීමට හා ඔවුන්ට පහසුකම් ලබාදීමට උක්සුක වෙති. අද සර්ෆින් ක්‍රීඩා පුහුණු ආයතනයක් පවත්වා ගනිමින් බුද්ධික වෘත්තීය මට්ටමින් සර්ෆින් ක්‍රීඩාවේ නියැළෙයි.

සිද්ධාර්ථ විද්‍යාලය හා තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලය අතර පැවැත්වෙන මහා ක්‍රිකට් ගැටුමට එක්වන ලක්ෂිත වසර දෙකකදීම සිද්ධාර්ථ විද්‍යාලයේ කණ්ඩායම් නායකයා ලෙසද කටයුතු කළ ක්‍රීඩකයෙකි. සිද්ධාර්ථ විද්‍යාලයෙන් උසස් පෙළ දක්වා අධ්‍යාපනය හදාරන ලක්ෂිත මධුෂාන් උසස් පෙළ අතර මඟ නවතා ආදායම් මාර්ගයක් හා ආකර්ෂණීය ක්‍රීඩාවක් වන සර්ෆින් ක්‍රීඩාව තෝරාගනියි. සංචාරකයන් පුහුණු කරමින් ආදායමක් උපයමින් ක්‍රීඩාව කරගෙන යන ලක්ෂිත 2016 දී රටවල් 15ක සහභාගීත්වයෙන් පැවැත් වුණු 'රේඩ්බුල් රයිඩ් මයිවේව්' තරගයෙන් ජය හිමිකර ගන්නේය. එම තරගයෙන් දෙවන හා තෙවන ස්ථානයන් හිමිවන්නේ විදේශී ක්‍රීඩකයන් දෙදෙනෙකුටය.

2015 වසර වන තෙක්ම සර්ෆින් ක්‍රීඩාවේ නිරත වුණත් හරියාකාරව පිහිනිමද ප්‍රගුණ කර නැති ලක්ෂිත 2016 වසරේදී 'රේඩ්බුල් රයිඩ් මයිවේව්' තරගයෙන් ජයගත් විට දෙමාපියන්ද ඔහුට අවැසි මඟ යාමට දී පසකට වී බලාසිටී. එතැන් පටන් සර්ෆින් ක්‍රීඩාව විදේශිකයන් හට පුහුණු කරමින් ක්‍රීඩාවක් ලෙස ප්‍රගුණ කරන ලක්ෂිත 2017 දි පැවැත් වූ විවෘත රැව්ස්, ස්ට්‍රින්ස් අහංගම හා සයින් සර්ෆ් යන දේශීය තරගාවලි ත්‍රිත්වයෙන්ම ජයගෙන ශූරතා ත්‍රිත්වයම තමන් සතු කරගැනීමට සමත් වෙයි.

ජාත්‍යන්තර ක්‍රීඩකයන් ක්‍රීඩා කරමින් අන්තර් ජාලයට එක් කර ඇති ක්‍රීඩා තරග දර්ශන හා ලෝක සර්ෆින් ශූරතා තරග දර්ශන නරඹමින් 'යු ටියුබ්' තම ගුරුවරයෙකු ලෙස පරිහරණය කරමින් අඩුපාඩු සකසා ගනිමින් විද්‍යානුකූලව ප්‍රගුණ කළ ක්‍රීඩා ගුරුවරයෙකු නොමැතිව ක්‍රීඩා කරන ලක්ෂිත ඉන්දියාව, චීනය හා ජපානය යන රටවල්වලද සංචාරය කරමින් ශ්‍රී ලංකාව නියෝජනය කර ඇත. නමුත් කිසිඳු රාජ්‍ය අනුග්‍රහයක් නොමැතිව පුද්ගලික ආධාර උපකාර ඇතිව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඉන්දියාවේදී 'කෝලම් පොයින්ට්' තරගාවලියෙන් දෙවන ස්ථානයත් චීනයේ පැවැති තරගාවලියෙන් අර්ධ අවසන් පුර්ව හා අවසන් වටය දක්වා පැමිණීමත්, ජපානයේ ඔලිම්පික් නියෝජනය වෙනුවෙන් පැවැති තරගයෙන් තුන්වන ස්ථානය දක්වා ද පැමිණීමත් ඔහු ලද ජාත්‍යන්තර ජයග්‍රහණ අතර වෙයි.

හිරාන් උක්වත්ත, හා තුෂාන් සම්පත් (තම්බෝ- අයියා) ඇතුළු පිරිසක් එක්ව 2018 වසරේදී සර්ෆින් ක්‍රීඩා සම්මේලනය පිහිටුවීම නිසා වත්මන් සර්ෆින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්හට තම ක්‍රීඩාව ප්‍රගුණ කිරීමේ මංපෙත් විවරව ඇති බව විශ්වාස කරන ලක්ෂිත. ඔවුන්ව පසසන්නේ හෘදයාංගමවය. ඔවුන් විසින් එසේ අරඹන සම්මේලනයේ අනුග්‍රහයෙන් පැවැත් වූ පළමු ජාතික තරගාවලියෙන් ලසිත් ප්‍රභාත් ජාතික ශූරතාව හිමිකරගනිද්දී ලක්ෂිතට හිමිවුනේ දෙවන ස්ථානයයි.

මෙම ක්‍රීඩාව නිසි ලෙස පුරුදු පුහුණු වුනොත් ලංකාවට සර්ෆින් ක්‍රීඩාවෙන් ලෝකය දිනන එක සිහිනයක් නොවන බව පවසන ලක්ෂිත. මෙම ක්‍රීඩාවේ නියැළීමට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩයන්ගේ මිල ගණන් අධික වීම නිසා ක්‍රීඩාව ප්‍රගුණ කිරිමට බාධාවක් බවද පවසයි. සර්ෆින් බෝඩ් එකක මිල රුපියල් 130,000ක් පමණ වන බව පවසන ලක්ෂික ස්භාව සෞන්දර්යයේ පාරිසරික හේතුන් මත වෙනස් වන රළට ගැළැපෙන සර්ෆින් බෝඩ්වල මිල ගණන් ඊටත් වඩා අධික බවද පවසයි.

දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා ශ්‍රී ලංකා වෙරළ තීරය මෙම ක්‍රීඩාව වෙනුවෙන්ම වෙන් වූ තොතැන්නක් බව පවසන ලක්ෂිත අපට ස්භාව ධර්මයෙන්ම උරුම මුහුදු රළෙන් නිසි ප්‍රයෝජන ගත නොහැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමූහයක් සිටින බව බවසයි. ඒ වෘත්තිය මට්ටමින් මෙම ක්‍රීඩාවට නියැළීමට ඇති බාධාව මෙන්ම මිල අධික ක්‍රීඩා භාණ්ඩ නිසා බව ඔහු අවධාරණය කරයි. සර්ෆින් ක්‍රීඩකයෙක් වන වත්මන් ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා වෙත අවධානය යොමුකරන ලක්ෂිත මධුෂාන්, සර්ෆින් ක්‍රීඩාවට ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මෙන්ම පුද්ගලික අනුග්‍රහකයන්ද උනන්දු කර ජාත්‍යන්තර පුහුණුකරුවෙකුගේ සහාය ලබාදීමට කටයුතු සලසා දි ජාත්‍යන්තරය ජයගත හැකි ක්‍රීඩකයන් දිරිගන්වන්නේ නම් එය සර්ෆින් ක්‍රීඩකයන්හට කරන දිරිගැන්වීමක් ලෙස ඔහු දකියි.

අධ්‍යාපනය හදාරන ලක්ෂිත මධුෂාන් උසස් පෙළ අතර මඟ

ඡායාරූප - සුලෝචන ගමගේ

රග්බි ක්‍රීඩාවේ කාන්තා සලකුණ උදානි එදිරිසිංහ

කොවිඩ් 19 නිසා අඩපණ වූ දේශීය රග්බි පිටිය යළිත් ඩයලොග් අන්තර් සමාජ සත් සාමාජික තරගාවලිය හරහා ජීවය ලැබීමට නියමිත මොහොතක බොහෝ ක්‍රීඩා සමාජ ලහි ලහියේ ඒ සඳහා සූදානම් වන්නේ සිය කණ්ඩායම්වල කැපී පෙනෙන වෙනස්කම් ද සමඟින් ය. ඒ අතර 2020 - 21 ඩයලොග් අන්තර් සමාජ සත් සාමාජික තරගාවලියට පෙර කොළඹ හොකී සහ පාපන්දු සමාජය (සී.එච්. ඇන්ඩ් එෆ්. සී) ප්‍රධාන වෙනස්කම් රැසක් සිදු කරමින් නව තරගවාරයේ ලාංකේය රග්බි පිටිය ආක්‍රමණය කිරීමට මූල පුරා තිබේ. සිය වෘත්තිය ජීවිතයේ ප්‍රථම වතාවට සී.එච්. ඇන්ඩ් එෆ්.සී. සහ ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ හිටපු නායක රෝහිත රාජපක්ෂ ප්‍රධාන පුහුණුකරු ලෙස පත් කළේ ය.

මේ අතර ලාංකේය රග්බි ඉතිහාසයේ ප්‍රථම වරට කාන්තා කළමනාකාරිනියකට ඉඩකඩ විවර කර දෙමින් උදානි එදිරිසිංහ සී.එච්. ඇන්ඩ් එෆ්.සී. හි නව කළමනාකාරිනිය ලෙස පත් කර තිබේ. උදානි සී.එච්. රග්බි පිටියට නවකයකු හෝ ආධුනිකයකු නොවේ. 2016 දී එකී ක්‍රීඩා සමාජයේ සහාය කළමනාකාරිවරිය ලෙස සිය වගකීම් සම්භාරය අකුරට ඉටු කළ උදානි 2019 - 20 රග්බි තරගාවලිය කොවිඩ් 19 හේතුවෙන් නවතා දමන තෙක්ම එකී තනතුරෙහි කටයුතු කළාය.

කොළඹ රග්බි සහ පාපන්දු සමාජය ලෙස අද සී.එච්. ඇන්ඩ් එෆ්.සී. ප්‍රකට වුව ද 1879 දී පාපන්දු ක්‍රීඩා සමාජයක් ලෙස එකී වසරේ ජූනි 30 හා ඔවුන් ලෝක කණ්ඩායමට එරෙහිව පළමු තරගයට ක්‍රීඩා කර තිබේ. ඔවුන් හොකී ක්‍රීඩාවට අවතීරණව ඇත්තේ 1892 දී ය. සමස්තයක් ලෙස හොකී සහ පාපන්දු ක්‍රීඩා සමාජය ලෙස එනම් සී.එච්. ඇන්ඩ් එෆ්.සී. ලෙස ස්ථාපිතව ඇත්තේ 1896 දීය. 1965 වන තෙක්ම සී.එච්. ක්‍රීඩා සාමාජිකයන් සෙසු සියලුම සාමාජිකයන් බ්‍රිතාන්‍ය ජාතිකයෝ වූහ.

උදානි එදිරිසිංහ

1950 ක්ලිෆර්ඩ් කුසලාන තරගාවලියට පිවිසෙන සී.එච්. ඇන්ඩ් එෆ්.සී. හත්වතාවක් කුසලානය දිනාගෙන තිබේ. ඒ 1957 - 60 - 62 - 82 - 83 - 90 සහ 1994 දී ය. 2003 සහ 2005 දී අවසන් මහා තරගවලට පිවිසුණු නමුත් මහනුවර කණ්ඩායම ඉදිරියේ පරාජය විය. එවන් දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන සී.එච්. හි කළමනාකාරිවරිය ලෙස කටයුතු කරන තිස් දෙවැනි විය පසුවන උදානී මියුසියස් විද්‍යාලයෙන් සිප් සතර හදාරා තිබේ.

මට සී.එච්. එක්ක අවුරුදු පහක විතර ඉතිහාසයක් තියෙනවා. මේ ක්‍රීඩා සමාජය ක්‍රීඩකයන් සමඟ පසුගිය කාලයේ බොහෝම සමීපව කටයුතු කරලා තිබෙනවා. ක්‍රීඩකයන් පවා බොහෝ සෙයින් මට ගරු කරනවා. මම හැම වෙලාවේම ඉහළම ගෞරවයක් සුහදත්වයක් ඇති කළමනාකර භූමිකාවක් පවත්වා ගෙන යනවා. එය මගේ කාර්යයට විශාල පහසුවක් වේ යැයි උදානි විශ්වාසය පළ කරයි.

උදානි පිළිබඳ හොඳම සහතිකය ලබා දී ඇත්තේ වත්මන් පුහුණුකරු රෝහිත රාජපක්ෂ ය. ඈ සී.එච්. ක්‍රීඩකයන්ට අම්මා කෙනෙක් වගෙයි. හුඟක් අය නොදන්නවා වුණාට ඈ පහුගිය වසර පහක කාලය තුළ මේ ක්‍රීඩා සමාජයට විශාල සේවයක් කරලා තියෙනවා. ඈ සී.එච් පවුලට හොඳ මග පෙන්වන්නියක් වගේම ආලෝකයක් වේ යැයි පුහුණුකරු රෝහිත රාජපක්ෂ විශ්වාසය පළ කරයි.

පිටියේ රවුමක්

පැසි පන්දුවේ පිල්ලි ගිය සල්ලි සොයයි

නේපාලයේ කත්මණ්ඩු නුවර පැවැති 13 වැනි සාග් තරගාවලිය වෙනුවෙන් ශ්‍රී ලංකා පැසිපන්දු සම්මේලනයට ක්‍රීඩා අමාත්‍යාංශය ලබා දුන් රුපියල් ලක්ෂ 50කට ආසන්න මුදලට සිදුවූ දේ පිළිබඳ සොයා බැලීමට පරීක්ෂණයක් ආරම්භ කරන්නැයි ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට උපදෙස් ලබා දී තිබේ

පුහුණුකරුවන් අට දෙනකු, ක්‍රීඩකයන් 30 දෙනකු සහ ක්‍රීඩිකාවන් 30 දෙනකු වෙනුවෙන් මාස තුනකට ආසන්න කාලයක් සඳහා පෝෂණ දීමනා, පුහුණුවීම් සඳහා ක්‍රීඩාංගණ දෙකක් වෙන් කිරීම ඇතුළු මෙකී මුදල් වෙන් කරගෙන තිබේ. මෙහිදී නිසි පරිදි පුහුණුවීම් නොකිරීම, පෝෂණ දීමනාව සඳහා නිසි පරිදි ආහාර වේලක් ලබා නොදීම, ව්‍යාජ බිල්පත්, අසත්‍ය ලියකියවිලි යොදාගෙන මෙකී මුදල් ප්‍රමාණය අවභාවිත කර ඇතැයි ශ්‍රී ලංකා පැසිපන්දු නිලධාරින්ට එරෙහිව එල්ල වී ඇති චෝදනාය.

ක්‍රීඩා පාසල් 25 ට සිසුන් කැඳවයි

ශ්‍රී ලංකාවේ සියලුම පළාත් ආවරණය පරිදි ක්‍රීඩා පාසල් සඳහා සිසු සිසුවියන් ඇතුළත් කර ගැනීමට ඉදිරි සතිය දෙක තුළදී අයදුම්පත් කැඳවීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර තිබේ. මෙහිදී විශේෂයෙන් වෙනත් පාසල්වල හත්වැනි පන්තියේ අධ්‍යාපනය හදාරන සිසු සිසුවියන් 2021 දී අටවන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට නියමිතය.

මේ අතර දැනට ක්‍රියාත්මක වන ක්‍රීඩා පාසල් විසි පහේ අටේ පන්තියට සමගාමීව වෙනත් පන්තියක් ආරම්භ කිරීමට ද තීරණය කර තිබේ. දැනට ක්‍රියාත්මක වන අටේ පන්තියේ සිසුන් සංඛ්‍යාව 20කට අඩු වි ඇති බවද වාර්තා වෙයි. ක්‍රීඩා පාසල්වල ක්‍රීඩා විෂයට අදාළ පන්තියට ඇතුළත් වන සිසු සිසුවියන්ට මාසිකව රුපියල් 5000ක පෝෂණ දීමනාවක් ලබාදීමටද අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර තිබේ. මේ අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොමැති ක්‍රීඩා පාසල්වල පහසුකම් ඉහළ දැමීමෙන් පලක් නොවන බවද අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇති අතර ඒ නිසා එකී පාසල්වල සිසු සිසුන් වැඩි කර ගැනීමට තීරණය කර තිබේ.

අකිලගේ තහනම අවසන්

සිය පන්දු යැවීමේ ඉරියව්වේ දෝෂයක් නිසා වසරක තරග තහනමකට ලක්ව සිටි අකිල ධනංජයගේ එකී තහනම් කාලය පසුගියදා ඉවත් විය. කෙසේ වෙතත් අකිල නැවතත් සිය පන්දු යැවීමේ ඉරියව්ව සම්බන්ධයෙන් පරීක්ෂණයකට මුහුණදිය යුතුය. එකී පරීක්ෂණයෙන් සමත්වීම, අසමත් වීම මත අකිලගේ අනාගත ක්‍රිකට් දිවිය තීරණය වනු ඇත.

කොවිඩ් 19 වසංගතය නිසා සියල්ල නතර වී ඇති පසුබිමක අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය පවත්වන මෙකී පරීක්ෂණයට සහභාගිවීමේ අවිනිශ්චිතතාවක්ද මතුව තිබේ. 2018 සහ 2019 දී අවස්ථා දෙකකදීම අකිලට පන්දු යැවීමේ දෝෂය පිළිබඳ ගැටලු මතුවිය. විසිහය වන වියේ පසුවන අකිල ටෙස්ට් තරග 6කට එක්දින තරග 36කට සහ විස්සයි 20 තරග දෙකකට ක්‍රීඩා කර තිබේ. එහිදී ටෙස්ට් කඩුලු 33ක්, එක්දින කඩුලු 51ක් සහ විස්සයි 20 කඩුලු 22ක් බිඳ දමා තිබේ.

හදපු සුද්දා ළඟවත් නැති අපේ කාර්

● ඉනෝකා පෙරේරා බණ්ඩාර

ප්‍රශ්නය තවම විසඳී නැතත්, ඒ ගැන ඔවුන්ට අහිතක් නැත. උදාව ඇත්තේ, රට වෙනුවෙන් යමක් කළ යුතු මොහොතක් බව ඔවුහු දනිති.

සංචාරක ව්‍යාපාරය නංවන්න මේ පරණ කාර් යොදාගන්න

ඉතිහාසයක් වළලා දමන එක අපරාධයක්

කොවිඩ් වසංගතයට මුහුණ දී සිටින තම රටේ සංචාරක ව්‍යාපාරය යළි පණ නැංවීම උදෙසා Vintage Car Owner's Club (VCOC) හෙවත්, පැරණි කාර් හිමියන්ගේ සංගමය ලෙස උපරිම දායකත්වය ලබා දෙන්නට ඔවුන් තීරණය කළේ, ඒ නොවිසඳුණු ප්‍රශ්න සියල්ල මොහොතකට අමතක කර දමමිනි.

ඒ අනුව ඔවුන් මෙවර රැළිය අරඹමින් පසුගිය සැප්තැම්බර් 21 වැනිදා මොරටුවේ සිට ගාලු ගියේ, ශ්‍රී ලංකාව ඉක්මනින් යථා තත්ත්වයට පත්වෙමින් පවතින බවත්, තව නොබෝ දිනෙකින් ශ්‍රී ලංකාවට සංචාරය කළ හැකි බවත් සංචරණයට රුසි, ලෝකයාට කියන්නට ය.

සිය වසකට ආසන්න ඉතිහාසයක් ඇති, වයසින් වැඩිමහලුන් මෙන් වූ, රැල් බුරුල් හැර වසරකට වතාවක් පමණක් එළියට එන මේ පැරණි කාර්වලට, කිලෝ මීටර සියයකට ආසන්න ගාලු ගමන, ඉතාමත් වෙහෙසකර එකකි. එහෙත්, ඔවුන් සිය රැළි සඳහා තෝරා ගන්නේ, යාපනය, අනුරාධපුර, පොළොන්නරුව, ගාල්ල වැනි දුර ගමන් පමණක් වීම තුළ, පාරේ දුවන නවීන පන්නයේ අලුත් කාර් නාම්බන්ට දෙවැනි වන බවක් ද නොපෙනේ.

කෙසේ වුවද, යුගයක අභිමානය කියා පාන මේ පැරණි කාර් සමූහය අද මුහුණ පා ඇත්තේ, දැඩි බේදවාචකයකට ය. එය රටක් ලෙස, ලැජ්ජාවට පත්විය යුතු කාරණාවක් බවද නොකියා බැරිය.

"ලංකා ඉතිහාසයේ එක් පැතිකඩක් කියාපාන මේ පැරණි කාර් මෙරට මෝටර් රථ කොමසාරිස්වරයාට අනුව, කිසිදු වැදගැම්මකට නැති යකඩ ගොඩක්. ඒ නිසා, ලියාපදිංචිය නොමැති මේ ඉපැරණි වාහනවල පොත් සහ ෆයිල් සියල්ල විනාශ කර දමන්නට, ගිය අවුරුද්දේ ඔහු ගත් තීන්දුවේ තවම වෙනසක් වී නැහැ. ඔහුට අනුව, එම ලේඛන තබන්නට එම දෙපාර්තමේන්තුවේ ඉඩකඩ නැහැ. ඔහුගේ විසඳුම ඒවා විනාශ කර දැමීම.

නමුත්, ලංකාවේ ලේඛන ආරක්ෂක ආඥා පනතට අනුව අවුරුදු 50ට වැඩි කිසිදු ලේඛනයක් විනාශය කිරීමට තහනම්. ඒ වගේම, ඒවා ආරක්ෂා කිරීමට මේ අය නීතියෙන් බැඳී හිඳිනවා. එහෙම බැලුවත්, මේක ජාතික උරුමයක්.

අමතර කොටස් මේ රටේ තියා, හදපු රටේවත් මිලදී ගන්න තැනක් නැති වටපිටාවක අපි මේවා නඩත්තු කරන්නේ, කැලි හදා ගන්නේ, දුවන තත්ත්වයෙන් පවත්වාගෙන යන්නේ, දැඩි අසීරුතා රැසක් මැද්දේ.

එහෙම ගැටලුත් තියාගෙන, මේ කාර් ටික මේ තරම් හොඳින් රැක ගත්තු අපිට දැන් වෙලා තියෙන්නෙ, ඇතැම් නිලධාරීන්ගේ අමනෝඥ ක්‍රියා පිළිවෙත් නිසා උද්ගතව ඇති තවත් ගැටලු එක්ක සටන් කරන්න. දැන් මේ ගැටලුව, දේශපාලනය විසින් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන විසඳිය යුතු තැනට තල්ලු වෙලා. ඉඩකඩ මදි නම්, ඒ ප්‍රශ්නයට උදව් කරන්න අපේ සංගමයට පුළුවන්. මේ වගේ සුළු හේතුවකට, ඉතිහාසයක් වළලා දමන එක අපරාධයක්.

ලංකාවෙ විතරක් නෙවෙයි, ලෝක ආර්ථිකය දියුණු වුණෙත් ප්‍රවාහන පද්ධතිය දියුණු වීමෙන්. ඒ නිසා ප්‍රවාහන ඉතිහාසය කියා පාන මේ පරණ වාහන ටික, රටේ උරුමයක්. ඔවුන් විනාශ කර දමන්න හදන්නේ, ඒ ඉතිහාසය කියා පාන සාක්ෂි ගොන්නක්.

අනික, දියුණු කළොත්, රැක ගත්තොත් මේක රටට විදේශ විනිමය ගේන්න පුළුවන් අංශයක්.අපේ සංගමයේ බහුතරය වැඩිහිටි උදවිය. දැන් අපේ දෙවැනි පරම්පරාවත් මේ උරුමය රැක ගැනීමේ කාර්යයට අවතීර්ණ වී සිටිනවා. දැන් අපිට බයක් නැහැ. අපෙන් පසුව මේ උරුමය ඉදිරියට ගෙන යන පිරිසක් බිහිවෙලා ඉන්න එක ම, අපිට විශාල හයියක්.

ඇත්තටම මේ සංචාරය අවසානයේ, මහපාරේ දීත්, ගාලු කොටුවේදීත්, රිය පෙරහර දුටු අලුත් සාමාජිකයන් කිහිප දෙනෙක්ම සංගමයට බැඳෙන්න කැමැත්ත පළ කළා.

පිටරටවලින් පවා අපිට දුරකථන ඇමතුම් ආවා. තමන්ගේ ගෙදර ගරාජ් එකේ, හැමදාම හැංගිලා තියෙන මේ කාර් එළියට එන්නේ මේ වගේ රැළියකදී විතරයි. පුද්ගලිකව ගෙවල්වල තිබුණට, ඒවා පිට අයට බලන්න බැහැ. මේවා එකතු කරන අය ළඟ බොහෝ විට එක වාහනයකට වඩා තියෙනවා. එහෙම බැලුවොත් එවැනි පැරණි කාර් දාහකට වඩා අපේ රටේ ඉතුරු වෙලා ඇති."

පැරණි කාර් හිමියන්ගේ සංගමයේ උප සභාපති, වෛද්‍ය කාලිංග ගිනිගේ පවසන්නේ, සුන්දරත්වය මෙන්ම ගැටලුකාරී බව සමග දැවැන්ත සටනක යෙදෙන මේ පරණ කාර් කතාවේ යථාර්ථය පිළිබඳව ය.

මුද්දරවලට, තේ මැෂිමට, දුම්රියට මතු නොව, මෙකී නොකී බොහෝ දෑ සඳහා මියුසියම් ඇති අපේ රටේ, මොන තරම් ප්‍රවාහන අමාත්‍යවරු ඇවිත් ගිය ද, යුගයක අභිමානය කියා පාන මේ ඉපැරැණි කාර් සඳහා කිසිවකුත් එවැන්නක් තැනුවේ නැත.

එහෙයින්, ගාමීණී ලොකුගේ හෝ දිලුම් අමුණුගම ප්‍රවාහන අමාත්‍යවරුන්ට කැමැති නම්, ඉතිහාසගත වන සහ ජාතික යුතුකමක් ඉටු කළා වැනි,මේ කටයුත්තට අත ගසන්නට ඉතා හොඳ අවස්ථාවක් උදා ව තිබේ.

කෞතුකාගාරයක් කෙසේ වෙතත්, මේ පැරැණි කාර්වල උරුමය රැක ගන්නට වෙර දරන මිනිසුන්ගේ ප්‍රශ්න ටිකට විසඳුමක් ලබා දෙන්නට හැකි නම්, එයද මේ රටේ උරුමයක් රැක ගන්නට දායක වූවා වේ.

කෙසේ වුවද, පැරැණි කාර්වලට ආසාව උනන්දුව සහ 'ඇගේ උණක්' ඇති මේ රටේ කුඩා මිනිසුන් සමූහයක් ළඟ පමණක් තවමත් සුරැකිව පවතින මේ ඉපැරැණි කාර්, ඇතැම් විට ඒවා එකල ගෙන් වූ එංගලන්තය හෝ ජර්මනියේ වත් අද ඉතිරිව ඇත්දැයි නොදනිමි.

'උඹලගෙ රටේ මේ කාර්වලට මියුසියම් එකක් තියෙනවද...?'

' කොහෙද මේ කාර් මෙච්චර කල් තිබුණේ...?'

'මේවට අමතර කොටස් හොයාගන්නේ කොහොමද...?'

ගාලු කොටුවේ දී මේ වාහන අතපත ගෑ සුදු ජාතිකයන් නා නා ප්‍රකාර ප්‍රශ්න ඇසුවේ, මෙපමණ ඉතිහාසයක් ඇති පරණ කාර් විස්සක් තිහක් එක පෙළට ලංකාවේ දී දුටු ප්‍රථම වතාව බව පවසමිනි.

ඔස්ටින්,බේබි ඔස්ටින්, බෝට් ටේල්, වූල්ස්ලි, වොක්ස්වෝල්, ස්ටෑන්ඩර්ඩ්, ක්‍රයිස්ටලර්, හස්ටලර්, ඩේම්ලර්,හම්බර් හෝර්ක් සහ ෆෝර්ඩ් යන එකකට එකක් හැඩයෙන් වර්ණයෙන් මෝස්තරයෙන් වෙනස් කාර් සමූහය

1927 යුගයට අයත් මෝටර් බයිසිකල් රැළියේ ගමන් කරමින්

පැරැණි මෝටර් රියක තනු සොයන සුදු ජාතික කාන්තාවක්

මෙවැනි කාර් 1,000ක් පමණ තවමත් ලංකාවේ දකින්නට පුළුවන්

පමණක් නොව, බ්‍රිතාන්‍ය යුද හමුදාවට අයත්, මෙරට පරණම මෝටර් සයිකලය ලෙස සැලකෙන 1927 යුගයට අයත්, BSA 250 මෝටර් බයිසිකලය සහ කොල්ලෑව හෙවත් කරත්තය සහිත BSA 21 මෝටර් බයිසිකලයත් මෙම රැළියේ අභිමානය තවත් වැඩි කළ බව කිව යුතුමය.

එමෙන්ම, සංගමයේ සභාපති නිල් ප්‍රනාන්දුගේ 1926 වසරට අයත්,නිල් පැහැ ඔස්ටින් සෙවන් වාහනයේ සිට, 1956 දක්වා අවුරුදු 30ක පරාසයක දිවෙන අති පැරැණි එහෙත් ඉතා හොඳ ධාවන තත්ත්වයෙන් යුතු, කාර් තිහක් පමණ මෙවර රැළිය හැඩ කළේය.

ඇතැම් විට කෙනකු, පින්තූරයකින් පමණක් දැක තිබූ මෙවැනි කාර් එදා මහ පාරේ සිටි බොහෝදෙනා හැබෑවටම දුටු මොහොත එය විය.

බාල මහලු කවුරුත් ඒ පරණ කාර් සමග සෙල්ෆියක් හෝ සමූහ ඡායාරූපයක් ගන්නට පෙලඹුණේ එනිසාම විය යුතුය.

"වාහන තාක්ෂණය හදාරන තරුණයන්ට පවා මේවායින් කොයිතරම් දේ ඉගෙන ගන්න පුළුවන්ද. මේ කාර් බොහොමයක ලයිට් නැහැ. ඉස්සර භූමි තෙල් සහ ගෑස් ලාම්පු තමයි දෙපැත්තෙන් ලයිට් විදියට පාවිච්චි කළේ. ඊට පස්සේ ඩයිනමෝ තාක්ෂණය ආවා. බ්‍රේක් තිබුණේ, කේබල් බ්‍රේක් හැටියට. ඊට පස්සේ, හයිඩ්‍රොලික් බ්‍රේක් දක්වා දියුණු වුණා. ගියර් බොක්ස් වුණත් එහෙමයි.

ඉලෙක්ට්‍රික් කාර්. හයිබ්‍රිඩ් කාර් පදින රටක තවම මේ වගේ සරල තාක්ෂණයෙන් දුවන කාර් ටිකක් ඉතිරිවෙලා තියෙනවා කියන්නේ, රටක් හැටියට මොනතරම් වටිනා දෙයක්ද.

ඉතින් අපි කියන්නේ, මේ පරණ වාහනවල අයිතිය තහවුරු කරගන්නට අවශ්‍ය නීතිමය පසුබිම සකසා දෙන්න, ප්‍රදර්ශනය සඳහා අවස්ථා උදා කර දෙන්න, කියලයි. මොකද, මේකෙන් යැපෙන පිරිසක් දැනටමත් බිහි වී සිටිනවා. මේ වාහනවල තත්ත්වය විශේෂයි. ඒවායේ පේන්ටින්, ටින්කරින්, අපෝස්ටරින් සහ ඉලෙක්ට්‍රික් වැඩ තරමක් වෙනස්. ඒ නිසා, මේවාට අදාළ ගරාජ් වැඩ දන්නා මිනිස්සු තව තව බිහි වෙන්න ඕනේ "

සංගමයේ සභාපති නීල් ප්‍රනාන්දු පවසන්නේ, කිසිවකුත් නොදන්නා තවත් එක් පැතිකඩක් පිළිබඳව ය.

කෙසේ වුවද, එදා සුද්දා තේ වතුවලට ගියේත්, ඇතැම් විට රට වටා සංචාරය කළේත්, මේ වාහනවලින් බව නොදන්නා පිරිසක් ද මේ රටේ සිටිති.

අද සුද්දා ළඟවත් නැති ඒ වාහන ටික තවත් කාලයක් රැක ගැනීම යුතුකමක් වන්නේ එහෙයිනි.

ඡායාරූප- චමිල පීරිස්

සභාපති නීල් ප්‍රනාන්දු සහ වෛද්‍ය කාලිංග ගිනිගේ ඇතුළු සාමාජිකයන් රැළිය ආරම්භ කරමින්.

දීපානි

මාලිමාවකි අදත් ඔබ

සක්වලින් එපිට බුදුරැස් මඩුල්ලේ හිඳින
ගුත්තිලයෙ කවියකින් තවම සිත පිරිමදින
කලු තිරය වැටුණු පසු ගමන් හොඳ නෑ කියන
සීත මතකයක් ඇත ගත සිත ම හිරිවැටෙන

සමකයේ ගිම්හාන වළල්ලේ හතර වට
මකරයේ කර්කටක නිවර්තන ලහිරු පට
කරදියේ රැළි නැගෙන මේ මහා පොළොව යට
ඔබ පයේ සියුම් හැඩ තල පවා සිහියි මට

කාලිදාසයන් ගේ මේඝ දූතයේ එන
පාළි කවි සංස්කෘත මහා ඉහළින් වනන
බාලි දූපතේ සිටි රාවණගෙ තතු ගයන
මාලිමාවකි අදත් අප්පච්චි මඟ කියන

පියුමි ජයකලණි වික්‍රම ආරච්චි

කොළඹ අහස යට

ඔසුවක් කවදා නිමවේදෝ
පෙමින් රිදුන සිත් සුවපත් කෙරුමට
ඔසුවක් කවදා නිමවේදෝ
ගිණි දලු ලාගෙන ඇවිළෙන විරහව
කවදා කොහොමින් නිමවේදෝ .....

ඉරහඳ දිවුරන නමුදු වෙනස් වෙන
පෙම් සිත් කොහොමින්
එක් වේදෝ
පෙම් ලොව අවසන
පණ නල හැර
කතා හෙටින් අවසන් වේදෝ ....

හිමිවී අහිමිව ඇතක යන සද
දරාගන්න සිත සවි වේදෝ
අයිතිය මත්තෙම තැවෙන නැසෙන සිත්
කවදා ප්‍රේමය හඳුනයිදෝ.....

පුෂ්පකුමාර ආරියරත්න

පැතුම...

සඳත් ඔබ
තරුත් ඔබ
කඩුපුල් මලත් ඔබ
මහද සන්තකයේ
පිපී පිපී දිලී හිනැහෙන...

නෙතත් නුඹ
පණනලත් නුඹ
හැරගියත් නුඹ
පතන්නෙමි මතු සසර
ප්‍රථම පෙම වී
මගෙම වන්නට...

රසික උපුල්

අතුරුදන් වූ බොහෝ දේ

තෙල් ඇබින්දට උඩට එන්නට
වතුර දමලා හිඩැස පුරවා
කුප්පියේ දැල්ලට සහය දුනි
එළිය දෙන්නට පුංචි ගෙපැලට...

පොල් අගිස්සේ මැදට හිරකළ
හනසු තීරුව සවිය වැඩිකළ
බල්බ සවිකළ පහන් කණු නැති
මාවතේදි සිතට දිරි දුනි...

ඉදුණු තැම්බුණු හෙරලි කටුඅල
වේල් තුනටම ගින්න නිව්වට
නෝක්කඩුවක් කිව්වෙ නෑ ගත
කවදාකවත් වෙලා විරසක...

සිවිලිමක් නැති පුංචි වහලේ
රූං පෙති එල්ලිලා නැතිවිට
ගොයම පීරා හමාගෙන ආ
සුළඟ නිව්වා ගතේ දාහය...

කෝ එදා තිබූ ඒ මිනිස්කම
නෑ එදා තිබූ සිතේ සැනසුම
අතුරුදන් වූ ඔබේ සිනහව
හැඩය ගත්තා මිලින කුසුමක

ප්‍රෙමිලා කුමාරි බාලසූරිය

මහගෙදර ගිය මගෙ හිත

නෝක්කාඩු වෙලා ගියත්
මහ ගෙදර
හිත තිබුණෙම ඔයාගෙ ළඟ
කෑවෙ කොහොමද
අද හොඳටම බිව්වද
දොරවල් වැහුවද.....

ඇස් එබුණෙම දුරකතන මූණ මත
හිරු එළිය වැටෙනකොට
මොලොක් හිත ගල් වෙනවා
සඳ එළිය වැටෙනකොට
ආයෙම ඒ හිත ලිහෙනවා
පරණ මතකයන් එක්කම
දින දෙක තුනක් කියන්නෙ
මෙච්චරම දිග කාලයක්ද
හරියට ...

ඒ කාලෙ බලාගෙන හිටපු
දවස් වගේ...

නෙත්මි පබසරා හේවගේ

සිරුංගල්

සරන නුබ ගැබ සිල් බිඳී
වන උයන් මතුයෙන් නැගී
අනන්තය ඉම ඉව දැනී
මඳනලට නිති පෙම් බැඳී

බොල් සුළඟ පෙම් සුව පිරී
තව තවත් නිදහස යදී
රැහැන් පට බිඳිලා කැඩී
සුළඟටම මුහු වූ සැටී...

රළු පවන ගොර හඬ දිදී
සිනිඳු සළු කඩකට ඉරී
පිනි මලක කඳුළක් රැඳී
බිඳුණු රැහැනට දුක දැනී

සුසන්ත ජයනාල් පෙරේරා

ලීදක් තිබුණා එදවස

ගඟක් වාගේ නොනැවත
දියක් සිහිලක් විඳ විඳ
ගළක් පත්ලෙන් පැන නැගි
ළිඳක් තිබුණා එදවස....

බොලොක්කය ඇඬු සද්දෙට
දිය පිරෙත් පෙර අලුයම
ඇහැරුණේ අඩ නින්දෙම
කුරුලු නාදෙත් එක්කම...

හෙන්දිරික්කා යායේ
මල් පිපෙන සැදෑ සාදෙක
සමනලුන්ගේ තනියට
කෙළිදෙලෙන් උන් සවසක...

නිදි කුමාරිට අන්දා
තනි කළත් නිදි කුටියක
ළිං දියෙන් යළි නැවෙත්
මල් පිපුණු හිමිදිරියක...

ඒ ළඟම කිරි කොස් ගස
හෙවණෙ වේලුණු කෙස් තෙත
වනාලා දා පිට මැද
වෙළී ඉමිහිරි ගීයක....

කළු අඳුරු රුක් වදුළෙක
පෙමාතුර උණු කඳුළෙක
ගිමන නිව් ඒ ළිඳ ළඟ
සිහිල කෝ දැන්? කොයිබද?

විපුලී නිරෝෂණී හෙට්ටිආරච්චි

වැහි ලිහිණිය

නිමක් නැති බොල් ආකහේ
දැස දල්වා ගිනියමේ
බලා සිටි දිගු කල්පයක්
නිමාකර වැහි ලිහිණියෙක්...

සලා මුදු කළු පියාපත්
හීන් සරයෙන් කියාපත්
පලා ආවෙද ඇත ඉම සිට
වැහි කඳුළු බිඳුවක් අරන්...

සුළං කෝඩය හැපි හැපී
හඬ තලයි බෝ සේ කිපී
රිදුණු අත් තටු හකුලුවාගෙන
මුවාවී සැඟවෙමු අපි...

රිදී එළි නැගි නැගි මැකී
මේඝ ගර්ජන කණ වැකී
කුඩා හදවත සැලෙයි
අතැඟිලි තුඩින්
පිරිමදිනට හැකි...

අනෝරාවේ ගැහි ගැහී
වැටෙන විට ගෙන ආ වැහි
කුඩා කුටියේ උණුහුමට වී
මගේ තනියට හිටියැකි

අමා ඔවිනි අලුත්ගේ

කවිසිඛිමිණ

සැකසුම - ශ්‍රීනාත් කෝරාලේගම

අයියණ්ඩි

සිප්සල දෙවෙනි කොට අප කුසගිනි	මැලට
ගස මුල පොත් තියා නැග කොස් රුක	අගට
ඉව බල බලා මෝරපු ගෙඩියක	හැඩට
අතුවල ඇවිද යනවා මතකයි	අපට
අඩකට පිරුණ කුස රැළි සනසන	අටින
සරමට පේර අඹ කජු එල වැල	රැගෙන
මුහුණට සිනා සරසා සතුටින්	පිරුණ
එනවිට නුඹ රජෙකි අප දුක සැප	දැනෙන
අප සේරටම දුර එක වර	ඉගෙනීම
ලොකු හීනයක් බව දැනගත්	අයියාම
නිවසේ පහන විය මග පෙන්වන	සෑම
ඔබ පා අසල කළුවර ගැන	නොසිතාම
සුළු පඩි පතෙන් සැනසී මාසේ	අගට
මුළු දාඩියම ගෙව්වේ අප	දියුණුවට
සුළුවෙන් දිවි ගෙවී මහ බෝසත්	ලෙසට
නෙළුමක් පුදමු ඔබ පය පාමුල	සුදට

ශ්‍යාම කුමාර මුණසිංහ

නුඹ

වාරු නැත තෙලිතුඩ
නුඹ සිත්තමින් මවන්නට
කීකරු නොවෙත් පන්හිඳ
නුඹ කවියෙන් වනන්නට....

කටුකය එළිය දැසට
අඳුරේ සිට දකිනවිට
දැන දැනත් අඳ වන බව
රැඳෙමි අඳුරෙම එළිය දැක දැක

නිපුන් සමීර

මිනිස්සු නිදති

මිනිස්සු නිදති
ඒත් නොනිදා සිටිමු අපි
ජීවිතය සුව යහන
වැතිර ඉන්නට මඳක්

සොඳුරුයි
පරම රමණීයයි
මනරම් වූ රැයක
නො නිදා සිටින විට
රතු රෝස පඳුරට
මලක් ඇවිදින්
හොර හොරෙන් බලයි
අප දෙස

යොවුන් වයසේ
මල් මාවතේ
පේනවා අපේ සෙවණැලි
මේ රැයේ සඳඑළියේ
අහසේ කොණක සිට
තරු ළඳුන් ඇස් අරින විට
අපි සඳට මුවා වෙමු
වියපත් වුවද අප
සැමදා දකින රාත්‍රිය
තවමත් යොවුන් වියෙහිය
මිනිස්සු නිදති
නො නිදා හිඳිමු අපි

ජයසේකර මලවිආරච්චි

දෙවියනි මෙවැනි දඬුවම් දෙන්න එපා

නිමිත්ත; නුවර ප්‍රදේශයේ ගොඩනැගිල්ලක් කඩා වැටීමෙන් මව පියා සහ සති හයක් වයසැති බිළිඳිය මිය යෑම

දහසක් පැතුම් මැද්දේ දැගිලි	බැඳුණා
වසරක් ගෙවුණ තැන සුදු දෝනිය	ලැබුණා
කන්දක් තරම් සතුටක් හිත තුළ	තිබුණා
මොහොතක් තුළ හීන බොදවී	මැකුණා
අප පෙම් බැන්දෙ මේ ලෙස	සමුගන්නටද
සුදු දෝණිගේ සුරතල් මට	මෙච්චරද
මෙතරම් දඬුවමක් හිමි මොන	පවකටද
පඩිසන් දුන්නෙ පෙර බවයේ	වරදක්ද
මා මිය ගිහින් ඔබ දෙදෙනා	රැකෙන්නට
පින් මදි ඇති උරුම එකටම	මියෙන්නට
හිමිකම ඇත්තෙ එක වල තුළ	සැතපෙන්ට
පතනෙමි එන බවයෙ එක පවුලක්	වෙන්ට
පින්බර මිනිසුනේ තව මෙය කරනු	එපා
පරිසරයට එරෙහි වී දුක් ගන්න	එපා
ගහකොළ වවනු මිස වනසා දමනු	එපා
දෙවියනි මෙවැනි දඬුවම් නම් දෙන්න	එපා

රවි ප්‍රභාෂ් කරුණාරත්න

රාධා

හෝපලු වනයේ මංපෙත් පාදා
ඇතින් ඇතට දිව යන රාධා
විසිරුණු පෙති ගෙන යළි මල් සාදා
පෙමින් පුදන්නට නැත කිසි බාධා...

සුමිහිරි කන්කලු වස්දඬු රාවේ
සෝබර සුසුමක් සමගින් යාවේ
දුක්බර තනුවක් අහසේ පාවේ
ඇසෙන මානයට කිම යළි නාවේ?...

පතිදම් රකිනා සීතාවක ලෙස
යළිනම් නොබලා කිසිදා මා දෙස
හැකිනම් ඉනු ගෙන මායාවක වෙස
මතුයම් දිනෙකත් පානෙමි සෙනෙහස...

අජිත් නිශාන්ත

රාත්‍රිය මනරම්

අහස් කුස සිඹ සිඹ
නිව් නිව් දිලෙනා තරුමල්
ඉඟි කරනා වදන්
හද සනහාලයි...

තුරුලතා හා ගැටි ගැටී
මොන මොනවදෝ
රහසේ කොඳුරා
හමන මඳ පවන්
ගත සිත පුබුදාලයි...

ඇතින් හිඳ හඬනා
රැහැයියන්ගේ
රාවය නින්දා දෙයි
සුසිනිඳු සේපාලිකා
මල් සුපිපි හමා එන සුගන්ධය
සුවය ගෙනෙයි...

තණ පලස මත රඟන පිණි කැට
දෙපතුල් සුවෙන් සනහා
නිදි දෙව් දුව කැඳවා යයි
ඇතින් ඇතට මවෙතින්...

තනිකම, පාළුව පිටමංකර
නුඹ හිඳිනවද මා හා සමගින්
රැය පහන් වන තුරු
සොඳුරු වදන් තෙපලමින්
සොබාදම් මිතුරියේ...

කේ.ජී. හිල්මිණි

විදෙස් කවිය

දෝණිවරුන් හතළිහම කෝ

සාර් නිකිතාට හතළිහක්
දූ වරුන්
ඒත් කිසිවකු ත් නෑ
ඔවුන්ගේ දුක සැප බැලූ
තිබුණේත් තිබෙන්නේ
ස්ත්‍රීත්වයම මායාකාරියක සේ

යක්ෂයා ගේ
පසුම්බියෙන් ගෙන
ශීතල හිම මත සතපා
අවැසි පරිදි
මවා පෙන්වා තිබේ....

අකැමැත්ත නොසලකා
අසුගේ සැදැලය පිට තබා
රට රාජ්‍යය හරහා
රැගෙන ගියෝය
ඒ ස්ත්‍රීත්වයම
සැඟ වන්න
නැඟ ගන්න
තිස් නව දෙනාම
මේ වනයේ
මහා රුක් රාජයින්ගේ
අතු පතර
තව දුරටත්
ස්ත්‍රී පුරුෂ ආලය
නොමැති සඳ
මොනවා ද මඟ හැරුණේ
මොනවා ද මඟ නො හැරුණේ

ෆ්‍රැන්සින් ජේ. හැරිස්

ඇලෙක්සැන්ඩර් පුෂ්කින් (1799-1837) රුසියානු මහා කවියා විසින් රචනා කරන ලද from tsar nikitha and his forty daughters කාව්‍ය ලොව පුරා වෙසෙන කවි කිවිඳියන් හා රසිකයන් ගේ මහත් අවධානයට හා විමංසාවට පාත්‍ර වූ කවියකි. එම කවිය කියවීමෙන් සිතෙහි උපන් ආහ්ලාදය හා ආශ්වාදය නිසාම, අපේ කාලයේ ප්‍රවීණ කිවිඳිය ක වූ ෆ්‍රැන්සින් ජේ. හැරිස් විසින් ලියන ලද "ඩිඩ් එනි වන් ආස්ක් එනි ඔෆ් නිකිතාස් ඩෝටර්ස්" නම් කවියේ අනුවාදයයි මේ. ඇගේ තෙවැනි කාව්‍ය සංග්‍රහය "හියර් ඉස් ද ස්වීට් හැන්ඩ්" හී ඉහත සඳහන් කවිය ඇතුළත් වේ. එම කාව්‍ය සංග්‍රහය නිකුත් කරන ලද්දේ මේ වසරේදීය (2020).

සම්මානනීය කිවිඳියක වන ෆ්‍රැන්සින් ජේ. හැරිස් ඇමෙරිකාවේ මිචිගන් සරසවියේ සාහිත්‍යය පිළිබඳ දේශකවරියක් ලෙස කටයුතු කරයි.

සමන් ගුණහේරත්

මුහුණු පොතෙන් කවියක්

මිනිස්සු නිදති

මිනිස්සු නිදති
ඒත් නොනිදා සිටිමු අපි
ජීවිතය සුව යහන
වැතිර ඉන්නට මඳක්

සොඳුරුයි
පරම රමණීයයි
මනරම් වූ රැයක
නො නිදා සිටින විට
රතු රෝස පඳුරට
මලක් ඇවිදින්
හොර හොරෙන් බලයි
අප දෙස

යොවුන් වයසේ
මල් මාවතේ
පේනවා අපේ සෙවණැලි
මේ රැයේ සඳඑළියේ
අහසේ කොණක සිට
තරු ළඳුන් ඇස් අරින විට
අපි සඳට මුවා වෙමු
වියපත් වුවද අප
සැමදා දකින රාත්‍රිය
තවමත් යොවුන් වියෙහිය
මිනිස්සු නිදති
නො නිදා හිඳිමු අපි

ජයසේකර මලවිආරච්චි

නිහඬ නවාතැන..

සවන් දෙන රැසියන් ගී හඬට
දිලෙයි තරු නිව් නිවී එක පෙළට
විටෙන් විට ඇඳෙයි හෙවණැලි ඇඳට
ඉතින් තව කණමැදිරි එළි කුමට

ඇති හැකිද නැති බැරිද නොසොයතී
පෙළපතද කුල මලද නොබලතී
හැම හතර රියනකම වැතිර'තී
සිත නිවයි නිහඬ බව අරුමැතී

මාලා විජේකෝන්

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න
සිළුමිණ, කවි පිටුව,
ලේක්හවුස්, කොළඹ 10.
edmediaunit@gmail.com

සතියේ කවි පෙළ

කෘතිය - අකල් මේඝ මැද
කෘතිය - කාශ්‍යප සත්‍යප්‍රිය ද සිල්වා
මිල - රු; 300 පිටු 94
සයුරි ප්‍රකාශනයකි.

'අකල් මේඝ මැද' කාව්‍ය සංග්‍රහය කාශ්‍යප සත්‍යප්‍රිය ද සිල්වාගේ දෙවන කාව්‍ය සංග්‍රහයයි. ඔහුගේ අකල් මේඝ මැද කාව්‍ය සංග්‍රහය නිකුත් වන්නේ වසර වසර තිස් හතරකට පසුවය. මුල්ම කාව්‍ය සංග්‍රහය වන 'විංශතිය' එළිදක්වන්නේ 1986 වසරේදීය.

ගෙවුණ කාලය අප ගත කළේ බියෙන් සැකයෙන් යැයි කිවහොත් නිවැරදිය. අපේ ජීවිත කාලයේ එවැනි සැක බිය සහිත කාල වකවානු කිහිපයක්ම පසු කරන්නට විය. නමුත් ඒ කාලවල අපි අපේ දෛනික කටයුතු සුපුරුදු පරිදි ගත කළෙමු. නමුදු කෝවිඩ් 19 කාලය ඊට හාත්පසින් වෙනස්ය. එය අපේ රටට ආගන්තුක කාලයක්ම විය.

තවමත් අප ජීවත් වන්නේ කොරෝනා පසුබිම් කර ගත් සමාජයකය. මිනිස් ජීවිතයක වටිනාකම මෙන්ම මුදලට රන් රිදී මුතු මැණික්, ගේදොර යාන වාහන ආදි වූ භෞතික දේට කළ හැක්කේ කුමක්ද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයක් කොරෝනා කාලය මිනිසුන්ට පහදා දුන්නේය. මිනිස්කමේ වටිනාකම මෙන්ම මිහිමත ඇති සියල්ලේ අනිත්‍ය බව ගැන මැනවින් පහදා දුන්නේ කොරෝනා කාලයයි. අවාසනාව නම් මිනිසුන් අද වන විට එය අමතක කර දැමීමය

කාශ්‍යප සත්‍යප්‍රිය ද සිල්වා

අපේ රටට මෙන් චීනය, ඉතාලිය, ඇමෙරිකා ආදී රටවල කෝරෝනා නිසා මිනි කඳු ගොඩගැසෙන විට අපට සැනසෙන්නට හැකි විය. ඒ අපේ රටේ රෝග ව්‍යාප්තිය දරුනු නොවූ නිසාය. කෙසේ වෙතත් කොරෝනා සමයේ තම සිතුවිලි එක්තැන් වූ අයුරු පමණක් නොව පොදුවේ විඳිය හැකි විඳ ඇති අත්දැකීම් ගොන්නක් ඇසුරින් කාශ්‍යප කවි රැසක් නිර්මාණය කර ඇත .ඒ අතර තිබූ මේ කවිය අපට සිහි කරන්නේ කොරෝනා වයිරසයෙන් චීනයේ රෝහලක සේවය කළ වෛද්‍යවරයාගේ මිය යෑමේ පුවතයි. ඉන් පසු අන්තර්ජාලය වෙත මුදා හැරුණ රූප රාමු හා ඡායාරූපයි. එනම් මියගිය වෛද්‍යවරයාගේ බිරිය සිය සැමියාගේ මෘත ශරීරය ගෙන යන වාහනය පසු පස හඬමින් යන දසුනයි. පහත දැක්වෙන්නේ ඒ කවිපන්තියේ අවසන් කවියයි. මාතෘකාව - අවසන් හාදුව.

"ගෙවා යොදුන් දුර මා කැටිව ආ හැටි
සිහිව නෙතින් වැගිරේ බරැති කඳුළැලි
නළලත මුව තබා තව හාදු දෙන බැරි
අතවන දුරින් හිඳ ඔබෙන් සමුගමි"

කොරෝනා වයිරසය පැතිරී යෑමත් සමග මිනී කඳු ගොඩගැසූ චීනයට ඇමෙරිකාවට ඉතාලියට පමණක් නො අනෙක් රටවලට ද මරණය සාමාන්‍ය දෙයක් විය. දෛනිකව රෝගීන් වැඩිවීමත් රෝගය උත්සන්න වීමෙන් මිය යන සංඛ්‍යාව වැඩි වීමත් රෝගය උත්සන්න වුවන්නට වෙනත් ප්‍රතිකර්මයක් නොතිබීම නිසා ඇතැම් රෝහල් වලදි පණ අඳින රෝගීන්ගේ වෙන්ටිලේටරය අක්‍රිය කළ අවස්ථා තිබිණි. මේ කාර්යය කරන ලද්දේ හෙදියන් විසිනි . එවන් හෙදියකගේ සිතුවිලි කෙබඳු වෙන්නට ඇති ද? මේ කාශ්‍යපට සිතුණ දේය. මාතෘකාව 'පව් නැත මා අත'

"මට ඉඩ දෙන්න.... මට ඉඩ දෙන්න
නවතාලන්න
අන්තිම හුස්ම
.....
පිපුණු මල් හැමදාම - පරව යයි නොකියාම
අහස් මව ආදරෙන් වැහැ වතුර ඉස්සාට
හැකිවේද ඉන් මලට
තවත් ආයුෂ දෙන්න

දැන් ඔබට විඩාවයි- ඔත්පලයි හොඳටෝම
වෛරසය ජීවිතය බිළිගනියි නොඅසාම

පින්වතුනි එකතු වී සෙත් පිරිත් මුමුණන්න
දරුවනේ , ඈත හිඳ ඇස කඳුළ වලකන්න
ඉඩ දෙන්න පලක් නැති යන්තරය නවතන්න
හඬා වැටෙනා මගේ හදවතට ඔසු දෙන්න

අනේ! මට පව් නැතැයි
මහතුනේ ..... පවසන්න"

කොරෝනා මුල් කර ගනිමින් ලියැවුණ කවි අතර වෙනස් අත්දැකීම් මුල්කරගෙන ලියැවුණ කවි රැසක් ද අපට අකල් මේඝ මැද කාව්‍ය සංග්‍රහයේදි හමුවේ. බඩගින්නට කොස් ගෙඩියක් කැඩූ වරදට කැති පහර සිද්ධිය මුල් කරගෙන කවියා ලියූ 'කැති පහර දුන් මාමාට' කවියයි මේ සිද්ධිය පිළිබඳ කියන කවියා අවසානයට කියන්නේ මෙසේය. එය කවියා කැති පහර දුන් මාමාගෙන පමණක් නොව මේ මුළු සමාජයේ මිනිසුන්ගෙන්ම කරන ආයාචනයක් බඳුය. "තමන්ගේ දුක මෙන්ම අනුන්ගේ දුක ද දැනෙවා , එපමනක් නොව හොඳ ගුණ ධර්ම රැකෙන්නට නම් මිනිස්කම තිබිය යුතුය" යන්න වඩාත් හොඳින් පවසන්නකි.

වැටෙන වැස්සේ වස විස හැම රැඳියන්
හැදෙන පැලය පුබුදා නියඟය හළු කරාපන්
නැගෙ කුස ගින්න තව තව දැනියන්
නිවන වඩනු පෙර මනු ගුණ වඩාපන්...

කාශ්‍යපගේ කවි මඟ දිනෙන් දින අලුත් වේ යැයි කිමෙහි වරදක් ද නැත.

පරණ බස් එකක් ඇතුළේ පුස්තකාලයක්

දීර්ඝ කාලයක් යටත්විජිත පාලනයක් තුළ පැවැති ආසියානු කලාපය ස්වදෙශීය ස්වාධීනත්වය ලබා ගන්නේ දේශප්‍රේමී සාහිත්‍යය ප්‍රබෝධයක් ද සමඟ ය. ස්වාධීනත්වය ලද පසුව විශේෂයෙන්ම ඉන්දියාව ගත් කළ සිය ස්ව පාලනය අර්ථවත් කරනු වස් සාහිත්‍යය යොදාගත් ආකාරය කැපී පෙනෙන එකකි. අගමැති ජවහර් ලාල් නේරු ජාත්‍යන්තර මට්ටමේ උසස් කෘති ස්වදේශීය භාෂාවන්ට පරිවර්තනය කරවා ජනතාව අතරේ බෙදා හැරීමේ, ඒ වැඩ පිළිවෙල තුළ අන්තර්ගත වූයේ එසේ නැත්නම් ඊට පදනම් වූයේ රටක ආර්ථික දේශපාලන නිදහස අර්ථවත් වීමේ මූලික පදතම බුද්ධිමත් ජනතාවක් සිටින තරමටය යන්න ය. එම පසුබිමේම රබීන්ද්‍රනාත් තාගෝර් කියුවක් ද මෙහිදී අමතක කළ නොහැකිය.

"බටහිර සුළඟට රටට ඇතුළු වන්නට ඉඩ දෙන්න පිටව යාමට ද ඉඩ හරින්න. එහෙත් දේශයේ සංස්කෘතිය, සාරධර්ම ආදියට ඒත් සමගම ගසාගෙන යෑමට ඉඩ නොදෙන්න."

1980 දශකය අවසාන වන්නේ නමක් ප්‍රසිද්ධ නැති, ප්‍රකාශකයන්ගේ අවධානයක් නැති ලේඛකයන්ට තමන්ගේ කෘතියක් ප්‍රකාශනයට පත් කරගැනීමට අවස්ථාවක් නැතැයි යන මැසිවිලි චෝදනා ද සමඟ ය. ඒ අනුව 90 දශකය ආරම්භයේ දී ඇරඹෙන ජාතික පුස්තකාල ප්‍රලේඛන සේවාව ඒ වන විට සැඟවී සිටි අංකුර ලේඛකයින්ගේ කෘති මෙන්ම ලේඛකයන්ව ද උගත් පාඨක සමාජය හමුවේ අනාවරණය කිරීමට කටයුතු කිරීම එකී ලේඛකයන්ගේ ද ප්‍රශංසාවට හේතු වූ කරුණක් විය. නමුත් පසුගිය කාලවල දී ඒ අරමුණුත් සමඟ මේ සේවාවේ අඩපණ වීමක් දකින්නට ලැබුණේ මූල්‍ය ප්‍රතිපාදනයන්හි අගහිඟකම් ද මැද ය. නමුත් වෙනස් වූ රාජ්‍ය පාලන සමයත් සමඟ නැවතත් අත් පිටපත් බාර ගැනීමේ සොම්නස් සහගත ආරංචිය පුවත්පත් දැන්වීමක් වශයෙන් දැකිය හැකි විය.

පුස්තකාල හා ප්‍රලේඛන සේවාවේ වත්මන් සභාපතිවර සොනාල ගුණවර්ධන උක්ත සේවාවේ නව්‍ය මුහුණුවර සම්බන්ධයෙන් කතා බහකට එක් වෙමින් පැවසුවේ මේ වන විට 2019 -2020 පොත් මිල දී ගැනීම වෙනුවෙන් පවත්නා ව්‍යාපෘතියත්, පොත් ප්‍රකාශනයට සහාය ලබාදීම උදෙසා අත් පිටපත් ලබා ගැනීමේ ව්‍යාපෘතියත් ක්‍රියාත්මක කොට ඇතැයි කියා ය. මෙතෙක් ඒ කටයුතු මූල්‍ය ප්‍රතිපාදන නොමැතිවීමේ හේතුවෙන් අඩාල ව තිබූ බව ද ඔහු පිළිගත්තේ ය.

"අපි ඒ ලේඛකයාට සහයක් හැටියට පොත් මිල දී ගත්තත් ඔහු හෝ ඇයට ඒ පොත වෙනුවෙන් බාහිර ප්‍රකාශකයෙක් හොයා ගන්න වෙනවා. කර්තෘ භාගය හැටියට ලැබෙන්නෙත් සියයට 10 ම තමයි. කර්තෘ දන්නෙත් නැතිව ප්‍රකාශකයා පිටපත් ගහලා විකුණන එක නවත්වන්නත් බෑ. ඒ නිසා මම කල්පනා කරල තියෙනවා සමීක්ෂණයෙන් අනුමැතිය ලබන පොත්වල ප්‍රකාශකයාත් අපිම වෙන්න. ඒ අනුව පුස්තකාල ප්‍රලේඛන සේවාවෙන්ම ඒ පොත් ප්‍රකාශයට පත් කරන්න අපේ බලාපොරොත්තුවක් තියෙනවා. එතැනදී ලේඛකයාගේ කර්තෘ භාගය වැඩි කරන්නත් අපට පුළුවන්."

මෙයට අමතරව ඉදිරියේ දී තවදුරටත් ධාවනය කළ නොහැකි අබලන් බස් රථ ප්‍රාදේශීය පළාත් හි පුස්තකාල බවට පත් කිරීමේ අදහසක් ද ඇතැයි පැවසූ ඔහු මේ වන විට එසේ නිර්මාණය කළ බස් රථ පහක් ජනාධිපතිතුමාව ලබා දී ඇතැයි ද කීය.

"මෙහි විශේෂත්වය තමයි එම බස් පුස්තකාල ඇතුළෙ ඉන්ටර්නෙට් පහසුකම් ද තිබීම." සොනාල ගුණවර්ධනයන් පැවැසුවේය.

ශාස්ත්‍රීය පොතපත මුද්‍රණය කිරීමේ අදහසක් ද පුස්තකාල ප්‍රලේඛන සේවාවට ඇති බව ද පැවසූ ඔහු විශේෂයෙන්ම මේ වන විට සොයාගත නොහැකි පෙර විසූ උගතුන්ගේ ශාස්ත්‍රීය පොතපත නැවත මුද්‍රණය කිරීමට තම ආයතනය බලවත් උනන්දුවකින් සිටින්නේ යැයි ද වැඩිදුරටත් පැවසීය. එහෙත් බොහෝ අවස්ථා වල දී පොත්වල හිමිකම පිළිබඳ නීතිමය ප්‍රශ්නත් ඇතැම් කෘති කොහොමටවත් සොයා ගැනීමට නොහැකි වීමත් නිසා ඒ සම්බන්ධයෙන් මහත් අපහසුතා ගොඩනැගී ඇති බවක් ද ඔහු කීය.

> **"පොත් ප්‍රදර්ශනයට ගියාම පරිවර්තන කෘති වැහි වැහැලා. මේ පොත් ඇත්ත වශයෙන්ම සැබෑ පරිවර්තන කෘති ද කියන එකත් ප්‍රශ්නයක්. පෝළිමෙ ඉඳල පොත් ගන්න තත්ත්වයකුත් තියෙනවා. ඉතින් ඔය විදිහෙ කියවීමක් තියෙනවනං මේ රට මෙහෙම වෙයි ද කියලත් මට හිතෙනවා. ඒ අනුව ප්‍රශ්නයක් ගොඩනැගෙනවා. ඔය ගන්න තරමට පොත් කියවන්නෙ නැද්ද?"**

තවද පොදුවේ ගත් කළ ප්‍රකාශයට පත්වන පොත් සම්බන්ධයෙන් විද්වත් නියාමනයක් අවශ්‍යයය කියන කරුණ ද මෙහි දී අපගේ සාකච්ඡාවට බඳුන් විය.

"පොත් ප්‍රදර්ශනයට ගියාම පරිවර්තන කෘති වැහි වැහැලා. මේ පොත් ඇත්ත වශයෙන්ම සැබෑ පරිවර්තන කෘති ද කියන එකත් ප්‍රශ්නයක්. පෝළිමෙ ඉඳල පොත් ගන්න තත්ත්වයකුත් තියෙනවා. ඉතින් ඔය විදිහෙ කියවීමක් තියෙනවනං මේ රට මෙහෙම වෙයි ද කියලත් මට හිතෙනවා. ඒ අනුව ප්‍රශ්නයක් ගොඩනැගෙනවා. ඔය ගන්න තරමට පොත් කියවන්නෙ නැද්ද? නැත්තම් කියවන තරමට වර්ධනය වෙන්න දෙයක් ඒ පොත්වල නැද්ද?"

පුස්තකාල හා ප්‍රලේඛන සේවාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ඉදිරිපත් වූ කපිල කුමාර කාලිංග ප්‍රකට ලේඛකයකු මෙන්ම එකී සේවාවේ සමීක්ෂකයෙකු වශයෙන් ද කටයුතු කරන්නෙකි. ඒ අනුව තමන් ප්‍රබන්ධ හා නාට්‍ය අංශයේ කෘති සමීක්ෂණ කටයුතු වලට සහභාගි වන බවත්, එහිදී බොහෝ විට ලැබෙන්නේ නවක මට්ටමේ කෘති බවත් ආයතනය මෙන්ම තමන් පවා නිතරම උත්සහා කරන්නේ හැකිතාක් දුරට ගුණාත්මක බවක් මත ප්‍රකාශනය සඳහා හොඳ කෘති තෝරා දීමටය යනුවෙනුත් ඔහු පැවසීය. එමෙන්ම කළ හැකි මට්ටමෙන් මෙන්ම හැකිතාක් දුරට කෘතිවල වැරදීම් නිවැරැදි කොට (අදාළ ආයතනයේ අදහස ද එයම වන පසුබිමක) ඒ පොත් හොඳ කියැවීමක් වෙනුවෙන් ඉදිරිපත් කරන්නට තමන් ඇතුළු ආයතන කටයුතු කොට ඇතැයි ද ඔහු පැවසීය. තවද ඒ වෙනුවෙන් උපදෙස් ලබා දෙන්නේය යන කරුණ ද ඔහු ඊටම එක් කළේය.

සොනාල ගුණවර්ධන

සිය මුල් කෘති පුස්තකාල හා ප්‍රලේඛන සේවාවේ අනුග්‍රහයෙන් ප්‍රකාශයට පත් කරගනිමින් අද දින එහි සමීක්ෂණ කටයුතු වලට ද හවුල් වී සිටින ප්‍රකට ලේඛක කීර්ති වැලිසරට අනුව මෙය ආරම්භ වූ එදා ලේඛන කලාවට පිවිසෙන්නවුන්ට තිබූ ප්‍රකාශකයකු සොයා ගැනීමේ බරපතළ ප්‍රශ්නය හමුවේ මේ සේවාව අතිශය වැදගත් එකක් විය. විශේෂයෙන්ම තමන්ගේ කෘතිය අදාළ විෂය පිළිබඳ පිළිගත් උගතකමක් ඇති පෙර සමීක්ෂණ මණ්ඩලයක අනුමත වීමෙන් එම කෘතියේ ගුණාත්මක බව පිළිබඳ සහතිකයක් පාඨකයාට ලැබුණි. අනිත් අතින් අදාළ සේවාව විසින් සිදු කරනු ලබන මිළ දී ගැනීමේ අනුග්‍රහය මත ක්ෂේත්‍රයට පිවිසෙන ලේඛකයකුගේ කෘතියක් බියක් සැකක් නැතිව ප්‍රකාශනයට බාර ගැනීමට ප්‍රකාශකයකු ඉදිරිපත් වීම යන මේ කරුණු මත මෙය ඉතා හොඳ වැඩපිළිවෙලක්ය යන්න ද ඔහුගේම අදහස විය.

කෙසේ වෙතත් පසුගිය කාල වකවානුවේ මූල්‍ය ප්‍රතිපාදන අහිමි වීමෙන් ලද පසු බැසීම ද හමුවේ මේ වන විට එයට ලැබෙන අත් පිටපත් සංඛ්‍යාවේ කැපී පෙනෙන අඩුවක් දැකිය හැකි යැයි ද ඔහු පැවසීය. පවත්නා මෙම මන්දගාමී ස්වභාවය කෙරෙහි ඉක්මන් අවධානයක් යොමු වීම අවශ්‍ය බවත්, එය වර්ධනීය තත්ත්වයකට ගෙන ඒම එහි වගකීමක් බවත්, පෙන්වා දෙමින් කීර්ති වැලිසර තවදුරටත් පෙන්වා දුන්නේ මෙවැනි හොඳ වැඩපිළිවෙලක් ආරක්ෂා කරගැනීම වගකීමක් මෙන්ම යුතුකමක් ද වන බව ය.

ඇත්තටම අපට විද්‍යා සාහිත්‍යයක් අවශ්‍ය නැද්ද?

මීට වසර 11,500 කට පමණ පෙර (මේ වන විට ඒ වර්ෂ කාල නිර්ණය ඊට වඩා වැඩි විය යුතුය.) පැවති අතිශය දියුණු ශිෂ්ටාචාරයක් සාගරයේ ගිලී අතුරුදන් වූයේ යැයි ද ඒ වනාහි අත්ලාන්තික් දිවයින නම් භූ කලාපය වන්නේ යැයි ද යන ආහ්ලාදජනක ඒ ප්‍රවෘත්තිය එක්දාස් නවසිය අසූ ගණන්වලදීත් නැවත ඉස්මතු වූයේ විද්‍යා ලොව හා පුවත්පත් ලොව ද එක සේ කළඹමිනි. ඒ වන විට ලේක්හවුස් ප්‍රවෘත්ති පත්‍ර ආයතනයේ කතුවරයකු වූ දයාසේන ගුණසිංහ සාම්ප්‍රදායික එවකට පැවති පුවත්පත් කලාවෙන් එහාට යමින් ඒ හා සම්බන්ධව ලිපි මාලාවක් ලියුවේ "සඳ මඬළින් ආ දෙවිවරු" යන අපුරු උත්ප්‍රාසාත්මක සිරස්තලය යටතේ ය. එපමණක් නොව "විද්‍යා හමුව" නමින් විද්‍යා දැනුම හා තොරතුරු සහිත ලිපි සරණියක් ද සිළුමිණ පුවත්පත විසින් ඉදිරිපත් කරන්නට යෙදුණේ විද්‍යා සාහිත්‍යයක වෙනුවෙන් තමන්ගේ සැබෑ උවමනාව මොනවට පෙන්වා දෙමිනි. පසුව වෙනත් පුවත්පත් ද විශේෂයෙන්ම විද්‍ය සාහිත්‍යය පාදක කරගත් විද්‍යා ප්‍රබන්ධ කතා පරිවර්තන පවා කොටස් වශයෙන් ඉදිරිපත් කරන තැනට පත් වුණි. 60 දශකය වන විට ලොව පුරා නැඟී එමින් තිබූ විද්‍යා සාහිත්‍ය ප්‍රබෝධය අපට දැනෙන්ට වූයේ 70 -80 දශකයන්හි සිටය කීවොත් නිවැරැදි ය. එතැනදී එවකට කැපී පෙනෙන මට්ටමේ ජාතික පුවත්පත් ආයතනයක් වූ ලේක්හවුසියේ ඉදිරිපත් වීම සැලකිය යුතු තැනක තිබුණි.

"අත්ලාන්තික් දිවයින පිළිබඳ පුවත මෙන්ම එය නැවත සොයා ගැනීමේ පුවත ද එක හා සමානව අද්භූත ජනකය."

"අත්ලාන්තික් දිවයිනේ නටබුන් අතරින් පළමුවරට මිනිස් ඇසට හමු වූයේ සුවිශාල දෙවොලකැයි අදහස් කරන ගොඩනැගිල්ලක මුදුනයි. එය වූයේ 1968 දී ය." විශේෂත්වයකින් මෙන්ම කෘතවේදීව සඳහන් කළ යුත්තක් වේ.

විශේෂයෙන්ම විද්‍යා අධ්‍යාපනයට අදාල එහි විෂය මූලික වැදගත්කම් අවධාරණය කෙරෙන නව රාජ්‍ය ප්‍රතිපත්ති මාලා හමුවේ තවදුරටත් කුමන මට්ටමක හෝ නවකතා මුල් කොටගෙන මුදල් ත්‍යාග සොලවන සාහිත්‍ය ප්‍රකාශන සම්මානකරුවන්ට විද්‍යා සාහිත්‍යයක අවශ්‍යතාව පෙනී නොයෑම ගැන පුදුමයක් ඇති නොවුණත් ඒ පිළිබඳව උගතුන්ගේ නිහඬතාව ගැන නම් මවිතයට පත් නොවී සිටිය නොහැකිය. ලෝකය අලුතින් නිර්මාණය කළ, එකී නව වෙසෙස් විද්‍යා නිර්මාණ හමුවේ "ස්වර්ණ යුගය" වශයෙන් පතළ නමක් ඇති කරගත් 80 දශකය ඉල්ලා සිටි ඒ විද්‍යා සාහිත්‍ය අවශ්‍යතාව හමුවේ එවකට සිටි උගතුන් මෙන්ම ප්‍රකාශකයන් දැක්වූ ඒ සවිඥනකත්වය ගැන සොයා බැලීම වෙනම අධ්‍යයනයක් නිර්මාණය කරනු ඇත. ඒ අනුව ගොඩනැගුණ ඒ පුවත්පත් කලාව ද මෙරට විද්වතුන් සහ නව තාරුණ්‍යයක් හමුවේ පුළුල් සංවාදශීලි පාඨක සමාජයක් ඇති කළේය යන්න විවාද රහිත ය.

විශේෂයෙන්ම ලෝක විද්‍යා හැදෑරීම් තුළ භෞතික විද්‍යාව වැනි යාන්ත්‍රික විෂයයක් දාර්ශනික අධ්‍යයනයකට යොමුව තිබූ එම කාල වකවානුවේ (එහි පුරෝගාමියා හැටියට සැලකෙන්නේ ඇල්බට් අයින්ස්ටයින් ය.) විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යයට ලැබුණේ නොතිත් වටිනාකමකි. විශේෂයෙන්ම විද්‍යා පර්යේෂණයේලා "තෝර්ට එක්ස්පරිමන්ට්" යන්න මතුවීම තුළ විද්‍යා පර්යේෂණ ද පරිකල්පනය මුල් කොටගත් ව්‍යායාමක් බවට පත් විය. හුදු භෞතික අත්හදා බැලීම් වලින් එහාට ගිය නිර්මාණශීලි කටයුත්තක් බවට ද පත් විය.



ඇල්බට් අයින්ටයින්

කාල් සේගන්

බිල් ටයිසන්

ඉලොන් මස්ක්

මෙරට පුවත්පත් කලාවට අදාළව මේ සම්බන්ධයෙන් මහත් අවධානයක් යොමු කළ දයාසේන ගුණසිංහ එය වෙසෙස් විශේෂාංග පුවත්පත් කලාවක් බවට පත් කළේ ඔහු ලේක් හවුසියේ සිටිදී ය. ඒ වෙනුවෙන් මහත් කැපවීමකින් කටයුතු කළ මහාචාර්ය ඔස්මන්ඩ් ජයරත්න වැන්නවුන්ගේ පුවත්පත් සාකච්ඡා මෙන්ම අධ්‍යයන පූර්වක නිර්මාණශීලි ලිපි ඒ පුවත් විශේෂාංග අතර නිතර දැකිය හැකි විය.

විද්‍යා ප්‍රබන්ධ සාහිත්‍යය සැමවිටම ඉලක්ක කරගත්තේ අනාගතයයි. අනාගතය නිර්මාණය කර ගැනීමයි. ප්‍රබන්ධයකින් නොකීවාට මිනිසා මුලින්ම ගින්දර සොයා ගැනීම ද අනාගත විද්‍යා ජයග්‍රහණයකි. විද්‍යා ලේඛකයන් පවසන අන්දමට ලෝකය පූර්ණකාලීනව ම අනාගතය වෙනස් කිරීමට යොමු වන්නේ රෝදය සොයා ගැනීමෙන් පසුව ය. ස්ටීව් ජොබ් ඇතුළු කණ්ඩායමේ ඇපල් නිෂ්පාදන දක්වාම ගලාගෙන ආවේ එකී විද්‍යා නිර්මාණශීලීත්වයයි. පර්යේෂණාත්මක පරිකල්පනයයි. ඒ අනුව විද්‍යා ප්‍රබන්ධ යැයි කියන්නේ හුදෙක් අද්භූත පරිකල්පනයක්ය යන්න තවදුරටත් ඇත්තක් නොවේ. එය එතැනින් නතර කළ යුතු ද නොවේ.

ඇත්ත වශයෙන්ම අනාගතවාදී දැක්මක් ඒ වෙනුවෙන් අපට අවශ්‍යය. සාම්ප්‍රදායික ඇමරිකන් නාසා ආයතන වල් වැදෙමින් ඉලොන් මස්ක්ගේ "ස්පේස් එක්ස්" නව ඉලෙක්ට්‍රොනික තාක්ෂණය හරහා අජටාකාශ ජයග්‍රහණ අත්පත් කරගනිමින්, නව අධි තාක්ෂණ විප්ලවීය නිෂ්පාදන බටහිර ලෝකය හමුවේ දෛනික පරිභෝජන භාණ්ඩ බවට පත් වෙද්දී අප විද්‍යා අධ්‍යාපනය මෙන්ම අපගේ ජීවන විලාසයේ අනාගත පැවැත්ම ගැන විවේචනාත්මක සිතා බැලීමක් අද අපට අවශ්‍ය ය. තවද එය පොදු කියවීමක්, නව අපේක්ෂාවක් බවට පත් කරගත හැක්කේ පරිකල්පනීය විද්‍යා සාහිත්‍යයක් හරහා ය.

> **ඇත්ත වශයෙන්ම අනාගතවාදී දැක්මක් ඒ වෙනුවෙන් අපට අවශ්‍යය. සාම්ප්‍රදායික ඇමරිකන් නාසා ආයතන වල් වැදෙමින් ඉලොන් මස්ක්ගේ "ස්පේස් එක්ස්" නව ඉලෙක්ට්‍රොනික තාක්ෂණය හරහා අජටාකාශ ජයග්‍රහණ අත්පත් කරගනිමින්, නව අධි තාක්ෂණ විප්ලවීය නිෂ්පාදන බටහිර ලෝකය හමුවේ දෛනික පරිභෝජන භාණ්ඩ බවට පත් වෙද්දී අප විද්‍යා අධ්‍යාපනය මෙන්ම අපගේ ජීවන විලාසයේ අනාගත පැවැත්ම ගැන විවේචනාත්මක සිතා බැලීමක් අද අපට අවශ්‍ය ය.**

ලෝක යුද්ධ දෙකකින් පසු විනාශ වූ මනුෂ්‍යත්වය හමුවේ නව නිර්මාණශීලි විද්‍යා අධ්‍යාපනයක් වෙනුවෙන් අධ්‍යාපනයක් සහ නිර්මාණ ප්‍රවේශයක් වෙනුවෙන් කීර්තිමත් විද්‍යාඥ මහාචාර්ය කාල් සේගන්ගේ 70 -80 දශකයන්හි පැවති නිරවි යුද්ධයට ද එරෙහිව ලොව විශිෂ්ටතම (මානව සම්භවයට අදාළව) විද්‍යා රූපවාහිනී මාලා වැඩ සටහනක් වූ "කාස්මස්" වැනි නිර්මාණශීලි මාධ්‍ය නිදර්ශන හමුවේ අප, අප වෙනුවෙන්ම ප්‍රගති වාර්තාවක් ලබාගත යුතු කාලය පැමිණ ඇත. ආචාර්ය හරිශ්චන්ද්‍ර විජේතුංග ද ඒ හා සමාන අත්දැකීම් නිර්මාණශීලි විද්‍යා සාහිත්‍යයට දැක්වූ දායකත්වය යළිත් සිහිපත් කරගැනීම මැනවි. තවද ආචාර්ය ඊ. ඩබ්ලිව් අදිකාරම් විද්‍යා විෂය සිංහල විෂය ධාරාවන්ට එකතු කරමින් කටයුතු කරන්නේ ද මේ කියන කාලයේ ය. විද්‍යා අධ්‍යාපනය සිංහල බසින් ඉගැන්වීමේ හැකියාව සම්බන්ධයෙන් ආචාර්ය අදිකාරම් මුල් කොටගත් උගතුන් සිය අධ්‍යාපන ක්ෂේත්‍රයට එකතු කළ වර්ධනයන් ඉතිහාසය තුළ නිහඬ වීමට ඉඩ නොදිය යුතුය.

බටහිර පවා පැවැති සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රම විවේචනයට ලක් වෙමින් පැවතුණේ විද්‍යා අධ්‍යාපනය මුල් කර ගනිමිනි. මහා විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින් ඒ සාම්ප්‍රදායික අධ්‍යාපනයෙන් අසාධාරණයට අතිශයින්ම ලක් වූ පුද්ගලයෙක් වේ. එනිසාම ඔහු සපල මෙන්ම නිර්මාණශීලි අධ්‍යාපනයක් වෙනුවෙන් සිය ජීවිතයෙන්ම කැප වුණේ ය. මහාචාර්ය කාල් සේගන්, අද වන විට මහාචාර්ය නීල් ටයිසන් මෙන්ම තවත් ප්‍රගතිශීලි ප්‍රබුද්ධ විද්‍යාඥයන් හමුවේ නව නිර්මාණාත්මක විද්වත් විෂය ධාරාවන්ගෙන් ලොව විද්‍යා අධ්‍යාපනය පෝෂණයටත්, ප්‍රබෝධයටත් ලක්ව ඇති මේ යුගයේ අප සිටිය යුතු තැන ගැන වෙසෙස් අවධානයකට ලක් විය යුතු වේ.

මිහිතලය උරුමයට ගත් මානවයාගේ වංශ කතාව

ග්‍රන්ථය - සේපියන්ලා
පරිවර්තනය - උපාලි රත්නායක
සරසවි ප්‍රකශකයෝ
මිල රු. 900 (පිටු 546)
විමසීම් - 071 6686325

උපාලි රත්නායක

අප කුමන විශ්වාසයක සිටිය ද මානව පරිණාමයේ හෝමෝ සේපියන්ස් නම් හඳුනා ගැනීම තුළ අප ලබා ඇති ශිෂ්ටාචාරයේ අභිවර්ධනය මුළුමනින්ම මානවීය පරිකල්පනය නම් වූ ඒ අසීමිත තත්ත්වය මත පදනම් වන්නේ ය. ඒ බව මෙම විස්තරය අවසානයේ දී ඔබට තවදුරටත් පැහැදිලි වෙනු ඇත.

"සේපියන්ලා - මිහිතලය උරුමයට ගත් මානවයාගේ වංශ කතාව" මැයෙන් සිංහල බසට නැගෙන්නේ යුවාල් නොආ හරාරිගේ "සේපියන්ස් අ බ්‍රිෆ් හිස්ටරි ඔෆ් හියුමන් කයින්ඩ්" නම් ඓතිහාසික වූත්, විද්‍යාත්මක වූත් මානව පරිණාමයේ පර්යේෂණාත්මක නව සංස්කරණයක් බුඳුහුදු ප්‍රබන්ධයක් නොවන ආඛ්‍යායනයයි. පරිවර්තක උපාලි රත්නායක ඒ පිළිබඳව සිය නිරීක්ෂණය ඉදිරිපත් කරන්නේ මෙසේ ය.

ඒ අනුව මානව වංශ කතාවේ සමාජ දේශපාලන මුහුණුවර ගත් කළ අද දක්වාත්, අදින් පසු ඉදිරියටත් ගමන් කරන මේ ආඛ්‍යායනය මාක්ස්වාදී විග්‍රහයේ එන මූලික ප්‍රවාදය වන ඓතිහාසික භෞතිකවාදය හා මුළුමනින්ම එකඟ නොවුවත්, හෝමෝ සේපියන්ස් නම් මානවයාගේ මෙම ගමන තුළ ද පැහැදිලිවම විප්ලවීය ස්වභාවයක් දැකගත හැකි වේ. තව ද යුවාල් නොආ හරාරි මෙය ලියන්නේ විද්‍යාත්මක කරුණු පාදක කරගත් විශ්ලේෂණයක් හැටියට වුණත්, කෘතියක් හැටියට ගත් කළ මෙය දෘෂ්ටාන්ත සහිත ආඛ්‍යායනයක් හැටියට හඳුනාගත හැකි ය.

මාක්ස්වාදී විග්‍රහය තුළ එන රදළ සහ වහල් සමාජ වෙනස් කරන්නා වූ පැහැදිලි මායිම් රේඛාවක් හඳුනා ගැනීමට අසීරු ය. මන්ද යත් වැඩවසම් ක්‍රමය තුළම වහල් ශ්‍රමය පවතින තත්වයක් දැකිය හැකි හෙයිනි. තවද ධනවාදී සමාජය යනු ද වැඩවසම් සමාජයීය ලක්ෂණ මුළුමනින්ම අතු ගා දැමූ තත්වයක් නොවේ. ඒ ආකාරයට එම සමාජ පරිණාමය ඒ අයුරින් විභේදනය කෙරුණත් ඒ වනාහි ශුද්ධ වූ ලාක්ෂණික බෙදීම් වශයෙන් ගත හැකි තත්ත්වයක් නොවේ. ඒ ආකාරයටම මානව පරිණාමය තුළ අප උගත් සාම්ප්‍රදායික විභේදනය තවදුරක් ඉරි ගසා වෙන් කළ හැකි ශුද්ධ වූ ලාක්ෂණික තත්වයක් නොවේය යන්න මෙම කෘතිය මැනවින් පෙන්වා දෙයි. සේපියන්ලා නම් කෘතියේ පර්යේෂණාත්මක වටිනාකම පවතින්නේ ද එකී විශ්ලේෂණය තුළ ය.

ඒ අනුව කෘතියේ කතුවරයා මානව පරිණාමය තුළ සංජානන විප්ලවය, කෘෂිකාර්මික විප්ලවය, කාර්මික විප්ලවය මෙන්ම අධි තාක්ෂණ විප්ලවය වශයෙන් අවධි කිහිපයක් මානව පරිණාමයට අදාළව දකී. එය ඓතිහාසික බෙදීමක් බව පැහැදිලි ය. අවසානයට කියවුණ අධිතාක්ෂණ විප්ලවය යනු අප වසන මෙම කාලයෙන් එහාට නිර්මාණය වෙමින් පවතින කාල වකවානුව වේ. විශේෂයෙන්ම සංජානන විප්ලවයේ දී මානවයන් එකිනෙකා අතර ඇති කරගත්තා වූ සංජානනය (සන්නිවේදනය) මානව ශිෂ්ටාචාරයේ පැවැත්ම සම්බන්ධයෙන් වැදගත් බලපෑමක් සිදු කළ බව ඇත්තක් වේ. තවද මානව පරිණාමයේ සාම්ප්‍රදායික බෙදීම තුළ එන නියැන්ඩර්තාල් මානවයා හෝමෝ සේපියන්ස්ට පෙර සිට ඉවත්ව ගොස් ඇතැයි යන ඒ සාම්ප්‍රදායික පරිණාමීය ඉගැන්වීම කතුවරයා වඩාත් තත්වානුකූල විශ්ලේෂණයකින් ඉදිරිපත් කෙරෙන්නේ පහත දැක්වෙන ආකාරයට ය.



ඒ අනුව යමින් කතුවරයා පෙන්වා දෙන්නේ නියැන්ඩර්තාල් හා හෝමෝ සේපියන්ස් යන මානවයන් එකම කාලයක විසූවන් වන නමුත් පරිසර කලාප දෙකක විසූ අය බව ය. නියැන්ඩර්තාල් විසුවේ හිම ප්‍රදේශ වල ය. විශේෂයෙන්ම හිම කලාපයට ඔරොත්තු දෙන අයුරින් ශක්තිමත් දේහ ශක්තියක් ඇතිව සිටි නියැන්ඩර්තාල්ගේ මස්තිෂ්කය, හිස් කබල පවා හෝමෝ සේපියන්ස්ට සාපේක්ෂව විශාල මට්ටමකින් පැවතී තිබේ. ඊට අමතරව රුසියාව හා ඕස්ට්‍රේලියාව ඇසුරේ හෝමෝ ඩෙගිසෝවා සහ හෝමෝ ප්ලෝරෙමියාස් යනුවෙන් තවත් මානව විශේෂ දෙකක් ද ඊට සමකාලීනව වාසය කොට ඇත. කෙසේ වුව දේහ ශක්තියෙන් වැඩි නියැන්ඩර්තාල් මානව පරිණාමය තුළ අතුරුදහන් වෙද්දී හෝමෝ සේපියන්ස් සිය පැවැත්ම දිගටම රඳවා ගත්තේ සෙසු සියලු විශේෂයන්ට වඩා සියුම් වූත් ප්‍රබල වූත් හැකියාවක් ඔහුට තිබූ නිසා ය.

කතුවරයා ඒ වෙසෙස් හැකියාව "පරිකල්පනය" නමින් හඳුන්වා දෙයි. පොදුවේ ගත් කල සෑම සත්ව විශේෂයකටම සිය පැවැත්ම වෙනුයෙන් ස්වභායෙන්ම ලද හැකියාවක් තිබේ. එම හැකියාව මෙන්ම පරිසර සාධක ද මත උහු සිය පැවැත්ම තහවුරු කර ගනිති. එමෙන්ම ඒ සාධක අහෝසි වන පසුබිමක ඔවුන්ගේ පැවැත්ම ද අවදානමකට ලක් වේ. නියැන්ඩර්තාල්ගේ ඉරණම ද ඊට වෙනස් නොවී ය. එහෙත් හෝමෝ සේපියන්ස්ට ඒ සියල්ලන්ටම නැති වෙසෙස් හැකියාවක් වූ නිසා ඔහු මානව පරිණාමය තුළ සියල්ලන් අබිබවා පැහැදිලි ජයග්‍රාහණයක් අත් කර ගැනීමට සමත් විය. ඒ හැකියාව අර කීව පරිකල්පනයයි. ඒ අනුව සාම්ප්‍රදායික මානව යුග පසු කරමින් පැමිණ සිටින ඔහු අනාගත අධිතාක්ෂණ යුගයේ හිමිකාරත්වය ද ඉල්ලමින් සුපිරි මිනිසකු බිහි කිරීමේ සංකල්පයක් ද ඉදිරිපත් කරමින් සිටී.

උපාලි රත්නායකගේ පරිවර්තන කර්තව්‍යයේ පවත්නා විශ්වසනීයත්වය හා සුගම බව ඔහුගේ සාහිත්‍ය නිර්මාණශීලිත්වයේ මුහුකුරා යෑම මත සිද්ධ වුවක්ය යන්න පැහැදිලි ය.

දීපානි

රට පිනවූ සිනහව මිලිනව යයි!

දශක තුනකට අධික කාලයක් සිංහල සිනමා ක්ෂේත්‍රය තුළ සිය අනන්‍යතාව තහවුරු කළ හාස්‍යෝත්පාදක රංගන ශිල්පී ටෙනිසන් කුරේ සිය දිවි ගමනෙන් සමුගන්නේ තරුවක් ලෙසින් බැබළෙමින් සිටියදී ය.

"මේ මේ ය"යි නිශ්චිතව පෙන්වා දෙන්නට කිසිම තරුවක් ස්ථාවරව රැඳී නැති වර්තමාන සිංහල සිනමා ක්ෂේත්‍රය තුළ මියෙන තෙක්ම ඔහු කෙරෙහි ප්‍රේක්ෂක ආකර්ෂණය රැඳී තිබුණේ ය. ඔහුට සමගාමීව ඒ වාසනාවට හිමිකම් කියන්නට ඉඩ ලැබී තිබුණේ දීර්ඝ කාලයක් තිස්සේ ඔහුගේ ප්‍රහසන සහයා වූ ජනප්‍රිය හාස්‍යෝත්පාදක රංගන ශිල්පියකු වන බන්දු සමරසිංහට පමණි. ටෙනිසන් කුරේගේ හදිසි අභාවය ගැන සැලවූ සැණින් ඔහුගේ චිත්‍රපට බැලූ නොබැලූ හෝ කා තුළත් අනුකම්පාව හෝ සංවේගය වෙනුවට ක්ෂණික කම්පනයක් ඇති වූයේ එහෙයිනි.

සිංහල සිනමාවේ ආරම්භයේ දී එඩී ජයමාන්නගෙන් ඇරඹී හාස්‍යෝත්පාදක සිනමා රංග ඉතිහාසය මුළුල්ලේ හියුගෝ ප්‍රනාන්දු, ඇන්තනි සී පෙරේරා, දොන් සිරිසේන, නවනන්දන විජේසිංහ, බී.එස්.පෙරේරා, මුල් යුගයේ දී ජෝ අබේවික්‍රම ආදීන් විසින් ලබා තිබූ ජනප්‍රියත්වය ඉන් අනතුරුව දීර්ඝ කාලයක් එක දිගට පවත්වාගෙන ගිය ශිල්පියා වූයේ ෆ්‍රෙඩී සිල්වා ය. ෆ්‍රෙඩී සිල්වාගෙන් පසුව ඒ තත්ත්වය සිය ජීවිතය කාලය මුළුල්ලේ රැකගත් ශිල්පීන් දෙදෙනෙකුගෙන් එක් අයකු වූයේ ටෙනිසන් කුරේය.

පෙර කී පිරිසට වඩා ටෙනිසන් කුරේගේ මෙම ජනප්‍රියත්වය පිළිබඳව පැවසිය යුතු විශේෂත්වයක් තිබේ. එය නම් පෙරකී

නළු නිළියන් ජනප්‍රිය වූයේ මෙරට තුළ සිංහල සිනමාව ඉතා හොඳින් ව්‍යාප්තව පැවැති යුගයක වීමය. ඔවුන් සමඟ ගාමිණී ෆොන්සේකා, ජෝ අබේවික්‍රම, ජීවරාණී කුරුකුලසූරිය, සන්ධ්‍යා කුමාරි, විජය කුමාරතුංග, මාලනි ෆොන්සේකා, ඩොමී ජයවර්ධන ආදී නළු නිළියන් රැසක් ද රඟපෑ අතර, මේ කාලයේ සිංහල සිනමා අම්බරය මෙන්ම සුවහසක් ප්‍රේක්ෂක හදවත් ද මෙකී තරු වල ආලෝකයෙන් බැබළෙමින් තිබුණි. එකල කොල්ලා කෙල්ල සහ වීරයා පමණක් නොව, දුෂ්ඨ චරිත රඟපෑ ඩොමී, පියදාස ගුණසේකර වැනි නළුවන් පවා ජනප්‍රිය සිනමා තරු බවට පත්ව සිටි බව අපට මතකය.

නමුත් ටෙනිසන් කුරේට සිය අනන්‍යතාව රඳවා ගන්නට සිදු වූයේ මෙවැනි සිනමා තාරකා වලින් විනිර්මුක්ත පසුබිමක මෙන් ම සිංහල චිත්‍රපට කෙරෙන් ද ප්‍රේක්ෂකයා ඈත්ව ගිය යුගයකය.

1952 අප්‍රේල් 31 දා වැලිමඩ දී උපත ලැබූ ටෙනිසන් කුරේ අධ්‍යාපනය ලැබුවේ මොරටුව මෙතෝදිස්ත උසස් පාසැලෙනි.

චිත්‍රපට කතා රචකයකු ලෙස ඔහු මුලින් ම සිනමාවට සම්බන්ධ වූයේ දිනේෂ් ප්‍රියසාද්ගේ "පෙරළිකාරයෝ" චිත්‍රපටයේ කතාව සහ තිර රචනය නිර්මාණය කරමිනි. ඒ 1986 දී ය. ඉන් අනතුරුව 1987 දී තිරගත වූ "නොම්මර එකයි" චිත්‍රපටයේ කතාව සහ දෙබස් රචනය සිදු කෙරුණේ ද ඔහු අතිනි.

අනතුරුව 1987 දී "චණ්ඩින්ගෙත් චන්ඩියා" චිත්‍රපටයේ රඟපෑ ඔහුට එතැන් සිට දිගින් දිගටම චිත්‍රපට වල රඟපෑමට ආරාධන ලැබෙන්නට පටන් ගත්තේ ය. ඒ අනුව 1990 වසරේ දී තිරගත වූ "සම්බුදු මහිම", "හොඳ හොඳ සෙල්ලම්" "හිතහොඳ පුතෙක්", "හොඳින් නැත්නම් නරකින්"සහ ඇසළ සඳ", "චෙරියෝ ඩෝක්ටර්" ආදී වශයෙන් චිත්‍රපට ගණනාවක රඟපෑමේ අවස්තාව ඔහුට හිමි විය.

ඉන්පසු 1991 දී "අලි බබා සහ හොරු හතළිහ" සහ "ආසයි බයයි" යන චිත්‍රපට වලද, 1993 දී "සිංහයන්ගෙත් සිංහයා" සහ "රණබිමේ වීරයා" යන චිත්‍රපට වලද, 1993 දී "සිංහ රාජා" "කම් ඔ ගෝ චිකාගෝ" සහ" අපේ විජේ" යන චිත්‍රපට වලද රඟ පෑවේ ය.

ඉන් අනතුරුව 1995 වසරේදී තිරගත වූ චිත්‍රපට පහකම ටෙනිසන් කුරේගේ රඟපෑම් දැක ගැනීමේ අවස්ථාව ප්‍රේක්ෂකයාට හිමි විය. ඒවා නම් "රෝදය" "චෙරියෝ කැප්ටන්", "හිත හොඳ සූරයෝ", "දෙවියනි සත්‍යය සුරකින්න", සහ දෙමෝදර පාලම" ය. "දෙමෝදර පාලම" යනු සුප්‍රකට "චණ්ඩියා" චිත්‍රපටයේ දෙවන කොටස ලෙස තිරගත වූ අතර, ගාමිණී ෆොන්සේකා ප්‍රධාන චරිතය රඟපෑ මෙහිද තිර රචනයට ද ඔහු සම්බන්ධ වූ බවට මතකයක් අප තුළ ඇත. මෙහි අධ්‍යක්ෂවරයා වූයේ ටෙනිසන්ට සිනමාවට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දුන් දිනේෂ් ප්‍රියසාද් ය.

නවසිය අනූ හයේ තිරගත වූ "චෙරියෝ ඩාලිං" චිත්‍රපටයෙන් අනතුරුව 1997 දී ඔහුගේ ම තිර රචනයක් අනුව ගොඩනැගුණු "අපයේ තත්පර අසූහාර දහසක්" චිත්‍රපටයේ ද, "සූරයෝ වැඩ කාරයෝ", "විජයග්‍රහණය", "රඹා සහ මධු" යන චිත්‍රපට සඳහා ද රංගනයෙන් දායක විය.

පසුව රෝයිද සිල්වාගේ "දවල් මිගෙල් රැ දනියෙල්" චිත්‍රපටයේ බන්දු සමරසිංහ සමඟ රංගනයට එක් වෙමින් එදා පැවති ආදායම් වාර්තා බිඳ හෙළන ජනප්‍රියත්වයක් ලබා දීමට ටෙනිගේ දායකත්වය නොමඳව පිරිනමා තිබුණි.

මින් අනතුරුව "කොලොම්පුරේ" නම් යම් පමණක විද්‍යා ප්‍රබන්ධ ලක්ෂණ සහිත චිත්‍රපටයක රඟපෑ ටෙනිසන් කුරේ 20001 දී ප්‍රේක්ෂකයා හමුවට පැමිණෙන්නේ "ජොන්සන් ඇන්ඩ් ජොන්සන්"," ජැක් ඇන්ඩ් ජිල්" සහ "කොළඹ කොළොප්පන්" යන චිත්‍රපට තුළිනි.

අනතුරුව 2002 දී "පාර්ලිමන්ට් ජෝක්ස්", "සොමි බෝයිස්", 'ලව් 2002" යන චිත්‍රපට තුළින් ඔහුගේ රංගනය ප්‍රේක්ෂකයාට දැක බලා ගත හැකි විය.

2003 වසරේ දී තිරගත වූ "ඇලඩින් වැල්ඩින්", "ටැක්සි ඩ්‍රයිවර්" "හිත හොඳ පිස්සෝ" සහ වැලා ඉන් ලන්ඩන්" යන චිත්‍රපට වල රඟපෑ ටෙනි 2004 දී රෝයි ද සිල්වා අධ්‍යක්ෂණය කළ "රැ දනියෙල් දවල් මිගෙල්-2" රඟපා ප්‍රේක්ෂක ආදරය දිනා ගත්හ. එම වසරේදීම ඔහු "ඔහොම හරිද", "ක්ලීන් අවුට්" යන චිත්‍රපට තුළින් හේ ප්‍රේක්ෂකයා හමුවට පැමිණියේය.

''ජෙම්ස් බොන්ඩ්' නැමැති චිත්‍රපටයේ රඟපාමින් 2005 වසරේ ප්‍රේක්ෂක ආදරය දිනා ගත් ටෙනි "වැඩ බැරි චණ්ඩියා" සහ "ජුන්ඩයි ගුණ්ඩයි" යන චිත්‍රපට දෙකෙහිද චරිත නිරූපණයේ යෙදුණි. 2000 දී ඔහුව අපට දැකගත හැකි වූයේ "ඇයි ඔබ තනිවෙලා" චිත්‍රපටයෙන් පමණි. 2010 දී තිරගත වූ 'හදවත මල් යායයි", "අපේ යාළු පුංචි භූතයා" සහ "වැඩ බැරි ටාසන් මැති සබයට" යන චිත්‍රපට ත්‍රිත්වය විසින් ඔහුගේ රඟපෑම් යළිත් ප්‍රේක්ෂකයා ඉදිරියට ගෙන එන ලදි.

''තැන්ක් යු බර්ටි", චිත්‍රපටය ලියා අධ්‍යක්ෂණය කිරීම ඔහුගේ සිනමා ජීවිතයේ අලුත් අත්දැකීමක් වූ අතර, එය තිරගත වූයේ 2011 දීය.

ඉන් අනතුරුව 20012 දී "ජීවිතය ලස්සනයි" චිත්‍රපටයෙන් අපට ඔහු දැකගත හැකි වූ අතර, 2014 දී ඔහු රඟපෑ චිත්‍රපට තුනක් එක දිගට තිරගත වුවේ ය. ඒවා නම් 'සුපිරි අන්දරේ", "රංජා" සහ "පරපුර" යන චිත්‍රපටය.

දෙදහස් පහළොවේදී තිරගත වූ "සිංග මචං චාලි" චිත්‍රපටයෙන් පසුව 2017 දී "නෝනා හරිම වසයි" නම් චිත්‍රපටයක ද රඟපෑවේ ය. ඔහුගේ රංගනය සහිත අවසන් චිත්‍රපටය ලෙස වාර්තා වී ඇත්තේ "හලෝ ! මිස්ටර්! මං ඩිරෙක්ටර්" ය.

ඉතා පැහැදිලි ලෙසම ටෙනි සහ බන්දු සුසංයෝගය විසින් මෙරට හාස්‍යෝත්පාදක සිනමා රංගනයෙහි ලා එක් යුගයක් නිර්මාණය කළ බව අවිවාදිතය. අප විසින් ඉහත නම් සඳහන් කරන ලද චිත්‍රපට අතරින් සෑහෙන ප්‍රමාණයක ප්‍රධාන චරිත නිරූපණය කරන ලද්දේ ටෙනී සහ බන්දු විසින් බව ද මෙහිලා සඳහන් කළ යුතු කාරණයකි.

තවකෙකු අනුකරණය කිරීමෙන් තොරව තමන්ගේ කට හඬට ආවේනික ඔහුට ම සුවිශේෂී වූ රංගන විධික්‍රමයක් ප්‍රේක්ෂකයා සිනහා ගැන්වීම සඳහා ටෙනී යොදා ගත්තේ ය. දුව පනින ඇද වැටෙන සිදුවීම් වලින් ප්‍රේක්ෂකයා සිනහා ගැන්වීමට වඩා ඔහු විසින් ඒ සඳහා උපයෝගි කරගනු ලැබුවේ සියුම් චලනයක් සමඟ ඉදිරිපත් කළ හාස්‍යය ජනිත කරවන සුළු බරපතල වදන් මාලාවකි.

උදාහරණයක් ලෙස ඔහු විසින් ප්‍රේක්ෂකයාව වැඩිපුරම සිනහා ගස්වනු ලැබුවේ ටයි කෝට් පැළඳි ලොක්කකු ලෙස හෝ වෙනයම් ගණන්කාරයකු ලෙස තමා පෙනී සිටින බව පෙන්වන්නට උත්සාහ ගැනීමෙනි. බොහෝ විට ඔහුගේ සැලුන් එකක කොණ්ඩය කපන බව පවසන්නේ ලෝකයේ හොඳම බාබර්ලා එකොළොස් දෙනාගෙන් පස්වෙනියා ය!.

යම් යම් අධ්‍යක්ෂවරුන්ගේ අභිමතය පරිදි අනුගමනය කරන්නට සිදු වුවද හැකි සෑම විටකම දෙපිට කැපෙන දෙබස් පැවසීමෙන් ද, ජුගුප්සාව ජනිත කරවන සිදුවීම් ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීමට ද ටෙනී වගබලා ගත්තේ ය.

සිනමාවේ ඉහළම ජනප්‍රියත්වයත් සමඟ නාට්‍ය වේදිකාවේ හාස්‍යෝත්පාදක චරිත නිරූපණයට එක් වූ ටෙනී 80-90 දශක වලදී නිහාල් සිල්වාගේ "සාජන් නල්ලතම්බි"ට ආසන්න ජනප්‍රියත්වයකට පැමිණියේ ය. ඒ සිසිල් ගුණසේකරගේ "රැල්ල" ඇතුළු නාට්‍ය කීපයක රඟපෑමෙනි. සිනමාව හා සමානව ජනප්‍රියත්වයක් වේදිකාවේදිත් ලැබීමට නම් ඒ ගැන අවබෝධයක් ද තිබීම අත්‍යාවශ්‍ය කරුණකි.

නමුත් ඔහු නාට්‍ය වේදිකාව මතු නොව, විලියම් ෂේක්ස්පියර් ගැනද ප්‍රමාණිකයකු බව එක්තරා අවස්ථාවකදී අපට දැකගත හැකි විය.

එය නම් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට හාස්‍යෝත්පාදක රංග ශිල්පියෙකු අගයමින් "දෙරණ" නාළිකාව විසින් ඔහුට සම්මානයක් පුද කළ අවස්ථාවේ දීය.

එහිදී තමාට ලැබුණු එකී සම්මානය ශ්‍රී ලංකාවේ සියලුම හාස්‍යෝත්පාදක රංගන ශිල්පීන්ට පුද කරන බව පැවසූ ටෙනී තම ස්තුතිපූර්වක වචන කිහිපය අවසන් කළේ මේ අයුරින් විලියම් ෂේක්ස්පියර් ගේ "කිං ලියර්" නාට්‍යයෙන් උද්ධෘතයක් ඉදිරිපත් කිරීමෙනි.

"වැරහැලි ඇඳගත් කළ සුලු වැරදි පවා පෙනේ. සළුපිළි ආභරණ වලින් සැරසුණු කළ සියල්ල වැසේ, අපරාධය හා පාපය රනින් ආලේප කළ විට යුත්තියේ සාධාරණත්වයේ කඩු පවා ඇගට නොදැනී දෙකඩ වේ"

ඔහු කුමක් අරමුණු කරගනිමින් පැවසූ දෙයක් දැයි අපට නොවැටහුණත් සිය පියා විසින් මෙම කොටස ඔහුට පවසා තිබුණේ තමා විඳි බරපතළ සිත්තැවුලක් පිළිබඳව පැවසූ අවස්ථාවක යයි ටෙනිසන් එහිදී පැවසුවේය.

ඔහු විසින් විඳින ලද සිත් තැවුල කුමක්දැයි අප නොදන්නා මුත් එක්වරම අපගේ මතකයට නැගුණේ ඩොස්ටොව්ස්කිගේ "අපරාධය හා දඬුවම" පරිවර්තනය කරමින් දුර ගමනක් යෑමට මුළ පිරූ නමුත් එය අසාර්ථක වී මාරක කතා චක්‍රවර්ති වූ ඩීමන් ආනන්දය. ඒ ආකාරයට ම ටෙනිසන් කුරේ ද ශේක්ස්පියර් ඇසුරු කරමින් සිංහල නාට්‍ය වේදිකාව ඔස්සේ අරහන්නට තැත් කළ දිගු ගමන අඩාළ වී හාස්‍යෝත්පාදක රංගනයේ තරුවක් බවට පත්වූවාදැයි අප නොදනිමි.

නමුත් මෙකී මංපෙත තුළද ඔහු ලැබූ ප්‍රේක්ෂක ආකර්ෂණය කෙතෙක්දැයි තේරුම් ගැනීමට හොඳම නිදසුන ලෙස පෙන්වා දිය හැක්කේ රෝයි ද සිල්වාගේ "රැ දනියෙල් දවල් මිගෙල් " චිත්‍රපටයේ ටෙනී සහ බන්දු සුසංයෝගයෙන් ඉදිරිපත් කළ රංගනයයි. විවිධාකාර හේතු මත චිත්‍රපට බැලීමට ප්‍රේක්ෂකයා නොපැමිණෙන්නේ යයි නිෂ්පාදකයින් අඳෝනා නැඟූ යුගයක "රැ දනියෙල් දවල් මිගෙල්" එක දිගට පැල්බැඳගෙන දිව්වේ ටෙනී බන්දු සුසංයෝගය මුල්කර ගනිමිනි. ඒ තත්ත්වය පිළිබඳව අප දන්නා හොඳම සාක්ෂිකරුවා වන්නේ "සිරසේ" නිහාල් චිත්‍රම එදිරිසූරියයි. ඔහු පැවසුවේ පාසැල් කාලයේ දී සිදු වූ දෙයක් කලකට පසු චිත්‍රපට පෝළිමේ දී සිදු වූ බවය. එය නම් ඔහුට ඉදිරියෙන් සිටි තැනැත්තාගෙන් දවල් මිගෙල් චිත්‍රපටයේ ටිකට් ඉවරවීමය!

ටෙනිසන් අපෙන් සමු ගත්තේ ප්‍රේක්ෂක ආකර්ෂණය මත තරුවක්ව බැබළෙමින් සිටියදී බවට හොඳම සාක්ෂිය මෙය බව සිතමි.

ඔහු විසින් ප්‍රේක්ෂකයාව වැඩිපුරම සිනහා ගස්වනු ලැබුවේ ටයි කෝට් පැළඳි ලොක්කකු ලෙස හෝ වෙන යම් ගණන්කාරයකු ලෙස තමා පෙනී සිටින බව පෙන්වන්නට උත්සාහ ගැනීමෙනි. බොහෝ විට ඔහුගේ සැලුන් එකක කොණ්ඩය කපන බව පවසන්නේ ලෝකයේ හොඳම බාබර්ලා එකොළොස් දෙනාගෙන් පස්වෙනියා ය!

සැලරු චිත්තමල්

තිස්ස ප්‍රේමසිරි
tissa.siyana@gmail.com

සොරි! මිස් ජෙනිස්!

දැන් තිරගත වන "මිස් ජෙනිස්" චිත්‍රපටය තුළින් අප දකින්නේ බරපතළ රැවටිල්ලක යෙදෙමින් තම පවුලේ ජීවන ගැටලු සඳහා විසඳුමක් සොයා ගන්නට උත්සාහ දරන මිනිසෙකුගේ කතාවකි. මෙය ගැහැනියක ලෙස වෙස්වලා ගනිමින් රැකියාවක යෙදෙන මැදි වයසේ මිනිසකු පිළිබඳව වූවකි.

ජාත්‍යන්තර සම්මානලාභී නළුවකු ඩස්ටින් හොෆ්මාන් කලෙකට ඉහත රඟපෑ "ටූස්ටී" මෙන්ම, දෙදාහේදී බන්දු සමරසිංහ රඟපෑ "කවුද බොලේ ඇලිස්" චිත්‍රපටය ද අපට සිහිපත් කරවන්නෙකි.

චිත්‍රපට නිර්මාණය කර ඇත්තේ ප්‍රේක්ෂක මතකයේ රැඳුණු ටෙලි නාට්‍යය කිහිපයක් ම රූපවාහිනී මාධ්‍යයට එක් කළ ජනප්‍රිය ටෙලි නාට්‍ය අධ්‍යක්ෂවරයකු වූ සුසිරින් ද සිල්වා ය.

ඉන් කියැවෙන්නේ යහපත් මධ්‍යම පන්තියක ජීවිතයක් ගත කළ සමාගමක නිලධාරියෙකු වංචාවකට අසුව රැකියාවෙන් නෙරපනු ලැබීමත්, අන් කිසි තැනක රැකියාවකට ඉඩක් නොලැබීම නිසා ගැහැනියක ලෙස වෙස් වලා ගනිමින් රැකියාවක යෙදෙන ආකාරයත් ය. නමුත් මෙය ඩබ්ලිව්.ඒ. සිල්වාගේ කාලයේ සිද්ධියක් නොව වර්තමාන යේ කතාවක් වන බැවින් එවැනි වෙස් මාරුවක රැඳී සිටීම අතිශයින් සංකීර්ණ "මෙහෙයුමකි". එනිසාම අසීමිත ලෙස නාට්‍යමය අවස්ථා ගොඩ නගන්නටද හේතු වන්නකි. අද අප ජීවත් වන්නේ ජංගම දුරකථන වලට අයත් අදෘශ්‍යමාන විද්‍යුත් රැහැන්පටවල් වලින් එකිනෙකා බැඳ දමා ඇති යුගයක බව කිසිසේත් අමතක නොකළ හැකි ය. ජංගම දුරකථන තාක්ෂණයේ දියුණුවට සමගාමීව සමාජ සාරධර්ම වල විකෘතීන් ද ඒ තරමට ම වර්ධනය වී ඇත.

තමා තිරයේ දකින මෙවැනි වෙස් පෙරළියක් එක්වරම ප්‍රේක්ෂකයා තුළ ඇති කරන්නේ හාස්‍යෝත්පාදක හැඟීමකි. එහෙත් ලොකු මහත් වූ දරුවන් සිටින මැදි වයස ද ඉක්මවූ මිනිසකුට ජීවිතය ගෙන යෑම සඳහා මෙවැනි රැවටිල්ලක යෙදෙන්නට වීම බරපතළ බේදවාචකයකි. එසේ විය හැකිය යැයි අප විසින් උපකල්පනය කරනු ලැබුවද අධ්‍යක්ෂ සුසිරින්ද සිල්වා මෙම චිත්‍රපටයේ දී වැඩි අවධානයක් යොමු කර ඇත්තේ එකී වෙස් මාරුව හේතු කොටගෙන, ඉස්මතු වන හාස්‍යෝත්පාදක සිදුවීම් වලට වැඩි අවධානයක් යොමු කිරීමට ය. ඒ නිසා මෙම චරිතය හා සෙසු චරිත අතර ඇතිවන සබඳතා සහ ප්‍රතිවිරෝධතාවන් තුළින් ස්වාභාවික හාස්‍යය මතු කරනවා වෙනුවට හාස්‍යය මතු කරන සංසිද්ධීන් ගණනාවක කෘතීමව ඇති කිරීමට අධ්‍යක්ෂවරයා පෙලඹී ඇත. ඒ නිසා මිනිසෙකු ගැහැනියක වීමේ දී ඇතිවන අවුල මෙන්ම නිර්මාණයේ දී ද අවුලක් ඇති වී තිබෙන බව අපට පෙනේ.

අධ්‍යක්ෂවරයා ස්වකීය තිර නාටකය පිළිබඳව යොමු කර ඇති ඉතා අඩු අවධානය මේ කාරණයට මුල්ම හේතුව වී තිබේ. සරල කතාවක මෙන් සිදුවීම් ගණනාවක් ඒකරාශි කිරීමට මුල් තැනක් දෙනවා විනා චරිත නිර්මාණයක් ගැන ඔහුගේ අවධානය යොමු වී නැත. ලියොන් නැමැති මෙම පුද්ගලයා හොරකමක නිරත වූයේ ජීවන ප්‍රශ්න සඳහා යැයි සාධාරණය කිරීමක්, ඔහුගේ බිරිය අතින් සිදුවුණ ද, සිනමා රූපය තුළින් අප දකින්නේ එවැන්නක් නොවේ.

ඔහුගේ නිවස සහ එහි ඇතුළත පසුබිම අපට කියා පාන්නේ මේ පුද්ගලයා යම් තරමක සුපිරි ජීවිතයක් ගෙන යනු පිණිස වංචාවක නිරත වූ බවකි. ගෙදර බරපතළ ප්‍රශ්න ඇති බව අපට පෙන්වන්නේ තරුණ පුත්‍රයා එක් වරක් මොනවටදෝ සල්ලි ඉල්ලීමත්, තව ටික වේලාවකින් දියණියට පන්තියට සල්ලි බැඳීම මතක් කර දීමත් තුළින් පමණි.

හොරකමට සම්බන්ධ අනෙක් සගයා හමුවීමට සිය බිරිය විසින් දෙන උපදේශය මත එහි යන ලියොන්ට ඔහුගෙන් ලැබෙන උපකාරය වන්නේ කාන්තාවක් ලෙස වෙස් ගන්වා කඳුකරයේ වලව්වක තරුණ දියණියක රැක බලා ගන්නා තනතුරක් ලබා දීමය.

එතැන් සිට සමස්ත චිත්‍රපටය ගොඩනැගී ඇත්තේ මෙම වෙස් මාරුව සමඟ ලියොන් මුහුණ දෙන ප්‍රශ්න මුල්කර ගනිමිනි. නමුත් ගැහැනියක වූ ලියොන්ගේ චරිත නිරූපණය උදෙසා ජයලත් මනෝරත්නගේ වයස වැඩි බව යම් පමණකට අවාසියක් ගෙනදුන් බව පෙනෙන දෙයකි. මනෝරත්න අප රටෙහි සිටි විශිෂ්ටතම රංගවේදියකු වුවද, ප්‍රකෝටිපති ව්‍යාපාරිකයකු පිස්සු වැටෙන තරමේ ස්ත්‍රී චරිත නිරූපණයක් සඳහා සුදුසු කායික ස්වභාවයක ඒ මෙහොතේ සිටි බවක් නොපෙනේ. එම කාරණයද චිත්‍රපටයේ විශ්වසනීයත්වය පළුඳු වීමට හේතුවක් වී තිබේ. නමුත් මේ විශ්වසනීයත්වය පළුඳු වීම නිශ්චිතව ඇරඹෙන්නේ කිසිදා නොදුටු ගැහැනියක් හැඳුනුම්පත ද නොබලා වලව්වේ හාමු විසින් තම නිවසේ වැඩට ගැනීමත් සමඟ ය. ලියොන්ගේ චරිතය පිළිබඳ ලොකුම ගැටලුව අප තුළ ඇති කරවනු ලබන්නේ බේබි හාමුගේ මාලය කඩාගත් හොරුන් පසුපස හඹායන මිස් ජෙනිස් ඔවුනට පහරදී මාලය රැගෙන ඒමත් සමඟය. ජනප්‍රිය ද්‍රවිඩ චිත්‍රපටවල එන උද්වේගකර සටන් ජවනිකාවක් සිහි ගන්වමින් හොරුන්ගේ බල බිඳින "මිස් ජෙනිස්" එවැනි සටනකට යොමු කළේ ඇයි දැයි යන්න තරමක විමතියකි. එයින් අපට ලියොන්ගේ චරිතය පිළිබඳ ඇති වන්නේ බරපතළ විමතියකි.

ඒ සටන දෙස බලන විට එක් පැත්තකින් අපට පෙනී යන්නේ ඔහු ජූඩෝ වැනි සටන් කලාවක ප්‍රවීණයකු බවය. තවත් පැත්තකින් බලන විට දක්නට ලැබෙන්නේ අයුක්තිය අසාධාරණය ඉදිරියේ උන්හිටි තැන් පවා අමතක වෙන චරිතයක් විය යුතු බවය. නමුත් ඔහු එවැන්නෙකු නොව, තමා කෙරෙහි අසීමිත විශ්වාසය තැබූ හාම්පුතාට වංචාකොට නින්දිත ලෙස සේවයෙන් පහ කළ අයෙකි. ඒ සියල්ලටම අමතරව සමාජය හා දරු පවුල හමුවේ තම වෙස් මාරුව දැඩිලෙස ආරක්ෂා කරගත යුතු තත්ත්වයක සිටින්නෙකි. මේ සටනින් ඔහු ජය ලැබුවද හිස දමා සිටි බොරු කොණ්ඩය හෝ සතුරා අතට පත් වූවානම් අපට ඊළඟ නිමේෂය තුළ ඔහුව දක්නට ලැබෙන්නේ මුහුණ පොත හරහා බව දනිමු.

මේ ආකාරයට බලන කල පෙනී යන්නේ "මිස් ජෙනිස්"ට තමන්ගේ වෙස් මාරුව රැක ගැනීමේ බරපතළ උවමනාවක් කිසිසේත් ම නොමැති බවය. බංගලාවේ ගෘහ සේවකයා සමඟ මත්පැන් පානයේ යෙදෙමින් බේබි හාමු විවාහය ලියා පදිංචි කළ බව හෙළි කිරීම ඊට නිදසුනකි.

මෙනයින් මෙකී චරිතය අනන්‍යතාවක් නොමැති භූමිකාවක් බවට පත් කරවන අතර, එකී අන්තර්ගතයේ ගෞරවය හීන වන ආකාරයේ රංගන අවස්ථාවන්ද ඉස්මතු කර තිබේ.

වලව්වේ තරුණිය හමුවීමට පැමිණෙන්නේ තමාගේ පුතා යැයි දැන ගත්විට විකාර රූපී ඉරියව්වකින් ඉවතට දිවයාම, ළමා තැනියගෙන් බේරෙන්නට විකට නළුවකු මෙන් ඒ මේ අත දිවයාම වැනි අවස්ථා මේ කාරණයට නිදසුන් ය. පෙර සඳහන් කළ ආකාරයට මෙය හාස්‍යෝත්පාදක චිත්‍රපටයක් ලෙස ඉදිරිපත් කිරීමට තිබූ වුවමනාව නිවැරදිව ඉටු නොකර ගැනීම "මිස් ජෙනිස්" ප්‍රේක්ෂක විශ්වසනීයත්වයෙන් ගිලිහී ගිය චරිතයක් බවට පත්වීමට හේතු වී තිබේ.එමෙන්ම ගැහැනුන් ගණනාවක් ඇසුරු කර ඇති ප්‍රකෝටිපතියා "මිස් ජෙනිස්" ට පිස්සු වැටීම තුළ සිදුවන්නේ ඒ චරිතයද යම් මන්ද බුද්ධික ස්වභාවයකට පත්වීම යැයි සිතේ.

චැප්ලින්ගේ චිත්‍රපට නරඹා ශාලාව තුළ බඩ අල්ලාගෙන සිනාසුණ ප්‍රේක්ෂකයන් ඉන් පිටතට පැමිණ හඬා වැලපුණේ යයි කතාවක් තිබේ. එසේ වූයේ චැප්ලින්ගේ චිත්‍රපට නරඹා තමන් සිනාසුණේ ඒතුළින් ප්‍රති නිර්මාණය වූ මනුෂ්‍යාත්මභාවයේ බේදජනක ඉරණමට නොවේදැයි ඔවුනට සිහිපත් වූ හෙයිනි. සුසිරින්ද සිල්වාගේ "මිස් ජෙනිස්" කතා පුවත තුළ අන්තර්ගතව ඇත්තේ ද මිනිසකු මුහුණ දෙන එක් බේදනීය ඉරණමක් පිළිබඳ කතාවකි. මෙම ඉරණමට මුහුණ දී එය ජයගැනීමට ලියොන් නැමැත්තා දරන උත්සාහයේ ඇති සියුම් ස්වභාවය වෙනුවට සිදුව ඇත්තේ සුපුරුදු බයිස්කෝප් ආකෘතියට මෙම ජීවිත ගැටලුව ලඝු කිරීමය. ජීවන ගැටලු වලට මුහුණ දීමේ දී ඇතිවන හාස්‍යය අප වෙත ජනිත කරවනු වෙනුවට එම ගැටලුව හාස්‍යයට ලක්වන අයුරු මෙතුළින් දකින්නේ එහෙයිනි.

"සොරි! මිස් ජෙනිස්"

වෂී 2020ක් වූ ඔක්තෝබර් මස 04 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

Tel: 2429351
Mobile: 071 7829018
Email:
Silumina.advt@lakehouse.lk

අධ්‍යාපන
Education

ලෝක සංචාරක දිනයට MSU සිසුන්ගේ Floating Market ව්‍යාපෘතිය එළි දකී

කිසිවකුගේ අවධානයට ලක් නොවී මතකයෙන් ගිලිහී යමින් පවතින, පිටකොටුවේ Floating Market,දිය මත අලෙවිසල, සංචාරක ආකර්ෂණයට නතු කරගත හැකි වටිනා අංගයක් බවත්, එය සංවර්ධනය කිරීම හරහා කොරෝනා වසංගතය හේතුවෙන් කඩා වැටී ඇති සංචාරක ව්‍යාපාරය යළි නැංවීමට ආකර්ෂණීය අංගයක් ලෙස යොදා ගත හැකි බවත් පෙන්වා දෙමින්, මෙවර ජාත්‍යන්තර සංචාරක දිනයට සමගාමීව MSU හෙවත්, Management and Science University සිසුන් විසින් රජයට ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කිරීමට සූදානම් වේ.

මේ පිළිබඳ පැවැත් වූ මාධ්‍ය හමුවේ දී MSU අධ්‍යක්ෂ ඩී.එස්. ජීරිස් මහතා, මෙසේ පැවසීය.

" මේ වසරේ ජාත්‍යන්තර සංචාරක දිනය වෙනුවෙන් අපගේ අවධානය ලක් වූයේ, නොසලකා හැර තිබෙන තත්ත්වයකට පත්ව ඇති කොළඹ පිටකොටුවේ floating market, දිය මත අලෙවිසලයි. අපගේ දේශකයන් සහ සිසුන් කිහිපවරක්ම මෙහි ක්ෂේත්‍ර චාරිකාවල නියැළුණා. තොරතුරු රැස් කළා.

දිය මත අලෙවිසල් කියන්නේ, ලෝක සංචාරක ක්ෂේත්‍රයේ වැදගත් තැනක් දී තිබෙන අංගයක්. තායිලන්තයේ floating market එකටම යන සංචාරකයෝ මොනතරම් ඉන්නවද... ඒවා මොන තරම් හොඳින් නඩත්තු කරනවද... අපේ රටේ මේ තරම් වටිනා දෙයක් අද පාළුවට යමින් පවතින තැනක් බවට පත්වෙලා. අතීක, මොන තරම් වියදමක් දරල ද රජය මේ තැන නිර්මාණය කළේ. කුඩා අලෙවිසල් කිහිපයක් හැරෙන්නට, අද එහි සාරවත් වෙළෙඳාමක් නැහැ. රාත්‍රියට මෙය ඉතා කළුවර තැනක්. නමුත් මේ ෆ්ලෝටින් මාර්කට් එක සංචාරක ආකර්ෂණය දිනා ගත හැකි තැනක් බවට පත් කරන්න පුළුවන්. ඒ හා සමගාමීව කුඩා ව්‍යවසායකයින් විශාල පිරිසක් බිහිවනවා. ත්‍රී රෝද රියැදුරන් යොදාගෙන හොඳ ප්‍රවාහන පද්ධතියක් සකස් කරන්නත් පුළුවන්. මොකද, කොළඹ නගරයේ තරු පහේ හෝටල් ගණනාවම තිබෙන්නේ, පිටකොටුවේ මේ ෆ්ලෝටින් මාර්කට් එකට නුදුරින්. ඒ නිසා, පිටකොටුවේ බේරේ වැව ආශ්‍රිත මේ සුන්දර තැන සංචාරක ආකර්ෂණයට යොදා ගත හැකි බවට විචාරයක් නැහැ. මෙය රජයට ආදායමක් එන තැනක් බවට පත් කරන්නත් පුළුවන්.

මේ පිළිබඳ අපගේ සිසුන් එහි වෙළෙඳුන්, ආශ්‍රිතයන් සහ ත්‍රීවීල් රියදුරන් වැනි විවිධ පාර්ශ්වයන් මුණගැසී තොරතුරු රැස් කළා.එසේ කළේ, සංචාරක සහ ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වත් පිරිසකගෙන් මඟපෙන්වීම යටතේයි.

මහාචාර්ය ඩී.ඒ.සී. සිල්වා, ආචාර්ය පියව් විජේවර්ධන, මැක්සිම් වික්‍රමසිංහ, රුවන් රත්නායක, ආචාර්ය රොහාන්ත අතුකෝරළ සහ සුරංග තෙන්නකෝන් යන එම විද්වත් මණ්ඩලයේ මඟපෙන්වීමෙන් සකස් කළ එම ව්‍යාපෘති වාර්තාව, නුදුරේදී රජයේ අදාළ අංශ වෙත ඉදිරිපත් කිරීමට සූදානම්. අපගේ උසස් අධ්‍යාපන ආයතනයේ, Hospitality and Tourism Management සහ Event Management... හදාරන සිසුන් මේ පර්යේෂණාත්මක ව්‍යාපෘතිය සකස් කිරීම සඳහා විශාල කැපකිරීමක් කළ බවත් කිව යුතුයි. සිසු පිරිසක් හැටියට, ජාතික අවශ්‍යතාවකට උර දෙන කාර්යයකට අතගැසීම අප ආයතනයට ද විශාල ආඩම්බරයක්...."

ලොව තරුණ විශ්වවිද්‍යාල 150 අතරේ, 51 වැනි ස්ථානයේ හිඳින Management and Science University හෙවත් MSU, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමක් වන,QS Doller Rank හි 544 වැනි ස්ථානය හිමි කර ගත් විශ්වවිද්‍යාලය ලෙස ද පිළිගැනේ.

එමෙන්ම, ලොව වටා රටවල් 15කදී මධ්‍යස්ථාන 15ක් ලෙස ක්‍රියාත්මක, මැලේසියාව මවු රට කර ගත් MSU, ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය, ඩිප්ලෝමා පාඨමාලාවල සිට phd උපාධි දක්වා පාඨමාලා 126ක් පවත්වනු ලබයි.

MSU ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලාංකේය ශාඛාව, MSI හෙවත්, Management and Science Institute නමින්, කොල්ලුපිටිය ගාලු පාරේ අංක 300 දරන ස්ථානයේ පිහිටා තිබේ.

ඉනෝකා පෙරේරා බණ්ඩාර
ඡායාරූප- රොෂාන් පිටිපන

ඩිල්මා එළි දැක්වූ 'ශ්‍රී ලංකාවේ සුලභ වන තුරු' පාසල් පුස්තකාල වෙත

MJF **සෙන්ටර්,නාගරික වන රොද තුළදී, 'ශ්‍රී ලංකාවේ සුලභ වන තුරු' කෘතිය මෙරිල් ජේ. ෆර්නැන්ඩු මහතා, නියෝජිතවරිය වෙත පිළිගන්වමින්.**

ඩිල්මා සමාගම විසින් එළි දක්වන්නට යෙදුණු, මහාචාර්ය සුධීරා එම්. ඩබ්ලිව්. රන්වල, මැග්ඩන් ජයසූරිය සහ නදීෂා දිල්රුක්ෂි යන කතු වරු ත්‍රිත්වය විසින් රචිත, ' ශ්‍රී ලංකාවේ සුලභ වන තුරු ' කෘතිය පසුගිය පොහෝ දා, මොරටුව කටුබැද්දේ පිහිටි MJF සෙන්ටර් හිදී, ඩිල්මා සභාපති මෙරිල් ජේ.ෆර්නැන්ඩු මහතා සහ ප්‍රධාන විධායක නිලධාරී ඩිල්හාන් ෆර්නැන්ඩු යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාරදෙන ලදී.

එමෙන්ම, ශ්‍රී ලංකාවේ සමනලයින් පිළිබඳ ලියැවුණු Common BUTTERFLIES of Sri Lanka.., ශ්‍රී ලාංකේය වවුලන් පිළිබඳ ලියැවුණු ඒ Field Guide to the BATS of Sri Lanka..., ශ්‍රී ලාංකේය සර්ප විශේෂ පිළිබඳ ලියැවුණු Recognising Deadly Venomous Snakes from Harmless Snakes of Sri Lanka.., ලයිකන විශේෂ පිළිබඳ ලියැවුණු Fascinating LICHENS of Sri Lanka... , ශ්‍රී ලාංකේය බත්කුරන් පිළිබඳ ලියැවුණු A Field Guide to the Dragonflies and Damselflies of Sri Lanka... , ශ්‍රී ලංකාවේ මකුළු විශේෂ පිළිබඳ ලියැවුණු An introduction to common Spiders of Sri Lanka..., උඩවලව ජාතික වනෝද්‍යානය පිළිබඳ ලියැවුණු A Pictorial Guide to Uda Walawe National Park... , ශ්‍රී ලංකාවේ වැදි පරපුර පිළිබඳ ලියැවුණු Indigenous Communities in Sri Lanka The Veddahs...සහ ශ්‍රී ලාංකේය අහිකුණ්ඨක ජන සමාජය පිළිබඳ ලියැවුණු Traditional Communities in Sri Lanka The Ahikuntaka...යන පර්යේෂණාත්මක ඉංග්‍රීසි කෘතීන්ට අමතරව, හෙළ බත අසිරිය..., හෙළ වෙද අත්පොත... යන ග්‍රන්ථ ගණනාවක් ද ඩිල්මා සමාගම විසින් මෙතෙක් එළිදක්වා ඇති අතර,එම සියලුම පොත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ජංගම පුස්තකාල ව්‍යාපෘතිය යටතේ පාසල් පන්සියයක් වෙත සහ ජාතික පුස්තකාලය වෙත පරිත්‍යාග කිරීම මෙහිදී සිදු විය.

මෙම අවස්ථාවට, කෘතියේ කතුවරු, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වූ, ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තොරතුරු නිලධාරිනී, ශාමේන් උදේනි විජේතිලක මහත්මිය, ඩිල්මා සභාපති, මෙරිල් ජේ. ප්‍රනාන්දු සහ අධ්‍යක්ෂ ඩිල්හාන් ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන් සහභාගී වූහ.

මෙහිදී අදහස් දැක්වූ, ඩිල්හාන් ප්‍රනාන්දු මහත්මා,

" අපේ ව්‍යාපාරය තේ. එය සොබා දහම හා බැඳුණු අපූරු නිර්මාණයක්. ඉතින්, අපි ව්‍යාපාරයක් කළත්, සොබාදහම සමඟ තිබෙන බැඳීම කිසිදාක අඩු වන්නේ නැහැ.

මිනිසුන් ප්‍රබෝධමත් කරන තේ කෝප්පයක් හදන තේ දල්ල, සොබාදහම අපට දෙන විස්මිත නිර්මාණයක්. ඒ හරහා දැවැන්ත ව්‍යාපාරයක් අප ගොඩ නඟා තිබෙනවා. ඉතින්, නැවත අපි සොබා දහම වෙත දිය යුත්තේ මොනවාද... ව්‍යාපාරයකින් ගොඩනැගෙන්න ඕනෙ, ජාතික වටිනාකමක්.ඒ වගේම, සමාජ වටිනාකමක්. එය පරිසරයට ආපසු දෙන දෙයක් ද විය යුතුයි.

කටුබැද්දේ අප නිර්මාණය කර තිබෙන මේ නාගරික කැලෑව වගේම, සොබාදහම පිළිබඳ ලියැවෙන මේ සෑම පොතක් ම අප යළි, ඒ පරිසරයට දෙන කෘතවේදීත්වයයි. මෙය අප හැකි උපරිමයෙන්, තව දුරටත් ඉටුකරන ජාතික වගකීමක්..."යැයි පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ අධ්‍යාපන අමාත්‍යංශයේ නියෝජිතවරිය,

" කැඩුණු බස් රථ, පාසල් පුස්තකාල බවට පරිවර්තනය කිරීමේ ජාතික අධ්‍යාපනික ව්‍යාපෘතිය යටතේ, මේ රටේ ඈත පළාත්වල පාසල් පුස්තකාල සඳහා පොත් ලබා දීමේ ව්‍යාපෘතියට, ඩිල්මා සමාගමෙන් ලැබෙන මේ පොත් එකතුවත් විශාල හයියක්. සොබා දහම හා බැඳුණු මේ පොත් සියල්ල, දරුවන්ගේ ජීවිතවලට සාධනීය බලපෑමක් එක් කරන බව මගේ විශ්වාසයයි..."ඇය පැවසුවාය.

මොරටුව කටුබැද්දේ පිහිටි MJF මධ්‍යස්ථානය, මිනිසුන්ගේ ජීවිතවල ධනාත්මක වෙනසක් ඇති කිරීම සඳහා ආයෝජනය කර ඇති ඩිල්මා සමාගමේ විශාලතම හා වඩාත් ප්‍රබලම මධ්‍යස්ථානය වේ.

යුගයක වඩාත් ප්‍රචලිත දේශීය කර්මාන්තශාලාවක් වූ වෙලෝනා ඇඟලුම් කම්හල් භූමියේ, 2010 වසරේ දී පිහිටුවන ලද මෙම මධ්‍යස්ථානය වචනාර්ථයෙන් හා සංකේතාත්මකව නාගරික ක්ෂේම භූමියකි.

එනම්, ස්වදේශික ගස් 350 ක් රෝපණය කොට, දැඩි කලබලකාරී පරිසරයක් සහිත ගාලුපාර අද්දර කෘත්‍රිමව නිර්මාණය කරන ලද කුඩා වනාන්තරයකි.

තවත් ලෙසකින් කිව හොත්, ශ්‍රී ලංකාවේ, ' නිර්මාණය කරන ලද ' පළමු නාගරික වනාන්තරයයි. එය තවත් අතකින්, කුතූහලයෙන් පිරි ජීව විද්‍යාගාරයක් නිර්මාණය කර තිබේ.

අලුත්වැඩියා කරන ලද නවෝත්පාදන හා සැලසුම් කේන්ද්‍රයත්, කඩදාසි ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා නව තාක්ෂණයත් මොරටුව විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක වේ.

එසේම, සිය වස් ගණනාවක් පුරා ශ්‍රී ලංකාවේ භාවිත කරන ලද ගොවි සහ ගෘහ උපකරණ ඇතුළත් මෙහි ඇති මැටි නිවහන, ඉපැරැණි කෘෂිකාර්මික උරුමය සහ සාම්ප්‍රදායික ගොවි සංස්කෘතිය කියා පායි.

මොරටුව අවට ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ වුවත්, මේ වන විට එම කාර්යය ව්‍යාප්ත වී ආබාධිත සහ විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලන, චිකිත්සාව, උපදේශනය සහ පාසල් අධ්‍යාපනය ඇතුළත් පරිපූර්ණ මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාත්මක වේ.

ඒ අනුව, ඩවුන් සින්ඩ්‍රෝමය, මස්තිෂ්ක ආඝාතය, වෙනත් ස්නායු හා ඉගෙනුම් ආබාධ සහිත දරුවන් වෙනුවෙන් මෙහිදී බොහෝ සද්කාර්යයන් ක්‍රියාත්මක වේ.

එමෙන්ම, ඔවුන්ගේ ආබාධිත භාවයේ බරපතළකම හේතුවෙන් වෙනත් සමාන පාසල් විසින් පිළිගනු නොලබන දරුවන් සඳහා ද මේ භූමිය තෝතැන්නක් සපයයි. මීට අමතරව, කාන්තා සංවර්ධන වැඩසටහන්...ආහාර පිසීම, මැහුම් හා පෝෂණය පිළිබඳ කුසලතා වැඩි කිරීමට පමණක් නොව, මෙහි ඇති, වෘත්තීය පුහුණු... වඩු වැඩ... එම්.එස්. ඔෆිස් සහ ග්‍රැෆික් ඩිසයිනින් පාඨමාලා, සූප ශාස්ත්‍ර හා ආගන්තුක සත්කාර පාසල , ඉතා උසස් ආකාරයේ අධ්‍යාපනික ආයතනයක් ලෙස ද ක්‍රියාත්මක වේ.

ඉහත කරුණුවලට අමතරව, සාම මධ්‍යස්ථානයක් ලෙසද ක්‍රියාත්මක MJF සෙන්ටර්, තනි හෝ කණ්ඩායම් උපදේශනය ඔස්සේද දැවැන්ත සමාජ මෙහෙවරක යෙදී සිටියි.

ඉනෝකා පෙරේරා බණ්ඩාර

ප්‍රාථමික සහ ද්විතීය ශ්‍රේණිවල සිසුන් සඳහා ඉංග්‍රීසි
(1-12 ශ්‍රේණි)
ඉංග්‍රීසි කථාව, උච්චාරණය සහ ව්‍යාකරණය
2020/2021
IEM
AD ASTRA PER ARDUA
- ඉඩකඩ සීමිත බැවින් සිසුන් තෝරාගනුයේ තරග විභාගයකින් පමණි.
- මේ සඳහා ඉල්ලුම්පත්‍ර ඔක්තොම්බර් 1 වෙනිදා සිට 30 දක්වා නිකුත් කෙරේ.
- සියළු ඉල්ලුම්පත්‍ර කාර්යාලීය වේලාවන් හිදී පැමිණ ලබාගත යුතුය.
- සෑම පංති කාමරයකටම ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම් සපයා ඇත.
- ඉංග්‍රීසි පොත් පත් කියවීම දිරිගැන්වීම සඳහා අංග සම්පූර්ණ පුස්තකාලයක් ආයතනය තුළ පවත්වාගෙන යනු ලැබේ.
- ප්‍රාථමික අංශයේ සම්ගන්ධීකරණ කටයුතු හා අධීක්ෂණ කටයුතු සඳහා ඉහල සුදුසුකම්ලත් ගුරුවරියන් ඇතුළු අංශාධිපතිනියක් කටයුතු කරනු ලැබේ.
- අප ආයතනය අවුරුදු 44 කට වැඩි කාලයක් ඉතා සංවිධානාත්මකව ප්‍රාථමික සහ ද්විතික ඉංග්‍රීසි පාඨමාලා සුදුසුකම් ලත් පළපුරුදු ගුරු මණ්ඩලයක් මගින් පවත්වාගෙන යන කීර්තිමත් ආයතනයකි.

ඉංග්‍රීසි සාහිත්‍ය 7 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා
- අ. පො. සා. සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සාහිත්‍යය විෂය නිර්දේශය පදනම්ව සැකසුනු පාඨමාලාවකි.
- ඉල්ලුම් පත්‍ර කාර්යාලීය වේලාවන් වලදී දැන් ලබාගත හැක.
- පංතිය ආරම්භ වනුයේ දෙසැම්බර් මස මුල් සතියේදීය.
- ඉංග්‍රීසි සාහිත්‍යය පාඨමාලා මෙහෙයවනු ලබන්නේ ඉංග්‍රීසි විෂය උගන්වා දීර්ඝ පළපුරුද්දක් ඇති ඉංග්‍රීසි ගෞරව උපාධිධාරීන් විසිනි.
- අප ඉතා උසස් තත්වයේ පාඨමාලා ලබාදෙන අතර අතිවිශිෂ්ඨ සේවයක්ද පිරිනමනු ලැබේ.

සථානය සහ විමසීම්.
Director of Studies
INSTITUTE OF ENGLISH, MAHARAGAMA
2/81, High Level Road, Maharagama. Tel:0112840172
(Behind Sampath Bank)

Atlas Skills Factory සතුටින් ඉගෙන ගන්නා ආකාරය කියා දෙයි

ශ්‍රී ලංකාවේ ලිපිද්‍රව්‍ය අලෙවිකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වන ඇට්ලස් ඇක්සිලියා සමාගම, කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය පැවැත්වෙන බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ Atlas Skills Factory අත්දැකීම් කුටිය හරහා දරුවන්ට සතුටින් ඉගෙනීමේ නිරතවිය හැකි ආකාරය ප්‍රායෝගික ප්‍රවේශයකින් යුතුව පෙන්වා දීමට කටයුතු කළේය. අත්දැකීම් ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් දරුවන්ගේ පරිකල්පනය දියුණුවන ආකාරයේ ඉගෙනුම් ක්‍රම පිළිබඳ අපූර්ව මගපෙන්වීමක් වූ මෙම කුටිය දරුවන්ගේත්, දෙමවුපියන්ගේත් නොමඳ ආකර්ෂණය දිනා ගත්තේය.

සතුටින් ඉගෙනීමෙහි යෙදීම සඳහා දරුවන් යොමු කිරීමේ අරමුණ පෙරදැරිව කටයුතු කරන ඇට්ලස් සමාගම මෙම Atlas Skills Factory කුටිය හරහා දරුවන් සමග පවතින සිය සවිමත් සබඳතාව තවදුරටත් වර්ධනය කර ගැනීමට කටයුතු කළේය. දරුවන්ගේ නිර්මාණශීලී හැකියා වර්ධනය වන චිත්‍ර හා අත්කම් නිර්මාණ, විස්මිත විශ්වය, ගෙදරට වැඩක්-රටට වැඩකී, රූකඩ වැඩසටහන, දෙමවුපියන්ගේ රූව සිතුවමට නගන 'Face to Face' සහ මෝටර් ආශ්‍රයෙන් විවිධ නිර්මාණ සිදුකිරීම ඇතුළු අපූර්ව ක්‍රියාකාරකම් රැසක් මෙහිදී ඇට්ලස් සමාගම සංවිධාන කර තිබිණි. මේ එහි සුවිශේෂී අවස්ථා

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය
ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව
ශිෂ්‍ය ප්‍රවේශය 2020 / 2021

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, දියගම හෝමාගම පිහිටි මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය තුළ පැවැත්වෙනු ඇත.

01. යෝග්‍යතාවය :

(අ) අධ්‍යාපන සුදුසුකම් :

අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2017 හෝ 2018 හෝ 2019 වර්ෂවලදී පවත්වනු ලැබූ අ.පො.ස. (උ.පෙළ) විභාගයකදී පහත සඳහන් විෂයයන්ගෙන් 03 ක් එකවර සමත්ව සිටිය යුතුය.

1. **භෞතික විද්‍යාව**
2. **රසායන විද්‍යාව**
3. **සංයුක්ත ගණිතය**
4. **උසස් ගණිතය**

වයස :

2019.12.31 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 නොඉක්ම විය යුතුය.

02. අයදුම්පත් පෝරම හා විස්තර :

ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

ආදර්ශ අයදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබාගත හැක.

http://www.itum.mrt.ac.lk

03. වැඩි විස්තර :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2020.10.09 දිනැති අංක 2197 දරන ගැසට් පත්‍රයෙන් හෝ මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ ඉහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

04. අයදුම්පත් බාරගන්නා අවසාන දිනය 13.11.2020 දින වේ.

නියෝජ්‍ය ලේඛකාධිකාරී,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය,
දියගම, හෝමාගම.
2020.10.04

ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික සඟරාවක් යුනියන් ඇෂුවරන්ස් අගයයි

යුනියන් ඇෂුවරන්ස් සමාගම පසුගියදා මෙරට ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික සඟරාවක් වන Echelon හි විශේෂ ඇගැයීමකට ලක්විය. COVID-19 අභියෝගයට සාර්ථක ලෙස මුහුණදීම සඳහා ගත් පියවර මෙන්ම, තම ගනුදෙනුකරුවන්ට වඩාත් සමීප වීම සඳහා ජීවිත රක්ෂණ සේවාවන් පෙරළිකාරී ලෙස ඩිජිටල්කරණය කිරීම වෙනුවෙන් මෙම ඇගැයීම පිරිනමා තිබේ.

සිය 30 වසරක මෙහෙයුම් කාලය පුරාවටම රක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික ප්‍රගමනය සම්බන්ධයෙන් පෙරමුණේ සිටීමට යුනියන් ඇෂුවරන්ස් සමාගමට හැකියාව ලැබිණි. සියයට සියයක්ම ඩිජිටල් ක්‍රමයට වඩාත් ඉක්මනින්, කඩදාසි භාවිතයකින් තොර ක්‍රියාවලියක් ඔස්සේ රක්ෂණ නිකුත් කිරීම ආරම්භ කළ මෙරට ප්‍රථම ජීවිත රක්ෂණ සමාගම වූ යුනියන් ඇෂුවරන්ස්, සෘජු පිරිසැකසුම් ක්‍රියාවලියක් හඳුන්වා දීම, ඩිජිටල් ක්‍රමයට හිමිකම් මුදල් ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ හැකියාව ලබාදීම සහ ඩිජිටල් සේවා හැකියාවන් පුළුල් කිරීම ආදිය සම්බන්ධයෙන්ද ඉදිරියෙන්ම සිටී.

එමෙන්ම කලාපයේ ප්‍රථම වරට, මෑතකදී තවදුරටත් වැඩිදියුණු කරන ලද ක්ලවුඩ් තාක්ෂණය පදනම් කරගත් 4G (4th generation) රක්ෂණ පදනමක් භාවිත කිරීම ආරම්භ කිරීමට ද යුනියන් ඇෂුවරන්ස් සමාගම කටයුතු කළේ ය. එම පියවර වෙනුවෙන්, මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර පර්යේෂණ හා උපදේශන ආයතනයක් වන Celent (Oliver Wyman සමාගමේ කොටසකි) විසින් ඇමෙරිකාවේ නිව් 'යෝර්ක් නගරයේ පැවති උත්සවයකදී යුනියන් ඇෂුවරන්ස් වෙත Model Insurance' ඇගයීම පිරිනැමීමටද කටයුතු කළ අතර එය ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රයට නව ආදර්ශයක් හඳුන්වා දීමක් විය.

පසුගිය කාලය තුළ නවීන ඩිජිටල් ක්‍රමවේදයන් භාවිතා කරමින් නව ගනුදෙනුකරුවන් සම්බන්ධ කරගැනීමටත්, ඔවුන්ට සේවාවන් සැලසීමටත් අවශ්‍ය පුහුණුව සිය රක්ෂණ නියෝජිතයන්ට මාර්ගගත ආකාරයට ලබාදීම ආරම්භ කිරීමට යුනියන් ඇෂුවරන්ස් සමාගම කටයුතු කළේ ය. ඇඳිරි නීතිය පැවති කාලයේදී අන්තර්ජාලය ඔස්සේ බඳවාගැනීම් වැඩසටහනක් ක්‍රියාවට නංවන ලද අතර, එය එලෙස බඳවා ගන්නා ලද පුද්ගලයන්ට නව ජීවනෝපාය මාර්ගයක් ඔස්සේ සිය ආදායම් වැඩිකර ගැනීමට ලැබුණු මහඟු අවස්ථාවක් විය. ඇඳිරි නීතිය පැනවූ දිනයට පසු දිනම තම කාර්ය මණ්ඩලයට නිවෙස්වල සිටම රාජකාරී කිරීමේ පහසුකම් සලසා දීමට සමාගම පියවර ගත්තේ තම ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සේවාවන් සැලසීමේ අරමුණිනි.

මීට සමගාමීව පැය 24 පුරා ක්‍රියාත්මක තෛයිභාෂික ඇමතුම් මධ්‍යස්ථානයත්, හිමිකම් මුදල් ඉල්ලීම් සම්බන්ධ ලියකියවිලි සහ වෙනත් සේවාවන්ට අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීම සඳහා හඳුන්වා දෙන ලද නිර්මාණශීලී ඩිජිටල් සේවාවක් වන වැට්බොට් ක්‍රමවේදයත් අඛණ්ඩව ක්‍රියාත්මක විය. කාර්ය මණ්ඩලයට එකිනෙකට වෙනස් වෘත්තීය තල තුළ ක්‍රියාත්මක වෙමින් තම අත්දැකීම් පුළුල් කරගැනීමේ අවස්ථාව ලබා දීම, පසුගිය අභියෝගකාරී සමය තුළ තරමක් දුෂ්කර වූ බැවින් STEP (Strive Towards Excellence Programme) වැඩසටහන ක්‍රියාවට නැංවීමට කටයුතු යොදන ලදී.

COVID-19 වසංගතයෙන් ශ්‍රී ලංකාව රැකගන්නට Rainco 'යකා' ඉදිරියට එයි

COVID-19 ගෝලීය වසංගතය සමග අප වෙතට පැමිණි මුඛ ආවරණ (මාස්ක්) පැලඳිම, මීටරයක දුරින් සිටිමින් සමාජ දුරස්ථභාවය ආරක්ෂා කිරීම හා නිතරම නිවැරැදිව අත් සේදීම යන අලුත් සෞඛ්‍යාරක්ෂණ පුරුදු අත්නොහැර - මග නොහැර පවත්වාගෙන යාමේ වැදගත්කම අවධාරණය කෙරෙන මෙම ප්‍රචාරණ වැඩපිළිවෙළ "වෙනස් වෙන්න තමන්ගෙන්ම පටන්ගන්න" (Be the Change – It Stars with You) තේමාව යටතේ ක්‍රියාත්මක කෙරේ.

Rainco පුද්ගලික සමාගම විසින් COVID-19 ට එරෙහි "යකා" සංකල්පය එළිදැක්වීම පිළිබඳ පැහැදිලි කරමින් Rainco පුද්ගලික සමාගමේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි අහමඩ් අරුස් මහතා, "වර්ෂ 4500 කටත් එහා ගිය ප්‍රෞඪ ඉතිහාසයක් තිබෙන යක්ෂ ගෝත්‍රයට උරුමකම් කියන ශ්‍රී ලාංකිකයන් නොබියව ඕනෑම අභියෝගයකට මුහුණ දීමට හුරු පුරුදු වෙලා ඉන්නවා. කඩිසරව වැඩ කරන කෙනෙක්ව, ශක්තිමත්ව ධෛර්ය සම්පන්නව නොබියව වැඩකරන කෙනෙක්ව යකෙක් / යකා විදිහට හඳුන්වන්න අපේ ජන සමාජය කාලාන්තරයක සිට පුරුදුවෙලා ඉන්නවා. කොරෝනා වසංගතේ එක්ක අලුතින් ලෝකයට එක්වුණු චාරිත්‍ර වාරිත්‍ර එක්ක නොබියව වගකීමක් සහිතව නැගී සිටිමින් සමාජ වගකීම නිසි ලෙස ඉටු කරන යක්කු / යක්ඛයන් වෙමු කියන යෝජනාවයි අපි මේ ප්‍රචාරණ වැඩපිළිවෙළේදී ජනතාව අතර ඇතිකරන්න උත්සාහ ගන්නේ. කොරෝනා නිසා සම්පූර්ණයෙන් වසා දැමූ රටවල් අපේ ඇස් ඉදිරියේ තියෙනවා. ඒ රටවල ඇතිවෙලා තිබෙන සාමාජීය ගැටලු ඉතා හොඳින් පෙනෙන්නට තියෙනවා. ලංකාවේ අපිටත් නිරෝධායන ඇඳිරි නීතියේ අම්හිරි අත්දැකීම් තියෙනවා. මේ සියල්ල සලකා බලද්දී අපිට රට වසා දමා අපේ ජීවිත පවත්වාගෙන යන්න බෑ. අපිට කළ හැකි හොඳම දේ තනි තනිවම කොරෝනාවට එරෙහි සමාජ වගකීම් ඉටු කිරීමයි. ඒ ගැන නිර්මාණාත්මකව සමාජයට කියන්නට අපට අවශ්‍ය වුණා. යක්කු සංකල්පය අපිට ඒ සඳහා හොඳ මාවතක් සකස් කර දුන්නා." යැයි පැවසීය.

FADNA සාර්ථකත්වය කැලිෆෝනියාවේ දී තවදුරටත් තහවුරු කරයි

සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨය විසින් FADNA නිෂ්පාදන තුනක් on Shape Up Tea, Ezy Tea සහ Immunni Tea මත පදනම්ව විද්‍යානුකූලව සිදු කරන ලද පුළුල් අධ්‍යයන පර්යේෂණයන් ඇමෙරිකා එක්සත් ජනපදයේ ක්‍රියාකාරී ආහාර පිළිබඳ 28 වැනි ජාත්‍යන්තර සමුළුවට යෝජනා කරන ලද අතර, එහිදී එම පර්යේ ෂණ වාර්තා ප්‍රකාශයට පත් කරන ලදී.

FADNA නිෂ්පාදන පාරිභෝගිකයින් සඳහා ක්‍රියාශීලි, ප්‍රීතිමත් හා සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් සඳහා සෞඛ්‍යාරක්ෂිත ස්වභාවික නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ අරමුණින් අඛණ්ඩ පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සිදු කරයි. මේ සඳහා ආහාර සහ සෞඛ්‍ය අධ්‍යයනයන්හි ප්‍රමුඛ පෙළ දේශීය විශ්වවිද්‍යාලයක් වන සබරගමුව විශ්වවිද්‍යාලය සමග ඇති කරගත් සහයෝගීතාව මගින් FADNA නිෂ්පාදනවල ක්‍රියාකාරිත්වය, ඵලදායීතාව සහ ගුණාත්මකභාවය සහතික කිරීම නිරන්තරයෙන් සිදුකරන ලබයි. "සෞඛ්‍ය සම්පන්න සහ ඉහළ ගුණාත්මක බවක් ඇති සන්තාමයක් ලෙස, අපගේ පාරිභෝගිකයින් තමන් පරිභෝජනය කරන ඖෂධීය පානයන් මොනවද? සහ ඒවා ඔවුන්ගේ ජීවිතවලට ප්‍රයෝජනවත් වන්නේ කෙසේද යන්න දැන ගැනීම ඉතා වැදගත් බව ෆැඩ්නා තේරුම්ගෙන සිටිනවා. නිතිපතා පර්යේෂණ කිරීමට අපි අවධාරණය කරන්නේ මේ නිසයි. එය අප නිවැරැදි මාවතේ ගමන් කරනබව පෙන්නුම් කරන අතර, අපගේ නිෂ්පාදන තවදුරටත් දියුණු කිරීමට අපට මගපෙන්වනවා" යනුවෙන් ෆුඩ් ඇන්ඩ් නේවර් (පුද්) සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ චමේන්ද්‍ර සෝමතුංග මහතා පැහැදිලි කළේය.

ඔහු තවදුරටත් මෙසේද පැවසීය.

"සබරගමුව විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨය ආහාර හා සෞඛ්‍ය අධ්‍යයනයන්හි ප්‍රමුඛ පර්යේෂණ ආයතනයක් වන අතර, මේ ආකාරයේ බොහෝ අධ්‍යයනයන් සඳහා ඔවුන් FADNA සමග සහයෝගයෙන් කටයුතු කරනවා. ඔවුන්ගේ ශාස්ත්‍රීය දැනුම, අත්දැකීම් සහ ගුණාත්මක පර්යෂණ පහසුකම් නිසා ඔවුන් අප සතුව ඇති හොඳම හවුල්කරුවෙකු බවට පත් වී තිබෙනවා."

FADNA Shape Up Tea පිළිබඳව කරන ලද පර්යේෂණයෙන් හෙළි වූයේ ගාර්සෙනියා කාම්බෝජියා (Garcinia cambogia) සහ කැමෙලියා සයිනෙන්සිස් (Camellia sinensis) යන ප්‍රධාන අමුද්‍රව්‍ය දෙක හයිපොලිපිඩිමික් යාන්ත්‍රණයන් සහ බර අඩු කර ගැනීමේ විභවයන් සහිත ශාක දෙකක් බවයි. මෙම ශාක දෙකම ශතවර්ෂ ගණනාවක් තිස්සේ ආසියානු රටවල සූපශාස්ත්‍ර කටයුතු සඳහා කිසිදු හානිකර බලපෑමක් නොමැතිව ඉතා බහුල ලෙස භාවිත කර ඇත. එම ශාක දෙකේ සංයෝජනයක් ඇති නිෂ්පාදනයක විශාල බර අඩු කර ගැනීමේ විභවයන් ඇති අතර එය බර අඩු කර ගැනීමේ අතිරේකයක්ද විය හැකි බව පර්යේෂකයන් විසින් තවදුරටත් අවධාරණය කරයි. FADNA Shape Up Tea අඩංගු ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස, මෙය සාමාන්‍ය හරිත තේවලට (Green tea) වඩා වැඩි වටිනාකමක් එක් කරමින් නිෂ්පාදනයේ ඵලදායීතාව තහවුරු කරයි.

ඒ හා සමානව, FADNA Ezy Tea සහ Immunni Tea යන දෙවර්ගයේම ඖෂධ පැලැටි සියවස් ගණනක් පැරැණි ආයුර්වේද වෛද්‍ය විද්‍යාවෙන් සනාථ කර ඇති අතර, ඒවා සබරගමුව විශ්වවිද්‍යාලයේ විශේෂඥයින්ද ඉතා සමීපව අධ්‍යයනය කර ඇත.

දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් ලොතරැයිය DLB Sweep App සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන්

එදා මෙදාතුර ලොතරැයි ඉතිහාසයෙහි දැවැන්තම තාක්ෂණික පියවර තබමින් ඉදිරියට ආ සංවර්ධන ලොතරැයි මණ්ඩලය තම ප්‍රථම ඩිජිටල් ලොතරැයිය වන "සසිරි" ලොතරැයි පත වෙළෙඳපොළට නිකුත් කිරීම අද දින (2020.09.29) මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආර්. ආටිගල මහතාගේ ප්‍රධානත්වයෙන් මුදල් අමාත්‍යාංශ පරිශ්‍රයේදී සිදුකරන ලදී.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මේ වන විට හඳුන්වා දී ඇති DLB Sweep ඒනන හරහා අද සිට "සසිරි" ඩිජිටල් ලොතරැයි පත මිලදී ගැනීමට හැකියාව පවතින අතර ලග්න වාසනාව, සුපර් බෝල් සහ ශනිදා යන ලොතරැයිපත්ද එම ඒනන මගින් online ක්‍රමයට මිලදී ගැනීමේ හැකියාව පවතී.

"සසිරි" ලොතරැයිය දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් තාක්ෂණික ලොතරැයිපත වන අතර එය ඔන්ලයින් මාර්ගයෙන් මෙන්ම මුද්‍රිත ලොතරැයියක් වශයෙන්ද ලබා ගත හැකි දෙමුහුන් ලොතරැයිපතකි.

"සසිරි" ලොතරැයි පත වෙළෙඳපොළට නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණ පසුගිය කොරෝනා වසංගත සමයෙහි පිහිටු වූ කොවිඩ් අරමුදල සඳහා මූල්‍ය දායකත්වය සැපයීමයි . ඒ අනුව මෙම ලොතරැයිපත් අලෙවිය හරහා ලැබෙන්නා වූ ලාභයන් ජනාධිපති අරමුදලට බැර වෙන අතර ජනාධිපති අරමුදල හරහා එම මුදල් කොවිඩ් අරමුදල වෙත සම්ප්‍රේෂණය කිරීමට යෝජිතය. අද දින වෙළෙඳපොළට නිකුත් කරනු ලැබූ මෙම "සසිරි" ඩිජිටල් ලොතරැයි පතෙහි ප්‍රථම දිනුම් ඇදීම එළඹෙන ඔක්තෝබර් මස 14 වන දින සිදුකිරීමට නියමිත අතර එතැන් සිට සතියේ සෑම බදාදාවකම හා සෙනසුරාදා දිනයකම අදාළ දිනුම් ඇදීම් සිදුකරනු ලැබේ. එහිදී අංක තුනක් ගැළපීමෙන් ලක්ෂයේ දිනුම් අවස්ථා රැසක් සමගින් සෙසු ත්‍යාග රැසක්ද හිමි කර ගැනීමට පාරිභෝගිකයන්ට හැකියාව ඇත. "සසිරි" ඩිජිටල් ලොතරැයි පත හරහා දිනුම් හිමිකර ගත්තා ජයග්‍රාහකයින්ට අදාළ ත්‍යාග මුදල් එම ජයග්‍රාහකයින්ගේ බැංකු ගිණුමට බැරවන ලෙස පරිගණක තාක්ෂණයෙන් සකස් කර ඇත. මුද්‍රිත ටිකටපත් හරහා ජයග්‍රහණය කරනු ලබන ත්‍යාග මුදල් සුපුරුදු පරිදි බෙදාහැරීමේ අලෙවි නියෝජිත මහත්ම මහත්මීන්ගෙන් හෝ ප්‍රධාන කාර්යාලයට පැමිණ ලබාගත හැකිය. දැනට පවතින සාම්ප්‍රදායික ලොතරැයි දිනුම් ඇදීමේ ක්‍රමයන්ගෙන්ද ඉවත්ව නවතම ඩිජිටල් තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ මෙහි දිනුම් ඇදීම් සිදුකිරීමට කටයුතු සූදානම් කර ඇති බව සංවර්ධන ලොතරැයි මණ්ඩලය ප්‍රකාශ කරයි.

ලොතරැයි වෙළෙඳපොළෙහි පෙරළිකාර නැවුම් අත්දැකීමක් සමගින් ඔබ අතරට එන මෙම සසිරි ඩිජිටල් ලොතරැයිපත මිලදී ගැනීමට ඔබත් අදම www.dlb.lk/apps යන ලින්ක් භාවිත කර ඔබගේ ස්මාර්ට් ජංගම දුරකථනයට හෝ ටැබ් යන්ත්‍රයට DLB Sweep App යෙදවුම් භාගත කරගෙන ඩිජිටල්කරණය වූ වාසනාව උරුම කර ගන්නා ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලය සිය ලොතරැයි පත් මිලදී ගන්නා පාරිභෝගික මහත්ම මහත්මීන්ගෙන් ඉල්ලා සිටී.

BN බිස්නස් නියුස්

අරුවක්කාලු කැණීම් භූමියේ අනවසර පදිංචියට හා වනාන්තර විනාශයට එරෙහිව සියාම් සිටි සිමෙන්ති ක්ෂණික පියවර රැසක් ගනී

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් පුත්තලමේ පිහිටි (දිගුකාලීන වශයෙන් බදු දී ඇති) ඉඩමක් අනවසරයෙන් අල්ලා ගැනීම හා වනාන්තර හෙළිපෙහෙළි කිරීමට අදාළව ඉතා ඉක්මණින් පියවර ගැනීමට, වන සංරක්ෂණ අමාත්‍ය සී.බී. රත්නායක මහතා මුලසුන දැරූ විශේෂ රැස්වීමකදී ඊට සහභාගී වූ සියලු පාර්ශ්වකරුවෝ පසුගියදා එකඟවූහ.

පුත්තලමේ අරුවක්කාලු ප්‍රදේශයේ පිහිටි අක්කර 4,450ක වපසරියකින් යුත් මෙම භූමිය කල්බදු ක්‍රමයට ලබාගෙන ඇත්තේ සියාම් සිටි සිමෙන්ති සමාගම යි. මෙරට 100% දේශීය සිමෙන්ති නිෂ්පාදනයේ නියුතු එකම සමාගම වන සියාම් සිටි සිමෙන්ති සමාගම එම භූමිය ලබාගෙන ඇත්තේ, තම පුත්තලම සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය හුණු ගල් පාෂාණ සපයාගැනීමේ අරමුණෙනි.

ශ්‍රී ලංකාවේ පිහිටි එකම පූර්ණ ඒකාබද්ධිත සිමෙන්ති කර්මාන්තශාලාව වන්නේ ද මෙම පුත්තලම සිමෙන්ති කම්හල වීම කැපීපෙනේ. මෙසේ අරුවක්කාලු භූමියෙන් අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා සියාම් සිටි සිමෙන්ති සමාගමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය හා පළාත් පාරිසරික පනත හරහා මෙහෙයුම් බලපත්‍ර ද හිමිව තිබේ. හුණුගල් කැණීම් සිදුකරන අතරතුරදී ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව ද සියාම් සිටි සිමෙන්ති සමාගම අඛණ්ඩව සැලකිලිමත් වී ඇත. ඒ අනුව කැණීම් කටයුතු සිදුකළ ස්ථාන නැවත පිරවීම, බිම් සැකසීම හා අත්හැර දැමූ කැණීම් වළ වල් ආශ්‍රිතව නැවත වන වගාව ආදී කටයුතු සමාගම සිදුකරයි. ඒ අනුව වාර්ෂිකව ශාක 6,000කට වඩා කැණීම් භූමියේ රෝපණය කිරීමට ද පියවර ගෙන තිබේ.

කෙසේ වුවද මෙම භූමියේ නිශ්චිත සීමා මායිම් ලකුණු කර නොමැති හෙයින්, ගෙවුණු දශක දෙකක කාලය තුළ විවිධ අවස්ථාවන්හිදී අවට ගම්වාසීන් එම භූමිය අනවසරයෙන් අල්ලා ගෙන තිබේ. මේ පිළිබඳ අවස්ථා කිහිපයකදී ම අදාළ බලධාරීන්ගේ අවධානය යොමු කළ ද අනවසර පදිංචිය තවමත් නතර වී නොමැත. ආසන්නතම වනාන්තර හෙළිපෙහෙළි කිරීම සිදුව ඇත්තේ 2020 සැප්තැම්බර් මස මුලදීය.

ඒ අනුව, එම භූමියේ ගිතිකොණ දිගට වන්නට පිහිටි අක්කර 29ක භූමියක් මෙසේ නීතිවිරෝධී ලෙස විනාශ කර දමා තිබුණි. විශේෂයෙන්ම නිසියාකාර කැණීම් සැලසුමක් සහිතව තම මෙහෙයුම් සිදුකරන සියාම් සිටි සිමෙන්ති සමාගම,අදාළ බිම් කඩ භාවිතයට නොගනිමින්, වනාන්තර කොටසක් ලෙස අඛණ්ඩව සංරක්ෂණය කර තිබුණි. ඒ අනුව මෙම විනාශය පිළිබඳ විධිමත් විමර්ශනයක් පවත්වන ලෙස ඉල්ලා සමාගම,සැප්තැම්බර් 7 වැනිදා වනාතවිල්ලුව පොලිසිය වෙත පැමිණිල්ලක් ද ගොනු කර ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස සැප්තැම්බර් 14 වැනිදා වනාතවිල්ලුව පොලිස් ස්ථානයේ විශේෂ රැස්වීමක් පැවැත්වුණි. ඊට විෂය භාර අමාත්‍ය සී.බී. රත්නායක මහතා සහ වන සංරක්ෂණ හා වනජීවී අමාත්‍යංශ ලේකම්, ප්‍රාදේශීය ලේකම්, වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජෙනරාල්, වනජීවී අධ්‍යක්ෂ ජෙනරාල්, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්, පුත්තලම දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය පොලිස්පති, පුත්තලම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, වනාතවිල්ලුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති, ප්‍රාදේශීය සභා සභාපති, සිමෙන්ති සංස්ථාවේ සභාපති හා සියාම් සිටි සිමෙන්ති සමාගමේ සභාපති යන අය සහභාගී වූහ.

එහිදී අරුවක්කාලු ඉඩම් ආක්‍රමණය හා වනාන්තර විනාශය සම්බන්ධයෙන් ඉතා ඉක්මණින් පියවර ගැනීමට රැස්ව සිටි නිලධාරීහු එකඟ වූහ.

එම රැස්වීමෙන් අනතුරුව අමාත්‍ය සී.බී. රත්නායක මහතාගේ මාර්ගෝපදේශනය යටතේ, අනාගතයේදී මෙවැනි සිදුවීම් ඇතිවීම වළක්වා ගැනීමට අවැසි සියලු පියවර ගැනීමට සියාම් සිටි සිමෙන්ති සමාගම, එකඟවිය.

තව ද විනාශ කර ඇති වනාන්තර කොටස උපරිමයෙන් යථා තත්ත්වයට පත් කිරීමට ද එහිදී එකඟතාව පළකෙරිණි. ඒ අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි හෙළිපෙහෙළි කරන ලද වනාන්තර භූමිය යථා තත්ත්වයට පත්කිරීම සඳහා පියවර ගැනීමටත්, තැවන වන වගාව වෙනුවෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ශාක 19,000ක් මිලදී ගැනීමටත් සමාගම කටයුතු කර තිබේ. ත ව ද මේ හා බැඳුණු සියලු ක්‍රියාකාරකම් පිළිබඳ සියලු පාර්ශ්වකරුවන් විනිවිදභාවයකින් යුතුව දැනුවත් කිරීමටත් සියාම් සිටි සමාගම පටන් ගෙන ඇත.

සැප්තැම්බර් 15 වැනිදා සිට අදාළ භූමිය මැන සීමා මායිම් ලකුණු කිරීමටත් සමාගම කටයුතු යොදා තිබේ. ඊට අමතරව දිවා කාලයේදී ආරක්ෂක නිලධාරීන් යතුරු පැදි මගින් සීමා ආශ්‍රිතව නිරීක්ෂණ සංචාර සඳහා යෙදවීම හා ඩ්‍රෝන තාක්ෂණය යොදාගනිමින් වැඩිදුර නිරීක්ෂණ කටයුතු සිදුකිරීමත් සිදුවේ. භූමියට අනවසරයෙන් ඇතුළු වන්නන්ට අනතුරු ඇඟවීම් දක්වන දැන්වීම් පුවරු භූමිය වටා සවි කිරීමට ද යෝජනා වී ඇත.

පසුගිය දශක කිහිපය පුරාවට පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාව ඇසුරේ උසස් සිමෙන්ති නිෂ්පාදන මෙහෙයුම් පවත්වාගෙන ගිය සියාම් සිටි සිමෙන්ති සමාගම, අවට ප්‍රජාව සමඟ ඉතාමත් සහයෝගයෙන් කටයුතු කර තිබේ. විශේෂයෙන්ම රැකියා අවස්ථා ජනනය කිරීම, ප්‍රජාව සවිබල ගැන්වීම, ප්‍රජා සංවර්ධනය මෙන්ම සමාජ සත්කාර ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් සමාගම හරහා අවට ප්‍රජාවට හිමිවිය. වෙනත් අයුරකින් පැවසුවහොත්, සමාගමේ දියුණුව අතරතුර පුත්තලමේ දියුණුව ද ළඟා කරගැනීමට එම සහයෝගය හේතු විය. මේ අතර තම කැණීම් භූමි ආශ්‍රිත ජෛව විවිධත්ව කළමනාකරණය හා සංරක්ෂණය වෙනුවෙන් ද සියාම් සිටි සිමෙන්ති සමාගම දැවැන්ත කාර්යභාරයක් ඉටු කොට තිබේ. ශ්‍රී ලංකාවේ පරිසර පද්ධතිය ආරක්ෂා කරගැනීමේ වැදගත්කම පිළිබඳ සමාජ දැනුවත්භාවය වැඩි කරන අතරේ, තම කැණීම් භූමි සංරක්ෂණ ව්‍යාපෘති අඛණ්ඩව ඉදිරියට ගෙනයාමටත්, වාර්ෂිකව ඒ ආශ්‍රිත පාරිසරික අධීක්ෂණ කටයුතු කිරීමටත් සියාම් සිටි සිමෙන්ති සමාගම ඉදිරියටත් කැපවී සිටී.

Most Admired companies සම්මාන උළෙලට AIA ඉන්ෂුවරන්ස් ප්ලැටිනම් අනුග්‍රාහකත්වය

වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (CIMA) සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය (ICCSL) විසින් සංවිධානය කරනු ලබන 2020 ශ්‍රී ලංකාවේ වඩාත්ම ප්‍රශංසනීය සමාගම් සම්මාන වැඩසටහනෙහි ප්ලැටිනම් අනුග්‍රාහකත්වය දැරීමට මෙවරත් AIA ඉන්ෂුවරන්ස් සමාගම මහත් සාඩම්බරයෙන් ඉදිරිපත් වී ඇත. AIA මෙම වැඩසටහනට අඛණ්ඩව ප්ලැටිනම් අනුග්‍රාහකත්වය දක්වන 3 වන වසර මෙය වේ. මෙම සම්මාන ලබාදීමේ අපේක්ෂාව වන්නේ හුදෙක් මූල්‍ය සාර්ථකත්වය පදනම්ව පමණක් නොව, සමාගමෙහි සේවකයින්, සේවාලාභීන්, ආයෝජකයින් සහ සාමාන්‍ය ප්‍රජාව සඳහා තිරසාර හා සදාචාරාත්මක ලෙස, වටිනාකමක් උපදවන, සෙසු සමාගම්වලට වඩා කැපී පෙනෙන සමාගම් හඳුනා ගැනීමයි.

ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත හා ලැයිස්තුගත නොකළ සමාගම් දෙපාර්ශ්වයටම විවෘතව ඇති මෙම සම්මාන උළෙලට, 2020 ජූනි 30 වන විට වසර 5 කට වැඩි කාලයක් ව්‍යාපාරයේ යෙදී සිටින සහ 30% හෝ ඊට වැඩි ශ්‍රී ලාංකික හිමිකාරිත්වයක් ඇති සමාගම් සුදුසුකම් ලබයි.

AIA ඉෂුවරන්ස් හි ප්‍රධාන විධායක නිලධාරි නිබ්ල් අද්වානි අදහස් දක්වමින් කියා සිටියේ,

"ශ්‍රී ලංකාවේ හොඳම ජීවිත රක්ෂණ සමාගම ලෙස (ග්ලෝබල් බැන්කින් ඇන්ඩ් ෆිනෑන්ස් රිවිව් වෙතින් ඇගැයීමට පාත්‍රවන ලද) මෙරට ආයතන මෙලෙසින් ඇගැයීමට පාත්‍ර කරන්නා වූ එකම සම්මාන උළෙලට අනුග්‍රහය දැක්වීමට හැකිවීම පිළිබඳව අප සතුටු වෙනවා. හුදෙක් මූල්‍ය සාර්ථකත්වයෙන් ඔබ්බට යමින් සිය සේවකයින්, සේවාලාභීන්, ආයෝජකයින් සහ සාමාන්‍ය ප්‍රජාව සඳහා තිරසාර හා සදාචාරාත්මක ලෙස, වටිනාකමක් උපදවාලීමට කැපව කටයුතු කරන සමාගම් වෙත අපගේ සහාය ලබා දෙමින්, ඔවුන්ව සම්මානයෙන් ඇගැයුමට ලක්කිරීමට හැකි වීම අපට මහත් අභිමානයක් ගෙන දෙන කරුණක්". යනුවෙනි.

කිෂු ගෝමස් ඩ්‍රීම්රොන් සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂධුරයට

ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ කිෂු ගෝමස් මහතා පසුගිය වසරේ අගභාගයේදී එම තනතුරින් ඉවත්ව සමූහ ප්‍රධාන විධායක නිලධාරි ලෙස ඩ්‍රීම්රොන් සමූහ ව්‍යාපාරයට එක්වූ අතර, දශක ගණනාවක සිය දැනුම් සම්භාරය සහ අත්දැකීම් පාදක කරමින් ඩ්‍රීම්රොන් සමූහ ව්‍යාපාරය සවිබල ගැන්වීම සඳහා විශිෂ්ට කාර්යභාරයක් ඉටු කළේය.

දශක 3ක අධික කාලපරිච්ඡේදයක් තුළ විශාලතම ඇමෙරිකානු බහුජාතික සමාගම් ද්විත්වයක් වන චෙව්රොන් ලුබ්රිකන්ට් සහ චෙව්රෝන් සිලෝන් ලිමිටඩ් ආයතනවල කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරි ලෙස කටයුතු කර ඇති ඒ මහතා, කින්ඩායි කගාකු ලංකා පුද්ගලික ආයතනය, හරුමි හෝල්ඩිංග්ස් පුද්ගලික ආයතනය, ඩ්‍රීම්රොන් ලංකා පුද්ගලික ආයතනය සහ ඩ්‍රීම්රොන් කලා හා රූපලාවණ්‍ය විදුහල ඇතුළත් ඩ්‍රීම්රොන් ව්‍යාපාර සමූහයේ සාර්ථකත්වයට පුරෝගාමීව කටයුතු කරමින් පසුගිය කාලය තුළ එම ව්‍යාපාරය ලාභදායී ආයතනයක් බවට ලැයිස්තුගත කිරීමට සාර්ථක අඩිතාලමක් දැමීය.

සිළුමිණ රැකියා අවස්ථා

සිළුමිණ වටපිට
පල දරන්න - පළ කරන්න
මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
දැන් වචන 15ක් රු. 560ක් පමණයි...

Machinist (යන්ත්‍රකරු) ඇබෑර්තු
කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටි ප්‍රධාන පෙලේ අපනයන සමාගමක CNC හෝ Manual Lathe සහ milling මැෂින්වල වැඩ කල හැකි සේවක මහත්මයින් සඳහා ඇබෑර්තු ඇත.
මානව සම්පත් සහ පරිපාලන කළමණාකරු
0773 777085

රැකියා ඇබෑර්තු
Flexo Printing Machine Operators
✓ වසර 05ක පළපුරුද්ද / අවම වසර 03ක පළපුරුද්ද
✓ වැටුප සාකච්ඡා කරගත හැක
✓ Paper Bag Printing machine වල වැඩකර තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ
✓ සම්මුඛ පරීක්ෂණ සඳහා පහත දු.ක අමතන්න
077 4656368
GOODWIN

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

තනතුරු පුරප්පාඩු

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය වේ.

1. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් HM 1-3 (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාජීය විද්‍යාව/ විද්‍යාව / රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

සමඟ

සමාජීය විද්‍යාව/ විද්‍යාව/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය හෝ අදාළ වෙනත් ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් හෝ තනතුරේ විෂය පථයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

සහ

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, වෙනත් රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

2) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

සහ

රජයේ සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM 1-1) අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

- **වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016(I) – HM 1-3 රු .[86,865-15X2,270-120,915.00]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02 / 2016 (I) උපලේඛන II (A) අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 86,865.00.
- **අනෙකුත් වරප්‍රසාද :** මූලික වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව, වාහනයක් / ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව හා අනෙකුත් රජයේ අනුමත ප්‍රතිලාභ හිමිවේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් පවත් වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම සිදු කෙරේ.

2. අධ්‍යක්ෂ - නීති HM 1-1 (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක් සමග නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම

සමඟ

නීතිය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා තිබීම

සහ

රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ (MM)1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සමඟ නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම.

3. අධ්‍යක්ෂ (නීතිය ක්‍රියාත්මක කිරීම) HM 1-1 (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අපරාධ විද්‍යාව හෝ නීතිය පිළිබඳ ප්‍රථම උපාධියක් සමඟ නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම

සමඟ

පශ්චාත් උපාධි සුදුසුකමක් සපුරා තිබීම

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද ලබා තිබීම.

2) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ප්‍රථම උපාධියක්

සමඟ

අවම වශයෙන් වසර 12ක පොලිස් සේවයේ සේවය කර තිබීම හා එම කාලය තුල යටත් පිරිසෙන් අවුරුදු 05ක කාලයක් පොලිස් අධිකාරිවරයකු ලෙස සේවය කර තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

4. සායනික මනෝවිද්‍යාඥ HM 1-1 (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මනෝවිද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්

සමඟ

සායනික මනෝවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීම.

සහ

සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රජයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද සමග සායනික මනෝවිද්‍යඥයෙකු ලෙස සායනික පසුබිමක අවුරුදු 2 ක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සමග සායනික මනෝවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

වෙනත් - ඉහත 2 , 3 හා 4 තනතුරු සඳහා පොදු කරුණු :

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016(I) – HM1-1 රු .[80,295-15X2,270-114,345.00]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 (I) උපලේඛන II (A) අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 80,295.00
- **වයස** : අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **අනෙකුත් වරප්‍රසාද :** මූලික වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව, වාහනයක් / ප්‍රවාහන දීමනාව, ඉන්ධන දීමනාව හා අනෙකුත් රජයේ අනුමත ප්‍රතිලාභ හිමිවේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීම සිදු කෙරේ.

5. සහකාර අධ්‍යක්ෂ - (මාධ්‍ය හා තොරතුරු) MM 1-1 (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජන සන්නිවේදනය / ජන මාධ්‍ය පිළිබඳ විශේෂ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් අදාළ උපාධියක්

සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02 පශ්චාත් වෘත්තීය පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

6. සහකාර අධ්‍යක්ෂ - (නීතිය ක්‍රියාත්මක කිරීම) MM 1-1 (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අපරාධ විද්‍යාව හෝ නීතිය පිළිබඳ උපාධියක් සමඟ නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම

සහ

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02 පශ්චාත් වෘත්තීය පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) අවම වශයෙන් වසර 05ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සමඟ නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දී තිබීම.

වෙනත් - ඉහත 5 හා 6 තනතුරු සඳහා පොදු කරුණු :

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016 - MM1-1 රු .[53,175-10X1,375-15X1,910-95,575.00]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 53,175.00
- **වයස** : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත් වනු ලබන ලිඛිත තරගකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

7. වැඩසටහන් නිලධාරී JM 1-1 (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ විද්‍යාව/ සමාජීය විද්‍යා /සෞඛ්‍ය ප්‍රවර්ධනය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 01 පශ්චාත් වෘත්තීය පළපුරුද්ද.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ළමා ක්ෂේත්‍රයට අදාළ විෂයන් සහිත ඩිප්ලෝමාවක් හෝ උපදේශනය පිළිබඳ විෂයන් ඇතුළත් ඩිප්ලෝමාවක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් වේ.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත 1 හෝ 2 හෝ 3

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ආශ්‍රිත නිලධාරී MA 03 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.
3) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1) II ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

8. මාධ්‍ය හා තොරතුරු නිලධාරී JM 1-1 (තනතුරු 01)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජනමාධ්‍ය පිළිබඳ විශේෂ උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 01 පශ්චාත් වෘත්තීය පළපුරුද්ද.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත 1 හෝ 2 හෝ 3

1) ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ආශ්‍රිත නිලධාරී MA 03 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.
3) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2) II ශ්‍රේණියේ/ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායි සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම.

වෙනත් - ඉහත 07 , 08 තනතුරු සඳහා පොදු කරුණු :

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :**

  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016 - JM1-1 රු .[42,600-10 X 755-18 X 1,135-70,580.00]

  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 42,600.00
- **වයස** : අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය :** පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත් වනු ලබන ලිඛිත තරගකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

ප්‍රතිලාභ

ඉහත සඳහන් සියලු තනතුරු සඳහා මූලික වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හිමිවේ. එමෙන්ම සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක දායකත්වයක් හා සේවක භාරකාර අරමුදල සඳහා 3%ක දායකත්වයක් ද අධිකාරිය විසින් දරනු ලැබේ.

පොදු කරුණු

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් යුක්ත වීම හා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවියේ (www.childprotection.gov.lk) පළ කොට ඇති ආදර්ශ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර 2020 ඔක්තෝම්බර් මස 19 වන දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සෑම අයදුම්කරුවකුම තම අයදුම්පත්‍රය සමඟ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්, ජාතික හැඳුනුම්පතේ/ විදේශ ගමන් බලපත්‍රයේ සහතික කළ පිටපතක් හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කළ හැකි සහතිකපත් වල සහතික කළ පිටපත්ද යොමු කළ යුතුය. යම් අයදුම්කරුවෙකු එක් තනතුරකට වඩා අයදුම්කරන්නේ නම් එම එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් වෙනම ලිපිකවරවල බහා යොමු කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන තනතුර සඳහන් කර එවිය යුතු අතර, රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් යොමුකළ යුතුය.

ඉහත උපදෙස් අනුව ඉදිරිපත් කොට නොමැති, අසම්පූර්ණ හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, මෙම තනතුරු ලබා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත. කෙටි ලැයිස්තුගත කිරීමෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය / ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පත්වීම් සම්බන්ධව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති,
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,
නො. 330, තලවතුගොඩ පාර, මාදිවෙල,
ශ්‍රී ජයවර්ධනපුර.
දුරකථන අංකය - 0112778911-14
වෙබ් අඩවිය - www.childprotection.gov.lk

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

තනතුරු පුරප්පාඩු

ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනු අංකය	තනතුරු	වැටුප් කාණ්ඩය	පුරප්පාඩු සංඛ්‍යාව
01	සාමාන්‍යාධිකාරී (ප්‍රධාන විධායක නිලධාරී)	HM 2-3	01
02	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)	HM 1-3	01
03	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන)	HM 1-3	01
04	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	HM 1-3	01
05	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)	HM 1-3	01
06	ප්‍රධාන අභ්‍යන්තර විගණක	HM 1-1	01
07	සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන හා පරිපාලන)	HM 1-1	01
08	සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය ගිණුම්)	HM 1-1	01
09	සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)	HM 1-1	01
10	සහකාර සාමාන්‍යාධිකාරී (ගෘහ නිර්මාණ හා සැලසුම්)	HM 1-1	01
11	සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු ප්‍රචාරක)	HM 1-1	01
12	සහකාර සාමාන්‍යාධිකාරී (නිවාස සංවර්ධන)	HM 1-1	01
13	සහකාර සාමාන්‍යාධිකාරී (ඉඩම්)	HM 1-1	01
14	සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම් හා ප්‍රවාහන කළමනාකරණ)	HM 1-1	01
15	සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)	HM 1-1	01
16	සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)	HM 1-1	01

01. සාමාන්‍යාධිකාරී (ප්‍රධාන විධායක නිලධාරී)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

1.1 බාහිර අයදුම්කරුවන් :

I. රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, ඉංජිනේරු, වාස්තු විද්‍ය, ප්‍රමාණ සමීක්ෂක, නගර හා ග්‍රාම නිර්මාණය, කළමනාකරණය, වාණිජ්‍ය, ගණකාධිකරණය, නීති හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධිය ලබා තිබීම.

සමඟ

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

ඇතුළුව

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද ලබා තිබීම. (මෙම වසර 20 න් අවම වශයෙන් වසර 05 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය.)

හෝ

II. රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, ඉංජිනේරු, වාස්තු විද්‍ය, ප්‍රමාණ සමීක්ෂක, නගර හා ග්‍රාම නිර්මාණය, කළමනාකරණය, වාණිජ්‍ය, ගණකාධිකරණය, නීති හෝ වෙනත් අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධිය ලබා තිබීම.

සමඟ

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

ඇතුළුව

රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 05 ක විශිෂ්ට සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වීම.

1.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සමඟ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (HM1-3) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 04 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සමඟ

බහුවිධ කාර්යයන්හි නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහිලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහිලා නිශ්චිත ප්‍රවීණතාවය

02. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

2.1 බාහිර අයදුම්කරුවන් :-

සිවිල් ඉංජිනේරු හෝ වාස්තු විද්‍ය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය(Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

2.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (HM 1-1) සහකාර සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

03. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

3.1 බාහිර අයදුම්කරුවන් :-

සැලසුම්කරණය, පර්යේෂණ හා සංවර්ධනය, කළමනාකරණය, වාණිජ්‍ය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යානය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

3.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (HM 1-1) සහකාර සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

04. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

4.1 බාහිර අයදුම්කරුවන් :-

I. ගණකාධිකරණ, වාණිජ්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය, ගණකාධිකරණය) විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධිය හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

II. විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (Fellow Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

4.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (HM 1-1)

සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය ගිණුම් / කළමනාකාරීත්ව ගිණුම්) තනතුරක අවම වශයෙන් වසර 03 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

05. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

5.1 බාහිර අයදුම්කරුවන් :-

නීතිය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සමඟ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු ලෙස දිවුරුම් දී තිබීම සහ සිංහල/දෙමළ හා ඉංග්‍රීසි යන ද්විභාෂා වලින් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ලෙස දිවුරුම් දී තිබීම.

හා

නීතිය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 16 ක පළපුරුද්ද ලබා තිබීම.

5.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි (HM 1-1) සහකාර සාමාන්‍යාධිකාරී (නීති) තනතුරක අවම වශයෙන් වසර 03 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

06. ප්‍රධාන අභ්‍යන්තර විගණක

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

6.1 බාහිර අයදුම්කරුවන් :-

I. ගණකාධිකරණ, වාණිජ්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය, ගණකාධිකරණය) විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

II. විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (Fellow Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

6.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

III. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

07. සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන හා පරිපාලන)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

7.1 බාහිර අයදුම්කරුවන් :-

මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍ය හෝ කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධිය ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow/Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

7.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

08. සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය ගිණුම්)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

8.1 බාහිර අයදුම්කරුවන් :-

I. ගණකාධිකරණ, වාණිජ්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය, ගණකාධිකරණය) විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

II. විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (Fellow Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

8.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

III. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

09. සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

9.1 බාහිර අයදුම්කරුවන් :-

සිවිල් ඉංජිනේරු හෝ ප්‍රමාණ සමීක්ෂණ යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

9.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

III. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10. සහකාර සාමාන්‍යාධිකාරී (ගෘහ නිර්මාණ හා සැලසුම්)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

10.1 බාහිර අයදුම්කරුවන් :-

වාස්තු විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

10.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

III. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

11. සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු ප්‍රචාරක)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

11.1 බාහිර අයදුම්කරුවන් :-

ජන සන්නිවේදනය හෝ කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

11.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

12. සහකාර සාමාන්‍යාධිකාරී (නිවාස සංවර්ධන)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

12.1 බාහිර අයදුම්කරුවන් :-

සිවිල් ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරණය, නගර සැලසුම්කරණය, ආර්ථික විද්‍යාව,සංඛ්‍යාතය, කළමනාකරණය හෝ වාණිජ්‍ය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

12.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

III. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

13. සහකාර සාමාන්‍යාධිකාරී (ඉඩම්)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

13.1 බාහිර අයදුම්කරුවන් :-

දේපළ කළමනාකරණය, තක්සේරු විද්‍යාව, නගර හා ග්‍රාම නිර්මාණය, කළමනාකරණය, වාණිජ්‍ය හෝ මිනින්දේරු ශිල්පය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

13.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

14. සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම් හා ප්‍රවාහන කළමනාකරණ)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

14.1 බාහිර අයදුම්කරුවන් :-

මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, වාණිජ්‍ය, සැපයුම් කළමනාකරණය හෝ කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධිය ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

14.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

15. සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

15.1 බාහිර අයදුම්කරුවන් :-

I. ඉංජිනේරු, ප්‍රමාණ සමීක්ෂක හෝ ගෘහ නිර්මාණ ශිල්පය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

II. ගණකාධිකරණ, වාණිජ්‍ය හෝ ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය, ගණකාධිකරණය) යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධිය ලබා තිබීම හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

- රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ පිළිගත් රාජ්‍ය ආයතනයකින් ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

15.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

III. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ පිළිගත් රාජ්‍ය ආයතනයකින් ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

16. සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)

බඳවා ගැනීමේ පදනම : ස්ථිර

පුරප්පාඩු සංඛ්‍යාව : 01

සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

16.1 බාහිර අයදුම්කරුවන් :-

සිවිල් ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරණය, නගර සැලසුම්කරණය, කළමනාකරණය හෝ වාණිජ්‍ය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

හා

ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (Fellow / Corporate Member) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ මට්ටමේ තනතුරුවල අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද ලබා තිබීම.

16.2 අභ්‍යන්තර අයදුම්කරුවන් :-

I. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

II. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-3) තනතුරක සේවයේ නියුතුව සිටින සහ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක වසර 13 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

III. ඉහත තනතුරට අදාළව බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සමඟ විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක වසර 03 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස් සීමාව

තනතුර	වැටුප් කාණ්ඩය	වයස් සීමාව
සාමාන්‍යාධිකාරී (ප්‍රධාන විධායක නිලධාරී)	HM 2-3	අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)	HM 1-3	
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන)	HM 1-3	
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	HM 1-3	
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)	HM 1-3	
ප්‍රධාන අභ්‍යන්තර විගණක	HM 1-1	අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන හා පරිපාලන)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය ගිණුම්)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ගෘහ නිර්මාණ හා සැලසුම්)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු ප්‍රචාරක)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (නිවාස සංවර්ධන)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ඉඩම්)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම් හා ප්‍රවාහන කළමනාකරණ)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)	HM 1-1	

වැටුප

තනතුර	වැටුප් කාණ්ඩය	මාසික වැටුප් පරිමාණය
සාමාන්‍යාධිකාරී (ප්‍රධාන විධායක නිලධාරී)	HM 2-3	රු. 98,215-12 X 2,700 - 130,615
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)	HM 1-3	රු. 86,865 - 15 X 2,270 - 120,915
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන)	HM 1-3	
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)	HM 1-3	
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති)	HM 1-3	
ප්‍රධාන අභ්‍යන්තර විගණක	HM 1-1	රු. 80,295 - 15 X 2,270 - 114,345
සහකාර සාමාන්‍යාධිකාරී(මානව සම්පත් සංවර්ධන හා පරිපාලන)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී(මූල්‍ය ගිණුම්)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ගෘහ නිර්මාණ හා සැලසුම්)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු ප්‍රචාරක)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (නිවාස සංවර්ධන)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ඉඩම්)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම් හා ප්‍රවාහන කළමනාකරණ)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)	HM 1-1	
සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)	HM 1-1	

පොදු කොන්දේසි

- ➢ අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- ➢ තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- ➢ විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

- ➢ වෛද්‍ය ප්‍රතිලාභ
- ➢ නිවාඩු දින දීමනා
- ➢ දිරි දීමනා හා ප්‍රසාද දීමනා
- ➢ වෘත්තීය දීමනා හා අනුමත අනෙකුත් දීමනා
- ➢ රාජකාරී ගමන් වියදම් හා සංයුක්ත දීමනා
- ➢ සහනදායී පොලී ප්‍රතිශතයන් යටතේ සේවක ණය පහසුකම් (මාණ්ඩලික නිවාස ණය, ආපද ණය පහසුකම්), චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන/සන්නිවේදන දීමනා ඇතුළු වෙනත් සුබ සාධක පහසුකම්

ඉහත සඳහන් වයස් සීමාවන් රජයේ / රාජ්‍ය සංස්ථාවක/ මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක සේවයේ නියුතු සේවකයින්ට බල නොපැවැත්වේ.

දැනට රජයේ/ රාජ්‍ය සංස්ථා/ මණ්ඩල/ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානී මගින් තම අයදුම්පත් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

එසේම ඔබ විසින් ඉහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා ඔබගේ අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

අ - ජීව දත්ත අයදුම්පත

ආ - සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්

ඇ - ඔබ සම්බන්ධ කරගත හැකි දුරකථන අංක

සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුවේ.

සියලුම ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් සකස් කර අදාළ සහතික වල සහතික කරන ලද ඡායා පිටපත්ද සමඟ ඥාති නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංකයන්ද සහිතව මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුළත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ හා පාලන)
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කරන්න.

දුරකථන අංක - 011 2382006 / 011 2431709

සභාපති
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

EASTERN UNIVERSITY, SRI LANKA

VACANCIES

The Eastern University, Sri Lanka will entertain applications from suitably qualified persons for the following permanent cadre posts up to 03.11.2020.

1. Project Manager (Construction Works), Capital Works and Planning Division [U-EX 2(II)]

Qualifications :

(a) B.Sc. Engineering Degree from a recognized University/Higher Educational Institution (HEI) specializing in Civil Engineering

OR

B.Sc. Engineering Degree from a recognized University/HEI specializing in Quantity Surveying

OR

Equivalent professional qualifications recognized by the Institution of Engineers, Sri Lanka (IESL)

AND

(b) A corporate membership from a recognized Engineering Institute.

OR

A corporate membership from a recognized Institute of Quantity Surveying

AND

(c) A minimum of ten (10) years of relevant experience in construction projects, handling contracts as well as managing direct labour

Refer UGC Circular No. 948 dated 10.03.2011

2. Career Guidance Counsellor Grade II , Career Guidance Unit [U-AS2(II)]

Qualifications :

1. Holder of a Bachelor's Degree with First or Second Class from a recognized University/ Higher Educational Institution (HEI) with four (04) years experience in the field of Student Affairs.
2. Good command of communication skills in English

Note : *Preference will be given for those who have obtained Postgraduate qualification in the area of Human Resources Management or Counselling and / or experience in Career Guidance activities.*

Refer UGC Circular No.01/2020 dated 24.01.2020

(Age should be not less than 22 years and not more than 45 years of age on the closing date of the applications. Age limit does not apply to the Employee in the service of the Government Department, Statutory Boards and State Corporations)

3. Instructor in Physical Education Grade II /Grade III, Physical Education Unit

- **Instructor in Physical Education Grade II [U-AS 1(I)]**

Qualifications :

(a) A degree in Physical Education of a recognized University or equivalent or higher qualifications in Physical Education with at least 05 years experience in the organization and implementation of recreational programmes after obtaining such degree.

OR

(b) A graduate of a recognized University who had been a member of a National Team representing the country or a National Champion with at least 06 years experience in the organization and implementation of recreational programmes.

OR

(c) Instructor in Physical Education with not less than 8 years service in that grade who had been a member of a National team.

Refer UGC Circular No.03/2017 dated 31.01.2017

- **Instructor in Physical Education Grade III [U-AS 1(II)]**

Qualifications :

(a) A Graduate of a recognized University who has been a member of a National Team/ National Champion or other equivalent attainments in the field of sports with the prior approval of the UGC.

OR

(b) A candidate who has passed the G.C.E. (A/L) Examination in one and the same sitting and who has represented Sri Lanka in any sport at International Level with five (05) years experience in such sports.

OR

(c) G.C.E. (A/L) Examination in at least 03 subjects in one and the same sitting and a Diploma in Sports of not less than 09 months duration with five (05) years experience in organizing and implementing sports programmes.

Notes :

(i) Documentary evidence should be submitted to prove the five (05) years experience from the governing body of such sports/Organization as the case may be.

(ii) Candidates with other equivalent attainments in the field of sports as mentioned in qualification (a) above are considered if such qualifications are approved by the UGC.

Refer UGC Circular No.987 dated 16.05.2012

REMUNERATION AND OTHER BENEFITS

Remuneration : Refer UGC Circular No.17/2016 (v) dated 01.06.2018

Post	Salary	Salary Code	Salary Scale
Project Manager (Construction Works)	66,180/-	U-EX 2(II)-2016A	Rs.66,180-8x1335; 8x1630-89,900 p.m
Career Guidance Counsellor Gr.II	50,625/-	U-AS 2 (II)-2016A	Rs.50,625 - 3x1335 - 54,630 (EB) 55,965 - 14x1335 - 74,655 p.m
Instructor in Physical Education Gr.II	48,385/-	U-AS 1 (I)-2016A	Rs.48,385 - 19x690 - 61,495 p.m
Instructor in Physical Education Gr.III	41,095/-	U-AS 1 (II)-2016A	Rs.41,095 - 18x660 - 52,975 p.m

- The other allowances determined by the University Grants Commission will be paid in addition to the above salary.

Benefits

- Selected candidates will contribute 10% of their monthly salary to the Universities' Provident Fund, while the employer will make a contribution of 15% of their salary of which 8% will be credited to the Universities' Pension Fund and 7% to the Universities' Provident Fund. In addition, they will become contributors to the Employees Trust Fund under which the University will contribute an amount equivalent to 3% of their salary.

METHOD OF RECRUITMENT

By Structured interview

APPLICATIONS AND PARTICULARS

01. **Application forms and other relevant details could be downloaded from the University website http://www.esn.ac.lk.** Downloaded application form should accompany with the paid Bank Slip for the deposit of a sum of Rs.100/= credited to the Account No: 227-1001-4-0000024, at any branch of the People's Bank, drawn in favour of "Bursar, Eastern University, Sri Lanka". Application forms could also be obtained from the Office of the Senior Assistant Registrar, Academic Establishments Division, Eastern University, Sri Lanka, Vantharumoolai, Chenkalady from Monday to Friday during office hours by personally calling over by submitting **paid Bank Slip.**
02. The post applied for should be marked on the top left hand corner of the envelope.
03. The candidates who apply for more than one post should submit **separate applications along with separate Bank slips in separate covers for each post.**
04. Applicants who are employees of University System, Government Departments, State Corporations and Statutory Bodies should forward their applications through the Head of their respective institutions, but may send an advance copy in the first instance. However, no such applicant will be considered for interview, if the application channeled through the Head of the Department is not received.
05. Duly completed applications along with copies of educational & professional qualifications with statement of the degree and service certificates should be forwarded under registered cover to reach **"Senior Assistant Registrar, Academic Establishments Division, Eastern University, Sri Lanka, Vantharumoolai, Chenkalady" on or before 03.11.2020.**
06. Applications will not be entertained personally and the University will not bear any responsibility for such submissions.
07. **Incomplete & illegible applications, applications which are not attached with supportive documents & paid Bank slip and applications received by the University after the closing date will be rejected without intimation.**

Note: The University reserves the right to short list and interview only such applicants as the University may consider suitable for appointment.

REGISTRAR
EASTERN UNIVERSITY, SRI LANKA
VANTHARUMOOLAI
CHENKALADY

04.10.2020

වහාම අවශ්‍යය කර තිබේ

- **සිවිල් ඉංජිනේරු/සහකාර සිවිල් ඉංජිනේරු**
  Civil Engineer/Assistant Engineer
  (BSc/TTI/NDT/SLIT)
- **වාහන වායුසමීකරණ ශිල්පීන්**
  Auto/AC Technician
- **වාහන පින්තාරුකරුවන්**
  Auto Painter
- **වාහන ටින්කර්වරුන්**
  Tinker

සන් පයිලින් (පුද්.) සමාගම
නො. 295, මාදම්පිටිය පාර, කොළඹ 14.
දුරකථන - 011 254 0123
ඊ-මේල්: damith@sanpiling.com
සමීර - 071-9674879
දමිත් - 071-9674632

PROVISION

උද්‍යාන සැලසුම්කරණ ශිල්පියෙකු අවශ්‍යයි
(LANDSCAPER)

දිවයිනේ සුපතල බාහිර ප්‍රචාරක ආයතනයක් වන අබාන්ස් ඇඩ් අවුට්ඩෝ (පුද්ගලික) සමාගම සඳහා උද්‍යාන සැලසුම්කරණ ශිල්පියෙකු වහාම බඳවා ගැනේ.

සුදුසුකම්

- **උද්‍යාන සැලසුම්කරණය** (Landscaping) **ආශ්‍රිතව මනා පළපුරුද්දක් තිබීම.**
- **මහා මාර්ගයේ වට රවුම් සහ මධ්‍ය දුපත් විධිමත්ව පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම.**
- **සිංහළ, දමිළ සහ ඉංග්‍රීසි භාෂා මනා ලෙස හැසිරවීමේ හැකියාව අමතර සුදුසුකමක් ලෙස සැලකේ.**
- **වයස අවුරුදු 45 ට අඩු වීම.**

අයදුම්කරුවන් තමන් විසින් මීට පෙර නිර්මාණය කරන ලද උද්‍යාන සැලසුම් නිර්මාණ වල ඡායාරූප කිහිපයක්ද අයදුම්පතට ඇතුළත් කළ යුතුයි. සියලු විස්තර ඇතුළත් අයදුම්පතක් දැන්වීම පල වී දින 7 ක් ඇතුළත පහත ලිපිනයන්ට තැපැල් හෝ ඊ-මේල් මාර්ගයෙන් යොමු කරන්න.

අබාන්ස් ඇඩ් අවුට්ඩෝ (පුද්ගලික) සමාගම
5 වැනි මහළ, (අබාන්ස් ගොඩනැගිල්ල)
498, ගාලු පාර, කොළඹ 3

ඊ-මේල් : duminda@absgdh.lk
දුරකථන : **0112 565 294 - 5**

අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)
පුරප්පාඩු

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) හි පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්ගේ විස්තරාත්මක ජීවදත්ත තොරතුරු ප්‍රකාශ (CV) ඇතුළත් අයදුම්පත් අදාළ සහතිකපත්‍රවල පිටපත් ද සමග **2020.11.03 වන දින හෝ ඊට පෙර** ලැබෙන සේ ලියාපදිංචි (ලේඛනගත) තැපෑලෙන් **කොළඹ 10, T. B. ජයා මාවතේ අංක 320 හි, "ජනවතු පියස" හි පිහිටි ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) හි, අධ්‍යක්ෂක ජනරාල් වෙත** ලැබෙන සේ, එවිය යුතුය.

කරුණාකර අයදුම්කරනු ලබන තනතුර හා පිහිටි (සේවා) ස්ථානය, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කරනු මැනවි.

01. ගණකාධිකාරී

(සමන්තුරෙයි හා අනුරාධපුර උසස් තාක්ෂණ ආයතනහි) - පුරප්පාඩු ගණන - 02

අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :

බාහිර

(අ) ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) හි අන්තර්මධ්‍යම මට්ටමේ සුදුසුකම්.

(ආ) **හෝ**

වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම්.

හෝ

සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) අන්තර් මධ්‍යම මට්ටමේ සුදුසුකම්

හෝ

කළමනාකරණය හෝ වාණිජ විද්‍යාව පිළිබඳ උපාධියක්

සහ

(ඇ) රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක, කළමනාකරණ මට්ටමේ ගිණුම්කරණය හා මූල්‍ය කටයුතු පිළිබඳව අඩුම තරමින් වසර තුනක (03) පළපුරුද්ද.

සැ. යු : පරිගණකගත ගිණුම්කරණ වාතාවරණයකට නිරාවරණය වී සිටීම, විශිෂ්ට වාසියක් වනු ඇත.

අභ්‍යන්තර : ගිණුම්කරණ ක්ෂේත්‍රයේ 1 වන ශ්‍රේණිය වර්ගීකරණයේ කනිෂ්ඨ කළමනාකරු තනතුරක, අවම වශයෙන් වසර පහක (05) ක පළපුරුද්දක් සහිත සේවකයෙකු වීම.

වැටුප් පරිමාණය :

MM 1-1-2016 - ශ්‍රේණිය II - 53,175 - 10X1,375-15X1,910-95,575

සැ. යු : 2/2016 චක්‍රලේඛය පරිදි, තනතුරුලාභියා රු. 53,175/= ක් වන මූලික වැටුප් තලයක පිහිටවනු ලැබේ. එයට අතිරේකව රජය අනුමත දීමනාද ගෙවනු ලැබේ.

02. පුස්තකාලයාධිපති (Librarian)

(අම්පාර, යාපනය සහ අනුරාධපුර උසස් තාක්ෂණ ආයතනයන්හි) පුරප්පාඩු ගණන - 03 කි.

අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :

අභ්‍යන්තර අපේක්ෂකයන් :

පුස්තකාල විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් ද සහිතව, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ (SLIATE) හි, පුස්තකාල සහයක (සහකාරවරයකු) ලෙස MA3 ශ්‍රේණියේ, වසර පහක (05) ක පළපුරුද්ද

බාහිර අපේක්ෂකයින් :

පුස්තකාල විද්‍යාව පිළිබඳව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් ද සමග උසස් අධ්‍යාපන ආයතනයක, පුස්තකාලයක එම කටයුතු පිළිබඳ වසර 2 ක පළපුරුද්ද.

හෝ

පුස්තකාල විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමාවක් ද සමග උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයක එම පුස්තකාල කටයුතු පිළිබඳ වසර 8 (අටක) පළපුරුද්ද.

වැටුප් පරිමාණය :

JM1-2-2016 -ශ්‍රේණිය II- 43,355-755x10 - 1,135x18- 71,335

සැ. යු. 2/2016(1) චක්‍රලේඛය, ප්‍රකාරව, තනතුරුලාභියා රු. 43,355/= වන මූලික වැටුප් තලයක පිහිටුවනු ලැබේ. එයට අතිරේකව රජය අනුමත කර ඇති දීමනා ද ගෙවනු ලැබේ.

සේවා කොන්දේසි (නියමයන්) :

1. තෝරාගනු ලබන අපේක්ෂකයින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකත්වය සිය ඉපයීම්වලින් 10% ක් වශයෙන් දක්වනු ලැබිය යුතුවන අතර, SLIATE (ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය) සිය ඉපයීම්වලින් 15% ක් ලෙස එහි අරමුදල් වලින් දායක වන අතරම, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට (ETF) වන සිය ඉපයීම්වලින් 3% ක් වශයෙන්ද දායකත්වය ලබා දෙනු ඇත.
2. වයස් සීමාව සියලුම කාණ්ඩ සඳහා වයස අවුරුදු 45 ට අඩු විය යුතු වන අතර, කෙසේ වෙතත් රජයේ/ රාජ්‍ය අංශයේ ස්ථිර සේවයේ නියුතු අයහට මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
3. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.
4. රජයේ දෙපාර්තමේන්තුවල විශ්‍රාම වැටුප් සහිත තනතුරක් හොබවන තෝරාගනු ලබන අපේක්ෂකයින් අදාළ ආයතනවල අධ්‍යක්ෂක ජනරාල් (Director General of Establishments) වෙතින් සිය (සේවයෙන්) මුදා හැරීම ලබාගත යුතුය. කෙසේ වතුදු ඔවුන් හට (SLIATE) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ සේවය කරනු ලබන කාලය පුරාවට විශ්‍රාම වැටුප් අයිතීන් හිමි නොවනු ඇත.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනෙන් පසු ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂක ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, (SLIATE)
අංක 320, T.B. ජයා මාවත, කොළඹ 10.

සිංහල මිරර රැකියා අවස්ථා

රැකියා පුරප්පාඩු

සී/ස කුරුණෑගල වැවිලි සමාගම

(පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය)

ප්‍රධාන ලිපිකරු තනතුර

අප ආයතනය සතු කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි වතු කාර්යාලයකට ඉහත තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුට ලිපිලේඛන, වාර්ෂික අයවැය / ඇස්තමේන්තු ගිණුම් හා අනිකුත් කාර්යාල කටයුතු තනිව මෙහෙයවීමේ හැකියාව තිබිය යුතුය.

සුදුසුකම් හා පළපුරුද්ද

බාහිර අයදුම්කරුවන් සඳහා

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ 4 ක් සහිතව විෂයයන් 6 කින් අ.පො.ස. (සා/පෙළ) සමත්වීම සහ රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / මණ්ඩල හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ඒ හා සමාන අවම වශයෙන් වසර 5 ක පළපුරුද්ද.

වතු / වැවිලි ක්ෂේත්‍රයේ ගිණුම් කටයුතු පිළිබඳ මනා පළපුරුද්ද සහ පරිගණක දත්ත කළමනාකරණය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

කුරුණෑගල වැවිලි සමාගමේ වතුයායක ලිපිකරු ශ්‍රේණියේ වසර 10 කට නොඅඩු පළපුරුද්ද.

වයස

අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවනු ඇත.)

වැටුප

පැවති සාමූහික ගිවිසුමට යටත්ව සාකච්ඡා කොට තීරණය කරගත හැකිය.

ඔබගේ අයදුම්පතෙහි ඔබ ගැන විමසීම් කළ හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, තනතුරු හා දුරකථන අංක සඳහන් කර 2020 ඔක්තෝබර් 19 වන දින හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න. අයදුම්කරන තනතුර ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

රාජ්‍ය ආයතන, දෙපාර්තමේන්තු හෝ මණ්ඩලවල සේවයේ නියුක්ත වූවන් මේ සඳහා අයදුම් කරන්නේ නම් අදාළ ආයතන ප්‍රධානියා මගින් අයදුම් කළ යුතුය.

බඳවා ගැනීම් සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසු කමක් සේ සලකනු ඇත.

කළමනාකරු මානව සම්පත් හා පරිපාලන,
සී/ස කුරුණෑගල වැවිලි සමාගම,
නො. 80, දඹුල්ල පාර, කුරුණෑගල.

සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2021 වර්ෂය

නාගරික සංවර්ධන අධිකාරිය

නගර සංවර්ධන, වෙරළ සංරක්ෂණ,
අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

01. නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධිත නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2021 වර්ෂය සඳහා භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීම වෙනුවෙන්, ප්‍රාදේශීය වශයෙන් සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කරවා ගැනීම උදෙසා සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය විසින් දේශීය නිෂ්පාදකයින්, දේශීය සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, ප්‍රජාපාදක සංවිධාන, උපදේශක ආයතනයන් සහ විදේශීය සැපයුම්කරුවන්ගේ අනුමත නියෝජිතවරුන් වෙතින් වෙළඳපල මිල සැදැහුම් (Shopping Bidding Method) යටතේ අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් / උපදෙස් හා කොන්දේසි

ඇ. අයදුම්කරුවන්ට, 2020.10.05 දින සිට 2020.10.31 දින දක්වා කාලය තුළ පහත සඳහන් "වෙබ්" අඩවියට පිවිස එහි "Procurement Notices" හරහා ලියාපදිංචි වීමට අවශ්‍ය අයදුම්පත් සහ ඊට අදාළ ලියකියවිලි අය කිරීමකින් තොරව ලබාගත හැක. (Download).

නාගරික සංවර්ධන අධිකාරිය - **www.uda.gov.lk**

ආ. ලියාපදිංචිවීමට අදාළ අයදුම්පත සහ ලියකියවිලි කට්ටලය **පිටු 25 කින්** පමණ යුක්ත වන අතර එය පහත සඳහන් කොටස් වලින් සමන්විත වේ.

i. ප්‍රධාන අයදුම් පත්‍රය
ii. උපදෙස් සහ කොන්දේසි අඩංගු පත්‍රිකාව
iii. **පිටු 17 කින්** යුක්ත වන කාණ්ඩ ලැයිස්තුව (ඉංග්‍රීසි බසින්)

ඉහත සඳහන් ලියකියවිලි "වෙබ්" අඩවිය හරහා ලබාගැනීම පිළිබඳ අයදුම්කරුවෙකුට යම්කිසි ගැටලු සහගත තත්ත්වයක් පැනනැගුණහොත් නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලය, පළාත් / දිස්ත්‍රික් කාර්යාලවල කාර්යය මණ්ඩල සාමාජිකයින් වෙතින් අවශ්‍ය සහාය ලබාගත හැක.

03. ලියාපදිංචිය සඳහා කාණ්ඩ ගාස්තු ගෙවීම

ඇ. එක් කාණ්ඩයක් සඳහා ලියාපදිංචි වීම වෙනුවෙන් අයදුම්කරුවෙකුගෙන් අයකරනු ලබන ගාස්තුව රු. 3,000.00 (බදු සහිතව)

ආ. 2021 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා කාණ්ඩ ගාස්තු ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අංක 1534 දරන ගිණුමට බැරවන පරිදි ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට හෝ නාගරික සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන කාර්යාලය, පළාත් / දිස්ත්‍රික් කාර්යාලයන්ට ගෙවිය හැක.

ඇ. කාණ්ඩ ගාස්තු ගෙවීමේදී ඉදිරිපත් කරන **මුදල් තැන්පතු පත්‍රිකාව / කුවිතාන්සියේ මුල් පිටපත,** අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. (මුදල් ගෙවූ බවට සහතික වන පරිදි)

ඈ. අයදුම්කරුවන් විසින් **කාණ්ඩ ගාස්තු 2020.11.15** දින දක්වා වූ කාලය තුළදී ගෙවා අවසන් කළ යුතුය. 2020.11.15 දිනට පසුව ගෙවනු ලබන කාණ්ඩ ගාස්තු පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය වගකියනු නොලැබේ.

04. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ ලිපි ලේඛන සමග 2020.11.30 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය යුතුය. ඉල්ලුම්පත් බහාලන ලියුම් කවරයේ වම් ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021 වර්ෂය"** යනුවෙන් සඳහන් කළ යුතුය.

සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රසම්පාදන ඒකකය,
7 වන මහල, "සෙත්සිරිපාය", බත්තරමුල්ල.

05. 2021 වර්ෂයට, නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාණ්ඩ, වැඩ සහ සේවා සැපයීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සම්බන්ධව අවසන් තීරණය ගැනීමේ අයිතිය සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය සතු වේ.

සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය,
නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,
අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා
කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.

නාගරික සංවර්ධන අධිකාරිය,
ප්‍රසම්පාදන ඒකකය,
7 වන මහල, "සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

2020 ඔක්තෝබර් මස 05 වන දින.

Invitation for Bids

GOVERNMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

MINISTRY OF HEALTH

Date:	4th October 2020
Title of the Project	Health System Enhancement Project
Contract No. and Title of the Procurement	HSEP/ PMU/PRO/G 10/86/2020 Procurement of Furniture for 45 Facilities – G 10
Deadline for Submission of Bids	Before 1000 Hrs. on 3rd November 2020

1. The Democratic Socialist Republic of Sri Lanka has received financing from the Asian Development Bank (ADB) towards the cost of **Health System Enhancement Project**, and it intends to apply part of the proceeds of this financing to payments under the contracts named above. Bidding is open to bidders from eligible source countries of ADB.

2. The Ministry of Health (the Purchaser) invites sealed bids from eligible bidders for the procurement of following Goods. A brief description of the types of goods are below:

Lot No.	Brief Description of Goods		Quantity
1	Rest room/on call room beds	6x3 feet length. 18 inch width	24
2	Mattress	6x3 feet, 5 inch Thickness, Double layer	40
3	Mattress	6x2.5 feet, 5 inch Thickness, Double layer	30
4	Mattress	6x 3.5 feet, 5 inch Thickness, Double layer	7
5	Cushion chair with arm/ conference chair (Patient chair)	With cushion arm. Low back. Fabric upholstery. Steel frame	151
6	Rotating chair/ computer chair (hospital staff)	With nylon plastic arm. Lower back. Fabricupholstery. Rotatable with 5 Nylon caster wheels and height adjustable	69
7	Plastic chair	Steel legs and armless, Overall height 30 to 36 inch, Loading capacity not more than 100 kg	345
8	Dispenser chair with arm	Nylon 5 caster wheels. Adjustable and tilt. Fabric material. Maximum height 44 inches (+ or - 5% tolerance)	29
9	Gang Chairs stainless steel	3 in 1, Size 160cmx60cmx76cm (+ or – 6cm), stainless steel grade 201 ss	111
10	Gang Chairs stainless steel	4 in 1, Size 225cmx60cmx76cm (+ or – 6cm), stainless steel grade 201 ss	106
11	Gang Chairs plastic	4 in 1, iron frame, main area 40 cm x 40 cm, Back rest 40 x 38 cm (Not rigid), total height 78 cm	45
12	Low back executive chair with arm	Nylon 5 caster wheels, height adjustable, fabric finished upholstery, main area 48 cm x50 cm, back rest 45 cm x 53 cm, height 110 cm, (tolerance 6 cm)	109
13	Lobby Chair (Box Model)	Fabric upholstery, Cushion without arm, width 65cm, Height 80cm, length 150cm, with wheels	6
14	Lobby Chair	Should fabricate with fabric upholstery, Box model, Length – 23 (inches), Width – 26 (inches), Height – 32.5 (inches)	6
15	Sofa with Coffee table (Small)	2 + 1 + 1 seat sofa fabric upholstery Wood frame construction wrapped in foam and fabric upholstery	5
16	High-back executive chair	Nylon 5 caster wheels, height adjustable, fabric finished upholstery, main area 48 cm x50 cm, back rest 68 cm x 53 cm, height 125cm, (tolerance 6 cm)	47
17	Office table (Steel)	L120cmx W75cmx H75cm (tolerance 6 cm), Steel with 20 gauge. 3 Drawers with lockable keys. Melamine Top	107
18	Office table (Wood)	L120cmx W75cmx H75cm (tolerance 6 cm). 3 Drawers with lockable keys. Melamine Top	57
19	Computer Tables	Wood Finish Length – 120cm, Width – 40cm, Height – 77.3cm (tolerance 6 cm), 1 Drawer with lockable keys, key board drawer	10
20	Executive Table (L Shape)	Wood Finish Length – 160cm, Width – 60cm, Height – 77cm (tolerance 6 cm), 3 Drawers with lockable keys	10
21	Reception Table (C Shape)	Wood finish. Three units with overall length – 360cm, Width –60cm+30cm, Height – 75. cm+30cm. (Tolerance 6cm)	15
22	Reception Table (Crescent Shape)	Wood finish, Approximate dimension should be 241cm x 90cm x 107cm,(Tolerance 6cm) Manufactured completely in CKD (Completed in knock down), Reception Counter riser fixed with minimum of one lockable drawer set and it should include lockable cupboard with two shelves	3
23	Dining Table with 6 chairs	Steel Table with Tempered Glass top : Length – 152cm, Width – 91cm, Height – 76cm, (Tolerance 6cm) Steel Cushion Chairs	3
24	Workstation (Single)	Wood Finish two medium size lockable drawers and one large drawer, Approximate dimension should be length 140cm Width 50cm Height 75cm (Tolerance 6cm)	3
25	Horse shoe shape dispensing counter	Front of table should have opening 18” and side of Tabletop should have rack with compartment to store drugs containers. Size should be 59” x 29” and Tabletop height should be 36” inch. All frame height should be 30” from top of the table. Made up of wooden or melamine board completed in knock down system.	4
26	Steel Cupboard with Glass	Footer Frame in 2.5cm, Cold rolled mild steel Gauge 20, Epoxy Powder coated Board, Four Shelves Adjustable, Lockable door with handle flush with the door Length – 90cm, Width – 45cm, Height – 185cm.	123
27	File cupboard	Wood Finish, front Open three shelves with 2 Lockable doors Below, 180cmx90cmx35cm	16
28	Steel Cupboard without Glass	Footer Frame in 2.5cm, Cold rolled mild steel Gauge 20, Epoxy Powder coated Board, Four Shelves Adjustable, Lockable door with handle flush with the door Length – 90cm, Width – 45cm, Height – 185cm	28
29	Half Cupboards	Cold rolled mild steel Gauge 20, Epoxy Powder coated Board, Three Shelves, Lockable door with handle flush with the door Length – 80cm, Width – 40cm, Height – 123cm	11
30	File rack/ Book Shelf (wood)	Wood Finish Front Open, Five shelves, 180cmx90cmx35cm, 2 Years Warranty	14
31	File rack-iron	Cold rolled mild steel 22 Gauge, Epoxy Powder coated. Four Open shelves length 119cm, Width – 30cm, Height – 120cm	23
32	Workmen lockers	Triple tie Locker 360cmx360cmx720cm with Nine Lockable doors, Powder coated zinc Al, Handle flush with doors	5
33	File lockers (steel)	Cold rolled mild steel Gauge 22, Epoxy Powder coated Board, Four Shelves, Lockable door with the door Length – 45cm | Width – 60cm | Height – 130cm. Warranty 2 years	3

3. **The Successful Bidder** must deliver Goods to the locations mentioned in the delivery and completion schedule in the Bidding Document. Also, delivery must be completed within 60 days from signing of contract.

4. **Open Competitive Bidding** (OCB) will be conducted in accordance with ADB’s Single Stage: Single Envelope bidding procedure and is open to all bidders from eligible countries as described in the Bidding Document. The eligibility rules and procedures of ADB will govern the bidding process.

5. **Bid for one or multiple lots.** Bidders may bid for one or several lots (contracts), as further defined in the Bidding Document. Bidders who wish to offer discounts in case they are awarded more than one lot (contract) will be allowed to do so provided those discounts are included in the Bid Submission Sheet.

6. Only eligible bidders with the following key qualifications should participate in this bidding and the qualification criteria are more completely described in the Bidding Document:

   - Successful completion as main supplier for furniture within the last 7 years at least cumulative valued for LKR 12.10 Mn.
   - Minimum average annual turnover of LKR 24 Mn.calculated as total payments received by the Bidder for contracts completed or under execution over the last 3 years.

7. To obtain further information and inspect the Bidding Documents free of charge from 0900 Hrs to 1500 Hrs on working days, the bidders should contact:

   The Project Director,
   Health System Enhancement Project,
   No. 3/19, Kynsey Road,
   Colombo 8, Sri Lanka.

   Telephone Number: +94 112 697 173 / +94 112 056 535
   Fax: +94 112 697 163
   E-mail:hsep.pmu@gmail.com

8. A pre-bid meeting shall take place at 1500 Hrs on16th October 2020 at above address conducted by the Employer. All bidders are strongly advised to attend this pre-bid meeting.

9. To purchase the Bidding Document in English, eligible bidders should submit a written request/application to the address above requesting the Bidding Document for the **Procurement of Furniture for 45 Facilities – G 10** for the Health System Enhancement Project and pay a non-refundable fee of **LKR 7,000.00** on or before 1500 Hrs on 2nd November 2020.

10. The method of payment will be in the form of bank draft or cashier’s certified cheque in favor of the **“Secretary, Ministry of Health, Nutrition and Indigenous Medicine – A/C 7040309”** or in cash, from 0900 Hrs to 1500 Hrs on working days or pay by direct deposit to bank account number 7040309 at Bank of Ceylon.

11. The Bidding Document may also be sent by airmail for overseas delivery and surface mail or courier for local delivery with an additional fee of US$ 100 and LKR 5000.00 respectively in addition to the non-refundable fee stated under para 8. No liability will be accepted for loss or late delivery.

12. Bids shall be delivered to the address given in para 7 above **on or before 1000 Hrs on 3rd November 2020** together with the Bid Security as specified in the bidding document. If the Bid Security is submitted in a form of a Bank Guarantee, it shall be issued using the format given in the Section 4 of Bidding forms by a Commercial Bank approved by central bank of Sri Lanka in favor of **“The Project Director - Health System Enhancement Project”.** Late Bids will be rejected and returned unopened.

13. The Bids shall be valid for 90 days from the date of bid opening. The Bid Security shall be valid for 118 days from the date of bid opening.

14. Bids will be opened immediately after the deadline for bid submission in the presence of Bidders’ representatives who choose to attend.

15. The Health System Enhancement Project of the Ministry of Health will not be responsible for any cost or expenses incurred by bidders in connection with the preparation or delivery of bids.

Chairman, Project Procurement Committee,
Health System Enhancement Project,
No. 3/19, Kynsey Road,
Colombo 8, Sri Lanka.

Telephone Number: +94 112 697 173 / +94 112 056 535
Fax: +94 112 697 163
E-mail:hsep.pmu@gmail.com

විදේශ රැකියාවක නිරතව සිට "කොවිඩ් 19" හේතුවෙන් නැවත මෙරටට පැමිණි ඔබට කෙරෙන විශේෂ නිවේදනයයි.

නිරෝධායනය අවසන් කළ ඔබට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත තොරතුරු ලබාදීමට නොහැකි වූයේ නම්, පහත සඳහන් කාර්යාංශ වෙබ් අඩවියට පිවිස තොරතුරු ලබාදීමේ පත්‍රිකාව භාගත කරගෙන එය සම්පූර්ණ කර නැවත කාර්යාංශය වෙත ලැබීමට සලස්වන්න.

තොරතුරු පත්‍රිකා එවිය යුතු ලිපිනය -
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ සංවර්ධන)
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
නො. 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

www.slbfe.lk

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
24 පැය සේවය-1989 ප්‍රත්‍යානුකලන අංශය-0112791473

සිළුමිණ The Silumina

ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

වාහනය විකිණීමට

ලි.ප. අංකය	වර්ගය	නිෂ්. වර්ෂය
CP-DAF2xxx	මහින්ද්‍රා Supro Maxi Truck T6	2016

මෙම වාහන පරීක්ෂා කිරීම 2020 ඔක්තෝම්බර් 04 දින සිට 2020 ඔක්තෝම්බර් 11 දින දක්වා පෙ.ව. 8.00 සිට ප.ව. 5.00 දක්වා 112 C, නුගහවත්ත පාර, ඉහළ බෝමිරිය, කඩුවෙල පිහිටි (ශ්‍රීයා මෝටර්ස් අසල) සම්පත් බැංකු වාහන ආංශනයේදී සිදුකල හැක.

එමසිම සම්පත් බැංකුව රහට දිනා ජඩ්ජිය කරයි

කණිෂ්ඨ විධායක නිළධාරි - ණය අයකර ගැනීම්
සම්පත් බැංකුව පීඑල්සී.
110, ශ්‍රීමත් ජෙම්ස් පීරිස් මාවත, කොළඹ 02.

දුරකතන. 0114-730364 / 536 - දිනිත් නලින්ද
E mail: gayanwijegunawardhana@sampath.lk

මිල ගණන් කැඳවීම සඳහා වෙන්කර ඇති මෙම වාහනය දැන්වීමකින් තොරව ඉවත් කිරීමේ අයිතිය හා වාහනය විකිණීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය සම්පත් බැංකුව පී එල් සී සතුය.

අපනයන ආයතනයකට
වියළි කොහොඹ මල් අවශ්‍යයි.
කාර්යාල වේලාවන් තුළ අමතන්න.
072 7332248

සතර පෝදා එළිදකින සදහම් ප්‍රදීපය
ඉදුසරණ

අවශ්‍යයි

වගී අඩි 500 ක ව්‍යාපාරික ගොඩනැගිල්ලක් නුගේගොඩ, කළුබෝවිල, හෝ කොහුවල අවටින් ප්‍රධාන පාරට යාර 200කට අඩු දුරකින් වාහන දෙකක් පමණ නැවැත්වීමට අවශ්‍යයි.
0773243136, 0777769034

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

2021 වර්ෂය සඳහා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සමග ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පිළිගත් සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන් හා වෘත්තීයවේදීන්ගෙන් පහත සඳහන් කාණ්ඩ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

භාණ්ඩ / අයිතම සැපයීම

01. කාර්යාලීය උපකරණ හා යන්ත්‍ර
- 1.1 ගණක යන්ත්‍ර
- 1.2 ෆැක්ස් යන්ත්‍ර, මුදල් ආනාවරක (ඩිටෙක්ටර්,) කෑස් රෙජිස්ටර්
- 1.3 ඡායා පිටපත් යන්ත්‍ර
- 1.4 මිල සටහන් කිරීමේ/ කේතනය කිරීමේ යන්ත්‍ර හා කඩදසි
- 1.5 පොලිතින් සීලර්/ ෆුට් සීලර් සහ අමතර කොටස්
- 1.6 බර කිරන තරාදි
- 1.7 යකඩ සේප්පු

02. පිරියත හා යන්ත්‍රෝපකරණ (සැපයුම් / ස්ථාපන/ නඩත්තු)
- 2.1 විදුලි ජනක යන්ත්‍ර
- 2.2 වායු සමීකරණ යන්ත්‍ර
- 2.3 ශීතකරණ

03. විදුලි උපකරණ සහ උපාංග
- 3.1 විදුලි පංකා (මේස, පාදක සිවිලින්, බිත්ති)
- 3.2 ඉලෙක්ට්‍රොනික් අයිතම (රූපවාහිනී / වැකුම් ක්ලීනර් පවිත්‍රකරණ/ වායුසමීකරණ යන්ත්‍ර යනාදිය)
- 3.3 LED බල්බ / CFL බල්බ / ටියුබ් බල්බ/ සොකට් අඩුවිලව්/ ස්විච් යනාදිය
- 3.4 විදුලි රැහැන් උපාංග හා සවිකිරීම්

04. පරිගණක උපකරණ දෘඩාංග සහ අදාළ අයිතම
- 4.1 පරිගණක / ප්‍රින්ටර් සහ අනෙකුත් දෘඩාංග අයිතම
- 4.2 කාට්‍රිජ් රිබන් ටෝනර් යනාදිය

05. විවිධ අයිතම
- 5.1 ලිපි ද්‍රව්‍ය
- 5.2 ඡායා පිටපත් කඩදසි රෝනියෝ කඩදසි
- 5.3 පොලිතින් රෝල් (අඩු ඝනත්ව)
- 5.4 පරිගණක ලිපි ද්‍රව්‍ය (කඩදසි)
- 5.5 කඩදසි රෝල් (පොට 2/ පොට 3) තාප (Thermal) කඩදසි
- 5.6 දිරාපත් වන පරිසර හිතකාමී පොලිතින් බෑග්
- 5.7 කඩදසි බෑග්/ ලියුම් කවර
- 5.8 අත් පිස්නා

06. ගෘහ භාණ්ඩ
- 6.1 දූව / මෙලමයින්
- 6.2 වානේ

07. විනෝදායන භාණ්ඩ
- 7.1 ක්‍රීඩා භාණ්ඩ හා ක්‍රීඩා ඇඟලුම්

08. රෙදිපිලි හා ආශ්‍රිත නිෂ්පාදන
- 8.1 පාවහන්
- 8.2 තිල ඇඳුම් රෙදි
- 8.3 ඇඟලුම් (කමිස)

09. නාම හා සංඥා පුවරු

10. ගෘහ මෙවලම්
- 10.1 වතුර වීදුරු සෙරමික් භාණ්ඩ
- 10.2 උණු වතුර බෝතල්, වීදුරු කේතල, ජෝගු, බොයිලේරු, බිත්ති ඔරලෝසු යනාදිය.
- 10.3 Water Dispenser සහ පානීය ජලය, ජල බෝතල් සැපයීම.

11. රසායනාගාර අයිතම
- 11.1 රසායනාගාර උපකරණ (මිනුම් වීදුරු, ස්පැටුලා යනාදිය)
- 11.2 රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය
- 11.3 රසායනාගාර රසායන ද්‍රව්‍ය
- 11.4 ඖෂධ යන්ත්‍ර සූත්‍ර
- 11.5 ඇබ සවිකළ ඉස්කුරුප්පු මූඩි (Screw Caps With wadding inserted)
- 11.6 ඉලෙක්ට්‍රොනික් බර කිරන තරාදි/ බෙහෙත් ශාලා තරාදි
- 11.7 ගිස් වීදුරු බෝතල්
- 11.8 ප්ලාස්ටික් බෝතල් / ආලේපන (ඔයින්ට්මන්ට්) සඳහා බහාලුම්
- 11.9 HDPE බෝතල
- 11.10 ප්ලාස්ටික් බෝතල් (ස්ප්‍රේ / පීඩන එසවුම් මූඩි වැසුම්) (Spray / Push up/ Lid)

12. සංග්‍රහ අයිතම
- 12.1 සීනි
- 12.2 තේ කොළ/ ග්‍රීන් ටී
- 12.3 කිරි පිටි
- 12.4 සකස් කළ කිරි පැකට්

13. ආරක්ෂක අයිතම
- 13.1 CCTV (සංවෘත පරිපථ රූපාවාහිනී) පද්ධති
- 13.2 ඇඟිලි සලකුණු යන්ත්‍ර

14. මෝටර් රථ උපාංග
- 14.1 ටයර්, ටියුබ් බැටරි
- 14.2 අභ්‍යන්තර හා විද්‍යුත් සවි කිරීම් (Door Visors Reverse Camera Steering Wheel Covers etc.)

15. සනීපාරක්ෂක අයිතම
- 15.1 සබන් ඩිටර්ජන්ට් (ක්ෂාලක) එයාර් ෆ්‍රෙෂ්නර් යනාදිය

16. හාඩ්වෙයාර් ද්‍රව්‍ය හා උපාංග මුද්‍රණ සේවා
- 16.1 ආම්පන්න සහ යන්ත්‍රෝපකරණ
- 16.2 ගොඩනැගිලි ද්‍රව්‍ය
- 16.3 දූව
- 16.4 තීන්ත (පින්තාරු)
- 16.5. ගබඩා රාක්ක සෑදීම

සැපයිය යුතු සේවාව

17. අලුත්වැඩියාවන් හා සේවාව
- 17.1 ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, කෑෂ් රෙජිස්ටර්, මුදල් ආනාවරණක අලුත්වැඩියාව හා සේවා කිරීම.
- 17.2 වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා සැපයීම
- 17.3 විදුලි ජනක අලුත්වැඩියාව හා සේවා සැපයීම
- 17.4 විදුලි පංකා හා ශීතකරණ අලුත්වැඩියාව හා සේවා සැපයීම
- 17.5 PABX පද්ධති / අලුත්වැඩියාව හා සේවා සැපයීම
- 17.6 මහජන ඇමතුම් සබඳතා පද්ධති/ අලුත්වැඩියාව හා සේවා සැපයීම

18. සන්නිවේදන සේවා
- 18.1 PABX සහ අදාළ උපාංග
- 18.2 මහජන ඇමතුම් සබඳතා පද්ධති
- 18.3 තොරතුරු තාක්ෂණය (IT) මෘදුකාංග පද්ධති

19. මෝටර් රථ ආශ්‍රිත සේවා
- 19.1 රථ වාහන නඩත්තු කටයුතු සේවා කිරීම
- 19.2 පොරාදු (කුෂන්) වැඩ (වාහන)
- 19.3 මෝටර් වාහන අලුත්වැඩියාව/ වාහන වින්කරින් කිරීම/ රථ වාහන වායු සමීකරණ කටයුතු හා විද්‍යුත් කටයුතු

20. ප්‍රවාහන සේවා
- 20.1 ටැක්සි/ කුලී රථ හා ප්‍රවාහන සේවාවන් සැපයීම
- 20.2 නිවාස/ කාර්යාල මාරු කිරීමේ භාණ්ඩ ප්‍රවාහකයෝ / ට්‍රක් රථ සැපයුම්කරුවන්

21. මුද්‍රණ සේවා
- 21.1 Corrugated Carton (කාඩ්බෝඩ් පෙට්ටි) මුද්‍රණය හා සැපයීම.
- 21.2 ලේබල් සහ ඇසුරුම් ආවරණ මුද්‍රණය කිරීම හා සැපයීම.
- 21.3 පරිගණක ඉන්වොයිස් යනාදිය මුද්‍රණය
- 21.4 රෝනියෝ මුද්‍රණය / ඩුප්ලෝ මුද්‍රණය
- 21.5 රබර් සීල්
- 21.6 ඇසුරුම් ද්‍රව්‍ය ඇලුමිනියම් පවුච්
- 21.7 බාර්කෝඩ් ස්ටිකර් මුද්‍රණය
- 21.8 ආරාධනා පත්‍ර හා දැන්වීම් පත්‍රිකා මුද්‍රණය
- 21.9 වාර්ෂික වාර්තා මුද්‍රණය

22. ඇඳුම් මැසීම
- 22.1 තිර රෙදි සැපයීම හා මැසීම
- 22.2 තිල ඇඳුම් මැසීම

23. සාමාන්‍ය (කෘෂි) පිළිබෝධ පාලනය
(කෘෂි පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද සහතිකය ඇමිණිය යුතුය)

- 24. ගොඩනැගිලි ඉදිකිරීම් සහ / අලුත්වැඩියාව CIDA ලියාපදිංචි ලේඛනගත සාක්ෂි මගින් සනාථ කළ යුතුය.
- 25. පැස්සුම් හා යකඩ වැඩ
- 26. ඇලුමිනියම් වැද්දීම හා අභ්‍යන්තර සැලසුම් නිර්මාණකරණ කටයුතු
- 27. ගිනි නිවාරණ උපකරණ නැවත පිරවුම් සහ සේවා කිරීම්

වැදගත්

1. අයදුම්කරුවන්, ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය, අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.
2. අයදුම්පත් එක් අයදුම්පතක් සඳහා, ආපසු ගෙවනු නොලබන රු. 500.00 + වැට්, බැගින් වන ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව, 2020.10.05 වන දින සිට 2020.11.04 වන දින දක්වා, රාජකාරි දිනවලදී, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අංක 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 ලිපිනයේ පිහිටි, සංස්ථාවෙහි පිළිගැනීමේ කවුන්ටරයෙන් ලබාගත හැකිය.
3. එක් අනු කාණ්ඩයකට වඩා ලියාපදිංචිය අපේක්ෂා කරන්නේ නම්, එක් එක් අනු කාණ්ඩය සඳහා වෙන වෙනම අයදුම්පත් සඳහා ආපසු ගෙවනු නොලබන රු. 500.00 + වැට් වන ගාස්තුවක් බැගින් ගෙවීමෙන් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.
4. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ගෙවීම් ලදුපත සමග, 2020.11.05 දින ප.ව. 03.00 ට පෙර **පරිපාලන කළමනාකරු, අංක 75, ශ්‍රීමත් බාරෝන් ජයතිලක මාවත, කොළඹ** 01 ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම කළ යුතුය.
5. සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම සිදුකරයි. නමුත් විශේෂිත අවස්ථාවන්හිදී ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවීමේ අයිතිය සංස්ථාව සතුය.
6. වංචා කිරීම, ව්‍යාජ අයිතම සැපයීම, තත්ත්වයෙන් බාල භාණ්ඩ සැපයීම, භාණ්ඩ භාරදීමේ දුර්වලතා තිත්දු නොවූ නෛතික ක්‍රියාමාර්ග යනාදී කරුණු මත ඕනෑම ලියාපදිංචි **සැපයුම්කරුවකුගේ නම,** ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීම පිළිබඳ අයිතිය සංස්ථාව සතුය.

සංස්ථාවේ පරිපාලන අංශයේ පරිපාලන නිලධාරීගෙන් මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගත හැක.

දුරකථන : 2326607/ 2320007
ෆැක්ස් : 2447118

සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
අංක 75, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01.

රත්මලාන කාර්මික දේපළක් විකිණීමට

(01) කර්මාන්ත ශාලාවකට / කාර්යාල සංකීර්ණයකට ඉහළ පරිමාණයේ දේපළ සංවර්ධනයකට යෝග්‍යයි.

(02) දේපළ ගාලු පාරට මීටර් 500 දුරින් තෙලවල පාරට මායිම්ව පිහිටි 738 ක ඉඩමකි.

(03) ඉඩමේ ව.අඩි. 58469 එකතුවක කාර්යාල ගොඩනැගිලි හා ගබඩා පහසුකම් ඇත.

(04) මිල සාකච්ඡා කරගත හැක.

අමතන්න - ධනුෂ්ක
ජංගම දුරකථනය : 076-6714333

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

මූලික රෝහල, කන්තලේ

2021 වර්ෂය සඳහා කන්තලේ මූලික රෝහලට භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලාංකික සැපයුම්කරුවන්, ලියාපදිංචි කරන ලද වෙළඳ සමාගම්, සමුපකාර සමිති, සංස්ථා ඇතුළු රජයේ ආයතන, ග්‍රාම සංවර්ධන සමිති හා ලියාපදිංචි වාණිජ ආයතන, ඉදිකිරීම් කොන්ත්‍රාත් ආයතන සහ නඩත්තු කොන්ත්‍රාත් ආයතනවලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ පිළිබඳ විස්තර හා අයදුම්පත් කන්තලේ මූලික රෝහලේ කාර්යාලය මගින් සතියේ දිනවලදී ලබාගත හැකිය. නැතිනම් මුද්දර අලවන ලද 9x5 ප්‍රමාණයේ ලියුම් කවරයක් එවීමෙන් හෝ bhkantacc@gmail.com යන විද්‍යුත් ලිපිනය මගින් අදාළ විස්තර ලබාගත හැක.

සියලුම අයදුම්පත් 2020.11.06 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

දු.ක. පොදු	:	026-2234261-212
ගිණුම් අංශය	:	026-2234945
ආයතන අංශය	:	026-2234948
වෛද්‍ය අධිකාරී	:	026-2234262
විද්‍යුත් ලිපිනය	:	bhskanthale@gmail.com

සභාපති,
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,
මූලික රෝහල,
කන්තලේ.

UNIVERSITY COLLEGE
UNIVOTEC

කුලියාපිටිය විශ්ව විද්‍යාල විද්‍යායතනය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

භාණ්ඩ විස්තරය
1. විද්‍යාගාර ද්‍රව්‍ය හා උපකරණ
2. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය හා ටෝනර් (ඡායා පිටපත් යන්ත්‍ර,මුද්‍රණ යන්ත්‍ර)
3. අනෙකුත් උපකරණ හා ද්‍රව්‍ය
   - පරිගණක/පරිගණක උපාංග/මුද්‍රණ යන්ත්‍ර/CCTV
   - ඡායාපිටපත් යන්ත්‍ර,ෆැක්ස් යන්ත්‍ර
   - කාර්යාලීය විදුලි උපකරණ
   - වායු සමීකරණ
   - ලී බඩු හා වානේ භාණ්ඩ ඇතුළු අනෙකුත් කාර්යාලීය උපකරණ
   - හාඩ්වෙයාර් ද්‍රව්‍ය
   - ඉලෙක්ට්‍රිකල් ද්‍රව්‍ය

සේවාවන් විස්තරය
1. මුද්‍රණ කටයුතු
2. විදුලි හා ජලනල අලුත්වැඩියා සේවා
3. වාහන අලුත්වැඩියා කටයුතු
4. කුලී පදනම මත වාහන ලබා ගැනීම
5. වායු සමීකරණ/ශීතකරණ/විද්‍යාගාර හා අනෙකුත් කාර්යාල උපකරණ අලුත්වැඩියා
6. උපදේශන සේවා/ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා/පුහුණු සේවා.
7. පරිගණක, පරිගණක ජාල හා විද්‍යුත් උපකරණ සේවා හා අලුත්වැඩියා කිරීම්
8. ආපන ශාලා සේවාව
9. පිරිසිදු කිරීමේ සේවාව
10. ආරක්ෂක සේවාව
11. ගොඩනැගිලි ඉදිකිරීම් හා සුළු අලුත් වැඩියා (ඇලුමිනියම්/ වානේ ඇතුලුව)

සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා බලපාන කොන්දේසි
එක් එක් සැපයුම් හා සේවාවන් වෙනුවෙන් වෙන් වෙන්ව ලියාපදිංචි විය යුතු අතර සෑම අයදුම්පතක් සඳහාම ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් (ආපසු නොගෙවන) රු 500.00 ක මුදලක් කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ සරප් වෙත හෝ ගිණුම් අංක 028100130035492 ට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාකාවකට ගෙවා ලබා ගත් රිසිට් පත සහකාර මූල්‍ය අධිකාරී වෙත ඉදිරිපත් කිරීමෙන් 2020/10/04 දින සිට 2020/11/09 දින දක්වා සතියේ වැඩ කරන ඕනෑම දිනක පෙ.ව 9.00 සිට ප.ව 3.00 අතර අයදුම් පත් ලබා ගත හැක.

අයදුම්පත් www.uck.ac.lk/procurement යන වෙබ් පිටුව මගින් ද ලබා ගත හැකි අතර, එම අයදුම්කරුවන් ඉහත ගිණුම් අංකයට රු 500 බැර කර ලබා ගන්නා තැන්පතු පත අයදුම් පත්‍රය සමග අමුණා අයදුම්පත් 2020 නොවැම්බර් 10 දින ප.ව 2.00 ට ප්‍රථම, සභාපති,ප්‍රසම්පාදන කමිටුව, කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය,අශෝක මාවත,පන්නල පාර, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාර දිය හැක.අදාල ලිපි කවරයේ වම් පස උඩ කෙරවලේ "2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම" සහ අදාළ සැපයුම හා සේවාව කුමක්ද යනුවෙන් සඳහන් කල යුතුය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය,
අශෝක මාවත,පන්නල පාර,කුලියාපිටිය.
0372059572 2020.10.04

මහ රෝහල ත්‍රිකුණාමලය

භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

2021 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය මහ රෝහලට භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකා සැපයුම්කරුවන්, ලියාපදිංචි කරන ලද වෙළඳ සමාගම්, සමූපකාර සමිති, සංස්ථා ඇතුළු රජයේ ආයතන, ග්‍රාම සංවර්ධන සමිති හා ලියාපදිංචි වාණිජ ආයතන වලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ පිළිබඳව අයදුම්පත් ත්‍රිකුණාමලය මහ රෝහලේ සැලසුම් අංශය මඟින් සතියේ දිනවල (සඳුද සිට සිකුරාදා දක්වා) පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා වේලාවන්හිදී ලබා ගත හැක.

✣ **Suppliers are registered under following categories of goods & services**

(A): Goods:

i. All categories of stationery (Including Fax papers & computer papers).
ii. All categories of Office Equipment & Furniture (Timber/Steel/Plastic etc.)
iii. All Categories of Medical Equipment
iv. All Categories of Surgical equipment
v. All Categories of Laboratory equipment
vi All Surgical consumables.
vii. Electrical appliances (Accessories for House Wiring, Bulbs, Torch Batteries, Florescent Lamps, Wires etc.)
viii. Electronic appliances (Roneo machines, photocopy machines, fax machines, Rizo Graph machines, Duplo Machines, supermarket trolleys, Refrigerators and Air Conditioners etc.)
ix. All categories of Aluminiumware and Hardware items (building materials, paints, sanitary items etc)
x. All categories of trolleys (for patients, for dressing, for food, for drugs, trolley wheels, wheel chair, intravenous stands etc.)
xi. Hospital clothes (uniform materials, checked cloths, mosquito nets, GS towels, curtains, white towels etc.)
xii. All categories of kitchen utensils (aluminum items, plastic items, ceramic items, water filters, knives, cutting boards etc.)
xiii. All categories of cleaning items (soaps, washing powders, toilet cleaning items, hand wash. Vim Liquid, Harpic. Garbage Bags etc.)
xiv. Tyres, tubes & batteries for vehicles.
xv. Shoes, boots, slippers, rexin & rubber products,
xvi. Hospital Mattresses, brooms, brushes & various products. (rubber mixed/fiber)
xvii. Milk powders.
xviii. LP Gas. (for cooking purposes)
xix. Sand, bricks & timber.
xx. Medical books & magazines.
xxi. Medicine & dressings.
xxii. Computers & relevant fittings
xxiii. Dustbins with Lids
xxiv. Buckets with Lids
xxv. Motor spare parts
xxvi. Chemicals for laboratories
xxvii. Washing Machines, Dryers, Ironing Machines

(B): Services:

i. Repair & service of office equipment (Roneo machines, photocopy machines, fax machines, computers & accessories, Rizo Graph machines (Duplo Machine).
ii. Repair & service of all types of Motor Vehicles
iii. Repair of steel/wooden furniture (Weaving of chairs, painting and polishing, etc)
iv. Repair & service of refrigerators, air conditioners and coolers (Drugstore, Mortuary)
v. Repairing of iron beds, patient trolleys, stretchers, and intravenous (IV) stands etc.
vi. Repairing or ceiling fans, wall clocks and other electrical Items.
vii. Repair of buildings (up to Rs. 300,000.00)
viii. Repair of buildings (up to Rs. 10 Million)
ix. Repair & service of all hospital medical equipment
x. Repair & service of all hospital surgical equipment
xi. Repair & service of all hospital laboratory equipment and other items.
xii. Making of rubber stamps
xiii. Printing
xiv. Tailoring of Hospital clothes
xv. Collection of non-degradable waste
xvi. Repair and service of computers, WLAN Network, Servers, Printers & UPSs etc.
xvii. Repair and Services of Heavy Duty Washing Machines, Dryers and Ironing Machines

1. For each Good and or service, a Separate application should be submitted.
2. A non-refundable registration fee of Rs.500/- should be paid for each supply of goods and services. The above mentioned amount should be paid to the Shroff of this office and the receipt received in return should be attached to the application form. Cheques and money orders will not be entertained.
3. Even though priority is given to registered suppliers to supply goods and services, while calling for quotations this establishment reserves the right to call quotations from those who have not registered to obtain goods and services. Without notice, action will be taken to remove the names of the suppliers who don't supply goods and services as per stipulated standards and who don't offer the response while calling for quotations
4. All applications should be sent by Registered post to Director, District General Hospital, Trincomalee, on the top left - hand corner of the envelope marked "Registration of Suppliers for the year 2021"
5. The last date of accepting applications is 09.11.2020 on or before 3.45 pm and all applications received after this date will be rejected.
6. All the details in the application form should be correctly and completely filled in English.
7. All applicants should attach the following compulsory information with the application form.
   01. Pay in slip number & amount paid. (Original)
   02. Letter of authorization/sole agent (copy)
   03. VAT Clearance certificate (copy)
   04. VAT Registration certificate (copy)
   05. Photocopy of the Business Name Registration

Director,
District General Hospital, Trincomalee.

දැන්වීම් කාර්යාල
ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න

මරදාන
නො 383, ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
011 242 9336
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

United Nations Development Programme

UNDP
Empowered lives.
Resilient nations

REQUEST FOR QUOTATIONS

Supply and Delivery of Construction Materials to support improvement of facilities at Nittambuwa Rehabilitation Centre

(RFP/UNODC/2020/69)

The United Nations Development Programme (UNDP) in Sri Lanka wishes to Request for Quotations from eligible National Manufacturers, Distributors and authorized dealers to Supply and Delivery of Construction Materials to support improvement of facilities at Nittambuwa Rehabilitation Centre.

This procurement process is being conducted through Online Tendering System of UNDP and detailed instructions and link to the e tendering event can be accessed from www.lk.undp.orgprocurement > procurement notices.

Bid Submission deadline appearing on e-Tendering portal will be FINAL and prevail on the ones appearing on other websites.

Proposals submitted via email or by hard copies will not be accepted.

Head of Procurement/Administration
United Nations Development Programme
202-204 Bauddhaloka Mawatha
Colombo 07, Sri Lanka.

UNDP reserves the right to accept or reject any proposal. The procurement process will be governed by the rules and regulations of the United Nations Development Programme (UNDP).

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) සඳහා

ඖෂධ දත්ත සමුදාය (Database) සංශෝධනය කර වැඩි දියුණු කිරීම (Revamping) සඳහා මෘදුකාංග විසඳුමක් (Software Solution) සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ආරාධනයයි (RFQ)

01. ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) හි ප්‍රධාන විධායක නිලධාරී (CEO) විසින් ඉහත සඳහන් ප්‍රසම්පාදනය සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.
02. ලංසුකරණය, ජාතික තරගකාරී ලංසුකරණ (NCB) පටිපාටිය යටතේ මෙහෙයවනු ලැබේ.
03. ලංසු, දින 60 ක් දක්වා වලංගු විය යුතු වන අතර, කොන්ත්‍රාත්තු කාල සීමාව කොන්ත්‍රාත්තුව ආරම්භ කරන නියමිත දින සිට දින 120 ක් දක්වා වනු ඇත.
04. සියලුම ලංසු, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) හි වෙබ් අඩවිය වන (www.nmra.gov.lk) වෙතින් බාගත කර ගත හක. තාක්ෂණික පිරිවිතර (Technical Specifications) වලට අනුකූලව **ප්‍රසම්පාදන නිවේදනය** යටතේ බාගත කර ගෙන සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. පූර්ව ලංසු හමුවක් (ජාතික ඖෂධ නියාමන අධිකාරියේ) ශ්‍රවණාගාරයේ හිදී 2020.10.08 වන දින පෙ.ව. 10.00 ට පැවැත්වෙනු ඇත.
05. සියලුම ලංසු දින 180 ක් දක්වා වන වලංගු කාල සීමාවක් සඳහා වන **ශ්‍රී ලංකා රුපියල් 50,000.00 ක් වන වටිනාකමක්** සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ඉදිරිපත් කළ යුතුය.
06. වැඩිදුර විස්තර සඳහා NMRA (ජාතික ඖෂධ නියාමන අධිකාරියේ) හි සහකාර අධ්‍යක්ෂ (ICT තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) වෙතින් දුරකථන අංක 0718-736935, ඊමේල් - adict@nmra.gov.lk මගින් විමසනු මැනවි.
07. ලංසු, මුද්‍ර තබන ලද ලිපිකවරයක බහා එම ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ, "**ජාතික ඖෂධ නියාමන අධිකාරිය සඳහා ඖෂධ දත්ත සමුදය නවීකරණය කිරීම**" යනුවෙන් පැහැදිලිව සලකුනු කර 2020.10.19 වන දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ කොළඹ 10, නොරිස් කැනල් පාරේ අංක 120 හි ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරී (CEO) වෙත ලේඛනගත තැපෑලෙන් එවීම හෝ NMRA හි **මූල්‍ය අංශයේ** හි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය.
08. ඉලෙක්ට්‍රොනික (විද්‍යුත්) ලංසුකරණයට අවසර දෙනු නොලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු මිලගණන් භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම ඉහත දිනයේදී ප. ව. 2.00 ට **මූල්‍ය අංශයේදී** විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන එම අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
09. **ඉහත සඳහන් ලිපිනය වනුයේ :**

ප්‍රධාන විධායක නිලධාරී, (CEO)
ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA),
අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10.

www.adz.lk
it's what you want

SriLankan Catering

ලංසු ඉදිරිපත් කිරීමේ ආරාධනය

නල ලිදක් (Deep tube well) අලුතින් ඉදිකිරීම සහ තිබෙන නල ලිද අළුත්වැඩියා කිරීම සඳහා සුදුසුකම් සහිත සැපයුම් කරුවන්ගෙන් ලංසුපත් කැඳවනු ලැබේ

ලංසු කරුවන්ට 2020 ඔක්තෝබර් 05 දින සිට 16 දක්වා දිනයන්හිදී පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා කාල වකවානුව තුල ශ්‍රී ලංකන් කේටරින් සමාගමෙන් අයදුම්පත් ලබා ගත හැකි අතර ඉදිකිරීම් පරිශ්‍රයද පරීක්ෂා කල හැකිය.

ඇතුලත් වීමේ අවසර පත් සහ ආරක්ෂක විශ්කාශනය සූදානම් කිරීම සඳහා ලංසුකරුවන් විසින් පැමිණීමට පෙර ඔවුන්ගේ සම්පූර්ණ නම සහ ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය ඉදිරිපත් කල යුතුය.

ලංසු ලියවිලි 2020 ඔක්තෝබර් 20 දින පෙ.ව 9.00 ට පෙර දින හෝ ඊට පෙර ශ්‍රී ලංකන් කේටරින් සමාගම වෙත ලැබෙන සේ ඉදිරිපත් කල යුතුය.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි සම්බන්ධයෙන් වැඩිදුර විස්තර,
තිළිණ thilina.siriwardana@srilankancatering.com හෝ 0197334241
රොහාන්- rohan.silva@srilankancatering.com හෝ 0197334140 තුළින් ලබාගත හැකිය.

ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රීලංකන් කේටරින් සමාගම,
ගුවන්සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල,
කටුනායක, ශ්‍රී ලංකාව.

කලම්බු ඩොක්යාඩ් පී එල් සී

ආරක්ෂක නිළ ඇඳුම්, ආරක්ෂක සපත්තු සහ ආරක්ෂක අත් ආවරණ මිලදී ගැනීම

අවු.01 ක කාලයක් සඳහා අප ආයතනයෙහි සේවක මහතුන් හට ආරක්ෂිත නිළ ඇඳුම්, ආරක්ෂිත සපත්තු සහ ආරක්ෂිත අත් ආවරණ ලබා දීම සඳහා පිළිගත් සැපයුම්කරුවන්/නිෂ්පාදකයින්ගෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ

විස්තර :

S/No	Item Description	Annual Consumption (Approx.)
01	Overalls (100% cotton)	5000 To 6000 Nos
02	Safety Shoes	2000 To 2500 Nos
03	Hand Gloves	5000 To 10000 Nos

සැ.යු : ශ්‍රී ලංකාවේ වලංගු නීති රීතීන්ට අනුකූලව ඉහත සඳහන් අයිතම සඳහා අනුමැතිය ලබා තිබීම අමතර සුදුසුකමකි.

අදාල ටෙන්ඩර් ගාස්තුව (ආපසු නොගෙවනු ලබන) - රු. 1,000.00 කි.

ටෙන්ඩර් පත්‍ර : අංක 223, ජයන්ත මල්ලිමාරච්චි මාවත, කොළඹ 14 හි පිහිටි ඩොක්යාඩ් ජෙනරල් ඉංජිනියරින් සර්විසස් පුද්ගලික සමාගමෙහි ගණකාධිකාරී වෙත **2020.10.07** දින සිට **2020.10.14** වන දින දක්වා අදාල ටෙන්ඩර් ගාස්තු ගෙවා ලබා ගත හැක. (සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වාද, සෙනසුරාදා දින පෙ.ව 9.00 සිට ප.ව 12.00 දක්වා පමණි)

මිල ගණන් බහා එවනු ලබන කවරයේ ඉහළ වම් කෙලවර අපගේ ටෙන්ඩර් අංකය වන **SMCD/T/20/2020** යන්න පැහැදිලිව සටහන් කර **2020.10.14** වන දින **ප.ව. 4.00** ට හෝ ඊට පෙර ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන ඉහත ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු වේ.

පසුව ඉදිරිපත් කරනු ලබන සහ තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

වැඩි විස්තර සඳහා කරුණාකර විමසන්න :

සාමාන්‍යාධිකාරී (සැපයුම් දාම කලමණාකරණය)
කලම්බු ඩොක්යාඩ් පී.එල්.සී.
කොළඹ වරාය,
කොළඹ 15.
දු.කෘ: 011 242 9000 හෝ 011 242 9059

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

මිල ගණන් කැඳවීම

ලංකා සතොස ලිමිටඩ් වෙත තාප කඩදාසි සැපයීම

ලංකා සතොස ලිමිටඩ් වෙත මාස 06ක කාල සීමාවකට තාප කඩදාසි සැපයීම සඳහා ලංකා සතොස ලිමිටඩ් (ල.ස.ලි) සභාපති විසින් දේශීය සැපයුම්කරුවන්ගෙන්, දේශීය ඒජන්තවරුන්ගෙන්, ඔවුන්ගේ බලයලත් දේශීය නියෝජිතයන්ගෙන්, ආනයනකරුවන් සහ නිෂ්පාදකයින් වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

පිරිවිතර : ලංසු ලේඛණයේ දැක්වෙන පරිදි

අවශ්‍යතාව :

අයිතමයේ නම	ප්‍රමාණය
කැසියෝ තාප කඩදාසි රෝල් (Casio Thermal Paper Roll)	10,500
මිල ලකුණු කිරීමේ තාප කඩදාසි රෝල් (Price Marking Thermal Paper Rolls)	4,500
මිල ලකුණු කිරීමේ තින්ත (Price Marking Ink)	300
කිරුම් තරාදි සඳහා මිල දර්ශක මුද්‍රිත ස්ටිකර් ලේබල (Sticker Rolls for the Weighing Sale)	36,000
POS යන්ත්‍ර සඳහා දර්ශක මුද්‍රණය වන කඩදාසි රෝල් (POS Machine Paper Rolls)	180,000
SAM 4s තාප කඩදාසි රෝල් (SAM 4s Thermal Paper Rolls)	9,000

මිල ගණන් ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන ලංසුකරුවන් විසින් අදළ ලංසු ලේඛණ, **රු.3,000.00 ක මුදලක් (ආපසු නොගෙවන)** ගෙවා **05.10.2020 සිට 21.10.2020 දින** දක්වා කාලය තුළ, අංක 27, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 හි පිහිටි ලංකා සතොස ප්‍රධාන කාර්යාලයේ, මිල දී ගැනීම් අංශයෙන් (3 වෙනි මහල) ලබා ගත යුතුය. ලංසු ලේඛණ මිලදී ගැනීමට පැමිණීමේදි අදළ ආයතනයේ ලිපි ශීර්ෂය යටතේ, නිලධරයකු විසින් තහවුරු කරන ලද ලිපියක් රැගෙන ඒමට කටයුතු කරන්න.

පූර්ව ලංසු සාකච්ඡාව 2020.10.13 වන දින පෙ.ව. 11.00 ට පැවැත්වේ .

ඉදිරිපත් කරන මිල ගණන් **2020.10.21 වෙනි දින ප.ව. 01.00** ට හෝ ඊට පෙර ලංකා සතොස ලිමිටිටඩ්, අංක 27, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම ලිපිනයෙහි, මිල දී ගැනීම් අංශයෙහි (3 වන මහල) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. මුද්‍ර, තබන ලද මිල ගණන් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ලංකා සතොස ලිමිටඩ් වෙත තාප කඩදාසි සැපයීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

සියලුම ලංසුකරුවන් විසින් තක්සේරු වටිනාකමින් **2% ක ලංසු සුරක්ෂණයක් (ආපසු ගෙවනු ලබන)** ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.

මිල ගණන් භාරගැනීම 2020.10.21 **වෙනි දින** ප.ව. 01.00ට අවසන් වන අතර මිල ගණන් විවෘත කිරීම, මිලගණන් භාර ගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් ඉදිරියේ සිදු කරනු ඇත. ජයග්‍රාහී ලංසුකරු විසින් (ලියාපදිංචි සැපයුම්කරුවන් හැර) ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. 15,000.00 ක මුදලක් (ආපසු නොගෙවන) සහ තක්සේරු කරන ලද වටිනාකමින් 10%ක කාර්ය සාධන සුරක්ෂිතයක් (ආපසු ගෙවන) ලෙස ගෙවිය යුතුය.

වැඩි විස්තර සඳහා පහත නිලධාරිවරයා අමතන්න.

නියෝජ්‍ය සාමාන්‍යධිකාරී මිල දී ගැනීම්, ලසලි - 071 1506120

ටෙන්ඩරය / කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ අවසන් තීරණය, සභාපති, ලංකා සතොස ලිමිටඩ් සතු වේ.

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්

අඩුම මිලට ඔබේම තැන

- HOUSES
- LANDS
- COMMERCIAL PROPERTIES
- APARTMENTS

Sunday Observer ADZ it's what you want
It's What You Want...

☞ Buy & Sell
☞ Rent or Lease
☞ Wanted

HOUSE & PROPERTY SECTION

ඔබ කැමති **පුවත්පත් කීපයකම**
දැරිය හැකි මිලකට
ලුහුඬු දැන්වීමක්

* වචන 15ක් සඳහා

Sunday Observer ADZ	+	දිනමිණ	රු. 500/- - වැඩි වන වචනයක් සඳහා රු. 15/-
Sunday Observer ADZ	+	Daily News	රු. 350/- - වැඩි වන වචනයක් සඳහා රු. 15/-
දිනමිණ	+	දිනමිණ	රු. 350/- - වැඩි වන වචනයක් සඳහා රු. 15/-
Sunday Observer ADZ	+	තිනකරන්	රු. 400/- - වැඩි වන වචනයක් සඳහා රු. 15/-
දිනමිණ	+	තිනකරන්	රු. 400/- - වැඩි වන වචනයක් සඳහා රු. 15/-
Daily News	+	තිනකරන්	රු. 250/- - වැඩි වන වචනයක් සඳහා රු. 10/-
දිනමිණ	+	තිනකරන්	රු. 250/- - වැඩි වන වචනයක් සඳහා රු. 10/-

ඔබගේ ලුහුඬු දැන්වීම අදම අප වෙත **E-Mail** කරන්න...
classified@lakehouse.lk

වැඩි විස්තර සඳහා අමතන්න -
අනූෂා - 077 7 278 948 / පියුමි - 011 2 429 383
රමණී - 011 2 429 347

ශ්‍රී ලාංකේය සුව සේවාවේ දැවැන්ත පෙරළිය!

1990 සුව සැරිය
හදිසි අවස්ථාවකදී අමතන්න

පැය 24 පුරා ක්‍රියාත්මක
ගාස්තු රහිත පූර්ව රෝහල් ප්‍රතිකාර
ගිලන් රථ සේවාව

මෙම සේවාව දැන් දිවයිනපුරා ක්‍රියාත්මකයි.

ලේක්හවුස් සමාජ සත්කාරයකි

දූ දරුවෝ, නෑදෑයෝ, සත්පුර වැසියෝ, අම්මයි තාත්තයි,
සිටුවරයෝ, පාරාදීසේ සහ වාසනා වේවා වැනි ජනප්‍රිය ටෙලි නිර්මාණ
ජාතික රූපවාහිනියෙන් ඔබ හමුවට රැගෙන ආ
නාලන් මෙන්ඩිස්ගේ
රූපවාහිනී පුනරාගමනය
රූ ප වා හි නී
ரூபவாஹினி
RŪPAVĀHINĪ
සුවහසක් නෑනාලා සුවපත් කරන
ටෙලිවිෂන් ප්‍රතිකාරය
හෙට සිට...
නෑනාලා
සඳුදා සිට බ්‍රහස්පතින්දා දක්වා
රාත්‍රී 8.35 ට
ජාතික රූපවාහිනියෙන්
තිර රචනය - සුනන්ද සිල්වා
නිෂ්පාදනය - බුද්ධික ලොකුකැටිය / හිරුණි රණසිංහ

දැන්වීම්

මීරිගම

මීරිගම නගරයේ
සම්පත් බැංකුව ආසන්නයේ ඇති
තෙමහල් ව්‍යාපාරික
ගොඩනැගිල්ල බදු දෙනු ලැබේ.
072-8705282, 071-8318150,
035-2263467.

නිවාස සහ ඉඩම්

මතුගම

අක්කර 25 ක
රබර් සහ තේ
වත්තක් විකිනීමට
(මතුගම නැබඩ
ප්‍රධාන පාරේ)
ටෙලි : 0777601363
072 9077081

ඔබ සොයන
වාහනය
තෝරාගන්න
බලන්න

දැන්වීම් කාර්යාල

ඔබගේ දැන්වීම්
පළකරවා ගන්න
පිවිසෙන්න

මහනුවර
නො 22, දළදා වීදිය, මහනුවර
081 223 4200
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

මෙම සේවාව දැන් දිවයිනපුරා ක්‍රියාත්මකයි.
ලේක්හවුස් සමාජ සත්කාරයකි

වෂී 2020ක් වූ ඔක්තෝබර් මස 04 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.